ලංකා බැංකුව

BOC

ජාතියේ මහා පෙනී ටැඹ

වාර්ෂික වාර්තාව 2012

වර්ධනයේ නියමුවා

www.boc.lk

වර්ධනයේ නියමුවා

වාෂ්පීකරණ තාක්ෂණයේ වෛශ්චර්යමත් මුල් යුගයේදී, අධික බර පැටවුනු දුම්රියයන් දුෂ්කර බෑවුම් සහිත උස් කඳු මුදුන් තරණය කිරීමේදී අතිරේක ධාවන යන්ත්‍රයක/දුම්රිය ඇන්ජිමක උපකාර පැතීය. එවන් අත් උදව් ධාවන යන්ත්‍රයක් හෝ පසු පස ඇන්පිමක් යනු දුම්රිය මැදිරි හෝ ප්‍රවාහන වේදිකාවන් සුරක්ෂිතව, එනම් එකිනෙක වෙන් වෙමින් පල්ලම් බැසීම වැළැක්වීමත් තරණයන් සඳහා අවශ්‍ය බලශක්තිය මුදා හැරීමත් වෙනුවෙන් වූ විශේෂිත නිමැවුම් වේ.

අප එනම් ලංකා බැංකුව, අපගේ ගණුදෙනුකරුවන් හා ජාතික ආර්ථිකය උදෙසා ඒ හා සමාන වූ කාර්යභාරයක නියැලී සිටින්නෙමු. යළි කිසිඳු පසුබෑමකට ඉඩ නොතබමින්, ශ්‍රී ලාංකිකයන් ඔවුනොවුන්ගේ අරමුණු කරා යන ගමන්මග සුමට කරලීම සඳහා රුකුල් දෙමින් ජාතික අභිවෘද්ධිය හා සංවර්ධනය බලගැන්වීමට අවශ්‍ය මූල්‍යමය ශක්තිය අවැසි සෑම විටෙකදීම නොමසුරුව සැපයීමට අප ඇපකැප වී සිටිමු.

වර්ෂය තුලදී අතිසාර්ථක බැඳුම්කර නිකුතුවක් ඔස්සේ ඇමරිකානු ඩොලර් මිලියන 500 ක් ශ්‍රී ලාංකේය ආර්ථිකයට චින්නත් කරමින් ජාතියේ මිලදී ගැනීමේ ශක්තිය තීව්‍රකර රුපියල් බිලියන 700ක් ඉක්මවූ ණය හා අත්තිකාරම් ප්‍රදානය මඟින් වාණිජ චක්‍රයෙහි නොනිමි ගමන තහවුරු කිරීමට අප කටයුතු කලෙමු.

රුපියල් ට්‍රිලියනයක වාර්තාගත වත්කම් පදනමද, අපගේ කාර්යයමණ්ඩලයේ දැඩි කැපවීම ද කළමනාකාරීත්වයේ නිපුණතාව හා පළපුරුද්ද ද මඟින් බලාත්මක වූ අප රටවටා බැංකු මෙහෙයුම් ඔස්සේ රුපියල් බිලියන 19 ක් වූ, ඉහළ බදුපෙර ලාභයක් අධිජවයෙන් තරණය කලෙමු. එය සත්‍යවශයෙන්ම සීඝ්‍රගාමී වර්ධනයකි.

ජාතික වර්ධනයේ නියමුවා - ලංකා බැංකුව

පටුන

වැදගත් ව්‍යාපාරික ජයග්‍රහණ / 04
වැදගත් මූල්‍ය තොරතුරු / 06
දැක්ම හා මෙහෙවර / 10
ඓතිහාසික පසුබිම / 12
සභාපතිතුමාගේ පණිවුඩය / 17
නව සභාපතිතුමාගේ පණිවුඩය / 20
මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය / 24
නව මහා කළමනාකාරතුමාගේ ඉදිරි දැක්ම / 28
අධ්‍යක්ෂ මණ්ඩලය / 30
ආයතනික කළමනාකාරිත්වය / 38
විධායක කළමනාකරණ කණ්ඩායම / 48
කළමනාකරණ විවරණය සහ විශ්ලේෂණය / 54
අවදානම් කළමනාකරණය / 96

ආයතනික යහපාලනය / 108
අධ්‍යක්ෂ මණ්ඩලය සහ අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු / 138
අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු වාර්තාව / 139
තිරසර පැවැත්ම පිළිබඳ වාර්තාව / 152
GRI සම්මත හෙලිදරව් කිරීම් දර්ශකය / 217
මූල්‍ය වාර්තා
ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව
බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව / 226
ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම / 230
මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව / 233
ස්වාධීන සහතිකවීමේ වාර්තාව / 235
අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ ප්‍රකාශය / 236
විගණකාධිපති වාර්තාව / 237
ආදායම් ප්‍රකාශය / 238
විස්තීරණ ආදායම් ප්‍රකාශය / 239
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය / 240
ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය / 241
මුදල් ප්‍රවාහ ප්‍රකාශය / 243
මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් / 244
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය / 340
ආයෝජකයින් සඳහා තොරතුරු / 344
දස වර්ෂ සංඛ්‍යාන සාරාංශය / 356
නිෂ්පාදිත හා සේවා / 358
පරිපාලිතයන් හා ආශ්‍රිතයන් / 366
රටවල් පදනම මත - විදේශීය රටවල නියෝජිත බැංකු / 372
රටවල් පදනම මත - නියෝජිත විදේශ විනිමය සමාගම් / 378
මූල්‍ය සහ බැංකුකරණ පාරිභාෂික ශබ්ද සංග්‍රහය / 379
ලංකා බැංකු ජාලය - දීප ව්‍යාප්ත සේවා ස්ථාන / 384
ආයතනික කාර්යාල / 418
සංස්ථාපිත තොරතුරු / පිටුපස ඇතුල් කවරය

06

වැදගත් මූල්‍ය තොරතුරු

17

සභාපතිතුමාගේ පණිවුඩය

54

කළමනාකරණ විවරණය සහ විශ්ලේෂණය

ජාත්‍යන්තර අරමුදල් අවශ්‍යතාවය උපරිම තත්ත්වයකට පැවති අවස්ථාවකදී ඇ.ඩො. මිලියන 500 ක බැඳුම්කර ප්‍රධානව සංගතණය සහ ද්විපාර්ශවීය විධිවිධාන මගින් ඇ. ඩො. මිලියන 790 ක ප්‍රතිපාදන රට තුලට ගෙනඑන ලදී.

96

අවදානම් කළමනාකරණය

සාර්ථක ලෙස මූලික ක්‍රමෝපායන් ක්‍රියාවෙහි යෙදවීමේදී සහ නිරන්තරව වෙනස් වන පරිසරයට ප්‍රතිචාරාත්මකව ප්‍රත්‍යාස්ථිත හා තිරසර ලෙස වර්ධන වන ව්‍යාපාරයක් පවත්වාගෙන යාම සඳහා බැංකුවේ සාමූහික අවදානම් කළමනාකරණ ශක්‍යතාවය සහ නිපුණතාවය නොමද සහයක් සපයයි.

152

තිරසර පැවැත්ම පිළිබඳ වාර්තාව

226

මූල්‍ය වාර්තා

“ පුද්ගල බැකුකරණයෙහි සහ තියුණු වර්ධනයක් පෙන්වන වෙළඳ හා ආයෝජන ප්‍රවාහයන් තුළ අති විශාල ව්‍යාපාර අවස්ථාවන් සමූහයක් දකින්නෙමු.”

වැදගත්
ව්‍යාපාරික ජයග්‍රහණ

බැංකුකරුවන්ගේ ලැයිස්තුවේ
ඉහලතම ශ්‍රේණිගත කිරීම
ලද ලාංකීය බැංකුව

ද බෑන්කර් සඟරාව මඟින්
ලොව ප්‍රශස්ථතම බැංකු 1000
අතරට ශ්‍රේණිගත කර ඇත

රු. ට්‍රිලියනයක
වත්කම් සීමාව
සාක්ෂාත් කර ගැනීම
පළමු අර්ධ වර්ෂය අවසානයට පෙර

සේවා ස්ථාන 1,050 දක්වා
දිවයින පුරා
බැංකු මෙහෙයුම් ව්‍යාප්ත කිරීම

ලොව පුරා පැතිරුණු විදේශීය
නියෝජිත බැංකු 859
කින් යුත් ජාලය

38%
වෙළඳපළ කොටසක්
ආමුඛ ප්‍රේශණ වලින්
ප්‍රමුඛත්වය ලබා සිටියි

50%

ඉක්මවූ වෙළඳපළ කොටසක්

සහිත දේශීය-විදේශීය විනිමය වෙළඳපලේ භාණ්ඩාගාර මෙහෙයුම් වල ප්‍රමුඛයා

සිංගප්පූරු කොටස් හුවමාරුවේ ලැයිස්තු ගත

ඇ. ඩොලර් මිලියන 500 ක්වූ

7.7 ගුණයක අධිදායකත්වයක් ලත් සාර්ථක ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව

කොළඹ කොටස් හුවමාරුවේ

ලැයිස්තුගත වසර 5ක වලංගු කාලයක් සහිත ණයකර නිකුත් කිරීමෙන්,

සාර්ථක ලෙස සිවිවන වරටත්

රු.බිලියන 6 ක අරමුදල්

ජනනය කරගැනීම

වත්කම් සඳහා වැඩිම වෙළඳපළ කොටසක් සහිත

විශාලතම අක්වෙරළ බැංකු මෙහෙයුම් කටයුතු නියෝජනය

තනි ණය ආවරණ හැකියාව

රු. බිලියන 16 ඉක්මවීම

අත්තිකාරම් සහ තැන්පතු අගය

රු. බිලියන 700 ක

කඩඉම කරා ළඟාවීම

ෆිච් රේටින්ස් ලංකා සමාගම විසින් කරන ලද

'AA+ (lka)

ශ්‍රේණිගත කිරීම තවදුරටත් ස්ථාවරව පවත්වාගෙන යාම

වැදගත්

මූල්‍ය තොරතුරු

බදු පෙර ලාභය (රු.බිලියන)



බදු පසු ලාභය (රු.බිලියන)



ආදායමට පිරිවැය (%)

සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය (%)



සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභය (%)



	බැංකුව			සමූහය		
	2012	2011	වෙනස %	2012	2011	වෙනස %
මෙහෙයුම් ප්‍රතිඵල (රු.මිලියන)						
ආදායම	**110,138**	70,457	56.3	**115,527**	74,857	54.3
එකතු කළ අගය මත බදු සහ අදායම් බද්දට පෙර ලාභය	**23,009**	19,000	21.1	**23,482**	18,880	24.4
බදු පෙර ලාභය	**19,794**	16,485	20.1	**20,246**	16,491	22.8
බදු පසු ලාභය	**14,417**	11,918	21.0	**14,608**	11,667	25.2
රජයට දායකත්වය	**13,938**	10,929	27.5	**14,259**	11,267	26.6
මූල්‍ය තත්ත්වය (රු.මිලියන)						
මුළු වත්කම්	**1,048,221**	838,273	25.0	**1,079,353**	864,633	24.8
දළ ණය හා අත්තිකාරම්	**714,847**	561,766	27.2	**733,706**	577,688	27.0
දළ ණය සහ අත්තිකාරම් (හානිකරණ ප්‍රතිපාදන වලට පසු)	**691,899**	543,149	27.4	**709,933**	558,254	27.2
ගනුදෙනුකරුවන්ගේ තැන්පතු	**693,441**	595,774	16.4	**700,169**	603,406	16.0
කොටස්කරුවන්ගේ අරමුදල් (ප්‍රාග්ධනය හා සංචිත)	**50,953**	41,354	23.2	**58,643**	48,840	20.1
කොටසක් සඳහා දත්තයන් (රු.)						
කොටසක ඉපැයුම	**2,883**	2,383	21.0	**2,916**	2,318	25.8
කොටසක ශුද්ධ වත්කම්	**10,191**	8,271	23.2	**11,445**	9,478	20.8
ලාභදායිත්ව අනුපාත (%)						
සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය	**2.1**	2.1	0.0	**2.1**	2.1	0.0
සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභය	**31.2**	33.4	(2.2)	**27.2**	27.4	(0.2)
පොළී ආන්තිකය	**3.7**	3.2	0.5	**3.8**	3.3	0.5
ආදායමට පිරිවැය	**42.7**	51.1	(8.4)	**45.4**	53.1	(7.7)
හානිකරණ ප්‍රතිපාදන, දළ ණය හා අත්තිකාරම් වල ප්‍රතිශතයක් ලෙස	**3.2**	3.3	(0.1)	**3.2**	3.4	(0.2)
තැන්පතු වලට ණය අනුපාතය	**103.1**	94.3	8.8	**104.8**	95.7	9.1
ව්‍යවස්ථාපිත අනුපාත (%)						
ද්‍රවශීලතා වත්කම් අනුපාතය (දේශීය) (අවම අවශ්‍යතාවය 20%)	**21.8**	23.4	(1.6)			
ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත (%)						
මූලික ප්‍රාග්ධනය අනුපාතය (අවම අවශ්‍යතාවය 5%)	**8.3**	7.8	0.4	**8.9**	8.7	0.2
මුළු ප්‍රාග්ධන අනුපාතය (අවම අවශ්‍යතාවය 10%)	**11.4**	10.9	0.5	**12.4**	12.2	0.2

වැදගත්

මූල්‍ය තොරතුරු

රජයට දායකත්වය (රු.බිලියන)



පෙර වසරට සාපේක්ෂව, සමූහයේ වත්කම් රු.බිලියන 1,079 දක්වා 25% කින්ද, ණය සහ අත්තිකාරම් රු.බිලියන 733 දක්වා 27% කින් ද වර්ධනය වී ඇත. බදු පසු ලාභය රු.බිලියන 14.6 කි. තැන්පතු 16% ක වර්ධනයක් ලඟාකරගෙන ඇති අතර, බැංකුවේ අක්‍රීය වත්කම් අනුපාතය 2.8% සීමාවේ රඳවා ගැනීමට සමත්ව ඇත.

මුළු වත්කම් (රු.බිලියන)



මුළු අත්තිකාරම් (රු.බිලියන)



මුළු තැන්පතු (රු. බිලියන)



ප්‍රාග්ධනය සහ සංචිත (රු.බිලියන)



ඉදිරි දැක්ම

ජාතියේ මහා පහන් ටැඹ

මෙහෙවර

ගනුදෙනුකරුවන්

අපගේ සියලුම ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් ඉක්මවා යන පරිදි විශ්වාසවන්තවත් වගකීමෙනුත් යුතු ඵලදායී වූ ගනුදෙනුකාර සම්බන්ධතාවක් ගොඩනැගීම

කාර්ය මණ්ඩලය

අපගේ කාර්ය මණ්ඩලය නිසි පිළිගැනීමට සහ ඇගයුමට ලක් කිරීමෙන් හොඳම ඉලක්ක සපුරා ගන්නා විශිෂ්ට සේවා කණ්ඩායමක් බවට පත් කිරීම

අයිතිකරුවන්

අපගේ අයිතිකරුවන්ගේ අපේක්ෂාවන්ට අනුකූලව ලාභදායිත්වයක් සමඟ ජාතික සංවර්ධනයේ ක්‍රියාකාරකයෙකු වීම

සමාජය

සමස්ත සමාජය වෙතම පුළුල් බැංකු සේවාවක් සපයමින් දේශයට සෙත සලසන පහන් ටැඹක් ලෙස වැජඹීම

ලංකා බැංකුව වසර ගණනාවක් පුරා එහි මෙහෙයුම් කටයුතු, ශාඛා ජාලය, අයිතිය, මහජනතාව, නිෂ්පාදන හා සේවාවන් හි වෙනස්කම් වලට භාජනය වෙමින් ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම මූල්‍ය සේවා සපයන්නා ලෙස විකාශනය වී ඇත. එවන් වූ ප්‍රගතිය පිළිබඳව වැදගත් කරුණු සාරාංශගත කොට පහතින් දක්වා ඇත.

ඓතිහාසික පසුබිම

1939 - 2012

1939
ලංකා බැංකුව ජාතියේ මුල්ම, නව්‍යතම, දේශීය අයිතිය සහිත බැංකුවක් ලෙස අගෝස්තු 01 දින අග්‍රාණ්ඩුකාර සර් ඇන්ඩෘ කැල්ඩිකොට් විසින් දැනට නගර ශාඛාව පිහිටි පරිශ්‍රයේදී උත්සවාකාරයෙන් ආරම්භ කර ස්ථාපිත කරන ලදී.

1941
මහනුවර ශාඛා කාර්යාලයක් විවෘත කරමින් එහි මෙහෙයුම් කටයුතු ආරම්භ කරන ලදී. අනතුරුව අනෙකුත් පිටස්තර ප්‍රධාන නගර වන ගාල්ල, යාපනය හා ත්‍රිකුණාමලය යන නගර වල ශාඛා කාර්යාල ආරම්භ කරන ලදී.

1946
විදේශ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. කොළඹ කොටුව ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටල් (GOH) කාර්යාලයේ සිට මෙහෙයුම් කටයුතු සිදුකරන ලදී.

1949
නිදහස ලබා ගැනීමෙන් අනතුරුව ලන්ඩන් නගරයේ ලංකා බැංකු ප්‍රථම විදේශීය ශාඛාව ආරම්භ කළ අතර, එය බැංකුවේ 13 වන ශාඛාව විය.

1953
සී ලෝගනාදන් මහතා ප්‍රථම ශ්‍රී ලාංකික මහා කළමනාකරු බවට පත් විය.

1954
මධ්‍යම කාර්යාලය නගර ශාඛා පරිශ්‍රයේ සිට GOH ගොඩනැගිල්ලට ගෙනයන ලදී.

1959
පාර්ලිමේන්තු පනතකින් බැංකුවේ අනුදත් ප්‍රාග්ධනය රු. මිලියන 50 දක්වා වැඩි කරන ලදී.

1961
ජාතිකකරණය, ශ්‍රී ලංකා ආණ්ඩුව ලංකා බැංකුවේ එකම අයිතිකරුවා බවට පත්විය.

රජයේ දිස්ත්‍රික් පරිපාලන ක්‍රමය හා සමගාමී වන පරිදි කච්චේරි ශාඛා ජාලය ස්ථාපිත කරන ලදී.

1973
ගොවිජන සේවා මධ්‍යස්ථාන සංකල්පය ක්‍රියාත්මක කරන ලදී. ගොවිජන සේවා මධ්‍යස්ථාන 350 කට වැඩි ප්‍රමාණයක ශාඛා කාර්යාල ස්ථාපිත කෙරිණි. විස්තීරණ ග්‍රාමීය ණය ක්‍රමයක් ආරම්භ කරන ලදී.

1978
අනේවාසික විදේශීය මුදල් තැන්පතු ක්‍රමය (NRFC) හඳුන්වා දෙන ලදී.

1979
විදේශීය මුදල් බැංකු ඒකකය ස්ථාපිත කිරීමත් සමගම අක්වෙරළ බැංකු මෙහෙයුම් ආරම්භ කෙරිණි.

1980
පරිගණක අංශය ස්ථාපිත කිරීමත් සමගම ව්‍යාපාර කටයුතු යාන්ත්‍රීයකරණය ආරම්භ විය.

1981
මාලදිවයින් ජනරජයේ ලංකා බැංකු මාලේ ශාඛාව ආරම්භ කරන ලදී.

1985
ප්‍රධාන කාර්යාලය තට්ටු 32 කින් සමන්විත කොළඹ බී ඕ සී ගොඩනැගිල්ලට ගෙනයන ලදී.

1988
විද්‍යුත් බැංකුකරණ යුගය ආරම්භ කරමින් බී ඕ සී ස්වයංක්‍රීය ටෙලර් මැෂින් ක්‍රමය ස්ථාපිත කරන ලදී.

1989
අන්තර් ජාතික වීසා සමග සහයෝගයෙන් සී බෑන්ක් වීසා කාඩ්පත් ක්‍රමය හඳුන්වා දෙන ලදී.

1995
මදුරාසිය සහ කරච්චි නගර වල ශාඛා කාර්යාල ආරම්භ කරමින් විදේශීය ශාඛා ජාලය වර්ධනය කරන ලදී.

1996
නේපාල බැංකුව සමග බද්ධ ව්‍යාපාරයක් ලෙස නේපෝල් බෑන්ක් ඔෆ් සිලෝන් ආරම්භ කරන ලදී.

1998
රජය සමග ඇතිකර ගන්නා ලද අවබෝධතා ගිවිසුමක ප්‍රතිඵලයක් ලෙස කළමනාකරණය පිළිබඳව විශාල ස්වාධීනත්වයක් සහ ඉලක්ක මත පදනම් වූ කාර්ය සාධන ක්‍රමයක් ඇතිකරන ලදී.

2000
පාර්ලිමේන්තු පනතකින් අනුදත් ප්‍රාග්ධනය රු. බිලියන 50 දක්වා තව දුරටත් වැඩිකරන ලදී.

2004
ශ්‍රී ලංකාවේ විශාලතම තනි සහාධිපත්‍ය නිවාස සංවර්ධන ව්‍යාපෘතිය වූ හැව්ලොක් සිටි ආයෝජනය සඳහා දේපළ කටයුතු පිළිබඳව පරිපාලිතයක් ලෙස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම සංස්ථාපනය කරන ලදී.

2005
රු. බිලියන 300 ක සීමාව ඉක්මවමින් ශ්‍රී ලංකාවේ බැංකු අතරින් විශාලතම වත්කම් පදනම සහිත බැංකුව බවට පත්විය.

2004 දෙසැම්බර් මස සිදු වූ සුනාමි ව්‍යසනයෙන් පසුව විශාල පරාසයක සහන ක්‍රියාකාරකම්, පුනරුත්ථාපන සහ ප්‍රතිසංස්කරණ ක්‍රියාකාරකම් හා බැඳුණු මූල්‍යකරණ කටයුතු සම්පාදනය කරන ලදී.

2006
ආසියා ශාන්තිකර කලාපයේ වඩාත් වේගවත්ම මාර්ග ගත මූලික බැංකු ක්‍රමය වෙනුවෙන් IBM/FISERV ත්‍යාගය දිනාගන්නා ලදී.

2007
ශ්‍රී ලාංකික නිකුත් කරන්නෙකු විසින් ලබාගත් උපරිමය වන ඩොලර් මිලියන 210 ක අන්තර් ජාතික සහයෝගීතා ණය මුදල ජනනය කර ගැනීම, ශ්‍රී ලංකා රජයේ ඩොලර් මිලියන 500 ක චෛතිහාසික බැඳුම්කර නිකුතුවේ සම කළමනාකාරිත්වය දැරීම.

2008
ලැයිස්තුගත වර්ෂ 5 ක, යටත්කාලීන රුපියල් ණයකර මඟින් රු. බිලියන 4.2 ක අරමුදල් ජනනය කර ගැනීම.

වර්ෂ 5 ක, යටත් කාලීන ඩොලර් ණයකර පෞද්ගලික නිකුතුවක් මඟින් ඇ.ඩො. මිලියන 21.6 ක අරමුදල් ජනනය කර ගැනීම.

2009
ඉස්ලාමීය බැංකුකරණ ඒකකය ආරම්භ කළ ප්‍රථම රාජ්‍ය බැංකුව බවට පත්වීම. එය දීප ව්‍යාප්ත ශාඛා ජාලය පුරා ක්‍රියාත්මක වේ.

2010
ගෝලීය බැංකුකරණයට ඇතුළු වීමේ දෙරටුවක් ලෙස මෙන්ම, තව දුරටත් විදේශීය ආයෝජන රට තුළට ආකර්ෂනය කරගැනීම සඳහා එක්සත් රාජධානියේ ක්‍රියත්මක වූ ලන්ඩන් ශාඛාව ලංකා බැංකුවේ පරිපාලිතයක් බවට පත් කරන ලදී.

මූලික බැංකු කටයුතු වලින් පරිබාහිර ව්‍යාපාරික කටයුතු වර්ධනය කිරීමේ අරමුණින් විශේෂිත ආයෝජන බැංකු ඒකකයක් ඇතිකිරීම.

සුරැකුම් රහිත,යටත්, නිදහස් කළ හැකි වර්ෂ 5 ක ණයකර ප්‍රසිද්ධ නිකුතුවක් මඟින් රු. බිලියන 5 ක අරමුදලක් සාර්ථකව දෙවන වරටත් ජනනය කර ගැනීම.

2011
ෆිච් රේටින්ග්ස් ලංකා සමාගම විසින් ඒ වනවිට ශ්‍රී ලංකාවේ වාණිජ බැංකු සඳහා ලබාදුන් ඉහළම ශ්‍රේණිගත කිරීම වන AA+(lka), ලෙස ලංකා බැංකුවේ ශ්‍රේණිගත කිරීම උසස් කිරීම.

ශාඛා ජාලය ආවරණය වන පරිදි හඳුන්වා දුන් මාර්ගගත කල්බදු පද්ධතිය මඟින් බැංකුව පියවරක් ඉදිරියට තැබීම.

පෞද්ගලික බැංකුකරණය සඳහා ලංකා බැංකුව විසින් ප්‍රමුඛතා බැංකුකරණ ඒකකයක් විවෘත කිරීම.

2012
වත්කම් සඳහා රුපියල් ට්‍රිලියනයක අති විශාල ඉලක්කය සපුරා ගත් ප්‍රථම ශ්‍රී ලාංකීය බැංකුව බවට පත්වීම.

ශ්‍රී ලාංකීය වාණිජ බැංකුකරණ ඉතිහාසයේ ප්‍රථම වරට ඇ.ඩො. මිලියන 500 ක, වසර 5 බැඳුම්කර නිකුතුව සාර්ථකව නිම කිරීම. මෙම බැඳුම්කර නිකුතුව සඳහා ඇ.ඩො. බිලියන 3.86 ක දායකත්වයක් ලැබුණු අතර, එය බලාපොරොත්තු වූ මුදල මෙන් සත් ගුණයකටත් වැඩි අධි දායකත්වයකි.

සිව් වන වරටත් සිදු කරන ලද සුරැකුම් රහිත,යටත්, නිදහස් කළ හැකි වර්ෂ 5 ක ප්‍රසිද්ධ ණයකර නිකුතුව මඟින් රු. බිලියන 6 ක අරමුදල් ජනනය කර ගැනීම.

මෙම වසර තුළදී ගනුදෙනුකාර සේවා ස්ථාන ජාලය 1000 ඉක්මවා යන ලද අතර එක් දිනකදී උතුරු පළාතේ පමණක් සේවා ස්ථාන 11ක් ස්ථාපිත කරන ලදී.

ලොව ප්‍රමුඛ පෙලේ බැංකුකරණ හා මූල්‍ය සඟරාවක් වන ද බෑන්කර් සඟරාව විසින් ලංකා බැංකුව ලොව ප්‍රමුඛතම බැංකු 1000 අතරින් එකක් ලෙස හඳුන්වා දීම.



තරණය තියුණුවත්ම ප්‍රතිලාභයන් වර්ධනය වනවා සේම උපද්‍රව හා අවදානමද ඉහළ යනු ඇත. එබැවින් සාර්ථක තරණයන් සඳහා සුක්කානම හා අවකරය හැසිරවීමේ මනා ප්‍රාගුණ්‍ය වැදගත්ය.



යාන්ත්‍රිකයකුගේ දැක්ම

3

සභාපතිතුමාගේ පණිවුඩය

“දේශීය වශයෙන් ණය ලබාදීමේ වර්ධනයක් සමඟ ඒ සඳහා අවැසි අරමුදල් රැස්කිරීමේදී පොළී ආන්තිකය මත ඇතිවන තෙරපුම සහ ලාභය මත ඇතිවන පීඩනය පිළිබඳව පැහැදිලි අවබෝධයකින් යුතුව අපි උපායමාර්ගිකව කටයුතු කළ අතර අපේක්ෂිත ප්‍රතිඵල ළඟකර ගතිමු.”

Gamini Wickramasinghe

ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ
සභාපති

අපි පොරොන්දු වූ දේ ඉටු කළෙමු.....

හිතවත් පාර්ශ්වකරුවනි

ශ්‍රී ලංකාවේ ඇති බැංකු අතරින් පළමු වතාවට රුපියල් ට්‍රිලියනයක් ඉක්ම වූ වත්කම් සමූහයක් අත්කර ගැනීමට ලංකා බැංකුව සමත් වූ බව මා දැනුම් දෙන්නේ ඉමහත් උද්දාමයකිනි. 2016 වසරේදී ඒක පුද්ගල ආදායම ඇමෙරිකන් ඩොලර් 4,000 ඉලක්කය සාක්ෂාත් කර ගැනීම සඳහා වූ රජයේ මහින්ද චින්තන ඉදිරි දැක්මට අනුව යමින් අපගේ තුන් අවුරුදු මූල්‍ය පුරෝකථනය 2009 වසරේදී අපි පිළියෙල කලෙමු. පශ්චාත් යුධ සමයේදී ඇතිවන මූල්‍ය ප්‍රතිලාභ හා ආර්ථිකමය පරිවර්තනයන් සඳහා පහසුකම් සලසමින්ද ජනතාවට පුළුල් අවස්ථා ලබාදෙමින් ද ඉදිරි දැක්මකින් යුතු සංකල්පය අපි ගෙන හැර පෑවෙමු. මෙම ජාතික ඉලක්කය සපුරා ගැනීම සඳහා වඩා ක්‍රියාශීලී පියවරක් ලෙස, වඩා ප්‍රබල ඉදිරි දැක්මකින් යුතු සංකල්පයක් 2009 යේදී "One 10 Twelve" යන සංක්ෂිප්ත උදාන පාඨය හරහා සමාජගත කරනු ලැබීය. එනම් 2012 වසරේදී රුපියල් ට්‍රිලියනයක (බිලියන දහසක) වත්කම් අත්පත් කර ගනිමින් රුපියල් බිලියන දහයක ලාභයක් ලබා ගැනීමත් යන ආදර්ශ පාඨයෙන් යුත් ආයතනික සැලැස්මක් නිර්මාණය කිරීමට අපි කටයුතු කල අතර අපගේ ඉදිරි දැක්ම සාර්ථක වීම පිළිබඳ මා අතිශයින් උද්දාම වන්නේ එය මුළුමනින්ම සාක්ෂාත් කරගැනීමෙන් නොනැවතී ඉලක්කගත දිනයට පෙරම එය ලඟා කරගත් බැවිනි.

මෙහිදී බොහෝ දේශීය හා විදේශීය ආර්ථික අභියෝගයනට අපි මුහුණ දුන්නෙමු. මෙම වසර බොහෝ අභියෝගවලින් පිරි වසරක් විය. ඉහලයන උද්ධමනය, රුපියල අවප්‍රමාණය වීම, එනයින් ඉහල යන පොළී අනුපාත, දේශීය ද්‍රවශීලතාවය හීනවීම සහ ගෙවුම් ශේෂ හිඟය පුළුල් වීම යන ආර්ථික කරුණු බැංකු සඳහා දුෂ්කර වාතාවරණයක් නිර්මාණය කළේය. එම වාතාවරණය යටතේ තැන්පතු ඒකරාශී කිරීමේදී මුහුණ දීමට සිදුවූ ඉහල තරඟකාරිත්වය හමුවේ පොළී අනුපාතයන් ඉහල නැංවීමට සිදුවිය. මෙයට අමතරව අපගේ ග්‍රාමීය ජීවනෝපාය වූ කෘෂිකර්මාන්තය හා ඒ ආශ්‍රිත දාමයන්ට දිවයිනෙහි බොහෝ ප්‍රදේශවල හටගත් නියඟය, දැඩි වර්ෂාව සහ ගංවතුර මඟින් දැඩි බාධා එල්ල විය. මේ සියලු බාධා මධ්‍යයේ වුවද අපේක්ෂිත මෙහෙයුම් ප්‍රතිඵල සහ ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකි විය.

ආර්ථික වාතාවරණය

2008-2009 සිට අඛණ්ඩව පවතින ආර්ථික අර්බුදයෙන් මුළුමනින්ම අත්මිදීමට 2012 වසරේදී ලෝක ආර්ථිකයට නොහැකි විය. නැගීගෙන එන ආර්ථිකයන්ටද ඔවුන්ගේ මන්දගාමී වූ වර්ධන වේගය නැවත අත්පත් කර ගැනීමට නොහැකි වූ අතර මූල්‍ය අර්බුදයෙන් ඇති වූ පසු කම්පනයන් යුරෝපානු කලාපය තවමත් අත්විඳිමින් සිටී. මෙලෙස සමස්ත වශයෙන්, අස්ථාවර තත්ත්වයන් අත්විඳි ලෝක ආර්ථිකය දේශීය ආර්ථික වර්ධනය කෙරේ ප්‍රබල බලපෑමක් එල්ල කරනු ලැබීය. මෙකී ගෝලීය ආර්ථික අස්ථායීබවෙහි බලපෑම සමස්ත ආසියානු කලාපීය අපනයන කෙරේ, සෘජු ලෙසම අහිතකර ලෙස බලපානු ලැබීය.

අහිතකර ගෝලීය බලපෑම් හමුවේ වුවද ශ්‍රී ලංකාවට එහි වර්ධන රිද්මය තුළ අඛණ්ඩව රැඳී සිටීමට හැකි විය. සිදුවිය හැකි අහිතකර ප්‍රතිඵල මඟහරවා ගැනීම පිණිස බැංකු හා මූල්‍ය අංශයේ නියාමකයින් විසින් තත්කාලීනව සිදුකරන ලද අධීක්ෂණ ක්‍රියාකාරකම් මඟින් වෙළඳපළ විනය පවත්වා ගෙන යන ලදී.

රාජ්‍ය-පෞද්ගලික සහයෝගීතාවය සඳහා වූ රජයේ ඉදිරි දැක්ම හා අනුගත වෙමින් ආර්ථික ප්‍රගතිය උදෙසා ජාතික සංවර්ධන කාර්යයන්ට උරදීම සඳහා වූ අපගේ වගකීම අඛණ්ඩව ඉටුකලෙමු. නිවාස, කෘෂිකර්මය සහ සංචාරක කර්මාන්තය වැනි ආර්ථිකයේ ප්‍රධාන අංශයන්ට සහායවීම අපගේ බැංකුව අඛණ්ඩව සිදුකරන ලදී. ජන ජීවිතයේ ඉහල ගුණාත්මකභාවය මෙන්ම ආර්ථික සංවර්ධනය සිය ප්‍රමුඛ අවධාරණය වූ රජයේ බලාපොරොත්තු, සමාජ ස්ථරයේ පුළුල් පරාසයකට සේවය කිරීම සඳහා වූ අපගේ ගමනට මග පෙන්වීය.

මූල්‍ය කාර්යසාධනය

දේශීය වශයෙන් ණය ලබා දීමේ වර්ධනයත් සමඟ ඒ සඳහා අවැසි අරමුදල් රැස් කිරීමේදී පොළී ආන්තිකය මත ඇතිවන තෙරපුම සහ ලාභය මත ඇතිවන පීඩනය පිළිබඳව පැහැදිලි අවබෝධයකින් යුතුව අපි උපායමාර්ගිකව කටයුතු කළ අතර අපේක්ෂිත ප්‍රතිඵල ලඟා කර ගතිමු. ණය හා අත්තිකාරම් රු. බිලියන 733 දක්වා එනම්, පසුගිය වසරට වඩා 27% කින් වර්ධනය වූ අතර සමූහයේ වත්කම් රු. බිලියන 1,079 ක් දක්වා 25% කින් වර්ධනය විය. බදුවලින් පසු ලාභය ශ්‍රී ලංකා රු. බිලියන 14.6 ක් විය. තැන්පතු 16% කින් වර්ධනය වූ අතර අක්‍රිය ණය අනුපාතය 2.8% ක මට්ටමක රඳවා ගැනීමට හැකිවිය.

පසුගිය වසර තුන තුල අඛණ්ඩව ඉහල ගිය වත්කම් වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය අඩුවීමේ ප්‍රවනතාවයක් ඇත. ප්‍රධාන කොටම ප්‍රාග්ධනය සීමාවීම හේතුවෙන් ඉදිරියේ ව්‍යාපාර ප්‍රසාරණයෙහි කිසියම් සීමාවීමක් සිදුවිය හැක. මෙහිදී අප ප්‍රඥාගෝචර හා දුරදක්නා සැලසුම් කිරීමේ ක්‍රියාවලිය තුළ ප්‍රමුඛතාවය දී ඇත්තේ ඉහළ ප්‍රාග්ධනයකින් යුතු ශක්තිමත් ශේෂ පත්‍රයක් ගොඩනැඟීමයි.

ශ්‍රී ලංකාවේ ඇති මූල්‍ය ආයතනයක් විසින් සිදුකරන විශාලතම ණයකර නිකුතුව බවට පත් වෙමින් මෑතකදී සිදුකල ලැයිස්තුගත ණයකර නිකුතුව අතිශයින් සාර්ථක වූ අතර එය බැංකුව විසින් සිදුකරන ලද සිවු වැනි සාර්ථක රුපියල් ණයකර නිකුතුව වේ.

පාරිභෝගික සේවා මධ්‍යස්ථාන වැඩි දියුණු කිරීම

සමාලෝචනයට ලක්වූ කාලය තුල පුළුල් සමාජීය නියෝජනයකට මූල්‍ය පහසුකම් සැලසීම අරමුණු කරගත්, ව්‍යාප්තියක් අපගේ ප්‍රමුඛ අවධානය විය. උතුරු නැගෙනහිර පළාත්වල ආර්ථිකය සංවර්ධනය කිරීමේ කාර්යයට උරදෙනු සඳහා අපි එහි ශාඛා ජාලය පුළුල් කරමින්ද මිනිස් බලය වැඩි කරමින් ද අපගේ ව්‍යාප්තිය පුළුල් කලෙමු. එකම දින උතුරු පළාතේ පමණක් බැංකු ශාඛා 11 ක් විවෘත කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස 2012 වසර තුළ උතුරු නැගෙනහිර ප්‍රදේශවලට ලංකා බැංකුව නිකුත් කල ණය ප්‍රමාණය රු. බිලියන 7 කින් වර්ධනය විය.

අපගේ ජාතික නියෝජනය වර්ධනය කරමින් අනෙකුත් පළාත්වලටද ව්‍යාප්ත වූවෙමු. ඒ අනුව සමෝලචනය කරනු ලබන වර්ෂය තුල නව ශාඛා/ව්‍යාප්ති කාර්යාල 34 ක් ආරම්භ කරමින් අප ජාලයේ ශාඛා/ව්‍යාප්ති කාර්යාල 600 දක්වා ඉහල දැමුණු අතර විද්‍යුත් බැංකුකරණයේ ව්‍යාප්තිය පෙන්නුම් කරමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 451 දක්වා ඉහල දැමුණි. පුදුකුඩුඉරුප්පු සේවා මධ්‍යස්ථානය විවෘත

කිරීමත් සමඟ සේවා මධ්‍යස්ථාන සංඛ්‍යාව 1,000 ක සීමාවට ලඟා විය.

කල්බදු වෙළඳපොළ දිනා ගැනීම සඳහා කල්බදු පොළ-සංකල්පය යටතේ වැඩසටහන් ගණනාවක් ද අපි ආරම්භ කළ අතර 2012 වසරේදී කල්බදු වෙළඳපොළින් සැලකිය යුතු කොටසක් අප වෙත නතු කර ගැනීමට සමත් වුයෙමු.

අපගේ ජාත්‍යන්තර වෙළඳාම

බැංකුවේ ශාඛා ජාලයට විදේශයන් 15 ක බැංකු 25 ක් එක් කරමින් අනුරූපී සම්බන්ධතා තවදුරටත් ප්‍රසාරණය කලෙමු. කෙසේ වුවද, ඉරානය සමඟ ගනුදෙනු සඳහා එක්සත් ජාතීන්ගේ සම්බාධක පැනවීම හේතුවෙන් වසර තුල බැංකුව ඉරානය සමග පැවැත්වූ අනුරූපී සම්බන්ධතා සියල්ල අත්හැර දැමීමට සිදුවිය.

රට තුලට පැමිණෙන විදේශීය ප්‍රේෂණවලින් 38% ක වෙළඳපල කොටසක් අඛණ්ඩව තබා ගනිමින් සහ පසුගිය වසරට වඩා 15% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2012 වසර තුල රට තුලට රු. බිලියන 283 ක විදේශීය ප්‍රේෂණ ගෙන ඒමට පහසුකම් සපයන ලදී. අපගේ අන්තර්ජාලය මත පදනම් වූ අරමුදල් හුවමාරු කිරීමේ පද්ධතිය වැඩි දියුණු කිරීමට අමතරව ලෝකය පුරා විසිරී ඇති මෙහෙයුම් නියෝජිතයන් සමඟ අපගේ සම්බන්ධතාවයන් ශක්තිමත් කිරීමට මෙම කටයුතු කර ඇත. අපගේ ප්‍රේෂණ පහසුකම් භාවිතා කරන ගනුදෙනුකාර පදනම වැඩි කිරීම සඳහා දේශීය හා විදේශීය ප්‍රවර්ධන කටයුතු ගණනාවක් දියත් කරන ලදී.

ඇමෙරිකානු ඩොලර් මිලියන 500 ක බැදුම්කර නිකුතුව අපගේ ජාත්‍යන්තර මෙහෙයුම්හි ප්‍රමුඛ ජයග්‍රහණයක් වන අතර එය ප්‍රධාන වශයෙන් ආසියා, යුරෝපා, හා ඇමෙරිකානු ආයෝජකයන් විසින් මිළදී ගත් අතර අනෙකුත් දේශීය බැංකුවලටද අප අනුගමනය කිරීමට ඉඩ සැලසුනි. බැඳුම්කර සඳහා 7.7 ගුණයක අධි දායකත්වයක් ආයෝජකයන් වෙතින් ලැබූ අතර අපගේ ජාත්‍යන්තර පිලිගැනීම එයින් විද්‍යාමාන වේ. මෙම ක්‍රියාවලියේ කොටසක් වශයෙන් අපි ෆිච් (Fitch) සහ මූඩීස් (Moody's) යන ජාත්‍යන්තර මූල්‍ය ආයතන හා ණය ශ්‍රේණිගත කරන ආයතන වෙතින් පිරිනමන ජාත්‍යන්තර දර්ශක ලබාගත් අතර එම දර්ශක ශ්‍රී ලංකාවේ රාජ්‍ය සුරැකුම් සඳහා වන දර්ශක වලට සම වේ.

ආයතනික සමාජ වගකීම

අපගේ ආයතනික සංස්කෘතිය හා වටිනාකම් අපගේ තිරසාරත්වය සම්බන්ධයෙන් සාක්ෂි දරයි. ශ්‍රී ලංකාවේ ප්‍රධාන භාෂා තුන වන සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාවිතය මඟින් ජාතික සමගිය අරමුණු කරගත් ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා විසින් දියත් කරන ලද ත්‍රිභාෂා වැඩ සටහන අනුව යමින් සහ කෘෂිකර්මය මූලික කරගත් ජීවනෝපාය හා සංස්කෘතික සංවර්ධනය ඔස්සේ දියුණු ප්‍රජාවක් සහ සමාජ පදනමක් ඇති කිරීම අපගේ ආයතනික සමාජ වගකීම් වැඩ සටහන්වල අරමුණ විය.

රටේ තිරසාර සංවර්ධනය උදෙසා දායක වෙමින් ජනතාවගේ අවශ්‍යතා සපුරාලීමේ අරමුණු සුරැකිව රැකගනිමින් බැංකුව ආයතනික සමාජ වගකීම් වැඩසටහන් ආරම්භ කරන ලදී. දීඝවාපිය යථා තත්වයට පත් කිරීමේ ව්‍යාපෘතිය සඳහා මූල්‍යාධාර ලබාදීමේ අරමුණින් බැංකුව කම්කරුවන්ට නවාතැන් පහසුකම් ලබාදීම, කැනීම් සහ හදුනාගත් යටිතල පහසුකම් සඳහා අරමුදල් යෙදවූ අතර වසර තුල කරන ලද ප්‍රධාන ආයතනික සමාජ වගකීම් වැඩ සටහන් වලින් එකක් ලෙස මෙය සාක්ෂි දරනු ඇත. තවද, උතුරු හා දකුණු ප්‍රදේශවල ජනතාවට සමාජ හා ආර්ථික වශයෙන් යා කිරීමේ අභිප්‍රාය පෙරදැරිව යාපනය දුම්රිය ස්ථානය ගොඩ නැගීම භාර ගනු ලැබීය.

මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම

නිරන්තරයෙන් වෙනස් වන සුළු මෙන්ම, ඉහළ ගුණාත්මක භාවයක් අපේක්ෂා කරන ගණුදෙණු කරුවන් තෘප්තිමත් කිරීම සඳහා මානව ප්‍රාග්ධනය මෙන්ම, අවශ්‍ය යටිතල පහසුකම් සැපයීමේ අභියෝගය පිළිබඳ අපිට පූර්ණ අවබෝධයක් ඇත. තරගකාරිත්වයෙන් යුතු ඉහල ඉල්ලුමකින් හෙබි අපගේ වෙළඳ කටයුතු, තොරතුරු තාක්ෂණික ආර්ථිකය මත ස්ථාන ගත කර ඇත. ශක්තිමත් හා ඔරොත්තු දිය හැකි මෙහෙයුම් හැකියාවන් ලබාදීම අත්‍යාවශ්‍ය වන අතර බැංකු ක්ෂේත්‍රයට පමණක් සීමා නොවන සීග්‍රයෙන් වෙනස් වන පාරිභෝගික රුචිය සපුරාලීම සඳහා නොකඩවා සිදුකරනු ලබන නව්‍යකරණයන් අවශ්‍ය වේ. අපගේ ව්‍යාපාර කටයුතු ස්ථාවරව,ක්‍රියාකාරිව පවතිනුයේ අපගේ කාර්යය මණ්ඩලයේ මෙන්ම, පද්ධති හා ක්‍රියාවලියේ ගුණාත්මක බව නිසාය. ලංකා බැංකුවේ කතාන්දරය වඩාත් සිත් ඇද ගනු ලබන්නේ ක්ෂේත්‍රය පිළිබඳ අපගේ සේවක මණ්ඩලය සතු තාක්ෂණික හැකියාව, ඔවුන්ගේ වෙළඳපළ දැනුම හා පළපුරුද්ද හේතුවෙනි. එබැවින් මෙම ක්ෂේත්‍රයන් තුල අප අඛණ්ඩව ආයෝජනය සිදුකරන්නෙමු.

අනාගත දැක්ම

අපි 2013 වසරට පිවිසියේ ඉදිරි අභියෝග පිළිබඳ ඡායාමාත්‍ර රූපයක්ද දකිමිනි. යුරෝපය හා ඇමෙරිකාව ප්‍රතිසංස්කරණ කාල පරිච්ඡේදයක් පසුකරමින් සිටින අතර එවැනි ප්‍රතිසංස්කරණවල බලපෑම ලෝකයේ සියලු කොටස්වලට අත්විඳිමට සිදුව ඇත. වර්තමාන පොළී අනුපාත ක්‍රමය සැලකීමේදී නිසැකවම බැංකු අංශයට ද්‍රවශීලතාවය හා වත්කම්වල ගුණාත්මකභාවය පිළිබඳ අභියෝගවලට මුහුණ දීමට සිදුවනු ඇත. පොළී අනුපාත ස්ථාවර කිරීමේ අරමුණින් දේශීය වශයෙන් අරමුදල් එකරැස් කිරීමේ තරඟකාරිත්වය ලිහිල් කිරීම සඳහා වඩ වඩාත් විදේශීය ප්‍රභවයන් කෙරෙහි අවධානය යොමු කිරීමට සිදුවනු ඇත. බැංකුවට සිය අනාගත අභියෝගවලට මුහුණ පෑමට හැකිවන පරිදි ස්ථානගත කිරීම පිණිස මානව සම්පත් පදනම ප්‍රසාරණය කිරීමත් වර්තමාන තාක්ෂණික පදනම ඉහල තලයකට ගෙන ඒම මෙන්ම නව තාක්ෂණය පදනම් වූ විසඳුම් සෙවීම හදුන්වා දීමත් 2013 වසරේ ප්‍රමුඛතාවය වේ.

ස්තුතිය

පාරිභෝගිකයින්ට ඔවුන්ගේ තිරසාර සහයෝගය හා කැපවීම වෙනුවෙන් අපගේ ප්‍රසංශාව බැංකුව වෙනුවෙන් පළ කිරීමට කැමැත්තෙමි. විගණනකරුවන්, නීති උපදේශකයින්, ඇතුළු අනෙකුත් උපදේශකයන් හා මාධ්‍යවේදීන්ගේ දායකත්වය සම්බන්ධයෙන් කෘතඥතා පූර්වකව ස්තුතිවන්ත වෙමි. බැංකුවේ ප්‍රගතිය උදෙසා බැංකුවේ වෘත්තීය සංගම් ගන්නා ලද ස්ථාවරයන් අතිශයින් අගය කරමි.

වසර කිහිපයක් තිස්සේ බැංකුවට හා මා වෙත වෙහෙස නොබලා දක්වන ලද සහයෝගය සම්බන්ධයෙන් මහා කළමනාකාර තුමා, ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ කාර්ය මණ්ඩලයට මම කෘතඥ වෙමි.

අතිගරු ජනාධිපතිතුමාටත්, ගරු මුදල් හා ක්‍රම සම්පාදන නියෝජ්‍ය ඇමතිතුමාටත්, භාණ්ඩාගාරයේ ලේකම් තුමාටත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාටත් මාගේ හෘදයංගම ස්තුතිය හිමිවේ. මාගේ අධ්‍යක්ෂ මණ්ඩලය හැමවිටම සහයෝගය දැක්වූ අතර ඔවුන්ට ස්තුති කිරීමටත් සුභ පැතීමටත් කැමැත්තෙමි.

ලංකා බැංකුවේ සභාපති වශයෙන් මෙය මාගේ අවසාන වාර්තාව වන බව සඳහන් කිරීමට කැමැත්තෙමි. 2013 ජනවාරි 08 වන දින සභාපති තනතුරින් මා සමුගන්නා අතර බැංකුව තවදුරටත් ඉහල ස්ථානයකට ඔසවා තැබීමේ කාර්යය මාගේ අනුප්‍රාප්තිකයාට භාර දෙන්නෙමි.

ඔබ සියලු දෙනාටත් ලංකා බැංකුවටත් සුභ පැතීමට කැමැත්තෙමි.



ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ
සභාපති

2013 ජනවාරි 07
කොළඹ දීය.

නව සභාපතිතුමාගේ පණිවුඩය

ඉදිරි දැක්ම

“ඉහළ වර්ධනයක් සහ ආර්ථිකය තුළ වැඩි විභවයක් දක්වන අංශයන් තුළ ලංකා බැංකුව වඩාත්ම ජනප්‍රිය බැංකුව කිරීම පිණිස නව සේවාවන් හඳුන්වා දීමටත්, අපගේ ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමටත් අපි උත්සාහ කරන්නෙමු.”



රාසික් සරුක්
සභාපති

නව සභාපතිතුමාගේ
පණිවුඩය

ඉදිරි දැක්ම...

ප්‍රථමයෙන්, ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයටත්, හිටපු සභාපතිතුමාටත් මාගේ ප්‍රශංසාව පල කිරීමට කැමැත්තෙමි. මුදල් අමාත්‍ය තනතුර හොබවන අතිගරු ජනාධිපතිතුමාගේද, ගරු නියෝජ්‍ය මුදල් අමාත්‍යතුමාගේ ද, භාණ්ඩාගාර ලේකම්තුමා සහ නියෝජ්‍ය ලේකම්වරු ඇතුලූ කාර්ය මණ්ඩලයේ ද නිරන්තර මඟපෙන්වීම සහ සහයෝගය යටතේ සමාලෝචිත කාලසීමාව තුළදී පෙර නොදුටු විරූ ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම උදෙසා බැංකුව මෙහෙයවීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකි විය. තවද, මහ බැංකු අධිපතිතුමා, නියෝජ්‍ය අධිපතිවරුන් හා නිලධාරීන්ගේ මඟපෙන්වීම හා සහයෝගය ද මා අගයමි.

ලංකා බැංකුව දීර්ඝ කාලයක් අඛණ්ඩව එහි ශේෂ පත්‍රය වර්ධනය කර ගැනීමට කටයුතු කර ඇති අතර ජාත්‍යන්තර වශයෙන් එහි සන්නාම වටිනාකම වැඩි කර ගැනීමට ද සමත්ව ඇත.

ඉදිරි ගමන්මග සත්‍ය වශයෙන්ම අභියෝගාත්මක වුවද, මහා කළමනාකාරතුමාගේ මඟ පෙන්වීම යටතේ පළපුරුදු විවිධ හැකියාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීම ඔස්සේ අපගේ තිරසාර වර්ධනය ලඟා කරගත හැකි බව මාගේ විශ්වාසයයි.

පසුගිය වසර කිහිපය තුල වැඩි වූ වත්කම් ප්‍රමාණයට සාපේක්ෂව ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය වැඩි දියුණු කිරීමට අපි අවධානය යොමු කරන්නෙමු.

ඉහළ වර්ධනයක් සහ ආර්ථිකය තුළ වැඩි විභවයක් දක්වන අංශයන් තුළ ලංකා බැංකුව වඩාත්ම ජනප්‍රිය බැංකුව කිරීම පිණිස නව සේවාවන් හඳුන්වා දීමටත්, අපගේ ආදායම් මූලාශ්‍ර විවිධාංගීකරණය කිරීමටත් අපි උත්සාහ කරන්නෙමු.

තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයත් එමෙන්ම ජංගම දුරකථන මත කෙරෙන බැංකු කටයුතු සඳහා යටිතල පහසුකම් වර්ධනය කිරීම වෙනුවෙන් තවදුරටත් ආයෝජනයන් සිදුකිරීමට කටයුතු කරන අතර ලංකා බැංකුව තුළ නව තාක්ෂණය ව්‍යාප්ත කිරීමට සියලු උත්සාහයන් දැරීමට කැපවෙමු. ඒ අනුව තාක්ෂණ හිතකාමී පාරිභෝගික පදනමක් වර්ධනය කිරීමේදී පැන නඟින අවශ්‍යතාවයන්ට මුහුණ දීම සඳහා කළමනාකරණ කාර්ය මණ්ඩලය පුහුණු කිරීමටත්, උපදෙස් දීමටත් එමඟින් ඉහල ඵලදායීත්වයක් අරමුණු කරගත් හෘදයාංගම ආයතනික සංස්කෘතියක් නිර්මාණය කිරීමටත් අපි සියලු වෑයම් දරන්නෙමු.

බැංකුවෙහි ඉදිරි ගමනේදී ජාත්‍යන්තර තලයේ ඇති නව ප්‍රවනතා මෙන්ම ඉපැරණි වෙළඳ සංස්කෘතික වටිනාකම් ගවේෂණය කිරීමට ද අපි කටයුතු කරන්නෙමු. කෙසේ වුවද අපගේ ගමන් මඟ හැම විටම සුමට නොවන බව අපි සැලකිල්ලට ගන්නෙමු. අපගේ ගමන් මඟ සුමට වන තරමට ප්‍රවේශමීකාරී විය යුතු සේම අවදානම් තක්සේරු කිරීමටත් විය කළමනාකරණය කිරීමටත් සුදානම් විය යුතුය. ඒ අනුව ඉදිරි අභියෝගයන් සම්බන්ධයෙන් කළමනාකාරිත්වයේ අවධානය යොමු වී තිබෙන බවත් බැංකුවේ තිරසාරත්වය සහ මූල්‍ය ශක්තිය තහවුරු කරගැනීමටත් අත්පත් කරගත් වර්ධනය ආරක්ෂා කර ගැනීමටත් ඉදිරි වසර තුන සඳහා වූ ආයතනික සැලැස්ම සකස් කර තිබෙන බව මම ප්‍රකාශ කරමි.

“ලංකා බැංකුව දීර්ඝ කාලයක් අඛණ්ඩව එහි ශේෂ පත්‍රය වර්ධනය කර ගැනීමට කටයුතු කර ඇති අතර ජාත්‍යන්තර වශයෙන් එහි සන්නාම වටිනාකම වැඩි කර ගැනීමට ද සමත්ව ඇත.

ඉදිරි ගමන්මග සත්‍ය වශයෙන්ම අභියෝගාත්මක වුවද, මහා කළමනාකාරතුමාගේ මඟ පෙන්වීම යටතේ පළපුරුදු විවිධ හැකියාවන්ගෙන් සමන්විත කාර්ය මණ්ඩලයේ දැඩි කැපවීම ඔස්සේ අපගේ තිරසාර වර්ධනය ලඟා කරගත හැකි බව මාගේ විශ්වාසයයි.”

සියලුම පාර්ශ්වකරුවන් අතර යහපාලනයේ සාරගුණය ව්‍යාප්ත කරමින් වෘත්තීයමය සංස්කෘතියක් නිර්මාණය කිරීමට කටයුතු කරන්නෙමු. අනාගතයේ සිදුවියහැකි අවදානම් වලට මුහුණ පෑමට හැකියාවක් ඇති සුදුසු පරිසරයක් නිර්මාණය කරමින් බැංකුවේ අනාගතය සෞභාග්‍යමත් කිරීම සඳහා 9000 කට අධික වෘත්තිකයන්ගේ සැඟවුණු දක්ෂතා හා හැකියාවන් ධන නිධානයක් ලෙස සලකා ඔවුන්ට සවන් දීම, ගරු කිරීම හා දක්ෂතා ගවේශණය කල යුතුය. අතීතයේ සිදුවූ වැරදීම් බාධාවක් ලෙස නොව ශක්තියක් ලෙස සලකනු ඇත.

ලංකා බැංකුව රටේ ආර්ථික ගමන්මග මුලුමනින්ම ඒකාබද්ධ කිරීමටත් එහි දේශීය මෙන්ම විදේශීය වශයෙන් සීඝ්‍ර පරිනාමයක් සඳහා ඉඩහසර සැලසීමටත් එමඟින් ලංකා බැංකුව අනාගත පරපුරෙහි තේරීම බවට පත් කිරීමටත් අපි කැපවෙමු.

රාසික් සරූක්

සභාපති

2013 මාර්තු 21
කොළඹ දීය.

මහා කළමනාකාරතුමාගේ සමාලෝචනය

“අපගේ විශිෂ්ට මූල්‍ය තත්ත්වය ඔස්සේ, වසර තුළ සියලු පළාත් පුරා විසිරුණු සමස්ත මූලික බැංකු කටයුතු වලින් ශක්තිමත් වූ සමබර කාර්යසාධනය පිළිබිඹු විය.”

කේ. ධර්මසිරි
මහා කළමනාකරු

මහා කළමනාකාරතුමාගේ

සමාලෝචනය

2012 වසර බැංකුව සඳහා සාර්ථක ප්‍රතිඵල ගෙනදුන් අති විශිෂ්ඨ වසරක් ලෙස ප්‍රථමයෙන් මා සඳහන් කිරීමට කැමැත්තෙමි. ඒ වසර සඳහා සැලසුම්කල බදු පෙර ලාභය 5% කින් ඉක්මවමින් රු. බිලියන 19.8 දක්වා ලඟා වෙමින්ද බැංකුවේ වත්කම් රුපියල් ට්‍රිලියනය පසුකරමින් රු. ට්‍රිලියන 1.048 දක්වා ලඟා වීමද නිසාය. 2009 වසරේ බැංකුවේ ආයතනික උදාන පාඨය **"One Ten 12"** අනුව 2012 දී බැංකුවේ වත්කම් රුපියල් ට්‍රිලියනයක් (බිලියන දහසක්) සහ බැංකුවේ ලාභය රුපියල් බිලියන දහයක් ඉක්මවමින් සියළු ඉලක්කයන් හා අපේක්ෂිත ප්‍රථිපල අත්පත් කර ගැනීමට හැකි වූ බව ආඩම්බරයෙන් දැනුම් දෙමු.

2012 ප්‍රතිඵල සාක්ෂාත් කර ගනු ලැබුයේ නිතර වෙනස් වන වෙළඳපළ තත්ත්වයන් යටතේ වූ අභියෝගයන්ට මුහුණ දෙමිනි. පසුගිය වසරට වඩා 20% ක වර්ධනයක් සමග සමාලෝචනයට ලක්වූ වසර තුල බදු පෙර ලාභය රු. බිලියන 19.8 ක් කරා ලඟා වෙමින් එහි අපේක්ෂිත ඉලක්කයන් බලාපොරොත්තු වූවාටත් වඩා ඉහළින් ලබා ගැනීමට බැංකුවට හැකි විය. එය ලංකා බැංකු ඉතිහාසයේ මෙන්ම බැංකු කර්මාන්තය තුල ලැබූ ඉහළම ලාභය විය. පෙර වසර හා සැසඳීමේදී 25% ක වර්ධනයක් පෙන්වමින් බැකුවේ මුළු වත්කම් රු. ට්‍රිලියන 1.048 දක්වා ලඟා විය. බැංකුවේ දළ ණය හා අත්තිකාරම් 27% ක වර්ධන අනුපාතයක් පෙන්නුම් කළ අතර එය රු. බිලියන 153 කින් වැඩිවිය. කර්මාන්තයේ පවතින අනුපාතයට සමාන වෙමින් පසුගිය වසරට සාපේක්ෂව 16% ක වර්ධනයක් පෙන්නුම් කරමින් 2012 වසරේදී රු. බිලියන 693 ක තැන්පතු රැස් කිරීමට බැංකුව සමත් විය. අක්‍රිය ණය අනුපාතය කලින් වසරේ පැවති 2.1% සිට 2.8% දක්වා වර්ධනයක් පෙන්නුම් කරමින් වත්කම්වල ගුණාත්මකභාවය පීඩනයට පත්ව පැවතුනද අපගේ වත්කම්වල ගුණාත්මකභාවය තවමත් කර්මාන්තයේ පිළිගත් සීමාවන් තුල පවතී. පසුගිය වසර තුල සියලු පළාත් පුරා විසිරී ඇති සමස්ථ මූලික බැංකු කටයුතුවලින් ශක්තිමත් හොඳින් සමබර වූ කාර්යසාධනය තුළින් අපගේ විශිෂ්ඨ මූල්‍ය තත්ත්වයන් විදහා දැක්වින.

ජාතියේ පහන් ටැඹ වූ අපගේ සලකුණ දීප ව්‍යප්තව සටහන් කරමින් ශාඛා ජාලය ව්‍යාප්ත කිරීම අපි අඛණ්ඩව කරන්නෙමු. අපගේ ශාඛා ජාලය ශාඛා 324 කින්ද, ව්‍යාප්ති කාර්යාල 276 කින්ද සුලු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ප්‍රවර්ධන මධ්‍යස්ථාන 10 කින්ද, ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර 451 කින්ද වශයෙන් වූ පාරිභෝගික සේවා ස්ථාන දහසකට වඩා වැඩි සංඛ්‍යාවකින් සමන්විතය. විදේශීය ප්‍රේෂණ සහ අනේවාසික විදේශීය මුදල් තැන්පතු තවදුරටත් තහවුරු කිරීම සඳහා විදේශවල සිටින නියෝජිතයින් සංඛ්‍යාව 859 දක්වා වර්ධනය කළෙමු.

ප්‍රථම වතාවට අප, මූඩීස් (Moody's) සහ ෆිච් (Fitch) යන ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ නියෝජිත ආයතන මඟින් ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම් ලද අතර, බැංකුවේ ශක්තිමත්භාවය හා අඛණ්ඩව නොසැලී සිටීමේ හැකියාව හේතුවෙන් ශ්‍රී ලාංකීය රාජ්‍ය සුරැකුම් වලට සමානව ශ්‍රේණිගත වීමට හැකි විය. තවද දේශීය වශයෙන් දිනා ගත් ෆිච් ශ්‍රේණිගත කිරීම්හිදී AA+ ස්ථානය රැකගැනීමටද සමත් විය. ගෞරවාදරයට පත්වූ "ද බෑන්කර්" නම් ජාත්‍යන්තර සඟරාවේ තක්සේරුවලට අනුව ලෝකයේ හොඳම බැංකු දහස අතර සිටීමට අපහට අඛණ්ඩව හැකිවිය.

වෙළඳ කටයුතු සම්බන්ධයෙන් වූ අපගේ විශිෂ්ඨභාවය ශ්‍රී ලංකාවේ වාණිජ මණ්ඩලය එහි වාර්ෂික සම්මාන උළෙලේදී පිළිගනු ලැබුවේ බැංකු අංශය සඳහා වන රන් පදක්කමද, මහා පරිමාණ ව්‍යාපාර කාණ්ඩය සඳහා වන රිදී පදක්කමද, සමස්ථ කාණ්ඩය සඳහා වන ලෝකඩ පදක්කමද වශයෙන් සම්මාන ත්‍රිත්වය අපහට පිළිගන්වමිනි. මෙම ප්‍රදානයන් කරනු ලබන්නේ දස වැදෑරුම් තක්සේරු නිර්නායක පදනම් කරගෙන වන අතර ඒවාට ඇතුලත් වන්නේ මූල්‍ය කාර්යසාධනය, විදේශීය බැංකු කටයුතු, තාක්ෂණය, පරිමාව ගොඩනැගීම, යහපාලනය සහ ආයතනික සමාජ වගකීම සඳහා බැංකුව කරන ආයෝජනයන් ආදියයි.

ඉතා ඥාණාන්විතව ගොඩනැගූ අපගේ ආයතනික සැලැස්ම මඟින් බැංකුවෙහි අරමුදල් සපයා ගැනීමේ උපායමාර්ග ක්‍රියාවට නැඟුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ඇමරිකානු ඩොලර් මිලියන 500 ක් රැස් කිරීම සඳහා මුල්ම ජාත්‍යන්තර ලැයිස්තුගත බැඳුම්කර නිකුත් කෙරුණු අතර 7.7 ගුණයක අධි සහභාගීත්වයක් සඳහා ජාත්‍යන්තර ආයෝජකයින්ගේ ඉල්ලුමක් විය. බැඳුම්කර සඳහා මෙසේ අතිවිශාල ආකාරයෙන් වැඩිපුර දායකවීම අපගේ ලෝක පිළිගැනීම හා ජාත්‍යන්තරයට ලඟාවීම සහතික කරයි. මෙම නිකුතුව හරහා මධ්‍යම පරිමාණයේ සිට අතිවිශාල පරිමාණයේ අරමුදල් රැස් කිරීම දක්වා ජාත්‍යන්තර ආයෝජකයින් වෙත ලඟා වීමට අනාගතයේ ඕනෑම නිකුතුවක් කරන්නෙකුට දොරටුව අපි විවෘත කර තිබේ. අපගේ ශේෂ පත්‍රය තුළ සිටින ආයෝජකයින්ගේ විවිධත්වය සම්බන්ධයෙන් අපි ආඩම්බර වෙමු. බැඳුම්කර වලින් ලැබුනු මුදල්, පොළී අනුපාත ස්ථාවර මට්ටම්වල තබා ගනිමින් කළමනාකරණය කිරීමට, බැංකුවට මෙන්ම මුළු පද්ධතියටම ප්‍රමාණවත් ද්‍රවශීලතාවයක් ලබා දුනි. පහළ පිරිවැයකින් යුතු තැන්පතු පදනම නිරතුරුව තබා ගැනීම සඳහා "ඕඕසී මෙගා වාසි" නමින් අවුරුද්ද අවසානයේ විශේෂ තැන්පතු ප්‍රවර්ධන වැඩ සටහනක් දියත් කරන ලදී. ඊට අමතරව අනේවාසික විදේශ මුදල් ප්‍රවර්ධනය කිරීම සඳහා වැඩ සටහන් කිහිපයක් වසර පුරාම දියත් කරන ලදී.

ආර්ථික සංවර්ධන කටයුතුවල යෙදෙන රාජ්‍ය බැංකුවක් වශයෙන් අපගේ කාර්යභාරය ඉටු කිරීම පිණිස සමාලෝචනයට භාජනය කරනු ලබන වර්ෂය තුල බොහෝ ණය යෝජනා ක්‍රම හදුන්වා දෙන ලදී. "සිරිලිය සවිය" නමින් අඩු පොළියට ණය ලබා දෙන විශේෂ ණය ක්‍රමයක් ආරම්භ කරන ලද්දේ සමාජයේ අභිමානය සහිතව නැඟී සිටීම සඳහා යුධ ගැටුම් හේතුවෙන් වැන්දඹු වූවන් හා විශේෂයෙන් යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් ඇතුලත් සුළු පරිමාණ ආයෝජකයින් ඒල්ල කරගනිමිනි. ආයෝජකයින් 3282 අතර රු. මිලියන 474 ක් ප්‍රදානය කරමින් එය අතිශයින් සාර්ථක විය. ඊට අමතරව රටේ කෘෂිකාර්මික නිෂ්පාදනයට දැඩි ලෙස බාධා පැමිණුනු අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් තවදුරටත් ණය නැවත අයකර ගැනීම සහ වත්කම්වල ගුණාත්මකභාවය මත පීඩනයක් ඇති කරමින් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ මූල්‍ය පාලනය ට බාධා ඇති විය. ගංවතුරින් හා නියගයෙන් පීඩාපත් අයට ණය ගෙවීම සඳහා තවත් සහන කාලයක් ලබාදුන් අතර ඔවුන් එම තත්ත්වයෙන් මුදා ගැනීම පිණිස තවදුරටත් මූල්‍ය සහන ප්‍රදානය කරන ලදී. ධීවර අංශය සඳහා වූ "දියවර දිරිය" හා "දියවර සවිය" ණය යෝජනා ක්‍රම

යටතේ රුපියල් මිලියන 913 ක මුදලක් ප්‍රදානය කරන ලදී. වතු අංශයේ සේවකයන්ට ණය යෝජනා ක්‍රම, උතුරු පිබිදීම, නැගෙනහිර නවෝදය, උයන්වතු වගාව සඳහා වූ ණය ක්‍රමය, ත්‍රී රෝද රථ සහ කුඩා ප්‍රවාහන රථ මිළදී ගැනීම සඳහා ආදී වෙනත් ණය යෝජනා ක්‍රම සඳහා බැංකුව ප්‍රතිලාභීන් 67,233 දෙනකු සඳහා රු. මිලියන 6,194 ක මුදල් ප්‍රදානය කරන ලදී.

යටිතල පහසුකම් වැඩි දියුණු කිරීමේ රජයේ ප්‍රතිපත්තියට අනුගාමීව, විශේෂයෙන්ම මාර්ග සංවර්ධන අංශය ඇතුලත් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල් යෙදීම බැංකුව ආරම්භ කළේය. ව්‍යාපෘති කිහිපයක් දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර මෙම අංශයට බැංකුවේ සහයෝගය අඛණ්ඩව ලබා දෙනු ලැබේ. ශ්‍රී ලංකාවේ ඉතා සීඝ්‍රයෙන් දියුණු වෙමින් පවතින සංචාරක කර්මාන්තයට උදව් කිරීම සඳහා කොළඹ සහ පිට පළාත් වල හෝටල් සංවර්ධන ව්‍යාපෘතිවලට සැලකියයුතු විශාල පහසුකම් ලබාදීම දැනටමත් අනුමත කර ඇත.

වර්තමානයේ පොළී අනුපාත සහ විනිමය අනුපාත වල සංචලතාවයන්ද දේශීය ද්‍රවශීලතාවය කෙරෙහිද පීඩනයක් එල්ල වී ඇති අතර එයින් ලාභදායීත්වය අඩුවෙමින් පවතී. කර්මාන්තය තුල සෑම තරඟ කරුවකුගේම දළ පොළී ලාභය අඩුවීමෙන් මෙය විද්‍යාමාන වේ. එතෙකුදු වුවත්, 2012 වසරේ අභියෝගාත්මක පරිසරයට මුහුණ දීම සඳහා රටේ මූල්‍ය සහ මූල්‍ය කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රමාණවත් විය.

මානව සම්පත් අංශයෙන් ගත්කල, ඉදිරි වසර තුනක කාලය සඳහා බලය හිමි ප්‍රධාන සේවක වෘත්තීය සමිතිය සමග සාමූහික ගිවිසුමකට අත්සන් තැබීමට අප හට හැකිවිය. බැංකුවේ අවුරුදු 25 ක සේවය සම්පූර්ණ කර ඇති 418 ක සේවක පිරිස අපි ඇගයුවෙමු. තවදුරටත් බැංකුවට අතිවිශාල සේවක පිරිසක් බදවා ගැනීම සඳහා ආශ්‍රිත ක්‍රියාවලින් අවසන් කර ඇත. කාර්ය මණ්ඩලයට තව දුරටත් සුභසාධන ප්‍රතිලාභ ලබාදීම සඳහා නුවරඑළිය හා අනුරාධපුරයේ ඇති නිවාඩු නිකේතනවලට වැඩි ධාරිතාවයක් එකතු කරමින් වැඩි දියුණු කරන ලදී.

බැංකුව ඉතා සාර්ථකව එහි මූල්‍ය ප්‍රකාශන නව ගිණුම්කරණ ප්‍රමිතයනට අනුකූල වන ලෙස පරිවර්තනය කල අතර ඒ සඳහා “නව ගිණුම්කරණ ප්‍රමිත අනුකූලතා ඒකකයක්” පිහිටවූයේ අනාගත මූල්‍ය වාර්තාකරණයේදී බැංකුව විසින් මුහුණ දෙනු ලබන සංකීර්ණතාවයන් හඳුනාගත් බැවිනි. බැංකුවෙහි ප්‍රමාණයෙහි සහ කටයුතු වල සංකීර්ණත්වය හේතු කොටගෙන මෙම මූල්‍ය ප්‍රකාශ පරිවර්තනය කිරීම ඉමහත් පරිශ්‍රමයක් යොදා සිදුකළ යුතු අතර අපගේ පැහැදිලි කැපවීම හා සුදානම හේතුවෙන් එම ක්‍රියාවලිය සාර්ථක විය.

මාලදිවයිනෙහි සංචාරක කර්මාන්තය එහි දේශපාලන තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වූ නිසා සාමාන්‍ය ණය නැවත අය කර ගැනීමේ ගැටලුවකට මාලදිවයිනෙහි මෙහෙයුම් වලදී මුහුණ පෑමට සිදු වූවද චෙන්නායි හා මාලදිවයිනෙහි ලාභ වාර්තාකරණයේදී වෙළඳ මෙහෙයුම් සහ වර්ධනය පිළිබඳ සෑහීමකට පත්විය හැකිය. එක්සත් රාජධානියේ මෙහෙයුම් පාඩු නොවන තත්ත්වයකට ගෙන ඒමට අවශ්‍ය වන අතර තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා විධිවිධාන දැනටමත් යොදා ඇත.

අපගේ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් ද බැංකුවට ලාභාංශ ගෙවමින් වසර තුල සාර්ථක කාර්ය භාරයක් ඉටු කළෝය. වසර තුල අඛණ්ඩ සමාලෝචන කාර්යාවලියේ කොටසක් වශයෙන් බැංකුව පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල අධ්‍යක්ෂ මණ්ඩල සමග කාර්යසාධන සමාලෝචන පවත්වන ලදී.

ආයතනික සමාජ වගකීම් මැනවින් අවබෝධ කරගනිමින් නිරතුරුවම ඉටුකිරීමට අප කටයුතු කළ අතර එය මෙම වාර්තාවේ තිරසාරත්වය පිළිබඳ කොටසෙහි විස්තරාත්මකව නිරූපණය කර ඇත.

ඉදිරි මග

බැංකුවේ ඊළඟ පියවර වශයෙන්, 2013 සිට 2015 දක්වා අවුරුදු තුනක කාලසීමාවක් සඳහා වූ නව ආයතනික සැලැස්ම 2012 නොවැම්බර් මසදී ස්ථාපනය කරන ලදී. කර්මාන්තයේ තරඟකාරී කාර්යසාධන අනුපාත සමග මධ්‍යස්ථවූත් හා ස්ථාවරවූත් වර්ධනයක් හරහා බැංකුවේ ස්ථාවරත්වය ඇති කිරීම නව සැලැස්මෙහි මූලික අරමුණු වේ. කටයුතු විවිධාංගීකරණය කරමින්ද, පාරිභෝගික සේවා සැලසුම වැඩිදියුණු කරමින්ද සහ විදේශීයව බැංකුවේ නියෝජනය ඉහළ දමමින්ද වඩා හොඳ ප්‍රතිඵල ලඟාකරගැනීම සඳහා සංවිධාන ව්‍යුහය සමාලෝචනය කරනු ඇත. ජනවාරි 08 වන දින මා විශ්‍රාම ගැනීමට නියමිත වන අතර, නව සැලැස්ම මූලික වශයෙන් දියුණු කිරීමේ හැකියාවක් ඇති සහ බැංකුව ඉහලට ඔසවා තබමින් එය ක්‍රියාත්මක කල හැකි නව මහා කළමනාකාරතුමාට යෂ්ටිය භාර දීමට කැමැත්තෙමි. මම ඔහුට සුභ පතන අතර ඔහුගේ සියලුම කාර්යයන් සාර්ථක වේවායි ප්‍රාර්ථනා කරමි.

ස්තුතිය

අපගේ පක්ෂපාති පාරිභෝගිකයින් ඔවුන්ගේ විශ්වාසය අප වෙත තබමින් දක්වන ලද සහයෝගය අගය කරන අතර අපගේ ආයනයේ සිහිනය සැබෑ කර ගැනීමට අප සමඟ සිටීම සම්බන්ධයෙන් ඔවුන්ට මම කෘතඥ වෙමි.

භාණ්ඩාගාරයේ ලේකම්තුමා, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමා, විගණකාධිපතිතුමා, නීතිපතිතුමා, සහ වීම ආයතනවල සියලුම නිලධාරීන් දැක්වූ සහයෝගය සම්බන්ධයෙන් මම කෘතඥ වෙමි. නව විගණන ප්‍රමිතීන්ට අනුව අපගේ මූල්‍ය ප්‍රකාශ සංගත කිරීම සඳහා සහභාගී වූ උපදේශකයින් හා විවැනි විගණන උපදේශකයින් සඳහා ස්තුති කිරීමට මෙම අවස්ථාව යොදා ගනිමි.

අපගේ අතිවිශිෂ්ඨ කාර්යසාධනයෙන් පිලිබිඹු වන්නේ සභාපතිතුමා සහ අධ්‍යක්ෂ මණ්ඩලය අප වෙත දක්වන ලද සහයෝගය සහ මග පෙන්වීමයි. ඔවුන්ට ස්තූති කිරීමට මම මෙය අවස්ථාවක් කර ගනිමි.

2012 වසරෙදී බැංකුවේ කාර්යසාධනය උදෙසා අති විශාල වශයෙන් දායක වූ, මට පෙර මෙම නිලය දැරූ ඩබ්ලිව් ඒ නාලිනී මැතිනියට මම අතිශයින් කෘතඥ වෙමි. ගුණාත්මකභාවය දියුණු කරමින්ද ආයතනික වටිනාකම් හා උසස් ආකල්ප රඳවා තබාගනිමින් අපගේ ආයතනික හා විධායක කළමනාකරණ කණ්ඩායමේද කැපවූ කාර්ය මණ්ඩල සාමාජිකයින් හා වෘත්තීය සමිතිද අපගේ ආයතනික දැක්ම සැබෑවක් බවට පරිවර්තනය කිරීම සඳහා නොමසුරු සහයෝගය ලබාදුනි. මගේ උණුසුම් ඇගයීම සහ ස්තුතිය නොමසුරුව ඔවුන් වෙත දිගුකරමි.



කේ. ධර්මසිරි
මහා කළමනාකරු

2013 ජනවාරි 07
කොළඹ දීය.

නව
මහා කළමනාකාරතුමාගේ
ඉදිරි දැක්ම

ලංකා බැංකු මාතාවගෙන් සමුගන්නා මහා කළමනාකාර/ප්‍රධාන විධායක නිලධාරී, ධර්මසිරි මහාතාගේ අනුප්‍රාප්තිකයා ලෙස 2013 ජනවාරි සිට මා එම තනතුරේ වැඩ බාරගත් අතර එය වසර 29 ක සේවා කාලය තුල මා ලද ඉහළම ජයග්‍රහණය වේ. ජාතිය ගොඩනගමින් සමෘද්ධිමත් දේශයක් කරා යන ගමනේදී, ලංකා බැංකුව උත්කෘෂ්ඨ මෙහෙවරක් සිදුකල යුතු සමයක, බැංකුව මෙහෙයවීමේ අතිශය භාරධුර කාර්යය මා වෙත පවරමින් මා කෙරෙහි විශ්වාසය තැබූ සභාපති තුමා ඇතුලු අධ්‍යක්ෂ මණ්ඩලයට කෘතඥතාපූර්වකව ස්තූතිවන්ත වෙමි. මාගේ පත්වීම පිළිගැනීම සම්බන්ධයෙන් මුදල් අමාත්‍යංශයට හා ශ්‍රී ලංකා මහා බැංකුවට ස්තූති කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි.

බැංකුවෙහි අතීත නායකයින්ගේ කැපවීම, පක්ෂපාතීත්වය සහ අවංකභාවයද, කාර්ය මණ්ඩලයේ දක්ෂතාවය සහ පාර්ශවකරුවන්ගේ ඉමහත් සහයෝගයද හේතු කොටගෙන ලංකා බැංකුව ශ්‍රී ලාංකේය බැංකු කර්මාන්තයේ අංක එක ස්ථානයට පත්වෙමින් දීර්ඝ ගමනක් පැමිණ තිබෙන බව ඉතාමත් සතුටින් සඳහන් කරමි. මා හද පිරි සතුටින් ඔවුන් සිහිපත් කරමි. ඒ අනුව, ලාංකේය බැංකු ක්ෂේත්‍රයේ ඉතා ඉහළ ව්‍යුහාත්මක වැදගත් කමකින් යුතු ලංකා බැංකුව ක්‍රමානුකූලව මෙහෙයවීමේදී එහි පවතින ගෞරවනීයත්වය විශ්වාසවන්ත බව සහ අවංකත්වය යන ප්‍රධාන සාධක කෙරෙහි ප්‍රමුඛත්වය ලබා දෙමින් අප තුළ පවතින සංස්කෘතික බැඳීම සහ කැපවීමෙන් ගොඩනගාගත් බැංකුවේ කීර්තිනාමය ඉදිරියටත් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය නායකත්ව වගකීම මම නොපිරිහෙලා ඉටු කරන්නෙමි.

ලාභ ඉපයීමේ පහසුදායි හා කෙටි මාර්ග අනන්තවත් ඇත. නමුත් මහජන විශ්වාසය වර්ධනය කරගනිමින් අතිවිශිෂ්ට විශ්වාසවන්ත ආයතනයක් ගොඩනැගීම සඳහා කෙටි මාර්ග නොමැත. ඒ සඳහා ඇත්තේ ඉමහත් කැපකිරීම් වලින් පිරි දුෂ්කර මාර්ගයකි. එබැවින් බැංකුවේ ඉතිහාසය බොහෝ මිනිසුන්ගේ කැපකිරීම් වලින් පොහොසත්ය. සුවිසල් නෞකාවක් බදු ලංකා බැංකුව යාත්‍රා කරවීම මාගේ රාජකාරිය වන අතර සාගරයක් තරම් වූ අභියෝග මැඩ ඉදිරියටම යාත්‍රා කරවීමට නව මාර්ගයන් හා ක්‍රම වේදයන් අවශ්‍ය වනු ඇත.

“සුදුසු දක්ෂතා ඒකරාශී කොට දියුණුවේ හිනිපෙත්ත කරා ලඟා වීමට අවශ්‍ය ධෛර්යය හා අවස්ථාවන් නිර්මාණය කිරීමෙන් ශක්තිමත් හා ස්ථායි අනාගතයක් වෙනුවෙන් කාර්ය මණ්ඩලය පෙලගැස්වීම සඳහා අප වැඩි වැඩියෙන් කටයුතු කරන්නෙමු. එහිදී තරුණ ජවයෙන් ද දැනුම් සම්භාරයෙන්ද සමන්විත වූ 9,000 ට අධික වත්මන් කාර්ය මණ්ඩලයෙහි, සියලුම ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි පුද්ගල හැකියාවන් සහ දක්ෂතාවන්ගේ වර්ධනය වෙනුවෙන් සිදුකරන ආයෝජන ප්‍රධානය.”

සුදුසු දක්ෂතා ඒකරාශී කොට දියුණුවේ හිනිපෙත්ත කරා ලඟා වීමට අවශ්‍ය ධෛර්යය හා අවස්ථාවන් නිර්මාණය කිරීමෙන් ශක්තිමත් හා ස්ථායී අනාගතයක් වෙනුවෙන් කාර්ය මණ්ඩලය පෙලගැස්වීම සඳහා අප වැඩි වැඩියෙන් කටයුතු කරන්නෙමු. එහිදී තරුණ ජවයෙන් ද දැනුම් සම්භාරයෙන්ද සමන්විත වූ 9,000 ට අධික වත්මන් කාර්ය මණ්ඩලයෙහි, සියලුම ක්ෂේත්‍රයන් ආවරණය වන පරිදි පුද්ගල හැකියාවන් සහ දක්ෂතාවන්ගේ වර්ධනය වෙනුවෙන් සිදුකරන ආයෝජන ප්‍රධානය. තවද සියල්ලන්ට ඔවුනොවුන් පිළිබඳව විශ්වාසය තබන සහ සියලු දෙනා කෙරෙහි විශ්වාසය තබන සංස්කෘතියක්, පරිසරයක් ගොඩනැගීම මගින් කණ්ඩායම් හැඟීම් මුදුන්පත්කොට උපරිම කාර්ය සාධනය උදෙසා මෙහෙයුම් ක්‍රම පරිවර්තනය කිරීමට අප වගබලා ගන්නෙමු.

බැංකුවේ සේවාස්ථානයන්ට නවමු පෙනුමක් ලබා දෙමින් නවීන යටිතල පහසුකම් වලින් යුතු ශාඛා ජාලයක් බවට පරිවර්තනය කිරීමටද, සේවා ව්‍යාප්තිය වර්ධනය උදෙසාද අඛණ්ඩව ආයෝජනය කරන්නෙමු. දැනටමත් විවෘත කර ඇති අපගේ සේවා මධ්‍යස්ථානවල තත්ත්වය වැඩි දියුණු කිරීමත්, සීමිත බැංකු සේවා සපයන ව්‍යාප්ති කාර්යාල පූර්ණ බැංකු සේවා සපයන ශාඛා බවට පරිවර්තනය කරමින් පාරිභෝගික සේවා සැපයීම වඩාත් ශක්තිමත් කිරීමටත් කටයුතු කරන්නෙමු.

කාර්යක්ෂම පාරිභෝගික සේවාවක් සඳහා අවශ්‍ය කළමනාකරණ ව්‍යුහයක් නිර්මාණය උදෙසා නවීන තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයන් හඳුන්වා දීමට සැලසුම් සකස් කොට ඇත. මෙහිදී අපගේ ප්‍රධාන බැංකු පරිගණක පද්ධතියෙහි සමස්ථ සේවා සැපයීමේ ධාරිතාව ඉහළ දැමීමටත්, අවදානම් කළමනාකරණ පද්ධති සහ ක්‍රියාවලි පද්ධතීන් ජත්‍යන්තරව පිළිගත් ප්‍රමිතීන්ට අනුව වැඩි දියුණු කිරීමටත් කටයුතු යොදා ඇත. මෙයට අමතරව, "ලංකා බැංකුව අනාගත පරපුරෙහි තේරීම" බවට පත් කිරීම සඳහා අනෙකුත් අවශ්‍යතා සඳහා මුල් පියවර තබා ඇත.

ඒ අනුව සියලු ලාංකිකයින්ගේ පීවන තත්ත්වය ඉහල නැංවීම සඳහා අප උපරිම ශක්තිය යොදවන්නෙමු.

ඩී.එම්. ගුණසේකර
මහා කළමනාකරු

2013 මාර්තු 21
කොළඹ දීය

අධ්‍යක්ෂ මණ්ඩලය

“ඔනෑම වර්ෂයක් තුළ වර්තාගත ආදායමක් සහ ලාභයක් සනිටුහන් කරන්නේ නම් එය අති සාර්ථක ප්‍රතිඵල උදාකරගත් වර්ෂයකි. අර්බුදකාරී දීර්ඝ කාලපරාසයක් තුල වර්ෂ ගණනාවක් පුරාවට වර්තාගත ප්‍රතිඵලයන් අත්පත් කර ගැනීම ලංකා බැංකු කාර්යමණ්ඩලයේ කැපවීම, ශික්ෂණය හා වෘත්තීයත්වය පිළිබඳ සාක්ෂියකි.”

නලිනි අබේවර්ධන මෙනෙවිය

ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ

කේ එල් හේවගේ මහතා

චන්ද්‍රසිරි ද සිල්වා මහතා

අධ්‍යක්ෂ

මණ්ඩලය

වී කනගසබාපති මහතා

රාජූ සිවරාමන් මහතා

එස් ආර් ආටිගල මහතා

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

අධ්‍යක්ෂ
මණ්ඩලය

ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ
සභාපති (2013 ජනවාරි 8 දක්වා)

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සභාපති වශයෙන් ගාමිණී වික්‍රමසිංහ මහතා 2007 මැයි මසදී පත් කරන ලද අතර 2010 මැයි මසදී නැවත වතාවක් එම ධූරයෙහි පිහිටුවන ලදී. ඔහු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස අදාල වර්ෂය තුළදී කටයුතු කළේය.

ආචාර්ය වික්‍රමසිංහ සතු ජාතික සහ ජාත්‍යන්තර මට්ටමේ ව්‍යාපාර පිළිබඳ අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩලීය කටයුතු සාක්ෂාත් කරගැනීමට උපකාරී විය. ඔහු විනිමය සහ සුරැකුම්පත් කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස 2006 සිට 2009 දක්වා කටයුතු කරන ලද අතර 2006 සිට 2008 දක්වා ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිධූරය දැරීය. ඔහු ලංකාවේ විශාලතම පරිගණක මෘදුකාංග සංවර්ධන ව්‍යාපාරයක් වන ඉන්ෆෝමැටික්ස් සමූහ ව්‍යාපාරයේ නිර්මාතෘ වේ. තවද ඔහු සී/ස ලංකා බැංකුව (යූ කේ) සමාගම, ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී, සී/ස සී බෑන්ක් හොලිඩේ හෝම්ස් (පුද්ගලික) සමාගම සහ සී/ස කොළඳෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම ආදීන්හි සභාපතීත්වයද සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගමේ සහ ලංකා හොස්පිටල්ස් කෝපරේෂන් පී එල් සී හි අධ්‍යක්ෂවරයෙකු ලෙසද අදාල වර්ෂය තුළදී කටයුතු කළේය.

ආචාර්ය වික්‍රමසිංහ සිය විද්‍යාපති උපාධිය පද්ධති විශ්ලේෂණය පිළිබඳව එක්සත් රාජධානියේ බර්මින්හැම්හි ඇස්ටන් විශ්ව විද්‍යාලයෙන් දිනාගත් අතර ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය එක්සත් රාජධානියේ මැන්චෙස්ටර් මෙට්‍රොපොලිටන් විශ්ව විද්‍යාලයෙන් ලබාගෙන ඇත. ඔහු එක්සත් රාජධානියේ වරලත් කළමනාකාරිත්ව ආයතනයෙහි අධිසාමාජිකත්වයද (FCMI) බ්‍රිතාන්‍ය පරිගණක සංගමයෙහි අධිසාමාජිකත්වය සහ (FBCS) සහ ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයෙහි අධිසාමාජිකත්වයද (FIB) දරයි.

රාසික් සරුක් මහතා
සභාපති (2013 ජනවාරි 9 සිට)

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති ලෙස 2013 ජනවාරි 9 වන දින පත් කරන ලද අතර ඔහු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

නීති ක්ෂේත්‍රයෙහිද කළමනාකරණ හා ව්‍යාපාර ක්ෂේත්‍රයන්හිද මනා පරිණතභාවයක් ඇති සරුක් මහතා රාජ්‍ය සහ රාජ්‍ය නොවන ආයතන විශාල සංඛ්‍යාවක් මෙහෙයවා පුළුල් අත්දැකීම් සම්භාරයක් උකහාගෙන ඇත. සමූපකාර තොග සංස්ථාවෙහිද (CWE), කෘෂි සංවර්ධන අධිකාරියෙහිද, ජාතික ජලජ පර්යේෂණ සහ සංවර්ධන අධිකාරියෙහිද (NARA) සභාපතීත්වය හොබවා ඇති සරුක් මහතා වීෂියන් හොටෙල්ස් කෝපරේෂන් ලිමිටඩ්, ලංකා කැනරීස් ලිමිටඩ්, සිලෝන් මැච් කම්පැනි ලිමිටඩ්, සතොස ඉන්පිනියරින් සර්විසස් ලිමිටඩ්, ජාතික ඇසුරුම්කරණ මූලස්ථානය සහ ඉන්ග්‍රීන් මුද්‍රණ ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයන්හි කටයුතු කර ඇත.

තවද ඔහු සතොස මෝටර්ස් ලිමිටඩ්, සතොස ප්‍රින්ටර්ස් ලිමිටඩ් සහ ලංකා මිල්ක්ෆුඩ් ලිමිටඩ් යන ආයතනයන්හි ප්‍රථම සභාපතිවරයා විය. සරුක් මහතා එවකට පැවැති යුගොස්ලොවියානු ෆෙඩරල් ජනරජයේ සහ හන්ගේරියාවේ තානාපතීත්වය හෙබවූ අතර සිංගප්පූරුවෙහි මහ කොමසාරිස්වරයා ලෙස ද කටයුතු කළේය.

වර්ෂ 1969 දී නීතීඥ සංගම් සාමාජිකත්වය ලද සරුක් මහතා ජ්‍යේෂ්ඨ ජනාධිපති නීතීඥ වරයෙක් වන අතර ඔහු අහමදාබාද්හි ඉන්දියානු කළමනාකරණ ආයතනයෙහි උපාධිධරයෙකි.

එස් ආර් ආටිගල මහතා
නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ

2010 ජූනි මසදී ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත්වූ අතර විධායක නොවන, නිල බලයෙන් පත් අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

ආටිගල මහතා බැංකුවේ ඉලක්කයන් සහ රජයේ පරමාර්ථයන් අතර සබැඳියාවන් ගොඩනගා ගැනීමේදී ඔහු සතු අත්දැකීම් සහ මූල්‍ය ක්ෂේත්‍රයේ දැනුම අධ්‍යක්ෂ මණ්ඩලීය කටයුතු සඳහා ලබා දෙයි.

ඔහු ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ජ්‍යේෂ්ඨ ආර්ථික විශේෂඥයෙකු ලෙස වසර ගණනාවක් සේවය කර ඇති අතර ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි අධ්‍යක්ෂවරයෙකු සහ වැඩබලන සභාපතිවරයා ලෙසද සී/ස ෂෙල් ගෑස් ලංකා සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කර ඇත.

වර්තමානයේ ඔහු භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා ලෙස කටයුතු කරයි. තවද, ඔහු වරාය අධිකාරියෙහි අධ්‍යක්ෂකවරයෙකු ලෙස ද, ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණයේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද, රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙහි නිරීක්ෂකවරයෙකු ලෙසද කටයුතු කරයි.

ආටිගල මහතා කොළඹ විශ්ව විද්‍යාලයේ ගණිතය පිළිබඳ විද්‍යාවේදී උපාධිධරයෙකු වන අතර එක්සත් රාජධානියෙහි වොර්වික් විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධියද හිමිකරගෙන ඇත.

රාජු සිවරාමන් මහතා
අධ්‍යක්ෂ

සිවරාමන් මහතා ලංකා බැංකුවෙහි අධ්‍යක්ෂ තනතුරට 2006 ජනවාරි මස දී ප්‍රථමයෙන් පත්වූ අතර නැවත එම තනතුරට 2007 ජූනි මසදී සහ 2010 මැයි මසදී පත්කරන ලදී. ඔහු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කරයි.

ගෘහ නිර්මාණ ක්ෂේත්‍රයේ සහ කළමනාකරණ ක්ෂේත්‍රයේ වසර 30කට අධික ඔහු සතු අත්දැකීම් සමඟම රාජ්‍ය සහ පුද්ගලික අංශයන්හි ඔහු සතු ව්‍යාපාර අත්දැකීම්ද අධ්‍යක්ෂ මණ්ඩලීය කටයුතු සඳහා ලබා දෙයි. ඔහු මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී, මාර්ග සංවර්ධන අධිකාරිය, සැලසුම් මධ්‍යස්ථානය, මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම, ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී ආදීන්හි අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇත.

වර්තමානයේ ඔහු සී/ස ආක් ට්‍රයැඩ් කන්සල්ටන්ස් (පුද්ගලික) සමාගමේ සහ සී/ස රාම් ඩිවලොපර්ස් (පුද්ගලික) සමාගමෙහි කළමනාකාර අධ්‍යක්ෂවරයා වශයෙන්ද කටයුතු කරයි. සිවරාමන් මහතා සී/ස සීලීස් සමාගමෙහි සභාපතිත්වය දරණ අතර සී/ස මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා සමාගමෙහි සහ සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි. ඔහු 2006 සිට 2009 දක්වා ජාතික පොලිස් කොමිසමෙහි සාමාජිකයෙකු ලෙස කටයුතු කර ඇති අතර 2012 දී නැවත එම තනතුරෙහිම පිහිටුවන ලදී. තවද ඔහු ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයෙහි උපදේශන සභාවෙහි සාමාජිකයෙකු සහ භාණ්ඩාගාරික ලෙස කටයුතු කර ඇත. සිවරාමන් මහතා, මොරටුව විශ්ව විද්‍යාලයෙන් ගෘහ නිර්මාණ ශිල්පය පිළිබඳව විද්‍යාපති උපාධිය (M.Sc.Arch) ලබා ඇති වරලත් ගෘහ නිර්මාණ ශිල්පියෙකු වන අතර, ඔහු ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනයේ අධි සාමාජිකයෙකි (FIA).

නලිනි අබේවර්ධන මෙනෙවිය
අධ්‍යක්ෂ

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට 2010 මැයි මසදී පත්වුණ අතර ඇය විධායක නොවන අධ්‍යක්ෂවරියක ලෙස කටයුතු කරයි.

වාණිජ නීති ක්ෂේත්‍රයෙහි අත්දැකීම් සහ පුද්ගලික අංශයෙහි තේ කර්මාන්තයෙහි වසර 25කට වැඩි තමා සතු කළමනාකරණ අත්දැකීම් ඇය අධ්‍යක්ෂ මණ්ඩලීය කටයුතු සඳහා ලබා දෙයි. ඇය ලංකාවේ ප්‍රධාන පෙලේ නීති ආයතනයකට සම්බන්ධව කටයුතු කර ඇත.

ඇය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරියක ලෙස 2006 සිට 2009 දක්වා කටයුතු කර ඇත.

සංස්කෘතික හා ජාතික උරුමයන් පිළිබඳ අමාත්‍යාංශය යටතේ පවතින ගාලු උරුමය පදනමේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකාවකද වන ඇය සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගමේ බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගමේ හා මුස්සැන්දපොත්ත (පෞද්ගලික) වතු සමාගමේ අධ්‍යක්ෂවරියක ලෙසද කටයුතු කරන්නීය.

ඇය වෘත්තීයමය නීතිඥවරියකි.

චන්ද්‍රසිරි ද සිල්වා මහතා
අධ්‍යක්ෂ

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට 2010 මැයි මසදී පත්වුණු අතර විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරයි.

වෘත්තීයමය නීතිඥවරයකු ද වන සිල්වා මහතා සිය විශේෂිත වූ නීති අත්දැකීම් මෙන්ම ව්‍යාපාරික හා රක්ෂණ අංශයන්හි අත්දැකීම් අධ්‍යක්ෂ මණ්ඩලයට ප්‍රදානය කරනු ලබයි. ඔහු මහජන බැංකුව, සී/ස පීපල්ස් මර්චන්ට් බෑන්ක් පී එල් සී හා සී/ස පීපල්ස් ඉන්ෂුවරන්ස් කම්පැනි සමාගමේ අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කර ඇති අතර සී/ස පීපල්ස් ට්‍රැවල්ස් සමාගමේ සභාපතිවරයා වශයෙන්ද කටයුතු කර ඇත. වර්තමානයේ ඔහු සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගමේ සභාපතිවරයා වන අතර සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගමේ අධ්‍යක්ෂවරයකුද වේ.

ඔහු වෘත්තීමය නීතිඥවරයකු වන අතර එක්සත් රාජධානියේ වේල්ස් සරසවියෙන් අන්තර්ජාතික වාණිජ නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක්ද ලබාගෙන ඇත.

අධ්‍යක්ෂ
මණ්ඩලය

කේ එල් හේවගේ මහතා
අධ්‍යක්ෂ

2010 ජූනි මසදී ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයට පත් කරන ලද අතර ඔහු ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු කරයි.

හේවගේ මහතා උපදේශන, කළමනාකරණ, පුහුණු කිරීම්, ව්‍යාපෘති මූල්‍යනය, අලෙවිකරණය, කෘෂිකාර්මික සංවර්ධනය හා ව්‍යාප්තිය, වැවිලිකරණ කටයුතු යන අංශයන්හි සිය හතළිස් වසරක අත්දැකීම් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදේ.

හේවගේ මහතා සී/ස පීපල්ස් මර්චන්ට් බෑන්ක් පී එල් සී හි සභාපතිවරයා වශයෙන්ද සී/ස ජනතා ෆර්ටිලයිසර් එන්ටර්ප්‍රයිසස් සමාගම, රාජ්‍ය වැවිලි සංස්ථාව, රාජ්‍ය මුද්‍රණ නීතිගත සංස්ථාව සහ පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය (බස්නාහිර පළාත) යන ආයතනයන්හි සභාපති/ප්‍රධාන විධායක නිලධාරිධුර වල කටයුතු කර ඇත. ඔහු මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ලෙස හා ශ්‍රී ලංකා සමූපකාර කළමනාකරණ ආයතනයේ සාමාන්‍යාධිකාරීවරයා ලෙසද කටයුතු කර ඇත. එමෙන්ම ඔහු දෘශ්‍ය හා ප්‍රසාංගික කලා විශ්ව විද්‍යාලයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙසද කටයුතු කර ඇත.

වර්තමානයේ ඔහු සී/ස සීබෑන්ක් ඇසෙට් මැනෙජ්මන්ට් (පුද්ගලික) සමාගමේ සභාපතිවරයාද වන අතර සේසත දේපළ වෙළඳාම් හා ආයෝජන (පුද්ගලික) සමාගමෙහි සහ සී/ස සේසත ව්‍යාපාර (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි.

ඔහු කැලණිය විශ්ව විද්‍යාලයෙන් විද්‍යාවේදී උපාධියක් ලබා ගෙන ඇති අතර එක්සත් රාජධානියේ රීඩින් විශ්ව විද්‍යාලයෙන් විද්‍යාපති උපාධියක් ලබා ගෙන ඇත.

වී කනගසබාපති මහතා
විකල්ප අධ්‍යක්ෂ (2013 ජනවාරි 29 දක්වා)

2010 ජූලි මාසයේදී නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ එස් ආර් ආටිගල මහතාගේ විකල්ප අධ්‍යක්ෂ වශයෙන් පත්විය. ඔහු නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ වෙනුවට විධායක නොවන විකල්පීය අධ්‍යක්ෂවරයකු ලෙස සේවය කරයි. තවද ඔහු හිටපු නිලබලයෙන් පත් වූ අධ්‍යක්ෂවරුන්ට විකල්ප අධ්‍යක්ෂවරයකු ලෙස 2006 මාර්තු මස සිට කටයුතු කර ඇත.

කනගසබාපති මහතා රාජ්‍ය මූල්‍ය අධ්‍යක්ෂ/අතිරේක අධ්‍යක්ෂ, පොදු ව්‍යාපාර හා මූල්‍ය කළමනාකරණ ප්‍රතිසංස්කරණ අධ්‍යක්ෂ ජනරාල් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ සම්බන්ධීකාරක සහ මූල්‍ය කළමනාකරණ උපදේශක ආදී වශයෙන් රාජ්‍ය අංශයේ විවිධ ජ්‍යෙෂ්ඨ තනතුරු දරමින් වසර හතලිහකට වැඩි කාලයක පළපුරුද්ද සමග අධ්‍යක්ෂ මණ්ඩලයට සේවය කරයි. තවද ඔහු මහජන බැංකුව, රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී, සී/ස ලංකා හයිඩ්‍රොලික් ඉන්ඩස්ට්‍රීස් සමාගම සහ සී/ස මර්චන්ට් ක්‍රෙඩිට් ඔෆ් ශ්‍රී ලංකා සමාගම යනාදියෙහි අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කර ඇත.

ඔහු මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ පුහුණු ආයතනය වන මූල්‍ය අධ්‍යයන ඇකඩමියේ මූල්‍ය උපදේශකවරයා වශයෙන්ද, දුරස්ථ අධ්‍යයන කේන්ද්‍රයේ සභාපති ලෙසද කටයුතු කර ඇත. ඔහු රාජ්‍ය මූල්‍ය සහ සංවර්ධන ගණකාධිකරණ ආයතනයේ පාලක මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන්ද ජාතික වැටුප් හා ශ්‍රම බලකා කොමිෂන් සභාවේ සාමාජිකයෙකු වශයෙන්ද කටයුතු කරයි. තවද ඔහු හොටෙල් ඩිවලොපර්ස් ලංකා පී එල් සී හි විධායක අධ්‍යක්ෂවරයාද වෙයි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය දරන අතර, ඇමරිකා එක්සත් ජනපදයේ හාවර්ඩ් විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය හිමිකරගෙන ඇත. තවද ඔහු, රාජ්‍ය මූල්‍ය සහ සංවර්ධන ගණකාධිකාරී ආයතනය, සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ ආයතනය සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ශිල්පීය ආයතනය යන ආයතනයන් හි අධි සාමාජිකත්වයද දරනු ලබයි.

ආර් එම් ඒ රත්නායක මහතා
විකල්ප අධ්‍යක්ෂ (2013 ජනවාරි 30 සිට)

2013 ජනවාරි 30 දින රත්නායක මහතා නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ එස්. ආර්. ආටිගල මහතාගේ විකල්ප අධ්‍යක්ෂ වශයෙන් පත් විය. ඒ අනුව ඔහු විධායක නොවන නිලබලයෙන් පත්වූ අධ්‍යක්ෂ හට විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තුල කටයුතු කරයි.

රත්නායක මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ ආදායම් අංශයෙහි පළමු අධ්‍යක්ෂ ලෙසද, මූල්‍ය සහ ණය කළමනාකරණ අධ්‍යක්ෂ ලෙසද උක්ත අමාත්‍යංශයෙහිම ඉදිකිරීම්, ගුවන්සේවා හා ප්‍රවාහන අංශ භාර අධ්‍යක්ෂ ලෙසද කටයුතු කිරීම ඇතුලුව රාජ්‍ය අංශයන් හි ජ්‍යෙෂ්ඨ තනතුරු දරමින් වසර 21 ක් තුල විශාල අත්දැකීම් සම්භාරයක් උකහාගෙන ඇත.

තවද ඔහු රාජ්‍ය ගිණුම්කරණ දෙපාර්තමේන්තුවේ මූල්‍ය කළමනාකරණ සහාය අධ්‍යක්ෂ ලෙසද රාජ්‍ය ආයතන විශාල සංඛ්‍යාවක ගිණුම්කරණ නිලධාරී ලෙසද සේවයකර ඇති අතර, ශ්‍රී ලංකා පදනම් ආයතනය, සී/ස මිල්කෝ (පුද්ගලික) සමාගම සී/ස විලව් ප්ලාන්ටේෂන් කම්පැනි (පුද්ගලික) සමාගම සහ ඇඟලූම් කර්මාන්ත පුහුණු ආයතනයෙහි අධ්‍යක්ෂ මණ්ඩලයන්හි කටයුතු කර ඇත. වර්තමානයේ දී රත්නායක මහතා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවෙහි අතිරේක අධ්‍යක්ෂ ජෙනරාල් ලෙසද, සී/ස වෙස්ට් කෝස්ට් පවර් (පුද්ගලික) සමාගමෙහි සහ සී/ස ඩි ලා රූ ලංකා කරන්සි සහ සෙක්‍යුරිටි ප්‍රින්ට් (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේද කටයුතු කරයි.

රත්නායක මහතා සිංගප්පූරු ජාතික විශ්ව විද්‍යාලයෙන් රාජ්‍ය කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධියක් ද, නෙදර්ලන්තයේ මස්ට්‍රිච්ට් ස්කූල් ඔෆ් මැනේජ්මන්ට් වෙතින් කළමනාකරණ පාලනය සහ කළමනාකරණ තොරතුරු පද්ධති පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක්ද, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය වෙතින් ව්‍යාපාර සහ මූල්‍ය පරිපාලනය වෙනුවෙන් පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් සහ කැලණිය විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී (B.com special) උපාධියක්ද දිනාගෙන ඇත. තවද ඔහු ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකරුවන්ගේ ආයතනයෙහි අධි සාමාජිකත්වය ලබා සිටින අතර ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරයි.

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්/ලේකම් ලංකා බැංකුව

ශ්‍රේෂ්ඨාධිකරණ නීතිඥද, LLB, MBA

ආයතනික කළමනාකාරීත්වය



කේ ධර්මසිරි මහතා එම් ගුණසේකර මහතා පී ඒ ලයනල් මහතා එම් කේ නන්දසිරි මහතා එච් එම් මුදියන්සේ මහතා

ආචාර්ය ඩබ්ලිව්. ජී කරුණාදාස

ආචාර්ය ලයනල් සිරිවර්ධන

දයානි ප්‍රනාන්දු මහත්මිය

සෙනරත් බණ්ඩාර මහතා

ආයතනික

කළමනාකාරීත්වය

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

ජී ජේ ජයසිංහ මහතා

ලලිත් ප්‍රනාන්දු මහතා

ඩබ් ජී රසල් ෆොන්සේකා මහතා

ටී මුතුගල මහතා ඩබ්ලිව් ඒ අසෝක රූපසිංහ මහතා ඉඳුනිල් ලියනගේ මහතා එස් එච් රණවක මහත්මිය

ආයතනික

කළමනාකාරීත්වය

කේ ධර්මසිරි මහතා
මහා කළමනාකරු

2012 ජූනි මස ලංකා බැංකුවේ මහා කළමනාකාර ධූරයට පත් වූ අතර, 2013 ජනවාරි මස 07 වන දින විශ්‍රාම ගන්නා ලදී. ඔහු අතිරේක මහා කළමනාකරු ලෙස 2011 ජූනි සිට 2012 ජූනි දක්වා ආයතනික සහ අක්වෙරළ බැංකු කටයුතු, ජාත්‍යන්තර හා භාණ්ඩාගාර සහ අලෙවිකරණ යන අංශයන්හි මෙහෙයුම් කටයුතු අධීක්ෂණය කළේය.

වසර 37 කට අධික සේවා කාලයක් හිමි ධර්මසිරි මහතා විවිධ මානයන් ඔස්සේ පැතිරුණු සාරවත් දේශීය හා ජාත්‍යන්තර බැංකුකරණ අත්දැකීම් වලින් අනූනය. ඔහු සතු පුළුල් දැනුම, අත්දැකීම් හා නිපුණතා, අක්‍රීය ණය විමර්ශනය හා ප්‍රතිව්‍යුහගතකරණය, උපාය මාර්ගික සැලසුම් සම්පාදනය, ආයතනික මූල්‍ය වාර්තාකරණය හා ශාඛා ප්‍රතිසංවිධානය ලෙසින් විවිධ ඉසව් කරා විහිදෙයි. 2002 වසරේ සිට ඔහු ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයකු ලෙස බැංකුවේ අක්‍රීය අත්තිකාරම් මට්ටම කර්මාන්තයේ සාමාන්‍ය අක්‍රීය අත්තිකාරම් මට්ටමට වඩා පහළින් තබා ගැනීමට අති විශාල දායකත්වයක් ලබා දුන්නේය. ඔහු ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු, මූල්‍ය හා සැලසුම්, පරීක්ෂණ හා විගණන කටයුතු සහ අයකර ගැනීම් ඇතුළුව බැංකු මෙහෙයුම් කටයුතු වල ප්‍රධාන තනතුරු දැරිය. ඔහු 1997 වසරේ සිට 2000 වසර තෙක් මාලදිවයිනේ ලංකා බැංකු ශාඛාවේ ප්‍රධානියා වශයෙන්ද, 2002 වසරේදී සී/ස නේපාල ලංකා බැංකු සමාගමෙහි කළමනාකර අධ්‍යක්ෂ ලෙස ද එතෙර සේවය කර ඇත.

සී/ස බී ඕ සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම, සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම, සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම, බෑන්ක් ඔෆ් සිලෝන් (යූ කේ) සමාගම , සී බෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම, සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේමන්ට් සමාගම, සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම සහ සී/ස මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා (පෞද්ගලික) සමාගම, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, ලංකා මූල්‍ය සේවා කාර්යාංශය සහ ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගමෙහි විධායක නොවන අධ්‍යක්ෂ ලෙස ඔහු කටයුතු කරන ලදී .

ධර්මසිරි මහතා කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී ප්‍රථම පන්ති ගෞරව උපාධියක් සහ ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශණවේදී උපාධියක් ද හිමිකරගෙන ඇත. එසේම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු ද වෙයි .

ඩී එම් ගුණසේකර මහතා
මහා කළමනාකරු (ලංකා බැංකුව)

2013 ජනවාරි මස ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස පත් විය. 2010 ඔක්තෝබර් මස සිට 2013 ජනවාරි මස දක්වා කාලය තුල නියෝජ්‍ය මහා කළමනාකරු (විකුණුම් හා හැසිරවීම්) සහ නියෝජ්‍ය මහා කළමනාකරු (සිල්ලර බැංකු කටයුතු) ලෙස සේවය කර ඇත.

1983 දී සිය වෘත්තීය ජීවිතය ශාඛා බැංකු කටයුතු වලින් ආරම්භ කළ ගුණසේකර මහතා, ණය කළමනාකරණය හා පරිපාලනය පිළිබඳ දැනුම හා අත්දැකීම් සම්භාරයක් උකහා ගත්තේය. 1997 සිට 2000 තෙක් බැංකුවේ ලන්ඩන් ශාඛාවේ සේවය කළ ඔහු ජාත්‍යාන්තර බැංකු මෙහෙයුම් පිළිබඳව පරිපූර්ණ පළපුරුද්දක් ලබා ඇත. බැංකුවේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ ආශ්‍රිත පීඨ සාමාජිකයෙකු වන ඔහු ලංකා බැංකු කාර්ය මණ්ඩලයේ දැනුම මට්ටම ඉහළ නැංවීම සඳහා හැම විටම නොපැකිළිව දායක විය.

බැංකු ක්ෂේත්‍රයේ, ආයතනික හා අක්වෙරළ බැංකුකරණය පිළිබඳ අවුරුදු 29ක අත්දැකීම් සම්භාරයකින් හෙබි ඔහු වෘත්තීය බැංකුකරුවන්ගේ ආයතනයේ මණ්ඩල සාමාජිකයකු ලෙසද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සම්පත් දායකයකු ලෙසද සේවය කරයි.

ඔහු 2010 අගෝස්තු මස සිට සී/ස සී බෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගමේ සහ 2009 ජූනි මස සිට සී/ස හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගමේ විධායක නොවන නාමික අධ්‍යක්ෂකවරයෙකු ලෙස සේවය කරයි. තවද ඔහු 2008 වසරේ සිට 2009 වසර දක්වා එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂකවරයෙකු ලෙස ක්‍රියා කළේය.

2013 ජනවාරි මස ලංකා බැංකු මහා කළමනාකරු ලෙස පත්වීමෙන් අනතුරුව ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔහුව, සී/ස බී.ඕ.සී ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම, සී/ස බී.ඕ.සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම, සී/ස බී.ඕ.සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගම, බෑන්ක් ඔෆ් සිලෝන් (යූ කේ) ලිමිටඩ්, සී/ස සී බෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම, සී/ස ඇසෙට් මැනේජ්මන්ට් සමාගම, සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම, මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී, ශ්‍රී ලංකා බැංකු බැංකුකරුවන්ගේ ආයතනය, ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය, සී/ස ලංකා මූල්‍ය සේවා කාර්යාංශය සහ සී/ස ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාගම යන ආයතන වල විධායක නොවන නාමික අධ්‍යක්ෂක තනතුරු වලට පත් කරන ලදී.

එම් කේ නන්දසිරි මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(අයකරගැනීම්)

2009 මැයි මස නියෝජ්‍ය මහා කළමනාකරු ලෙස පත් විය. 2012 අගෝස්තු මස නියෝජ්‍ය මහා කළමනාකරු (අයකරගැනීම්) ධුරයට පත් වූ අතර, 2009 මැයි සිට 2012 අගෝස්තු දක්වා නියෝජ්‍ය මහා කළමනාකරු (උපකාරක සේවා) ධුරය හෙබවූයේය.

1975 බැංකු සේවයට එක්වූ ඔහු දේශීය හා ජාත්‍යන්තර බැංකු මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ඔහු සතු දශක තුනක පළපුරුද්ද ශාඛා පද්ධතිය තුළ කළමනාකරණ හා නායකත්ව භූමිකා තුළින් තව තවත් තීව්‍ර විය. බැංකුවේ වෙළඳ මූල්‍යන කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීමේ කටයුත්තට නායකත්වය ලබාදීමේදී එම ක්ෂේත්‍රයේ ඔහු සතු දැනුම ඉමහත් පිටුවහලක් විය. එමෙන්ම වෙළඳ මූල්‍යන අංශයේ කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සඳහා ද නන්දසිරි මහතා විශාල දායකත්වයක් සපයා ඇත. වර්තමාන තනතුරට පත්වීමට පෙර ඔහු 2005 සිට 2008 දක්වා ලංකා බැංකු චෙන්නායි ශාඛාවේ ලෙස සේවය කළේය.

ඔහු 2009 සැප්තැම්බර් සිට ග්‍රෑන්ඩ් ඔරියන්ටල් හෝටලයේ විධායක නොවන නාමික අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරයි. 2010 වසරේදී ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ වෙළඳ මූල්‍යන සංගමයේ සභාපතිවරයා ලෙස ද කටයුතු කළේය.

1974 දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් ආර්ථික විද්‍යාව පිළිබඳ ප්‍රථම පන්ති ගෞරව උපාධියක්ද 1975 දී ආර්ථික විද්‍යාව පිළිබඳ දර්ශනවේදී උපාධියක්ද හිමිකරගත් නන්දසිරි මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

එච් එම් මුදියන්සේ මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(විකුණුම් හා හැසිරවීම්)

2010 අගෝස්තු මස නියෝජ්‍ය මහා කළමනාකරණ ධුරයට පත් කරන ලද අතර, 2011 අගෝස්තු මස දක්වා නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්) ලෙස කටයුතු කරන ලදී.

1973 අගෝස්තු මස බැංකු සේවයට එක්වූ ඔහු ශාඛා බැංකු කටයුතු පිළිබඳව පුළුල් පරාසයක අත්දැකීම් සහිත වන අතර එය, බැංකුවේ ශාඛා පද්ධතිය එහි වර්තමාන තත්වය කරා සංවර්ධනය කිරීමට මහඟු පිටුවහලක් විය. මෙම තනතුරට ප්‍රථම වයඹ පළාතේ සහකාර මහා කළමනාකරු ලෙස ක්‍රියා කළ ඒ මහතා ක්ෂුද්‍ර මූල්‍යනය සහ කෘෂිකාර්මික අංශය පිළිබඳව තමා සතුව ඇති දැනුම යොදා ගනිමින් සිය පළාත සංවර්ධනය කරා මෙහෙයවීය.

ඔහු 2010 ඔක්තෝබර් මස සිට ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ විකල්ප අධ්‍යක්ෂවරයෙකු ද වේ. තවද 2007 සිට 2010 දක්වා සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම, වයඹ වාණිජ මණ්ඩලය, කර්මාන්ත සේවා කාර්යාංශය, වයඹ සංවර්ධන බැංකුව යනාදියෙහි ද විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කොට ඇත.

ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකු වන මුදියන්සේ මහතා 2001 වසරේදී විධායක බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද එම ආයතනයෙන්ම ලබාගත්තේය.

පී ඒ ලයනල් මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු
(ජාත්‍යන්තර, භාණ්ඩාගාර සහ ආයෝජන

2010 ඔක්තෝබර් මස නියෝජ්‍ය මහා කළමනාකරණ ධුරයට පත්කරනු ලැබීය. 2010 ඔක්තෝබර් මස සිට 2012 මාර්තු මස දක්වා නියෝජ්‍ය මහා කළමනාකරු (ආයෝජන හා මානව සම්පත්) ලෙස සිය රාජකාරී කටයුතු සිදුකල අතර පසුව වත්මන් තනතුර වන නියෝජ්‍ය මහා කළමනාකරු (ජාත්‍යන්තර, භාණ්ඩාගාර සහ ආයෝජන) තනතුරට පත් විය.

1983 වසරේදී බැංකු සේවයට එක් වූ, බැංකු හා මූල්‍ය ක්ෂේත්‍රයේ වසර 29 කට වැඩි පළපුරුද්දක් ඇති ලයනල් මහතා භාණ්ඩාගාර කටයුතු, ජාත්‍යන්තර මෙහෙයුම් හා ආයෝජන බැංකුකරණයේ විශේෂඥ දැනුම ලබා ඇත.

බැංකුවේ ප්‍රාථමික සුරැකුම්පත් ඒකකයේ ප්‍රධාන විධායක නිලධාරියා ලෙසද කටයුතු කර ඇති ඔහු, භාණ්ඩාගාර හා ආයෝජන බැංකු ඒකකයේ නායකත්වයද දැරීය. බී ඕ සී ලන්ඩන් ශාඛාවේ සේවය කළ කාලය තුළ ඔහු භාණ්ඩාගාර කළමනාකරණය හා විදේශ විනිමය වෙළඳාම් කටයුතු පිළිබඳව පුහුණුවක් හා විස්තීර්ණ පළපුරුද්දක් ලබා ඇති අතර, පසුව ලංකා බැංකුව කරච්චි ශාඛාවේ භාණ්ඩාගාර අංශයේ ප්‍රධානියා ලෙස කටයුතු කළේය.

2010 සිට ලංකා හොස්පිටල්ස් සමාගම හා 2009 සිට සී/ස ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම යනාදියෙහි විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරයි. එසේම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ පාලන මණ්ඩලයේ සාමාජිකයකු ද වන අතර 2006 වසරේ සිට සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ් මන්ට් සමාගමෙහි විකල්ප අධ්‍යක්ෂවරයෙකු හා 2012 දී ලංකා සුරැකුම්පත් මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙකු ලෙසද කටයුතු කරන අතර වත්මන් ශ්‍රී ලංකා විදේශ විනිමය සංගමයේ ප්‍රථම උප සභාපති වේ .

ලයනල් මහතා 1980 දී කොළඹ විශ්ව විද්‍යාලයෙන් ශාස්ත්‍රවේදී උපාධිය හිමිකරගෙන ඇත.

දයානි ප්‍රනාන්දු මහත්මිය

නියෝජ්‍ය මහා කළමනාකාරිනී
(ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු)

2011 සැප්තැම්බර් මස නියෝජ්‍ය මහා කළමණාකාරිනී (ආයතනික හා අක්වෙරළ බැංකු කටයුතු) ලෙස පත් විය. වර්තමාන පත්වීමට පෙර ඇය සහකාර මහා කළමනාකාරිනී (අක්වෙරළ බැංකු කටයුතු) ලෙස වසර 5ක් සේවය කර ඇත.

ආයතනික ණය කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ විශේෂඥභාවය සහ

ආයතනික

කළමනාකාරීත්වය

අවුරුදු 37ක කාලයක් තුළ ශාඛා හා ආයතනික බැංකු කටයුතු සම්බන්ධයෙන් ලද අත්දැකීම් සමුදායක් ඇය සතුව ඇත. ලංකා බැංකු ලන්ඩන් ශාඛාවේ වසර 3ක කාලයක් සේවය කළ ඇය වෙළඳ ණය සහ ශාඛා මෙහෙයුම් කටයුතු වල නියැලුනි.

සී/ස සීලීස් ෆිනෑන්ෂියල් සර්විසස් සමාගමේ විධායක නොවන නාමික අධ්‍යක්ෂවරියක ලෙසද ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නිළ බලයෙන් පත්වූ අධ්‍යක්ෂවරියක ලෙසද සී/ස මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා සමාගමේ විකල්ප අධ්‍යක්ෂවරියක ලෙසද කටයුතු කරයි.

ඇය කොළඹ විශ්ව විද්‍යාලයෙන් වාණිජවේදී ගෞරව උපාධියක්ද, ආර්ථික විද්‍යාව පිළිබඳව දර්ශනවේදී උපාධියක්ද හිමිකරගෙන ඇත.

සෙනරත් බණ්ඩාර මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (නිමැවුම් හා සංවර්ධන බැංකු)

2012 මාර්තු මස බණ්ඩාර මහතා නියෝජ්‍ය මහා කළමනාකාර ධූරයට නම් කරන ලද අතර, 2013 ජනවාරි මස දී නිමැවුම් හා සංවර්ධන බැංකු නියෝජ්‍ය මහා කළමනාකරණ ධූරයෙහි වැඩ භාරගන්නා ලදී. එයට පෙර ඔහු සී/ස බෑන්ක් ඔෆ් සිලෝන් (යූ කේ) සමාගමෙහි ප්‍රධාන විධායක නිළධාරී/ විධායක අධ්‍යක්ෂ ලෙස අනුයුක්ත කොට තිබුණි.

1990 ජනවාරි මස කළමනාකරණ අභ්‍යාසලාභියෙකු ලෙස බැංකු සේවයට එක්වූ ඔහු තම වෘත්තීය ජීවිතයෙහිදී ආයතනික බැංකුකරණය, භාණ්ඩාගාර කළමනාකරණය සහ ජාත්‍යාන්තර බැංකුකරණ මෙහෙයුම් යන අංශයන්ගේ විවිධ අත්දැකීම් සමුදායක් සහිතව ඉහල තලයකට පැමිණ සිටියි. එක්සත් රාජධානියෙහි පරිපාලිතය ආරම්භ කිරීමේ ක්‍රියාවලියේදී ඔහු බැංකුකරණ රෙගුලාසි සහ අනුකූලතාවය පිළිබඳව හසල දැනුමක් ලබාගත් අතර, පසුව ඔහු එම සමාගමේ ප්‍රධාන විධායක නිළධාරී ලෙස කළමනාකරණ කටයුතු වල නියැලුනි. ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ, ණය හා ආයෝජන කළමනාකරණය වෙනුවෙන් සම්පත් දායකත්වය ලබා දී ඇත.

බැංකුවට සම්බන්ධ වීමට පෙර, කැළණිය විශ්ව විද්‍යාලයේ සහකාර උපදේශකයෙකු, ලෙසද, මහවැලි අධිකාරියේ සංඛ්‍යාලේඛනඥයෙකු ලෙසද සේවය කර ඇත. සී/ස මර්චන්ට් බෑන්ක් ඔෆ් සිලෝන් සමාගමේ විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙසද ඔහු කටයුතු කර ඇත.

කැළණිය විශ්ව විද්‍යාලයේ විද්‍යාවේදී උපාධිධරයකු වන බණ්ඩාර මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණ පශ්චාත් උපාධිධරයන්ගේ ආයතනයෙන් පශ්චාත් උපාධිය විශේෂ කුසලතාවයක් සහිතව සමත් වී ඇත. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය දරණ ඔහු 1998 දී එම ආයතනයේම බැංකු කළමනාකරණය පිළිබඳ පශ්චාත් ඩිප්ලෝමාවද සම්පූර්ණ කර ඇත්තේ එහි හොඳම ශිෂ්‍යයාට හිමි සම්මානයද හිමිකර ගනිමිනි.

ඩබ්ලිව් ජී රසල් ෆොන්සේකා මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්)

වර්ෂ 2012 මාර්තු මස නියෝජ්‍ය මහා කළමනාකරු (මූල්‍ය හා සැලසුම්) ධූරයට තෝරා පත් කරනු ලැබීය. වත්මන් ධූරයට පෙර වර්ෂ 2008 සිට 2012 මාර්තු මස දක්වා සහකාර මහා කළමණාකරු (අයවැය හා ක්‍රමෝපාය සැලසුම්) ධූරය හොබවන ලදී.

1990 ජනවාරි මස ඔහු බැංකු සේවයට බැඳුණි. සිල්ලර බැංකුකරණයෙන් බැංකු ජීවිතය ඇරඹූ ඔහු බැංකුවේ මූල්‍ය කළමණාකරණ සහ ක්‍රමෝපාය සැලසුම් හි විශේෂඥ දැනුමකින් යුතු වන අතර වාණිජ බැංකුකරණයෙහි සියලුම අංශයන් පිළිබඳ පුළුල් අත්දැකීම් සමුදායකින් සමන්විත වේ.

තවද, ඔහු ලංකා බැංකුව ලන්ඩන් ශාඛාවෙහි සේවය කර ඇති අතර භාණ්ඩාගාර කටයුතු සහ ජාත්‍යාන්තර බැංකුකරණ කටයුතු යන අංශයන්හි විශාල අත්දැකීම් සම්භාරයක් ලබා ඇත.

බැංකුවේ ශක්තිමත් වත්කම් හා වගකීම් ව්‍යුහයක් පවත්වාගෙන යාම සඳහා ඔහු නිවැරදි නායකත්වයක් සහ මාර්ගෝපදේශකත්වයක් ලබා දී ඇත.

2012 නොවැම්බර් මස සිට සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සභාපති තනතුර ෆොන්සේකා මහතා විසින් හොබවනු ලබයි.

2008 වර්ෂයේ සිට ඔහු මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගමෙහි නාමික අධ්‍යක්ෂවරයෙක් ලෙස සේවය කරන අතර ලංකා ක්ලියර් පෞද්ගලික සමාගමෙහි විකල්ප අධ්‍යක්ෂ ධූරයද හොබවයි. තවද ආයෝජන මණ්ඩලයෙහි අනුමත පෞද්ගලික සමාගමක් වන සින්ටෙසි සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂකයෙකු ලෙස කටයුතු කරයි.

එසේම ෆොන්සේකා මහතා 2012 නොවැම්බර් මස සිට ලංකා ක්ලියර් (පෞද්ගලික) සමාග මෙහි අධ්‍යක්ෂ මණ්ඩල අනුකමිටුවක් වන විගණන කමිටුවෙහි සභාපති තනතුර හොබවයි.

ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධිධාරියකු වන ඔහු එම විශ්ව විද්‍යාලයේම කළමණාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවකටද හිමිකම් කියයි.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ අධි සාමාජිකත්වය ද ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකත්වය ද දරයි.

ජී ජේ ජයසිංහ මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්)

2012 මාර්තු මස නියෝජ්‍ය මහා කළමනාකරු (මානව සම්පත්) ලෙස පත් කරන ලදී.

1977 සේවයට බැඳුණු ජයසිංහ මහතා, සිල්ලර බැංකුකරණය, තොග බැංකුකරණය, ජාත්‍යන්තර බැංකුකරණය, භාණ්ඩාගාර මෙහෙයුම්, අක්වෙරළ බැංකුකරණය, වෙළඳ මූල්‍ය මෙහෙයුම්, ණය අයකරගැනීම් සහ මානව සම්පත් කළමණාකරණය යන විවිධ ක්ෂේත්‍රයන්ගේ අත්දැකීම් වලින් පිරිපුන්ය.

පසුගිය වසර 15ක කාලය තුල ඔහු බැංකුවේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම හා දැනුම වැඩි දියුණු කිරීමෙහිලා ණය ඇගයීම සහ පරිපාලනය, ණය ප්‍රතිපත්තිය, ජාත්‍යන්තර හා වෙළඳ මූල්‍ය යන අංශ සඳහා ආරාධිත සම්පත් දායකයකු ලෙස තම දායකත්වය සපයා ඇත.

ඔහු ණය කමිටුවෙහි ලේකම් ලෙසද අක්‍රීය ණය කළමනාකරණ කමිටුව හා මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුවෙහි සාමාජිකයකු ලෙසද තත්ත්ව කව තරඟාවලියේ සහ කර්මාන්ත හා වාණිජ මණ්ඩලය විසින් සංවිධානය කරන ලද ශ්‍රී ලංකා ව්‍යවසායකයන්ගේ සම්මාන - 2011 තරඟාවලියේ ජූරි සභාව නියෝජනය කර ඇත.

වර්තමානයේ, සී/ස බී.ඕ.සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම සහ සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ ධූරයද හොබවන ඔහු තවද මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුවෙහි සාමාජිකත්වය, ශිෂ්‍යත්ව කමිටුවෙහි සහ තොරතුරු තාක්ෂණ හැසිරවීමේ කමිටුවෙහි සභාපති තනතුරද, ලංකා බැංකු විශ්‍රාම අරමුදලහි නිල බලයෙන් පත්වූ භාරකරු ලෙස ද ලංකා බැංකු වැන්දඹු හා අනත්දරු අරමුදලෙහි සහ අර්ථසාධක අරමුදලේ නිල බලයෙන් පත්වූ කළමනාකරු ලෙසද කටයුතු කරයි.

තවද ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධිපතීන්ගේ මණ්ඩලයෙහි අතිරේක සාමාජිකයකු ද එහි විගණන කමිටු සාමාජිකයකු ද වන්නේය.

ජයසිංහ මහතා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ වානිජ විද්‍යාව සඳහා විශේෂ උපාධිධාරියකු ද වන අතර ජාතික ව්‍යාපාරික කළමනාකරණ ආයතනයේ මානව සම්පත් කළමනාකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව ද හදාරා ඇත.

ඔහු ශ්‍රී ලංකා බැංකු කරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයෙකි.

ටී මුතුගල මහතා

නියෝජ්‍ය මහා කළමනාකරු (උපකාරක සේවා)

2012 ජූලි මසදී නියෝජ්‍ය මහා කළමනාකරු (උපකාරක සේවා) ලෙස පත් විය.

1974 මාර්තු මස බැංකු සේවයට බැඳුණු ඔහු මෙහෙයුම් බැංකුකරණය, විගණන සහ එතෙර බැංකු මෙහෙයුම් පිළිබඳ මනා දැනුම් සම්භාරයකින් යුක්තය.

වත්මන් තනතුරට ප්‍රථම සහකාර මහා කළමනාකරු (තොරතුරු පද්ධති විගණන) ලෙස බැංකුවේ තොරතුරු පද්ධති විගණන ක්‍රියාවලිය සඳහා නායකත්වය සපයන ලදී . මෙම කාලය තුල බැංකුවේ පද්ධති ක්‍රියාත්මක කිරීමේ ව්‍යාපෘති සඳහා ද ඔහු දායකත්වය සපයා ඇත.

සී/ස එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගමේ විධායක නොවන නාමික අධ්‍යක්ෂවරයෙකු ලෙස ඔහු සේවය කරන අතර එම සමාගමේ විගණන කමිටුවේ හා අවදානම් කළමනාකරණ කමිටුවෙහි සභාපති ලෙසද සේවය සපයයි.

මීට අමතරව සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගමෙහි විධායක නොවන නාමික අධ්‍යක්ෂවරයකු ලෙසද සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගමේ සහ ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශයෙහි අතිරේක නාමික අධ්‍යක්ෂවරයකු ලෙසද කටයුතු කරයි .

මුතුගල මහතා ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ ආශ්‍රිත සාමාජිකයකු වන අතර වරලත් කළමණාකරණ ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකයෙකු ද සහතික ලත් තොරතුරු පද්ධති විගණකවරයෙකු ද වේ.

එස් එච් රණවක මහත්මිය

ප්‍රධාන නීති නිලධාරිනී

2012 අප්‍රේල් මස ප්‍රධාන නීති නිලධාරිනිය ලෙස පත්විය.

1986 ජූනි මස බැංකු සේවයට බැඳුණු ඇය නීති දෙපාර්තමේන්තුවට අනුයුක්ත කරන ලදී. රණවක මහත්මිය වෘත්තීමය නීතිඥවරියක වන අතර, 1980 වසරේදී ගාල්ල නීතීඥ මණ්ඩලයෙන් සිය නීතිඥ වෘත්තිය ආරම්භ කරන ලදී. මෙයට ප්‍රථම ඇය, බැංකුවේ නියෝජ්‍ය ප්‍රධාන නීති නිළධාරී (ණය) තනතුර හොබවන ලදී.

ඇය ශ්‍රී ලංකා නීතීඥ මණ්ඩලයේ සාමාජිකාවක් වන අතර ආයතනික නීතිඥ වරුන්ගේ සංගමයේ සභාපති ධූරය ද දරයි. බැංකුවේ පරිපාලිත සමාගමක් වන සී/ස බී ඕ සී ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂවරියක ලෙසද සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගමෙහි අතිරේක අධ්‍යක්ෂවරියක ලෙසද ඇය කටයුතු කරයි. ඇය බැංකුවේ මහරගම මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ ආශ්‍රිත පීඨ සාමාජිකත්වයද දරයි. වේල්ස් විශ්ව විද්‍යාලයේ ජාත්‍යන්තර වෙළඳාම් නීතිය පිළිබඳ විද්‍යාපති උපාධිධාරිනියක් වන ඇය ශ්‍රී ලංකා නීති විද්‍යාලය විසින් ප්‍රදානය කරනු ලබන බැංකු හා රක්ෂණ නීති සහ ජාත්‍යාන්තර වෙළඳාම් නීති පිළිබඳ ඩිප්ලෝමාධාරිනියක ද වෙයි.

ආයතනික

කළමනාකාරීත්වය

ජානකී සේනානායක සිරිවර්ධන මහත්මිය

අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

1996 දී බැංකු සේවයට එක් වූ සිරිවර්ධන මහත්මිය 2005 දෙසැම්බර් මස අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්/ලේකම් - ලංකා බැංකුව ලෙස පත් විය. වසර 15 ට අධික කාලයක් බැංකුවේ අත්දැකීම් සහිත සිරිවර්ධන මහත්මිය, ආයතනික යහපාලනය සහ සමාගම් ලේඛන කටයුතු සම්බන්ධව සුවිශේෂී දක්ෂතා දක්වා ඇති අතර ඇය බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුම උප කමිටුවල ලේකම් ධුරය හොබවයි.

ආයතනික යහපාලන නීතිරීති වලට අනුකූලව බැංකුව කටයුතු කරන්නේද යන්න ඇය විසින් සහතික කරනු ලබයි.

බැංකු සේවයට එක්වන්නට පෙර වෘත්තිය නීතීවේදිනියක වන ඇය පුද්ගලික අංශයේ සමාගම් කිහිපයකම මූලික කොටස් නිකුතූන්, සමාගම් ඒකාබද්ධ කිරීම් යනාදිය හා නෛතික හා මානව සම්පත් ඇතුළුව ලේකම් කටයුතු හැසිරවීම සිදු කරන ලදී.

ඇය කැළණිය විශ්ව විද්‍යාලයේ වාණිජ හා කර්මාන්ත නීතිය සම්බන්ධයෙන් බාහිර කථිකාචාර්යවරියක ලෙසද කටයුතු කළාය.

සී/ස සී බෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගමෙහි නාමික අධ්‍යක්ෂවරියක් වන ඇය එහි සමාගම් ලේකම්වරිය ලෙස ද කටයුතු කරයි

මීට අමතරව සී/ස බී.ඕ.සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසස් (පෞද්ගලික) සමාගමේ සමාගම් ලේකම්වරිය ද වේ .

කොළඹ විශ්ව විද්‍යාලයේ නීතිවේදී උපාධිධාරිනියක වන ඇය එහිම ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධියද හිමි කරගෙන ඇත.

ඩබ්ලිව් ඒ් අසෝක රූපසිංහ මහතා

ප්‍රධාන මූල්‍ය නිලධාරී

ප්‍රධාන මූල්‍ය නිලධාරී ලෙස පත් කරනු ලැබුවේ 2009 ඔක්තෝම්බර් මසය.

ලංකා බැංකුවේ සේවයට එක්වන්නට පෙර ඔහු කටාර් වාණිජ බැංකුවේ ආයතනික මූල්‍ය කටයුතු අංශයේ ප්‍රධානියා වශයෙන්ද, ශ්‍රී ලංකා සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ මූල්‍ය හා පරිපාලන ප්‍රධානියා ලෙසද කටයුතු කර ඇත.

රූපසිංහ මහතා 2010 මාර්තු මස සිට සී/ස සීලීස් සමාගමේ විධායක නොවන නාමික අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කරයි.

1991 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයෙන් ව්‍යාපාර පරිපාලනවේදී විශේෂ උපාධිය හිමිකරගත් අසෝක රූපසිංහ මහතා, 2007 දී ඕස්ට්‍රේලියාවේ දකුණු ක්වීන්ස්ලන්ත සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති (මූල්‍ය) උපාධිය ලබාගත්තේය.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ, සහතික ලත් කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා ගණකාධිකාරීරුන්ගේ තාක්ෂණික ආයතනයේ අධි සාමාජිකත්වයද දරයි.

තවද, ඔහු ශ්‍රී ලංකා ගණකාධිකාරීවරුන්ගේ තාක්ෂණික ආයතනයේ පාලක මණ්ඩල සාමාජිකයෙකි.

ලලිත් ප්‍රනාන්දු මහතා

ප්‍රධාන අවදානම් නිළධාරී

ප්‍රධාන අවදානම් නිළධාරී ලෙස පත්වීමට පෙර ඔහු සහකාර මහා කළමනාකරු (අවදානම් කළමනාකරණය / අනුකූලතාවය) ලෙසද වැඩ බලන ප්‍රධාන අවදානම් නිළධාරී ලෙසද සේවය කර ඇත .

1986 දී බැංකු සේවයට බැඳුනු ප්‍රනාන්දු මහතා, බැංකු හා මූල්‍ය සේවා පිළිබඳ වසර 26 කට අධික කාලයක පළපුරුද්දක් සහිත වන අතර ශාඛා බැංකුකරණය, ආයෝජන බැංකුකරණය, ජාත්‍යාන්තර බැංකුකරණය සහ භාණ්ඩාගාර මෙහෙයුම් යන ක්ෂේත්‍රයන්ගේ විශේෂිත වූ දැණුම් පරාසයකින් යුක්තය. බැංකුවට සම්බන්ධ වීමට පෙර ප්‍රනාන්දු මහතා ගණිතය සහ භෞතික විද්‍යාව පිළිබඳ උපාධිධාරී ගුරුවරයෙකි.

පසුගිය වසර 11 ක කාලයක් බැංකුවේ අවදානම් කළමනාකරණය සම්බන්ධ ක්‍රියාකාරකම් වල නියැලී සිටි ඔහු බැංකුවේ වත්මන් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය පිහිටුවීමෙහිලා පුරෝගාමීව කටයුතු කරන ලදී. ඇමරිකා එක්සත් ජනපදයේ, අවදානම් වෘත්තිකයන්ගේ ගෝලීය සංගමය මඟින් ඔහුට FRM තනතුර ප්‍රදානය කර ඇත. මෙම තනතුර ප්‍රදානය කිරීම, ගෝලීය වශයෙන් අවදානම් කළමනාකරණය පිළිබඳව ඇති විශිෂ්ඨ දැණුම සනාථ කරයි. අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධ්‍යාපන මධ්‍යස්ථානයේ ප්‍රසිද්ධ සම්පත් දායකයකු ද වේ. සවුදි මූල්‍ය නියෝජිත ආයතනය මඟින් ඔහුට කළ ආරාධනාවක් හේතුවෙන් සවුදි බැංකුකරුවන් සඳහා වන රියාද් බැංකුකරුවන්ගේ ආයතනය මඟින් පැවැත්වූ ණය අවදානම් කළමනාකරණ වැඩසටහන ඉතා සාර්ථක අන්දමින් සිදු කිරීමට ඔහු සමත් විය.

ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සංඛ්‍යානය පිළිබඳ විද්‍යාවේදී උපාධිය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිය ඔහු සතුය. එසේම ඔහු ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ අධිසාමාජිකත්වය ද දරයි.

ආචාර්ය ඩබ්ලිව් ජී කරුණාදාස

ප්‍රධාන අභ්‍යන්තර විගණක

2009 මාර්තු මස ප්‍රධාන විගණක ලෙස පත්කරනු ලැබීය.

ගණකාධිකරණ, විගණන හා මූල්‍ය කළමනාකරණ ක්ෂේත්‍රයන් හි වසර 32කට වැඩි අත්දැකීම් ආචාර්ය කරුණාදාස මහතා සතුවේ.

ලංකා බැංකුවට එක්වන්නට පෙර ඔහු විශාල වාණිජ හා මූල්‍ය ආයතනයන්හි අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා විය. ඔහු 1988-2001 දක්වා, ද ෆිනෑන්ස් සමාගම පී එල් සී හි අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ආයතනික කළමනාකාරිත්වයේ ද කටයුතු කර ඇත.

ආචාර්ය කරුණාදාස, 1996 දී ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ විද්‍යාපති උපාධිය හිමිකරගෙන ඇති අතර, 2005 දී අයර්ලන්ත අන්තර්ජාතික සරසවියෙන් ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ආචාර්ය උපාධිය හිමි කරගෙන තිබේ.

ඔහු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ මෙන්ම ශ්‍රී ලංකා සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරී ආයතනයේ ද අධි සාමාජිකත්වය දරයි.

ආචාර්ය ලයනල් සිරිවර්ධන

පර්යේෂණ හා සංවර්ධන ප්‍රධානි

2009 අගෝස්තු මස පර්යේෂණ හා සංවර්ධන ප්‍රධානි ලෙස පත්කරනු ලැබ 2013 පෙබරවාරි මස විශ්‍රාම ගන්නා ලදී .

ආචාර්ය සිරිවර්ධන සතුව බැංකු ක්ෂේත්‍රයේ සාර්ව ආර්ථික පර්යේෂණ, මූල්‍ය කාර්යඵල විශ්ලේෂණය හා පුරෝකථනය පිළිබඳව වසර 23 කට වඩා අත්දැකීම් ඇති අතර, ඔහු ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණය, සාඵල්‍යතා කළමනාකරණය, ආයතනික ප්‍රතිව්‍යුහගතකරණය හා ගනුදෙනුකාර සේවා පිළිබඳ සුවිශේෂී අත්දැකීම් රාශියක් ද ලබාගෙන ඇත.

ලංකා බැංකුවේ පර්යේෂණ හා සංවර්ධන ප්‍රධානියා ලෙස පත්වන්නට පෙර ඔහු 2005 වසරේ සිට 2009 දක්වා එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩ සටහනේ (UNDP) ආසියා-පැසිෆික් කලාපය සඳහා වන කලාපීය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂකයකු ලෙසද, 1991-2004 අතර කාලය තුළ මහජන බැංකුවේ පර්යේෂණ අධ්‍යක්ෂ ලෙස ද කටයුතු කර ඇත. 2008-2009 වසරවල ඔහු මාලදිවයින, ලාඕසය හා ශ්‍රී ලංකාවේ එක්සත් ජාතීන්ගේ පර්යේෂණ උපදේශකයකු ලෙස ද, 2001-2004 අතරතුර ආසියා ශාන්තිකර කෘෂිකාර්මික ණය සංගමයේ (APRACA) ක්ෂුද්‍ර මූල්‍යනය හා ග්‍රාමීය සංවර්ධනය පිළිබඳ කලාපීය පර්යේෂකයෙකු වශයෙන්ද, 1991-2004 දක්වා ආර්ථික විමසුම සඟරාවේ සංස්කාරක වශයෙන් ද, 1995-1997 අතර කොළඹ විශ්ව විද්‍යාලයේ බාහිර කථිකාචාර්යවරයකු ලෙසද, 1979-1980 කාලයේ නෝර්වේහි බර්ජින් සරසවියේ හා නෙදර්ලන්තයේ වැගනින්ජන් සරසවියේ බාහිර පර්යේෂකයෙකු ලෙස ද සේවය සපයා ඇත.

ආචාර්ය සිරිවර්ධන 1980 දී කැළණිය විශ්ව විද්‍යාලයේ ආර්ථික විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය ලබාගෙන ඇති අතර, 1989 දී නෙදර්ලන්තයේ වැගනින්ජන් සරසවියෙන් සමාජ විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය හිමිකරගෙන ඇත.

ඉඳුනිල් ලියනගේ මහතා

ප්‍රධාන අලෙවිකරණ නිළධාරී

2012 සැප්තැම්බර් මස ලංකා බැංකුවේ ප්‍රධාන අලෙවිකරණ නිළධාරී ලෙස පත් විය.

මූල්‍ය සේවාවන්හි සහ ශ්‍රී ලංකාවේ ඉක්මනින් අලෙවි වන පරිභෝගික භාණ්ඩ (FMCG) ක්ෂේත්‍රයේ වසර විසි තුනකට අධික කාලයක අත්දැකීම් සම්භාරයක් ලියනගේ මහතා සතුව ඇත. ලංකා බැංකුවේ ප්‍රධාන අලවිකරණ නිළධාරී තනතුරට ප්‍රථම ඔහු ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුවේ සහකාර උප සභාපති (ප්‍රධාන අලෙවිකරණ) ලෙස සේවය කර ඇත. එසේම මීට පෙර අලෙවිකරණ ක්ෂේත්‍රයට සම්බන්ධ නොයෙකුත් ආයතන වලට ඔහු සිය දායකත්වය ලබා දී ඇත.

ඇමරිකා එක්සත් ජනපදයේ හවායි හිදී ජපාන ඇමරිකා කළමනාකරණ විද්‍යායතනයේ ගෝලීය කළමණාකරුවන් සඳහා වන අන්තර් සංස්කෘතික අධ්‍යාපන වැඩසටහන සඳහා තේරී පත් වූ ප්‍රථම ශ්‍රී ලාංකිකයා ලියනගේ මහතාය. ඔහුගේ ශාස්ත්‍රීය විශිෂ්ඨත්වය, ජාත්‍යාන්තර අවබෝධය සහ කීර්තිනාමය වෙනුවෙන් ලබාදෙන ලද විභව දායකත්වය ඇගයීම උදෙසා 1996 දී ජපානයේ ෆුටිසු පදනම විසින් ඉහත වැඩසටහන නිම කිරීම සඳහා ඔහුට සම්පූර්ණ ශිෂ්‍යත්වයක් පිරිනමන ලදී.

ඔහු එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකු මෙන්ම ශ්‍රී ලංකාවේ ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කළමනාකරණය පිළිබඳ විද්‍යාපති උපාධිධරයෙකු ද වේ. ලියනගේ මහතා 1995 වසරේ සිට එක්සත් රාජධානියේ වරලත් අලෙවිකරණ ආයතනයේ සාමාජිකත්වය දරණ අතර, ශ්‍රී ලංකාවේ ප්‍රථම වරලත් අලෙවිකරුවන්ගේ කණ්ඩායමේ සාමාජිකයෙකු වන ඔහු 1997 සිට වරලත් අලෙවිකරුවකු ලෙස කටයුතු කරයි. එමෙන්ම ඔහු වරලත් අලෙවිකරණ ආයතනයේ සහ ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ අධි සාමාජිකත්වය උසුලයි.

විධායක
කළමනාකරණ කණ්ඩායම

වමේ සිට දකුණට
එච් කේ ඩබ් ගුණසිංහ මහතා (සහකාර මහා කළමනාකරු - ආපසු අයකර ගැනීම් - ප්‍රාදේශීය), ඩී එන් එල් ප්‍රනාන්දු මහතා (ප්‍රධාන විධායක නිළධාරී - ලංකා බැංකුව (යූ කේ) සමාගම), කේ ටී කරුණාරත්න මහතා (සහකාර මහා කළමනාකරු - උපකාරක සේවා), ඩී එම් එල් සී කුමාර මහතා (සහකාර මහා කළමනාකරු - ගිණුම්කරණ හා කළමනාකරණ තොරතුරු සේවා), ඩබ් ජී ආරියරත්න මහතා (ගනුදෙනුකාර සබඳතා)

වමේ සිට දකුණට
ජී එච් චන්ද්‍රසිරි මහතා (සහකාර මහා කළමනාකරු - ඌව පළාත), ජී එල් පී ජිනසෝම මහතා (සහකාර මහා කළමනාකරු - චෙන්නායි), එස් එම් එස් සී ජයසූරිය මහතා (සහකාර මහා කළමනාකරු - භාණ්ඩාගාර), ජී ඩී සිල්වා මහතා (සහකාර මහා කළමනාකරු - පුහුණු කිරීම් හා සංවර්ධනය), සී ඩබ් වෙලගෙදර මහතා (සහකාර මහා කළමනාකරු - පාරිභෝගික නිෂ්පාදන කළමනාකරණය)

වමේ සිට දකුණට
ඩී පී කේ ගුණසේකර මහතා (සහකාර මහා කළමනාකරු - ආයතනික සබඳතා), කේ ඊ ඩී සුමනසිරි මහතා (සහකාර මහා කළමනාකරු - උතුරු පළාත), ඩබ් එම් එස් වනසිංහ මහතා (සහකාර මහා කළමනාකරු - අලෙවිකරණය), ඩී කේ එන් පියසෝම මහතා (සහකාර මහා කළමනාකරු - දකුණු පළාත), ඊ එම් යූ බණ්ඩාර මහතා (සහකාර මහා කළමනාකරු - වයඹ පළාත)

වමේ සිට දකුණට
එච් ජී නිහාල් මහතා (සහකාර මහා කළමනාකරු - විශ්‍රාමික සැලසුම්), එච් එම් රත්නායක මිය (සහකාර මහා කළමනාකාරිනී - පරිපාලන සේවා), සී කේ ජයරත්න මිය (සහකාර මහා කළමනාකාරිනී - පිටකොටුව ශාඛාව), ටී පී ජී රණවීර මහතා (සහකාර මහා කළමනාකරු - මාලේ), එල් ජී එන් සිරිල් මහතා (සහකාර මහා කළමනාකරු - මානව සම්පත් මෙහෙයුම්)

වමේ සිට දකුණට
ආර් එම් හපුතන්ත්‍රී මහතා (සහකාර මහා කළමනාකරු - විදේශීය ශාඛා), එච් එස් ජයවර්ධන මහතා (සහකාර මහා කළමනාකරු - බස්නාහිර පළාත-දකුණ), පී එම් ප්‍රේමදාස මහතා (සහකාර මහා කළමනාකරු - සබරගමුව පළාත), එම් ඒ සුමනරත්න මහතා (සහකාර මහා කළමනාකරු - බස්නාහිර පළාත - උතුර), ඩබ් සී කේ වික්‍රමාරච්චි මහතා (සහකාර මහා කළමනාකරු - ශාඛා ණය)

විධායක
කළමනාකරණ කණ්ඩායම

වමේ සිට දකුණට
ඊ එම් එස් කේ දංගම්පොල මිය (සහකාර මහා කළමනාකාරිනී - මධ්‍යම පළාත), ඩී එම් ජී සී දේවසිංහ මහතා (සහකාර මහා කළමනාකරු - වෙළඳ සේවා),
ජේ එම් ඩී බී ජයසුන්දර මහතා (සහකාර මහා කළමනාකරු - තොරතුරු පද්ධති විගණන), සී අමරසිංහ මහතා (සහකාර මහා කළමනාකරු - අක්වෙරළ බැංකුකරණය),
කේ පී ආනන්දනඩේසන් මහතා (සහකාර මහා කළමනාකරු - නැගෙනහිර පළාත)

වමේ සිට දකුණට
එච් එම් පී බී හේරත් මහතා (සහකාර මහා කළමනාකරු - උතුරු මැද පළාත), ඩබ් අයි හෙට්ටිහේවා මිය (සහකාර මහා කළමනාකාරිනී - මෙට්‍රොපොලිටන් ශාඛාව),
එම් ටී එම් ජලාල්ඩීන් මහතා (සහකාර මහා කළමනාකරු - අනුකූලතා), එම් ජේ පී සල්ගාදු මහතා (සහකාර මහා කළමනාකරු - පළාත් විකුණුම් කළමනාකරණය),
ඩබ් ඒ සී තිසේරා මහතා (සහකාර මහා කළමනාකරු - නිෂ්පාදන සහ සංවර්ධන බැංකු කටයුතු)

වමේ සිට දකුණට
ඩී එම් එල් බී දසනායක මහතා (සහකාර මහා කළමනාකාර - ආයතනික ණය), එස් එම් ඩබ්ලිව් සමරකෝන් මහතා (සහකාර මහා කළමනාකරු - ජාත්‍යන්තර), ජේ එම් ඒ ආරියතිලක මහතා (සහකාර මහා කළමනාකරු - ව්‍යාපාර ක්‍රියාවලි ප්‍රතිනිර්මාණ සහ ප්‍රතිව්‍යුහකරණ ව්‍යාපෘතිය), ආර් එම් ඩී වී ජයබාහු මහතා (සහකාර මහා කළමනාකරු - අයවැය සහ ක්‍රමෝපාය සැලසුම්), ජී එච් වික්‍රමසිංහ මහතා (සහකාර මහා කළමනාකරු - බී ඕ සී කාඩ්පත් මධ්‍යස්ථානය)

වමේ සිට දකුණට
ඒ එස් දංගල්ල මහතා (සහකාර මහා කළමනාකරු - ණය විගණන), පී ජී ජී තිසේරා මහතා (සහකාර මහා කළමනාකරු - භාණ්ඩාගාර පසුපෙළ කාර්යාලය), පී ඒ ජයශාන්ත මහතා (සහකාර මහා කළමනාකරු - ආපසු අයකර ගැනීම් - ආයතනික), ආර් පී ඩී කේ රත්නසිංහ මහතා (සහකාර මහා කළමනාකරු - පත්කරන ලද), ජේ සී ඒ කුරුඳුකුඹුර මහතා (තොරතුරු තාක්ෂණ - මෙහෙයුම්/තාක්ෂණ සහය)

වමේ සිට දකුණට
එම් එම් එල් පෙරේරා මහතා (සහකාර අධ්‍යක්ෂ තොරතුරු තාක්ෂණ - යෙදවුම් පද්ධති), එම් ගුණසේකර මිය (නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිනී - ආපසු අයකර ගැනීම්), ඩී කිතුල්ගොඩ මිය (නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිනී- ජාත්‍යන්තර හා ආයෝජන බැංකුකරණය), ජී ජයසිංහ මිය (නියෝජ්‍ය ප්‍රධාන නීති නිලධාරිනී- ණය)

ශක්තියේ පුනරාවර්ජනය

වෙළඳපල ඉල්ලුම, තැන්පතු, අර්ථික විචලනයන් හා ආශ්‍රිත පීඩනයන්ට සීඝ්‍ර ප්‍රතිචාර දක්වමින් ද නියාමනයන්ට අනුකූල වෙමින් ද, මෙහෙයුම් කටයුතු හා ගනුදෙනුකාර සේවාවන් බලාත්මක කිරීමට අවැසි ශක්තිය උත්පාදනය කරගනී.

SIR THOMAS MAITLAND
251

කළමනාකරණ විවරණය
සහ විශ්ලේෂණය

ශ්‍රී ලංකා රුපියල් ට්‍රිලියනය ඉක්මවූ වත්කම් සහිත සහ ශ්‍රී ලංකා රුපියල් බිලියන 100කට අධික වාර්ෂික ආදායමක් ඇති ලංකා බැංකුව ශ්‍රී ලංකාවේ විශාලතම මූල්‍ය ආයතනයයි. විදේශීය ශාඛා දෙකක්ද ඇතුළුව ශාඛා 324 ක්, ව්‍යාප්ති කාර්යාල 276 ක්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 451 ක්, රටවල් 119 ක නියෝපිත බැංකු 762 ක් සහ රටවල් 20 ක විනිමය හුවමාරු සමාගම් 97 ක් සහිත අපගේ ජාලය ඔස්සේ මිලියන දහය ඉක්මවූ ගනුදෙනුකරුවන්ට අපගේ සේවා සලසන්නෙමු.

අපගේ ගනුදෙනුකාර භවතුන් අතරට අප මව්බිමේ මෙන්ම ජාත්‍යන්තරවද අපගේ ශාඛා ඔස්සේ අප සමග සම්බන්ධතා ගොඩනගා ගත් විශාල සමාගම්, මූල්‍ය ආයතන, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඉහළ ශුද්ධ වත්කම් සහිත ගනුදෙනුකරුවන් ව්‍යවසායකයන් සහ පුද්ගලයන් අයත් වේ. අපගේ ගනුදෙනුකරුවන් සහ පාර්ශවකරුවන්ට සේවය කිරීම සඳහා කැපවූ අප කණ්ඩායම සේවකයන් 7,790 කින් සමන්විත වේ.

මව් සමාගම වන ලංකා බැංකුව, පරිපාලිත සමාගම් 13 ක් සහ ආශ්‍රිත සමාගම් පහකින් සමන්විත ලංකා බැංකුව සමූහ ව්‍යාපාරයකි. සමූහයේ ව්‍යුහය පිළිබඳ වැඩි විස්තර සඳහා 244 වන පිටුවේ සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ අංක 1.1 සටහන බලන්න.

සමූහයේ සමස්ත වත්කම්වලින් 97%ක්ම ලංකා බැංකුව සතු වේ. පරිපාලිත හා ආශ්‍රිත සමාගම් ඒකාබද්ධව ලංකා බැංකු සමූහයේ වත්කම් සඳහා 3% කින්ද, ආදායම සඳහා 5% කින්ද දායක වේ. අන්‍යාකාරයෙන් සඳහන් කර ඇතොත් මිස, කළමනාකරණ විවරණය සහ විශ්ලේෂණය පිළිබඳ මෙම වාර්තාව මුළුල්ලෙහිම සඳහන් කරනුයේ මව් සමාගම වූ ලංකා බැංකුව පිළිබඳව පමණි.

ශාඛා බැංකු කටයුතු

ශාඛා බැංකු කටයුතු අංශය ශ්‍රී ලංකාවේ විශාලතම ශාඛා බැංකු කටයුතු ජාලය හරහා අපගේ ප්‍රමුඛතා බැංකුකරණ ඒකකය මඟින් සේවා සපයන ඉහළ මට්ටමේ ආයෝජන හැකියා සහිත පුද්ගලයන්ගේ සිට සියලු පුද්ගලයන්ට සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් දක්වා ගනුදෙනුකරුවන්ට සේවා සපයයි. නිපැයුම් සහ සංවර්ධන බැංකු අංශයද මධ්‍යගත බැංකුකරණ ජාලය සිය කටයුතු සඳහා යොදාගනී. ඉන් සපයන සේවාවන් අතරට කාලීන තැන්පතු සහ ඉතුරුම් ඒකරාශී කිරීම මෙන්ම ජංගම ගිණුම්, උකස් කටයුතු, විවිධ ණය වර්ග, හර කාඩ්පත් සහ ණය කාඩ්පත් අයත් වේ.

වැඩි විස්තර 76 වන පිටුවේ

බැංකුවේ සමස්ත ආදායමෙන් 36.20% කට දායක වේ.

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණ කටයුතු

ආයතනික සහ අක්වෙරළ බැංකු අංශය විශාල සහ මධ්‍යම පරිමාණ ආයතනික සේවාග්‍රාහකයන්, මූල්‍ය ආයතන, රජය සහ රජයට අයත් ව්‍යාපාර ඇතුළුව දේශීය සහ අක්වෙරළ බැංකු ආයතනික ගනුදෙනුකරුවන් සඳහා නිපැයුම් සහ සේවා සපයයි. මුදල් කළමණාකරණය, ආයතනික ණය පිරිනැමීම, වෙළඳ මූල්‍ය හා ව්‍යාපාරික ණය ආදිය එමඟින් සපයන සේවාවන් අතර වේ. මධ්‍යගත විදේශීය මුදල් ඒකක බැංකුකරණ ඒකකය හරහා ද මෙම අංශය සේවා සපයයි.

වැඩි විස්තර 82 වන පිටුවේ

බැංකුවේ සමස්ත ආදායමෙන් 54.63% කට දායක වේ.
(රාජ්‍ය අංශය ද ඇතුළුව)

භාණ්ඩාගාර සේවා සහ ජාත්‍යන්තර බැංකු කටයුතු

බැංකුවේ වත්කම් වගකීම් සංකලනය සහ ද්‍රවශීලතා තත්ත්වය භාණ්ඩාගාර අංශය මඟින් කළමනාකරණය කරයි. එසේම එම අංශය ගනුදෙනුකරුවන් මෙන්ම බැංකුව වෙනුවෙන් විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු වල නිරත වේ. පිරිනමන සේවාවන් අතරට භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර වෙළඳාම සහ ව්‍යුත්පන්න නිපැයුම් වන ව්‍යවහාර මුදල් හුවමාරු, පොළී අනුපාත හුවමාරු, ඉදිරි විනිමය ගිවිසුම් සහ ආයෝජන ක්‍රියාකාරකම් අයත් වේ. බැංකුවේ විදේශීය පරිපාලිත සමාගම්, විදේශ ශාඛා සහ විදේශීය රටවල නියෝජිත බැංකු සබඳතා අධීක්ෂණය මෙම අංශය මඟින් සිදු කරයි. රටවල් 119 ක සිය නියෝජිත බැංකු 762 හරහා ආමුඛ ප්‍රේෂණ, දේශීය භාණ්ඩාගාර මෙහෙයුම් සහ ජාත්‍යන්තර මූල්‍යකරණය යනාදී අංශ වල වෙළඳපොළ නායකත්වය හිමි කර ගැනීමට මෙම අංශය සමත්ව තිබේ.

වැඩි විස්තර 86 වන පිටුවේ

බැංකුවේ සමස්ත ආදායමෙන් 8.99% කට දායක වේ.

ඉස්ලාමීය බැංකුකරණ කටයුතු

ඉස්ලාමීය මූල්‍යකරණය මඟින් ෂාරියා නීතියට අනුකූල නිපැයුම් සහ සේවාවන් සපයනු ලැබේ. බැංකුකරණයේ සුවිශේෂී ලාභදායී බැංකුකරණ ක්ෂේත්‍රයක් වන මෙම අංශයෙහි අනාගතයේදී පුළුල් වර්ධන විභවයක් ඇති වන බවට බැංකුව හඳුනාගෙන තිබේ. මෙම අංශය මඟින් සපයන සේවාවන් අතර ඉස්ලාමීය තැන්පතු සහ ආයෝජන / ණය ප්‍රදාන සේවාවන් වේ. මෙය ශාඛා බැංකු කටයුතු අංශයේ උප ඒකකයකි.

වැඩි විස්තර 79 වන පිටුවේ.

බැංකුවේ සමස්ත ආදායමෙන් 0.18% කට දායක වේ.

ව්‍යාපාරික සහායක කටයුතු

ඉහත සඳහන් ව්‍යාපාරික ඒකකයන්හි ක්‍රියාකාරිත්වය උදෙසා හැකියාව ලබාදෙන අනෙකුත් පසුපෙළ කාර්යාල සේවාවන් වන තොරතුරු තාක්ෂණය, මූල්‍ය, අවදානම, මානව සම්පත්, නෛතික, විගණන, අනුකූලතා සහ සහායක සේවා යනාදිය මෙයට අයත් වේ.

සමස්ත මෙහෙයුම් වියදම් ශ්‍රී ලංකා රු. මිලියන 20,869 කි.

ඉදිරි දැක්ම

ජාතියේ මහා පහන් ටැඹ

මෙහෙවර

ගනුදෙනුකරුවන්
අපගේ සියලුම ගනුදෙනුකරුවන්ගේ අපේක්ෂාවන් ඉක්මවා යන පරිදි විශ්වාසවන්තවත් වගකීමෙනුත් යුතු ඵලදායී වූ ගනුදෙනුකාර සම්බන්ධතාවක් ගොඩනැගීම

කාර්ය මණ්ඩලය
අපගේ කාර්ය මණ්ඩලය නිසි පිළිගැනීමට සහ ඇගයුමට ලක් කිරීමෙන් හොඳම ඉලක්ක සපුරා ගන්නා විශිෂ්ඨ සේවා කණ්ඩායමක් බවට පත් කිරීම

අයිතිකරුවන්
අපගේ අයිතිකරුවන්ගේ අපේක්ෂාවන්ට අනුකූලව ලාභදායිත්වයක් සමග ජාතික සංවර්ධනයේ ක්‍රියාකාරකයෙකු වීම

සමාජය
සමස්ත සමාජය වෙතම පුළුල් බැංකු සේවාවක් සපයමින් දේශයට සෙත සලසන පහන් ටැඹක් ලෙස වැජඹීම

අපගේ ආයතනික උපාය මාර්ගය

ශ්‍රී ලංකාවේ විශාලතම සහ වඩාත්ම විවිධාංගීකරණයෙන් යුත් මූල්‍ය සේවා ආයතනයක් ගොඩ නැංවීම

ප්‍රධාන ඉලක්ක

“One Ten Twelve”

රු. බිලියන 10

රු.ට්‍රිලියනයක

මුළු වත්කම්
රු. ට්‍රිලියන 1.048 සපුරා ගන්නා ලදී.

මෙහෙයුම් ලාභය
රු. බිලියන 19.8 ක් සපුරා ගන්නා ලදී.

2012 වසර වන විට/වසරේදී

අපගේ නිර්ණීත තූන් අවුරුදු පොරොන්දුව.....

ඉටු කරන ලදී

රට තුළ පැවති අභ්‍යන්තර ගැටුමේ නිමාවත් සමගින් 2009 වසරේදී සම්පාදනය කරන ලද ආයතනික සැලැස්ම බැංකුවේ නව දිශානතිය තීරණය කරන ලදී. "One Ten Twelve" යන පාඨය යටතේ වූ එකී ආයතන සැලැස්ම බැංකුව සඳහා සුසමාදර්ශී වෙනසක් විය. බැංකුව එහි ඉලක්ක ඒ සඳහා සැලසුම් කළ කාලය වූ 2012 වසර තුළදී හෝ ඊට බොහෝ කලකට පෙර සපුරා ගැනීමට සමත් විය. මෙම අපේක්ෂා සහගත චාරිකාවේදී බැංකුව සාක්ෂාත් කරගැනීම සඳහා නියම කර ගත් ප්‍රධාන අභිමතාර්ථ මෙන්ම අනෙකුත් ජයග්‍රහණයන්ද පහත අපි පිරික්සා ඇත්තෙමු.



උපාය මාර්ගික කාර්යසාධනය මැනීම

රු. ට්‍රිලියන 1.048 ක
මුළු වත්කම් සපුරා ගන්නා ලදී.
රු. ට්‍රිලියන 1.0 ක ඉලක්කය 4% කින් ඉක්මවා යාමකි.

රු. බිලියන 19.8 ක
මෙහෙයුම් ලාභය
රු. බිලියන 10 ක ඉලක්කයට වඩා 97% ක වැඩිවීමකි.

සමස්ත වත්කම් වල වර්ධනය (රු. බිලියන)



නියමිත කාලසීමාවට මාස 7 කට පෙර, එනම් 2012 මැයි මාසයේදී රු. ට්‍රිලියන 1 ක ශේෂ පත්‍රයක් සපුරාගැනීමට බැංකුවට හැකි වූ අතර ඒ අනුව රු. ට්‍රිලියන 1 ක ශේෂ පත්‍රයක් සහිත ශ්‍රී ලංකාවේ පළමු ආයතනය සහ බැංකුව බවට පත් වීමට ලංකා බැංකුවට හැකි විය. 2009 දී රු. මිලියන 538,241 ක් වූ පදනමක සිට ඊළඟ වසර තුන තුලදී බැංකුවේ වත්කම් පදනම 95% කින් වර්ධනය වී රු. ට්‍රිලියන 1,048 ක් වෙත ළඟා වූ අතර ඉන් රු. මිලියන 209,947 ක් එකතු වූයේ 2012 දීය.

මෙම කඩිනම් වර්ධනයට ඉමහත් රුකුලක් වූයේ දළ දේශීය නිෂ්පාදිතයේ ශක්තිමත් වර්ධනය සහ යටිතල පහසුකම්වල සංවර්ධනයයි.අළුතින් පිබිදෙන උතුරු හා නැගෙනහිර පළාත් යළි ගොඩනැංවීමේදී සහ අනෙකුත් ප්‍රදේශ තවදුරටත් සංවර්ධනය කිරීමේදී වඩා වැඩි ප්‍රවේශයක් ලබාදීම උදෙසා බැංකුව සිය අරමුණු කේන්ද්‍රගත කරන ලදී.

වත්කම් වර්ධනය මෙහෙයවනු ලැබුවේ ආයෝජන, ණය සහ අත්තිකාරම් මඟින් වන අතර, විශේෂයෙන්ම පළාත්බද ව්‍යාප්තිය මඟින් බලගන්වනු ලැබූ ඉහල ඵලදායීත්වයකින් යුතු සුරක්ෂිත අරමුදල් නිපැයුම් මඟිනි. 2012 අවසානය වන විට අත්තිකාරම්වලින් 62% ක් සහිතව වර්ධනයේ ගාමක බලය වූයේ පුද්ගලික අංශයයි. පුද්ගලික අංශය සඳහා වූ ණය 20% කින් වර්ධනය වූ අතර පළාත්බද ණය වර්ධනය 33% ක් විය.

මෙම වර්ධනය අත්කර ගනු ලැබුයේ වත්කම්වල ගුණාත්මක බවද පවත්වාගනිමිනි. අක්‍රීය වත්කම් 2.8% දක්වා සුළු වශයෙන් වර්ධනය වූ අතර කර්මාන්තයේ අනෙකුත් තරඟකරුවන් හා සැසඳීමේදී එය බෙහෙවින්ම තරඟකාරී අනුපාතයක් විය.

2012 වසර සඳහා බදු පෙර ලාභය ලෙස රු. බිලියන 19.8 ක් වාර්තාකරන්නා වූ ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයේ එකම බැංකුකරණ ආයතනය ලංකා බැංකුව වනු ඇත. 2012 වසර සඳහා රු. බිලියන 10 ක් වූ ප්‍රථම ආයතනික සැලැස්ම හා සසඳා බැලීමේදී බැංකුවේ ලාභ දෙගුණයකින් වැඩි වීම, රටේ සීඝ්‍ර ආර්ථික වර්ධනය හා අනුකලනය වීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳ කදිම සාක්ෂියකි.

2012 දෙසැම්බර් 31 දිනට නිපැයුම් අනුව වත්කම්



කළමනාකරණ විවරණය
සහ විශ්ලේෂණය

මෙම ආශ්චර්යමත් ජයග්‍රහණය ලබාගැනීමට හැකිවූයේ ආදායම් වර්ධනයත් සමඟ අරමුදල් පිරිවැය සහ මෙහෙයුම් වියදම් පාලන සංකලනයක් මඟිනි.

ලාභ වර්ධනය කරගත හැකිවූයේ තිරසාර මූලික බැංකුකරණ ආදායම් ප්‍රවාහයන් තුලින් සහ බාහිර ණය ගැනුම් මඟින් තැන්පතු පදනම ඌණපූරණය කිරීම තුළින් යහපත් ශුද්ධ පොළී ආන්තිකයක් පවත්වාගැනීම මඟිනි.

වැඩි දියුණු වූ ආදායමට පිරිවැය අනුපාතය සඳහා ප්‍රධාන හේතූන් වූයේ කාර්යාවලි ස්වයංක්‍රීයකරණය සහ ව්‍යාප්තිය නිසා ඇතිවූ පිරිවැය වාසියයි. නිර්මාණය කරන ලද මෙම ශක්තිමත් අත්තිවාරම, දිනෙන් දින දියුණුවට පත්වීමට බැංකුවට හැකියාව ලබා දෙනු ඇති බවට බැංකුව දැඩිව විශ්වාස කරයි.

ලාභදායිත්වය (රු. බිලියන)



ආදායමට පිරිවැය අනුපාතය (%)



2012 අනෙකුත් ජයග්‍රහණ

පළමු ජාත්‍යන්තරව ලැයිස්තුගත කළ පස් අවුරුදු බැඳුම්කර දියත් කර ඇ.ඩො.මිලියන 500 ක් ජනනය කරන ලදී.

ඇ.ඩො.මිලියන 500

ස්වාධීන ශ්‍රේණිගත කිරීම් තත්ත්වයට සමාන,
ලබාගත හැකි ඉහළම ජාත්‍යන්තර ශ්‍රේණිගත කිරීම

BB- / Stable

FitchRatings

B1 / Stable

Moody's

වඩාත්ම වටිනාකම සහිත වෙළඳ සන්නාමය ලෙස

තෝරා ගන්නා ලදී. රු. බිලියන 15.192

BRAND·FINANCE®

රාජ්‍ය අංශයේ හොඳම ආයතන 20 අතුරින්

තෙවැන්න ලෙස LMD ව්‍යාපාරික සඟරාව මඟින් ශ්‍රේණිගත කරන ලදී.

LMD
THE VOICE OF BUSINESS

ලෝකයේ ප්‍රමුඛතම බැංකු 1000 අතරින්
966 වැන්න ලෙස ශ්‍රේණිගත කරන ලදී

The Banker
GLOBAL FINANCIAL INTELLIGENCE SINCE 1926

ජාතික වාණිජ මණ්ඩලය
ව්‍යාපාරික විශිෂ්ඨතා සම්මාන - 2012

ස්වර්ණ - බැංකුකරණ හා මූල්‍ය සේවා අංශය

රිදී - විශාල පරිමාණයේ ව්‍යාපාර කාණ්ඩය

ලෝකඩ - සමස්ත ජයග්‍රාහක (සියලු සමාගම්)

වැදගත් මූල්‍ය තොරතුරු සමාලෝචනය

බදු පෙර ලාභය

ගණනය කිරීම: සියලු වියදම් සඳහා ගණන් තැබීමෙන් පසු නමුත් ව්‍යවස්ථාපිත බදු අඩු කිරීමට පෙර බැංකුවේ ලාභදායිත්වය ගණනය කරනු ලැබේ.

ප්‍රතිඵලය: රු. බිලියන 19.8 ක කැපී පෙනෙන ලාභයක් වාර්තා කරන ලදී. මෙය 30% ක වර්ධනයක් වූ අතර ඒ සඳහා මූලිකවම හේතු වූයේ සියලු පළාත්වල වර්ධනය වූ ව්‍යාපාරික ධාරිතාවන් හේතුවෙනි.

සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය

ගණනය කිරීම: බැංකුව කොතරම් කාර්යක්ෂම අන්දමින් එහි වත්කම් භාවිතයට ගෙන ඇත්දැයි ගණනය කරයි.

ප්‍රතිඵලය: සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභ 2011 වසරට සමාන මට්ටමකින් පවත්වා ගෙන යන ලදී.

සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභය

ගණනය කිරීම: පාර්ශවකාර අරමුදල්වලින් ප්‍රතිශතයක් ලෙස බැංකුව කෙතරම් මුදලක් උපයා ඇත්දැයි ගණනය කරයි.

ප්‍රතිඵලය: සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභය 31.2% දක්වා ඉතා සුළු වශයෙන් පහත වැටුණු අතර ඒ සඳහා හුදෙක්ම හේතු වූයේ ඉහළ නැංවුණු කොටස්කරුවන්ගේ සංචිත පදනමයි.

බදු පෙර ලාභය (රු.බිලියන)



සාමාන්‍ය වත්කම් මත ප්‍රතිලාභය (%)



සාමාන්‍ය ස්කන්ධය මත ප්‍රතිලාභය (%)



ශුද්ධ පොළී ආන්තිකය

ගණනය කිරීම: පොළී උපයන වත්කම්වල ප්‍රතිශතයක් ලෙස ශුද්ධ පොළී ආදායම ගණනය කරනු ලැබේ.

ප්‍රතිඵලය: ඉහළ යමින් පැවති අරමුදල් පිරිවැය මඟින් ඇති කරන ලද ආන්තික පීඩනය සහ 2012 වසරේ ඇතැම් කාලපරිච්ඡේදවල වෙළඳපොලෙහි වඩා පහළ වෙළඳපොළ ද්‍රවශීලතාවක් පැවතියා වුවද, 3.7% ක පොළී ආන්තිකයක් පවත්වාගැනීමට බැංකුවට හැකි විය.

ශුද්ධ පොළී ආන්තිකය (%)



ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කළ දළ ණය සහ අත්තිකාරම්

ගණනය කිරීම: අයිරා, වෙළඳ මූල්‍යයන, කාලීන ණය ආදී වශයෙන් ප්‍රදානය කළ ණය ප්‍රමාණයයි.

ප්‍රතිඵලය: ණය සහ අත්තිකාරම් පෙර වසරට සාපේක්ෂව 27% කින් වර්ධනය විය. එම වර්ධනයෙන් 19%කට උතුරු නැගෙනහිර පළාත් දායක විය.

දළ ණය සහ අත්තිකාරම් (රු.බිලියන)



ගනුදෙනුකරුවන්ගේ තැන්පතු

ගණනය කිරීම: ජංගම ගිණුම්, ඉතිරිකිරීමේ ගිණුම්, කාලීන තැන්පතු, ජංගම තැන්පතු ලෙස ගනුදෙනුකරුවන් බැංකුවේ තැන්පත් කළ තැන්පතු ප්‍රමාණයයි.

ප්‍රතිඵලය: ග්‍රාමීය සහ නාගරික ජනයා අතර ඉතිරි කිරීම් පිළිබඳව දැනුවත්බව ප්‍රවර්ධනය කිරීමට බැංකුව අඛණ්ඩව දැරූ උත්සාහය පිලිබිඹු කරමින් රු. බිලියන 693 ක් දක්වා ළඟා විය.

ගණුදෙනුකරුවන්ගේ තැන්පතු (රු.බිලියන)



අක්‍රීය අත්තිකාරම් අනුපාතය

ගණනය කිරීම: ණයගැතියෙකු පොළිය හෝ ප්‍රාග්ධන මුදල කාලීනව ආපසු ගෙවීම පැහැර හරින්නේ නම් සහ මහ බැංකුවේ රෙගුලාසි ප්‍රකාරව නියම කරන ලද කාලසීමාවන් ඉක්මවා යන්නේ නම් එබඳු ණය 'අක්‍රීය ණය' ලෙස සලකනු ලැබේ. මෙම අනුපාතයෙන් සමස්ත ණය ප්‍රමාණයට සාපේක්ෂව අක්‍රීය ණය ප්‍රමාණය ගණනය කරනු ලැබේ.

ප්‍රතිඵලය: නියඟය, ගංවතුර මෙන්ම මාලදිවයිනේ පැවති දේශපාලන අර්බුදය හේතුවෙන් 2012 වසරේදී වත්කම් ගුණත්වයට බලපෑම් ඇති විය. පොළී අනුපාත ඉහළ යාම හේතුවෙන් මෙම තත්ත්වය තවදුරටත් වේගවත් විය.

අක්‍රීය අත්තිකාරම් අනුපාතය (%)



කළමනාකරණ විවරණය
සහ විශ්ලේෂණය

ආදායමට පිරිවැය අනුපාතය

ගණනය කිරීම: මෙහෙයුම් පිරිවැය මෙහෙයුම් ආදායමේ ප්‍රතිශතයක් ලෙස ගණනය කරනු ලැබේ.

ප්‍රතිඵලය: මෙම දර්ශකය කාර්යක්ෂම මට්ටමක් වූ 42.7% පැවති අතර පෙර වසරේ පැවති 51.1% ට වඩා ඌනනය වීමකි. ක්‍රියාදාම ස්වයංක්‍රීයකරණය සහ ආර්ථික පිරිමැසුම් මඟින් පිරිවැය අඩු කර ගැනීම මේ සඳහා මූලිකවම හේතු විය.

මුළු ප්‍රාග්ධන ප්‍රමාණවත්බවෙහි අනුපාතය

ගණනය කිරීම: බැංකුවේ ප්‍රාග්ධනය පිලිබඳ මිම්මකි. බැංකුව විසින් උපකල්පිත අවදානම දරාගැනීමට බැංකුවට ඇති හැකියාව පිළිබඳ මිනුමක් ලෙස මෙම අනුපාතය භාවිතා කරනු ලැබේ.

ප්‍රතිඵලය: පසුගිය වසර තුන තුළ දක්නට ලැබුණු ඉහළ වත්කම් වර්ධනය හේතුවෙන් බැංකුවෙහි ප්‍රාග්ධන ප්‍රමාණවත්බවෙහි අනුපාතය බලපෑමට ලක් වුණි. 2012දී බැංකුවේ ප්‍රාග්ධන ප්‍රමාණවත්බවෙහි අනුපාතය 11.4% ක් විය.

ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය

ගණනය කිරීම: ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය යන්නෙන් අදහස් වනුයේ මූල්‍ය ආයතනයක් සිය සංචිතවල පවත්වාගෙන යා යුතු මුදල්, වටිනා ලෝහ හෝ අනෙකුත් කෙටිකාලීන සුරැකුම්පත් ආදී ද්‍රවශීල වත්කම් ප්‍රමාණයයි.

ප්‍රතිඵල: වත්කම් මත ප්‍රතිලාභ තුලනය කරගනිමින් ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් බැංකුව පවත්වාගෙන යන ලදී.

ආදායමට පිරිවැය අනුපාතය (%)



මුළු ප්‍රාග්ධන ප්‍රමාණවත්බවෙහි අනුපාතය (%)



ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය (%)



මූල්‍ය සමාලෝචනය

ආදායම

මුළු ආදායම 2011 පැවති රු. මිලියන 70,457 සිට රු. මිලියන 110,138 ක් දක්වා 56% කින් වර්ධනය වූ අතර මෙම සුවිසල් වැඩිවීමට මූලිකවම හේතු කාරක වූයේ පොළී ආදායම ඉහළ යාමයි. පෙර වසරට සාපේක්ෂව විදේශ විනිමය ආදායමද වැඩි වූ අතර ආනයන අඩුවීම සහ අපනයනයන් කෙරේ බලපෑ දුර්වල ගෝලීය ඉල්ලුම හේතුවෙන් වෙළඳ පිරිවැටුම සම මට්ටමක පැවතීම නිසා ගාස්තු පාදක ආදායම ස්ථාවරව පැවතුණි. ශේෂ පත්‍ර ප්‍රමාණයේ වැඩිවීම සහ ඉහළ ඵලදා වත්කම් මත වැඩි අවධානයක් සහිතව වත්කම් සංයුතියේ වෙනස්වීම් හේතු කොටගෙන මුළු ආදායමේ ඉහළ යාමක් සිදු විය.

අඩු වුණි. මෙම වත්කම්වල අඩුවීමට මූලික වූයේ ඒවා ණය සහ අත්තිකාරම් ලෙස නැවත පැවරීම නිසාවෙනි.

පෙර වසරට සාපේක්ෂව ගාස්තු පාදක ආදායමේ 9% ලෙස සුළු වශයෙන් වැඩි වී තිබේ. දුෂ්කර පළාත් තුලට සිය ක්‍රියාකාරකම්

බලපෑ අතර 2012 වසරේදී විදේශ විනිමය වෙළඳපොලෙහි ඉක්මනින් වෙනස්වන තත්ත්වයන් ඇති කරන ලද්දේ පොළී පරාසයන් පුළුල් වීම සහ ඉහළ නැංවුණු අන්තර් බැංකු වෙළඳාමය. 2011 දී රු. මිලියන 1,746 ක් වූ විනිමය ආදායම 2012 දී රු. මිලියන 5,809 දක්වා දෙගුණයකටත් වඩා වැඩි විය. මෙම

අනෙකුත් ආදායම

	රු. මිලියන		
	2012	2011	විචලනය
ගාස්තු ආදායම	6,666	6,133	9%
විදේශ විනිමය ආදායම	5,809	1,746	233%
ලාභාංශ ආදායම	740	713	4%
ලාභ / (අලාභ) පොළී අනුපාත සාධන පත්‍ර	134	(276)	-149%
ලාභ / (අලාභ) ස්කන්ධ සාධනපත්‍ර	(441)	(1,083)	-59%
අනෙකුත් ආදායම	1,554	1,459	7%
එකතුව	**14,462**	**8,692**	**66%**

ආදායම් සංයුතිය

	රු. මිලියන		
	2012	2011	විචලනය
පොළී ආදායම			
ගනුදෙනුකරුවන්ට ප්‍රදානය කළ ණය හා අත්තිකාරම්	72,579	43,562	67%
මුදල් ආයෝජන	16,594	10,538	58%
වෙනත්	5,848	7,122	-18%
එකතුව	**95,022**	**61,222**	**55%**

පොළී ආදායමේ වැඩිවීමට පාදක වූයේ බැංකුවේ සියලු ව්‍යාපාරික කටයුතු හරහා පොළී උපයන වත්කම්වල සිදුවූ වර්ධනයයි. 67% කින් වර්ධනය වූ ණය සහ අත්තිකාරම් සහ 58% කින් වර්ධනය වූ මූල්‍ය ආයෝජන යන දෙකෙහිම පොළී ආදායමේ කැපී පෙනෙන වර්ධනයක් දක්නට ලැබුණි. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම දායක වූයේ 27% කින් වර්ධනය වූ ශේෂ පත්‍ර ණය සහ අත්තිකාරම් සහ 49% කින් වර්ධනය වූ මූල්‍ය ආයෝජන ණය සහ අත්තිකාරම් සහ පරිනතිය දක්වා රඳවා ගනු ලැබූ මූල්‍ය ආයෝජනයන්ය. මීට අමතරව ආදායම වර්ධනය වීමට පොළී අනුපාතයන්හි වර්ධනය වීම බලපා ඇත. අනෙකුත් පොළී ආදායම් උපයා ඇත්තේ විකිණීම සඳහා ඇති ආයෝජන, වෙළඳාම් සඳහා රඳවාගනු ලැබූ ආයෝජන ප්‍රතිවර්ත ප්‍රති මිලදී ගැනුම් හිවිසුම්, සහ බැංකු සමඟ රඳවාගැනීම් මඟිනි.

මෙම කාණ්ඩ හතරෙන් ලත් ආදායම 18% කින් පහත වැටුණු අතර ව්‍යුත්පන්නයක මිල පදනම් වූ මූල්‍ය සාධන පත්‍ර කළඹක් ලෙස 31% කින්

ව්‍යාප්ත කිරීමේ බැංකුවේ උපාය මාර්ගය මඟින් සිය වෙළඳ මූල්‍යයන කටයුතු නොනවත්වා පවත්වාගෙන යාමට බැංකුවට හැකි වූ නමුත් ආනයන / අපනයන වෙලඳාමේ පසුබෑම මඟින් ගාස්තු ආදායමේ වර්ධනයට බලපෑම් ඇතිවුණි. ණය ආශ්‍රිත ක්‍රියාකාරකම් මඟින් ලැබූ ගාස්තු ආදායම 17% කින් වර්ධනය වූ අතර ණය / හර කාඩ්පත් ව්‍යාප්ති උපාය මාර්ගය හේතුවෙන් කාඩ්පත් ආශ්‍රිත ගාස්තු 31% කින් වර්ධනය විය. ආමුඛ ප්‍රේෂණ ගාස්තු ආදායම 8.1%කින් ඉහළ යාම එම ප්‍රේෂණ ව්‍යාපාරය සංවර්ධනය සඳහා වූ බැංකුවේ අඛණ්ඩ කැපවීමට සාක්ෂි දරන්නක් විය. එයට අමතරව, ඇපකරු ගාස්තු 8.5% කින් වැඩි වූ අතර ගනුදෙනුකාර තැන්පතු ආශ්‍රිත ගාස්තු 13.7% කින් වර්ධනය විය.

යුරෝපීය රාජ්‍ය ණය අර්බුදය සහ එක්සත් ජනපද මූල්‍ය අර්බුදය ගෝලීය ව්‍යවහාර මුදල් වෙළඳපොළේ වෙනස්වන සුළු බවට

ආදායමෙන් රු. මිලියන 3,985 ක් හෙවත් 69% ක් වෙළඳ ක්‍රියාකාරකම් නිසා උත්පාදනය වූ අතර ඉතිරිය වර්තමාන වෙළඳපොළ වටිනාකමට ප්‍රත්‍යාගණනය කිරීම නිසාවෙන් ඇති වුණි. දේශීය වෙළඳපොලෙහි ඉක්මනින් වෙනස් වන සුළු තත්ත්වයක් ඇති වූයේ විනිමය වෙළඳපොළ මැදිහත් නොවීමට මහ බැංකුව තීරණය කිරීම නිසා රුපියලේ අගය අවප්‍රමාණය වීමෙන් වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස එක්සත් ජනපද ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය අඩුවීම නිසා පෙර වසර හා සැසඳීමේදී වෙළඳ ලාභ 150% කින් වැඩිවුණි. අනෙක් අතට වෙළඳ සාධනපත්‍ර හරහා වර්තමාන වෙළඳපොළ වටිනාකමට ගණනය කිරීමෙන් ඇති වූ පාඩුව රු. 306,523 දක්වා අඩු විය.

බැංකුවේ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල ලාභදායිත්වය ඉහළ නැංවීම අරමුණු කරගනිමින් සහ වෙළඳපොළ තරඟකාරී ලාභාංශ ගෙවීම පිණිස එම සමාගම් සමඟ කතිකාවතකට බැංකුව මුලපිරීම නිසා බැංකුවේ පරිපාලිත හා ආශ්‍රිත සමාගම් විසින් සිදු කළ ඉහළ නැංවූ ලාභාංශ ගෙවීම් මඟින් සැපයූ දායකත්වය හේතුවෙන් වසර තුළදී ලාභාංශ ආදායම 4% කින් ඉහළ නැංවුණි.

පොළී උපයන සාධනපත්‍ර වලින් ලැබූ වෙළඳ ප්‍රතිලාභ වසර තුළදී සුළු වශයෙන් වැඩි දියුණු වූ අතර 2012 දෙවන භාගයේ කොටස් වෙළඳපොළ තත්ත්වයන් පහත වැටීම හේතුවෙන් ස්කන්ධ සාධන පත්‍ර වලින් බැංකුව දිගින් දිගටම අලාභ ලැබීය. 7% කින් වැඩි වූ අනෙකුත් ආදායම් ප්‍රධාන ලෙසම සමන්විත වූයේ අනෙකුත් බැංකු සේවා, ඉස්ලාමීය

කළමනාකරණ විවරණය
සහ විශ්ලේෂණය

බැංකුකරණ ආදායම සහ බැංකුව විසින් භාවිතා කළ දේපල, පිරියත සහ උපකරණ විකිණීම මඟින් ලැබූ ආදායමෙනි.

වියදම්

පෙර වසරේ රු. මිලියන 53,171 ට සාපේක්ෂව 2012 සඳහා වාර්තා වූ මුළු වියදම් රු. මිලියන 80,571 ක් විය. මුළු වියදමෙන් 69% ක් ම පොළී වියදම් වූ අතර ඉතිරිය මෙහෙයුම් වියදම් විය.

2012 දී පොළී වියදම් රු. මිලියන 59,701 දක්වා ඉහළ නැංවුණු අතර එය 2011 ට වඩා 65% ක වැඩිවීමකි. 26% කින් වැඩි වූ පොළී ගෙවන්නා වූ බැරකම්වල වැඩිවීම සහ වෙළඳපොළ පොළී අනුපාත වැඩිවීම යන කරුණු දෙකම මෙම වැඩිවීම සඳහා ප්‍රධාන වශයෙන් හේතුකාරක විය. අනුපාත ඉහළ යාම හා සමගින් 16% කින් තැන්පතු වර්ධනය වීම හේතුවෙන් තැන්පතු මත ගෙවූ පොළී 54% කින් වැඩිවුණි. වෙළඳපොළ පොළී අනුපාත ඉහළ යාමේ වාසිය ලබාගනු පිණිස පංගම සහ ඉතිරිකිරීමේ ගිණුම්වල මුදල් රඳවාගනු වෙනුවට ඒවා කාලීන තැන්පතු ගිණුම් වලට බැර කිරීමේ ගනුදෙනුකරුවන්ගේ නැඹුරුවද බැංකුවේ අරමුදල් පිරිවැය ඉහළ යාමට දායක වුණි.

වියදම් සංයුතිය

	රුපියල් මිලියන		
	2012	2011	විචලනය
තැන්පතු මත පොළී වියදම්	38,177	24,842	54%
ණය ගැනුම් හා පොළී වියදම්	21,524	11,373	89%
මෙහෙයුම් වියදම්	20,870	16,955	23%
අපහායනය (ගාස්තු) / ණය හා අනෙකුත් අලාභ සඳහා ප්‍රත්‍යාවර්තනය	(5,904)	2,258	(361%)

මුළු ණය ගැනුම් 55% කින් ඉහළ ගිය බැවින් ණය ගැනුම් මත ගෙවූ පොළියද 89% කින් ඉහළ ගියේය. මෙම වැඩිවීම සඳහා බලපෑ ප්‍රධාන හේතුව වූයේ ඇ. ඩො. මිලියන 500 ක බැඳුම්කර නිකුතුව මඟින් ජාත්‍යන්තරවද, රු. මිලියන 6,000 ක ණයකර නිකුතුව හරහා දේශීයවද යන දෙයාකාරයෙන්ම ඉහළ නැංවුණු මධ්‍යකාලීන ණය ගැනුම් වේ. සමස්තයක් ලෙස ණය සුරැකුම්පත් සහ ණයකර (අළුතින් නිකුත් කරනු ලැබූ රු. මිලියන 6,000 ක ණයකර නිකුතුව ද ඇතුළුව) 10.6% කින් වර්ධනය වූ අතර එහි ප්‍රතිඵලය වූයේ ගෙවනු ලැබූ පොළිය රු. මිලියන 4,618 දක්වා 22%කින් වැඩිවීමයි. එසේම අනෙක් බැංකු වෙත ගෙවීමට නියමිතව තිබූ මුදල් සඳහා ගෙවනු ලැබූ පොළියේද සැලකිය යුතු වැඩිවීමක් වූ අතර එම වැඩිවීම 55.6% වේ.

2011 වසරේ රු. මිලියන 16,955 ට සාපේක්ෂව 2012 වසරේ මෙහෙයුම් වියදම් රු. මිලියන 20,870 දක්වා 23%කින් වැඩි වුණි. මෙහි ප්‍රධාන ලෙසම වියදම් අංග දෙකක්, එනම් පිරිස් පිරිවැය සහ අනෙකුත් වියදම් ඇතුළත් විය.

මුළු පිරිස් පිරිවැයේ වැඩිවීම රු. මිලියන 2,466 ක් විය. ඉන් 23.6% ක් ශාඛා ජාල ව්‍යාප්තිය වෙනුවෙන් සිදුකළ නව බඳවාගැනීම් වෙනුවෙන් දරන ලද අතර දැනට අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති 1996.01.01 දිනට පසු බැංකුවට බඳවාගත් සේවකයන් සඳහා යෝජිත විශ්‍රාම වැටුප් ක්‍රමයේ මූලික අතීත සේවා පිරිවැය උදෙසා රු. මිලියන 600 ක අතිරේක ප්‍රතිපාදනයක් වෙන් කරන ලදී. එයට අමතරව 2012 වසර සඳහා වූ රු. මිලියන 12,926 ක පිරිස් පිරිවැයට නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතය සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියේ වෙනස්කම් සඳහා ගැලපුමක් ලෙස වෙන් කළ රු. මිලියන 850 ක් ද අයත් වේ.
(පසුගිය වසර සඳහා රු. මිලියන 771 ක ගැලපුමක් ඇතුලත් කරන ලදී.)

අනෙකුත් මෙහෙයුම් වියදම් රු. මිලියන 1,448 කින් වැඩි වූ අතර එය 2011 ට වඩා 22.3% ක වැඩිවීමකි. මෙම වැඩිවීම ප්‍රධාන වශයෙන් සිදුවූයේ වත්කම් නඩත්තු පිරිවැය (16%), කාර්යාල පරිපාලන පිරිවැය (33%) සහ තැන්පතු රක්ෂණ වාරිකයන්හිය. (28%) වත්කම් නඩත්තුව සහ අනෙකුත් පරිපාලන වියදම් ඉහළ යාමට හේතු කාරක වූයේ කාර්යාල ජාලය ව්‍යාප්තිය සහ යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම මෙන්ම ඉහළ නැංවුණු අලෙවිකරණ වියදම්ය. 2012 දී දියත් කරන ලද BOC මෙගා වාසි (තැන්පතු ඒකරාශී කිරීමේ විශේෂ ව්‍යාපාරය), කල්බදු ව්‍යාපාරික කටයුතු ප්‍රවර්ධනය සඳහා පවත්වනු ලැබූ කල්බදු වෙළඳපොළ, සහ ආමුඛ ප්‍රේෂණ අලෙවිකරණ ව්‍යාපාර ආදී විශාල ප්‍රවර්ධන ක්‍රියාකාරකම්හි ප්‍රතිඵලයක් ලෙස අලෙවිකරණ වියදම් ඉහළ නැංවුණි. තැන්පතු රක්ෂණ වාරිකය 28% කින් ඉහළ යාම ආධික්‍යය බැඳුම් සහිත තැන්පතු වැඩිවීමේ ප්‍රතිඵලයකි.

අපහායනය හා අනෙකුත් අලාභයන් සඳහා වූ රු. මිලියන 5,904 ක ප්‍රතිපාදනය 2011 ට වඩා සැලකිය යුතු ලෙස වැඩි වීමකි. (2011 වසරේදී එය රු. මිලියන 2,257 ක ප්‍රත්‍යාවර්තනයක් විය.) මෙම අපහායන ගණනය කරන ලද්දේ අළුතින් භාවිතය සඳහා යොදාගත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුකූලවය. වත්මන් වසරේ අපහායනයන්ට තනි වශයෙන් ප්‍රමාණාත්මක ණය රු. මිලියන 1,742 ක් ද, සාමූහික අපහායනයෙන් රු. මිලියන 2,374 ක් ද අයත් වන අතර ශ්‍රී ලන්කන් එයාර්ලයින්ස් සමාගමේ ආයෝජනයන්ගෙන් රු. මිලියන 1,788 ක් කපා හරින ලදී.

රටේ පැවති නියඟය හා ගංවතුර මෙන්ම වෙළඳපොලේ ඉහළ පොළී අනුපාතයන්හි ප්‍රතිඵලයක් ලෙස 2012 වර්ෂය තුල වත්කම් ගුණාත්වය කෙරෙහි බලපෑමක් ඇති කරන ලදී. මාලදිවයිනේ ඇති වූ දේශපාලන අර්බුදය හේතුවෙන් මාලේ හි පිහිටි අපගේ ශාඛාවද වත්කම් ගුණත්වයේ පිරිහීමක් අත්දකින ලදී.

මුළු වත්කම් මත අක්‍රීය අත්තිකාරම් 2011 පැවති 2.1% ට සාපේක්ෂව 2.8% ක් විය. මෙම වසරේ අත්කරගත් සුවිශේෂී වත්කම් වර්ධනය හමුවේ මෙම අක්‍රීය අත්තිකාරම් මට්ටම පිළිගත හැකි මට්ටමක පවතින බව බැංකුව නිගමනය කර ඇත. ඊට අමතරව වත්කම් ගුණත්වය අඛණ්ඩව අධීක්ෂණය කිරීමට සහ අවශ්‍ය විටදී නිවාරණ ක්‍රියාමාර්ග ගැනීමට අවදානම් අවම කිරීමේ ප්‍රමාණවත් ක්‍රියාමාර්ග බැංකුව ගෙන තිබේ.

ලාභදායීත්වය

බදු පෙර ලාභය ලෙස රු. මිලියන 19,794 ක් වාර්තා කර පසුගිය වසරට සාපේක්ෂව 20% ක වර්ධනයක් අත් කරගනිමින් බැංකුව තවත් වැදගත් සන්ධිස්ථානයක් සටහන් කර තිබේ. 21% ක වර්ධනයක් වාර්තා කරමින් රු. මිලියන 14,417 ක බදු පසු ලාභයක් කරා ළඟා වීමට රු. මිලියන 5,378 ක් වූ බදු සඳහා ප්‍රතිපාදන අඩු කරනු ලැබීය. මෙය එතෙක් මෙතෙක් බැංකුව විසින් වාර්තා කරනු ලැබූ ඉහළම ලාභය වන අතර 2010 - 2012 සඳහා වූ අපගේ ආයතනික සැලැස්ම මඟින් අපේක්ෂා කරන ලද සැලසුම්ගත ඉලක්කය වූ රු. මිලියන 10,000 සැලකිය යුතු අන්දමින් ඉක්මවා යාමකි. විනිමය අනුපාත ප්‍රතිශත වැඩිවීමක් සිදු වුවද, බැංකුවේ ආදායම් ප්‍රධාන වශයෙන්ම ජනනය වූයේ මූලික බැංකුකරණ මූලාශ්‍රයන්ගෙනි.

පෙර වසරට සාපේක්ෂව ලාභයෙහි 20% ක වර්ධනයක් අත් කරගනු ලැබුයේ පහත දැක්වෙන ආකාරයෙනි.

පසුගිය වසරට සාපේක්ෂව ලාභ වර්ධනය

	රු. මිලියන		
	2011	2012	විචලනය
බදු පෙර ලාභය 2011			16,484
එකතු කළා :			
පොළී ආදායමේ ඉහළයාම	61,222	95,021	33,799
විදේශ විනිමය ආදායමේ ඉහළ යාම	1,746	5,809	4,063
ගාස්තු පාදක ආදායමේ වැඩිවීම	6,133	6,666	533
ආයෝජන සුරැකුම්පත් වලින් ශුද්ධ ලාභ/(අලාභ)	(646)	433	1,079
අනෙකුත් ආදායම් වැඩිවීම	1,458	1,554	96
අක්‍රිය වත්කම් අයකරගැනීමේ වැඩිවීම (අඩුවීම)	1,442	-	(1,442)
අඩු කළා :			
පොළී වියදම් වැඩිවීම	36,215	59,701	23,486
මෙහෙයුම් වියදම් වැඩිවීම	16,955	20,870	3,915
බොල් සහ අඩමාන ණය සඳහා ප්‍රතිපාදනයන්හි වැඩිවීම/(අඩුවීම)	-	4,116	4,116
ආයෝජනයන්හි වටිනාකම් පහතවැටීම් සඳහා ප්‍රතිපාදන	(815)	1,788	2,603
අ. ව. බ. වියදම් වැඩිවීම	2,516	3,214	698
2012 බදු පෙර ලාභය			19,794

ආදායම් ප්‍රකාශන සාරාංශය

	රු. මිලියන		
	2012	2011	විචලනය
මුළු ආදායම	110,138	70,457	56.3%
මෙහෙයුම් ආදායම	49,782	33,698	47.7%
බදු පෙර ලාභය	19,794	16,485	20.1%
බදු පසු ලාභය	14,417	11,918	21.0%

3.7% ක් වූ සාධනීය පොළී ආන්තිකයක් සහ එක් සේවකයෙකු සඳහා ලාභයෙන් මනිනු ලබන, 2011 දී එක් සේවකයෙකු සඳහා වූ රු. මිලියන 2.0 ට සාපේක්ෂව මෙම වසරේ රු. මිලියන 2.5 ක් වූ ශක්තිමත් 25% ක ඵලදායීතා වර්ධනය සහිත බැංකුවේ ලාභදායීත්වය ස්ථාවර ගමන් මඟකට ප්‍රවිශ්ඨව තිබේ. පිරිවැය/ආදායම් අනුපාතිකයෙහි වැඩි දියුණු වීමේ ප්‍රවණතාවය මෙම සියල්ලට ධනාත්මකව දායක වී තිබේ. ඒ අනුව, කර්මාන්තයේ අනෙක් තරඟකරුවන් හා සැසඳීමේදී බෙහෙවින් තරඟකාරී 31.2% ක ප්‍රශස්ත සාමාන්‍ය ස්කන්ධ මත ලාභයක් (සා.ස්.ලා) අඛණ්ඩව පවත්වාගැනීමට බැංකුවට හැකි විය.

තෝරාගත් ලාභදායීත්ව අනුපාතික

	2012	2011
සාමාන්‍ය ස්කන්ධය මත ලාභය (බදුවලින් පසු)	31.2%	33.4%
ආදායමට පිරිවැය අනුපාතය	42.7%	51.1%
සේවකයෙකු සඳහා ලාභය	2.5	2.0

කළමනාකරණ විවරණය
සහ විශ්ලේෂණය

ශේෂ පත්‍ර සාරාංශය

ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍ර ඉතිහාසයේ විශිෂ්ඨ සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් රු. ට්‍රිලියන 1.048 ක වත්කම් පදනමක් ශේෂ පත්‍රයේ සටහන් කිරීමට ලංකා බැංකුව සමත් විය. පෙර වසරට සාපේක්ෂව මෙය 25% ක සුවිශේෂී වර්ධනයකි. ශේෂ පත්‍රයේ ප්‍රධාන වත්කම් වර්ගයන්හි සංයුතිය සහ ව්‍යුහයෙන්, වත්කම් බෙදාහැරීම තුලනය කිරීම සඳහා වූ බැංකුවේ ප්‍රයත්න පිලිබිඹු වේ. (වත්කම් සංයුතිය - ප්‍රස්තාරය බලන්න) ප්‍රධාන වත්කම් පංතිය ලෙස ණය සහ අත්තිකාරම් තවදුරටත් පවතී.

පුද්ගලික අංශය සමග කටයුතු කිරීම, සීෂ්‍රයෙන් වර්ධනය වන යටිතල පහසුකම් සංවර්ධනයන්ට සහාය වීම, කාරක ප්‍රාග්ධනය සැපයීම සහ රජයේ මුදලින් ක්‍රියාත්මක ව්‍යාපෘති වල ආයෝජන හේතු කොටගෙන සැලකිය යුතු වත්කම් වර්ධනයක් වාර්තා කරන ලදී.

බැංකුව තුළ ප්‍රමාණවත් ද්‍රවශීලතාවක් පවත්වාගන්නා අතරම තැන්පතු සහ ණය ගැනුම් මඟින් සුසැදි අරමුදල් පදනමක් මඟින් ස්ථාවර ශේෂ පත්‍රයක් පවත්වා ගෙන යනු ලැබේ.

අපගේ පාර්ශ්වකරුවන්ගේ විශ්වාසය තහවුරුකරමින් කොටසක් සඳහා බැංකුවේ

2011 වත්කම් සංයුතිය



2012 වත්කම් සංයුතිය



ශුද්ධ වත්කම්, කොටසක් සඳහා රු. මිලියන 8.2 සිට රු. මිලියන 10.1 දක්වා වැඩි වුණි.

පහත දැක්වෙනුයේ ශේෂ පත්‍රයේ විස්තරාත්මක සමාලෝචනයකි.

	රු. මිලියන		
වත්කම්	**2012**	**2011**	**විචලනය**
අත්තිකාරම් (දළ)	**714,847**	**561,766**	**27%**
ණය	345,794	279,492	24%
රන් සුරැකුම්	146,666	123,579	19%
අයිරා	120,722	75,356	60%
කල්බදු	22,574	14,762	53%
අනෙකුත් අත්තිකාරම්	79,091	68,577	15%
ආයෝජන	**245,924**	**201,430**	**22%**
සුරැකුම්පත් සහ බැඳුම්කර	238,290	194,348	23%
සමාගම්	7,634	7,082	8%
අනෙකුත් වත්කම්	**110,397**	**93,695**	**18%**

ප්‍රධාන වත්කම් පංති දෙක වූ අත්තිකාරම් සහ ආයෝජන පෙර වසරට සාපේක්ෂව පිළිවෙලින් 27% ක් සහ 22% ක් ලෙස වර්ධනය විය.

ණය සහ අත්තිකාරම්

දළ ණය සහ අත්තිකාරම් 27%කින් වර්ධනය විය. ගනුදෙනුකාර තැන්පතු සහ අන්තර්ජාතික ණය දායකයන් සහ ආයෝජකයන්ගෙන් ලබාගත් ණය ගැනුම් ඇතුළු ස්ථාවර ණය ගැනුම් වර්ධනය සඳහා අරමුදල් සපයන ලදී. උපරිම ණය සීමාවට යටත් නොවන අක්වෙරළ බැංකු කටයුතු අංශයද මෙම වර්ධනය සඳහා 35% කින් දායක විය.

අළුතින් විවෘත කරන ලද ශාඛාවල පූර්ණ සහභාගිත්වයෙන් යුතුව ආර්ථිකයේ සියලූ අංශවල ණය ලබාදීම් ඉහළ නැංවීම සඳහා බැංකුව පළාත් තුළ විශේෂ වැඩසටහන් දියත් කරන ලදී. මෙතෙක් බැංකු කටයුතු අඩු මට්ටමින් සිදුවූ නව ක්ෂේත්‍ර කරා ප්‍රවිශ්ඨ වීම ශාඛා ව්‍යාප්තියේ ප්‍රධාන ඉලක්කය විය. උතුරු සහ නැගෙනහිර පළාත්වල සීෂ්‍ර පුනරුත්ථාපනය සඳහා දායක වෙමින් එම පළාත් සඳහා ණය ලබාදීම් බැංකුව ඉහළ නංවන ලදී. මෙම පළාත් දෙක වෙත ප්‍රදානය කළ ඉහළ නංවන ලද ණය මුදල වන රු. මිලියන 6,630 නැතහොත් 2011 වසරට වඩා 19% ක වැඩිවීම, උතුර සහ නැගෙනහිර සංවර්ධනය සඳහා අපගේ කැපවීම මැනවින් විද්‍යාමාන කරන්නක් විය.

ප්‍රධාන ලෙසම කුඩා ව්‍යවසාය ව්‍යාපාරයන්ට ඔවුන්ට අවශ්‍ය උපකරණ ලබාගැනීමට ලබාදුන් මූල්‍ය සහයෝගය හේතුවෙන් කල්බදු කළඹ 53% කින් වැඩි විය. කෘෂිකාර්මික කටයුතු සහ ක්ෂුද්‍ර ව්‍යවසායන් ඇතුළුව ග්‍රාමීය ජනතාවගේ හදිසි මුදල් අවශ්‍යතා සඳහා මූලිකවම ප්‍රදානය කරන්නා වූ අපගේ රන් ප්‍රතිඥා ණය වන රන් සුරැකුම් 19% කින් වැඩි විය. කාලීන ණය රු. මිලියන 66,302 කින් හෙවත් 24% කින් වැඩි වූ අතර අයිරා ද රු. මිලියන 120,722 දක්වා 60% කින් වර්ධනය විය.

වෙළඳ මූල්‍යනය, ණය කාඩ්පත්, ප්‍රදානය කළ කාර්ය මණ්ඩල ණය ඇතුලත් අනෙකුත් ණය රු. මිලියන 10,514 කින් හෙවත් 15% කින් වැඩි විය. ණය කාඩ්පත් අත්තිකාරම් රු. මිලියන 399 කින් හෙවත් 20.4% කින් වැඩි වූ අතර වෙළඳ මූල්‍යයන ණය රු. මිලියන 5,110 කින් හෙවත් 11.1% කින් ඉහළ ගියේය. නව ගිණුම්කරණ ප්‍රමිති යටතේ කාර්ය මණ්ඩල ණය විශේෂ ගිණුම්කරණ ක්‍රමවේදයකට යටත් කරන ලද අතර එහිදී රු. මිලියන 6,585 ක් 2011 දී පූර්ව ගෙවීම් කාර්ය මණ්ඩල පිරිවැයට මාරු කරන ලද අතර එය දැන් ක්‍රමක්ෂය කරමින් පවතී. මෙම විශේෂ ක්‍රමවේදය නිසා කාර්ය මණ්ඩල පිරිවැය 2012 වසරේදී රු. මිලියන 767 කින් වැඩි විය.

විවිධාංගීකරණයෙන් යුත් ණය කළඹක් බැංකුව පවත්වාගෙන යනු ලැබූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස බැංකුව වෙත ස්ථාවර ලාභදායීත්ව ධාරාවන් ගලා එන ලදී. සියලු ක්ෂේත්‍රයන්හි එබඳු සමතුලිත ණය වර්ධනයක් පවත්වා ගැනීමට හැකියාව ඇතිවූයේ අපගේ අවදානම් කළමනාකරණ ආවේක්ෂණ සමාලෝචන පරිචයන් නිසාවෙනි.

විශේෂයෙන්ම කුඩා සහ මධ්‍යම පරිමාණයේ ව්‍යවසායන්ට සහාය ලබාදීමෙන්, දිවයිනේ ධීවර කර්මාන්තය නගා සිටුවීමට සහ කෘෂිකර්මාන්තයට අගය එකතු කරනු පිණිස කෘෂිකර්ම සහ ධීවර ණය රු. මිලියන 15,236 කින් (16%) ඉහළ නංවන ලදී. කෘෂිකර්ම ණය අතර වී සංරක්ෂණය සහ මිල ස්ථායීකරණය සඳහා ප්‍රදානය කළ ණය, ඉදිරි තිරිඟු වගාව සහ දේශීය පාරිභෝජනය සහ අපනයනය යන දෙකම සඳහා එහි වටිනාකම් දාමය සංවර්ධනය කිරීමට සහ වාණිජ කෘෂිකර්මාන්තය ඇතුළුව අනෙකුත් කෘෂිකර්ම සංවර්ධනය සඳහා ලබාදුන් ණය ඇතුළත් වේ. කිරි නිෂ්පාදන සංවර්ධනය සඳහා ප්‍රදානය කළ ණය ද කෘෂිකාර්මික ණයට ඇතුලත් වන අතර ඒ සඳහා මේ දක්වා රු. මිලියන 3,812 ක් ප්‍රදානය කර තිබේ.

කුඩා හා මධ්‍යම ව්‍යවසාය ණය යෝජනා ක්‍රම හරහා ණය සැපයීම මඟින් ධීවර කර්මාන්තය සඳහා සිය ණය ලබාදීම බැංකුව අඛණ්ඩව සිදුකරන ලදී. බෝට්ටු අළුත්වැඩියාව, දැල් අළුත්වැඩියාව, මරුවල් පන්න ධීවර කර්මාන්තය ආදී ක්‍රියාකාරකම් වලින් ව්‍යුත්පන්න වූ නිපැයුම් සහ සේවා වටා බැංකුවේ මහජන ප්‍රවේශ කටයුතු කේන්ද්‍රගත විය. ධීවර අංශය සඳහා වසර තුළදී ලබා දුන් මුළු ණය මුදල රු. මිලියන 580 ක් වූ අතර එය පසුගිය වසරට වඩා 36% ක වර්ධනයකි.

2011 කර්මාන්ත සංකේන්ද්‍රනය



2012 කර්මාන්ත සංකේන්ද්‍රනය



පසුගිය වසරට සාපේක්ෂව 20% ක වර්ධනයක් සටහන් කරමින් නිෂ්පාදන අංශ සඳහා ලබා දුන් ණය ද රු. මිලියන 6,545 කින් වැඩි විය. ණය ලබා දුන් ප්‍රධාන සංරචකයන්ට පේෂකර්ම කර්මාන්තය, වානේ නිෂ්පාදන, ඇසුරුම්කරණය සහ දේශීය මෙන්ම අපනයන වෙළඳපොළ සඳහා කාර්මික භාණ්ඩ අන්තර්ගත විය.

සංචාරක ක්ෂේත්‍රය සඳහා ප්‍රදානය කළ ණය සැලකිය යුතු ලෙස වැඩි කිරීමට හේතු වූයේ ඉහළ යන ඉල්ලුම සපුරාලීමේදී මෙම අංශයේ යටිතල පහසුකම් වර්ධනය වේගවත් කිරීමට බැංකුවේ කැපවීමයි. පෙර වසර හා සැසඳීමේදී මේ සඳහා වෙන් කල මුදල රු.මිලියන 5,225 කින් හෙවත් 40% කින් වැඩි කිරීම මේ සඳහා සාක්ෂි දරයි. මෙම ඇතැම් ව්‍යාපෘති තවමත් සිදුකරමින් පවතින අතර ඒවා සම්පූර්ණ කිරීමෙන් පසුව කර්මාන්තයේ වටිනාකම් දාමයට සැලකිය යුතු ධාරිතාවක් එක් කරනු ඇත.

සංචාරක කර්මාන්තය අනුපූරණය කරමින් යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ සහ ජාතියේ ධනය වැඩි දියුණු කිරීම උදෙසා බැංකුව ඉදිරිකිරීම් සහ යටිතල පහසුකම් අංශයටද සිය දායකත්වය ලබා දුණි. මෙම අංශය සඳහා ලබා දුන් ණය රු. මිලියන 19,687 කින් හෙවත් 37% කින් වැඩි වූ අතර එයට මූලිකවම ඇතුළත් වූයේ ඉඩම් සහ දේපල, මාර්ග, පාලම් සහ අනෙකුත් යටිතල පහසුකම්ය. වී මාර්ග සංවර්ධනය උදෙසා නිකුත් කළ සැලකිය යුතු ඇපවීම් වලට අමතරවය.

වෙළඳ කාර්යයන් සඳහා ලබාදුන් ණය සහ අත්තිකාරම් රු. මිලියන 49,704 කින් හෙවත් 27% කින් වැඩි විය. මේ සඳහා මූලිකවම හේතුවූයේ රටට ඉන්ධන ආනයනය සඳහා ප්‍රදානය කළ ණය මුදල් වැඩි කිරීමය. නියඟය හේතුවෙන් ජලවිදුලි උත්පාදක ජල ධාරා වියළී ගිය බැවින් රටේ විදුලිබල අවශ්‍යතා ජනනය කරනු ලැබුයේ තාප බලාගාර ක්‍රියාත්මක කිරීමෙන් වන අතර එහි ප්‍රතිඵලයක් ලෙස තෙල් ආනයන ඉහළ නැංවුණි. මෙම අතිරේක ආනයන අවශ්‍යතා සඳහා සැලකිය යුතු ලෙස මුදල් වෙන් කිරීමට සිදු වූ අතර එමගින් මෙම අංශය සඳහා ණය වැඩිවුණි.

මෙම කාණ්ඩයේ වර්ගීකරණය කර ඇති ශ්‍රී ලන්කන් ගුවන් සමාගමට ප්‍රදානය කරන ලද ණය සැලකිය යුතු ලෙස පියවන ලද බැවින් මෙම වසර තුළදී ප්‍රවාහන සේවා අංශයට ප්‍රදානය කළ ණය අඩු විය.

රැකියා නියුක්ත ජනගහනයේ ණය ඉල්ලුම වැඩි වීම සහ රටේ ඒක පුද්ගල ආදායම වැඩිවීමේ ප්‍රතිඵලයක් ලෙස පාරිභෝගික ණය ද රු. මිලියන 16,310 කින් (22%) වැඩි විය.

කළමනාකරණ විවරණය
සහ විශ්ලේෂණය



පුද්ගලික අංශයේ අත්තිකාරම් 19.6% කින් වැඩි වූ අතර රජය හා රජයට අයත් ව්‍යාපාර වෙත ලබා දුන් ණය 42% කින් වැඩි විය. මෙම වැඩිවීම සඳහා ප්‍රධානතම හේතුව වූයේ ඉන්ධන ආනයන සඳහා ලබාදුන් ණයයි. පළාත්බදව අපගේ ව්‍යාප්ති කටයුතු මල් ඵල ගන්වමින් ආයතනික ණයට වඩා වේගයෙන් සුළු පරිමාණ අංශය වර්ධනය වුණි.

ණය කළඹේ කාර්යක්ෂම වර්ධනයේ තවත් ප්‍රතිඵලයක් වූයේ මහ බැංකුවේ රෙගුලාසි අනුව ගණනය කරනු ලබන අක්‍රීය වත්කම් අනුපාතය (අ.ව.අ) පෙර වසරේ පැවති 2.1% සිට වත්මන් වසරේ 2.8% දක්වා වැඩි වීමයි. මේ සඳහා බලපෑ ප්‍රධානම කරුණ වූයේ සමස්ත වටිනාකම් දාමයට බලපෑම් ඇති කරමින් රටේ කෘෂිකාර්මික නිපැයුමට බලපෑ නියඟය සහ ගංවතුර තත්ත්වය වූ අතර ඉහළ පොළී අනුපාතය ණය වත්කම් ගුණාත්වය කෙරෙහිද බලපාන ලදී. වත්කම් ගුණත්වය පවත්වා ගැනීමට සහ අක්‍රීය වත්කම් බැංකුවේ අවදානම් මට්ටම් තුළ පවතින බව වගබලා ගැනීමට පූර්වාපේක්ෂක ක්‍රියාමාර්ග ගැනීමට සිය ජාලය පුරාම ශක්තිමත් කරන ලද කළමනාකරණ ව්‍යුහයක් බැංකුව සතු වේ.

ආයෝජන

ආයෝජනයන්හි කැපී පෙනෙන වර්ධනය, ප්‍රතිඵලදායී අරමුදල් උපයෝජනය මුඛ්‍ය පරමාර්ථය කරගනිමින් භාණ්ඩාගාර බැඳුම්කර ඇතුළුව රජයේ සුරැකුම්පත් වල බැංකුව ආයෝජනය කිරීමේ ප්‍රතිඵලයකි. රජයට අයත් ව්‍යවසායන් සඳහා නිරාවරණ පියවීමට බැංකුවට රු. මිලියන 60,000 ක් ද ලැබුණි. 2011 වසරේ රු. මිලියන 40,728 හා සැසඳීමේදී කල් පිරීම දක්වා රඳවාගන්නා රජයේ භාණ්ඩාගාර බැඳුම්කර වල ආයෝජන රු. මිලියන 99,842 දක්වා දෙගුණයකින් වැඩි කර ගැනීමටද බැංකුව සමත් විය.

වගකීම්

අභ්‍යන්තර ද්‍රවශීලතාව පීඩනයට ලක් විය හැකි බවත් අරමුදල් පිරිවැය වැඩි වන බවත් ඒ පිළිබඳව දැනුමැතිව, බැංකුව 2012 වසර වෙත ප්‍රවේශවූයේ සැලසුම්ගත ද්‍රවශීලතා කළමනාකරණ විධි නියෝගයක් සහිතවය. ඒ අනුව, මූලිකවම ජාත්‍යන්තර අරමුදල් ආකර්ෂණය කරගැනීම කෙරෙහි කේන්ද්‍රගත වෙමින් විකල්ප මූල්‍ය මූලාශ්‍රයන් ගවේෂණය කිරීම බැංකුව අරඹන ලදී. 2012 දී මුළු අරමුදල් පදනමෙහි 70%ක් නියෝජනය කරමින් වත්කම් පදනමට අරමුදල් සැපයීමේ ප්‍රධාන මූල්‍ය සාධන පත්‍රය ලෙස ගනුදෙනුකාර තැන්පතු තවදුරටත් පැවති අතර, බාහිර ණය ගැනුම් තුලින්ද වත්කම් පදනමේ සැලකිය යුතු කොටසක් සඳහා අරමුදල් සපයන ලදී.

ණය වර්ධනයට උපස්ථම්භක වීමට වෙළඳපල තැන්පතු වර්ධනය ප්‍රමාණවත් නොවූ බැවින් එම පරතරය පියවීමට සහ ද්‍රවශීලතා පරතරය අවම කිරීමට බැංකුව දිගු ආපසු ගෙවීමේ කාලයක් සහිත ණයගැනුම්වලට යොමුවන ලදී. ඒ අනුව සමස්ත ණය ගැනුම් රු. මිලියන 291,038 දක්වා රු. මිලියන 103,549 කින්(55%) වැඩි විය.

2011 පැවති 24% සිට 2012 දී 30% දක්වා සිය ශේෂ පත්‍ර කොටස ඉහළ නංවා ගනිමින් ණය අරමුදල්කරණය, වත්කම් වර්ධනය වෙතට ඇතුළු වන ලදී. මේ සඳහා ප්‍රධාන වශයෙන් දායක වූයේ 2012 මැයි මාසයේ ඇ. ඩො.

2012 අරමුදල් සම්මිශ්‍රණය



2011 අරමුදල් සම්මිශ්‍රණය



මිලියන 500 ක් රැස් කරගත් ජාත්‍යන්තර ඩොලර් බැඳුම්කර නිකුතුව සහ 2012 දෙසැම්බර් මසදී රු. මිලියන 6000 රැස් කරගත් රුපියල් ණයකර නිකුතුවයි. අපගේ ඇ. ඩො. බැඳුම්කර නිකුතුව පිළිබඳව මෙම විවරණයේ වෙනත් ස්ථානයක සඳහන් වේ.

තැන්පතු

බැංකුවල අරමුදල් අවශ්‍යතා ඉහළ නැංවුණු බැවින් බැංකු කර්මාන්තයේ තැන්පතු

රාශිකරණය අතිශයින්ම තරඟකාරී විය. තරඟකාරී උපාය මාර්ගයක් ලෙස පළමු කාර්තු තුන තුළ තැන්පතු ඒකරාශී කිරීම මධ්‍යස්ථව පවත්වා ගනිමින්, ඉන්පසුව වෙළඳපොළ කොටස රඳවාගැනීම සඳහා බැංකුව වෙළඳපොළ රඳවාගැනීම් උපාය මාර්ගයක් යොදා ගනු ලැබීය. අවසාන කාර්තුවේදී BOC මෙගා වාසි නම් විශේෂ වැඩසටහනක් බැංකුව දියත් කළේය. සමස්ත රුපියල් තැන්පතු 16% කින් වර්ධනය වූ අතර විදේශ මුදල් තැන්පතු ද 17% කින් වර්ධනය විය. සමස්ත වශයෙන් රු. මිලියන 693,440 ක ගනුදෙනුකාර තැන්පතු ලබාගැනීමට බැංකුව සමත් විය.

ජංගම සහ ඉතුරුම් ගිණුම් වල තිබූ තැන්පතු වඩා ඉහළ පොළී අනුපාතයක් ඇති කාලීන තැන්පතු වෙත මාරු කරනු ලැබීය. ඒ අනුව රුපියල් ඉල්ලුම් ගිණුම් 9% කින් සංකෝචනය වූ අතර රුපියල් කාලීන තැන්පතු 34% කින් වැඩි විය. අනෙක් අතට විදේශ මුදල් ඉල්ලුම් තැන්පතු 24% කින් අඩු වූ අතර විදේශ මුදල් කාලීන තැන්පතු 33% කින් වැඩි විය. එහි ප්‍රතිඵලය වූයේ ආන්තිකයන් මත අතිරේක පීඩනයක් ඇති කිරීම සඳහා අරමුදල් පිරිවැය වැඩි කිරීමය.

ප්‍රධාන වශයෙන්ම 2012 මැයි මාසයේ ජාත්‍යන්තර වෙළඳපොළෙන් බැංකුව රැස් කළ ඇ. ඩො. මිලියන 500 ක ජ්‍යෙෂ්ඨ සුරැකුම් රහිත පස් අවුරුදු බැඳුම්කර සහ අන්තර්ජාතික ණය දායකයෙන් ලබාගත් අනෙකුත් ද්විපාර්ශ්වීය ණයගැනුම් හේතු කොට ගෙන විදේශ මුදලින් ණය ගැනීම් වැඩි විය. ශ්‍රී ලාංකික බැංකුවකට ජාත්‍යන්තර වෙළඳපොළෙන් මෙතරම් විශාල මුදලක් රැස් කර ගැනීමට හැකිවූ ප්‍රථම අවස්ථාව මෙයයි. (බැඳුම්කර පිළිබඳ අපේ වාර්තාව බලන්න)

ඇ. ඩොලර් බැඳුම්කර මඟින් රැස් කරන ලද ඩොලර් හුවමාරුව මඟින් ලැබුණු රුපියල් අරමුදල්වල ප්‍රතිඵලයක් ලෙස රුපියල් ණය ගැනුම් අඩු කරන ලදී. එයට අමතරව රු. මිලියන 6,000 ක සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර ද 2012 දෙසැම්බර් මාසයේදී බැංකු නිකුත් කරන ලදී. මෙම ණයකර කොළඹ කොටස් වෙළඳපොළේ ලැයිස්තුගත කර ඇති අතර ආයෝජකයන් විශ්වාසය තවදුරටත් තහවුරු කරමින් අධිදායක විය. ණයකරය ස්ථර II වන මට්ටමේ ප්‍රාග්ධනය සඳහා ද සුදුසුකම් ලබයි.

තැන්පතු සංයුතිය

	රු. මිලියන		
තැන්පතු	**2012**	**2011**	**විචලනය**
දේශීය මුදල්	509,396	438,391	16%
• ඉල්ලුම්	60,936	67,195	(9)%
• ඉතිරි කිරීම්	167,695	161,619	4%
• කාලීන සහ අනෙකුත්	280,765	209,577	34%
විදේශ මුදල්	184,044	157,382	17%
• ඉල්ලුම්	15,798	20,729	(24)%
• ඉතිරි කිරීම්	53,973	50,661	6%
• කාලීන	114,273	85,992	33%
මුළු තැන්පතු	693,440	595,773	16%

අරමුදල්කරණය

ණය ගැනුම් වල මුදල් ප්‍රභේදනය

	රු. මිලියන		
ණය ගැනුම්	**2012**	**2011**	**විචලනය**
දේශීය මුදල්	119,739	122,848	-3%
විදේශීය මුදල්	171,298	64,640	165%
මුළු ණය ගැනුම්	291,037	187,488	55%

	2012	2011	විචලනය
දේශීය බැංකුකරණ ඒකකය	21.80%	23.36%	-1.56%
අක්වෙරළ බැංකුකරණ ඒකකය	24.95%	24.39%	0.56

ණය පරිමාව, සැලකිය යුතු අන්දමින් ණය හරහා අරමුදල් සැපයීමේ ප්‍රතිඵලයක් ලෙස තැන්පතු ණය අනුපාතය 2011 පැවති 94% හා සැසඳීමේදී 103% කින් වැඩි විය. මෙම අනුපාතය පිළිබඳව බැංකුව වත්මනෙහි සෑහීමකට පත් වුවද මධ්‍යම සහ දීර්ඝකාලීනව මෙම අනුපාතය අඩු කිරීම සඳහා බැංකුව උපාය මාර්ග යොදා ඇත.

ද්‍රවශීලතාව

පෙර වසර හා සැසඳීමේදී ඉහළ ණය ව්‍යාප්තිය සහ ද්‍රවශීලතාව සහ ඉපැයුම් වත්කම් අතර විචක්ෂණ හුවමාරුවක් පවත්වාගෙන යාමේ බැංකුවේ උපාය මාර්ගය හේතු කොට ගෙන ද්‍රවශීලතා වත්කම් අනුපාතය සුළු වශයෙන් පහත වැටුණි. ද්‍රවශීලතාව සැලකිය යුතු ඉහළ මට්ටමක එනම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවා ඇති අවශ්‍ය නියාමන මට්ටම වන 20% ට ඉහළින් පවත්වා ගෙන යන ලදී. සිය දේශීය වගකීම් මෙන්ම විදේශ මුදල් වගකීම් සඳහා බැංකුව මාසික පදනමින් ද්‍රවශීලතා වත්කම් අනුපාතය ගණනය කරනු ලැබේ.

ප්‍රාග්ධන ප්‍රමාණවත් බව

වැඩි වූ ලාභදායිත්වය සහ වැඩි වූ ණය ගැනුම් ප්‍රකාරව, පෙර වසරේ 10.88% හා සැසඳීමේදී 2012 අවසන් වන විට 11.39% ක ප්‍රාග්ධන ප්‍රමාණවත් බවේ අවරෝධකයක් බැංකුව සතු වූ අතර එය ශ්‍රී ලංකා මහ බැංකුවට අනුව අවශ්‍ය වන 10% ට වඩා සැලකිය යුතු ලෙස ඉහළින් පවතියි.

අපේ බැඳුම්කර විත්ති

ජාත්‍යන්තර වෙළඳපොලේ ඇ. ඩො. මිලියන 500 ක ප්‍රථම අරමුදල් රැස් කිරීම

2012 අප්‍රේල් 26 වන දින ලංකා බැංකුව සිය ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව සාර්ථක ලෙස මුද්‍රණය කරන ලදී. ඇ. ඩො. මිලියන 500 ක ජ්‍යෙෂ්ඨ, සුරැකුම් රහිත, බැඳුම්කර නිකුතුව ලංකා බැංකුවේ ගමන් මගේ වැදගත් සන්ධිස්ථානයක් වූ අතර පුළුල් ගෝලීය ආයෝජන පදනමකට ප්‍රවේශය සපයන ලදී.

- ශ්‍රී ලාංකික වාණිජ බැංකුවක් නිකුත් කළ ප්‍රථම අන්තර්ජාතික බැඳුම්කර නිකුතුව
- 2011 රාජ්‍ය බැඳුම්කර නිකුතුවෙන් පසු ශ්‍රී ලංකාවෙන් පිටත විශාලතම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව
- ශ්‍රී ලංකාවේ විශාලතම බැංකුකරණ අධිකාරිය වන ලංකා බැංකුව විසින් සිදු කළ ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කර නිකුතුව

USD 500,000,000

BANK OF CEYLON

BOC

Bankers to the Nation

B1/BB-

(Moody's/Fitch)

144A/RegS
6.875% Senior Unsecured
Notes due 2017

Joint Lead Manager and
Joint Bookrunners

Bank of America
Merrill Lynch

HSBC

citibank

බැඳුම්කර නිකුතුව පිළිබඳ සංක්ෂේප දත්ත

නිකුත් කරන්නා	:	ලංකා බැංකුව
නිකුත් කරන්නාගේ ශ්‍රේණිගත කිරීම්	:	B1 (Stable) / BB - (Stable) (මූඩීස්/ෆිච්)
නිකුතුවේ ශ්‍රේණිගත කිරීම්	:	B1/BB - (මූඩීස්/ෆිච්)
විස්තරය	:	ජ්‍යෙෂ්ඨ සුරැකුම් රහිත බැඳුම්කර 2017 දී
බෙදී යාම	:	144 ඒ නීති/රෙගුලාසි
නිකුතුවේ ප්‍රමාණය	:	ඇ. ඩො. 500,000,000
කල් පිරීම	:	2017 මැයි 03
කූපනය	:	6.875%
නිකුත් කිරීම් මිල	:	100% ක මුහුණත ප්‍රමාණය
කල් පිරීමේදී ඵලදාව	:	6.875%
පොළී ගෙවීම් දින	:	2012 නොවැම්බර් 3 දිනෙන් ආරම්භ වී මැයි 3 සහ නොවැම්බර් 3
පාලන මාරුව	:	මුල් මුදලින් 10.1% ක් සහ උපචිත පොළිය සහිත විකිණීමට හැක
නාමිකය / ගුණාකාර	:	ඇ. ඩො. 200,000 ක් සහ ඊට වැඩි ඇ. ඩො. 1000 හෝ පූර්ණ සංඛ්‍යාමය ගුණාකාර
පියවීම	:	T+5
අරමුදල් භාවිතය	:	සාමාන්‍ය ආයතනික කාර්යයන්

සභාපති ගාමිණී වික්‍රමසිංහ (2013 ජනවාරි 08 විශ්‍රාම ලැබීය) සාමාන්‍යාධිකාරී ඩබ්. ඒ. නාලිනී (2012 ජුනි 03 විශ්‍රාම ලැබීය) ප්‍රධාන මූල්‍ය නිලධාරී අශෝක රූපසිංහ, නි. සාමාන්‍යාධිකාරී (ජාත්‍යන්තර සහ භාණ්ඩාගාර) පී. ඒ. ලයනල් සහ ස. සාමාන්‍යාධිකාරී (භාණ්ඩාගාර) එස්. එම්. එස්. ජයසූරිය ඇතුළු බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ මුල් පෙලේ කණ්ඩායමක් විසින් නායකත්වය දරන ලද අතිශයින්ම සාර්ථක ජාත්‍යන්තර මාර්ග සංදර්ශනයක් බැංකුව පවත්වන ලදී. මෙම මාර්ග සංදර්ශන විස්තීර්ණ වූ අතර ඒවායේ ප්‍රතිඵල ලෙස නිකුතුව අලෙවි කරමින් ආසියාවේ, යුරෝපයේ සහ එක්සත් ජනපදයේ ප්‍රමුඛ පෙලේ ආයෝජකයින් 40 කට වැඩි ප්‍රමාණයක් සමග හමුවන් පැවැත්වුණි.

මෙම මාර්ග සංදර්ශනය මඟින් මුළු බැංකුකරණ වත්කම්වලින් 23% ක ණය සහ අත්තිකාරම් වල එකතුව 21% ක් සහිතව මුළු තැන්පතු වලින් 21% ක පාලනය සහිත ලංකා බැංකුව දිවයිනේ වාණිජ බැංකු කර්මාන්තයේ වෙළඳපොළ ප්‍රමුඛතමයා ලෙස අවධාරණය කරන ලදී. එසේම ශ්‍රී ලංකාව වෙත එවනු ලබන සේවක ප්‍රේෂණ වලින් 38% ක කොටසක් බැංකුව හසුරුවන බවත් වාණිජ බැංකුවල ඇති විදේශ මුදල් තැන්පතු වලින් 30% කට වැඩි ප්‍රමාණයක් එය සතු බවත් අවධාරණය කරන ලදී. බැංකුවේ කාර්ය සාධනය සහ ශක්තිමත් අධිකාරියත් විභව්‍ය ආයෝජකයන්ගේ ඇගැයුමට බඳුන් විය.

ලොව පුරා ඉහළ ගුණාත්මක ආයෝජකයන් කෙරෙන් විශාල උනන්දුවක් ජනනය කරමින් මාර්ග සංදර්ශනය ඉතා සවිමත් ඇණවුම් ලේඛණයක් සඳහා අවස්ථාව උදා කරන ලදී. නිකුතුව 7.7 වාරගණනකින් අධිදායක වූ අතර ලැබුණු මුළු ඇණවුම් ප්‍රමාණය ඇ. ඩො. බිලියන 3.86 ඉක්මවන ලදී.

මූලික මිල නියම කිරීම් සංකල්පනය 7.125% කට පමණ නිකුත් කරනු ලැබූ අතර අවසන් මිල මාර්ගෝපදේශනය 6.875% -7.000% ක් අතර ප්‍රමාණයකට ගෙන එන ලදී. දැවැන්ත ඉල්ලුම නිසාම අවසන් මිල මාර්ගෝපදේශනයේ වඩා පහළ සීමාව වූ 6.875% ට බැඳුම්කර මිල කිරීමට බැංකුවට හැකි විය.

ආසියාව, යුරෝපය සහ එක්සත් ජනපදය ආවරණය කරමින් සිදුකල අතිශයින් ඵලදායී අලෙවිකරණ සංදර්ශණය



කොටස් වෙන් කිරීම අනුව ගුණාත්මක ගිණුම් ඇණවුම් ලේඛණයේ ප්‍රමුඛත්වය ගත් අතර වෙන් කිරීම් වලින් 88% ක් වත්කම් කළමනාකරුවන් නියෝජනය කළ අතර ඉන් පසුව අනුපිළිවෙලින් පුද්ගලික බැංකු (9%) සහ බැංකු (3%) විය. භූගෝලීයව සලකා බැලීමේදී ඇණවුම් පොත ආසියාව (30%), යුරෝපය (34%) සහ එක්සත් ජනපදය (36%) අතර ආසන්න වශයෙන් එක හා සමාන අන්දමින් බෙදී ගොස් තිබුණි.

වෙන්කිරීම් සහ බෙදියාම් පිළිබඳ සංඛ්‍යා ලේඛණ



ධනාත්මක පුවත්පත් ප්‍රතිචාර

චයිනා මර්චන්ට්ස්, කේ වා(හ්) ලංකා බැංකුව ඇ. ඩො. බිලියන 1.2 ක් රැස් කරයි.

ෆයිනෑන්ස් ඒෂියා, ඩෙනිස් වී විසිනි
(2012 අප්‍රේල් 27)

ශ්‍රී ලංකාවේ ලංකා බැංකුව අද උදෑසන ඇ. ඩො. මිලියන 500 ක පස් වසරක බැඳුම්කරයක් නිකුත් කරන ලදී. එම නිකුතුව මූඩි ආයතනය මඟින් B1 ලෙස ද ෆිච් විසින් BB- ලෙස ද ශ්‍රේණිගත කර තිබේ. එම ගනුදෙනුව වඩා රහස්‍ය බැංකු ණය සඳහා ආයෝජක රුචිය පිළිබඳ පරීක්ෂණයක් වන අතර එය ඉදිරියට යාම දිරිගන්වන සුළු සලකුණකි.

ලංකා බැංකුව 2004 න් පසු ශ්‍රී ලංකාවේ පළමු ආයතනික බැඳුම්කර මිල නියම කරයි.

නටාෂා බෙරටන් - ෆුකුයි විසිනි - ඩව් ජෝන්ස් ජාත්‍යන්තර පුවත් / 2012 අප්‍රේල් 27

දිගුකාලීන සිවිල් යුද්ධය නිමාවත් සමග රටේ මූල්‍ය ප්‍රගතියේ නවතම නිදර්ශනය සපයමින් ලංකා බැංකුව ඇ.ඩො. මිලියන 500 ක ඩොලර් බැඳුම්කරයක් සඳහා මිල නියම කර තිබේ. එය 2004 න් පසුව ශ්‍රී ලංකාවේ පළමු රාජ්‍ය නොවන බැඳුම්කර නිකුතුව වේ. නිකුතුව මුල් ගනුදෙනු කිරීමේදී ශක්තිමත් වූ අතර පස්වරුව වන විට ආසියාවේදී 6.7% ක ඵලදාවක් සඳහා 100.75 කට මිල නියම කරන ලදී. එයට වාසිදායක සාධකයක් ලෙස බැඳුම්කරයේ හිඟකම් වටිනාකම සහ ජේ. පී. මෝ(ර්)ගන් නැගී එන වෙළඳපොළ බැඳුම්කර දර්ශකයට ප්‍රවිශ්ඨ වීමට එහි යෝග්‍යතාවය අවධාරණය කරන ලදී.

තව තවත් ශ්‍රී ලංකා ආයතන බැඳුම්කර සඳහා යොමු විය යුතුය - සී බෑන්ක්

මිහාර් අනීස් විසිනි, රොයිටර්ස් / 2012 අප්‍රේල් 27

ඉහළ ඉල්ලුමක් සහිතව අපේක්ෂිත මිලට වඩා අඩුවෙන් පස් අවුරුදු බැඳුම්කරයක් හරහා රජයට අයත් ලංකා බැංකුව ඇ. ඩො. මිලියන 500 ක් රැස් කිරීමෙන් පසුව බැඳුම්කර හරහා අරමුදල් රැස් කරගන්නා ලෙස ශ්‍රී ලංකාවේ මහ බැංකුව දිවයිනේ ආයතන වලින් සිකුරාදා ඉල්ලීමක් කරන ලදී. එම මිල 2007 දී සියයට 8.25 කට අලෙවි කරන ලද ශ්‍රී ලංකාවේ පළමු ඇ. ඩො. මිලියන 500 ක් වූ පස් අවුරුදු රාජ්‍ය බැඳුම්කරයට වඩා වැඩි අතර සමාන රාජ්‍ය බැඳුම්කරයක් සඳහා 2009 දී එය ලත් මිල වන සියයට 7.4 ට වඩා අඩුය.

බැඳුම්කර හරහා ලංකා බැංකුව ඇ. ඩො. මිලියන 500 ක් රැස් කර ගනී.

සන්ඩේ ටයිම්ස් (ශ්‍රී ලංකාව) / 2012 අප්‍රේල් 29

අපේක්ෂා කළ මුදල හත් ගුණයකට වඩා ඉක්මවා ඇ. ඩො. බිලියන 3.86 ක ග්‍රාහක මුදල් ආකර්ෂණය කර ගනිමින් ලංකා බැංකුවේ ඇ. ඩො. මිලියන 500 ක පස් අවුරුදු බැඳුම්කර නිකුතුව විශිෂ්ඨ සාර්ථකත්වයක් ලබා ගත ඇතැයි නිල ආරංචි මාර්ග සඳහන් කරයි. ලංකා බැංකුවේ බැඳුම්කර නිකුතුව ඕනෑම ශ්‍රී ලාංකික වාණිජ බැංකුවක් විසින් නිකුත් කළ විශාලතම බැඳුම්කර නිකුතුව වේ.

දේශීය මෙන්ම ජාත්‍යන්තර වෙළඳපොලෙහි ආයෝජක විශ්වාසය බැංකුව දිගින් දිගටම දිනාගෙන ඇති බවට බැඳුම්කර නිකුතුවේ සාර්ථකත්වය මගින් පෙන්නුම් කර තිබේ.

ව්‍යාපාරික කටයුතු කාර්ය සාධනය

ශාඛා බැංකු කටයුතු

2012 දෙසැම්බර් 31 දිනට දීප ව්‍යාප්ත ශාඛා සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) ජාලයෙහි දළ වශයෙන් ශාඛා ගිණුම් 10,576,000 සහිත ලංකා බැංකුව ශාඛා බැංකු කටයුතු සිදු කරන ශ්‍රී ලංකාවේ විශාලතම බැංකු වේ. බැංකුවේ දේශීය ශාඛා ජාලයට ශාඛා 324 ක් ව්‍යාප්ති කාර්යාල 276 ක් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 451 ක් අයත් විය. සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ඇතුළුව සිය බැංකු ශාඛා ගනුදෙනුකරුවන් සඳහා ශාඛා බැංකුකරණය පුළුල් පරාසයක නිපැයුම් සහ සේවා පිරිනමයි. නිපැයුම් සහ සංවර්ධන බැංකුකරණ අංශය, ඉස්ලාමීය මූල්‍ය, කාඩ්පත් මධ්‍යස්ථාන මෙහෙයුම් ආදී අනෙකුත් අංශ මගින් පිරිනමන සේවාවන් මෙන්ම රක්ෂණ සහ ආයෝජන සේවා බඳු එහි පරිපාලිත සමාගම් විසින් සපයනු ලබන සේවාවක් එකිනෙක අංශ ඔස්සේ ප්‍රවර්ධනය සඳහා බැංකුව සිය පුළුල් ශාඛා ජාලය යොදාගනියි.

රන් සුරැකුම් (උකස්) ණය, කාන්තා රන් ගිණුම් (කාන්තාවන්ගේ ඉතිරි කිරීම්) තැන්පතු ගිණුම්, රන් කැකුළු (ළමා ඉතිරි කිරීම), තැන්පතු ගිණුම් බඳු ශාඛා බැංකු වෙළඳපොළ නිපැයුම් විවිධ ගනුදෙනුකාර කාණ්ඩයන්හි අවශ්‍යතා සපුරාලීම පිණිස විශේෂයෙන් සකස් කර ඇත. 2011 දී විවෘත කරන ද ප්‍රමුඛතා මධ්‍යස්ථානයක්ද චය ක්‍රියාත්මක කරන අතර රු. මිලියන 10 ට වඩා ඉහළ තැන්පතු ඇති ගනුදෙනුකරුවන්ට සේවා සම්පාදනය සඳහා මැනවින් ස්ථාපිත වී ඇත.

නිෂ්පාදන සහ සංවර්ධන බැංකුකරණ අංශය සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා ණය ලබා දෙන අතර ක්ෂුද්‍ර මූල්‍ය හා ක්ෂුද්‍ර ගොවිතැන් ණය, සාර්ව ව්‍යවසාය ණය, ධීවර යාත්‍රා සඳහා ණය, පොල්, සහල් සහ අනෙකුත් තෝරාගත් බෝග සඳහා ණය බඳු තෝරාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍ර කෙරෙහි වැඩි අවධානයක් යොමු කරයි.

ෂාරියා නීතියට අනුකූල මූල්‍ය සේවා බලාපොරොත්තු වන්නා වූ ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා 2009 වසරේදී ඉස්ලාමීය බැංකුකරණ ඒකකය ස්ථාපිත කරනු ලැබීය 'ක්වාඩ්' පදනම යටතේ ෂාරියා නීතියට අනුකූල ජංගම ගිණුම්, 'මුදාරබා' සහ අට්ෆාල් (ළමා ඉතිරි කිරීම්) යටතේ ඉතිරි කිරීම් සහ 'ඉජාරා' යටතේ වාහන සහ යන්ත්‍රෝපකරණ සඳහා කල්බදු ආදී ඉස්ලාමීය බැංකු සේවා පිරිනමනු ලබන ශ්‍රී ලංකාවේ පළමු සම්ප්‍රදායික වාණිජ බැංකුව වනුයේ ලංකා බැංකුවයි. 'මුරබහා' යටතේ වෙළඳ මූල්‍ය පහසුකම් සපයන අතර 'වකාලා බිල් ඉස්තිත්මාර්' යටතේ අරමුදල් කළමනාකරණ සේවා සහ කාරක ප්‍රාග්ධනය සපයනු ලැබේ.

බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය සිය ණය සහ හර කාඩ්පත් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර සහ සේවා සැපයුම් ස්ථාන ජාලය සක්‍රියව සංවර්ධනය කරයි. වත්මනෙහි චය සතු ණය කාඩ්පත් 120,000 ක් සහ හර කාඩ්පත් මිලියන 2.4 ක් සංසරණයේ පවතී.

අපේ උපාය මාර්ගය

- 2015 වන විට ශාඛා බැංකුකරණ ණය කළඹ රු. බිලියන 350 කට වර්ධනය කිරීම
- යටිතල පහසුකම් ජාලය ව්‍යාප්ත කිරීම මෙන්ම ගනුදෙනුකාර අවශ්‍යතා සපුරාලීම පිණිස බැංකුවේ ක්‍රියාදාම සහ පාරිභෝගික සේවා මධ්‍යස්ථාන තාක්ෂණිකව උත්ශ්‍රේණි කිරීම මගින් ශ්‍රී ලංකාවේ විශාලතම ශාඛා ජාලය ඇති කිරීම
- ආහාර සුරක්ෂිතතාව සහතික කිරීම, තිරසාර කෘෂිකර්මාන්තය සහ ග්‍රාමීය ප්‍රජාවන්ගේ ජීවනෝපාය සහ ආදායම් මට්ටම් ඉහළ නැංවීමේ ජාතික අරමුණු ඉටු කරලීමට සංවර්ධන බැංකුකරණය අන්තර්කරණ පාර්ශ්වකරුවෙකු වීම
- 2012 වන විට රු. බිලියන 3 ක වත්කම් වර්ධනයක් සපුරාගැනීම සහ බාහිර අරමුදල්කරණය මත රඳා පැවැත්ම අඩු කිරීම

අපේ අනාගත ඉලක්කය

- ණය සහ තැන්පතු අනුපාත නැවත පෙළගැස්වීම සහ 2015 වන විට තැන්පතු ට්‍රිලියන එක දක්වා වර්ධනය කිරීම
- බැංකුව සමග ගනුදෙනුකරුවන්ගේ සබඳතා වැඩි දියුණු කිරීම පිණිස ශාඛා ජාලය නවීකරණය කිරීම
- පලාත් වෙත සේවා ව්‍යාප්ත කරමින් සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය සහ ඉහළ ශුද්ධ ප්‍රතිලාභ අංශය සංවර්ධනය කිරීම
- දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර - මූල්‍යකරණ ව්‍යාපෘතිය සහ සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය ව්‍යාප්ත කිරීමේ සංවර්ධන බැංකුකරණ මෙහෙයුම අඛණ්ඩව පවත්වාගෙන යාම
- 2015 වන විට ඉස්ලාමීය බැංකුකරණ වෙළඳපොළ කොටසින් 25% ක් ග්‍රහණය කිරීම
- ප්‍රමුඛතම හර / ණය කාඩ්පත් සපයන්නා වීම
- බෙදාහැරීම් මාර්ග ශක්තිමත් කිරීම

විශේෂ සිදුවීම්

මෙහෙයුම් ආදායමේ % ක් ලෙස



මෙහෙයුම් ආදායම (රු. මිලියන)



මුළු වත්කම් (රු. මිලියන)

මුළු වත්කම්වල % ක් ලෙස



කළමනාකරණ විවරණය
සහ විශ්ලේෂණය

මූල්‍ය සාරාංශය - ශාඛා බැංකු කටයුතු

	රු. මිලියන		
	2012	2011	වෙනස %
පොළිය	36,156	22,272	62%
ගාස්තු සහ කොමිස්	2,204	1,837	20%
වෙනත්	1,258	1,236	2%
මුළු ආදායම	**39,619**	**25,345**	**56%**
පොළී වියදම්	(26,406)	(18,624)	42%
පොළී නොවන වියදම්	(15,394)	(12,042)	28%
අන්තර් අංශ ගනුදෙනු	10,992	8,048	37%
ශුද්ධ මෙහෙයුම් ආදායම	**8,811**	**2,728**	**223%**
මුළු වත්කම්	**278,954**	**252,889**	**10%**
මුළු වගකීම්	**447,488**	**403,930**	**11%**

ශාඛා බැංකු කටයුතු අංශය බැංකුවේ මුළු වත්කම් වලින් 28% ක්ද, දළ ණය සැපයුමෙන් 35% ක් ද, දළ ආදායමෙන් 36% ක්ද සඳහා දායක වේ. සමස්ත තැන්පතුවලින් 64% ක් සහිත එය බැංකුවේ ප්‍රධානතම තැන්පතු රාශිකරණ අංශය වේ. ශාඛා බැංකු කටයුතු සිය උපාය මාර්ගික ප්‍රමුඛතා සාක්ෂාත් කරගනිමින් පසුගිය වසරට සාපේක්ෂව සිය වත්කම් පදනම රු. මිලියන 278,954 දක්වා 10%කින් වර්ධනය කර ගනිමින් සිය ඉලක්කය ඉක්මවා ගොස් තිබේ. බැංකුවේ ශාඛා බැංකු කටයුතු අංශය මඟින් ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය සහ අත්තිකාරම් ප්‍රමාණය 2012 දෙසැම්බර් 31 දිනට දළ වශයෙන් රු. මිලියන 250,196 ක් වූ අතර එය බැංකුව සිය ගනුදෙනුකරුවන්ට ලබා දුන් සමස්ත ණය සහ අත්තිකාරම් වලින් 35% ක් සංස්ථාපනය කරයි. බැංකුව සිය ශාඛා හරහා සෘජුවම පුද්ගලයන්ට ණය ලබා දෙන අතර වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, දන්ත ශල්‍ය වෛද්‍යවරුන් ,පශු ශල්‍ය වෛද්‍යවරුන්, හෙදියන්, සන්නද්ධ හමුදා පිරිස් සහ වෘත්තිකයන්ට පුද්ගලික ණය සැපයීම සඳහා සිය දීප ව්‍යාප්ත ශාඛා ජාලය හරහා විවිධ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කරයි.

නාගරික ප්‍රදේශවල සිට පළාත් වෙත සංවර්ධනය ව්‍යාප්ත වීමත් සමග බැංකුව යොදාගත් අන්තර්කරණ උපාය මාර්ගයේ ප්‍රතිලාභ නෙලාගනිමින් වර්ධනයේ ප්‍රධාන කොටස පළාත්බදව සපුරා ගෙන තිබේ. වර්ධනයේ විශාල කොටසක් උතුරු සහ නැගෙනහිර පළාත් වලින් වාර්තා වූ අතර 30 වසරක් පැවති ගැටුම නිමාවත් සමග එම ප්‍රදේශ කරා ව්‍යාප්ත වී බැංකු සේවා සැපයූ පළමු බැංකුව වූයේ ලංකා බැංකුවයි. එක් දිනක් තුළ උතුරු සහ නැගෙනහිර පළාත්වල ශාඛා 11 ක් බැංකුව විවෘත කළ අතර සිය දහස්වන ශාඛාව 2012 ජූලි මාසයෙදී පුදුකුඩියිරිප්පු (උතුරු පළාත) විවෘත කරන ලදී.

වත්කම් පදනමට වඩා තෙගුණයක වේගයකින් පොළී ආදායම වර්ධනය වී තිබේ. මේ සඳහා ප්‍රධාන වශයෙන්ම හේතු කාරක වූයේ ශාඛා බැංකු කටයුතු නිෂ්පාදන පෙලෙහි ඉහළ ඵලදා වත්කම් පංතියේ ඉහළ නැංවුණු සංකේන්ද්‍රණයයි. වාහනයක් තෝරාගැනීමේ සිට අළුතින් කල්බදුගත් වාහනය පදවාගෙන යාම දක්වා සේවා සැපයුම ආරම්භයේ සිට අවසානය දක්වා වූ ක්‍රියාමාර්ගය දිනක් තුළ නිම කිරීම සඳහා වූ කල්බදු පොළ හරහා දියත්

> **වර්ධනයේ ප්‍රධාන කොටස පළාත්බදව සපුරා ගෙන තිබේ. වර්ධනයේ විශාල කොටසක් උතුරු සහ නැගෙනහිර පළාත් වලින් වාර්තා වූ අතර 30 වසරක් පැවති ගැටුම නිමාවත් සමග එම ප්‍රදේශ කරා ව්‍යාප්ත වී බැංකු සේවා සැපයූ පළමු බැංකුව වූයේ ලංකා බැංකුවයි**
>
> **එක් දිනක් තුළ උතුරු සහ නැගෙනහිර පළාත්වල ශාඛා 11 ක් බැංකුව විවෘත කළ අතර සිය දහස්වන ශාඛාව 2012 ජූලි මාසයෙදී පුදුකුඩියිරිප්පු (උතුරු පළාත) විවෘත කරන ලදී.**

කළ අපගේ නව්‍ය ප්‍රවේශය අතිශයින්ම සාර්ථක විය. පොළී වියදම 42% කින් වැඩි වූ අතර මුළු තැන්පතුවල වැඩිවීම 10% ක් පමණි. මේ සඳහා මූලික ලෙසම හේතු පාදක වූයේ ඉහළ නැංවුණු ණය ගැනුම් මෙන්ම පොළී අනුපාත වැඩිවීම සහ ජංගම සහ ඉතිරිකිරීමේ ගිණුම්වල සිට කාලීන තැන්පතු දක්වා මාරුවීමයි. කෙසේ වෙතත් පසුගිය වසරේ පැවති 27% සිට 2012 දී 36% දක්වා වැඩි වූ ශුද්ධ පොළී ආන්තිකය බැංකුව විසින් දිගටම පවත්වා ගෙන යන ලදී.

එසේම ආසන්න වශයෙන් මුළු තැන්පතුවලින් 64% ක් වන ආසන්න වශයෙන් රු. මිලියන 445,000 ක් සපයන්නා වූ ශාඛා කටයුතු බැංකු අංශය බැංකුව තුළ විශාලතම තැන්පතු රාශිකරණ ඒකකයද වේ. පසුගිය වසරට සාපේක්ෂව මෙය 14% සාමාන්‍ය වර්ධනයකි. දැනට බැංකුව සතු තැන්පත්කරුවන් පවත්වා ගැනීමට සහ රඳවා ගැනීමටත් වසරේ අවසන් කාර්තුව වන තෙක් පවත්නා ඉහළ පොළී වෙළඳපොළේ තරඟ නොකිරීමටත් බැංකුව ප්‍රතිපත්තිමය තීරණයක් ගන්නා ලදී.

සංවර්ධන බැංකුකරණ ක්ෂුද්‍ර මූල්‍ය ණය ප්‍රධාන වශයෙන්ම සපයනු ලබන්නේ කෘෂිකාර්මික හා ධීවර අංශයන්ටය. දේශීය රෙගුලාසි අනුව බැංකුව ගනුදෙනුකරුවන්ට සපයන මුළු ණය සහ අත්තිකාරම් වලින් 10% ක් කෘෂිකාර්මික අංශයට සැපයීම අවශ්‍ය වේ. 2011 සහ 2012 දෙසැම්බර් 31 දිනයන්ට බැංකුව ගනුදෙනුකරුවන්ට සැපයූ මුළු ණය සහ අත්තිකාරම් වලින් 17% ක් සහ 16% ක් අනුපිළිවෙලින් සපයා තිබුනේ කෘෂිකර්මාන්තය ආශ්‍රිත ණය සඳහාය. බැංකුවේ සංවර්ධන බැංකුකරණ කටයුතු අභ්‍යන්තරව ජනනය කළ අරමුදල් සහ ප්‍රතිමූල්‍ය කරන ලද සංවර්ධන ණයදීම් යන දෙකින්ම සිදු කරනු ලබයි. 2012 දෙසැම්බර් 31 දිනට සමූහය ජාත්‍යන්තර සංවර්ධන අරමුදලක් වන අන්තර්ජාතික සහයෝගිතාව පිළිබඳ ජපාන බැංකුවෙන් ණය ලෙස ලබාගෙන තිබූ මුළු මුදල රු. මිලියන 1,487 කි.

සංවර්ධන ණයදීම් පෙළක් හරහා ලංකා බැංකුව සංවර්ධනය දිරිමත් කරයි. උදාහරණයක් ලෙස, 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකාව පුරා 17,010 කට අධික කණ්ඩායම් අතර රු. මිලියන 1,408 ක් වටිනා ක්ෂුද්‍ර මූල්‍ය ණය බැංකුව සපයා තිබුණි. ක්ෂුද්‍ර මූල්‍ය ණය ලැබූ සෑම කණ්ඩායමකම සාමාජිකයන් අටක් දක්වා පිරිසකින් සමන්විත වී තිබූ අතර ණය සඳහා ඔවුන් සාමූහිකව වගකියූ අතර කුඩා පරිමාණ ව්‍යාපෘති සංවර්ධනය සඳහා ඔවුන් එම ණය යොදවා තිබුණි. 2012 වසරේදී ධීවර බෝට්ටු නිෂ්පාදන සහ මිලදී ගැනීම සඳහා බැංකුව රු. මිලියන 1,000 ක් වෙන් කරනු ලැබූ අතර එය බෙහෙවින් සාර්ථක විය. ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ සංවර්ධනය සඳහා මේ අන්දමේ තවත් වැඩසටහන් හඳුන්වා දෙන ලෙස ධීවර අමාත්‍යාංශය කළ ඉල්ලීම මෙම වැඩසටහන් සාර්ථකත්වය පිළිබඳ කදිම සහතිකයකි.

අපගේ කාර්ය සාධනය සිඳුකළ ආකාරය

පසුගිය වසර දෙක සඳහා බැංකුවේ සංවර්ධන අංශයේ අත්තිකාරම් පහත සාරාංශගත කර ඇත.

	රු. මිලියන		
	2012	2011	වර්ධනය (%)
කෘෂිකර්මය			
සෘජු	87,423	84,602	3.3%
වක්‍ර	1,200	1,200	0%
මුළු කෘෂිකර්මාන්තය	88,623	85,802	3.3%
සුළු ව්‍යවසාය	6,246	5,401	15.6%
අධ්‍යාපනය	534	473	12.9%
එකතුව	**95,403**	**91,676**	**4.1%**

2011 වසරට සාපේක්ෂව 2012 වසරෙදී ඉස්ලාමීය බැංකුකරණ ඒකකය සිය තැන්පතු පදනම 118% කින් වැඩි කරගන්නා ලදී. ෂාරියා නීතියට අනුකූල ණය සහ අත්තිකාරම් සඳහා අරමුදල් සැපයීමට තැන්පතු පදනම ප්‍රමාණවත් වූ අතර අරමුදල් සඳහා බාහිරව රඳා පැවතීමට සිදුවීම අඩු කරගැනීමට හැකි විය. වත්මනෙහි, 59% ක ආදායම් වර්ධනයක් ජනනය කරයි. ඒකකයේ වෙළඳපොළ කොටස, දළ වශයෙන් 10% ක් වේ. අරමුදල් කළඹ 2012 දී රු. මිලියන 1,120 ක් විය. ඉස්ලාමීය බැංකුකරණ ඒකකය ක්ෂුද්‍ර මූල්‍ය පහසුකම් නියාමන වැඩසටහනක් අරුගම්බේ හිදී ආරම්භ කළ අතර එය අතිශයින්ම සාර්ථක විය. 2013 දී දිවයින පුරා එබඳු පහසුකම් 10 ක් විවෘත කිරීමට බැංකුව අදහස් කරයි.

2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය ණය කාඩ් 120,000 ක් නිකුත් කර තිබූ අතර එය 2011 ට සාපේක්ෂව 20% ක වර්ධනයකි. 2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ණය කාඩ්පත් සඳහා නොගෙවූ මුළු ශේෂය 2011 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 1,955 ට සාපේක්ෂව රු. මිලියන 2,352 ක් විය. බැංකුව විසින් ක්‍රියාත්මක කරන මිලියන 9 ක් වූ බැංකු ශාඛා ගිණුම් හා සැසඳීමේදී, 2012 දෙසැම්බර් 31 දිනට බැංකුව හර කාඩ්පත් මිලියන 2.4 ට වඩා නිකුත් කර තිබූ අතර ණය කාඩ්පත් සේවාවන්හි අනාගත වර්ධනය සඳහා එය බැංකුවට පදනමක් සපයනු ඇත. බැංකුව විසින් සේවා සපයනු ලබන වෙළෙඳ නියෝජිත ආයතන 2,000කට වැඩි ප්‍රමාණයක් සිටින අතර බැංකුවේ අනුබද්ධිත ජාල හරහා අතිරේක සේවා සැපයුම් ස්ථාන 18,000කට වැඩි සංඛ්‍යාවක් කරා කාඩ් හිමියන්ට ප්‍රවේශය ලබාගත හැක.

පසුගිය වසර හා සැසඳීමේදී ශාඛා බැංකු කටයුතු ව්‍යාපාරයේ අක්‍රීය වත්කම් රු. මිලියන 6,038 ක විශාල වැඩිවීමක් පෙන්නුම් කරයි. ඒ සඳහා ප්‍රධාන හේතුව වූයේ දිවයිනේ ඇතැම් කොටස්වල දිගින් දිගටම පැවති ගංවතුර සහ නියං තත්ත්වය නිසා පළාත්බදව සැපයූ ණය කෙරෙහි ඇති වූ බලපෑමයි.

පිරිවැය මත පාලනය රඳවාගනිමින් මෙම සාර්ථකත්වයන් කළමනාකරණය කිරීමට අප සමත් වූයෙමු. අපගේ ආදායමට පිරිවැය අනුපාතය ක්‍රමිකව පහත වැටෙමින් පැවති අතර එය අඛණ්ඩව පැවතෙමින් පසුගිය වසරේ 50.3% සාපේක්ෂව මෙම වසරේදී 41.9% දක්වා ලඟා වුණි. ඒ සඳහා දායක වූ ප්‍රධාන කරුණු වූයේ ඉහළ නැංවුණු ඵලදායිත්වය සහ වඩා කාර්යක්ෂම ක්‍රියාදාම සහ පද්ධති හඳුන්වා දීමයි.

කළමනාකරණ විවරණය
සහ විශ්ලේෂණය

සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසාය ගනුදෙනුකරුවන් සඳහා බැංකු සේවා

සිය ශාඛා බැංකු කටයුතු අංශය තුළින් බැංකුව ප්‍රධාන වශයෙන් සු. ම. ව. ගනුදෙනුකරුවන් සඳහා බැංකු සේවා සපයයි. කෙසේ වෙතත්, ගනුදෙනුකරු සමග බැංකුවේ ඇති සබඳතාවය මත ඇතැම් සු .ම .ව. ගනුදෙනුකරුවන්ට ආයතනික බැංකුකරණ අංශය විසින් වෙන වෙනම සේවා සපයයි. ආයතනික බැංකුකරණ අංශය යටතේ ක්‍රියාත්මක වන වෙළඳ මූල්‍ය ඒකකය විසින්ද සු. ම. ව්‍යවසායන් සඳහා වෙළඳ මූල්‍ය සේවා සපයනු ලබයි. ශාඛා බැංකු කටයුතු සිදු කරන ශාඛා මගින් ණය පහසුකම් සැපයීම සු. ම. ව්‍යවසායන්ට ණය ලබාදීමේදී උපදේශන සේවා සහ අනෙකුත් පහසුකම් සැපයීම ආදී සු .ම. ව. විශේෂිත පසු පෙළ කාර්යාල සහයෝගය සපයන සු. ම. ව. ක්‍රියා යන මධ්‍යස්ථාන 25 ක් 2013දී ස්ථාපිත කිරීමට බැංකුව සැලසුම් කර තිබේ. සු .ම. ව. ණය යෝජනා පිළියෙල කිරීම කඩිනම් කිරීම, වත්මන් සහ අනාගත අභියෝගයන්ට මුහුණදීමට සු ම ව බැංකුකරණ නිපුණතා සහිත කණ්ඩායමක් සංවර්ධනය කිරීම, හුදෙක්ම සු ම ව ණය සැපයීම වෙනුවට සු. ම. ව. බැංකුකරණ සංස්කෘතියක් කරා සංකල්පික වෙනසක් සඳහා කලාපීය මට්ටමේ උපකාරක ආයතනයක් ප්‍රවර්ධනය කිරීම සහ සු. ම. ව. ව්‍යාපාරික කුසලතා සංවර්ධනය කිරීම සු. ම. ව. ක්‍රියා යන මධ්‍යස්ථාන මගින් සිදු කරනු ඇත. මෙමගින් සු .ම .ව. බැංකුකරණ විශේෂඥ දැනුම බැංකුවේ ශාඛා ජාලය ඔස්සේ ව්‍යාප්ත වී සිය සු. ම. ව. ගනුදෙනුකාර පදනම ව්‍යාප්ත කිරීමට ඉඩ ලැබෙනු ඇතැයි බැංකුව විශ්වාස කරයි.

අපගේ සේවා කළඹ

තැන්පතු සේවා

සිය ශාඛා බැංකු ගනුදෙනුකරුවන්ට බැංකුව ජංගම ගිණුම්, රුපියල් ඉතිරි කිරීම් ගිණුම්, විදේශ මුදල් තැන්පතු සහ කාලීන තැන්පතු පිරිනමයි.

- **ජංගම ගිණුම්**

  ඉල්ලුම් ගිණුම් සහ පොළී ගෙවනු නොලබන ඉල්ලුම් තැන්පතු ඇතුළුව සමස්ත ඉල්ලුම් තැන්පතු ශේෂයෙන් 36% ක් ජංගම තැන්පතු නියෝජනය කරයි. පුද්ගලික චෙක්පත්, කෙටි පණිවිඩ සේවය සහ අන්තර්ජාල බැංකු කටයුතු ඔස්සේ ඒවා වෙත ප්‍රවේශ විය හැක.

- **ඉතිරි කිරීමේ ගිණුම්**

  2011 ට වඩා 8% කින් වර්ධනය වූ බැංකුවේ මුළු ඉතුරුම් තැන්පතු වලින් 87% ක් ශාඛා ඉතිරි කිරීම් නියෝජනය කරයි. පොදු මහජනයා සඳහා බැංකුව පොළී දරන ඉතිරි කිරීම් ගිණුම් පිරිනමයි. එසේම ඉතිරි කිරීමේ පුරුද්ද ප්‍රවර්ධනය සඳහා ළමුන්, කාන්තාවන් විශාමික සේවකයන් සහ ගොවීන් බඳු අඩු සේවාලාභී ජන විකාශ කොටස් සඳහා බැංකුව ඉලක්කගත ඉතිරි කිරීමේ ගිණුම් වැඩසටහන් හඳුන්වා දී තිබේ. බැංකුව එබඳු සේවා සැලසුම් කර ඇත්තේ ශ්‍රී ලංකාවේ බැංකු සේවා සියලු ප්‍රදේශ කරා ව්‍යාප්ත කිරීමට සහ බැංකුවේ තැන්පතු පදනම ඉහළ නංවන සහ අරමුදල් සඳහා අඩු පිරිවැය සපයන ආර්ථික වර්ධනය ප්‍රවර්ධනය කිරීමටය. හර කාඩ්පත්, වරණීය පොළී අනුපාත, පාසල් ළමුන් සඳහා අධ්‍යාපනික ශිෂ්‍යත්ව හෝ රක්ෂණ ආවරණය සඳහා පූර්ව සුදුසුකම් ආදී විශේෂ ප්‍රතිලාභ මෙම ගිණුම්වලට ඇතුළත්වීමට ඉඩ තිබේ. වඩ වඩාත් ඉතිරි කිරීම් ආකර්ෂණය කරගැනීම සඳහාත් පවත්නා ඉතිරි කිරීම් රඳවාගැනීම සඳහාත් වසර අවසානයේදී BOC මෙගා වාසි වැඩසටහන දියත් කරන ලදී.

- **කාලීන තැන්පතු**

  බැංකුවේ මුළු කාලීන තැන්පතු වලින් 60% ක් නියෝජනය කරන ශාඛා බැංකු අංශයේ කාලීන තැන්පතු වසර තුළදී 2011 ට වඩා 29% කින් වර්ධනය විය. ස්ථාවර අනුපාතයකින් පොළීය උපචිත වන සහ අදාල අනුපාත ප්‍රකාරව කල් පිරිමට පෙර මුදල් ආපසු ගත හැකි ස්ථාවර කාල සීමාවක් සඳහා ස්ථාවර මුදල් ප්‍රමාණයක නිශ්චිත කාලසීමා පාදක තැන්පතු ද බැංකුව පිරිනමයි. මූලිකවම ඉහළ යන පොළී අනුපාතවලින් ගනුදෙනුකරුවන් වාසි ලබාගැනීම හේතුවෙන් ඉතිරි කිරීමේ ගිණුම් තැන්පතු කාලීන තැන්පතු කරා යොමු වීමක් බැංකුව මේ වසර තුලදී අත්විඳිනු ලැබීය.

- **විදේශ මුදල් තැන්පතු**

  අනේවාසික ශ්‍රී ලාංකිකයන් සහ නේවාසික ශ්‍රී ලාංකිකයන් සඳහා බැංකුව විදේශ මුදල් ඉතිරි කිරීම් තැන්පතු හෝ ස්ථාවර අනුපාත තැන්පතු පිරිනමයි. විදේශ මුදල් තැන්පතු ගිණුම් විවෘත කරන අනේවාසික ශ්‍රී ලාංකිකයන් ජීවිත රක්ෂණ ආවරණ සහ ණය පහසුකම් සඳහා ප්‍රවේශය ආදී අතිරේක සේවාවන් සඳහා සුදුසුකම් ලැබීමට ඉඩ ඇත. මෙම අංශයේ තමන්ට 30% කට වැඩි වෙළඳපොළ කොටසක් හිමි බව බැංකුව ඇස්තමේන්තු කර තිබේ. ශාඛා බැංකු ඒකකයේ රඳවාගෙන තිබූ මුළු විදේශ මුදල් තැන්පතු රු. මිලියන 63,653 ක් වූ අතර එය 2011 වඩා 6% ක වර්ධනයකි.

- **පුද්ගල ණය දීම්**

  බැංකුවේ පුද්ගල ණයදීම් නිපැයුම් සහ සේවාවන්ට ස්ථාවර සහ විචල්‍ය යන දෙයාකාරයේම ණයදීමේ නිපැයුම්, කාලීන ණය, අයිරා පහසුකම්, නිවාස ණය, මූල්‍ය කල්බදු යෝජනා ක්‍රම සහ අනෙකුත් විශේෂ ණය වැඩසටහන් අයත් වේ. සමස්තයක් ලෙස සිය ශාඛා ගනුදෙනුකරුවන් සඳහා බැංකුව 100කට වැඩි විශේෂිතව ඉලක්කගත සහ අලෙවි කරන ලද ණය වැඩසටහන් හඳුන්වා දී තිබේ.

- **කාලීන ණය**

  අනෙකුත් දෑ අතර අධ්‍යාපන ණය, රථවාහන ණය, ඉදිකිරීම් අංශය සඳහා ණය සු .ම. ව. ණය, වගා ණය, වාණිජ අංශය සඳහා ණය ඇතුළුව විවිධ කාර්යයන් සඳහා බැංකුව සාමාන්‍ය කෙටි කාලීන ණය සපයයි. කාලීන ණය සාමාන්‍යයෙන් මාස 6 සිට මාස 120 දක්වා වේ. 2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ශාඛා ණය වලින් 25% කාලීන ණය වලින් සමන්විත විය. එය පෙර වසරට වඩා 31% ක වර්ධනයක් පෙන්නුම් කළේය.

- **අයිරා පහසුකම්**

  මේවා සු. ම. ව්‍යවසායන්ට සහ තනි පුද්ගලයෙකුට හිමි ව්‍යාපාර සඳහා ඔවුන්ගේ ව්‍යාපාරයන්හි මුදල් ප්‍රවාහය කළමනාකරණය කිරීම සඳහා ලබා දෙන චක්‍රිය පහසුකම් ණය වේ. අයිරා සපයනු ලබන්නේ වසරක කාලයක් සඳහා වන අතර වාර්ෂික සමාලෝචනයට යටත් වේ. 2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ නොපියවූ අයිරා, ශාඛා මගින් සැපයූ ණය කළඹින් 9% ක් සංස්ථාපනය කළේය. ශාඛා අංශයේ වර්ධනය වෙමින් පැවති ඉහළ නැංවුණු කාරක ප්‍රාග්ධන අවශ්‍යතාවන්හි ප්‍රතිඵලයක් ලෙස පෙර වසරට සාපේක්ෂව බැංකු අයිරා ද රු. මිලියන 4,544 කින් වැඩිවුණි.

- **නිවාස ණය**

  ගෙවීමට ඇති මුදලේ එකතුව සහ 2012 වසර තුළ අළුතින් ලබා දුන් මුදල් යන දෙයාකාරයම අනුව බැංකුව දිවයිනේ ප්‍රමුඛතම නිවාස ණය සපයන්නෙකි. 2012 දෙසැම්බර් 31 දිනට ශාඛා බැංකුකරණ ණය කළඹින් 9% ක් නිවාස ණය විය. නිවාස ණය සපයනු ලබන්නේ නිවාස ඉදි කිරීම, මිලදී ගැනීම සහ අළුත්වැඩියාව ආදිය සඳහාය. එයට අමතරව විදේශගත ශ්‍රී ලාංකිකයන් බඳු අනේවාසික විදේශ මුදල් ගනුදෙනුකරුවන් සඳහා ද බැංකුව නිවාස ණය සේවා හඳුන්වා දී තිබේ.

- **මූල්‍ය කල්බදු යෝජනා ක්‍රම**

  ලංකා බැංකුව මූල්‍ය කල්බදු යෝජනා කිහිපයක් සපයන අතර ඒ යටතේ පිරියත සහ යන්ත්‍රෝපකරණ, බර උපකරණ, කාර්යාල උපකරණ, වෘත්තිකයන් සඳහා මෝටර් රථ වාහන හෝ උපකරණ, කල්බදු ගැනීමේ සිට අයිතිය දක්වා පදනම්න් බැංකුව අරමුදල් සපයයි. ලබාගත් උපකරණ සඳහා ක්ෂයවීම් උපලේඛනය මත පදනම්ව සාමාන්‍යයෙන් මෙම ණය ආපසු ගෙවීමේ කාලසීමාව වසර තුනේ සිට පහ දක්වා වේ. 2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ශාඛා බැංකුකරණ ණය කළඹින් 6% ක් නැතහොත් රු. මිලියන 18,498 ක් සංස්ථාපනය කරන ලද්දේ මූල්‍ය කල්බදු යෝජනා ක්‍රම වන අතර එය පෙර වසරට සාපේක්ෂව 59% ක වර්ධනයකි.

- **අනෙකුත් ණය යෝජනා ක්‍රම**

  පුද්ගලික දේපල මත කෙටිකාලීන 'උකස්' ණය, ගමන් වියදම් සඳහා ණය හා ස්වයං රැකියා නියුක්ත පුද්ගලයන්, සහ රජයේ සේවකයන් සදහා ණය ආදී අනෙකුත් ණය යෝජනා ක්‍රම රාශියක් බැංකුව සපයයි. 2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ ශාඛා බැංකුකරණ ණය කළඹ වූ රු. මිලියන 136,962 කින් 44% ක් සමන්විත වූයේ උකස් ණය සහ අනෙකුත් ණය යෝජනා ක්‍රමයන්ගෙනි. රන් පවුම් හෝ ස්වර්ණාභරණ ඇපයට තැබීම මගින් පූර්ණ ලෙස සුරක්ෂිත උකස් ණය කෙටිකාලීන ණය වේ. උකස් ණය වැඩි වශයෙන් ලබාගනුයේ කෘෂිකාර්මික කටයුතු සඳහා ගොවීන් සහ ග්‍රාමීය ප්‍රදේශවල ජනතාවය. උකස් සහ අනෙකුත් ණය යෝජනා ක්‍රම රු. මිලියන 21,522 කින් හෙවත් 16% කින් වර්ධනය විය.

> **“ගෙවීමට ඇති මුදලේ එකතුව සහ 2012 වසර තුළ අළුතින් ලබා දුන් මුදල් යන දෙයාකාරයෙන්ම බැංකුව දිවයිනේ ප්‍රමුඛතම නිවාස ණය සපයන්නා විය.”**

ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය

ආයතනික බැංකු අංශය රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන ඇතුළුව විශාල ආයතනික සේවාග්‍රාහකයන්ට බැංකු සේවා සපයයි. සෑම ආයතනික ගනුදෙනුකරුවෙක් සඳහාම සබඳතා කළමනාකරුවෙක් අනුයුක්ත කර ඇති අතර ඔහු ගනුදෙනුකරුගේ සියලු බැංකු අවශ්‍යතා එකම ස්ථානයකින් සපයයි.

එමගින් සපයන නිපැයුම් සහ සේවා අතරට ආයතනික ණය පහසුකම්, වෙළඳ මූල්‍ය, මුදල් කළමනාකරණය, ආයෝජන සේවා සහ ආයතනික සේවාග්‍රාහකයන් සහ රජයේ ආයතන සඳහා ව්‍යාපෘති මූල්‍ය සහ කාරක ප්‍රාග්ධනය අයත් වේ. ආයතනික ශාඛාව, වෙළඳ මූල්‍ය ඒකකය සහ අක්වෙරළ බැංකුකරණ අංශය ලෙස එය උප ඒකක තුනකින් සමන්විත වේ.

ශ්‍රී ලංකාවේ විශාලතම රාජ්‍ය සහ පුද්ගලික ආයතන ගණනාවක් ඇතුළුව වාර්ෂික පිරිවැටුම රු. මිලියන 600ට වැඩි සහ නිරාවරණය රු. මිලියන 200 ට වැඩි ආයතනික ගනුදෙනුකරුවන් සඳහා ආයතනික බැංකු අංශය මගින් අධිධාරිතා පුර්ණ බැංකු සේවා සපයයි. මෙම අංශය කොළඹ ලංකා බැංකු මූලස්ථානයේ පිහිටා ඇත.

වෙළඳ මූල්‍ය සේවා ඒකකය, අපනයන පාදක කර්මාන්ත මත කේන්ද්‍රගත වූ බලපත්‍රලාභී අක්වෙරළ බැංකුකරණ අංශය සඳහා පහසුකම් සපයන අතර ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ඇතිකරගත් ගිවිසුම් යටතේ ක්‍රියාත්මක වන හෝ ශ්‍රී ලංකාවෙන් පිටත ලියාපදිංචි කර ඇති සීමිත වගකීමක් සහිත සමාගම් ආදී විදේශ මුදලින් ගනුදෙනු සිදුකරන ගනුදෙනුකරුවන් කළමනාකරණය කරයි.

අපේ උපාය මාර්ගය

- 2015 වන විට අපේ ණය ධාරිතාව රු. බිලියන 360 දක්වා වර්ධනය කිරීම (රජය හැර)
- ආනයන / අපනයන ගනුදෙනු බැංකුකරණයේ වෙළඳපොළ නායකත්වය පවත්වාගෙන යාම
- යටිතල පහසුකම් සංවර්ධනයේදී රජයේ ආයෝජන කෙරෙහි විශේෂ අවධානය යොමු කිරීම
- ආනයනකරුවන් සහ අපනයනකරුවන් සඳහා තීරුබදු සහ අක්වෙරළ ගනුදෙනුකරුවන් සඳහා ආමුඛ ප්‍රේෂණ බඳු තොරතුරු තාක්ෂණ පාදක විසඳුම් හඳුන්වා දීම

අපේ අනාගත ඉලක්කය

- සේවාස්ථ නිපුණතා ඉහළ නැංවීම මගින් ගනුදෙනුකරුවන්ගේ ප්‍රසාදය පිණිස සේවාවේ ගුණාත්මක බව වැඩි දියුණු කිරීම
- විශේෂ ව්‍යාපෘති ණය සැපයුම් ඒකකයක් ස්ථාපිත කිරීම මඟින් අධි ධාරිතා ව්‍යාපෘති වඩ වඩාත් ආකර්ෂණය කර ගැනීම
- තව තවත් වෙළඳ මූල්‍යයන ව්‍යාපාර සඳහා ප්‍රචාරණ කටයුතු කිරීම මඟින් සහ ඇපකරු ලිපි සහ ණයවර ලිපි නිකුත් කිරීමේ ක්‍රියාදාම වඩා සරල කිරීම මඟින් ගාස්තු පාදක ආදායම ඉහළ නංවා ගැනීම

විශේෂ සිදුවීම්

මෙහෙයුම් ආදායමේ % ක් ලෙස



මෙහෙයුම් ආදායම (රු. මිලියන)

මුළු වත්කම් (රු. මිලියන)

මුළු වත්කම්වල % ක් ලෙස



අපේ කාර්ය සාධනය සිදුව ඇති ආකාරය

මූල්‍ය සාරාංශය - ආයතනික සහ අක්වෙරළ බැංකුකරණය

	රු මිලියන		
	2012	2011	වෙනස %
පොළිය	16,486	8,754	88%
ගාස්තු සහ කොමිස් මුදල්	1,546	896	72%
වෙනත්	1,014	462	120%
මුළු ආදායම	**19,046**	**10,112**	**88%**
පොළී වියදම්	(18,787)	(9,472)	98%
පොළී නොවන වියදම්	(3,603)	(2,261)	59%
අන්තර් අංශ ගනුදෙනු	8,339	3,609	131%
ශුද්ධ මෙහෙයුම් ආදායම	**4,995**	**1,988**	**151%**
මුළු වත්කම්	**178,567**	**127,166**	**40%**
මුළු වගකීම්	**369,172**	**210,944**	**75%**

2012 දෙසැම්බර් 31 දිනට ආයතනික බැංකුකරණ අංශයේ මුළු වත්කම් රු. මිලියන 178,567 ක වූ අතර එය බැංකුවේ සමස්ත වත්කම් පදනමින් 18.1% ක් නිරූපනය කළේය. මුළු වත්කම් වර්ධනය සඳහා දායක වූ ප්‍රධාන කරුණක් වූයේ 2011 පැවති රු. මිලියන 112,353 ක් වූ ණය සහ අත්තිකාරම් 2012 දී රු. මිලියන 150,117 දක්වා 34% කින් වර්ධනය වීමයි. රාජ්‍ය අංශයට ප්‍රදානය කළ ණයෙන් 65% ක් සඳහා දායක වූයේ ආයතනික බැංකු කටයුතු අංශයයි.

2012 වසරේදී ආයතනික සහ අක්වෙරළ බැංකු කටයුතු අංශයේ මුළු ආදායම රු. මිලියන 19,046 ක් වූ අතර එය බැංකුවේ මුළු ආදායමෙන් 17.5% ක් විය. ආයතනික සහ අක්වෙරළ බැංකු කටයුතු අංශය එහි රාජ්‍ය ව්‍යාපාර හා එක්ව ගත් කළ (රාජ්‍ය ව්‍යාපාර වෙනම කාණ්ඩයක් ලෙස කාණ්ඩ විශ්ලේෂණ සටහනේ පෙන්නුම් කර ඇත.) බැංකුවේ ආදායම සඳහා විශාලතම දායකත්වය සපයන්නා විය. 2012 මුදල් වර්ෂය තුළ පොළී ආදායම 88% කින් වර්ධනය වූ අතර ඒ සඳහා හේතු වූයේ. ණය සහ අත්තිකාරම් හි ඒ හා සමාන වර්ධනයයි. මුළු පොළී ආදායම සඳහා ආයතනික බැංකු කටයුතු 17% කින් දායක විය. (එනම් රු. මිලියන 16,486)

කළමනාකරණ විවරණය
සහ විශ්ලේෂණය

2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මුළු තැන්පතුවලින් 25% සඳහා දායක වෙමින් ආයතනික ගනුදෙනුකරුවන් රු. මිලියන 171,392 ක් තැන්පත් කර තිබුණි. ඉහළ පොළී අනුපාත හේතුවෙන් පොළී වියදම් දෙගුණයකට ආසන්න ප්‍රමාණයකින් වැඩි වූ අතර ජංගම සහ ඉතිරි කිරීම් හිඟුම් වල සිට ස්ථාවර සහ කාලීන තැන්පතු දක්වා මාරුවීමක් දක්නට ලැබුණි.

වත්මනෙහි කාරක ප්‍රාග්ධනය මූල්‍යයනය ආයතනික ගනුදෙනුකරුවන්ට බැංකුවෙන් ලබා දෙන ණය සහ අත්තිකාරම් වලින් 50% කට වැඩි ප්‍රමාණයකින් සමන්විත වේ. බැංකුව වඩාත් පුළුල් අන්දමින් මූල්‍ය යටිතල පහසුකම්, සංචාරක ව්‍යාපාරය, නිෂ්පාදන, ඉදිකිරීම් සහ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘතින් මූල්‍යයනය සඳහා සහභාගි වීම හේතුවෙන් ආයතනික ණය සඳහා වන කල්පිරීමේ පැතිකඩ 2013 වසරේ සිට ඉදිරියට වඩා දිගුකාලීන කල්පිරීම් දක්වා මාරුවනු ඇතැයි බැංකුව අපේක්ෂා කරයි.

2012 දෙවන භාගයේදී බැංකුව ඇතැම් ප්‍රධාන දිගුකාලීන ණය පහසුකම් අනුමත කරන ලදී.

- ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි කි.මී. 270 ක් වූ නව මාර්ග සංවර්ධනය සහ ඉදිකිරීම පිණිස මාර්ග යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ආසන්න වශයෙන් රු. බිලියන 21.5 ක් අනුමත කරන ලදී. රජය විසින් නිකුත් කරන ලද සාමාන්‍ය භාණ්ඩාගාර ඇපකර හානිපූරක වශයෙන් තබාගනිමින් ශ්‍රී ලංකා මාර්ග සංවර්ධන අධිකාරියට මෙම මුදල් සපයන ලදී. පහසුකම ස්ථාපනය කළ දින සිට වසර දෙක හමාරක කාලසීමාවක් තුළ මෙම ණය මුදල ලබාදීම සිදු කරන ලද අතර ආපසු ගෙවීමේ කාලය මධ්‍ය සිට දිගුකාලීන වනු ඇත. මෙම පහසුකම යටතේ 2012 දී ප්‍රදානය කළ ණය ප්‍රමාණය රු. මිලියන 14,000 කි.

- සංචාරක අංශයේ කාමර ධාරිතාවය තවත් 1,500කින් වැඩි කිරීමට යෝජනා කරමින් එම අංශය සඳහාද රු. මිලියන 13,000 ක ණය පහසුකම් බැංකුව අනුමත කර ඇති අතර එම මුදලින් රු. මිලියන 8,000 ක් 2013 දී ලබා දීමට අදහස් කෙරේ. මෙම ණය ආපසු ගෙවීම් කාලය වසර අටේ සිට දහය දක්වා වනු ඇත.

- එමෙන්ම නිෂ්පාදන, සෞඛ්‍ය සේවා, මූල්‍ය, පුනර්ජනනීය බලශක්ති සහ ඉදිකිරීම් අංශ ආශ්‍රිත විවිධාංගිකෘත ව්‍යාපෘති ගණනාවකටද 2013 වසරේදී රු. මිලියන 2,500 කට ආසන්න කාලීන ණය ලබාදීමට බැංකුව අදහස් කරයි.

වෙළඳ මූල්‍යයනයේ පසුබැස්ම ආනයන සහ අපනයන අඩුවීමේ ප්‍රතිඵලයකි. ගෝලීය ආර්ථිකයේ මන්දගාමී වර්ධනය හේතුවෙන් ශ්‍රී ලංකාවට විවිධ ගැටළු වලට මුහුණ දීමට සිදු විය. පහළ වැටෙමින් පැවති බාහිර ඉල්ලුම නිසා අපගේ ප්‍රධාන ඇඟලුම් අපනයන ද පහත වැටුණු අතර අපනයන වෙළඳපොළේ යටියත් ප්‍රවණතාවක් ඇති කරමින් අපේ රබර් අපනයනය ද පහත වැටුණි. අයහපත් බලපෑම් ඇති කරමින් මහ බැංකුව පැනවූ විවිධ මූල්‍ය විධිවිධාන වල ප්‍රතිඵලයක් ලෙස ආනයන ද, අපනයනයන්ට බෙහෙවින් වැඩි වේගයකින් පහත වැටුණි.

වෙළඳ මූල්‍යයන ආශ්‍රිත ක්‍රියාකාරකම් වලින් ලද අඩු දායකත්වය මධ්‍යයේ වුවද, 2012 දී බැංකු සේවා ගාස්තු සහ කොමිස් මුදල් රු. මිලියන 1,546 දක්වා 72% කින් වර්ධනය වුණි.

2011 වසරේ රු. මිලියන 6,493 ට සාපේක්ෂව අක්‍රිය වත්කම් 2012 දී රු. මිලියන 7,796 ක් වූ අතර එය 20% ක වැඩිවීමකි (රජයේ ණය ද ඇතුළුව). ඒ සඳහා ප්‍රධාන හේතු කාරකය වූයේ මාලදිවයිනේ පැවති අයහපත් දේශපාලන වාතාවරණය හේතුවෙන් සංචාරක කර්මාන්තයේ ආදායම් පහත වැටීම නිසා මාලේ ශාඛාව මගින් ප්‍රදානය කළ ණය කිහිපයක් අය කර ගැනීමට නොහැකි වීමයි.

නිපැයුම් කළඹ

ආයතනික බැංකු කටයුතු

ආයතනික බැංකුකරණ අංශය දිගු සහ කෙටිකාලීන ණය, චක්‍රීය අයිරා ණය සහ ආනයන සහ අපනයන සඳහා පූර්ව සහ පශ්චාත් නැව්ගත කිරීමේ පහසුකම්, මුදල් වෙළඳපොළ ණය, ණය දායකයන් කිහිප දෙනෙකු සමග ලබා දෙන ව්‍යාපාරික ණය ඇතුළුව ව්‍යාපෘති ණය, ණයවර ලිපි, ඇපකර සහ බැඳුම්කර ඇතුළුව පුළුල් පරාසයක ණය සහ අත්තිකාරම් ආයතනික ගනුදෙනුකරුවන් සඳහා ලබා දෙයි. ආර්ථිකයේ සියලු අංශ

> **ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශයන්හි කි.මී.270ක් වූ නව මාර්ග සංවර්ධනය සහ ඉදිකිරීම පිණිස මාර්ග යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා ආසන්න වශයෙන් රු.බිලියන 21.5 ක් අනුමත කරන ලදී**

ආවරණය කෙරෙන විවිධාංගීකෘත ණය කළඹක් ආයතනික බැංකුකරණ අංශය සතු වේ. ගනුදෙනුකරුවන් සහ ඔවුන්ගේ ව්‍යාපාර ආශ්‍රිත ණය අවදානම් සැලකිල්ලට ගනිමින් ආයතනික ගනුදෙනුකරුවන්ට ලබා දෙන අත්තිකාරම් සඳහා සුරැකුම් සහිත සුරැකුම් රහිත යන ණය නිපැයුම් දෙවර්ගයම අයත් වේ. බැංකුවේ ආයතනික ණය පොළී අනුපාත නිර්ණය කරනු ලබනුයේ ගනුදෙනුව හා සම්බන්ධ ව්‍යවහාර මුදල් වීකකය මත පදනම්ව AWPLR හෝ LIBOR අනුපාතයන් අදාළ කරගනිමිනි. ආයතනික ගනුදෙනුකරුවන්ගෙන් අය කරගනු ලබන පොළී පරාසය සහ වාරික පදනම්ව ඇත්තේ ගනුදෙනුකරුවන් සඳහා අනුමත කරනු ලැබූ ණය පහසුකම් පැකේජයෙන් බැංකුවට හිමිවන මුළු ප්‍රතිලාභ සහ ලබාදුන් ශ්‍රේණිගත කිරීම මත පදනම්වය.

සෑම ආයතනික ගනුදෙනුකරුවෙක් සඳහාම ඒ වෙනුවෙන්ම කැපවූ සබඳතා කළමනාකරුවෙක් / නිලධාරියෙක් පත් කරනු ලබන අතර බැංකුව සමග ගනුදෙනුකරුගේ සබඳතා සහ එම ගනුදෙනුකරුගේ සමස්ත බැංකු අවශ්‍යතා එකම ස්ථානයකින් සැපයීම සඳහා එම නිලධාරීන් ක්‍රියා කරයි. මුදල් ණයවර, කාරක ප්‍රාග්ධන ඉල්ලුම් ණය සහ අයිරා පහසුකම් ඇතුළු මූල්‍යකරණයේ ප්‍රධාන කොටස් සකස් වනුයේ කාරක ප්‍රාග්ධන මූල්‍යකරණයෙනි.බැංකුව විසින් මූල්‍යකරණය කර ඇති මෙම පහසුකම්

මුදල් තැන්පතු, භාණ්ඩ ලේඛන සහ ලැබිය යුතු දෑ බඳු ජංගම වත්කම් මඟින් සාමාන්‍යයෙන් සුරක්ෂිත කර ඇත. කාරක ප්‍රාග්ධන ණය පහසුකම් සාමාන්‍යයෙන් එක් වර්ෂයක කාලසීමාවක් සඳහා ලබා දෙන අතර එම වසර අවසානයේදී යෝග්‍ය පරිදි සමාලෝචනය කර අළුත් කරනු ලැබේ. එබඳු සෑම ණය ලබාදීමකදීම ණය පහසුකම වාර්ෂික සමාලෝචනයකට යටත් වේ. දිනපතා ගෙවීමට ඇති මුදල් ප්‍රමාණය මත පදනම්ව මාසික පදනමින් පොළිය එකතු කරගනු ලැබේ.

ආයතනික තැන්පතු නිපැයුම් තුළ ඉල්ලුම් තැන්පතු, ස්ථාවර තැන්පතු සහ සත්දින ඉල්ලුම් තැන්පතු අයත් වේ. ණය ගැනුම් පිරිවැය අඩු කරගැනීම සඳහා ආයතනික ගනුදෙනුකරුවන් සිය අරමුදල් ප්‍රතිආයෝජනය කරන බැවින් ඔවුන් සාමාන්‍යයෙන් දීර්ඝ කාලයක් පුරා විශාල තැන්පතු පවත්වා ගනු නොලැබේ.

වෙළඳ සේවා

බැංකුවේ වෙළඳ සේවා ඒකකය එකම ස්ථානයකින් සියලු සේවා සැපයීමේ සංකල්පය යටතේ ගනුදෙනු ආරම්භයේ සිට අවසානය දක්වා වෙළඳ විසඳුම් සපයමින් වෙළඳ මූල්‍ය ගනුදෙනුකරුවන් කළමනාකරණය කිරීමට සමෝධානික ප්‍රවේශයක් යොදාගනී. මෙම වෙළඳ සේවාවන්ට ණයවර ලිපි ස්ථාපනය හා උපදෙස් දීම, පූර්ව නැවිගත කිරීම් සහ පශ්චාත් නැවිගත කිරීමේ ලේඛන පහසුකම් සැපයීම සහ ගැනුම්කරුවන්ගේ තත්ත්ව වාර්තා ලබාගැනීම අයත් වේ. වෙළඳ සේවා ඒකකය ආයතනික සේවාග්‍රාහකයන්ට සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක සේවාග්‍රාහකයන් යන දෙපිරසටම සේවා සපයන අතර ඔවුන්ගේ අනෙකුත් බැංකුකරණ ක්‍රියාකාරකම් ශාඛා බැංකු කටයුතු අංශය මඟින් කළමනාකරණය කරනු ලැබේ. වෙළඳ සේවා ඒකකය ලංකා බැංකු මූලස්ථානයේ පිහිටුවා ඇත. සිය දේශීය ශාඛා ජාලය සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක මධ්‍යස්ථාන මඟින් 2012 වසරේදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් ඇතුලත්ව විශාල ගනුදෙනුකාර පිරිසකට වෙළඳ මූල්‍ය සේවා ලබාදීම සඳහා වන සැලසුම් බැංකුව විසින් ක්‍රියාවට නංවා තිබේ.

වෙළඳ මූල්‍ය සේවා ශාඛා 45 කින් ලබාගත හැකි අතර 2013 පළමු කාර්තුව වන විට තවත් ශාඛා 11 ක් මඟින් එම සේවා සැපයීමට අපේක්ෂා කරනු ලැබේ. ශාඛාවල එම සේවා සැපයීම සඳහා ශාඛා කාර්ය මණ්ඩල සාමාජිකයන් 400කට වැඩි පිරිසක් බැංකුව මඟින් පුහුණු කර තිබේ.

වෙළඳ සේවා ඒකකය මඟින් සපයනු ලැබූ සේවාවන්හි සාර්ථකත්වය හේතු කොටගෙන ට්‍රේඩ් ෆයිනෑන්ස් සඟරාව විසින් 2010 වසරේ හොඳම ශ්‍රී ලාංකික වෙළඳ බැංකුව ලෙස ලංකා බැංකුව නම් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය විසින් පිරිනමනු ලබන ISO 9001 2008 තත්ත්ව කළමනාකරණ පද්ධති සහතිකය 2011 වසරේදී බැංකුවේ වෙළඳ සේවා ඒකකයට පිරිනමනු ලැබිය. වාර්ෂික විගණන සහ සමාලෝචනයට යටත්ව එම සහතිකය 2014 දක්වා වලංගු වේ.

අක්වෙරළ බැංකු කටයුතු

බැංකුවේ අක්වෙරළ බැංකු කටයුතු අංශය මූලිකවම අක්වෙරළ සමාගම් සහ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් ප්‍රදානය කරන ලද අනුමැතීන් සහ බලපත්‍ර යටතේ අපනයන පාදක ක්‍රියාකාරකම් සහ සේවාවන්හි නියැලී සිටින ශ්‍රී ලාංකික ආයතනික සහ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක ගනුදෙනුකරුවන් සඳහා සේවා සපයයි. අක්වෙරළ බැංකු කටයුතු අංශය ණය, තැන්පතු බඳු විදේශ ව්‍යවහාර මුදල් බැංකු සේවා සහ ප්‍රධාන කාර්යාලයෙදී සපයනු ලබන අනෙකුත් සියලු සේවාවන් සපයයි.

දේශීයව අගය එකතු කිරීමෙන් පසුව ප්‍රති අපනයනය සඳහා සිදු කරන ආනයන ඇතුළුව අපනයනකරුවන්ගේ සියලුම මූල්‍ය අවශ්‍යතා බැංකුව ඉටු කරනු ලැබේ. මෙම අංශය මඟින් සපයන පහසුකම් අතරට පූර්ව නැවිගත කිරීම් සහ පශ්චාත් නැවිගත කිරීම් පහසුකම්, කෙටිකාලීන කාරක ප්‍රාග්ධන ණය පහසුකම්, ව්‍යාපෘති ණය, ව්‍යාපාරික හා අනෙකුත් ණය ඇතුලත් වේ.

අක්වෙරළ බැංකු කටයුතු අංශය ඉලක්ක කරනුයේ විදේශ මුදලින් ගනුදෙනු කරන සේවාග්‍රාහකයන්ය. බැංකුව ණය පහසුකම් ව්‍යාප්ත කළ ප්‍රධාන අංශ අතරට ඇඟලුම් සහ රෙදිපිළි, නෞකා නිෂ්පාදනය, සහ අළුත්වැඩියා, නෞකා සඳහා ඉන්ධන සැපයීම, සංචාරක, නිෂ්පාදන සහ විදුලි බල උත්පාදන කර්මාන්ත අයත් වේ.

“සංචාරක අංශයේ කාමර ධාරිතාවය තවත් 1,500 කින් වැඩි කිරීමට යෝජනා කරමින් එම අංශය සඳහාද රු. මිලියන 13,000 ක ණය පහසුකම් බැංකුව අනුමත කර ඇති අතර එම මුදලින් රු. මිලියන 8,000 ක් 2013 දී ලබා දීමට අදහස් කෙරේ. මෙම ණය ආපසු ගෙවීම් කාලය වසර අට සිට දහය දක්වා වනු ඇත.”

භාණ්ඩාගාර සහ ජාත්‍යන්තර බැංකු කටයුතු අංශය

බැංකුවේ භාණ්ඩාගාර සහ ජාත්‍යන්තර බැංකු කටයුතු අංශය භාණ්ඩාගාර ඒකකය, ජාත්‍යන්තර ඒකකය සහ විදේශ ශාඛා ඒකකය ලෙස ඒකක තුනකට බෙදා තිබේ.

භාණ්ඩාගාර ඒකකය වත්කම් සහ වගකීම් කළමනාකරණය, ද්‍රවශීලතා කළමනාකරණය, පොළී අනුපාත අවදානම් කළමනාකරණය, විදේශ මුදල් සහ විදේශ වෙළඳපොළ සමග කටයුතු කිරීම බඳු භාණ්ඩාගාර මෙහෙයුම් පිළිබඳව කටයුතු කරනු ලබයි. ඊට අමතරව, රජයේ සුරැකුම්පත් අලෙවි කිරීම සහ ද්විතියික වෙළඳපොළ ක්‍රියාකාරකම් වලද භාණ්ඩාගාර අංශය නියුක්තව සිටී. එසේම ඉදිරි ගිවිසුම, පොළී අනුපාත හුවමාරු,ව්‍යවහාර මුදල් හුවමාරු සහ විදේශ මුදල් විකල්ප මෙන්ම අරමුදල් කළමනාකරණය බඳු අවදානම් ඉදිරි රැකුම් ව්‍යුත්පන්න සාධන පත්‍ර මෙම අංශය මඟින් සිය ගනුදෙනුකරුවන් සඳහා පිරිනමයි.

ජාත්‍යන්තර ඒකකය මඟින් බැංකුවේ ප්‍රේෂණ කටයුතු සහ ලොව පුරා අනුරූපක බැංකුකරණ සබඳතා මෙහෙයවනු ලබයි.

විදේශ ශාඛා ඒකකය විසින් එක්සත් රාජධානි පරිපාලිත සමාගම ඇතුළුව බැංකුවේ විදේශ ශාඛා ජාලය කළමනාකරණය සහ මෙහෙයවීම සිදු කරනු ලබයි.

භාණ්ඩාගාර සහ ජාත්‍යයන්තර බැංකු කටයුතු අංශය බැංකුවේ මුළු වත්කම්වලින් 2.92% ක් සඳහා ද දළ ආදායමින් 8.99% ක් සඳහාද දායක වෙයි.

අපේ උපාය මාර්ගය

- වෙළඳපොළ වෙනස්වීම් වලට අනුකූල ලෙස වත්කම් සහ වගකීම් සංකලනය ගැලපීම් කරමින් බැංකුවේ ශේෂ පත්‍රය පූර්වාපේක්ෂකව කළමනාකරණය කිරීම
- බැංකුවේ අරමුදල් පදනම තවදුරටත් විවිධාංගීකරණය කිරීම සඳහා මූල්‍ය සාධනපත්‍ර වෙළඳපොළ ගවේෂණය කිරීම
- වැඩි දියුණු කළ ආවේක්ෂණ තාක්ෂණවේදය තුළින් භාණ්ඩාගාර අවදානම් කළමනාකරණය කිරීම
- වෙළඳපොළ ප්‍රවණතා අනුව අවදානම් ගැලපුම් කල ප්‍රතිලාභ වඩා ප්‍රශස්ත මට්ටමකට ගෙන ඒම

අපේ අනාගත ඉලක්ක

- අරමුදල් පිරිවැය සක්‍රියව කළමනාකරණය කරමින් බැංකුවේ අරමුදල් සම්මිශ්‍රණය ව්‍යාප්ත කිරීම
- අති නවීන තාක්ෂණය යොදා ගනිමින් සමස්ත ආමුඛ ප්‍රේෂණ කටයුතු ස්වයංක්‍රීයකරණය කිරීම
- රට තුළට මෙන්ම බැංකුවටද තිරසාරව විදේශ මුදල් ප්‍රවාහ ස්ථාපිත කිරීම සඳහා අපේ තත්ත්වය තවදුරටත් තහවුරු කිරීම පිණිස විදේශ වෙළඳපොළ කරා ව්‍යාප්ත කිරීම
- නව්‍ය සාධනපත්‍ර සහිතව වඩා විවිධාංගීකෘත භාණ්ඩාගාර නිපැයුම් සහ සේවා පිරිනැමීම
- දිගු සහ මධ්‍යකාලීන අරමුදල්කරණය හරහා අරමුදල් පදනම තවදුරටත් ශක්තිමත් කිරීම
- වත්කම් පදනම පුළුල් කරන අතරතුර විදේශ ශාඛාවන්හි වත්කම් ගුණත්වය වැඩි දියුණු කිරීම

විශේෂ සිදුවීම්

මෙහෙයුම් ආදායමේ % ක් ලෙස



මෙහෙයුම් ආදායම (රු. මිලියන)

මුළු වත්කම් (රු. මිලියන)

මුළු වත්කම්වල % ක් ලෙස



	රු. මිලියන		
	2012	2011	වෙනස
පොළී	2,750	3,629	(24.2)%
ගාස්තු සහ කොමිස් මුදල්	643	646	(0.5)%
වෙනත්	6,396	1,476	333.2%
මුළු ආදායම	**9,789**	**5,751**	**70.2%**
පොළී වියදම්	(10,906)	(5,562)	96.1%
පොළී නොවන වියදම්	(3,504)	(1,171)	199.2%
අන්තර් අංශ ගනුදෙනු	9,436	4,339	117.5%
ශුද්ධ මෙහෙයුම් ආදායම	**4,815**	**3,357**	**43.5%**
මුළු වත්කම්	**28,764**	**32,546**	**(11.6)%**
මුළු වගකීම්	**43,267**	**18,535**	**133.4%**

2011 වසරේ පැවති මට්ටමට වඩා 2012 දී දෙගුණයක් වූ විදේශ විනිමය ආදායම හේතු කොට ගෙන භාණ්ඩාගාර සහ ජාත්‍යන්තර බැංකු කටයුතු අංශය 43.5% ක මෙහෙයුම් ලාභ වැඩිවීමක් වාර්තා කරන ලදී. 2012 වසරේ මුල් භාගයේදී බැංකුව රුපියලේ අගයෙහි ප්‍රධාන උච්චාවචනයක් අත්විඳි ඉක්මනින් වෙනස්වන සුළු වූ විදේශ විනිමය පරිසරයක් තුළ විනිමය ආදායමේ වැඩිවීමකට දායක වෙමින් වෙළඳ ක්‍රියාකාරකම් මෙන්ම පරාසයක් ද ඉහළ නැංවුණි. එයට අමතරව, බැංකුව සිය ඇ. ඩො. බැඳුම්කර නිකුතුවේ කොටසක්ද රුපියල් සඳහා හුවමාරු කරගත් අතර එයද විදේශ විනිමය ඉහළ යාමට දායක වුණි. ගාස්තු ආදායම ස්ථාවරව පැවති අතර ඉහළ ඵලදා නිපැයුම් බවට ප්‍රතිවර්ගීකරණය හේතුවෙන් අංශයේ වත්කම් 11.6% කින් අඩුවිය.

භාණ්ඩාගාර ඒකකය

මූලිකවම, 2011 දී පැවති මට්ටමේ සිට 2012 දී දෙගුණයක් වූ ඉහළ නැංවුණු විදේශ විනිමය ආදායම හේතු කොටගෙන 95% ක මෙහෙයුම් ලාභ වැඩිවීමක් භාණ්ඩාගාර අංශය විසින් වාර්තා කරන ලදී. 2012 මුල් භාගයේදී රුපියලේ අගයෙහි ප්‍රධාන අවප්‍රමාණයක් දක්නට ලැබුණු වෙනස්වන සුළු විදේශ විනිමය පරිසරයක් තුළ විනිමය ආදායමේ වැඩිවීමට

දායක වෙමින් වෙළඳ ක්‍රියාකාරකම් මෙන්ම පරාසයන්ද වැඩිවුණි.

බැංකුවේ වත්කම් සඳහා භාණ්ඩාගාර ඒකකය 1.4% කින් හෙවත් රු. මිලියන 13,812 කින් දායක වූ අතර බැංකුවේ ආදායම සඳහා එහි දායකත්වය 6.8% ක් හෙවත් රු. මිලියන 7,734 කි. ඒකකයේ වත්කම් 32% කින් පහත වැටුණි. බැංකුවේ භාණ්ඩාගාර ඒකකය සඳහා මග පෙන්වනු ලබනුයේ භාණ්ඩාගාර ප්‍රතිපත්තිය, ද්‍රවශීලතා ප්‍රතිපත්තිය, වත්කම් සහ ද්‍රවශීලතා කළමනාකරණ ප්‍රතිපත්තිය සහ ආයෝජන සහ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති මගිනි. බැංකුවේ වත්කම් සහ වගකීම් මිල නියම කිරීම, බැංකුවේ පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීම සහ බැංකුවේ වත්කම් සහ වගකීම් සංකලනයේ කල්පිරීමේ පැතිකඩ කළමනාකරණය අයත් වන්නා වූ බැංකුවේ වත්කම් සහ වගකීම කළමනාකරණ වැඩසටහන පවත්වනුයේ භාණ්ඩාගාර ඒකකයයි. විදේශ මුදල් බැඳුම්කර, ද්විපාර්ශ්වීය සහ සම්මිලිත ණය බඳු බැංකුවේ විදේශ මුදල් ණය ගැනුම් කළමනාකරණය කරනුයේ භාණ්ඩාගාර අංශයයි.

මූලික ආර්ථික සිද්ධාන්ත පොළී අනුපාත, විනිමය අනුපාත සහ අභ්‍යන්තර ද්‍රවශීලතාව ආදියට හිතකර නොවුයෙන් 2012 අභියෝග සපිරි වසරක් විය. මෙම අයහපත් වාතාවරණය කල් තියා දුටු බැංකුව, පොළී අනුපාත විනිමය අනුපාත මත දේශීයව ඇති විය හැකි පීඩනය ලිහිල් කිරීම සඳහා අරමුදල් සැලැස්මක් නිර්මාණය කරන ලදී. 2012 තුළදී දේශීය අරමුදල් රාශිකරණය අප සමානුපාතිකව අඩු කළ අතර විකල්ප බාහිර අරමුදල් සපයා ගැනීම සඳහා කටයුතු කළෙමු. එහි ප්‍රතිඵලයක් ලෙස අපගේ ප්‍රථම ජාත්‍යන්තර බැඳුම්කරය අප ක්‍රියාවට නැංවූ අතර එය විශිෂ්ඨ ජයග්‍රහණයක් විය. (කරුණාකර විස්තර සඳහා අපගේ බැඳුම්කර විත්ති බලන්න) අපේ අරමුදල් සම්මිශ්‍රණය වෙනස් කිරීමෙන් අප ලබාගත් වාසිය දේශීය පොළී අනුපාත සහ විනිමය අනුපාත යන දෙකටම සිය ස්ථාවරත්වය පවත්වාගැනීම පිණිස බලපෑමක් ඇතිකිරීමට අපට හැකියාව ලබා දුනි.

අරමුදල් සම්පාදනය සහ ද්‍රවශීලතාව

බැංකුවේ මුළු වත්කම් ව්‍යාප්තිය කළමනාකරණය කරන අතරතුර එහි ද්‍රවශීලතා තත්ත්වය යහපත්ව පැවතුණි. බැංකුව සිය දේශීය සහ විදේශීය මුදල් වගකීම් යන දෙකම සඳහා ද්‍රවශීලතා අනුපාතිකය එහි නියාමන සම්මතය වන 20% ට ඉහළින් පවත්වා ගන්නා ලදී. 2012 දෙසැම්බර් 31 දිනට ද්‍රවශීලතා වත්කම් අනුපාතිකය දේශීය වත්කම් සඳහා 22% ක් ද අක්වෙරළ වත්කම් සඳහා 25% ක් ද විය.

බැංකුවේ අරමුදල් පදනමේ සැලකිය යුතු ප්‍රමාණයක් සමන්විත වූයේ මුළු අරමුදල් සම්මිශ්‍රණයෙන් 70% ක් ලෙස දිගටම පැවති ගනුදෙනුකාර තැන්පතු වලිනි. බැංකුවේ උපාය මාර්ගය ප්‍රකාරව, එහි අරමුදල් සහ ණය සම්මිශ්‍රණයේ ආවේණික ආපසු ගෙවීමේ කාලසීමාවේ නොගැලපීම කළමනාකරණය කිරීමට සහාය වනු පිණිස 2012 දී අරමුදල් රැස් කිරීමේ ප්‍රධාන වැඩසටහන් දෙකක් මගින් අරමුදල්කරණය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

රු. මිලියන 209,947 ක් වූ ශේෂ පත්‍රයේ වර්ධනය සඳහා තැන්පතු මඟින් 47% ක් ද, (රු. මිලියන 97,667) ඇ.ඩො. බැඳුම්කරය මඟින් 30% ක් ද (රු. මිලියන 63,907 ක් හෙවත් ඇ.ඩො. මිලියන 500 ක්) අනෙකුත් විදේශ ණය ගැනුම් මගින් 20% ක් හෙවත් රු. මිලියන 42,750 ක් ලෙස අරමුදල් සපයන ලදී. ඉතිරිය සඳහා අරමුදල් සපයන ලද්දේ රඳවාගත් ඉපැයුම් හා අනෙකුත් වගකීම් මගිනි. රුපියලේ ද්‍රවශීලතාව කළමනාකරණය කිරීම පිණිස බැංකුව සිය ඇ. ඩො. බැඳුම්කර වලින් කොටසක් ද (ඇ. ඩො. මිලියන 250 ක්) හුවමාරු කරන ලදී.

රුපියලේ ද්‍රවශීලතාව සහ රුපියල් අරමුදල්කරණ නොගැලපීම සමනය කිරීම සඳහා බැංකුව දෙසැම්බර් මාසයේ පස් අවුරුදු ණයකරයක් දියත් කර ඉන් රු. මිලියන 6,000 ක් රැස් කර ගන්නා ලදී. ණයකරය සඳහා දේශීය වෙළඳපොලෙහි ඉතා ඉහළ ඉල්ලුමක් පැවති අතර එය අධි දායක විය.

“අප විසින් රටට දැඩි අවශ්‍යතාවයක්ව පැවති විදේශ විනිමය අවශ්‍යතා සපුරාලීමට ඇ.ඩො. මිලියන 790 ක් සම්පාදනය කරන ලදී. මින් ඇ.ඩො. මිලියන 500 ක් බැඳුම්කර මඟින්ද ඉතිරිය සම්මිලිත ණය ගිවිසුම් හා ද්විපාර්ශ්වික ගිවිසුම් තුළින් සම්පාදනය කරන ලදී.”

ජාත්‍යන්තර මෙහෙයුම්

2012 සමූහයේ ආදායමින් 2.2% ක් සමන්විත වූයේ බැංකුවේ විදේශ මෙහෙයුම්වලින් වන අතර 2012 දෙසැම්බර් 31 දිනට සමූහයේ මුළු වත්කම් වලින් 1.5% කට දායක විය.

ආමුඛ ප්‍රේෂණ

ශ්‍රී ලංකාව වෙත එවන ආමුඛ ප්‍රේෂණ දෙවර්ග යකි. එනම් ප්‍රධාන වශයෙන්ම මැද පෙරදිග, යුරෝපයේ සහ දකුණු කොරියාවේ රැකියාවල යෙදෙන ශ්‍රී ලාංකිකයන්ගේ ප්‍රේෂණ සහ විදේශ සමාගම්වල වාණිජ ප්‍රේෂණය විගාමික ශ්‍රී ලාංකික සේවකයන්ට සිය ප්‍රේෂණ ගනුදෙනු සඳහා සහායවීමට බැංකුව නියෝජිතයන් 23 දෙනෙකු විදේශ රටවලට අනුයුක්ත කර තිබේ. ලොව පුරා මෙහෙයුම් නියෝජිතයන් වන මනිග්‍රෑම්, එක්ස්ප්‍රස් මනි, කොයින්ස්ටාර්, ක්වික් පේ සහ ඊසි රෙමිට් ආදී ගෝලීය ප්‍රේෂණ ජාලයන්හි බැංකුව හවුල්කරුවෙකි.

එසේම, ප්‍රේෂණ සඳහා පහසුකම් සැපයීමට බැංකුව BOC ඊ-කෑෂ් නම් තමන්ටම හිමි අන්තර්ජාලය පාදක අරමුදල් හුවමාරු පද්ධතියක්ද පවත්වාගෙන යයි. ජාත්‍යන්තර බැංකුකරණ ආයතන සමග බැංකුවේ පවතින අනුරූපී සබඳතා විශාල සංඛ්‍යාව සහ දීපව්‍යාප්ත එහි දේශීය ශාඛා ජාලය, සිය ප්‍රේෂණ ගනුදෙනුකරුවන් සඳහා කාර්යක්ෂම සේවාවක් සැපයීමට බැංකුවට ඉඩ ලබා දෙයි. ආයතනික ප්‍රේෂණ පිළිබඳව කටයුතු කරනුයේ ප්‍රධාන ලෙසට බැංකුවේ ද්විපාර්ශවීය අනුරූපී බැංකු සබඳතා හෝ SWIFT වැනි අන්තර් බැංකු හුවමාරු පද්ධති හරහාය. බැංකුවේ ගනුදෙනුකාර තැන්පතු පදනම වෙතට ස්ථිර ඇමෙරිකානු ඩොලර් ප්‍රවාහයක් සපයන බැවින් ආමුඛ ප්‍රේෂණ වෙළඳපොළට විශේෂ අවධානය යොමුකරන ලදී. දේශීයවම මෙන්ම විදේශීය වෙළඳපොලේ ද වෙළඳ ප්‍රවර්ධන මූලපිරීම් කිහිපයක් දියත් කරන ලදී. අනේවාසික විදේශ මුදල් තැන්පතු ගිණුම් සඳහා දිනුම් ඇදීමක් හඳුන්වා දී ජයග්‍රාහකයන්ට රු. මිලියන 18.5 ක් ප්‍රදානය කළ අතර අනේවාසික විදේශ මුදල් තැන්පතුකරුවන්ගේ ළමුන්ගේ ශිෂ්‍යත්ව සහ අධ්‍යාපන වැඩසටහන් සඳහා රු. මිලියන 2.5 ක් වෙන් කරන ලදී.

38% ක වෙළඳපොළ කොටසක් නියොජනය කරමින් ප්‍රේෂණ මිලියන 1.8 ක් තුළින් බැංකුව හසුරුවනු ලැබූ මුළු ආමුඛ ප්‍රේෂණ ප්‍රමාණය රු. මිලියන 283,260 ක් විය. මෙය පෙර වසරට වඩා 15% ක වර්ධනයක් වූ අතර වර්ධනය ප්‍රධාන වශයෙන්ම සිදුවූයේ GCC, නැගෙනහිර ආසියාව, උතුරු ඇමෙරිකාව, යුරෝපීය සංගමය සහ දකුණු ආසියාවෙන් ලැබුණු ප්‍රේෂණ මඟිනි.

අනුරූපී බැංකුකරණය

රටවල් 118කට වැඩි සංඛ්‍යාවක බැංකු / හුවමාරු මධ්‍යස්ථාන 859කට අධික ප්‍රමාණයක් සමග බැංකුව සබඳතා පවත්වයි. වසර තුළ මෙම ජාලයේ සිදුවූ ප්‍රධාන වෙනස්කම වූයේ චික්සත් ජාතීන්ගේ සම්බාධක හේතු කොට ගෙන ඉරානීය බැංකු සමග පැවති සබඳතා බැංකුව අත්හිටුවීමයි.

විදේශ ශාඛා මෙහෙයුම්

2012 දෙසැම්බර් 31 දිනට, ඉන්දියාවේ චෙන්නායිහි සහ මාලදිවයිනේ මාලේහි බැංකුව සතුව විදේශ ශාඛා දෙකක් මෙන්ම චික්සත් රාජධානියේ ලන්ඩන්හි පූර්ණ හිමිකම සහිත පරිපාලිත සමාගමක් තිබුණි. මෙම ශාඛා සහ පරිපාලිත සමාගම තැන්පතු ගිණුම්, ප්‍රේෂණ සේවා, වෙළඳ මූල්‍යන පහසුකම්, භාණ්ඩාගාර නිපැයුම්, ව්‍යාපාරික ණය සහ උපදේශන සේවා පිරිනමයි. එයට අමතරව චෙන්නායි සහ මාලදිවයින් ශාඛා, ආසියානු නිශ්කාශන සංගමයේ යාන්ත්‍රණය යටතේ එම සංගමයේ අනෙකුත් වාණිජ බැංකුවලට පහසුකම් සපයයි.

චෙන්නායි ශාඛාව එහි ණය සහ අත්තිකාරම් රු. මිලියන 2,159 දක්වා 24% කින් වර්ධනය කළ අතර මාලේ ශාඛාවේ ණය රු. මිලියන 7,365 දක්වා 18% කින් වර්ධනය විය.

“2012 වසර තුළ සිදුවූ සියලු ආමුඛ ප්‍රේශණ වලින් 38% ක් බැංකුව හරහා සිදු විය.”

අනෙකුත් ව්‍යාපාරික කටයුතු

බෙදාහැරීම් ජාලය

සම්ප්‍රදායික බැංකු ශාඛාවන්ගේ සිට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර, ජංගම උපකරණ සහ අන්තර්ජාලය දක්වා විවිධ ප්‍රවේශ ලක්ෂ්‍යයන් හරහා බැංකුව සිය නිපැයුම් සහ සේවා බෙදා හරියි.

ශාඛා ජාලය

බැංකුව සතුව ශ්‍රී ලංකාව තුළ විශාල ශාඛා ජාලයක් පවතී. 2012 දෙසැම්බර් 31 දිනට ශාඛා 324 ක් (එක් ප්‍රමුඛතා බැංකුකරණ මධ්‍යස්ථානයක් ඇතුළුව) ව්‍යාප්ති කාර්යාල 276 ක් සහ සු. ම. ප. ව. මධ්‍යස්ථාන 10 ක් සහිත ජාලයක් බැංකුව සතුව ශ්‍රී ලංකාවේ පැවති අතර ලන්ඩනයේ පරිපාලිත සමාගමක්ද ඉන්දියාවේ චෙන්නායි නුවර සහ මාලදිවයිනේ මාලේ නුවර එක් විදේශ කාර්යාලය බැගින් තිබුණි. බැංකුවේ දේශීය ශාඛා 322 බැංකුවේ නිපැයුම් සහ සේවා පෙළම සපයන පූර්ණ සේවා ශාඛාවන් වන අතර ආයතනික ගනුදෙනුකරුවන්ට සේවා පිරිනැමීමේ විශේෂඥතාව සහිත ශාඛා 6 ක් ද ඊට ඇතුළත් වේ. ව්‍යාප්ති කාර්යාල 276 තැන්පතු සේවා සඳහා විශේෂිතව කටයුතු කරන අතර කොළඹ නගර මධ්‍යයේ පිහිටි ප්‍රමුඛතා බැංකුකරණ ඒකකය විශාල ආයෝජන හැකියාවන් සහිත ගනුදෙනුකරුවන් සඳහා සේවා සැපයීමේ විශේෂඥතාවක් දක්වයි.

පසුගිය වසර තුන තුළ බැංකුව සිය ශාඛා ජාලය සැලකිය යුතු ලෙස ව්‍යාප්ත කර තිබේ. 2010 දී එය නව ශාඛා සහ ව්‍යාප්ති කාර්යාල 27 ක් ද, 2011 දී නව ශාඛා සහ ව්‍යාප්ති කාර්යාල 40 ක් ද, 2012 නව ශාඛා සහ ව්‍යාප්ති කාර්යාල 34 ක් ද විවෘත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති උපදෙස් ප්‍රකාරව නව ශාඛා 15 ක් 2013 දී ස්ථාපිත කිරීමට බැංකුව සැලසුම් කර තිබේ.

1988 දී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ශ්‍රී ලංකාවට පළමුව හඳුන්වා දුන් බැවින් බැංකුව ස්වයංක්‍රීය බැංකුකරණයේ පුරෝගාමියෙකු ද වේ. 2012 දෙසැම්බර් 31 දිනට ටෙලර් යන්ත්‍ර 451 ක දේශීය ජාලයක් සහ ටෙලර් යන්ත්‍ර බෙදා හදා ගැනීමේ ශ්‍රී ලංකාවේ වැඩ පිළිවෙල අනුව අතිරේක ටෙලර් යන්ත්‍ර 2,326 ක් බැංකුව සතුව පැවතියේය. 2012 දී ලංකා බැංකුව ඇතුළුව ශ්‍රී ලංකාවේ බැංකු ගණනාවක් පොදු ටෙලර් යන්ත්‍ර පුවරුවක් සඳහා එක්වූ අතර එමගින් ඕනෑම ශ්‍රී ලාංකික බැංකුවක ගනුදෙනුකරුවෙකුට ශ්‍රී ලංකාව තුළ පිහිටි ඕනෑම ටෙලර් යන්ත්‍රයක් භාවිතා කිරීමට ඉඩ සලසන ජාලයක් නිර්මාණය කරන ලදී. මෙමගින් ගනුදෙනුවක් සඳහා ගනුදෙනුකරුගේ ගාස්තුව අඩු වන අතර හර කාඩ්පත් ජනප්‍රිය කරවීමට උපකාර වනු ඇත. බැංකුව 2010 දී ටෙලර් යන්ත්‍ර 23 ක්ද, 2011 දී ටෙලර් යන්ත්‍ර 52 ක් ද, 2011 දී ටෙලර් යන්ත්‍ර 47 ක් ද ස්ථාපනය කරන ලදී. 2013 දී ටෙලර් යන්ත්‍ර 70 ක් ස්ථාපනය කිරීමට බැංකුව සැලසුම් කර ඇත.

ජංගම බැංකු සේවා

බැංකුවේ ජංගම බැංකුකරණ සේවාව වන පේ මේට්, පහසුව සහ ආරක්ෂාව උපරිම කිරීමේ අරමුණ ඇතිව ගනුදෙනුකරුවන්ට සිය ජංගම දුරකථන හරහා ඕනෑම වේලාවක අඩු වියදම් බැංකු සේවා පිරිනමයි. ගනුදෙනුකරුවන්ට ලෙහෙසි සහ පහසු ක්‍රම පිරිනැමීම මගින් ගනුදෙනුකරුවන් රඳවා ගැනීම ඉහළ නැංවීම සහ බැංකුවේ වෙළඳ නාමය පිළිගැනීම ශක්තිමත් කිරීම සඳහා විභවය සිය ජංගම බැංකුකරණ සේවාව සතු බැව් බැංකුව විශ්වාස කරයි. බැංකුවේ සියලුම ශාඛාවල ගිණුම් වලට අදාලව මෙම සේවාව ලබාගත හැක. 2012 දෙසැම්බර් 31 දිනට, ජංගම බැංකුකරණ සේවා සඳහා ගනුදෙනුකරුවන් 18,600 කට වැඩි පිරිසක් ලියාපදිංචි වී තිබුණි.

> **“බැංකුව සිය BOC ඒ බෑන්ක් සේවාව මගින් පුද්ගලික ගනුදෙනුකරුවන්ටද, සිය BOC අයි-නෙට් සහ BOC ඒ බෑන්ක් මගින් සිය ආයතනික ගනුදෙනුකරුවන්ටද අන්තර්ජාල බැංකුකරණ සේවා සපයයි.”**

ප්‍රවේශ ක්‍රමවේදය අනුව මේ යටතේ ඇති පහසුකම් වලට ගිණුම් ශේෂ විමසීම්, ලූහුඬු ප්‍රකාශන, චෙක්පොත් සඳහා ඉල්ලීම්, වෙළඳ ගිණුම් විමසීම්, බැංකුව තුළ අරමුදල් මාරු කිරීම, පුද්ගලයාගෙන් පුද්ගලයාට අරමුදල් මාරුකිරීම, ජංගම දුරකථන ණය, බිල්පත් ගෙවීම් හා ජීවිත රක්ෂණ වාරික ගෙවීම් ඇතුළත් වේ. අනාගතයේදී අන්තර් බැංකු මුදල් පැවරුම් ආදී අතිරේක සේවා ජංගම බැංකුකරණය ඔස්සේ ලබාදීමට බැංකුව අදහස් කරයි. බැංකුව ජංගම බැංකුකරණ සේවා පිරිනමනුයේ ගනුදෙනුකරුගේ පහසුව වැඩි කිරීම පිණිසය.

අන්තර්ජාල බැංකුකරණය

බැංකුව සිය BOC ඒ බෑන්ක් සේවාව මගින් පුද්ගලික ගනුදෙනුකරුවන්ටද, සිය BOC අයි-නෙට් සහ BOC ඒ බෑන්ක් මගින් සිය ආයතනික ගනුදෙනුකරුවන්ටද අන්තර්ජාල බැංකුකරණ සේවා සපයයි. 2012 දෙසැම්බර් 31 දිනට දළ වශයෙන් ශාඛා බැංකු කාණ්ඩයේ

ගනුදෙනුකරුවන් 20,300 ක් ද, ආයතනික බැංකුකරණ අංශයේ ගනුදෙනුකරුවන් 1,750 ක් පමණද අන්තර්ජාල බැංකුකරණ සේවා සඳහා ලියාපදිංචි වී තිබුණි. බැංකුවේ අන්තර්ජාල බැංකු විසඳුම් ශාඛා සහ ආයතනික බැංකු කටයුතු භාවිතය සඳහා වූ විස්තීරණ නිපැයුමකි.

බැංකුවේ ගනුදෙනුකරුවන්ට අන්තර්ජාලය ඔස්සේ ගිණුම් ශේෂය පරීක්ෂා කර බැලීම, චෙක්පොත් සඳහා ඉල්ලීම් කිරීම, ස්ථාවර උපදෙස් නිකුත් කිරීම, කාලීන තැන්පතු ආයෝජනය සහ අළුත් කිරීම, නව ගිණුම් විවෘත කිරීම, ආගමික සංවිධානවලට මුදල් පරිත්‍යාග කිරීම, සහ ආදායම් බදු ගෙවීම සිදු කළ හැක. ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ වෙනත් ගිණුම්වලට මෙන්ම තෙවැනි පාර්ශ්වීය ගිණුම්වලට අන්තර්බැංකු අරමුදල් පැවරුමද සිදු කළ හැක. එසේම උපයෝගිතා බිල්පත් ගෙවීම, රක්ෂණ වාරික සහ ණය කාඩ්පත් ශේෂ ගෙවීම ද සිදු කළ හැක.

තොරතුරු තාක්ෂණය

විශ්වාසය තැබිය හැකි මෙන්ම කාර්යක්ෂම තාක්ෂණවේදී පදනමක් පවත්වාගෙන යාමට බැංකුව සැලකිය යුතු සම්පත් ප්‍රමාණයක් වෙන් කරයි. බැංකුවට සිය ක්‍රියාකාරකම් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය තාක්ෂණික පදනම සපයනු වස් බැංකුවේ ජාල යටිතල පහසුකම්, හර බැංකුකරණ පද්ධතිය සහ ආපදා ප්‍රතිසාධන යටිතල පහසුකම් උත්ශ්‍රේණි කිරීම සඳහා 2011 සහ 2012 දී බැංකුව අනුපිළිවෙලින් රු. මිලියන 285.8 ක් සහ රු. මිලියන 369.5 ක් ආයෝජනය කරන ලදී.

ඊට අමතරව, සිය මාස්ටර් කාඩ් ගෝලීය නිෂ්කාශණ කළමනාකරණ මෘදුකාංගය ජාත්‍යන්තර ප්‍රමිති හා අනුකූලවීම සඳහා උත්ශ්‍රේණි කිරීම පිණිස ද බැංකුව ආයෝජනය කරන ලදී. එසේම බැංකුවේ නොවන ණය කාඩ්පත් ගෙවීම් පිළිබඳව කටයුතු කිරීමේදී යොදාගන්නා පද්ධතියද වැඩි දියුණු කරන ලදී. තවද, බැංකුව විසින් සේවය සපයනු ලබන සේවා මධ්‍යස්ථානයන්හිදී RFID චිපය සහිත කාඩ්පත් මඟින් ගනුදෙනු කිරීමේ හැකියාව ඇති කරනු පිණිස ද බැංකුව අබණ්ඩව ආයෝජනය කරන ලදී. එහි පළමු පියවර වූයේ RFID චිපය සහිත කාඩ්පත් මඟින් සුරක්ෂිත ආකාරයකින් ගනුදෙනු කිරීමට විදේශිකයන්ට හැකි වන පරිදි තාක්ෂණය හඳුන්වා දීමයි. RFID චිපය සහිත කාඩ්පත් අනාගතයේදී දේශීය ගනුදෙනුකරුවන්ට හඳුන්වා දීමට බැංකුව සැලසුම් කර තිබේ.

බැංකුවේ ජංගම බැංකුකරණ විසඳුම වන පේ මේට් ද ක්ෂුද්‍ර ගෙවීම් හැසිරවීමට හැකිවන ආකාරයෙන් උත්ශ්‍රේණිගත කරන ලදී. ගනුදෙනුකරුවන්ට පුළුල් සහ අබණ්ඩ සේවාවක් සපයනු පිණිස පේ මේට් බැංකුවේ මූලික බැංකුකරණ පද්ධතිය සමඟ පූර්ණව ඒකාබද්ධ කර වැඩි දියුණු කරන ලදී.

සිය භාණ්ඩාගාර පද්ධතිය සහ නව වත්කම් වගකීම් කළමනාකරණ පද්ධතිය, මුදල් විශුද්ධිකරණ මර්ධන පද්ධතිය, අවදානම් කළමනාකරණ පද්ධතිය, ඉස්ලාමීය බැංකුකරණ පද්ධතිය, විශ්‍රාම වැටුප් අරමුදල් කළමනාකරණ පද්ධතිය සහ කල්බදු මූල්‍ය පද්ධතිය ආදිය ක්‍රියාත්මක කිරීමේ මුල් අදියරයන් උත්ශ්‍රේණි කිරීම් ඇතුළුව සිය තොරතුරු තාක්ෂණ සංවර්ධන ව්‍යාපෘති බැංකුව දිගටම පවත්වාගෙන යන ලදී.

සිය ව්‍යාපාරික අවිනිශ්චිත අවස්ථා ප්‍රතිසාධන සැලැස්මේ කොටසක් ලෙස බැංකුව හදිසි අවස්ථා ප්‍රතිසාධන පදධතියක් භාවිතා කරයි. සියලු තීරණාත්මක මෙහෙයුම් පිළිබිඹු කිරීමට හා අනුපිටපත් කිරීමට සහ හදිසි අවස්ථා තත්ත්වයන්හිදී ප්‍රතිසාධනය සඳහා සූදානම් වීම සහතික කිරීමට මෙම පද්ධතිය බැංකුවට ඉඩ සලසයි. ප්‍රථමක පරිගණක මධ්‍යස්ථානය වෙත ප්‍රවේශ විය නොහැකි හෝ ක්‍රියාත්මක කළ නොහැකි අවස්ථාවන්හිදී අවහිරයකින් තොරව ටෙලර් යන්ත්‍ර භාවිතය සඳහා හැකියාව ලබා දෙන උපස්ථ ටෙලර් යන්ත්‍ර පුවරුවක් සිය හදිසි අවස්ථා ප්‍රතිසාධන මධ්‍යස්ථානයෙන් බැංකුව පවත්වාගෙන යයි. ඊට අමතරව, හදිසි අවස්ථා තත්ත්වයකදී දත්ත අහිමි වීම අවම කරමින් බැංකුවේ ආයතනික මූලස්ථානය සහ බැංකුවේ ව්‍යාපාරික ප්‍රතිසාධන දත්ත මධ්‍යස්ථානය අතර මාර්ගගත තැටි අනුපිටපත් කිරීමේ පද්ධතියක් බැංකුව භාවිතා කරන අතර ඒ අනුව බැංකුවේ තීරණාත්මකව වැදගත් සියලු භාවිතයන් හදිසි ආපදාවකින් පසුව පැය තුනක් ඇතුළත නැවත මාර්ගගත කිරීමේ හැකියාව

බැංකුවේ ගනුදෙනුකරුවන්ට අන්තර්ජාලය ඔස්සේ ගිණුම් ශේෂය පරීක්ෂා කර බැලීම, චෙක්පොත් සඳහා ඉල්ලීම් කිරීම, ස්ථාවර උපදෙස් නිකුත් කිරීම, කාලීන තැන්පතු වල ආයෝජනය සහ අළුත් කිරීම, නව ගිණුම් විවෘත කිරීම, ආගමික සංවිධානවලට මුදල් පරිත්‍යාග කිරීම, සහ ආදායම් බදු ගෙවීම සිදු කළ හැක.

බැංකුව සතු වේ. මාර්ගගත තැටි අනුපිටපත් කිරීමේ පද්ධතිය හැරුණු විට වඩා සෙමින් ක්‍රියා කරන සම්ප්‍රදායික පට පාදක උපස්ථ යාන්ත්‍රණ ප්‍රතිස්ථාපනය කිරීමට බැංකුව අතථ්‍ය පට පද්ධතියක් භාවිතා කරයි.

සේවා තවදුරටත් වැඩි දියුණු කිරීමේ කොටසක් ලෙස අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල ලිපි ලේඛන දැන් විද්‍යුත් ස්වරූපයෙන් ඇති අතර අයිපෑඩ්ස් ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය වීවා වෙත ප්‍රවේශ වන අතර අධ්‍යක්ෂ මණ්ඩල පරිපාටීන් සඳහා කඩදාසි භාවිතා කිරීමක් සිදු නොවේ.

ඊළඟ අදියර වනුයේ වත්කම් වගකීම් සමාලෝචන රැස්වීම් සහ ණය සමාලෝචන රැස්වීම් බදු සියලු කළමනාකරණ රැස්වීම් ස්වයංක්‍රීයකරණය කිරීමයි.

2012 දී ශාඛා ටෙලර් මුහුණත සහ පද්ධතිය නවතම විශේෂාංග යොදා උත්ශ්‍රේණි කරනු ලැබූ අතර එමඟින් ටෙලර් සේවාවේ වේගය සහ ඵලදායිතාව ඉහළ නංවනු ලැබීය.

පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්

ලංකා බැංකු සමූහ මව් සමාගම වන ලංකා බැංකුව සහ පරිපාලිත සමාගම් 13කින් සහ ආශ්‍රිත සමාගම් පහකින් සමන්විත වේ. කණ්ඩායම් ව්‍යුහය සහ මව් සමාගම මත ඒවායේ රඳා පැවැත්ම පහත පෙන්නුම් කෙරේ.



2012 දෙසැම්බර් 31 දිනට පරිපාලිත හා ආශ්‍රිත සමාගම් එක්ව ලංකා බැංකු සමූහයේ වත්කම් සඳහා 3% ද, ආදායම සඳහා 5% කින් ද දායක විය. සී/ස ලංකා බැංකුව (යු කේ) සමාගම සහ සී/ස එම්.බී. එස්. එල් සේවින්ස් බෑන්ක් සමාගම (පරිපාලිත), සී/ස සදර්න් ඩිවලොප්මන්ට් ෆයිනෑන්ෂල් කම්පැනි. සහ සී/ස ලංකා සෙකියුරිටීස් (පෞද්ගලික) සමාගම (ආශ්‍රිත) යන සමාගම් හතර හැරුණු විට අනෙකුත් සියලු පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් ලාභ ලබන ආයෝජන විය. ලාභ ලබන ආයෝජන බොහොමයක් ලාභාංශ ප්‍රකාශයට පත් කළ අතර ඒවායේ සාමූහික එකතුව රු. මිලියන 357 ක් විය.

චාර්ෂික ප්‍රගතිය 2012 රු. මිලියන

	එම් බී එස් එල්	පී ඩී එල්	එම් සී එස් එල්	සීලීස්	පී ඩී එම් එල්	බී ඔ සී ට්‍රැවල්ස්	එච් සී එල්	එච් එච් එල්	එම් එස් එස්	බී ඔ සී යූ කේ	එම් බී එස් එල් ඉන්ෂුවරන්ස්	කොළඳෙණිය හයිඩ්‍රොපවර්	එම් බී එස් එල් සේවින්ස්
මුළු ආදායම	1,863	655	1,268	318	207	155	311	95	1	378	1,056	61	344
බදු පෙර ලාභය	212	443	152	16	86	48	53	0	1	(63)	12	33	(138)
කොටස් හිමි වටිනාකම	2,754	2,882	666	228	1,321	124	215	4	8	2,955	401	247	101
ආයෝජන වටිනාකම	2,123	740	22	110	1,010	3	101	-	1	2,684	-	-	-
ලාභාංශ	122	154	10	6	10	5	20	-	0.5	-	-	-	-
ආදායම් වර්ධනය	34%	5%	33%	17%	8%	17%	11%	17%	14%	16%	69%	100%	-6%
ලාභ වර්ධනය	-50%	5%	20%	226%	10%	76%	27%	-89%	15%	10%	67%	2457%	-109%
වත්කම් වර්ධනය	21%	-3%	18%	5%	5%	31%	33%	31%	0%	33%	33%	17%	-3%
කොටස් හිමියන්ගේ වටිනාකම වර්ධනය	-2%	-4%	20%	1%	1%	45%	48%	-1%	5%	44%	6%	9688%	-16%
හිමිකම (%)	72.14	93.16	85.79	55.00	100.00	100.00	99.99	100.00	100.00	100.00	56.28	93.16	54.25
ඵලදාව	4%	5%	2%	3%	1%	5%	11%	0%	6%	0%	0%	0%	0%

* 2011 දෙසැම්බර් 31 දිනට සාපේක්ෂව වර්ධනය

** ලාභාංශ / කොටස් හිමියන්ගේ වටිනාකම

පෙරමග සුභ ලකුණු

ජාතික ආර්ථිකයට සහ බැංකු කර්මාන්තයට
අභියෝගාත්මක කාලපරිච්ඡේදයක් තුළ ජාතියේ
මහා පහන් ටැඹ ලෙස වගකීම් ඉටුකරමින් පෙරටම.

අවදානම්
කළමනාකරණය

සියලුම ව්‍යාපාර කටයුතුවල සහ බැංකුව ක්‍රියාත්මක වන පරිසරයේ අවදානම පවතී. බැංකුවේ සාමූහික අවදානම් කළමනාකරණ හැකියාව සහ නිපුනත්වය, උපායමාර්ගික ප්‍රමුඛත්වයන් සාර්ථක ලෙස ක්‍රියාත්මක කිරීමට උපකාරී වෙමින්, නිරතුරුවම වෙනස් වන පරිසරයට ප්‍රතිචාරී වූ තිරසාර හා දෘඪතර ව්‍යාපාරයක් වර්ධනය කර ගැනීමේ හැකියාව ලබා දෙයි. 2012 වර්ෂයේදී මෙම බැංකුව අවදානම් අභිරුචි රාමුව ඇතුළත සුපරීක්ෂාකාරී ආකාරයකින් අවදානම් අනුමාන කෙරෙන බවට වග බලා ගනිමින් සුවිශේෂී වර්ධනයක් අත් කර ගෙන ඇත.

උපායමාර්ගය, කළමනාකරණ තීරණ සහ අවදානම් අභිරුචිය අතර අන්තර්-සම්බන්ධය

උපායමාර්ගික පරමාර්ථ සහ අරමුණු නියම කිරීම → උපායමාර්ග සකස් කිරීම → මෙහෙයුම්, අනුකූලතා හා වාර්තාකරණ අරමුණු ස්ථාපනය කිරීම → අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාළ අවදානම් කළමනාකරණය කළ යුතු ආකාරය පිළිබඳ තීරණ ගැනීම

උපායමාර්ග, අරමුණු හා අවදානම් කළමනාකරණය කළ යුතු ආකාරය නියම කිරීමේදී අවදානම් අභිරුචිය සලකා බලයි

පාලන ව්‍යුහය

බැංකුවේ අවදානම් කළමනාකරණ පාලන ව්‍යුහය ඇරඹෙනුයේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අධීක්ෂණය ඇතිවය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සමස්ත අවදානම් කළමනාකරණ රාමුව ස්ථාපනය කර ඇති අතර, එම රාමුව අවදානම් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, නිරීක්ෂණය කිරීම සහ ඒවායේ ඵලයන් අවම කිරීම සඳහා වූ ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි හරහා, උපායමාර්ගික දිශානතිය සකස් කරයි. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC) අධ්‍යක්ෂ මණ්ඩලයට අවදානම් කළමනාකරණය පිළිබඳ රාජකාරී ඉටු කිරීමෙහිලා උපකාරී වෙයි.

බැංකුවේ අවදානම් පාලනය ආරක්ෂක ක්‍රම තුනක් මත පදනම් වී ඇති අතර එමගින් වගවීම, වගකීම, විනිවිදභාවය හා ස්වාධීන වාර්තාකරණය ඇති කර ගත යුතු බවට නියම කෙරේ.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව (IRMC)

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි ප්‍රධාන කාර්යය වන්නේ අවදානම් කළමනාකරණ හා අනුකූලන කර්තව්‍යයන් හි ක්‍රියාකාරිත්වය හා සඵලදායිත්වය සම්බන්ධ සිය අධීක්ෂණ වගකීම් ඉටු කිරීමෙහිලා අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය වීමයි. මෙම කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත් කරනු ලබන අතර, එයට අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්, මහා කළමනාකාරතුමා සහ ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) ඇතුළත් ය.

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව පහත සඳහන් රාජකාරී ඉටු කරයි.

- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්ණය කරනු ලබන අවදානම් අභිරුචියේ සන්දර්භය ඇතුළත ව්‍යාපාර කටයුතුවල අවදානම් ස්වරූපය සහ අවදානම් කළමනාකරණය අධීක්ෂණය කිරීම
- අවදානම් අභිරුචිය සහ යම් විශේෂිත අවදානම් හෝ අවදානම් කළමනාකරණ පිළිවෙත් සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම
- බැංකුව මුහුණ පාන බැරෑරුම් අවදානම්වල ඵලය අවම කිරීම සඳහා වූ උපායමාර්ගික සැලසුම් සමාලෝචනය කිරීම
- අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීම හා සමාලෝචනය කිරීම පිළිබඳව සහ අභ්‍යන්තර අනුකූලතා හා පාලන පද්ධති පිළිබඳව අධීක්ෂණය කිරීම
- අවදානම් සවිඥානකත්වය පදනම් වූ සංස්කෘතියක් පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීම සහ අවදානම සහ ප්‍රතිලාභය අතර සමතුලිතතාවය සාක්ෂාත් කර ගැනීම.



විධායක මට්ටමේදී, ප්‍රධාන අවදානම් නිලධාරී (CRO) විසින් වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුව (ALCO), මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව (ORMEC), තොරතුරු තාක්ෂණ නියමු කමිටුව (ITSC) ව්‍යාපාරික අවිච්ඡින්නතා කළමනාකරණ නියමු කමිටුව (BCMSC), ආයෝජන කමිටුව (IC) ව්‍යාජ ලෙස සකස් කළ චෙක්පත් හා වංචා කමිටුව (FCFC) පූර්ව ප්‍රධානිත දේපළ කමිටුව (FPC) සහ අක්‍රීය අත්තිකාරම් කමිටුව (NPAC) වැනි, බැංකුව නිරාවරණය වන විවිධ අවදානම් කළමනාකරණය කිරීමෙහි නියැළී සිටින කමිටුවල සහාය ඇතිව අවදානම අධීක්ෂණය කරනු ලැබේ.

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශයේ (IIRMD) ප්‍රධානත්වය ප්‍රධාන අවදානම් නිලධාරී විසින් දරනු ලැබේ. ව්‍යාපාරය තුළ ඇති විශේෂිත අවදානම් ගැටළු මත අවධානය යොමු කරනු පිණිස සහ ජාත්‍යන්තර විශිෂ්ටතම පිළිවෙත් හා නියාමක මාර්ගෝපදේශ ක්‍රියාත්මක කරනු පිණිස, එය උපායමාර්ගික ව්‍යාපාර ඒකකවලින් (SBUs) ස්වායත්තව, වෙනම දෙපාර්තමේන්තුවක් ලෙස ක්‍රියාත්මක වේ. අවදානම් කළමනාකරණයෙහි ප්‍රගමන ප්‍රවේශයන් පිලිපදිනු පිණිස, ක්‍රියාමාර්ග ආරම්භ කිරීමේ ක්‍රියාවලියට බැංකුව අවතීර්ණ වී සිටී.

ණය අවදානම

ණයගැතියකු සිය වගකීම් භාරය ඉෂ්ට කිරීමට අකමැති වීමෙන් හෝ එබදු වගකීම්භාරයක් ඉෂ්ට කිරීමට ඇති හැකියාව දුර්වල වීමෙන් බැංකුවට ආර්ථික හානියක් ඇති වීමට ඇති විභවය වෙතින් ණය අවදානම පැන නගී. ප්‍රධාන වශයෙන් ණය දීමේ මෙහෙයුම්වලින් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ඇති වන ණය අවදානම බැංකුවේ සමස්ත බර තැබූ වත්කම්වලින් 80 % ක ප්‍රමාණයක් වේ. ඒ අනුව ණය අවදානම සඵලදායී ලෙස කළමනාකරණය කිරීම අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ අත්‍යාවශ්‍ය සංරචකයක් වන අතරම එය බැංකුවේ දිගු කාලීන සාර්ථකත්වය සඳහා තීරණාත්මක වන බව හඳුනා ගෙන ඇත.

ණය අවදානම් නිරාවරණයන් පිළිගත හැකි පරාමිතීන් ඇතුළත පවත්වා ගනිමින් අවදානමට සරිලන පරිදි සකස් කරන ලද ඉපැයුම් අනුපාතිකය උපරිම කිරීම බැංකුවේ ණය අවදානම් කළමනාකරණයේ පරමාර්ථයයි.

ණය අවදානම් කළමනාකරණයේ සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඇති අතර, තනි පුද්ගල ණය සහ ණය කළඹ යන මට්ටම් දෙකෙහිදීම ණය අවදානම් කළමනාකරණය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි යොදා ඇත.

ණය අවදානම අධීක්ෂණය සඳහා වගකීම ණය කමිටුවට පවරා ඇත. එම කමිටුව සාමාන්‍යයෙන් සතියකට වරක් රැස් වෙයි. කෙසේ වුවද, විභව්‍ය අවදානම් ආශ්‍රිත කාරණාවන් සඳහා මීට වඩා වැඩි රැස්වීම් වාර ගණනක් පැවැත්වීමට ඉඩ තිබේ. ණය කමිටුව:-

- ව්‍යවස්ථාපිත හා නියාමන නියමයන් පිළිපදින බවට වග බලා ගනිමින්, ණය පහසුකම් ආශ්‍රිත ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි සැකසීම, සමාලෝචනය හා ප්‍රතිශෝධනය සිදු කරයි.
- පවරා ඇති බලතල සීමාව දක්වා ණය මුදල් ලබා දීම අනුමත කිරීම හෝ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත උචිත නිර්දේශ ඉදිරිපත් කිරීම සිදු කරයි.
- ණය සහ සේවාවන්හි ගුණාත්මකතාව නිරීක්ෂණය කිරීමේ හා තහවුරු කිරීමේ අදහසින් කලින් කලට ණය සීමාවන් සමාලෝචනය කරයි.
- අක්‍රීය අත්තිකාරම් සම්බන්ධයෙන් ණය කළඹ නිරාවරණයන් හා සංකේන්ද්‍රණ අවදානම සහ ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග නිරීක්ෂණය, සමාලෝචනය හා අලුත් කිරීම සිදු කරයි.

බැංකුව තමන් වැඩිපුර කැමති ණයගැතියන් වර්ග හා ඔවුන්ගේ ලක්ෂණ නිර්වචනය කරනු පිණිස විශේෂිත ණය නිර්නායකයන් ස්ථාපනය කර ඇත. මෙම නිර්ණායක වලට කර්මාන්තයේ සමානයින්ට සාපේක්ෂව ව්‍යාපාරික කාර්යසාධන වාර්තාව, මූලික මූල්‍ය දර්ශක, (තිබේ නම්) ඉලක්ක ණයගැතියන්ගේ අවදානම් ශ්‍රේණිය සහ බැංකුව ණය දීමට සූදානම් නියමයන් හා කොන්දේසි ඇතුළත් වනු ඇත.

තනි ණයගැතියන්, එකිනෙකාට සම්බන්ධ ණයගැති කණ්ඩායම්, කර්මාන්ත සහ භූගෝලීය කලාප සඳහා වූ නිරාවරණ සීමාවන් බැංකුවේ අවදානම් රුචිකත්ව සීමාවන් අනුව ස්ථාපනය කර ඇත.

නව ණය මුදල් අනුමත කිරීම හෝ පවතින ණය මුදල් අලුත් කිරීම සඳහා වූ මනාව ස්ථාපිත ක්‍රියාවලීන් බැංකුව සතුව ඇති අතර, ඒවාට පහත දැක්වෙන සංරචකයන් ඇතුළත්ය.

ණය ගැනුම්කරුගේ, ආශ්‍රිත කර්මාන්තයේ සහ සාර්ව ආර්ථික සාධකවල ණය තක්සේරුව

ණය ගනුදෙනු ව්‍යුහගත කිරීම

නිසි අධිකාරී බලය සහිතව කළමනාකාරිත්වය විසින් අනුමත කිරීම

නෛතික ලිපිලේඛන සම්පූර්ණ කිරීම

ණය මුදල ලබා දීම

තනි පුද්ගල ණය මුදල්වල තත්ත්වය නිරීක්ෂණය කිරීම සඳහා වූ පද්ධතියක් පිහිටුවා ඇති අතර, ගැටළු ඇති කිරීමේ විභවය සහිත ණය මුදල් හඳුනා ගෙන, අවශ්‍ය වන පරිදි හා අවශ්‍ය අවස්ථාවේදී ඒ පිළිබඳව අදාළ බලධාරීන් වෙත වාර්තා කරනු ලැබේ.

බැංකුවේ ණය ප්‍රතිපත්තිවලට අනුකූලව ණය මුදල් ලබා දෙන්නේද යන්න තහවුරු කර ගැනීමටත්, වත්කම්වල ගුණාත්මකතාව පිළිබඳ ස්වාධීන විනිශ්චයක් ලබා දීමටත් බැංකුව නිතිපතා ණය සමාලෝචන සිදු කරයි.

පරිපූර්ණ සමාලෝචනයක් යටතේ පිරිසෙයින් වර්ෂයකට වරක් සිදු කරනු ලබන අතර, ''සෝදිසි ලැයිස්තු'' නිරාවරණයන් සඳහා වඩාත් සුලභ යාවත්කාලීන කිරීම් සිදු කෙරේ. බැංකුවේ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මගින්, ''සෝදිසි-ලැයිස්තු'' ණය පරිපාලනය කිරීම පිළිබඳව විස්තර කෙරේ.

ණය ගැනුම්කරුවාගේ ණය ශක්තිය පිළිබඳව බැංකුවේ තක්සේරුව පිළිබිඹු කරනු පිණිස සියලුම ණය නිරාවරණයන් නිසි ලෙස හා කඩිනමින් ශ්‍රේණිගත කරනු ලැබේ. ශ්‍රේණිගත කිරීම සඳහා බැංකුව නියාමන මාර්ගෝපදේශයන්ට අනුකූල වන උචිත නිර්ණායක භාවිතා කරයි.

අභ්‍යන්තර අවදානම් ශ්‍රේණි කිරීමේ පද්ධතියක් ණය ගැනුම්කරුවන්ට ඔවුන්ගේ ස්වරූපය සහ අලාභයක් ඇති වීමේ ඉඩකඩ පිළිබිඹු කරන ණය අවදානම් ශ්‍රේණියක් ලබා දෙයි. එමෙන්ම එය සමස්ත අවදානම් ස්වරූපය පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීමේ හැකියාව ඇති කරයි.

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය (IIRMD) විසින් සංවර්ධනය කරන ලද අභ්‍යන්තර අවදානම් ශ්‍රේණි කිරීමේ පද්ධතිය ආයතනික ණය ගැනුම්කරුවන්ගේ අවදානම් ස්වරූපය ඇගැයීම සිදු කරන අතර, එය සියලුම ණය මුදල් විවිධ අවදානම් ශ්‍රේණිවලට වර්ගීකරණය කරයි. අවදානම් ශ්‍රේණි සිසාරා ණය ගැනුම්කරුවන් පැතිර පවතින ආකාරය පහත සාරාංශ කර තිබේ.

ණය දීම ආරම්භයේදීම අවදානම් ශ්‍රේණි ලබා දෙන අතර, ඒවා යටත් පිරිසෙයින් වාර්ෂිකව යාවත්කාලීන කරනු ලැබේ. කෙසේ වුවද, අහිතකර සිදුවීම් ඇති වන ආකාරයට සහ ඇති වන විට බැංකුව ශ්‍රේණිගත කිරීම් සමාලෝචනය කරයි.

කේවල පාරිභෝගිකයින් වෙත පිරිවැය සළුලදායී හා කාර්යක්ෂම සේවාවක් ලබා දෙනු පිණිස, පාරිභෝගිකයින්ට ණය දීමේදී භාවිතා කෙරෙන ණය ලකුණු ආකෘති, ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් සංවර්ධනය කර තිබේ.

සංකේන්ද්‍රණ අවදානම

මෙම බැංකුව සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කරනු පිණිස ණය කළඹ පදනම්න් ණය අවදානම නිරීක්ෂණය කරයි. ණය කළඹවල සංකේන්ද්‍රණ අවදානම පැන නගිනුයේ තනි ණය ගැනුම්කරුවන් (කේවල/නාම සංකේන්ද්‍රණය) හෝ කර්මාන්ත හා භූගෝලීය ප්‍රදේශ (ආංශික සංකේන්ද්‍රණය) අතර ණය හා අත්තිකාරම් බෙදී යාමේ අසමානතාවන් හේතුවෙනි.

බැංකුවේ ණය කළඹ විවිධ කර්මාන්ත සහ භූගෝලීය කලාප සිසාරා විවිධාංගීකරණය වී තිබේ.

අවදානම් ශ්‍රේණිවලට අනුව ණය ගැනුම්කරුවන්ගේ පැතිරීම (%)



භූගෝලීය සංකේන්ද්‍රණය



කර්මාන්ත සංකේන්ද්‍රණය



මෙම රූප සටහන් දෙකෙහි කැපී පෙනෙන සංකේන්ද්‍රණයක් පෙන්නුම් කරන්නේ රජය හා රජය සතු ආයතනවලට නිරාවරණය වීමයි.

සංකේන්ද්‍රණ අවදානම පිළිගත හැකි මට්ටමක පවත්වා ගෙන යනු පිණිස බැංකුව උචිත සීමාවන් පනවා ඇති අතර, සමාලෝචනය කිරීම සඳහා සැලකිය යුතු සංකේන්ද්‍රණයන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය වෙත වාර්තා කරනු ලැබේ.

වත්කම්වල ගුණාත්මකභාවය

අහිතකර කාලගුණික තත්ත්වයන්, මන්දගාමී ආර්ථික වර්ධන වේගය හා පොළී අනුපාතිකයේ වැඩි වීම මධ්‍යයේ වුවද, බැංකුව සිය අක්‍රීය වත්කම් මට්ටම බැංකුවේ අවදානම් අභිරුචිය ඇතුළතට සීමා කර ගැනීමට සමත් විය.

අක්‍රිය අත්තිකාරම්



අවදානම් පාදක මිලකරණය

බැංකුව විසින් අනුගමනය කරනු ලබන අවදානම් පාදක මිල නියම කිරීමේ ක්‍රමවේදය තුළ අවදානම හා ප්‍රතිලාභය අතර සම්බන්ධතාව මත අවශ්‍ය අවධාරණය යොදනු ලැබේ. මෙමගින් වත්කම්වල මිල නියම කිරීමේදී ස්ථායී බව ප්‍රවර්ධනය කිරීම හා නිසි ලෙස හැසිරවීම සිදු කෙරේ.

ණය අවදානම් කළමනාකරණය සහ මැනීම පිළිබඳ වැඩිදුර තොරතුරු මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් අංක 59 හි ඇතුළත් කර ඇත.

වෙළඳපල අවදානම

වෙළඳපල අවදානම යනු මූල්‍ය උපකරණ සම්බන්ධයෙන් බැංකුවේ වත්කම් ස්ථාපිතයන් තුළ, වෙළඳපල විචල්‍යයන් හි වෙනස් වීම් මඟින් ඇති කරනු ලබන වෙළඳපල වටිනාකමේ අහිතකර වෙනස්කම්වලට නිරාවරණය වීමයි. බැංකුව විදේශ විනිමය, ස්කන්ධය, ණය සුරුකුම්පත් හා ඉතා සුළු වශයෙන් රත්‍රන් වල වත්කම් ස්ථාපිතයන් පවත්වා ගෙන යයි. ප්‍රධාන අවදානම් මූලාශ්‍රයන් වන්නේ විදේශ විනිමය හුවමාරු අනුපාතිකයන්, ස්කන්ධ මිලගණන්, පොළී අනුපාතිකයන් හා භාණ්ඩවල මිලගණන් ය.

වෙළඳපල අවදානම් කළමනාකරණය වනාහි බැංකුව මුළුල්ලේම වෙළඳපල අවදානම් හඳුනා ගනු පිණිස හා නිරීක්ෂණය කරනු පිණිස සහ වෙළඳපල අවදානම් ප්‍රතිපත්ති හා කාර්යපටිපාටි නිර්වචනය කරනු පිණිස ව්‍යාපාරික අංශ සමග සමීප හවුල්කාරිත්වයකින් කටයුතු කරන ස්වාධීන ක්‍රියාකාරිත්වයකි. බැංකු සිය ගනුදෙනු කරන හා නොකරන ණය කළඹ පිළිබඳ අවදානම් කළමනාකරණය කරනුයේ වෙළඳපල සීමාවන්, අවදානම් අභිරුචිකත්ව සීමාවන්, අවදානමෙහි අගය පිළිබඳ සීමාවන්, ආතති පරීක්ෂාව සහ සංවේදීතා විශ්ලේෂණය ඇතුළත් වෙළඳපල අවදානම් කළමනාකරණ රාමුවක් හරහාය.

මෙම බැංකුවේ වෙළඳපල අවදානම් කළමනාකරණ අරමුණු වන්නේ:

- බැංකුවේ අවදානම් අභිරුචියට පරිබාහිර පිළිගත නොහැකි අලාභයන්ට බැංකුව නිරාවරණය කිරීමෙන් තොරව අවදානම් - ප්‍රතිලාභ සම්බන්ධතාව වර්ධනය කරන බවට වග බලා ගැනීම
- කාර්යක්ෂම ලෙස අවදානම් - ප්‍රතිලාභ පිළිබඳ තීරණ ගැනීම් සඳහා පහසුකම් සැලැස්වීම
- මෙහෙයුම් කාර්යසාධනයෙහි විචලතාවය අඩු කිරීම
- දෘඩතර මිනුම්, වාර්තාකරණය හා අධීක්ෂණය හරහා වෙළඳපල අවදානම අවබෝධ කර ගැනීම හා පාලනය කිරීම
- වෙළඳපල අවදානම සඳහා වන ප්‍රාග්ධන වැය විචක්ෂණීය මට්ටම් ඇතුළත පිහිටන බවට වග බලා ගැනීම
- ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය, අධ්‍යක්ෂ මණ්ඩලය හා නියාමකයින් වෙනුවෙන් බැංකුවේ වෙළඳපල අවදානම් ස්වරූපය තුළට විනිවිදභාවය ලබා දීම

වෙළඳපල අවදානම් කළමනාකරණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය වෙත පවතී. වෙළඳපල හා ද්‍රවශීලතා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය මඟින් බැංකුවේ වෙළඳපල අවදානම් කළමනාකරණ රාමුව පාලනය කෙරේ.

වෙළඳපල අවදානම මැනීමට හා පාලනය කිරීමට බැංකුව විසින් අනුපූරක තාක්ෂණික ප්‍රවේශයන් මාලාවක් භාවිතා කරනු ලැබේ. ඒවාට අවදානමේදී දෛනික අගය (DVaR), පදනම් අගය මත මිල වෙනස්වීම් (PVBP), සහ කාල හා පීඩ්‍යතා පරීක්ෂාව ඇතුළත් වේ. අවදානමේදී දෛනික අගය වනාහි, එක් ව්‍යාපාර දිනයක් සඳහා වත්මන් තත්ත්වයන් නොවෙනස්ව රඳවා ගැනීම පිණිස, යම් විශ්වාස මට්ටමක් ඇතුළත හිතකාමී නොවන වෙළඳපල සංචලනයන් වෙතින් පැන නැගිය හැකි උපරිම විභව්‍ය අලාභයේ ඇස්තමේන්තුවයි.

අවදානමේදී දෛනික අගය සොයා ගැනීමේදී පහත දේ සැලකිල්ලට ගනු ලැබේ:

- ඓතිහාසික සමාකරණයේදී, අනාගතයේ ඇති විය හැකි වෙළඳපල චලනයන් උත්පාදනය කරනු පිණිස වඩාත් සමීප දින 370 හි අතීත දත්ත භාවිතා කරන නමුත්, අතීතය අනාගතය පිළිබඳ හොඳ දර්ශකයක් නොවීමටද ඉඩ ඇත.
- එක් දින වෙළඳපල දසුන මඟින්, එක් දිනක් ඇතුළත සමාප්ත කළ නොහැකි හෝ අවශෝෂණය කළ නොහැකි වත්කම් ස්ථාපිතයන් හි වෙළඳපල අවදානම පූර්ණ වශයෙන් ග්‍රහණය කර නොගනේ.
- අවදානමේදී දෛනික අගය 99% ක ප්‍රතිශතයෙන් ඔබ්බට විභව්‍ය අවදානම් නොදක්වයි.

අවදානමේදී-අගය ආශ්‍රිත සීමාකාරී බව හඳුනා ගනිමින්, වෙළඳපල විචල්‍යයන්හි තාර්කික, එහෙත් වඩාත් අන්තගාමී, සිදුවීම් හෝ සංචලනයන් මඟින් ණය කළඹ මත ඇති විය හැකි විභව්‍ය බලපෑම ඇගයීම පිණිස බැංකුව ආතති පරීක්ෂාව යොදා ගනිමින්, අවදානමේදී-අගයට ඌනපූරණ එක් කරයි.

නිතිපතා හා අවස්ථානුගත වාර්තා හරහා ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය කළමනාකාරිත්වයේ විවිධ මට්ටම් වෙත වෙළඳපල අවදානම නිරාවරණයන් පිළිබඳව වාර්තා කරයි. දෛනික වෙළඳපල අවදානම් වාර්තාවක් බැංකුවේ වෙළඳපල අවදානම් නිරාවරණයන් සාරාංශ කොට, පෙර නියම කර ඇති නිරාවරණ සීමාවන් සමග විය සංසන්දනය කරයි. මෙම දෛනික වාර්තාව ප්‍රධාන අවදානම්

කළමනාකරණය

නිලධාරී සහ වෙනත් සුදුසු කළමනාකාරවරුන් වෙත සමාලෝචනය සඳහා ඉදිරිපත් කරනු ලැබේ.

පොළී අනුපාතික අවදානම

පොළී අනුපාතික අවදානම වනාහි වෙළඳපල පොළී අනුපාතිකයන්හි වෙනස්කම් මඟින් බැංකුවේ ශුද්ධ පොළී ආදායම මත ඇති වන විභව්‍ය විචලතාවයයි. පොළී අනුපාතිකයන්හි සංචලනයන් මඟින් ශුද්ධ පොළී ආදායමට අහිතකර ලෙස බලපෑම් එල්ල නොවන සේ පොළී අනුපාතික සංවේදිතාව කළමනාකරණය කිරීම බැංකුවේ සමස්ත පරමාර්ථයයි. පොළී අනුපාතික අවදානම මඟින්, බැංකුවේ මූල්‍ය උපකරණ කෙරෙහි වඩාත් සැලකිය යුතු වෙළඳපල අවදානම් නිරාවරණය නිරූපනය කෙරේ. ප්‍රධාන වශයෙන්, බැංකුවේ පොළී අනුපාතිකයට සංවේදී ණය කළඹ රජයේ සුරුකුම්පත් වලින් සමන්විත වේ.

පහත වගුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට රජයේ සුරුකුම්පත් ගනුදෙනු කළඹ කල්පිරීම පිළිබඳ විශ්ලේෂණයක් දැක්වේ.



සතිපතා පදනමින් ගණනය කොට කළමනාකාරිත්වයේ විවිධ මට්ටම් වෙත සන්නිවේදනය කරනු ලබන පොළී අනුපාතික

කාල ප්‍රමාණය	ගනුදෙනු	විකිණීම සඳහා තබා ඇති	කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම්
බිල්පත්	නැත	නැත	0.35
බැඳුම්කර	1.56	4.54	3.93

පාදක අංකයකට මිල අගය (රුපියල්)	ගනුදෙනු	විකිණීම සඳහා තබා ඇති	කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම්
බිල්පත්	නැත	නැත	(2,109,212)
බැඳුම්කර	(1,346,412)	(475,356)	(39,074,987)

අවදානම තක්සේරු කරනු පිණිස, බැංකුව පදනම් අගය මත මිල වෙනස් වීම සහ කාල ප්‍රමාණ ශිල්පක්‍රම භාවිතා කරයි. කාල හා පදනම් අගය මත මිල දැක්වෙන වගුවලින්, 2012 දෙසැම්බර් 31 දිනට පොළී අනුපාතික අවදානමේ තත්ත්වය දැක්වේ.

ද්‍රවශීලතා අවදානම

බැංකුව ද්‍රවශීලතා අවදානම ප්‍රධාන අවදානම්වලින් එකක් ලෙස සලකයි. විශාලතම වත්කම් සමුදායද සහිත රටෙහි විශාලතම වාණිජ බැංකුව වශයෙන්, මෙම බැංකුව ආර්ථිකය තුළ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටු කරයි.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කොට ඇති, බැංකුවේ වත්කම් සහ බැරකම් කළමනාකරණ (ALM) ප්‍රතිපත්තියට අනුකූලව ද්‍රවශීලතාව කළමනාකරණය කිරීමේ වගකීම දරනු ලබන්නේ වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුව (ALCO) විසිනි. වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුවට ප්‍රමුඛ ආයතනික කළමනාකරණ සාමාජිකයින් ඇතුළත් වන අතර, මහා කළමනාකාරවරයා එහි මූලාසනය දරයි. 2012 වර්ෂයේදී වත්කම් සහ බැරකම් කළමනාකරණ කමිටුවේ රැස්වීම් 20 ක් පවත්වන ලද අතර, ද්‍රවශීලතා සහ පොළී අනුපාතික අවදානම කළමනාකරණය කරනු පිණිස වූ වැදගත් තීරණද එහි දී ගනු ලැබීය. බැංකුවේ අරමුදල් සම්පාදක සැලැස්ම මාසිකව සමාලෝචනය කරන ලද අතර, පීඩක ද්‍රවශීලතා වාතාවරණයකට මග පෑදිය හැකි යම් සැලකිය යුතු අපගමනයන් වේ නම්, ඒවා නිවැරදි කරනු පිණිස වූ ප්‍රතිකර්ම යෝජනා කරන ලදී. වත්කම් සහ බැරකම් කළමනාකරණ ඒකකය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය සමග එක්ව බැංකුවේ ලාභදායකත්වය හා ද්‍රවශීලතාව වඩාත් යහපත් කරනු පිණිස ද්‍රවශීලතා සහ පොළී අනුපාතික අවදානම කළමනාකරණය කරයි.

බැංකුව එයට සම්බන්ධ බැංකු හරහා බොහෝ අරමුදල් සම්පාදන මාර්ග පිහිටුවා ඇති අතර, ද්‍රවශීලතා අවශ්‍යතාවන් සපුරා ගනු පිණිස රජයේ බැඳුම්කර වැනි උසස් ගණයේ ද්‍රවශීලතා වත්කම් සෑම විටම පවත්වා ගෙන යයි. විශේෂිත මෙන්ම අන්තගාමී සිදුවීම්වල ඵලයන් නිර්ණය කරනු පිණිස, නියමිත කාලයකට වරක් වැඩිදුර පීඩ්‍යතා පරීක්ෂණ පවත්වනු ලැබේ.

පරිණති විශ්ලේෂණය මෙම බැංකුවට වත්කම් හා බැරකම් පැතිකඩෙහි නොගැලපීම් හඳුනා ගැනීමට උපකාර කරන අතර, එමඟින් අරමුදල් සම්පාදන තීරණ ගැනීමට හැකියාව ඇති කරයි. මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් අංක 54 තුළ 2012 දෙසැම්බර් 31 දිනට පරිණත පරතර විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. ද්‍රවශීලතා අවදානම විචක්ෂණ ලෙස කළමනාකරණය කිරීම සඳහා මුඛ්‍ය ද්‍රවශීලතා අනුපාතයන්ද නිරීක්ෂණය කරනු ලැබේ.

විදේශ විනිමය අවදානමේ අගය (රුපියල්)			
31.12.2012	විවිධාංගීකරණය නොකළ	විවිධාංගීකරණය කළ	විවිධාංගීකරණ ඵලය
දෛනික අවදානමේ අගය	529,010	496,389	32,621
දස-දින අවදානමේ අගය	1,672,877	1,569,720	103,157

විදේශ විනිමය අවදානම

බැංකුවේ විදේශ විනිමය ස්ථාපිතයන්හි වටිනාකමට බලපාන විදේශ විනිමය අනුපාතිකයන්හි අහිතකර සංචලනයන් කෙරෙන් පැන නගින, ඉපැයීම් හා මූලධනය කෙරෙහි වර්තමානයේ හෝ අනාගතයේ ඇති විය හැකි අවදානම විදේශ විනිමය අවදානම වෙයි. බැංකුව විදේශ විනිමය ස්ථාපිතයන් පවත්වා ගෙන යනුයේ ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාර කටයුතුවලට පහසුකම් සැලැස්වීම සඳහා විනා, ඉදිරි කාලයේ ප්‍රතිලාභ ලැබීමේ කාර්යය සඳහා නොවේ. බැංකුව ශුද්ධ මුදල් ස්ථාපිතයන් මගහැරීමට ඉලක්ක කරන අතර, සාමාන්‍ය වශයෙන් 2012 මුළුල්ලේ පහළ ස්ථාපිතයන් පවත්වා ගෙන ගොස් ඇත.

බැංකුව ප්‍රතිපක්ෂ සීමාවන්, මුදල් වෙළඳපල සීමාවන්, අවදානම් රුචිකත්ව සීමාවන් හා අවදානමේදී අගය මිනුම් හරහා විදේශ විනිමය අවදානම නිරීක්ෂණය කරයි. කවර හෝ සීමා ඉක්මවන ව්‍යතිරේඛයන් පිළිබඳව නිසි පරිදි වාර්තා කෙරෙන බවටත්, නිසි ඉහළ බලධාරීන් විසින් අනුමත කරනු ලබන බවටත් ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය සහතික වෙයි.

විදේශ විනිමය අවදානමේදී අගය වගුවෙන්, වර්ෂය අවසානයේදී 99% ක විශ්වාසනීයතා විරාමයක් යටතේ, දෛනික අවදානමේදී - අගයෙහි තත්ත්වය දැක්වේ.

ස්කන්ධ අවදානම

ස්කන්ධ අවදානම් පැන නගිනුයේ, බැංකුවේ මූල්‍ය ස්ථාවරයට බලපාන සේ සුරුකුම්පත්වල මිලගණන් වෙනස් වීම හේතුවෙනි. බැංකුවට ප්‍රාථමික මෙන්ම ද්විතියික වෙළඳපල තුළ ස්කන්ධය නිරාවරණයන් තිබෙන අතර, ඒවා සිදු කරනු ලබන්නේ එහි ආයෝජන ප්‍රතිපත්තියට අනුකූලවය. සමස්ත සීමාව ඇතුළත, බැංකුවේ වෙළඳපල නිරාවරණයන් මත මෙන්ම, තනි සුරුකුම්පත් කෙරෙහි නිරාවරණයන් මත, ආයෝජන ප්‍රතිපත්තිය මගින් විචක්ෂණ සීමාවන් පැනවේ. එමෙන්ම, උපරිම ඉහළ සීමාවක් මඟින් කර්මාන්ත-විශේෂිත ආයෝජන කළඹෙහි සමස්ත විශාලත්වය සීමා කිරීම මඟින් මෙන්ම, වෙනත් විවිධ සීමාකාරී වූ කර්මාන්ත හා ගනුදෙනුකාර සංකේන්ද්‍රණ සීමාවන් පැනවීම මඟින්, බැංකුවෙහි ආයෝජන ප්‍රතිපත්තිය ස්කන්ධ කළඹෙහි සංකේන්ද්‍රණ අවදානම කළමනාකරණය කරයි.

බැංකුව විසින් දරනු ලබන ස්කන්ධ සුරුකුම්පත් වල වටිනාකම වෙළඳපල අගය මත අගය කිරීමේ පදනමින් දිනපතා තක්සේරු කරනු ලැබේ. ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් අවදානමේදී-අගය ගණනය කිරීම්වලට අතිරේකව, බැංකුවේ ස්කන්ධ කළඹේ වටිනාකම සහ අලාභ සීමාවන් දෛනික පදනමින් නිරීක්ෂණය කරනු ලැබේ.

ආංශික වෙළඳ කොටස් කළඹ



මෙහෙයුම් අවදානම

මෙහෙයුම් අවදානම යනු අප්‍රමාණවත් හෝ අසාර්ථක වූ අභ්‍යන්තර ක්‍රියාවලි, පුද්ගලයින් හා පද්ධති හෝ බාහිර සිදුවීම් හේතුවෙන් ඇති වන අලාභයේ අවදානමයි. මෙයට නෛතික අවදානම ඇතුළත් වන නමුත්, උපායමාර්ගික අවදානම හා කීර්තිනාම අලාභය ඇතුළත් නොවේ.

මෙහෙයුම් අවදානම් කළමනාකරණයේ (ORM) ප්‍රාථමික අරමුණ වන්නේ ව්‍යාපාරික හා උපායමාර්ගික පරමාර්ථයන් සාක්ෂාත් කර ගැනීම සඳහා ඉඩ සලසන අතරේම, මෙහෙයුම අවදානම් හඳුනා ගනු ලබන බවට, තක්සේරු කරනු ලබන බවට හා ඒවායේ හානි හෝ ඵල අවම කරනු ලබන බවට වග බලා ගැනීමයි.

බැංකුවේ ප්‍රමුඛතම අභිලාෂයන් සඵලදායී හා කාර්යක්ෂම ලෙස ඉටු කරනු පිණිස, බැංකුව සතුව පරිපූර්ණ මෙහෙයුම් අවදානම් කළමනාකරණ රාමුවක් ඇති අතර, එය පහත දේ සාක්ෂාත් වන බවට වග බලා ගනී:

ස්කන්ධ අවදානමේදී අගයට එරෙහිව වෙළඳපල තක්සේරු මත ලාභ/අලාභ



විවිධාංගීකරණයේ ප්‍රතිලාභ ග්‍රහණය කර ගනු පිණිස, හොඳින් විවිධාංගීකරණය කරන ලද වෙළඳ ආයෝජන කළඹක් පවත්වා ගැනීම කෙරෙහි බැංකුව ඇපකැප වී සිටී. පහත වගුවෙන් 2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ වෙළඳ ස්කන්ධ කළඹෙහි නිරාවරණය වූ ආකාරය ආංශික පදනමින් දැක්වේ.

ස්කන්ධ අවදානමට අදාළ අවදානම් අගය දෛනිකව මිනුම් තබන අතර එය අදාළ කළමනාකාරීත්ව මට්ටම් වලට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. 2012 වර්ෂයේ දෛනික ස්කන්ධ අවදානම් අගයෙහි වර්ධනය හා වෙළඳාම සඳහා තබාගත් ස්කන්ධ ආයෝජන කළඹ වෙළඳපල අගය මත අගය කිරීමෙන් ලද ලාභ/අලාභ ඉහත ප්‍රස්ථාරය මඟින් දැක්වේ.

- සියලුම කාර්යමණ්ඩල සාමාජිකයින් විසින් සිය වේදිනෙදා රාජකාරී වැඩවල ගැබී වී ඇති නෛසර්ගික මෙහෙයුම් අවදානම කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වගකීම හා අයිතිය භාර ගැනීම
- බැංකුව සිසාරා අවදානම පිළිබඳව සවිඥානක සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම හා මුල්බැස්වීම
- මෙහෙයුම් අවදානම හඳුනා ගැනීම, තක්සේරු කිරීම, හානි අවම කිරීම, නිරීක්ෂණය හා වාර්තා කිරීම සම්බන්ධයෙන් අභික්‍රියාකාරී (ඉදිරි බලන සුළු) හා ස්ථායී වීම

අවදානම්

කළමනාකරණය

මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති මගින් බැංකුව සඳහා වූ මූලධර්ම, අවම ප්‍රමිති හා මෙහෙයුම් අවදානම් කළමනාකරණ මෙවලම් නිර්වචනය කෙරේ.

සඵලදායී ලෙස මෙහෙයුම් අවදානම් කළමනාකරණය කරනු පිණිස, අවදානම් පිළිබඳ සංස්කෘතියක් ප්‍රගුණ කරවීම ඉහළ වැදගත්කමකින් යුක්ත කාර්යයක් ලෙස බැංකුව සලකයි. බැංකුවේ සියලුම මට්ටම්වල තැනැත්තන් නෛසර්ගික අවදානම් පිළිබඳව දැනුවත්ව සිටින අතරම, අනුමත අවදානම් රුචිකත්ව සීමාව ඇතුළත ඒවා කළමනාකරණය කර ගැනීම සඳහා කැපවන විට, ශක්තිමත් මෙහෙයුම් අවදානම් සංස්කෘතියක් ඇතැයි පෙනේ.

බැංකුව මෙහෙයුම් අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම හරහා අවදානමට සවිඥානක පරිසරයක් ඇති කරයි. ඒ කේසේදයත්;

- විදිනෙදා ව්‍යාපාරික තීරණ තුළට මෙහෙයුම් අවදානම් කළමනාකරණය සඵලදායී ලෙස අන්තර්ග්‍රහණය කරන ලද
- අවදානම හඳුනා ගැනීමේදී හා කළමනාකරණය කිරීමේදී උචිත විනිශ්චය ක්‍රියාවට නැංවීම තුළින් අවදානම් දැනුවත්භාවයට උපකාර වන
- නීතිරීති, රෙගුලාසි, පවරන ලද බලතල සහ වෙනත් අනුකූලතා නියමයන් මත පමණක් නොව, නිවැරදි දේ කිරීම දක්වාද ව්‍යාප්ත වන පරිසරයකි.

මෙම බැංකුව ශිල්පක්‍රම ගණනාවක් භාවිතා කරමින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ උපායමාර්ගය හා සැලසුම්කරණ ක්‍රියාවලිය වෙත දායක වන අවදානම් විශ්ලේෂණ ගණනාවක් සිදු කරයි.

බැංකුවේ අවදානම් තත්ත්වය පිළිබඳ අන්තර්දසුනක් ලබා දිය හැකි සංඛ්‍යා දත්ත සහ/හෝ මානක, බොහෝ විට මූල්‍යමය මානක, ලෙස 'මුඛ්‍ය අවදානම් දර්ශක' (KRI) නිර්වචනය කෙරේ.

බැංකුවට ඉදිරියට ඇති වන ගැටළු කාලෝචිත ආකාරයෙන් හඳුනා ගැනීමට 'මුඛ්‍ය අවදානම් දර්ශක' භාවිතා කෙරේ. එය බැංකුවේ පාලන සංස්කෘතිය මෙන්ම මෙහෙයුම් අවදානම් ස්වරූපය නිරීක්ෂණය කිරීමටත්, අවදානම් හානි අවම කරන ක්‍රියාමාර්ග දියත් කිරීමටත් ඉඩ සලසයි.

'මුඛ්‍ය අවදානම් දර්ශක' වැඩසටහන තුළ, ව්‍යාපාරික පරිසරය අධීක්ෂණයට මග පාදමින් සහ ඉදිරි දැක්මක් සහිත කළමනාකාරිත්වයක් සඳහා පහසුකම් සලසමින්, බිම් මට්ටමින් දත්ත ග්‍රහණය කර ගනු ලැබේ.

අවදානම් හා පාලන ස්වයං-තක්සේරුව (RCSA) යනු බැංකුව සිසාරා මෙහෙයුම් අවදානම මෙන්ම එම අවදානම් කළමනාකරණය කිරීමට නිර්මිත අභ්‍යන්තර පාලනවිධි සමාලෝචනය කිරීමට හා තක්සේරු කිරීමට සම්බන්ධ ක්‍රමවේදයකි.

බැංකුව අවදානම් හා පාලන ස්වයං - තක්සේරු ක්‍රියාවලිය මෙහෙයවනු පිණිස "පහළ - සිට -ඉහළට" ප්‍රවේශයක් භාවිතා කරයි. මෙම ක්‍රියාවලිය නියමිත කාලයකට වරක්, ඉහළ අවදානම් විභවයක් සහිත ක්ෂේත්‍රවල අවදානම් හානි අවම කිරීමේ ක්‍රියාමාර්ග ගනු පිණිස හා හඳුනා ගනු ලැබූ ගැටළු නිරාකරණය කරනු පිණිස ක්‍රියාත්මක කරනු ලැබේ.

"මෙහෙයුම් අලාභ අවස්ථා" සහ "ව්‍යාපාර කටයුතු අඩාල කරවන අවස්ථා" පිළිබඳව වාර්තා කිරීමේ යාන්ත්‍රණය විස්තරාත්මක විශ්ලේෂණයන් සිදු කිරීමේ සහ කළමනාකාරිත්වය හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත නිසි කලට වේලාවට දැන්වීමේ හැකියාව ලබා දෙයි.

අභ්‍යන්තර අලාභ සිදු වන අවස්ථා ඇති වූ විට ඒවා යළි යළිත් ඇති වීම අඩු කරනු පිණිස නිවාරණ ක්‍රියාමාර්ගයක් වශයෙන් ක්‍රමානුකූල අවදානම් විශ්ලේෂණය, මූල හේතුකාරක විශ්ලේෂණය හා උගත් පාඩම් අභ්‍යාසය සිදු කරනු ලැබේ.

නෛසර්ගික අවදානම් ක්ෂේත්‍රයන් හඳුනා ගැනීමටත්, උචිත අවදානම් හානි අවම කිරීමේ ක්‍රියාමාර්ග නිර්වචනය කිරීමටත් බැංකු කර්මාන්තයේ ඇති වන බාහිර අලාභ සිදුවීම් පිළිබඳ විශ්ලේෂණය සිදු කෙරේ.

බැංකුව ප්‍රතිපත්ති මට්ටමේ මෙහෙයුම් අලාභයන් සඳහා වූ අභ්‍යන්තර අනතුරු ඇඟවීම් මට්ටම් නියම කර ඇත.

අභ්‍යන්තර අනතුරු ඇඟවීම් - මෙහෙයුම් අලාභ අවස්ථා



සිදුවීම් සංඛ්‍යාතය (%)



අවදානම් අවස්ථාවන් වල බරපතලකම (%)



මෙම බැංකුව මූලධනය, ලාභදායිතාව හා ද්‍රවශීලතාව මත ඇති වන අන්තගාමී වාතාවරණයන්හි බලපෑම් විශ්ලේෂණය කරනු පිණිස අභ්‍යන්තර හා බාහිර අලාභ තොරතුරු පිළිබඳ සිද්ධිරූපණ විශ්ලේෂණ හා පීඩ්‍යතා පරීක්ෂාවන් සිදු කරයි.

තවද, මෙම බැංකුව 'අලාභ ව්‍යාප්ති ප්‍රවේශය' (LDA) යටතේ වූ ගණනය කිරීම් වලට උපකාරී වනු පිණිස තීරු 8 ක් හා පේළි 7 ක් සහිත න්‍යාසයක් (එනම්, අවදානම් අවස්ථා ප්‍රභේදය



හා ව්‍යාපාර රේඛාව) භාවිතා කරමින් පරිපූර්ණ මෙහෙයුම් අලාභ දත්ත සමුදායක් පවත්වා ගෙන යයි.

පහත දී ඇත්තේ පසුගිය වර්ෂ දෙක ඇතුළත සිදු වූ මෙහෙයුම් අවදානම් අවස්ථාවල සංඛ්‍යාතය හා තීව්‍රතාවයයි:

මෙහෙයුම් අවදානම අවම කිරීම

මෙම බැංකුව වර්ධනය වන ගෝලීයකරණය හා ඒකාබද්ධ වීම්, ඉහළ යන ගනුදෙනුකාර අපේක්ෂණයන් මෙන්ම තව තවත් සංකීර්ණ බවට පත් වන නිපැයුම්, වැඩි වන නියාමන අවශ්‍යතාවන්, ඉහළ යන තාක්ෂණවේද නව්‍යකරණය, ඉහළ නගින තරගකාරිත්වය හා ස්වයංක්‍රීයකරණය යන මේවායින් සලකුණු වූ පරිසරයකට මුහුණ දී සිටී. මෙහෙයුම් දෘෂ්ටි කෝණයකින්, මෙය අසාර්ථකත්වයේ හෝ වැරදිම්වල සම්භාවිතාව වර්ධනය කර ඇති අතර, එහි ප්‍රතිඵලයක් වශයෙන් උචිත හානි අවම කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම කෙරෙහි අවදානම වැඩි වී ඇත.

බැංකුව විවිධ විශාලත්වවල මෙහෙයුම් අවදානම් අවම කරනු පිණිස, පහත ආකෘතිය භාවිතා කරයි.

මෙහෙයුම් අවදානම්වල විවිධාකාරී ස්වභාවය නිසා එහි හානි පූර්ණ වශයෙන් සමනය කළ නොහැකිය. එබඳු ඒවායෙහිදී හානි අවම කිරීමෙහි වියදම එහි ප්‍රතිලාභ සමඟ සන්සන්දනය කර බලමින් ශේෂ අවදානම විධිමත් ලෙස භාර ගනිමින් "සාධාරණව හැකි තරම් අඩු" මූලධර්මය අනුගමනය කරමින් මෙහෙයුම් අවදානම අවම කරනු ලැබේ. එමෙන්ම බැංකුව අවශ්‍ය අනුමැතීන් සහිතව අවදානමේ පිරිවැයට වඩා අඩු ප්‍රතිලාභයක් සහිත ඒවා මග හරී.

මෙහෙයුම් අවදානම අවම කිරීමේ මුඛ්‍ය සංරචකයක් වන ශක්තිමත් අභ්‍යන්තරික පද්ධතියක් බැංකුව සතුව ඇත. තවද, බැංකුවේ මෙහෙයුම් අවදානම අවම කරනු පිණිස පහත ප්‍රතිපත්ති හා ක්‍රියාවලීන්ද හඳුන්වා දෙනු ලැබේ.

තොරතුරු පද්ධති ආරක්ෂාව

ඉබේ මෙන්ම හිතාමතාම සිදු කෙරෙන විනාශය, දෝෂ සහගත වීම හා අනවසර ප්‍රවිෂ්ටය කෙරෙන් තොරතුරු ආරක්ෂා කෙරෙන බවට වග බලා ගැනීම බැංකුවකට අත්‍යවශ්‍ය වේ.

බැංකුව සවිමත් කරන ප්‍රගමණයන් හි ප්‍රතිලාභ බැංකුවට මෙන්ම එයට සම්බන්ධ සියලු කොටස්වලට භුක්ති විඳිය හැකි වනු පිණිස සුරක්ෂිත සන්නිවේදනය අවශ්‍ය කෙරේ.

අයි.එස්.ඕ. 27001 ප්‍රමිත මත පදනම්ව සංවර්ධනය කරන ලද, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ තොරතුරු ආරක්ෂක ප්‍රතිපත්ති, කාර්යපටිපාටි හා මාර්ගෝපදේශක බැංකුවට තිබේ. තොරතුරු ආරක්ෂණ මූලකෘත්‍යයන් ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය කළමනාකරණ මඟ පෙන්වීම හා උපකාර සපයනු ලබන්නේ මහා කළමනාකාරතුමා ප්‍රධානත්වය දරන ආයතනික තොරතුරු ආරක්ෂක කමිටුව (CISC) විසිනි.

බැංකුවේ 'තොරතුරු තාක්ෂණ නියමු කමිටුව' තොරතුරු තාක්ෂණය ආශ්‍රිත උපායමාර්ගික අවශ්‍යතාවන් සඵලදායී ලෙස ආමන්ත්‍රණය කළ හැකි අනුශාසක මඩුල්ලක් ලෙස කටයුතු කරයි. එමෙන්ම මෙම මඩුල්ල තොරතුරු තාක්ෂණ මූලකෘත්‍යයන්හි ප්‍රගතිය සෙවීමේ, අවදානම් හඳුනා ගැනීමේ හා ඒවායේ හානි අවම කරන උපායමාර්ග සැකසීමේ යාන්ත්‍රණයක්ද වෙයි.

ව්‍යාපාරික අඛණ්ඩත්ව සැලැස්ම

අර්බුදකාරී වාතාවරණයන් කළමනාකරණය කිරීම මඟින් බැංකුව සිසාරා ව්‍යාපාර කටයුතුවල අඛණ්ඩත්වය පිළිබඳව වග බලා ගැනීම අවදානම් කළමනාකරණයේ මුඛ්‍ය කාර්යයකි. ව්‍යාපාරික කටයුතුවලදී ඇති විය හැකි බාධාවන් හෝ ඇණහිටීම් පිටු දකිනු පිණිස ව්‍යාපාරික අඛණ්ඩත්ව සැලැස්මක් ස්ථාපනය කිරීමට කළමනාකාරිත්වයට ඇති අභිප්‍රාය ව්‍යාපාරික අඛණ්ඩතා ප්‍රතිපත්තිය මඟින් නිර්වචනය කෙරේ. මෙහි අරමුණ වන්නේ විශාල බිඳවැටීම්, සිදුවීම් හෝ ව්‍යසන වල ඵලයන් මඟින් අතිශය වැදගත් නිෂ්පාදන හා සේවාවන් ආරක්ෂා කර ගැනීම හා එම අතිශය වැදගත් ක්‍රියාවලීන් යළි ඇරඹීමයි.

සියලුම ව්‍යාපාරික අංශයන්හි ව්‍යාපාරික අඛණ්ඩත්වය තහවුරු කරනු පිණිස වූ විෂය පථය, උචිත වගකීම්, අභිමතාර්ථය, අධිකාරී බලය හා සබඳතා ව්‍යාපාරික අඛණ්ඩත්ව සැලැස්ම මඟින් නිර්වචනය කෙරේ. එමෙන්ම එයට බැංකුව විසින් යොදා ගනු ලබන ව්‍යාපාරික අඛණ්ඩත්ව ප්‍රවේශය ද ඇතුළත් ය.

බැංකුවේ ව්‍යාපාරික අඛණ්ඩත්ව සැලැස්මේ මුඛ්‍ය අවශ්‍යතාවක් වශයෙන්, විවිධ පූර්ව-නිර්ණිත සිද්ධිරූපණයන් සිදු වන අවස්ථාවක වැදගත් මෙහෙයුම් පවත්වා ගෙන යාම සඳහා පහසුකම් සලස්වනු පිණිස, විකල්ප විධිවිධාන සහිත, පරිපූර්ණ ව්‍යසන ප්‍රකෘතිකරණ මධ්‍යස්ථානයක් නගර සීමාවෙන් පිටත පිහිටුවා ඇත.

ව්‍යාපාරික අඛණ්ඩත්ව සම්බන්ධීකරණ ඒකකය බැංකුවෙහි ව්‍යාපාරික අඛණ්ඩතාව පාලනය හා අධීක්ෂණය සම්බන්ධයෙන් වගකීම දරන අතර, එම ඒකකය ප්‍රලේඛනය කරන ලද ප්‍රතිපත්ති අනුගමනය කෙරෙන්නේදැයි පිරික්සීම, අධීක්ෂණය හා තහවුරු කිරීම සිදු කරයි. සෑම ඒකකයක්ම තමන්ගේ කාර්යයන් සම්බන්ධයෙන් 'ඒකක ව්‍යාපාරික අඛණ්ඩත්ව හැකියාවන්' වර්ධනය කර ගන්නා බවට ව්‍යාපාරික අඛණ්ඩතා සම්බන්ධීකරණ ඒකකය වග බලා ගනියි. සමාලෝචිත වර්ෂය තුළ අත්හදා බැලීමේ ධාවන තුනක් සාර්ථකව සම්පූර්ණ කරන ලදී.

ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය විසින් ව්‍යාපාරික අඛණ්ඩතා සැලැස්ම ක්‍රියාත්මක වන ආකාරය අධීක්ෂණය කරනු ලබන අතර, එය මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත දෛනික පදනමින් වාර්තා කරයි.

රක්ෂණය

පාලනය කළ නොහැකි මූලාශ්‍රවලින් ඇති වන ඉහළ තීව්‍රතාවෙන් යුතු අවදානම් අවම කරනු පිණිස, බැංකුව අවදානම් වෙනතක පැවරීමේ උපායමාර්ගයක් භාවිතා කරයි. අවදානම් පැවරීම වනාහි විශේෂිත සිදුවීම්වල නොදන්නා මූල්‍යමය බලපෑම, දන්නා මූල්‍ය පිරිවැයකට හුවමාරු කිරීමේ මාර්ගයකි.

බැංකුව අවදානම් පැවරුම් උපායමාර්ග යක් වශයෙන් රක්ෂණය භාවිතා කරයි.

කළමනාකරණය

සීබෑන්ක් රක්ෂණ සේවා ඒකකය විවිධ බැංකු මෙහෙයුම්වල ඇති අවදානම තක්සේරු කොට, රාජ්‍ය රක්ෂණ සේවා සම්පාදකයින් වෙතින් රක්ෂණ ආවරණ ලබා ගනී.

බැංකුවේ හානිපූර්ණ ප්‍රතිපත්තිය බැංකුවේ මෙහෙයුම්වලින් පැන නඟින අවදානම්වලට එරෙහිව පරිපූර්ණ ආවරණයක් ලබා දෙයි. එයට අමතරව, ස්වාභාවික ව්‍යසනවලින් හා වෙනත් උපද්‍රවවලින් භෞතික වත්කම්වලට ඇති විය හැකි හානිවල අවදානම් බැහැර පවරනු පිණිස බැංකුව දේපළ රක්ෂණය භාවිතා කරයි.

බාහිර මූලාශ්‍රණය

සේවා සම්පාදකයින් පූර්ණ ලෙස ඇගයීමෙන් පසුව, පිරිවැය අඩු කරනු පිණිස හා විශේෂඥතා ඥානය හෝ සම්පත් නොමැතිකම වෙනුවෙන් හානිපූරණය කිරීමක් වශයෙන් බැංකුව ඇතැම් කාර්යයන් බැහැරට ලබා දෙයි. මෙම බැහැර මූලාශ්‍රන කාර්යයන් බාහිර සේවා සම්පාදකයින් හා බැංකුව අතර පැහැදිලි වගකීම් බෙදී යාමක් තහවුරු කරන ශක්තිමත් ගිවිසුම් හෝ සේවා මට්ටම් එකඟතාවන් මඟින් ආවරණය කෙරේ.

නෛතික අවදානම

නෛතික අවදානම මෙහෙයුම් අවදානමේ නිර්වචනය ඇතුළතට වැටේ. එය අසාර්ථක පද්ධති හෝ ක්‍රම, පුද්ගලයින්, ක්‍රියාවලීන් හෝ බාහිර සිදුවීම්වල නෛතික බලපෑම් නිසා පැන නගී. බැංකුවේ නීති දෙපාර්තමේන්තුව අත්දැකීම් බහුල හා මැනවින් කටයුතු කරන නීති නිලධාරීන්ගෙන් සමන්විත වේ. බැංකුව වෙනුවෙන් නෛතික ක්‍රියාමාර්ග ගැනීමේ වගකීම නෛතික දෙපාර්තමේන්තුවට පවරා ඇත.

ප්‍රධාන නීති නිලධාරියා බැංකුවේ මෙහෙයුම් අවදානම් කාරණාවන්හි නෛතික ඵලවිපාක පිළිබඳව කටයුතු කිරීමෙහිලා මෙහෙයුම් අවදානම් කළමනාකරණ විධායක කමිටුවට උපකාරී වෙයි.

උපායමාර්ගික අවදානම

උපායමාර්ගික අවදානම යනු කළමනාකරණ අඩුපාඩුකම් හෝ උපායමාර්ගික පරමාර්ථ හා අරමුණු වැරදි ලෙස නිර්ණය කිරීමෙහි ප්‍රතිවිපාක වශයෙන් බැංකුවට මූල්‍ය අලාභයක් සිදු වීමේ හැකියාවයි.

බැංකුවෙහි උපායමාර්ගික දිශානතිය ආයතනික සැලැස්ම තුළ හොඳින් විග්‍රහ කොට ඇති අතර, උපායමාර්ගික දිශානතිය සමග සත්‍ය කාර්යසාධනය අනුකූල වන බවට වග බලා ගනු පිණිස ශක්තිමත් යාන්ත්‍රණයක් ස්ථාපනය කර ඇත.

අවදානම් ප්‍රතිරූපය තුළ උපායමාර්ගික අවදානමෙහි වැදගත්කම හඳුනා ගැනීමෙන් අනතුරුව, බැංකුව විසින් 'අභ්‍යන්තර මූලධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය' (ICAAP) හරහා, පංච-පරාමිති ලකුණුපත්‍ර පදනම් කර ගත් ආකෘතියක් භාවිතා කර ගනිමින් උපායමාර්ගික අවදානම තක්සේරු කරන කාර්යපටිපාටියක් ස්ථාපනය කර තිබේ. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව අබණ්ඩ පදනමින් උපායමාර්ගික අවදානම නිරීක්ෂණය කරයි.

කීර්තිනාම අවදානම

කීර්තිනාම අවදානම යනු ඍණාත්මක ජනමතය හේතුවෙන් පැන නගින, ලාභදායකත්වය හා මූලධනය මත ඇති වන වත්මන් හා ඉදිරි බලපෑමයි.

ලෝකය මුළුල්ලේම එකම මොහොතේ පාහේ මාධ්‍ය ආවරණය සිදු වන ඉතා ඉක්මනින් වෙනස්වන ගෝලීය වෙළඳපල තුළ, කීර්තිනාමය වනාහි තරඟකාරිත්ව වාසියෙහි ප්‍රමුඛ මූලාශ්‍රයක් වේ. මහජන මුදල් ගනුදෙනු කරන බැංකු සඳහා, විශ්වාසය හා විශ්වසනීයත්වය යන දෙක ව්‍යාපාර ගාමක බලයන් ලෙස අවබෝධ කර ගැනේ.

දේශයේ ප්‍රමුඛ බැංකුව ලෙස, මෙම බැංකුව එහි කීර්තිය ආරක්ෂා කර ගැනීමෙහි වැදගත්කම අවබෝධ කර ගෙන සිටින අතර, එය බැංකුවේ විශ්වාසයේ සළකුණෙහි කැඩපත ලෙස සලකයි.

එම නිසා මෙම බැංකුව සිය සංවිධානයේ සියලු මට්ටම්හිදී ශක්තිමත් ආයතනික පාලනවිධි හා අවදානම් කළමනාකරණ පිළිවෙත් ශක්තිමත් කිරීමෙන්, සිය ව්‍යාපාර කටයුතුවල විවිධ අංශ කොටස්කරුවන්ට බලපාන අන්දම අවබෝධ කර ගැනීමෙන් සහ සවිලදායී සන්නිවේදනය හා වත්මන් නීතිරීති හා රෙගුලාසි පිළිපැදීම හරහා කීර්තිනාම අවදානම කළමනාකරණය කිරීමට කැප වී සිටී.

සත්‍ය මූලධනයට එරෙහිව නියාමන මූලධනය



බාසල් II මාර්ගෝපදේශ යටතේ වූ නිර්වචනයට අනුව, අභ්‍යන්තර මූලධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය නමැති රාමුවේ ස්ථම්භ අංක II යටතේ කීර්තිනාම අවදානම පිළිබඳව කටයුතු කරනු ලැබේ. මෙම බැංකුව වර්ෂයකට දෙවරක් පදනමින් කීර්තිනාම අවදානම තක්සේරු කරනු පිණිස ලකුණුපත්‍ර ප්‍රවේශයක් භාවිතා කරයි.

මූලධන කළමනාකරණය

මූලධන කළමනාකරණයේ මූලික අරමුණ වන්නේ අවම නියාමන මූලධන අවශ්‍යතාව පවත්වා ගෙන යනු ලබන බවට වග බලා ගැනීමයි. බැංකුවේ අවදානම් රුචිය ඇතුළත එහි උපායමාර්ගික අරමුණ සාක්ෂාත් කර ගනු පිණිස ප්‍රමාණවත් මූලධනය ප්‍රතිපාදනය කොට තිබෙන බවට බැංකුව වග බලා ගනී.

2012 දෙසැම්බර් 31 දිනට බැංකුව 8.26% ක ස්ථර අංක I අනුපාතයක්ද, 11.45% ක ස්ථර අංක I හා II අනුපාතිකවල වෙක්‍යයක්ද පවත්වා ගෙන ගොස් ඇත. එය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කර ඇති අවම නියාමන මූලධන අවශ්‍යතාව අභිභවා යයි.

සියලුම ව්‍යාපාරික අංශ සිසාරා පරිපූර්ණ ආකාරයකින් සියලු ආකාරවල අවදානම් ආවරණය කිරීම ඉතා විශාල අභියෝගයකි. බාසල් II සම්මුතිය ස්ථම්භ අංක I යටතේ සැලකිල්ලට ගනු නොලැබූ අවදානම් ග්‍රහණය කරගැනීමේ රාමුවක් හඳුන්වා දී තිබේ. මෙම විකල්ප ප්‍රවේශය 'අභ්‍යන්තර මූලධන

සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය' වශයෙන් ප්‍රසිද්ධය. එය බැංකුවේ මුළු අවදානම් මට්ටම මත රඳා පවතිමින් මූලධන තක්සේරුව සිදු කරයි.

අභ්‍යන්තර මූලධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය (ICAAP)

ස්ථම්භ අංක I හි මෙන්ම II හි නෛසර්ගික අවදානම් විස්තරාත්මක ලෙස ප්‍රලේඛනය කරන 'අභ්‍යන්තර මූලධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය' අවදානම් හා මූලධන ප්‍රතිරූපය සම්බන්ධයෙන් බැංකුවක් විසින් භාවිතා කරනු ලබන පාලනවිධි හා හානි අවම කිරීම් දක්වයි.

මෙහෙයුමෙහි ස්වභාවය, විශාලත්වය හා සංකීර්ණත්වය සැලකිල්ලට ගනිමින්, බැංකුව අනපේක්ෂිත අහඹු අවස්ථාවන්ට මුහුණ දෙනු පිණිස අවශ්‍ය වන ප්‍රශස්තතම මූලධන මට්ටම අවබෝධ කර ගනු පිණිස, මූලධන තක්සේරු ක්‍රියාවලිය ක්‍රියාත්මක කරයි.

'අභ්‍යන්තර මූලධන සප්‍රමාණකත්ව තක්සේරු ක්‍රියාවලිය' බැංකුවේ මූලික අවශ්‍යතාවන් දෙකක් මඟින් පාලනය කෙරේ:

- ඒවායේ මූලධන මට්ටම්වලට සම්බන්ධ අභ්‍යන්තරික මූලධන සප්‍රමාණකත්ව ක්‍රියාවලියක් සහ උපායමාර්ගයක් ඇති කර ගැනීම
- නියාමන අවමය ඉක්මවා මූලධනය පවත්වා ගැනීම.

ඉහත මූලධර්මයන්ට අනුකූල වනු පිණිස බැංකුව සියලු සැලකිය යුතු අවදානම් මැනීම, නිරීක්ෂණය කිරීම හා වාර්තා කිරීම සහ බැංකුවට බරපතල තත්ත්වයන් යටතේ සිය සම්පත් හා මූලධනය සහමුලින්ම භාවිතා කර අවසන් නොකොට, නොනැසී පැවතිය හැකි වන බවට වග බලා ගැනීම පිණිස වූ මූලධර්ම හා ක්‍රියාවලීන් ස්ථාපනය කර ඇත.

ආතති පරීක්ෂාව

ආතති පරීක්ෂාව යනු බැංකුව ක්‍රියාත්මක වන පරිසරය තුළ ඇති වන අහිතකර ආර්ථික, දේශපාලනික හා භෞතික වෙනස්කම් යටතේ, විවිධ තීව්‍රතාවයන්ගෙන් යුතු අනපේක්ෂිත සිදුවීම්වලට ඔරොත්තු දිය හැකිදැයි යන්න දක්වන ඒකාබද්ධ පරීක්ෂණයකි.

ව්‍යාපාරයට එහි මූල්‍ය සප්‍රමානකත්ව ඉලක්කයන් සපුරාලනු පිණිස සිය මූලධනය ප්‍රමාණවත්දැයි සලකා බලනු පිණිස ආතතීන් හා සිද්ධිරූපණ භාවිතා කෙරේ.

බැංකුවේ ආතති පිරික්සුම් රාමුව විවිධ පරීක්ෂණ වර්ග ගණනාවක් ආවරණය කරයි:

- ව්‍යාපාරික අනුමානයන්ට ඇති ආතති
- ණය නිරාවරණයන්ට ඇති ආතති
- වෙළඳපල සංචලනයන්ට හා පොළී අනුපාතිකවලට ඇති ආතති
- ද්‍රවශීලත්වයට ඇති ආතතීන්
- ඉපැයීම්, මූලධනය හා ද්‍රවශීලත්වය වෙත බලපෑ හැකි සැලකිය යුතු සාර්ව ආර්ථික හෝ මෙහෙයුම් සිද්ධි

බැංකුව එක් එක් සිද්ධිරූපණය සඳහා තීව්‍රතා මට්ටම් තුනක් භාවිතා කරයි. ණය වෙළඳපල හා මෙහෙයුම් අලාභයන් කෙතරම් විශාල වේද යන්න අනුව, බැංකුව තීව්‍රතා මට්ටම් මෘදු, මද හා අයහපත්ම වශයෙන් නිර්වචනය කරයි. ආතති පරීක්ෂාව මඟින් ලබා ගත් ප්‍රතිඵල කළමනාකාරිත්වයට හා අධ්‍යක්ෂ මණ්ඩලයට වියහැකි අවදානම් පිළිබඳ පැහැදිලි දසුනක් ලබා දෙයි.

අනුකූලනය

බැංකුව දේශයේ හා සමාජයේ දියුණුව සඳහා වූ සිය ස්වේච්ඡාමය යුතුකමෙහි කොටසක් වශයෙන් 'අනුකූලනය' සලකයි. අනුකූලන ක්ෂේත්‍රය තුළ වූ නෛතික හා නියාමන අවශ්‍යතාවන් පිළිපැදීම හැරුණු කොට, බැංකුව සිය සමාජීය වගකීම ඉටු කරනු පිණිස බැංකු චර්යාධර්ම හා ප්‍රමිතීන් තදින්ම අනුගමනය කිරීමටද ඇපකැප වී සිටී.

මූල්‍ය ආයතනයන් කවර ස්ථානයක පිහිටා තිබුණද, එකක්-පසුපස-එකක් ලෙස පැමිණි මූල්‍ය අර්බුදවලින් උගත් පාඩම් නිසා, එම ආයතන සඳහා වන අනුකූලන රාමුව වඩාත් දැඩි බවට පරිවර්තනය වී තිබේ. 'ජාත්‍යන්තර බැංකු ප්‍රජාව' තවත් අර්බුදවලින් ගෝලීය මූල්‍ය පද්ධතිය ආරක්ෂා කර ගනු පිණිස, මුදල් විශුද්ධිකරණය, ත්‍රස්තවාදී මූල්‍ය සම්පාදනය සහ මත්ද්‍රව්‍ය ජාවාරම වැනි සමාජීය වශයෙන් හානිදායක ක්‍රියාකාරකම්වලට එරෙහිව බැංකු පද්ධතිය ආරක්ෂා කිරීමේ සියලුම මාර්ග ගවේෂණය කිරීමෙහි නියැලී සිටී.

ජාත්‍යන්තර ලෙස ක්‍රියාකාරීව සිටින හා මෙරට අන් රටවල් සමඟ කෙරෙන ගනුදෙනුවල වැඩිම කොටස දරන බැංකුව ලෙස, මෙම බැංකුව 'ජාත්‍යන්තර බැංකු ප්‍රජාව' විසින් දරනු ලබන ප්‍රයත්නයන් හා මාර්ගෝපදේශයන් පිළිපැදීමට පූර්ණ ලෙස ඇපකැප වී සිටී.

අනුකූලනය යනු: වෙළඳපල චර්යාව පිළිබඳ නිසි ප්‍රමිති හා ආචාර ධර්ම සහ සියලු මෙහෙයුම් ක්ෂේත්‍රයන්හි අනුමත ප්‍රතිපත්ති අනුගමනය කිරීම සම්බන්ධ, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සඳහා කටයුතු කිරීම හා ත්‍රස්ත මූල්‍යකරණය පිටුදැකීම සම්බන්ධ කාරණාවන්හිදී නීතිරීති, රෙගුලාසි, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලනවිධි, ප්‍රමිති සහ චර්යා ධර්ම සංග්‍රහවලට අනුකූල වීමයි.

අනුකූලන අවදානම සහ අනුකූලන ක්‍රියාකාරිත්වයන්

අනුකූලන අවදානම වනාහි නොපිළිපැදීම් හේතුවෙන් බැංකුවේ කීර්තියට හානි සිදු වීමට, නෛතික හෝ නියාමන සම්බාධකයන්ට යටත් වීමට හෝ මූල්‍ය අලාභයන්ට මඟ පාදමින්, බැංකුවේ අවංකත්වය ආපදාවට ලක් වීමේ වත්මන් හා අනාගත අවදානමයි. අනුකූලන අවදානම එහි ඉතාමත්ම අවම මට්ටමක පවත්වා ගැනීමට බැංකුව උපරිම ප්‍රයත්නයන් ගෙන තිබේ.

බැංකුවේ අනුකූලන ක්‍රියාකාරිත්වයන් සිදු කෙරෙනුයේ, 2005 අංක 25 දරණ ත්‍රස්තවාදී මූල්‍ය සම්පාදනය මර්ධනය කිරීම පිළිබඳ සම්මුතිය, 2006 අංක 5 දරණ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත, 2006 අංක 6 දරණ මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍ර ලත් බැංකුවල ගනුදෙනුකාර ප්‍රඥප්තිය ඇතුළු අදාළ සියලුම නීතිරීති, රෙගුලාසි හා මාර්ගෝපදේශ ආදිය පිළිපදින අයුරිනි. මෙම බැංකුවේ මැනවින් නිර්වචනය කර ඇති අනුකූලන ක්‍රියාකාරිත්වයන්, නියාමන අධිකාරිවලින් දත්ත ලබා ගැනීමේදී හා ඒවාට දත්ත සම්ප්‍රේෂණය කිරීමේදී යොදා ගනු ලබන පද්ධතීන් හා කාර්යපටිපාටි, පාරිසරික ක්‍රියාකාරකම් කෙරෙහි සංවේදීතාව, සහ නියාමන අධිකාරි සමඟ පවත්වා ගෙන යනු ලබන යහපත් සම්බන්ධීකරණය හා සබඳතාව යන මේවා "පූර්ණ වශයෙන් අනුකූල වීම" යන පිළිපදින සුළු බවට අවසාන පරමාර්ථය සාක්ෂාත් කර ගැනීමට දායක වෙයි.

ස්වාධීන අනුකූලන දෙපාර්තමේන්තුව පිහිටුවීම

අනුකූලන ක්‍රියාකාරිත්වයන්හි සඵලදායිත්වය ස්වාධීන අනුකූලන දෙපාර්තමේන්තුවේ ස්වාධීනත්වය මත රඳා පවතී. තවද, බැංකුවේ ව්‍යාපාර කටයුතු ව්‍යාප්ත කිරීම නිසා, ව්‍යාපාර කටයුතුවල පරිමාවෙහි සහ නිෂ්පාදනවල මාන ව්‍යාප්ත කර ඇති අතර, එමඟින් ඇති වූ කාර්ය සම්භාරය උසුලනු පිණිස අනුකූලන දෙපාර්තමේන්තුව සීඝ්‍රයෙන් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාව මතු වී ඇත. මෙම කාරණා සැලකිල්ලට ගෙන බැංකුවේ ආයතනික කළමනාකාරිත්වය විසින් අනුකූලන දෙපාර්තමේන්තුව වෙනම සහකාර මහා කළමනාකාරවරයකු යටතට පත් කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව අනුකූලන ඒකකය 2013 අගෝස්තු මාසයේදී අනුකූලන දෙපාර්තමේන්තුව බවට පරිවර්තනය වූ අතර, එහි කටයුතු සහකාර මහා කළමනාකාර (අනුකූලන) විසින් හසුරුවනු ලැබේ.

සාර්ථකත්වයේ මාවතේදී අවකර්ය ලිහිල් කිරීමට පෙලඹෙනු ඇත. එවන් අවස්ථා වලදී ආරක්ෂිත නියාමනයන්, යහපාලනයේ සම්මත පරිවයන් හා ආයතනික කාලසටහනට අනුගත වීම් ආදිය අතිශය වැදගත්ය.

නිසි
මං සලකුණු
ඔස්සේ

ආයතනික
යහපාලනය

ලංකා බැංකුව වර්ධනයේ නියමුවා වශයෙන් සිය පාර්ශවකරුවන්ට සහායවීම උදෙසා වන තම කාර්යභාරය ගැඹුරින් අවබෝධ කරගෙන සිටින අතර, ආයතනික යහපාලනය ඉතා උසස් මට්ටමක පවත්වා ගැනීමට බැංකුව දරන ප්‍රයත්නය තුළින් එය මනාව පැහැදිලි වේ. බැංකුවට ඇල්මක් දක්වන පාර්ශවයන් වෙනුවෙන් සිය ව්‍යාපාරික කටයුතු නිවැරදි ආකාරයෙන් සිදු කිරීමට දරණ නිරන්තර උත්සාහයද එයට ඇතුළත් වේ. ශක්තිමත් සහ ඵලදායී යහපාලන ක්‍රමයක් අනුගමනය කිරීම මහජන විශ්වාසය ආකර්ෂණය කරගැනීමටත්, පවත්වා ගෙන යාමටත් බලපාන මූලික සාධකයක් වන අතර විශේෂයෙන් බැංකුව රජයට අයිති වීම සහ ශ්‍රී ලංකා ආර්ථිකය තුළ බැංකුව වැදගත් සහ ප්‍රමුඛ කාර්යභාරයක් ඉටුකරන බැවින් එහි ප්‍රතිපත්ති සහ පරිචයන් පිළිබඳ බොහෝ කරුණුවලදී මූලිකත්වය ලබාදෙමින් සැලකිය යුතු ලෙස බලපෑම් කළ හැකි ආයතනයක් ලෙස කටයුතු කරයි.

අප අධ්‍යක්ෂ මණ්ඩලය බැංකුවේ කටයුතු අධීක්ෂණය කරන අතරම ආයතනික යහපාලන ක්‍රියාපටිපාටි ගොඩනැංවීමට සහ වැඩි දියුණු කිරීමට නිරන්තරයෙන් කටයුතු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ මෙම පියවරයන්ට සහයෝගය දක්වමින් අධ්‍යක්ෂ මණ්ඩලීය උපකමිටුවක් වන නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව අදාළ යහපාලන රීති සහ සම්මත පරිචයන් අනුගමනය කරනු ලබන අතර අඛණ්ඩව අධීක්ෂණයෙහි නියුතු වේ.

ලංකා බැංකුවේ කළමනාකරණ ක්‍රියාවලිය, ව්‍යුහය සහ ප්‍රතිපත්තීන් මඟින් නීති හා රෙගුලාසි සඳහා ඇති අනුකූලතාවය සහතික කෙරෙන අතර තීරණ ගැනීම හා වගකීම සම්බන්ධයෙන් වූ අධිකාරිත්වය පිළිබඳ පැහැදිලි නිර්ණායක සපයයි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනතේ ආයතනික යහපාලන විධිවිධානයන්ට බැංකුව සීමාවේ. මෙහි විධිවිධානයන්ට බැංකුව අනුකූල වීමට කටයුතු කරන අතර, මෙහි සඳහන් නොවන, බැංකුව පාලනය වන 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුකූල වීමට ද අවශ්‍ය පියවර බැංකුව ගෙන ඇත.

මෙම විධිවිධානයන්ට අනුකූලවීම යහපාලනයේ එක් පැතිකඩක් පමණි. බැංකුවේ ආයතනික පරිසරය තවත් පැතිකඩකි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උසස් ආචාරධර්ම පද්ධතියක් අනුගමනය කිරීම ආයතනික සංස්කෘතිය ගොඩනැංවීම හා ආරක්ෂා කිරීම සඳහා අනුගමනය කරන එක් ක්‍රමයකි. එසේ කටයුතු කිරීම බැංකුවට හා එහි කාර්ය මණ්ඩලයට බැංකුකරණයේ සම්මත පරිචයන්, අනුරූප හර පද්ධතීන් සහ සම්මතයන් ස්ථාපනය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ලැබෙන අතර එය විශ්වාසනීයත්වය සහ පාරදෘශ්‍යභාවය වර්ධනය වීමටත් සියලුම පාර්ශවකරුවන් කෙරේ පවතින බැඳීම් තහවුරු කිරීමට සහ අවබෝධ කරගැනීමටත් හේතු වේ.

යහපාලනයෙහි අඛණ්ඩ වර්ධනය උදෙසා බැංකුව වර්ධන ප්‍රවේශයක් අනුගමනය කරනු ලබන අතර බැංකුවෙහි අගය වර්ධනය කිරීමේ ක්‍රමවේදයන්ට යහපාලනය ද අන්තර්ගත කර ඇති බැවින් අනුගමනය කළ යුතු නීති සහ රෙගුලාසි අභිබවා ගිය වර්ධිත පාලන රාමුවක් නිර්මාණය කිරීමට එය උපකාරී වී ඇත.

බැංකුව විසින් සුරැකුම් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳ වූ සම්මත පරිචයන්ගේ සංග්‍රහය භාවිතා කරන අතර එය ආයතනික යහපාලනයේ වූ සම්මත පරිචයන් වෙනුවෙන් මාර්ගෝපදේශකත්වයක් ලබාදේ. කෙසේ වෙතත් බැංකුව ඉහතින් සඳහන් 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධානයන්ට අනුව කටයුතු කරන බැවින් කොළඹ විනිමය හුවමාරුවෙහි ලැයිස්තුගත රීතින්හි වගන්ති අංක 7.10 ප්‍රකාර වූ ආයතනික යහපාලනය සම්බන්ධ අවශ්‍යතාවයන්ගෙන් බැංකුව මුදාහැර ඇත.

ලංකා බැංකුව සිය එකම කොටස්කරුවා වන ශ්‍රී ලංකා රජයට ප්‍රතිලාභ ලබාදෙමින් සිය ගනුදෙනුකරුවන්ට සහ අනෙකුත් ඇල්ම දක්වන පාර්ශවයන්ට සේවා සැලසීමට කටයුතු කිරීම හේතුවෙන්, තම සාර්ථකත්වය අර්ථවත් වන්නේ එය නිවැරදි ආකාරයට නිවැරදි වටිනාකම් සහිතව ළඟාකරගත් විට බව අවබෝධ කරගෙන ඇත. එය, ලංකා බැංකුව පිළිබඳ තිරසාර මහජන විශ්වාසය හා දිගුකාලීන සාර්ථකත්වයට මූලික වේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වල ආයතනික යහපාලනය පිළිබඳ නිකුත් කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධානයන්ට ප්‍රකාරව ආවරණය කළ යුතු තොරතුරු සහ සුරැකුම් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳ වූ මනා පරිචයන්ගේ සංග්‍රහයට අනුකූලව ද අවශ්‍ය කරන තොරතුරු අනාවරණය කර ඇත.

ලංකා බැංකුවේ යහපාලන ක්‍රියාපටිපාටීන් සහ මනා පාලනයක් පවත්වා ගැනීමට ගන්නා ක්‍රියාමාර්ග පිළිබඳව ද මෙමඟින් විස්තර වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික යහපාලනය පිළිබඳ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධානයන් සමඟ ඇති අනුකූලතා මට්ටම

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (1) මණ්ඩලයේ වගකීම්		
3 (1) (i)	පහත සඳහන් දෑ ක්‍රියාත්මක කිරීම සහතික කිරීම තුළින් බැංකුවේ ආරක්ෂාව හා ශක්තිමත්භාවය වර්ධනය කිරීම සඳහා මණ්ඩලය ක්‍රියාකළ යුතු වන්නේය.	
	(අ) බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ ආයතනික හර පද්ධතීන් අනුමත කිරීම, සුපරීක්ෂණය කිරීම සහ ඒවා සමස්ත බැංකුව තුළ හොඳින් සන්නිවේදනය වන බවට තහවුරු කිරීම.	අනුගමනය කරන ලදී, බැංකුවේ උපාය මාර්ගික අරමුණු සහ හර පද්ධතීන් 2012-2014 කාලපරිච්ඡේදය සඳහා වූ ආයතනික සැලැස්මෙහි අන්තර්ගත වන අතර ඒවා ආයතනික සැලැස්ම දියත් කිරීමේදී සමස්ත බැංකුව පුරා සන්නිවේදනය කරන ලදී.
	(ආ) අවම වශයෙන් ඉදිරි තෙවසර සඳහා වූ මැනිය හැකි ඉලක්ක සහිත අවදානම් ප්‍රතිපත්තිය සහ අවදානම් කළමනාකරණ පිළිවෙත් හා යාන්ත්‍රණයන් ඇතුළත් බැංකුවේ සමස්ත ව්‍යාපාරික උපාය මාර්ග අනුමත කිරීම.	අනුගමනය කරන ලදී, 2012-2014 ආයතනික සැලැස්මෙහි සමස්ත ව්‍යාපාරික උපායමාර්ග අන්තර්ගත වේ. මැනිය හැකි ඉලක්කයන් ඉස්මතු කරමින් ආයතනික සැලැස්ම මත පදනම්ව සකස් කරන ලද ක්‍රියාවලි සැලැස්ම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.
	(ඇ) ප්‍රධාන විභව අවදානම් වර්ග හඳුනාගැනීම සහ අවදානම් විචක්ෂණශීලී ආකාරයෙන් කළමනාකරණය කිරීම සඳහා යෝග්‍ය වූ විධි ක්‍රම ක්‍රියාත්මක කිරීම සහතික කිරීම.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් ප්‍රතිපත්තියෙහි ණය අවදානම, වෙළඳපල අවදානම, මෙහෙයුම් අවදානම, උපායමාර්ගික සහ කීර්තිය පිළිබඳ අවදානම යනාදී සියළුම අවදානම් වර්ග අන්තර්ගත වේ. හඳුනාගත් අවදානම් කළමනාකරණය කිරීමේ කටයුතු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවක් වන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව වෙත පවරා ඇත. ප්‍රධාන අවදානම් නිළධාරී/වැඩ බලන ප්‍රධාන අවදානම් නිළධාරී විසින් විධිමත් ලෙස කමිටුව වෙත ඉදිරිපත් කරන මාසික අවදානම් වාර්තා මඟින් කමිටුව විසින් බැංකුවෙහි අවදානම් කළමනාකරණය කිරීම සිදු කරයි. මෙම වාර්තා අවශ්‍ය නිර්දේශයන්ද සමඟ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීමට පසු එළඹෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම සඳහා ඉදිරිපත් කරයි.
	(ඈ) තැන්පතුකරුවන්, ණය හිමියන්, කොටස්කරුවන් සහ ණයගැතියන් ඇතුළු උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් සමඟ සන්නිවේදනය කිරීම සඳහා වූ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීම අනුමත කිරීම.	අනුගමනය කරන ලදී, උනන්දුවක් දක්වන සියළු පාර්ශවයන් ආවරණය වන පරිදි සකස් කරන ලද සන්නිවේදන ප්‍රතිපත්තිය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ක්‍රියාත්මක කරන අතර, ප්‍රතිපත්ති නිර්ණායකයන්ට අනුකූලව කටයුතු කරන ලදී.
	(ඉ) බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ විශ්වාසනීයත්වය විමර්ශණය කිරීම.	අනුගමනය කරන ලදී, විගණන කමිටුව හරහා ඉදිරිපත් කරන වාර්තා මඟින් බැංකුවේ අභ්‍යන්තර පාලන ක්‍රම සහ කළමනාකරණ තොරතුරු පද්ධතීන්හි ප්‍රමාණවත්භාවය සහ විශ්වාසනීයත්වය, අවශ්‍ය අවස්ථාවන්හිදී නිර්දේශයන් හා හුවාදැක්වීම් ඉදිරිපත් කරමින් මාසිකව විමර්ශනය කරයි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඊ) ජාත්‍යන්තර ගණකාධිකරණ ප්‍රමිතීන්හි අර්ථ දක්වා ඇති ආකාරයට, ප්‍රධාන කළමනාකරණ මඩුල්ල හඳුනාගැනීම සහ ඔවුන් නම් කිරීම. මෙසේ තෝරා පත්කර ගන්නවුන් (i) ප්‍රතිපත්ති කෙරෙහි සැලකිය යුතු බලපෑමක් කළ හැකි (ii) කටයුතු මෙහෙය විය හැකි සහ (iii) ව්‍යාපාරික කටයුතු, ක්‍රියාවලීන් සහ අවදානම් කළමනාකරණය වැනි කටයුතු කෙරෙහි පාලනයක් ඇති කළ හැකි, පුද්ගලයන් විය යුතුය.	අනුගමනය කරන ලදී, ලංකා ගිණුම්කරණ ප්‍රමිත (LKAS) 24 - සම්බන්ධිත පාර්ශව අනාවරණය සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ආයතනික යහපාලනය පිළිබඳ නිකුත් කර ඇති 2007 අංක 11 දරණ විධිවිධානය ප්‍රකාරව බැංකුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලය (අතිරේක අධ්‍යක්ෂවරයා ද ඇතුළුව), මහා කළමනාකරු සහ ආයතනික කළමනාකාරිත්වයේ සාමාජිකයන් (නියෝජ්‍ය මහා කළමනාකරුවන් සහ සමාන ශ්‍රේණීන්හි සිටින නිලධාරීන්) ප්‍රධාන කළමනාකරණ මඩුල්ල ලෙස සලකනු ලබයි.
	(උ) අධ්‍යක්ෂ මණ්ඩලය සහ ප්‍රධාන කළමනාකරණ මඩුල්ලට අයත් අධිකාරිබල ක්ෂේත්‍රය හා ප්‍රධාන වගකීම් නිර්වචනය කිරීම.	අනුගමනය කරන ලදී, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්හි සහ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ මහා කළමනාකරුගේ අධිකාරි බලතල හා වගකීම් පැහැදිලිව නිර්වචනය වෙයි. ප්‍රධාන කළමනාකරණ මඩුල්ලෙහි අධිකාරි බලතල හා වගකීම් රැකියා විස්තරයෙහි හා රැකියා පිරිවිතරයෙහි හඳුනා ගත හැක.
	(ඌ) මණ්ඩලයේ ප්‍රතිපත්තිවලට අනුකූලව, ප්‍රධාන කළමනාකාරිත්ව මඩුල්ල විසින් බැංකුවේ කටයුතු යෝග්‍ය ආකාරයෙන් අධීක්ෂණය කරනු ලබන බවට සහතික කිරීම.	අනුගමනය කරන ලදී, ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව, ආයතනික සැලැස්මේ අරමුණු ඉටුකර ගැනීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීම මඟින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පවත්වාගෙන යන අතර අවශ්‍ය වූ විට ප්‍රධාන කළමනාකරණ පිරිස් කැඳවා ඔවුන්ට අදාල ක්‍රියාවලීන් පිළිබඳ පැහැදිලිකිරීම් ලබා ගනී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඒ) පහත සඳහන් දෑ ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ යහපාලන පරිචයන්හි ඵලදායීතාවය කලින් කලට දැනගැනීම.	අනුගමනය කරන ලදී, නාමයෝජනා සහ ආයතනික යහපාලන කමිටුව මඟින් යහපාලන පරිචයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳව කලින් කලට සමාලෝචනය කරනු ලබයි.
	(i) අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ මඩුල්ල තෝරා ගැනීම, නම් කිරීම සහ පත් කිරීම	මුළුමනින්ම රජයට අයත් බැංකුවක් වන ලංකා බැංකුවෙහි අධ්‍යක්ෂවරුන්, බැංකුව පිහිටුවීමේදී නීතිගත කරන ලද 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුකූලව මුදල් ඇමති විසින් පත් කරනු ලැබේ. මුදල් ඇමතිගේ අනුමැතිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා කළමනාකරු පත්කරනු ලබන අතර, නියෝජ්‍ය මහා කළමනාකරුවන් හා සමාන ශ්‍රේණීන්හි සිටින නිළධාරීන් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කරනු ලබයි.
	(ii) අරමුණු අතර ගැටුම් කළමනාකරණය කිරීම, සහ	අනුගමනය කරන ලදී, අරමුණු අතර ගැටුම් වේ නම් ඒවා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීමේ ක්‍රියාදාමයක් පවතින අතර, සෑම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් ආරම්භයේදීම සාකච්ඡාවට බඳුන් වේ. අරමුණු අතර ගැටුම් කළමනාකරණය පිණිස ඒ සඳහා වූ ප්‍රතිපත්තීන් යොදා ගනියි.
	(iii) දුර්වලතාවයන් නිශ්චය කිරීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී වෙනස්කම් ඇති කිරීම.	අනුගමනය කරන ලදී, යහපාලන පරිචයන්ගේ කිසියම් දුර්වලතාවයක් වේ නම් එය ඉහත සඳහන් කළ නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව මඟින් අදාල යහපාලන පරිචයන්ට අනුකූලතාවය පිරික්සන සමස්ත ඇගයීම් ක්‍රියාවලියේදී පරීක්ෂා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ වාර්ෂික කාර්යසාධන ඇගයීම්හි සාරාංශයක් මඟින් දුර්වලතාවයන් සහ වෙනස්කම් ඇති කිරීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සාකච්ඡා කිරීම සහ තීරණ ගැනීම සිදුවේ.
	(ඓ) ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සඳහා යෝග්‍ය වූ අනුප්‍රාප්තික සැලසුමක් බැංකුවට පවතින බවට සහතික කිරීම.	අනුගමනය කරන ලදී, ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සඳහා යෝග්‍ය වූ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අනුප්‍රාප්තික සැලසුමක් බැංකුවට පවතී.
	(ඔ) ප්‍රතිපත්ති සමාලෝචනය කිරීම, සන්නිවේදන මාර්ග පිහිටුවීම සහ ආයතනික අරමුණු මුදුන්පත් කර ගැනීමේ ප්‍රගතිය විමර්ශනය කිරීම යනාදිය සඳහා අවශ්‍යතාවයන් අනුව නිතිපතා ප්‍රධාන කළමනාකරණ මඩුල්ල සමග රැස්වීම් පැවැත්වීම.	අනුගමනය කරන ලදී, අවශ්‍යතාවය පරිදි ප්‍රධාන කළමනාකරණ මඩුල්ල අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා කැඳවන බව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර්තා මඟින් තහවුරු වේ.
	(ඕ) නියාමන පරිසරය අවබෝධ කර ගැනීම සහ නියාමකයින් සමඟ බැංකුව ඵලදායී සම්බන්ධතාවයක් පවත්වා ගන්නා බවට සහතික කිරීම.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂවරුන් ලෙස පත් වීමේදී සියලුම නියාමන අවශ්‍යතාවයන් හා අදාළ වන ආයතනික යහපාලන මූලධර්ම පිළිබඳව අන්තර්ගත වන ලිපි ගොනුවක් අලුතින් නිකුත්වන විධිවිධාන හා චක්‍රලේඛන පිළිබඳව ද ඔවුන් දැනුවත් කරයි.
	(ක) බාහිර විගණකයන් බඳවා ගැනීමේදී සහ අධීක්ෂණය කිරීමේදී නිසි ප්‍රවේශම් සහගතභාවයකින් යුතුව කටයුතු කිරීම.	අනුගමනය කරන ලදී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනයන්ට අනුව, විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (1) (ii)	මෙම නියමයන්ගේ 3(5) නියමයේ දක්වා ඇති ආකාරයට මණ්ඩලය විසින් සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී පත් කිරීමත්, ඔවුන්ගේ කාර්යයන් හා වගකීම් නිශ්චය කර අනුමත කිරීමත් කළයුතු වන්නේය.	1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව මුදල් ඇමතිගේ පූර්ව අනුමැතිය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා කළමනාකරු නමින් හඳුන්වන බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියා පත්කරනු ලබයි. සභාපතිතුමාගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි සඳහන් වේ.
3 (1) (iii)	මණ්ඩලය නිතිපතා රැස්විය යුතු අතර, ආසන්න වශයෙන් මාසික පරතරයක් සහිතව අවම වශයෙන් වසරකට දොලොස් වරක් වත් මණ්ඩලයේ රැස්වීම් පැවැත්විය යුතු ය. එවැනි රැස්වීම්වල දී පැමිණීමට අයිතිය ඇත්තා වූ අධ්‍යක්ෂවරුන් බහුතරයකගේ පුද්ගලික ක්‍රියාශීලී සහභාගිත්වය තිබිය යුතු ය. ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය තුළින් මණ්ඩලයේ කැමැත්ත ලබාගැනීම හැකිතාක් දුරට වැළැක්විය යුතු වේ.	අනුගමනය කරන ලදී, 2012 වර්ෂය තුළදී, විශේෂ රැස්වීම් 06ක් ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 29ක් පවත්වන ලද අතර මෙම රැස්වීම් සඳහා අධ්‍යක්ෂවරුන් සක්‍රීයව සහභාගී විය. ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනීම හැකිතාක් දුරට අවම කර ඇත. සමාලෝචනයට භාජනය වූ වසර තුලදී ලිඛිත යෝජනා/පත්‍රිකා ආදිය තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයේ කැමැත්ත ලබා ගැනුණේ එක් වතාවකදී පමණි.
3 (1) (iv)	මණ්ඩලයේ රැස්වීම් සඳහා වූ න්‍යාය පත්‍රයට විෂයන් හා යෝජනා ඇතුළත් කිරීමට අධ්‍යක්ෂවරුන්ට හැකියාව ලැබෙන අයුරින් නිසි පියවර ගෙන ඇති බවට මණ්ඩලය විසින් සහතික කළ යුත්තේය. ඒවා බැංකු ව්‍යාපාරික කටයුතු හා අවදානම් කළමනාකරණය වර්ධනය කිරීමට අදාළ වූ විෂයයන් හා යෝජනා විය යුතුය.	අනුගමනය කරන ලදී, මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි අන්තර්ගත වේ.
3 (1) (v)	සියලුම අධ්‍යක්ෂවරුන්ට අවස්ථාවක් ලබාදීමේ අරමුණින් සාමාන්‍ය මණ්ඩල රැස්වීම් සඳහා අවම වශයෙන් දින 7 ක පෙර දැනුම්දීමක් කරන බව මණ්ඩල පටිපාටියක් විසින් සහතික කළ යුත්තේය. අනෙකුත් මණ්ඩල රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කළ හැකිය.	අනුගමනය කරන ලදී, වර්ෂය තුල පැවැත්වෙන අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳ ලේඛනයක් සකස් කර වර්ෂ ආරම්භයට පෙරාතුව එය අධ්‍යක්ෂ මණ්ඩලයට ලබාදීම සිදු කරයි. තවද, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමක් අවසන් වූ වහාම ඊළඟ රැස්වීම පිළිබඳ දැනුම් දෙනු ලබන අතර සාමාන්‍ය මණ්ඩල රැස්වීමකට දින 07කට පෙරාතුව ඒ පිළිබඳ දැනුවත් කරයි. අනෙකුත් විශේෂ රැස්වීම් සඳහා සාධාරණ පෙර දැනුම්දීමක් කරනු ලැබේ.
3 (1) (vi)	පසුගිය මාස 12 ක කාලය තුළ පැවැත්වූ රැස්වීම් වාර අඩුම වශයෙන් 2/3 කට සහභාගි නොවුණ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ පසුගිය රැස්වීම් වාර 3 කට අඛණ්ඩව සහභාගි නොවුණු අධ්‍යක්ෂවරයෙකුගේ හෝ අධ්‍යක්ෂ ධූරය අහිමි වන බවට මණ්ඩල පටිපාටිය මගින් සහතික කළයුතු ය. විකල්ප අධ්‍යක්ෂවරයෙකු මාර්ගයෙන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලට සහභාගිවීම, නිසි පැමිණීමක් ලෙස පිළිගත හැකිය.	සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුලදී මෙවැනි තත්ත්වයක් උදා වී නොතිබුණි.
3 (1) (vii)	1988 අංක 30 දරණ බැංකු පනතේ 43 වගන්තියේ දැක්වෙන විධි විධාන සපුරන්නා වූ සමාගම් ලේඛකාධිකාරිවරයෙකු මණ්ඩලය විසින් පත් කළ යුත්තේය. ඔහුගේ මූලික වගකීම් විය යුත්තේ මණ්ඩලය හා කොමසාරිස්වරයාගේ රැස්වීම් සඳහා ලේඛකාධිකාරී සේවා ලබාදීම සහ අණපනත්වල හා වෙනත් නියාමනයන් මඟින් දන්වා ඇති අනෙකුත් කාර්යයන් කිරීමත්ය.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්තුමිය නීතිඥවරියක වන අතර 1988 අංක 30 දරන බැංකු පනතේ 43 වගන්තියේ විධිවිධාන ඇය විසින් සපුරාලනු ලබයි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (1) (viii)	මණ්ඩලයේ පටිපාටීන් සහ අදාළ සියලු රීති හා නියාමනයන් පිළිපදින බව සහතික කරනු පිණිස සියලුම අධ්‍යක්ෂවරුන්ට සමානව ලේඛකාධිකාරීවරයාගේ උපදෙස් හා සේවා ලබාගැනීම සඳහා අවකාශය තිබිය යුතු ය.	අනුගමනය කරන ලදී, මෙම වැඩපිළිවෙල ක්‍රියාත්මක වන අතර අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි දක්වා ඇත.
3 (1) (ix)	මණ්ඩල රැස්වීම්වල වාර්තා ලේඛකාධිකාරීවරයා විසින් පවත්වා ගතයුතු අතර, ඕනෑම සාධාරණ වේලාවක දී සාධාරණ දැනුම්දීමකින් පසු ඕනෑම අධ්‍යක්ෂවරයෙකුට එවැනි වාර්තා පරීක්ෂා කිරීම සඳහා විවෘතව පැවතිය යුතු ය.	අනුගමනය කරන ලදී, සියලුම මණ්ඩල රැස්වීම් වල වාර්තා විශේෂ තොරතුරු තාක්ෂණ ක්‍රමවේදයක් (විශේෂ මෘදුකාංග පද්ධතියක් සමඟ ipads පහසුකම ලබාදීමෙන්) හරහා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට බෙදා හරියි. අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ට පහසුවෙන් ලබාගත හැකි වන පරිදි සියලු වත්මන් හා පූර්ව මණ්ඩල රැස්වීම් වල වාර්තා එම පද්ධතියට අන්තර්ගත කර ඇත.
3 (1) (x)	මණ්ඩලය නිසි සැලකිල්ලෙන් හා විචක්ෂණශීලී බවකින් කටයුතු කළා ද යන්න වාර්තා මඟින් තොරතුරු ලබාගත හැකිවන ආකාරයෙන්, මණ්ඩල රැස්වීම්වල වාර්තා ප්‍රමාණවත් අයුරින් විස්තරාත්මක විය යුතු ය. මණ්ඩල රැස්වීම් වලදී ඇතිවන සාකච්ඡාවන්ගේ ගැඹුරු බව පිළිබඳ තක්සේරු කිරීමට මෙම වාර්තා නියාමන හා අධීක්ෂණ අධිකාරීන්ට උපකාරී විය යුතු ය. එම නිසා මණ්ඩල රැස්වීම් වාර්තා තුළ පහත දෑ පැහැදිලිව ඇතුළත් විය යුතුය. (අ) මණ්ඩලය තම සාකච්ඡා සඳහා භාවිතා කරනු ලැබූ තොරතුරු හා දත්ත පිළිබඳ සාරාංශයක්. (ආ) මණ්ඩලය විසින් සලකා බැලීමට යෙදුන විෂය කරුණු. (ඇ) මණ්ඩලය විසින් තම යුතුකම් නිසි සැලකිල්ලෙන් හා ප්‍රවේශම් සහගත භාවයකින් යුතුව කරගෙන යන්නේ ද යන්න පිළිබඳ තොරතුරු ලබාදිය හැකි, තොරතුරු රැස්වීමේ සාකච්ඡා සහ මතභේදයට හෝ විරෝධයට බඳුන් වූ විෂය කරුණු. (ඈ) මණ්ඩලයේ උපාය මාර්ග හා ප්‍රතිපත්ති සහ අදාළ නීති හා නියාමනයන් වලට අනුකූල වන බව විදහාපාන්නා වූ, අදාළ විධායකයින් විසින් කරනු ලබන සාක්ෂිදීම් සහ සනාථ කිරීම්. (ඉ) බැංකුව මුහුණ දී සිටින අවදානම් වලින් ද මණ්ඩලයේ දැනුම හා අවබෝධය සහ අනුගමනය කළා වූ අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග වලින් ද සමස්ත නිරීක්ෂණයක් සහ (ඊ) තීරණ සහ මණ්ඩල යෝජනා	අනුගමනය කරන ලදී, විස්තරාත්මක අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා මඟින් මෙම මූලධර්මවලට අදාළ කරුණු ආවරණය වේ.
3 (1) (xi)	යෝග්‍ය අවස්ථාවන්හි දී, සාධාරණ ඉල්ලීම් මත, බැංකුවේ වියදමින් ස්වාධීන වෘත්තීයමය උපදෙස් පැතීම සඳහා අධ්‍යක්ෂවරුන්ට අවස්ථා ලබාදෙන මණ්ඩලය විසින් එකඟ වූ පටිපාටියක් තිබිය යුත්තේය. අදාළ අධ්‍යක්ෂවරයෙකුට හෝ අධ්‍යක්ෂවරුන්ට ඔහුගෙන්/ඇයගෙන්/ඔවුන්ගෙන් බැංකුවට ඉටුවිය යුතු යුතුකම් ඉටුකිරීම සඳහා ආධාර වීම පිණිස වෙනම ස්වාධීන වෘත්තීයමය උපදෙස් අධ්‍යක්ෂවරුන්ට ලබාදීම මණ්ඩලය විසින් සිදුකළ යුතුය.	අනුගමනය කරන ලදී, ස්වාධීන වෘත්තීමය උපදෙස් පැතීම සඳහා බැංකුව විසින් අධ්‍යක්ෂවරුන්ට අවස්ථාව සලසා ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී අධ්‍යක්ෂ මණ්ඩලය එවැනි උපදෙස් කරා යොමුවෙයි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (1) (xii)	අනෙකුත් සංවිධාන හෝ සම්බන්ධිත පාර්ශවයන් සමඟ කටයුතු කිරීමේදී සහ ඒවාට ඇති බැඳීම්වල දී, අරමුණු අතර ගැටුම් ඇතිවීම හෝ එවැනි ගැටුම් ඇති බව පෙන්නුම් කිරීම අධ්‍යක්ෂවරුන් විසින් වළක්වා ගතයුත්තේය. මණ්ඩලය විසින් සැලකිල්ලට භාජනය කිරීමට ඇති සහ මණ්ඩලය විසින් සැලකිය යුතු වැදගත්කමකින් යුතු විෂය කරුණක් බව නිශ්චය කර ඇති, විෂය කරුණක් සම්බන්ධයෙන් යම් අධ්‍යක්ෂවරයෙකුට අරමුණු අතර ගැටුමක් තිබේ නම්, එවැනි විෂය කරුණු සාකච්ඡාවට බඳුන් කළ යුත්තේ අදාළ විෂය කරුණ සම්බන්ධයෙන් කිසිදු සැලකිය යුතු හිමිකමක් නොමැති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් (මෙම නියමයන්ගේ 3(2)(iv) නියමය බලන්න) සහභාගි වන මණ්ඩල රැස්වීමක දීය. තවද, ඔහුට/ඇයට හෝ ඔහුගේ/ඇයගේ සමීප ඥාතියෙකුට හෝ අධ්‍යක්ෂවරයෙකුට සැලකිය යුතු හිමිකමක් ඇත්තා වූ ව්‍යාපාරයකට සම්බන්ධතාවයක් ඇති කිසිදු මණ්ඩල යෝජනාවක දී අධ්‍යක්ෂවරයෙකු විසින් ඡන්දය දීමෙන් වැළකී සිටිය යුතුය. එසේම එම මණ්ඩල රැස්වීම් න්‍යාය පත්‍රයේ අදාළ අධීක්ෂණය සඳහා ඝණපූරණය ගණන් බැලීමේ දී ඔහු/ඇය ඊට ඇතුළත් නොකළ යුතු ය.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද, අරමුණු අතර ගැටුම් සඳහා වූ ප්‍රතිපත්තීන් යොදා ගෙන ඇත. තවද, සාමාන්‍යයෙන් සෑම මණ්ඩල රැස්වීමකදීම (සති 02 කට වරක් පවත්වනු ලබන) අධ්‍යක්ෂවරුන් විසින්, අරමුණු අතර ගැටුම් වේ නම් හෝ වෙනත් අධ්‍යක්ෂ මණ්ඩල හෝ ආයතන වලට නව පත්වීම් ලැබුවේ නම් හෝ ඒවා ප්‍රකාශයට පත්කළ යුතු වේ.
3 (1) (xiii)	බැංකුවේ මෙහෙයවීම හා පාලනය ස්ථිරසාර ලෙස තම අධිකාරිය යටතේ පවතින බව සහතික කිරීම පිණිස, තම තීරණ ගැනීම සඳහා තමන්ට විශේෂයෙන් වෙන් කරන ලද්දා වූ විෂය ක්ෂේත්‍රයන් පිළිබඳ විධිමත් උප ලේඛනයක් මණ්ඩලය විසින් තබාගත යුතුය.	අනුගමනය කරන ලදී, අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියේ, අධ්‍යක්ෂ මණ්ඩලයට හිමි බලතල දක්වයි.
3 (1) (xiv)	බැංකුවට තම වගකීම් ගෙවීමට නොහැකි යැයි හෝ නොහැකිවීමට ඉඩ ඇතැයි හෝ බැංකුව බුන්වත් වීමට ආසන්න යැයි හෝ තැන්පතුකරුවන්ට සහ අනෙකුත් ණය හිමියන්ට නියමිත ගෙවීම් අත්හිටුවීමට ආසන්න යැයි හෝ බැංකුව සළකන්නේ නම්, වෙනත් කිසිම තීරණයක් හෝ ක්‍රියාවක් ගැනීමට පෙර වහාම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බැංකුවේ තත්ත්වය පිළිබඳව බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයාට දැන්විය යුතු වේ.	2012 වර්ෂය තුළදී මෙවැනි තත්ත්වයන් මතු නොවුණි. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන මාසික මූල්‍ය වාර්තා මඟින් බැංකුවේ නුබුන්වත්බව සහතික කෙරේ.
3 (1) (xv)	ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය සහ අනෙකුත් විචක්ෂණශීලී පදනම් අනුව මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති මට්ටම්වලට අනුකූල වන මට්ටමක බැංකුවේ ප්‍රාග්ධනය පවතින බවට මණ්ඩලය විසින් සහතික කළයුතු ය.	බැංකුව මුදල් මණ්ඩලයේ ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අවශ්‍යතාවයන්ට පූර්ණ අනුකූලතාවයක් දක්වයි. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන මාසික මූල්‍ය වාර්තාවන්හි ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාතය පිළිබඳ විස්තර කරයි. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත සඳහා පිටු අංක 64 පරිශීලනය කරන්න.
3 (1) (xvi)	මෙම නියමයන්ගේ 3 වැනි නියමයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් වූ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවක්, මණ්ඩලය විසින් බැංකුවේ වාර්ෂික වාර්තාව තුළින් ප්‍රසිද්ධ කළයුතු ය.	මෙම නියමයන්ගේ 3 වැනි නියමයෙහි සඳහන් අවශ්‍යතාවයන්ට අනුකූලතාවය දක්වමින් ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවක් බැංකුවේ වාර්ෂික වාර්තාවේ පළකරයි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (1) (xvii)	වාර්ෂිකව සෑම අධ්‍යක්ෂවරයෙකු විසින්ම ස්වයං ඇගයීමක් කිරීම සඳහා වූ ක්‍රමයක් මණ්ඩලය විසින් අනුගමනය කළයුතු අතර, එවැනි ඇගයීම්වල වාර්තා තබා ගතයුතු වන්නේය.	අනුගමනය කරන ලදී. වාර්ෂිකව අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ ස්වයං ඇගයීමක් කරනු ලබන අතර එවැනි ඇගයීම් වල වාර්තා පවත්වා ගනී. මෙම ඇගයීම් ක්‍රියාවලිය සඳහා නාමයෝජනා හා ආයතන යහපාලන කමිටුව පහසුකම් සලසයි.
3 (2) **මණ්ඩලයේ සංයුතිය**		
3 (2) (i)	මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාව 7ට වඩා අඩු නොවිය යුතු අතර, 13ට වඩා වැඩි නොවිය යුතුය.	1938 අංක 53 දරණ ලංකා බැංකු පනතට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු අධ්‍යක්ෂවරුන්ගේ සංඛ්‍යාව 6ක් වන අතර වත්මන් අධ්‍යක්ෂ මණ්ඩලය අධ්‍යක්ෂවරු 6 දෙනෙකුගෙන් සමන්විත වේ. මෙම විධිවිධානයට අනුකූල වන පරිදි ලංකා බැංකු ආඥා පනත සංශෝධනය කිරීමට බැංකුව විසින් පියවර ගනිමින් පවතී.
3 (2) (ii)	(අ) ප්‍රධාන විධායක නිලධාරී තනතුරේ සිටින අධ්‍යක්ෂවරයා හැර, අධ්‍යක්ෂවරයෙකුගේ මුළු සේවා කාලය වසර 9 නොඉක්මවිය යුතු අතර, එම සේවා කාලයට 2008 ජනවාරි 01 දින දක්වා එවැනි අධ්‍යක්ෂවරයෙකු එම ධූරයේ සේවය කරන ලද මුළු කාලයද ඇතුළත් විය යුත්තේය.	ලංකා බැංකුවේ වත්මන් අධ්‍යක්ෂවරුන් වසර 9කට වඩා අඩු සේවා කාලයක් එම තනතුරේ සේවය කර ඇත. වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ පත්වීම් පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ අධ්‍යක්ෂවරුන්ගේ විස්තර යටතේ පිටු අංක 34 සිට 37 දක්වා සඳහන් කර ඇත.
	(ආ) මෙහිදී, පහත සඳහන් සාමාන්‍ය නිදහස් කිරීම අදාළ විය යුතුය. 2008 ජනවාරි 01 දිනට වසර 09 ක සේවා කාලය සම්පූර්ණ කළ අධ්‍යක්ෂවරයෙකුට හෝ 2008 දෙසැම්බර් 31 දිනට පෙර එය සම්පූර්ණ කළ අධ්‍යක්ෂවරයෙකුට 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන උපරිම වසර 3 ක කාලසීමාවක තවදුරටත් සේවාව සැපයිය හැක.	අදාළ නොවේ.
3 (2) (iii)	විධායක අධ්‍යක්ෂවරුන් ගණන මණ්ඩලයේ සිටින අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් තුනෙන් එකක ප්‍රමාණය නොඉක්මවන පරිදි බැංකු සේවකයකු බැංකුවේ අධ්‍යක්ෂවරයකු ලෙස (මින් මතු විධායක අධ්‍යක්ෂවරුන් ලෙස හඳුන්වන) පත් කිරීමට, තෝරා ගැනීමට හෝ නම් කිරීමට හැකිය. එවැනි අවස්ථාවකදී එක් විධායක අධ්‍යක්ෂවරයකු ප්‍රධාන විධායක නිලධාරී ලෙස පත්කළ යුතු ය.	ලංකා බැංකුවේ කිසිම සේවකයෙකු අධ්‍යක්ෂවරයකු ලෙස පත් කර නොමැති අතර එනිසා ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තුළ විධායක අධ්‍යක්ෂවරුන් කිසිවකු නොමැත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (2) (iv)	මණ්ඩලය ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් හෝ මුළු අධ්‍යක්ෂවරුන් ගණනින් තුනෙන් එක යන දෙකෙන් වැඩි ගණනකින් සමන්විත විය යුතු ය. මෙම අනු විධානය අදාළ වන්නේ 2010 ජනවාරි 01 දිනෙන් පසුවය. විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් පහත සඳහන් දෑට යටත් වන්නේ නම් ඔහු/ඇය ස්වාධීන අයෙක් ලෙස නොසැලකේ. අ) බැංකුවේ කොටස් හිමිකාරිත්වයෙන් 1% කට වඩා සෘජු ලෙස හෝ වක්‍ර ලෙස අත්කර ගෙන සිටීම. ආ) දැනට හෝ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර 2 ක කාල පරිච්ඡේදයක් තුළ මෙහි 3(7) වන වගන්තියෙන් දක්වන පරිදි, බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන කිසිදු ව්‍යාපාරික ගනුදෙනුවක වර්තමානයේ යෙදී සිටීම/ යෙදී සිට තිබීම. ඇ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්වීමට පෙර ආසන්න වසර දෙකක කාලයක් තුළ බැංකුවේ සේවා නියුක්ත වී සිට තිබීම. ඈ) කිට්ටු ඥාතිත්වයක් ඇති අධ්‍යක්ෂවරයෙක් හෝ ප්‍රධාන විධායක නිලධාරියෙක් හෝ ජ්‍යෙෂ්ඨ විධායක කළමනාකාරිත්වයේ සාමාජිකයෙක් හෝ වෙනත් සැලකිය යුතු කොටස් හිමිකරුවෙක් බැංකුවේ හෝ වෙනත් බැංකුවක සිටීම. මෙහි අරමුණ සඳහා, සමීප ඥාතියකු, යන්නෙන් අදහස් වන්නේ කාලත්‍රයා හෝ මූල්‍යමය වශයෙන් යැපෙන්නා වූ ළමයෙකි. ඉ) බැංකුව පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශවයන් නියෝජනය කිරීම. ඊ) පහත දැක්වෙන සමාගමක හෝ ව්‍යාපාරික ආයතනයක සේවකයෙකු හෝ අධ්‍යක්ෂවරයෙකු හෝ සැලකිය යුතු කොටස්කරුවෙකු වීම. I. පහත 3(7) විධානයේ දැක්වෙන පරිදි බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක බැංකුව සමඟ වර්තමානයේ සිටින හෝ II. බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරුන් සේවයේ යෙදී සිටින හෝ අධ්‍යක්ෂවරයෙක් වන හෝ සැලකිය යුතු කොටස් හිමියකු වී සිටින හෝ III. මෙම විධානයන්ගේ 7 වන විධානයේ දක්වා ඇති පරිදි බැංකුවේ වෙනත් යම් අධ්‍යක්ෂවරයෙක් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් 10% ඉක්මවන ගනුදෙනුවක යෙදී සිටින	අනුගමනය කරන ලදී. ලංකා බැංකුවේ සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වේ. ඒ අතරින් තිදෙනෙකු මෙම විධිවිධානයට අනුව ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස හඳුනාගත හැකිය. පිටු අංක 34 සිට 37 දක්වා අධ්‍යක්ෂවරුන්ගේ විස්තර යටතේ සහ පහත සඳහන් විධිවිධාන අංක 3(2)(viii) හි ඔවුන්ව දක්වා ඇත.
3 (2) (v)	ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නියෝජනය කිරීම සඳහා විකල්ප අධ්‍යක්ෂවරයෙකු පත් කර ඇති විටක එසේ පත් කරන ලද පුද්ගලයා ද ස්වාධීන අධ්‍යක්ෂවරයෙකුට අදාළ වන මිනුම් දඬු සම්පූර්ණ කළයුතු ය.	ස්වාධීන අධ්‍යක්ෂවරුන් ලෙස විකල්ප අධ්‍යක්ෂවරු පත්කර නොමැත.
3 (2) (vi)	විධායක නොවන අධ්‍යක්ෂවරුන් ප්‍රමාණවත් තරමේ කීර්තිමත් පෙර වාර්තා සහිත ඉහළ හැකියාවකින් යුතු පුද්ගලයන් විය යුතු අතර, ක්‍රමෝපාය, කාර්යසාධනය සහ සම්පත් පිළිබඳව මතුවන ගැටළුවලට ස්වාධීන වූ තීරණ ගැනීමේ පළපුරුද්ද සහ හැකියාවන්ගෙන් ද යුක්ත විය යුතු ය.	අනුගමනය කරන ලදී. පිටු අංක 34 සිට 37 දක්වා වූ වත්මන් අධ්‍යක්ෂවරුන්ගේ විස්තරයෙහි අවශ්‍ය තොරතුරු දක්වා ඇත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (2) (vii)	මණ්ඩලයේ රැස්වීමක් පැවැත්වීම සඳහා අවශ්‍ය අධ්‍යක්ෂවරුන්ගේ ඝනපූරණය සම්පූර්ණ වුවද, එම රැස්වීමට සහභාගි වන අධ්‍යක්ෂවරුන්ගේ ගණනින් භාගයකට වඩා විධායක නොවන අධ්‍යක්ෂවරුන් සිටිය යුතු අතර, එසේ නොවේ නම් එවැනි රැස්වීමක් නිසි පරිදි පවත්වන ලද්දක් නොවනු ඇත. මෙම අනු විධානය බලපැවැත්වෙනුයේ 2010 ජනවාරි 01 දින සිටය.	අනුගමනය කරන ලදී. ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි සියලුම අධ්‍යක්ෂවරු විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (2) (viii)	සියලුම ආයතනික සන්නිවේදන කටයුතුවලදී බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ නම් හෙළි කිරීමේ දී ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් එවැනි විධායක නොවන අධ්‍යක්ෂවරුන් ලෙස නිශ්චිතව හඳුනාගත යුතු ය. සභාපති, විධායක අධ්‍යක්ෂ, විධායක නොවන අධ්‍යක්ෂ සහ ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරුන් නම් සහිතව මණ්ඩලයේ සංයුතිය සමන්විත වන අධ්‍යක්ෂවරුන්ගේ වර්ගීකරණයක් බැංකුව විසින් තම වාර්ෂික යහපාලන වාර්තා මඟින් අනාවරණය කළයුතු ය.	අනුගමනය කරන ලදී. 2012 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සංයුතිය පහත දැක්වේ. • ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ • එස් ආර් ආටිගල මහතා - විධායක නොවන නිල බලයෙන් අධ්‍යක්ෂ හෝ එස් ආර් ආටිගල මහතා සහභාගී නොවන අවස්ථාවල වී කනගසබාපති මහතා- විකල්ප අධ්‍යක්ෂ වශයෙන් සහභාගී වේ. • ආර් සිවරාමන් මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ • නලිනි අබේවර්ධන මෙනවිය - විධායක නොවන අධ්‍යක්ෂ • චන්ද්‍රසිරිද සිල්වා මහතා - විධායක නොවන අධ්‍යක්ෂ • කේ චල් හේවගේ මහතා - ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ කෙසේ වුවද, 2013 ජනවාරි 09 වන දින සිට රාසික් සරූක් මහතා සභාපති ලෙස පත්වූ අතර, 2013 ජනවාරි 30 දින සිට ආර් එම් ඒ රත්නායක මහතා එස් ආර් ආටිගල මහතාට විකල්ප අධ්‍යක්ෂවරයෙකු ලෙස 2013 ජනවාරි 22 දින සිට විකල්ප අධ්‍යක්ෂ ධූරයෙන් ඉවත් වූ වී කනගසභාපති මහතා වෙනුවෙන් පත් විය.
3 (2) (ix)	මණ්ඩලයට නව අධ්‍යක්ෂවරුන් පත් කිරීම සඳහා වූ විධිමත්, සිතාමතා සකස් කරන ලද විනිවිදභාවයෙන් යුක්ත ක්‍රියාපටිපාටියක් තිබිය යුතුය. එසේම මණ්ඩලයට අනුප්‍රාප්තිකයන් පත් කිරීම සිදු කිරීම සඳහා ක්‍රියාපටිපාටියක් ද තිබිය යුතු ය.	මුදල් අමාත්‍යවරයා විසින් 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්ට අනුව පත්කිරීම් සිදුකරන හෙයින් මෙය අදාළ නොවේ.
3 (2) (x)	තාවකාලික ඇබෑර්තු පිරවීම සඳහා පත් කරනු ලැබූ සියලුම අධ්‍යක්ෂවරුන් එම පත් කිරීම්වලින් පසුව එළඹෙන පළවෙනි මහා සභා රැස්වීමේදී කොටස්කරුවන්ගේ ඡන්දයෙන් තෝරා පත්කර ගැනීමට යටත් විය යුතු ය.	මුදල් අමාත්‍යවරයා විසින් පත්කිරීම් සිදු කරන හෙයින් මෙය අදාළ නොවේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (2) (xi)	අධ්‍යක්ෂවරයෙක් සිය ධූරයෙන් ඉවත් කරන ලද්දේ නම් හෝ ඉල්ලා අස්වූයේ නම් මණ්ඩලය විසින්, (අ) අධ්‍යක්ෂවරයාගේ ඉල්ලා අස්වීමේ හෝ ඉවත් කිරීමේ හේතූන් එම අධ්‍යක්ෂවරයා බැංකුව සමඟ එකඟ නොවීමට අදාළ තොරතුරු තිබේ නම් එම තොරතුරු ද සමඟ ප්‍රසිද්ධ කළයුතුය. (ආ) කොටස්කරුවන්ගේ අවධානයට ලක්විය යුතු කිසියම් කරුණක් තිබීම හෝ නොතිබීම සහතික කරමින් ප්‍රකාශනයක් නිකුත් කළ යුතුය.	2012 වර්ෂය තුළදී අධ්‍යක්ෂවරුන් කිසිවකු ඉල්ලා අස්වීම හෝ ඉවත් වීම සිදු නොවුණි. කෙසේ වෙතත්, සභාපති වශයෙන් කටයුතු කළ ගාමිණී වික්‍රමසිංහ මහතා පෞද්ගලික හේතූන් මත 2013 ජනවාරි 08 වන දින ඉල්ලා අස්වූයේය. රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගැනීම හේතුවෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයෙන් ඉවත් වූ, එස් ආර් ආටිගල මහතාට විකල්ප අධ්‍යක්ෂ ලෙස කටයුතු කළ, නිල බලයෙන් අධ්‍යක්ෂ වී කනගසභාපති මහතා 2013 ජනවාරි 22 දින සිට බලපැවැත්වෙන පරිදි එම ධූරයෙන් ඉවත් වූයේය. බැංකුවේ එකම කොටස්හිමියා වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් අමාත්‍යවරයා විසින් පත්කිරීම් හා ඉවත් කිරීම් සිදු කරයි. ඉල්ලා අස්වීමක් වේ නම් එයද එම අමාත්‍යවරයාට යොමු කරයි.
3 (2) (xii)	බැංකුවේ අධ්‍යක්ෂවරයෙක් හෝ සේවකයෙක් බැංකුවේ පරිපාලිත සමාගමක් හෝ ආශ්‍රිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයෙක් ලෙස පත්කිරීම, තෝරා ගැනීම හෝ නම් කිරීම නොකළ යුතුය.	2008 අංක 41 දරණ ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යටතේ ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ නිලබලයෙන් අධ්‍යක්ෂවරයෙකු ලෙස බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නාමයෝජනා කරන ලද නියෝජ්‍ය මහා කළමනාකරු පත් කිරීම හැර ලංකා බැංකුවේ වෙනත් අධ්‍යක්ෂවරයෙකු හෝ සේවකයකු පරිපාලිත සමාගමක් නොවන වෙනත් බැංකුවක අධ්‍යක්ෂවරයකු ලෙස කටයුතු නොකරයි.
3 (3) **අධ්‍යක්ෂවරුන්ගේ යෝග්‍යතාවය සහ උචිතභාවය ඇගැයීමේ නිර්ණායක**		
3 (3) (i)	අධ්‍යක්ෂවරයකු වශයෙන් සේවය කරන පුද්ගලයකුගේ වයස අවුරුදු 70 නොඉක්මවිය යුතු ය. මෙවැනි අවස්ථාවලදී පහත දැක්වෙන සාමාන්‍ය නිදහස් කිරීම් අදාළ වන්නේය. 2008 ජනවාරි 01 දිනට වයස අවුරුදු 70 සපුරන හෝ 2008 දෙසැම්බර් 31 දිනට පෙර වයස අවුරුදු 70 සපුරන අධ්‍යක්ෂවරයෙකුට 2009 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන උපරිම වසර 3 ක කාලසීමාවක තවදුරටත් රාජකාරියේ යෙදිය හැක.	වත්මන් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සියලු දෙනාම වයස අවුරුදු 70ට අඩු පුද්ගලයින් වන නිසා මෙම ඊතියට අනුකූල වේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (3) (ii)	පුද්ගලයකු විසින් බැංකුවේ පාලිත සමාගම් හෝ ආශ්‍රිත සමාගම් ද ඇතුළත්ව සමාගම්/ ඒකකයන්/ ආයතන 20 කට වඩා වැඩි ප්‍රමාණයක අධ්‍යක්ෂ තනතුර දැරිය නොයුත්තේය. එම සමාගම්/ ඒකක/ ආයතන 20 න්, 10 කට නොවැඩි ප්‍රමාණයක්, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගණකාධිකරණ හා විගණන ප්‍රමිත පනතේ විශේෂිත ව්‍යාපාරික ඒකකයක් ලෙස වර්ගීකරණය කර ඇති ඒවා විය යුතු ය.	අනුගමනය කරන ලදී.
3 (3) (ii) (අ)	මෙවැනි අවස්ථාවකදී පහත සඳහන් සාමාන්‍ය නිදහස් කිරීම් අදාළ වේ. ඉහත දැක්වූ සීමාවන් ඉක්මවා ගිය පුද්ගලයෙකු වේනම්, එවැනි පුද්ගලයෙකු 2009 ජනවාරි 01 දින සිට උපරිම වසර 03 ක කාලයක් තුළ දී ඉහත සඳහන් කළ සීමාවන් සමඟ අනුකූල වීම සහ මුදල් මණ්ඩලය දැනුවත් කරයි.	අදාළ නොවේ.
3 (4) මණ්ඩලය විසින් පවරා ඇති කළමනාකරණ කාර්යයන්		
3 (4) (i)	බලතල පවරා දීම සඳහා පවතින ක්‍රියාවලිය අධ්‍යක්ෂවරුන් විසින් සුපරීක්ෂාකාරීව අධ්‍යයනය කිරීම හා නිරවුල්ව අවබෝධ කර ගැනීම කළයුතු ය.	අනුගමනය කරන ලදී. 1938 අංක 53 දරණ ලංකා බැංකු පනත හා එහි සංශෝධන අධ්‍යක්ෂ මණ්ඩලයේ බලතල පවරාදීම දක්වයි. මහා කළමනාකරු පත් කිරීමේ බලතල හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ අනෙකුත් බලතල පවරා දිය හැකි අතර එවැනි පවරාදීම් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශිත සියලු රෙගුලාසිවලට අනුකූලතාවය දැක්වීමට යටත්ව සිදු කරයි. එවැනි පවරාදීම් ඉවත් කිරීමේ බලයද අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ හැකියාවන්ට බාධා නොවන ලෙස පවරා දීම් මණ්ඩලය විසින් සිදු කරයි.
3 (4) (ii)	මණ්ඩලයට සමස්තයක් ලෙස තම කාර්යයන් ඉටු කිරීම සඳහා සැලකිය යුතු ලෙස අවහිරවන්නා වූ හෝ ඉටුකිරීමේ හැකියාව අඩු කරන්නාවූ ආකාරයේ ප්‍රමාණයකට, මණ්ඩලය විසින් මණ්ඩලීය කමිටුවකට, ප්‍රධාන විධායක නිලධාරියාට, විධායක අධ්‍යක්ෂවරු හෝ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ට කිසිම කාර්යයක් පවරා දීම නොකළ යුත්තේය.	
3 (4) (iii)	බැංකුවේ අවශ්‍යතාවයන්ට අදාළ වන ආකාරයෙන් තිබෙන බව සහතික කර ගැනීම සඳහා, මණ්ඩලය විසින් පවතින බලතල පවරාදීමේ ක්‍රියාවලිය කාලීනව විමර්ශනය කළයුතු වේ.	අනුගමනය කරන ලදී. බලතල පවරා දීමේ ක්‍රියාවලිය කාලීනව විමර්ශනය කිරීම හා යාවත්කාලීන කිරීම සිදු වේ.
3 (5) සභාපති හා විධායක නිලධාරී		
3 (5) (i)	සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියාගේ කාර්යභාරයන් වෙන් කළයුතු අතර මෙම කාර්යයන් තනි පුද්ගලයෙක් විසින් සිදු නොකළ යුතු ය.	අනුගමනය කරන ලදී. ලංකා බැංකුවේ සභාපති තනතුර හා මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක තනතුර පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරනු ලැබේ. සභාපතිතුමන්ගේ සහ මහා කළමනාකරුගේ වගකීම් අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියෙහි විස්තර වෙයි.
3 (5) (ii)	සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු විය යුතු අතර ස්වාධීන අධ්‍යක්ෂවරයකු වන්නේ නම් මැනවි. සභාපති ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු නොවන විට, ස්වාධීනත්වය සහතික කිරීම පිණිස ලිඛිත කාර්යභාරයන් සහිතව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයෙකු පත්කළ යුතු ය. මෙම ජ්‍යෙෂ්ඨ අධ්‍යක්ෂවරයාගේ තනතුර බැංකුවේ වාර්ෂික වාර්තාවෙහි පළ කළ යුතු ය.	ලංකා බැංකුවේ සභාපති විධායක නොවන අධ්‍යක්ෂවරයෙකි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (5) (iii)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික වාර්තාවේ අනිවාර්ය කොටසක් විය යුතු ආයතනික යහපාලන වාර්තාවේ, සභාපති හා ප්‍රධාන විධායක නිලධාරියාගේ අනන්‍යතාවය ද, සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරී සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් අතර කිසියම් සම්බන්ධතාවයක් ඇත්නම්, (මූල්‍ය, ව්‍යාපාරික, පවුලේ හෝ අනෙකුත් සැලකිය යුතු/ අදාළ සම්බන්ධතාවයන් ඇතුළුව) එය ද පල කළ යුතුයි.	සභාපති - 2013 ජනවාරි 08 දක්වා ගාමිණී වික්‍රමසිංහ මහතා සහ 2013 ජනවාරි 09 සිට රාසික් සරුක් මහතා ප්‍රධාන විධායක නිළධාරී(ලංකා බැංකුවේ මහා කළමනාකරු ලෙස හඳුන්වයි) • 2012 ජනවාරි 01 දින සිට ජූනි 03 දක්වා ඩබ් ඒ් නාලනී මෙනවිය • 2012 ජූනි 04 දින සිට 2013 ජනවාරි 07 දක්වා කේ ධර්මසිරි මහතා • 2013 ජනවාරි 08 සිට ඩී එම් ගුණසේකර මහතා මෙම විධිවිධානයේ දක්වන ආකාරයේ කිසිදු සම්බන්ධතාවයක් ඔවුන් අතර නොමැති බව දක්වමින් ප්‍රකාශනයක් සභාපතිතුමාගෙන්, මහා කළමනාකරුගෙන් සහ අනෙකුත් අධ්‍යක්ෂවරුන්ගෙන් ලබාගෙන ඇත.
3 (5) (iv)	සභාපතිතුමා විසින් (අ) අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සැපයීම (ආ) අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බව හා සිය වගකීම් නිසි ලෙස ඉටුකරන බව සහතික කිරීම (ඇ) ප්‍රධාන ගැටලු කාලීන ලෙස මණ්ඩලය තුළ සාකච්ඡා කරන බව සහතික කිරීම කළයුතු වේ.	අනුගමනය කරන ලදී. සභාපතිතුමා අධ්‍යක්ෂ මණ්ඩලයට නායකත්වය සපයන අතර අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බව හා සියළු වගකීම් නිසිලෙස ඉටු කරන බව සහතික කරයි. සියලු ප්‍රධාන ගැටලු කාලීන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තුළ සාකච්ඡා කරයි.
3 (5) (v)	සෑම රැස්වීමකම න්‍යාය පත්‍රය පිළියෙළ කිරීමේ හා අනුමත කිරීමේ මූලික වගකීම සභාපතිතුමා සතු වන අතර අනෙකුත් අධ්‍යක්ෂවරුන් විසින් යෝජනා කරන ඕනෑම කරුණක් යෝග්‍ය වන්නේ නම් න්‍යාය පත්‍රයට ඇතුළත් කළයුතු ය. න්‍යාය පත්‍රය පිළියෙළ කිරීමේ කාර්යය සභාපති විසින් සමාගම් ලේකම්ට පැවරිය හැකිය.	අනුගමනය කරන ලදී. සභාපති විසින් බලය පවරාදීම යටතේ, අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් න්‍යාය පත්‍රය පිළියෙල කිරීමේ කාර්යය සිදු කරනු ලබයි. මහා කළමනාකරු හරහා ඉදිරිපත් කරන සංදේශය මත හා කිසියම් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු ඇතුළත් කිරීමට බලාපොරොත්තු වන වෙනත් අදාල කරුණු මත පදනම්ව න්‍යාය පත්‍රය සකස් කිරීම සිදු කරයි.
3 (5) (vi)	සභාපති විසින් සියලුම අධ්‍යක්ෂවරුන් රැස්වීමේ පැන නගින කරුණු පිළිබඳව නිසි ලෙස දැනුවත්ව සිටින බවට සහතික විය යුතු අතර ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත අධ්‍යක්ෂවරුන්ට ලැබෙන බවට ද සහතික විය යුතු ය.	අනුගමනය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරන න්‍යාය පත්‍රය සහ අධ්‍යක්ෂ මණ්ඩල සංදේශ මඟින් ප්‍රමාණවත් තොරතුරු කාලීන පදනමක් මත රැස්වීමට දින 6 සිට 7 දක්වා කාලයකට පෙර අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි. ප්‍රමාද වූ සංදේශයන් වෙතොත් එයද හැකිතරම් ඉක්මනින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට පෙර ඉදිරිපත් කරයි. කෙසේ වෙතත්, සංදේශයේ අඩංගු කරුණු වලට අමතරව ඉතා හදිසි කරුණක් පැණනැගුනහොත් තීරණ ගැනීමට හැකිවන ආකාරයේ ප්‍රමාණාත්මක තොරතුරු සහිත විස්තරාත්මක පැහැදිලි කිරීමක් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිදු කරයි. මෙම ක්‍රියාවලිය ක්‍රියාවට නැංවීම පිළිබඳව සභාපති සහතික වේ.
3 (5) (vii)	සභාපති විසින් මණ්ඩලයේ කටයුතු සඳහා සම්පූර්ණ හා සක්‍රීය දායකත්වයක් ලබාදීම සඳහා සියලුම අධ්‍යක්ෂවරුන් ධෛර්යමත් කළයුතු අතර බැංකුවේ උපරිම වාසිය සඳහා ක්‍රියාකරන බව සහතික කිරීමට මූලිකත්වය ගතයුතු ය.	අනුගමනය කරන ලදී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (5) (viii)	සභාපතිතුමා විසින් විශේෂයෙන් විධායක නොවන අධ්‍යක්ෂවරුන්ගේ ඵලදායී දායකත්වය ලබාගැනීමට පහසුකම් සැපයිය යුතු අතර විධායක හා විධායක නොවන අධ්‍යක්ෂවරුන් අතර හිතකර සබඳතාවයන් පවත්වා ගැනීම ද සහතික කළයුතු ය.	අනුගමනය කරන ලදී. අධ්‍යක්ෂ මණ්ඩලයේ සියලුදෙනාම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.
3 (5) (ix)	ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන් හෝ වෙනත් කිසිම විධායක කාර්යයක් සෘජුවම අධීක්ෂණය සඳහා සභාපති සම්බන්ධ නොවිය යුතු ය.	අනුගමනය කරන ලදී. සභාපතිතුමන් ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන අතර ප්‍රධාන කළමනාකරණ පිරිස් අධීක්ෂණය කිරීමේ කටයුතු වලට සෘජුවම සම්බන්ධ නොවේ.
3 (5) (x)	කොටස්හිමියන් සමග ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගැනීමට අවශ්‍ය පියවර ගන්නා බවට හා කොටස් හිමියන්ගේ අදහස් මණ්ඩලයට සන්නිවේදනය වන බවට සභාපති විසින් සහතික විය යුතු ය.	අනුගමනය කරන ලදී. මුළුමනින්ම කොටස් හිමිකාරිත්වය දරණ ශ්‍රී ලංකා රජය සමඟ ඵලදායී සන්නිවේදනයක් පවත්වා ගනී. සෑම විටම මුදල් අමාත්‍යාංශයේ නියෝජිතයෙකු නිලබලයෙන් අධ්‍යක්ෂ ලෙස පත් කරන අතර කොටස් හිමියාගේ අදහස් සන්නිවේදනය කෙරේ.
3 (5) (xi)	ප්‍රධාන විධායක නිලධාරීවරයා බැංකුවේ දෛනික මෙහෙයුම් හා ව්‍යාපාරික කටයුතු භාර ඉහළම විධායකයා වශයෙන් ක්‍රියා කළයුතු ය.	අනුගමනය කරන ලදී. මහා කළමනාකරුගේ බලතල අධ්‍යක්ෂ මණ්ඩල ප්‍රඥප්තියට විශේෂයෙන් අදාළ වේ.
3 (6) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පත්කළ කමිටු		
3 (6) (i)	මෙම විධානයන්ගේ 3(6)(ii), 3(6)(iii), 3(6)(iv) සහ 3(6)(v) යන විධානවල දක්වා ඇති ආකාරය අනුව සෑම බැංකුවකම අඩුම තරමේ අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක්වත් තිබිය යුතු ය. සෑම කමිටුවක්ම අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කළයුතු ය. කමිටුවේ සභාපතිවරයාගේ අධීක්ෂණය යටතේ රැස්වීම් සංවිධානය කිරීම හා රැස්වීම් වාර්තා පවත්වා ගැනීම යනාදිය සඳහා සෑම කමිටුවක් විසින්ම ලේකම්වරයෙක් පත්කර ගතයුතු ය. සෑම කමිටුවකම යුතුකම් හා කාර්යයන් ඇතුළත් කාර්යසාධනය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මහා සභා රැස්වීමට ඉදිරිපත් කළයුතු ය.	අනුගමනය කරන ලදී. මෙම විධිවිධානය යටතේ අධ්‍යක්ෂ මණ්ඩලීය උප කමිටු 4ක් (විගණන, මානව සම්පත් හා පාරිශ්‍රමික, නාමයෝජනා හා ආයතනික යහපාලන සහ ඒකාබද්ධ අවදානම් කළමනාකරණ) ස්ථාපිත කර ඇති අතර රැස්වීම් වාර්තා සමඟ නිර්දේශයන් ඉදිරිපත් කරමින් අධ්‍යක්ෂ මණ්ඩලයට සෘජුවම වාර්තා කරයි. අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් සියලුම කමිටුවල ලේකම් ලෙස පත්කර ඇති අතර සමිතියේ සභාපතිගේ අධීක්ෂණය යටතේ රැස්වීම් වාර්තා පවත්වා ගනී. උප කමිටු වල සංයුතිය, එක් එක් උප කමිටු වල කාර්යසාධනය සහ අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම පිළිබඳව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 138 සිට 149 දක්වා විස්තර කරයි. ලංකා බැංකුව වාර්ෂික මහා සභාවක් නොපවත්වයි. කෙසේ වෙතත්, එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු මණ්ඩල සාමාජිකයෙකු වන අතර ඔහු කොටස්කරුගේ අවශ්‍යතා වෙනුවෙන් පෙනී සිටියි.
3 (6) (ii)	විගණන කමිටුව සම්බන්ධයෙන් පහත රීති අදාළ වේ. (අ) ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් ඇති ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් කමිටුවේ සභාපතිවරයා විය යුතු ය.	විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන නිල බලයෙන් අධ්‍යක්ෂගේ විකල්ප අධ්‍යක්ෂවරයා වන, වී කනගසභාපති මහතා ගණකාධිකරණය හා විගණනය සම්බන්ධයෙන් සුදුසුකම් හා අත්දැකීම් වලින් පරිපූරණ වූ පුද්ගලයෙකු වන අතර 2012 වර්ෂයේදී ඔහු විසින් විගණන කමිටුවේ සභාපතිධුරය උසුලන ලදී. 2013 ජනවාරි සිට විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වන, නිල බලයෙන් අධ්‍යක්ෂගේ විකල්ප අධ්‍යක්ෂවරයා ලෙස පත්වූ, ගණකාධිකරණය හා විගණනය සම්බන්ධයෙන් සුදුසුකම් හා අත්දැකීම් වලින් පරිපූර්ණ වූ ආර් එම් ඒ රත්නායක මහතා විගණන කමිටුවේ සභාපති ලෙස කටයුතු කරයි. විගණන කමිටුවේ සභාපති ලෙස ඔවුන්ගේ පත්වීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලදී.
	ආ) කමිටුවේ සෑම සාමාජිකයෙක්ම විධායක නොවන අධ්‍යක්ෂවරයෙක් විය යුතු ය.	අනුගමනය කරන ලදී. කමිටුවේ සෑම සාමාජිකයෙකුම විධායක නොවන අධ්‍යක්ෂවරුන් වේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
(ඇ)	කමිටුව විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කළ යුතු ය.	
	(i) අදාළ නීති ප්‍රකාරව විගණන සේවා සඳහා බාහිර විගණකවරුන් පත් කිරීම	ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව බැංකුවේ විගණක, විගණකාධිපති වන නිසා මෙය අදාළ නොවේ. 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවෙහි හා එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා විගණකාධිපති විසින් ඔහුගේ සහය පිණිස Ernst & Young ගණකාධිකාරී ආයතනය පත් කරන ලදී.
	(ii) මහ බැංකුව විසින් විගණකවරුන් වෙත වරින් වර නිකුත් කරන ලද උපදෙස් මාලාවන් ක්‍රියාත්මක කිරීම	අනුගමනය කරන ලදී. 2007 අංක 11 දරණ ශ්‍රී ලංකා මහ බැංකු විධිවිධානයට අනුකූලව විගණකයින් විසින් පිළියෙල කොට ඉදිරිපත් කරන ලද මූල්‍ය වාර්තා වල විශ්වාසනීයත්වය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවෙහි අනාවරණය කිරීමේ අවශ්‍යතාවය දක්වමින් විගණකයින් සඳහා නිකුත් කොට ඇති ශ්‍රී ලංකා මහ බැංකු විධිවිධාන වලට අදාළ ගැටළු සාකච්ඡා කිරීම හා ස්ථිර කර ගැනීම විගණන කමිටුව විසින් සිදු කරන ලදී.
	(iii) අදාළ ගිණුම්කරණ ප්‍රමිත භාවිතා කිරීම	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිතය සම්බන්ධයෙන් වූ ගැටළු පිළිබඳව විගණන කමිටුවේදී සාකච්ඡාවට බඳුන් වන අතර අවශ්‍ය නිර්දේශයන් සකස් කරන ලදී.
	(iv) විගණකවරුන්ගේ සේවා කාලය, ගාස්තු සහ විගණකවරයාගේ ඉල්ලා අස්වීමක් හෝ ඉවත් කිරීම. මෙහි දී විගණක හවුල්කරුවකුගේ සේවය ලබා ගැනීම වසර පහක් නොඉක්මවිය යුතු අතර, එම කාලය සපිරූ හවුල්කරුවකු නැවත පත්කළ හැකි වන්නේ මුල් වාරය සම්පූර්ණකර වසර තුනක් ඉක්මවූ පසුවය.	ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපති, බැංකුවේ විගණක වන නිසා අදාළ නොවේ.
(ඈ)	බාහිර විගණකවරයාගේ ස්වාධීනත්වය, විෂය මූලිකත්වය සහ විගණන ක්‍රියාවලියේ සඵලදායකත්වය, අදාළ ප්‍රමිතීන් සහ මනා පරිචයන් අනුව සමාලෝචනය කිරීම කමිටුවේ කාර්යයකි.	ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව විගණකාධිපති, බැංකුවේ විගණක වන නිසා අදාළ නොවේ. ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ විගණකාධිපතිගේ ස්වාධීනත්වය තහවුරු වේ.

මූලධර්ම	අනුකූලතා මට්ටම
(ඉ) අදාළ නීති නියමයන්, අවශ්‍යතාවයන් සහ මාර්ගෝපදේශ මඟින් අවසර දෙන ලද විගණන නොවන සේවා සැපයීම සඳහා බාහිර විගණකයින් යොදා ගැනීම පිළිබඳව ප්‍රතිපත්තියක් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම විගණන කමිටුවේ වගකීමකි. බාහිර විගණකවරයා විසින් සපයනු ලබන එවැනි විගණන නොවන සේවා ඔහුගේ ස්වාධීනත්වය සහ විෂයමූලිකභාවයට හානි නොවන බවට කමිටුව වගබලා ගතයුතු ය. විගණන නොවන සේවා සැපයීමේ දී විගණකවරයාගේ ස්වාධීනත්වය හෝ විෂයමූලිකභාවය තක්සේරු කිරීමේදී කමිටුව විසින් පහත කරුණු සළකා බැලිය යුතුය. I. විගණන සමාගමේ නිපුණතා සහ පළපුරුද්ද විගණන නොවන සේවා සැපයීම සඳහා යෝග්‍ය වන්නේ ද නැද්ද යන්න II. බාහිර විගණකවරයා විසින් එවැනි සේවා සැපයීමේදී විගණනයේ ස්වාධීනත්වය හා/හෝ විෂයමූලිකභාවය ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇද්දැයි යන්න සහ III. විගණන නොවන සේවාවල ස්වභාවය, අදාළ ගාස්තු මට්ටම්, විගණන සමාගමට සාපේක්ෂව එක් එක් ගාස්තු මට්ටම් හා සමුච්චිත ගාස්තු මට්ටම් යනාදිය බාහිර විගණකවරයාගේ විෂය මූලිකභාවයට හෝ ස්වාධීනත්වයට කිසියම් බලපෑමක් කරන්නේ ද යන වග.	විගණකාධිපති, බැංකුවේ විගණක වේ.
(ඊ) විගණනය ආරම්භ කිරීමට පෙර කමිටුව විසින් පහත සඳහන් දේ ඇතුළත් විගණනයේ ස්වභාවය සහ විෂයපථය පිළිබඳව බාහිර විගණකවරයා සමඟ සාකච්ඡා කර අවසන් කළ යුතුය. I. අදාළ ආයතනික රීති සහ මූල්‍ය වාර්තාකරණය පිළිබඳ කළමනාකරණයේ අභ්‍යන්තර පාලන විධිවිධානවලට බැංකුවේ අනුකූලවීම පිළිබඳ ඇගැයීමක් II. අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ වාර්තා කිරීමේ අවශ්‍යතාවයන් අනුව බාහිර අවශ්‍යතා වෙනුවෙන් මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම. III. එක් විගණන සමාගමකට වඩා වැඩි සංඛ්‍යාවක් සම්බන්ධ වන විට ඒවා අතර සම්බන්ධීකරණය යනාදියයි.	විගණකාධිපති බැංකුවේ විගණක වේ. මෙම විධිවිධානයන්ට අදාළ ගැටළු සාකච්ඡා කිරීමට සභාපති සහ අදාළ කළමනාකරණ පිරිස් සමඟ විගණන කමිටුවේ සාමාජිකයන් විගණකාධිපතිවරයා හමු වීමට ගොස් ඇත. විගණනයේ විෂය පථය හා පරාසය පිළිබඳව විගණකාධිපති විසින් තීරණය කරනු ලබන අතර විගණකාධිපතිගේ සහය පිණිස කටයුතු කරන Ernst & Young ආයතනයට, ප්‍රමාණය සහ අවදානම පිළිබඳ සලකා බලමින් විෂය පථය සම්බන්ධයෙන් වැඩිදුර වෙනස් කිරීම්/සංශෝධනය කිරීම් සිදු කළ හැක.
(උ) තොරතුරු අනාවරණය කිරීම සඳහා බැංකුව විසින් නිකුත් කරනු ලබන බැංකුවේ මූල්‍ය ප්‍රකාශන එහි වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තාවල සත්‍යතාවය සහ ඒවායේ අඩංගු මූල්‍ය වාර්තාකරණ විනිශ්චයන් පරීක්ෂා කිරීම සඳහා කමිටුව විසින් බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කළ යුතුය. බැංකුවේ වාර්ෂික වාර්තාව, ගිණුම් සහ කාර්තුමය වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට පෙර කමිටුව විසින් විශේෂයෙන් අවධානය යොමු කළයුතු කරුණු වන්නේ (i) ප්‍රධාන විනිශ්චයන් සහිත ක්ෂේත්‍ර (ii) ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ පරිචයන්ගේ සිදුවූ වෙනස්කම් (iii) විගණනය තුළින් ඇතිවූ ප්‍රධාන ගැලපීම් (iv) අබණ්ඩ පැවැත්මේ උපකල්පනයන් සහ (v) අදාල ගිණුම්කරණ ප්‍රමිති සහ අනෙකුත් නීතිමය අවශ්‍යතාවයන්ට අනුකූලවීම ආදියයි.	අනුගමනය කරන ලදී. මෙය මාසික, ත්‍රෛමාසික හා වාර්ෂික මූල්‍ය තොරතුරු සමාලෝචනය කරමින් සිදු කරන අඛණ්ඩ ක්‍රියාවලියකි.

මූලධර්ම	අනුකූලතා මට්ටම
(උ) කමිටුව විසින් අතුරු සහ වසරාවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කළයුතු අතර, ප්‍රධාන කළමනාකරණ පුද්ගලයන්ගේ සහභාගිත්වය නොමැතිව විගණකවරයාට සාකච්ඡා කිරීමට අවශ්‍ය දෑ වේ නම් ඒවාද ඇතුළුව අනෙකුත් කරුණු ද අවශ්‍ය විට සාකච්ඡා කළයුතුය.	කමිටුව විසින් අතුරු සහ වසරාවසාන විගණන මඟින් මතුවන ගැටළු, ප්‍රශ්න සහ අනෙකුත් දේ සාකච්ඡා කරයි. විගණකාධිපති බැංකුවේ බාහිර විගණක වන අතර ඔහුගේ නියෝජිතයෙකු විගණන කමිටුවට ඉදිරිපත් වෙයි. සමාලෝචනයට පාත්‍ර වූ වසර තුලදී කළමනාකරණ පුද්ගලයන්ගේ සහභාගීත්වයෙන් තොරව කිසිදු කරුණක් සාකච්ඡා කිරීමට ඉල්ලීමක් ඉදිරිපත් නොවුණි.
(ඌ) බාහිර විගණකවරයාගේ කළමනාකරණ ලිපිය සහ එයට යවන ලද කළමනාකරණයේ පිළිතුරු කමිටුව විසින් සමාලෝචනය කළයුතුය.	අනුගමනය කරන ලදී. ඒ ආකාරයෙන් පසුවිපරමක් සිදුවේ.
(ඒ) බැංකුවේ අභ්‍යන්තර විගණන කාර්යය සම්බන්ධයෙන් කමිටුව පහත සඳහන් ක්‍රියාමාර්ග ගතයුතුය.	
I. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විෂය පථය, කටයුතු සහ සම්පත් ප්‍රමාණවත් ද යන්න සමාලෝචනය කිරීම සහ එහි කටයුතු කරගෙන යාම සඳහා දෙපාර්තමේන්තුවට ප්‍රමාණවත් බලතල තිබේද යන්න පිළිබඳව සෑහීමකට පත්වීම.	අනුගමනය කරන ලදී.
II. අභ්‍යන්තර විගණන වැඩසටහන සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රතිඵල සමාලෝචනය කිරීම සහ අදාළ අවස්ථාවන්හි දී අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිර්දේශයන් මත සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇති බවට සහතික වීම.	අනුගමනය කරන ලදී. ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහ අභ්‍යන්තර විගණන කාර්යයේ කාර්යසාධනය ඇගයීම විගණන කමිටුව මඟින් සිදු කරයි. ජ්‍යෙෂ්ඨ සේවකයින්ගේ කාර්යසාධනය ඇගයීම ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සහිත ඇගයීමේ ක්‍රියාවලියකට අනුව සිදු කරනු ලබන අතර එය විගණන කමිටුවට ඉදිරිපත් කරයි.
III. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියාගේ සහ ජ්‍යෙෂ්ඨ සේවකයන්ගේ කාර්යසාධනය ඇගයීම හෝ තක්සේරු කිරීම සමාලෝචනය කිරීම.	
IV. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා, ජ්‍යෙෂ්ඨ සේවකයන් සහ බාහිරින් ලබාගන්නා සේවාදායකයින් පත්කිරීම හෝ සේවය හමාර කිරීම සම්බන්ධ නිර්දේශ ඉදිරිපත් කිරීම.	අනුගමනය කරන ලදී. කමිටුව විසින් ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සේවා දිගුව පිළිබඳව නිර්දේශ කළ අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලදී.
V. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ සේවකයන්ගේ සහ බාහිර සේවා සපයන්නන්ගේ ඉල්ලා අස්වීම පිළිබඳව කමිටුවට තොරතුරු ඉදිරිපත් වන බවට සහ ඔවුනට සිය ඉල්ලා අස්වීමට හේතු පැහැදිලි කිරීමට අවස්ථාවක් දී ඇති බවට සහතික වීම.	අනුගමනය කරන ලදී.
VI. අභ්‍යන්තර විගණනය, එහි විගණනයට භාජනය වන කටයුතු වලින් ස්වාධීනව පවතින බව සහ එය නිපුණතාවයෙන් සහ නිසි සැළකිල්ලෙන් යුක්තව කරගෙන යන බව සහතික කිරීම.	අනුගමනය කරන ලදී. බැංකුවේ සංවිධාන ආකෘතියට අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක, විගණන කමිටුව හරහා මණ්ඩලයට සෘජුවම වාර්තා කරන අතර බැංකුවේ මෙහෙයුම් වලින් ස්වාධීන වේ.
(ඔ) අභ්‍යන්තර පරීක්ෂණ වල ප්‍රධාන සොයාගැනීම් සහ ඒවාට ලබාදුන් කළමනාකරණ ප්‍රතිචාරයන් කමිටු විසින් සලකා බැලිය යුතුය.	අනුගමනය කරන ලදී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඕ) ප්‍රධාන මූල්‍ය නිළධාරියා, ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බාහිර විගණකවරුන්ගේ නියෝජිතයන් හට සාමාන්‍යයෙන් රැස්වීම් වලට සහභාගිවිය හැකිය. කමිටුවේ ආරාධනය මත අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ටද රැස්වීම් වලට සහභාගි විය හැක. කෙසේ වුවද විධායක අධ්‍යක්ෂවරුන්, නොමැතිව අඩුම ගණනේ වර්ෂයකට දෙවරක්වත් බාහිර විගණකයින් සමඟ රැස්වීම් පැවැත්වීමට කමිටුව වගබලා ගතයුතුය.	අනුගමනය කරන ලදී. සියලුම කමිටු රැස්වීම් ප්‍රධාන මූල්‍ය නිළධාරී, ප්‍රධාන අභ්‍යන්තර විගණක, මහා කළමනාකරු සහ විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නියෝජිතයන්ගේ සහභාගිත්වයෙන් පවත්වයි. විගණකාධිපතිට සහය පිණිස Ernst & Young ආයතනය පත් කිරීමෙන් පසු එහි නියෝජිතයන් ද රැස්වීම් වලට සහභාගි වූහ.
	(ක) කමිටුවට පහත බලතල තිබිය යුතුය. (i) එහි විෂය පථයට අයත් වන කරුණක් විමර්ශනය කිරීම සඳහා ප්‍රකාශිත අධිකාරිය, (ii) එය කිරීම සඳහා අවශ්‍ය සම්පත් (iii) තොරතුරු ලබාගැනීමේ පූර්ණ හැකියාව සහ (iv) අවශ්‍යනම් බාහිර වෘත්තීය උපදෙස් ලබාගැනීමට සහ අදාළ පළපුරුද්ද ඇති බාහිර පුද්ගලයන්ට රැස්වීම්වලට ඇරයුම් කිරීම සඳහා අධිකාරය.	අනුගමනය කරන ලදී.
	(ග) සාකච්ජාවට භාජනය වන කරුණු පිළිබඳව කල් ඇතිව දැනුම්දී කමිටුව නිතිපතා රැස්විය යුතු අතර, එහි බලතල සහ වගකීම් ඉටු කිරීමේදී එළඹෙන නිගමනයන් වාර්තාගත කළයුතු ය.	අනුගමනය කරන ලදී. සාකච්ජාවට භාජනය වන කරුණු පිළිබඳව කල් ඇතිව දැනුම් දී කමිටුව නිතිපතා රැස්වෙයි. මෙම කමිටු රැස්වීම්වල වාර්තා සකස්කර පවත්වාගෙන යයි.
	(ජ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, (i) විගණන කමිටුවේ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර (ii) වසර තුළදී පවත්වන ලද විගණන කමිටු රැස්වීම් සංඛ්‍යාව සහ (iii) ඒ ඒ අධ්‍යක්ෂවරයා රැස්වීම්වලට පැමිණි වාර ගණන යනාදිය පිළිබඳ විස්තර අනාවරණය කළයුතුය.	අනුගමනය කරන ලදී. කමිටුවේ කටයුතු, පිටු අංක 139 සහ 141 හි විගණන කමිටු වාර්තාවේ දක්වා ඇත. 2012 වසර තුළදී කමිටුව 14 වරක් රැස්වී ඇති අතර පැමිණීමේ විස්තර පිටු අංක 149 හි දක්වා ඇත.
	(ට) නියම පරිදි පත්කරනා ලද කමිටුවේ ලේකම්වරයා විසින් එහි රැස්වීම්වල විස්තරාත්මක වාර්තා පවත්වා ගතයුතුය. (ලේකම්වරයා වශයෙන් සමාගම් ලේකම්වරයා හෝ අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධානියා පත්කර ගත හැකිය.)	අනුගමනය කරන ලදී. කමිටුවේ ද ලේකම්වරයා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් විසින් වාර්තා පවත්වා ගනී.
	(ඩ) මූල්‍ය වාර්තා කිරීම, අභ්‍යන්තර පාලන ක්‍රම හෝ වෙනත් විෂයයන් සම්බන්ධයෙන් විය හැකි අයථා ක්‍රියාවන් පිළිබඳව බැංකුවේ සේවකයන්ට රහස්‍යභාවයෙන් යුතුව ප්‍රශ්න නැඟීම සඳහා සලසා ඇති පහසුකම් පිළිබඳව කමිටුව විසින් සමාලෝචනය කළයුතු ය. ඒ අනුව, එවැනි කරුණු පිළිබඳව සාධාරණ හා නිදහස් පරීක්ෂණ කිරීම සඳහාත්, ඒ සඳහා අවශ්‍ය පසු විපරම් කටයුතු කිරීම සඳහාත් සහ බාහිර විගණන සමඟ බැංකුවේ ඇති සම්බන්ධය නිරීක්ෂණය කිරීමේ ප්‍රධාන නියෝජිත මණ්ඩලය ලෙස ක්‍රියාකිරීම සඳහාත් අවශ්‍ය කටයුතු සම්පාදනය වී තිබෙන බවට කමිටුව විසින් සහතික කළයුතු ය.	අනුගමනය කරන ලදී. මෙම කරුණු ආවරණය වන පරිදි විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක වන අතර සුදුසු පසු විපරම් කටයුතු සඳහා වැදගත් සොයා ගැනීම් විගණන කමිටුවට වාර්තා කරනු ලබයි.
3 (6) (iii)	**මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව** සම්බන්ධයෙන් පහත සඳහන් පරිදි අදාළ වේ. (අ) බැංකුව අධ්‍යක්ෂවරුන්ගේ, ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයන්ගේ පාරිශ්‍රමික (වැටුප් දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) ප්‍රතිපත්තිය කමිටුව විසින් තීරණය කළයුතු ය.	මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයන් මත පදනම්ව අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික තීරණය වන අතර එම චක්‍රලේඛයන් මත පදනම්ව බැංකුව විසින් පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් ක්‍රියාවට නංවයි. මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාළ පාරිශ්‍රමික කමිටුව විසින් නිර්දේශ සකස් කරන අතර එම නිර්දේශයන් අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර අවසානයේ මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගනී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ආ) බැංකුවේ අධ්‍යක්ෂවරුන්ට, ප්‍රධාන විධායක නිලධාරියාට සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයන්ට අදාළ අරමුණු සහ ඉලක්ක ලබාදීම කමිටුව විසින් කළයුතු ය.	සියලුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන අධ්‍යක්ෂවරුන් වන නිසා ඔවුන් වෙනුවෙන් ඉලක්ක ස්ථාපිත කර නොමැත.
	(ඇ) බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරියාගේ සහ ප්‍රධාන කළමනාකාරීත්ව පුද්ගලයන්ගේ කාර්යසාධනය දෙන ලද අරමුණු සහ ඉලක්ක සමඟ කලින් කලට අගයා ඔවුන්ගේ පාරිශ්‍රමික ප්‍රතිලාභ සහ කාර්යසාධනය මත ලබාදෙන අනෙකුත් ගෙවීම් සංශෝධනය කරන පදනම නිශ්චය කළයුතු ය.	ප්‍රධාන කළමනාකරණ පිරිස වෙනුවෙන් අරමුණු හා පරමාර්ථ ලේඛනගත කර ඇති අතර ආයතනික සැලැස්ම මත පදනම්ව පිළියෙල කර ඇති ක්‍රියාවලි සැලසුම මඟින් ඒවා විස්තර කරයි. ප්‍රධාන කළමනාකරණ පිරිස හරහා ආයතනික සැලැස්ම ක්‍රියාවට නැංවීම ප්‍රධාන විධායක නිලධාරියාගේ වගකීම වේ. ඔවුන්ගේ කාර්යසාධනය සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ප්‍රධාන විධායක නිලධාරියාගේ ද කාර්යසාධනය ඇගයීම සඳහා වෙනමම ක්‍රියාවලියක් වාර්ෂික පදනම මත සමස්ත අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් සිදු කරයි.
	(ඈ) ප්‍රධාන විධායක නිළධාරියාට අදාළ කරුණු සාකච්ඡා කරනු ලබන විට හැර, ප්‍රධාන විධායක නිළධාරියා කමිටුවේ සියලුම රැස්වීම් සඳහා සහභාගි විය යුතු ය.	අනුගමනය කරන ලදී.
3 (6) (iv)	**නාම යෝජනා කමිටුව** සම්බන්ධයෙන් පහත සඳහන් රීති අදාළ වේ.	බැංකුව විසින් නාමයෝජනා හා ආයතනික යහපාලන කමිටුවක් ස්ථාපිත කර ඇත. මෙම විධිවිධානයේ දක්වා ඇති නාමයෝජනා කමිටුවේ කාර්යයන්ට අමතරව මෙම කමිටුවේ නිර්දේශයන් යටතේ අන්තර්ගත වන පිළිගන්නා ලද අදාළ ආයතනික යහපාලන ප්‍රතිපත්තීන්ට අයත් අනෙකුත් කාර්යයන් ද වේ.
	(අ) නවක අධ්‍යක්ෂවරුන් සහ ප්‍රධාන කළමනාකරණ පිරිස තෝරාගැනීමේ හා පත්කර ගැනීමේ ක්‍රමවේදයක් කමිටුව විසින් ක්‍රියාත්මක කළයුතු ය.	මුදල් අමාත්‍යාංශය මඟින් අධ්‍යක්ෂවරුන් පත් කරන අතර කමිටුව විසින් මේ සම්බන්ධයෙන් කටයුතු නොකරයි. ප්‍රධාන කළමනාකරණ පිරිස ඇතුළුව ලංකා බැංකුවේ කාර්ය මණ්ඩලය තේරීම/ පත් කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත ක්‍රමවේදයක්/ යෝජනාවලියක් පවතී. මෙම අනුමත යෝජනාවන්ට කරනු ලබන සංශෝධන කමිටුව විසින් සිදු කරයි. මේ සම්බන්ධයෙන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 144 සහ 145 දක්වා ඇති කමිටුව පිළිබඳ වාර්තාව පරිශීලනය කරන්න.
	(ආ) අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත වගකීම් ඉටුකිරීමේදී ඒ ඒ අධ්‍යක්ෂවරයා දක්වන ලද කාර්යසාධනය සහ දායකත්වය සැලකිල්ලට ගෙන දැනට සිටින අධ්‍යක්ෂවරුන් නැවත පත්කිරීමට (හෝ පත් නොකිරීමට) සලකා බැලීම හා නිර්දේශ කිරීම කමිටුව විසින් කළයුතු ය.	මුදල් අමාත්‍යවරයා විසින් අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන බැවින් මෙය අදාළ නොවේ.
	ඇ) ප්‍රධාන විධායක නිළධාරී තනතුර සහ ප්‍රධාන කළමනාකරණ තනතුරුවලට තෝරා ගැනීමේදී හෝ උසස් කිරීමේදී සලකා බලන සුදුසුකම්, පළපුරුද්ද සහ ප්‍රධාන අවශ්‍යතා කමිටුව විසින් තීරණය කළයුතු ය.	1938 අංක 53 දරණ ලංකා බැංකු පනතට අනුව, මුදල් ඇමතිගේ හා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය යටතේ බැංකුව විසින් පිළිගත් ක්‍රමවේදයක් අනුව මහා කළමනාකරුව පත් කිරීම සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත උසස්වීම් යෝජනාවලීන් මඟින් ප්‍රධාන කළමනාකරණ තනතුරු සඳහා සලකා බලන සුදුසුකම් දක්වයි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඈ) 3(3) වැනි රීතියේ සහ අදාළ නීතියේ දක්වා ඇති නිර්ණායක අනුව ප්‍රධාන විධායක නිළධාරියා සහ ප්‍රධාන කළමනාකාරිත්ව පිරිස එම තනතුරු සඳහා සුදුසු සහ යෝග්‍ය පුද්ගලයන් බවට කමිටුව සහතික විය යුතු ය.	අනුගමනය කරන ලදී.
	(ඉ) අතිරේක නව විශේෂඥ දැනුම ලබා ගැනීමේ අවශ්‍යතාවයන් සහ අධ්‍යක්ෂවරුන්ගේ හා ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයන්ගේ විශ්‍රාම යාම තුළින් ඇති වූ පුරප්පාඩු පිරවීම සඳහා වන අනුප්‍රාප්තික සැලසුම් යනාදිය කමිටුව විසින් කලින්කලට සලකා බලා අවශ්‍ය නිර්දේශ කළයුතු වේ.	අධ්‍යක්ෂවරුන් පත් කිරීම මුදල් අමාත්‍යවරයා විසින් සිදු කරයි. මහා කළමනාකරුට සහ ප්‍රධාන කළමනාකරණ පිරිසට අදාළව අනුප්‍රාප්තික සැලැස්මක් ඇත.
	(ඊ) ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු කමිටුවේ සභාපති විය යුතු අතර, කමිටුවේ බහුතරයක් ස්වාධීන අධ්‍යක්ෂවරුන්ගෙන් සමන්විත වීම මැනවි. ආරාධනයෙන් ප්‍රධාන විධායක නිළධාරියාට රැස්වීම් වලට සහභාගි විය හැකිය.	අනුගමනය කරන ලදී. මේ සම්බන්ධ විස්තර සඳහා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 144 හි දක්වා ඇති කමිටුව පිළිබඳ වාර්තාව පරිශීලනය කරන්න.
3 (6) (v)	**ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට** පහත සඳහන් නීති අදාළ වේ.	
	(අ) ණය, වෙළඳපල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපායමාර්ගික අවදානම් අධීක්ෂණය කරන ප්‍රධාන කළමනාකාරිත්ව පුද්ගලයන්ගෙන් ද ප්‍රධාන විධායක නිළධාරියාගෙන් ද සහ අඩුම තරමේ විධායක නොවන අධ්‍යක්ෂවරු තුන් දෙනෙකුගෙන් ද මෙම කමිටුව සමන්විත විය යුතු ය. ප්‍රධාන කළමනාකාරිත්වයේ පුද්ගලයන් සමඟ සමීපව කටයුතු කරමින් පවරා දෙන බලතල සහ වගකීම් සීමාව තුළ සිටිමින් අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් තීරණ ගැනීම කමිටුව විසින් සිදු කළයුතු ය.	මෙහි දක්වා ඇති පරිදි මෙම කමිටුව, විධායක නොවන අධ්‍යක්ෂවරු තිදෙනෙකුගෙන් ද, මහා කළමනාකරුගෙන් ද, මෙම විධානයේ දක්වා ඇති පරිදි පුළුල් අවදානම් ක්ෂේත්‍ර පාලනය කරන වැඩ බලන ප්‍රධාන අවදානම් නිළධාරියාගෙන් ද සමන්විත වේ. අනෙකුත් ප්‍රධාන කළමනාකරණ පිරිස් සහ අනෙකුත් සේවකයන් ද කමිටුවට ඔවුන්ගේ සහභාගීත්වය අවශ්‍ය වූ විටදී රැස්වීම් වලට සහභාගී වීමට ආරාධනා ලබයි.
	(ආ) සුදුසු අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු ආශ්‍රයෙන් බැංකුවට බලපාන සියලුම අවදානම් එනම්, ණය, වෙළඳපල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම් පිළිබඳව, මාසික තක්සේරුවක් කමිටුව විසින් සිදු කළයුතු ය. බැංකුව සතුව පාලිත සමාගම් සහ ආශ්‍රිත සමාගම් පවතින විට අවදානම් ඇස්තමේන්තුව සහ කළමනාකරණය බැංකුව වශයෙන් හා සමූහය වශයෙන් යන දෙආකාරයටම කළයුතු ය.	ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ අංශය මඟින් බැංකුවේ ණය, වෙළඳපල, ද්‍රවශීලතාවය, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම් පිළිබඳව, මාසික තක්සේරුවක් සිදු කරන අතර සාරාංශගත කරන ලද වාර්තා ත්‍රෛමාසිකව කමිටුව වෙත හා ඊට පසුව එළඹෙන ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරයි. පරිපාලිත හා ආශ්‍රිත සමාගම් සම්බන්ධයෙන් වන විට, වැඩ බලන ප්‍රධාන අවදානම් නිළධාරියා විසින් එම ආයතනයන්හි අවදානම් නිළධාරීන් වෙනුවෙන් වැඩමුළු පැවැත්වූ අතර, ඉදිරි කටයුතු සඳහා ඔවුන්ගේ අවදානම් ප්‍රතිපත්ති ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දෙන ලදී. ඉදිරියේදී බැංකුව මත පදනම්ව හා සමූහය මත පදනම්ව අවදානම් කළමනාකරණය කිරීමට බැංකුවට සිදු වේ.
	(ඇ) කමිටුව විසින් දක්වන ලද ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් සීමා තුළ තිබෙන පරිදි අවදානම් කළමනාකරණය කිරීම සහ විශේෂිත අවදානම් සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම පිණිස, ණය කමිටුව සහ වත්කම් වගකීම් කමිටුව යනාදී කළමනාකාරිත්ව කමිටුවල ප්‍රමාණාත්මකභාවය සහ ප්‍රතිඵලදායක බව කමිටුව විසින් සමාලෝචනය කළයුතුය.	අනුගමනය කරන ලදී.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඈ) බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන හා අධීක්ෂණ අවශ්‍යතාවයන්ට අනුව තීරණය කළ විවක්ෂණ මට්ටම්වලට වඩා ඉහළ මට්ටමක යම් අවදානමක් ඇත්නම් කමිටුව එය නිවැරදි කිරීමට සුදුසු ක්‍රියාමාර්ග නොවලහා ගතයුතු ය.	අනුගමනය කරන ලදී. සීමාවන් ඉක්මවා ගිය, විශේෂිත ප්‍රමාණාත්මක හා ගුණාත්මක අවදානම් පිළිබඳව ප්‍රධාන අවදානම් නිළධාරි/ වැඩ බලන ප්‍රධාන අවදානම් නිළධාරි අධීක්ෂණය කළ අතර ඒවායේ ප්‍රබලතාවය මත පදනම්ව සෘජුවම කමිටුවට වාර්තා කරන ලදී.
	(ඉ) කමිටුව අඩුම ගණනේ ත්‍රෛමාසිකව රැස්වී යාවත්කාලීන ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ද ඇතුලත්ව අවදානම් කළමනාකරණයේ සියළු පැතිකඩ ඇගැයීම කළයුතු ය.	අනුගමනය කරන ලදී වර්ෂය තුළදී කමිටු රැස්වීම් 5ක් පැවැත්වුණි. රැස්වීම් සහ පැමිණීම පිළිබඳ විස්තර පිටු අංක 149 හි දක්වා ඇත.
	(ඊ) විශේෂිත අවදානම් හඳුනාගැනීමට හා කමිටුව විසින් හා/හෝ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා විසින් නිර්දේශිත නිවැරදි කිරීමේ ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීමට අසමත් වූ නිලධාරීන් සම්බන්ධයෙන් කමිටුව සුදුසු ක්‍රියාමාර්ග ගතයුතු ය.	අභ්‍යන්තර විගණන හා මානව සම්පත් සඳහා වන විධිමත් ලෙස ලේඛණගත කරන ලද විනය නීති පටිපාටියක් බැංකුව සතුව පවතී.
	(උ) රැස්වීමක් පවත්වා සතියක් ඇතුළත කමිටුව විසින් අධ්‍යක්ෂ මණ්ඩලයේ අදහස් දැනගැනීම, අනුමැතිය සහ/ හෝ උපදෙස් සඳහා අවදානම් ඇස්තමේන්තු වාර්තාවක් මණ්ඩලයට සැපයිය යුතු ය.	කමිටු රැස්වීම්වල වාර්තා අවදානම් කළමනාකරණ වාර්තා සහ නිර්දේශයන් සමඟ ඊට පසුව වුලඔන ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරයි.
	(ඌ) සියලුම ව්‍යාපාරික ක්ෂේත්‍රවලට අදාළ නීති, නියාමනයන්, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන ක්‍රම සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාවය ඇගයීම සඳහා කමිටුව විසින් අනුකූලතා යාන්ත්‍රණයක් පිහිටුවිය යුතු ය.	සියලුම ව්‍යාපාරික ක්ෂේත්‍ර වලට අදාළ නීති, නියාමනයන්, නියාමන මාර්ගෝපදේශ, අභ්‍යන්තර පාලන ක්‍රම සහ අනුමත ප්‍රතිපත්ති සමඟ බැංකුවේ අනුකූලතාවය ඇගයීම සඳහා බැංකුව විසින් වෙනමම අනුකූලතා ඒකකයක් ස්ථාපිත කර ඇත. අනුකූලතා නිළධාරි විසින් මාසිකව හා කාර්තුමය ලෙස අනුකූලතා වාර්තා කමිටුවට සහ මණ්ඩලයට ඉදිරිපත් කරයි. අනුකූලතා කාර්යය වැඩි දියුණු කිරීම සඳහා තවදුරටත් කටයුතු සම්පාදනය කර ඇත.
3 (7) **සම්බන්ධිත පාර්ශව ගනුදෙනු**		
3 (7) (i)	මෙම විධානයේ අරමුණු සඳහා, සම්බන්ධිත පාර්ශවයන් , වශයෙන් සැලකිය යුතු පහත දැක්වෙන කාණ්ඩයට ඇතුළත් පුද්ගලයන් සමඟ විශේෂයෙන් ද, පොදුවේ ඕනෑම පුද්ගලයකු සමඟ බැංකුව කරනු ලබන ගනුදෙනුවකින් අරමුණු අතර ගැටීම් ඇතිවීම වැළැක්වීම සඳහා මණ්ඩලය විසින් පියවර ගතයුතුය. (අ) බැංකුවේ ඕනෑම පරිපාලිත සමාගමක්, (ආ) බැංකුවේ ඕනෑම ආශ්‍රිත සමාගමක්, (ඇ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකු, (ඈ) බැංකුවේ ඕනෑම ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකු, (ඉ) බැංකුවේ අධ්‍යක්ෂවරයෙකුගේ හෝ ප්‍රධාන කළමනාකරණ පුද්ගලයෙකුගේ ළඟම ඥාතියෙකු, (ඊ) බැංකුවේ සැලකිය යුතු කොටස් හිමිකාරිත්වයක් දරන කොටස්කරුවෙකු, (උ) බැංකුවේ ඕනෑම අධ්‍යක්ෂවරයෙකුගේ හෝ බැංකු අධ්‍යක්ෂවරයෙකුගේ ළඟම ඥාතියෙකුගේ හෝ ඕනෑම සැලකිය යුතු කොටස් හිමිකාරිත්වයක් ඇති කොටස්කරුවෙකුගේ සැලකිය යුතු සම්බන්ධයක් ඇති ව්‍යවසායක්.	අනුගමනය කරන ලදී. සම්බන්ධිත පාර්ශවයන්, ඔවුන් සමඟ සිදු කෙරෙන ගනුදෙනු සහ වඩා වාසිදායක සැලකිල්ලක් ලබාදීම වැලැක්වීම යනාදී කරුණු ආවරණය වන පරිදි සකස් කරන ලද සම්බන්ධිත පාර්ශව ගනුදෙනු පිළිබඳ වූ ප්‍රතිපත්ති ප්‍රකාශයක් යොදා ගනී. මෙම ගනුදෙනු ස්වයංක්‍රීය පද්ධතියක් භාවිතා කරමින් අධීක්ෂණය කරයි. සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවල නිරතවෙමින් සම්බන්ධිත පාර්ශව සමඟ සිදුකළ ගනුදෙනු මෙම වාර්ෂික වාර්තාවේ සටහන් අංක 55 වන සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය යටතේ දක්වා ඇත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (7) (ii)	මෙම විධානය මඟින් ආවරණය වන සම්බන්ධිත පාර්ශව සමඟ ගනුදෙනුවලට පහත දේ ඇතුළත් විය යුතු ය. (අ) උපරිම ණය පහසුකම් ප්‍රමාණය පිළිබඳ මුදල් මණ්ඩලය විසින් නිකුත් කර ඇති විධානයේ අර්ථ දැක්වා ඇති පරිදි ඕනෑම වර්ගයේ ණය පහසුකමක් සැපයීම, (ආ) තැන්පතු, මුදල් ණයට ගැනීම් හෝ ආයෝජන වශයෙන් ඕනෑම වගකීමක් නිර්මාණය කිරීම, (ඇ) බැංකුවට ලබාදුන් හෝ බැංකුවෙන් ලබාගත් මූල්‍ය හෝ මූල්‍ය නොවන ආකාරයේ ඕනෑම සේවාවක්, (ඈ) සම්බන්ධිත පාර්ශවයන්ට ප්‍රතිලාභ ලබාදීමට සමත් බැංකුවට අයත්, රහසිගත හෝ සංවේදී තොරතුරු වාර්තා කිරීමේ මාර්ග සහ තොරතුරු ගලායාම් බැංකුව සහ ඕනෑම සම්බන්ධ පාර්ශවයක් අතර ඇති කර ගැනීම හෝ පවත්වා ගැනීම,	අනුගමනය කරන ලදී. මේ සම්බන්ධ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ සටහන් අංක 55 වන සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය යටතේ දක්වා ඇත.
3 (7) (iii)	සමාන ආකාරයේ ව්‍යාපාරයක යෙදී සිටින බැංකුවේ ගනුදෙනුකරුවකුට ලබාදෙන සැලකිල්ලට වඩා වාසිදායක සැලකිල්ලක් ලබාදෙන ඉහත 3(7)(i) විධානයේ අර්ථ දක්වා ඇති ගනුදෙනු සම්බන්ධිත පාර්ශවයන් සමඟ බැංකුව නොයෙදෙන බව සහතික කිරීමට මණ්ඩලය වගබලා ගතයුතු ය. මෙහිදී, වඩා වාසිදායක සැලකිල්ල යන්නෙන් අදහස් විය යුත්තේ හා ඇතුළත් විය යුත්තේ පහත සඳහන් දේය. (අ) මණ්ඩලය මඟින් තීරණය කළ බැංකුවේ නියාමන ප්‍රාග්ධනයෙන් යම් ප්‍රතිශතයක් ඉක්මවා සම්බන්ධ පාර්ශවයන්ට මුළු ශුද්ධ ණය පහසුකම් ප්‍රදානය කිරීම. මෙම අනුවිධානය සඳහා I. පහසුකම් යන්නෙන් අදහස් විය යුත්තේ 2007 අංක 7 දරණ උපරිම පහසුකම් ප්‍රමාණය පිළිබඳ බැංකු පනත් විධානයන්ගේ අර්ථ දක්වා ඇති පහසුකම්ය. II. ශුද්ධ මුළු පහසුකම් ගණනය කළයුත්තේ, මුළු පහසුකම් වලින්, මුදල් සුරැකුම්, බැංකුවේ කොටස් ප්‍රාග්ධනයේ අදාළ සම්බන්ධිත පාර්ශවය කර ඇති ආයෝජනයන් සහ අවුරුදු 5 ක් හෝ ඊට වැඩි පරිණත කාලයක් සහිත බැංකුවේ ණය උපකරණවල අදාළ සම්බන්ධිත පාර්ශවයන් කර ඇති ආයෝජනයන් අඩු කිරීමෙනි. (ආ) සම්බන්ධ නොවන වෙනත් පාර්ශවයක් සමඟ සංසන්දනය කළ හැකි සමාන ගනුදෙනුවකදී බැංකුවේ හොඳම ණය පොළී අනුපාතිකයට වඩා අඩු පොළී අනුපාතිකයක් අය කිරීම හෝ තැන්පතු සඳහා ඉහළ අනුපාතිකයක් ගෙවීම. (ඇ) සම්බන්ධිත නොවන පාර්ශව සමඟ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවල යෙදෙන විට දෙන කොන්දේසිවලට වඩා වාසි සහගත කොන්දේසි, වෙළඳ අලාභ ආවරණය කිරීම සහ ගාස්තු/කොමිස් ආදිය අත්හැරීම ආදී වාසි සහගත සැලකිලි ලබාදීම. (ඈ) ඇගයීම් ක්‍රියාපාටියක් නොමැතිව සම්බන්ධිත පාර්ශවයන්ට සේවාවන් සැපයීම හෝ ඔවුන්ගෙන් සේවාවන් ලබාගැනීම. (ඉ) නිත්‍යානුකූල යුතුකම් සහ කාර්යයන් සඳහා අවශ්‍ය වන විට හැර, බැංකුවට අයිතිවිය හැකි, රහසිගත හෝ නැතහොත් සංවේදී තොරතුරු සම්බන්ධිත පාර්ශවයන්ට ගලායාමට ඉඩ ඇති වාර්තා කිරීමේ මාර්ග සහ තොරතුරු ගලායාමේ ක්‍රම පවත්වා ගැනීම.	අනුගමනය කරන ලදී. 3(7)(i) සඳහන් කර ඇති පරිදි සම්බන්ධිත පාර්ශව සමඟ ඇතිවන කිසියම් ගනුදෙනුවක් මඟින් අරමුණු අතර ගැටුම් ඇතිවීම වළක්වා ගැනීමට අවශ්‍ය පියවර අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ගනු ලැබේ . වාසිදායක සැලකිම් හඳුනා ගැනීම සම්බන්ධයෙන් පවතින අධීක්ෂණ ක්‍රියාවලිය වැඩි දියුණු කෙරේ.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (7) (iv)	ණය පහසුකම් ප්‍රදානය කිරීමේදී, ණය ලබාගන්නා අධ්‍යක්ෂවරයාගේ ඡන්දය හැර අධ්‍යක්ෂ මණ්ඩලයේ 2/3 ක අනුමැතිය නොමැතිව අධ්‍යක්ෂවරයෙකුට හෝ සමීප ඥාතියෙකුට බැංකුව ණය ප්‍රදානය නොකළ යුතු ය. මෙම ණයමුදල් මණ්ඩලය වරින් වර තීරණය කරන සුරැකුම් මඟින් සුරක්ෂිත කළයුතු ය.	අනුගමනය කරන ලදී.
3 (7) (v)	(අ) යම් පුද්ගලයෙකුට හෝ පුද්ගලයෙකුගේ ළඟම ඥාතියෙකුට හෝ එම පුද්ගලයාගේ සැලකිය යුතු හිමිකමක් ඇති ව්‍යාපාරයකට බැංකුව විසින් මුදල් ණයට දීමක් කර ඇති විටක, එම පුද්ගලයා පසුකාලීනව බැංකුවේ අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කළේ නම්, බැංකුව මුදල් මණ්ඩලය මඟින් එම කටයුත්ත සඳහා අනුමත කර ඇති සුරැකුම්, එම පුද්ගලයා අධ්‍යක්ෂවරයෙකු වශයෙන් පත් කළ දින සිට වසරක් ඇතුළත ලබාගැනීමට අවශ්‍ය පියවර ගතයුතුය. (ආ) ඉහත 3(7)(ii)(අ) විධානයේ සඳහන් ආකාරයට එවැනි සුරැකුම් සපයා නොමැති නම්, බැංකුව ලැබිය යුතු මුළු මුදල, අදාළ නම් පොළිය ද සමඟ, එම ණය ප්‍රදානය කිරීමේදී නිශ්චය කළ කාලසීමාව හෝ එලෙස අධ්‍යක්ෂවරයෙකු ලෙස පත් කර මාස 18 ක් ගතවීම හෝ යන්නෙන් කලින් යෙදෙන දිනට, අයකර ගැනීමට බැංකුව විසින් පියවර ගතයුතු ය. (ඇ) මෙම අනුවිධානය සමඟ අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන ඕනෑම අධ්‍යක්ෂවරයෙකු, ඔහුගේ නිලය අත්හැර ගියා සේ සලකන අතර, ඒ බව බැංකුව මහජනතාවට හෙළිදරව් කළයුතු ය. බැංකුව ණය ප්‍රදානය කරන අවස්ථාවේදී අධ්‍යක්ෂවරයා බැංකුවේ සේවකයෙකු නම් සහ ණය ප්‍රදානය කර ඇත්තේ බැංකුවේ සියලුම සේවකයන්ට පොදු වූ යෝජනා ක්‍රමයකට නම් මෙම අනුවිධානය එවැනි අධ්‍යක්ෂවරයකුට අදාළ නොවේ. (ඈ) අධ්‍යක්ෂවරයෙකු බැංකුවෙහි සේවකයෙකු වශයෙන් කටයුතු කරන අවධියෙහිදී යම් පහසුකමක් ලබා ගත්තේ නම් ද, එය බැංකුවේ සියළු සේවකයන්ට පොදු වූ ක්‍රියාවලියක් යටතේ ලැබූ පහසුකමක් ද වේ නම්, මෙම අන් විධානයට එවන් අධ්‍යක්ෂවරයෙකු යටත් නොවේ.	2012 වසර තුළදී මෙවැනි තත්ත්වයක් උදා වී නොමැත. 3(7)(i) යටතේ දක්වා ඇති ස්වයංක්‍රීය පද්ධතිය මෙයට යොදා ගනී.
3 (7) (vi)	බැංකුවේ සේවකයින්ට පොදු වූ යෝජනා ක්‍රමයක් මත හෝ ඉහත සඳහන් 3(7)(iv) විධානයේ සඳහන් පරිදි මුදල් ණයට දීමේදී මුදල් මණ්ඩලය අනුමත කර ඇති සුරැකුම් මඟින් සුරක්ෂිත කර ඇති විට හැර, මුදල් ණයට දීමක් හෝ ගාස්තු සහ කොමිස් අතහැර පක්ෂග්‍රාහී වාසිදායක සැලකිල්ලක් ඕනෑම සේවකයෙකුට හෝ එවැනි සේවකයෙකුගේ ළඟම ඥාතියෙකුට හෝ සේවකයා හෝ ළඟම ඥාතියා සමග ප්‍රමාණවත් බැඳියාවක් ඇති ඕනෑම සම්බන්ධිත පාර්ශවයකට බැංකුව විසින් නොකළ යුතු ය.	සියලුම සේවකයින්ට පොදු වූ සාමාන්‍ය ණය යෝජනා ක්‍රමය හැර වෙනත් පක්ෂග්‍රාහී වාසිදායක සැලකිල්ලක් කිසිදු සේවකයෙකු වෙනුවෙන් කර නොමැත. මේ සම්බන්ධයෙන් චක්‍රලේඛීය උපදෙස් නිකුත් කර ඇත.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (7) (vii)	මුදල් මණ්ඩලයේ පූර්ව අනුමැතිය නොමැතිව, ඉහත සඳහන් විධානයන් 3(7)(iv) සහ 3(7)(vi) යටතේ ප්‍රදානය කළ කිසිම ණය මුදලක් හෝ එම ණය මුදලේ කොටසක් හෝ ඊට අදාළ පොළිය හෝ ප්‍රේෂණය කළ නොහැකි අතර, එවැනි අනුමැතියක් නොමැතිව කළ ඕනෑම ප්‍රේෂණය කිරීමක් අවලංගු සහ බල රහිත එකක් වන්නේය.	අනුගමනය කරන ලදී. 2012 වසර තුළදී මෙවැනි කිසිදු සිදුවීමක් සිදු වී නොමැත.
3 (8) **හෙළිදරව් කිරීම්**		
3 (8) (i)	අධ්‍යක්ෂ මණ්ඩලය විසින්: අධීක්ෂණ හා නියාමන ආයතනයන් විසින් නියම කරන ලද ආකෘතීන්ට සහ අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන සහ කාර්තුමය මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම හා ප්‍රසිද්ධ කිරීම කළ බවටත් සම්පිණ්ඩිත ස්වරූපයෙන් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පුවත්පත්වල එම ප්‍රකාශන ප්‍රසිද්ධ කරන බවටත් සහතික විය යුතු ය.	අනුගමනය කරන ලදී.
3 (8) (ii)	පහත අවම හෙළිදරව් කිරීම් වාර්ෂික වාර්තාවේ ඇතුළත් කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සහතික විය යුතු ය:	
	(අ) අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ විශේෂිත හෙළිදරව් කිරීම් ඇතුළත් නියාමන අවශ්‍යතාවයන්ට අනුකූලව වාර්ෂික විගණිත මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බව සඳහන් ප්‍රකාශයක්.	අනුගමනය කරන ලදී. පිටු අංක 226 සිට 229 දක්වා ඇති ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව යටතේ විස්තර කර ඇත.
	(ආ) මූල්‍ය වාර්තාකරණයේ විශ්වාසවන්තභාවය පිළිබඳ සාධාරණ සහතිකයක් ලැබෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණය සැලසුම් කර ඇති බවත් අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන්ට අනුව බාහිර අරමුණු සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කර ඇති බවත්, සහතික කරන්නාවූ බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණය පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාවක්.	අනුගමනය කරන ලදී. මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 233 දක්වා ඇති මූල්‍ය වාර්තාකරණය මත අභ්‍යන්තර පාලනය පිළිබඳව වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව යටතේ විස්තර කර ඇත.
	(ඇ) සහතික වීම් සඳහා වන ශ්‍රී ලංකා ප්‍රමිත **SLSAE** 3050 - අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තා සඳහා බැංකු වලට ලබාදෙන සහතිකය යටතේ විගණකවරුන් විසින් නිකුත් කරනු ලබන සහතික වීමේ වාර්තාව	අනුගමනය කරන ලදී. මෙය, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 235හි දක්වා ඇත.
	(ඈ) අධ්‍යක්ෂවරුන්ගේ නම්, යෝග්‍ය බව හා උචිතභාවය, බැංකුව සමඟ කර ඇති ගනුදෙනු සහ බැංකුව විසින් ගෙවන ලද ගාස්තු/පාරිශ්‍රමික ඇතුළත් අධ්‍යක්ෂවරුන්ගේ විස්තර.	අනුගමනය කරන ලදී. අධ්‍යක්ෂවරුන්ගේ විස්තර සඳහා පිටු අංක 34 සිට 37 දක්වාද, ගනුදෙනු හා ගාස්තු සඳහා සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය දක්වන පිටු අංක 310 සිට 315 දක්වා ද, අධ්‍යක්ෂවරුන්ගේ ගාස්තුවල නිශ්චිත අගය සඳහා පිටු අංක 259 ද පරිශීලනය කරන්න.
	(ඉ) 3(7)(iii) හි අර්ථ දක්වා ඇති සෑම වර්ගයකම සම්බන්ධිත පාර්ශවයන්ට ප්‍රදානය කළ මුළු ශුද්ධ පහසුකම් සෑම වර්ගයකම සම්බන්ධිත පාර්ශවයකම ප්‍රදානය කර ඇති ශුද්ධ මුළු පහසුකම් බැංකුවේ නියාමන ප්‍රාග්ධනයේ ප්‍රතිශතයක් ලෙස හෙළිදරව් කළයුතු ය.	අනුගමනය කරන ලදී. පිටු අංක 314 පරිශීලනය කරන්න.

මූලධර්ම		අනුකූලතා මට්ටම
	(ඊ) බැංකුව විසින් එහි ප්‍රධාන කළමනාකරණ නිලධාරීන්ට ගෙවූ මුළු පාරිශ්‍රමිකවල එකතුව සහ පාරිශ්‍රමික ගෙවීම්, ප්‍රදානය කළ ණය පහසුකම් සහ බැංකුවේ කර ඇති තැන්පතු හෝ ආයෝජන යනාදී පුළුල් කාණ්ඩයන් වශයෙන් බැංකුව ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග සිදුකළ ගනුදෙනු.	අනුගමනය කරන ලදී. සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය යටතේ පිටු අංක 310 පරිශීලනය කරන්න.
	(උ) ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පරිචය පිළිබඳ ප්‍රකාශය 4750- යටතේ නිකුත් කරන ලද විගණකයින්ගේ අනාවරණය කරගත් කරුණු ඇතුළත් වාර්තා වල අඩංගු කරුණු වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවෙහි අන්තර්ගත කොට බැංකු අධීක්ෂණය පිළිබඳ අධ්‍යක්ෂ වෙත තහවුරුවක් ලබාදීම සිදුකළ බවට සහතිකයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිය වාර්ෂික ආයතනික යහපාලන වාර්තාවෙහි ඉදිරිපත් කළ යුතුය.	අනුගමනය කරන ලදී. මෙම වාර්තාව අවසානයේ දක්වා ඇත. විගණකාධිපතිගේ නිර්දේශ ඇතොත් ඒවා 2013 වසරේදී සලකා බලනු ඇත.
	(ඒ) විවක්ෂණශීලී අවශ්‍යතා, නියාමන, නීති සහ අභ්‍යන්තර පාලනයන් සමඟ අනුකූල බවට සහ ප්‍රමාණාත්මක අනුකූල නොවීම් නිවැරදි කිරීමට ගත් ක්‍රියාමාර්ග පිළිබඳ විස්තර ඇතුළත් වාර්තාවක්.	අනුගමනය කරන ලදී. මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 105 හි වාර්තාව පරිශීලනය කරන්න.
	(ඌ) මුදල් මණ්ඩලය විසින් මහජනයාට හෙළිදරව් කළයුතු බවට විධානය කර ඇත්නම්, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් පෙන්වා දී ඇති බැංකුවේ අවදානම් කළමනාකරණයේ අඩුපාඩු සම්බන්ධ නියාමන හා අධීක්ෂණ සැලකිල්ල යොමු වූ කරුණු සහ එවැනි සළකා බැලීම් නිවැරදි කිරීමට ගත් පියවරයන් ඇතුළත් වාර්තාවක්.	මෙවැනි තත්ත්වයන් ඇති නොවුණි.

මූලධර්ම		අනුකූලතා මට්ටම
3 (9) **සංක්‍රාන්තිමය සහ අනෙකුත් පොදු විධිවිධානයන්**		
3 (9) (i)	අනුකූල වීම සඳහා විශේෂිත කාලයක් මෙම විධානයේ ලබාදී ඇති අවස්ථා හැර, මෙම විධානය සමඟ 2008 ජනවාරි 01 දින පටන් අනුකූල වීම ආරම්භ කළයුතු අතර, 2009 ජනවාරි 01 දින හෝ ඊට පෙර මෙම විධානය සමඟ සම්පූර්ණයෙන් අනුකූල විය යුතු ය.	අනුගමනය කරන ලදී.
3 (9) (ii)	විශේෂිත ව්‍යවස්ථා මඟින් ශ්‍රී ලංකාවේ සංස්ථාපිත බැංකු, අදාළ ව්‍යවස්ථාවන්හි විධිවිධානවලට පටහැනි නොවන්නා වූ මෙම විධානයේ විධිවිධාන සමඟ අනුකූලවීම සඳහා පියවර ගැනීමේ කොන්දේසියට යටත්ව, එම අදාළ ව්‍යවස්ථාවන්හි විධිවිධානයන්ට අනුකූලව කටයුතු කරගෙන යාමට ඒවායේ අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු කළයුතු ය.	ලංකා බැංකුව, එය පාලනය වන ව්‍යවස්ථාව, එනම් 1938 අංක 53 දරණ ලංකා බැංකු පනත සහ එහි සංශෝධනයන් වලට පටහැනි නොවන්නා වූ මෙම විධානයේ විධිවිධාන සමඟ අනුකූලව කටයුතු කරගෙන යාමට කළ හැකි සියලු කාර්යයන් සිදු කරයි. ලංකා බැංකුව, එය පාලනය වන ව්‍යවස්ථාවට අනුව කටයුතු කරගෙනයාමේදී මෙම විධානයේ කිසියම් විධිවිධානයකට අනුකූලතාවයක් නොදක්වයි නම් එය ඉහත දක්වන ලද අදාළ අංශයන් යටතේ නිශ්චිතව දක්වා ඇත.
3 (9) (iii)	එවැනි බැංකු සංස්ථාපිත රටේ නියාමනයන් හා නීතිවලට පටහැනි නොවනතාක් දුරට, ලංකාවේ ක්‍රියාත්මක වන විදේශීය බැංකුවල ශාඛාවලට මෙම විධානය බලපාන්නේය. විදේශීය බැංකුවක ශාඛාවක් විසින්, තම වාර්ෂික වාර්තාව සහ ලංකාවේ ශාඛාවේ ගිණුම් කටයුතු සමඟ තම මව් බැංකුවේ වාර්ෂික ආයතනික යහපාලන වාර්තාව පළ කළයුතු වේ.	අදාළ නොවේ.
3 (9) (iv)	මෙම විධානයේ යම් ප්‍රතිපාදනයක් කිසියම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය (හෝ අභ්‍යන්තර නීතිරීති) සමඟ ගැටීමක් ඇති වන අවස්ථාවකදී, මෙම විධානයේ විධිවිධානයන් බලාත්මක වේ. නමුත් යම් බැංකුවක සාංගමික ව්‍යවස්ථාවලිය විසින් මීට වඩා දැඩි ප්‍රමිතීන් දක්වා ඇත්නම්, සාංගමික ව්‍යවස්ථාවලියේ ඇති එවැනි විධිවිධානයන් අනුගමනය කළහැකි වන්නේය.	අදාළ නොවේ.
3 (9) (v)	බැංකු පනතේ සඳහන් පරිදි අසනීප තත්ත්වයක් හෝ අයෝග්‍යතාවයක් වැනි කිසියම් හේතුවක් වේ නම් විධිවිධාන 3 (2) (ii) (ආ), 3 (3) (i) (අ), සහ 3 (3) (ii) (අ) හි ව්‍යතිරේක ප්‍රයෝජනවත් නොවන බව මුදල් මණ්ඩලය සලකන අතර එවැනි විටකදී මුදල් මණ්ඩලය විසින් අදාළ පුද්ගයන්ට දැනුම් දෙයි. පසුව මුදල් මණ්ඩලය විසින් නිදහස් කිරීම් ලබාදෙන කාල සීමාව අඩුකරනු ලැබේ.	අදාළ නොවේ.

ආයතනික

යහපාලනය

ශ්‍රී ලංකා සුරැකුම් හා විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය ඒකාබද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳව මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම පිළිබඳව විස්තර පහත වේ.

විෂයය	හෙළිදරව් කිරීම	ප්‍රතිචාරය
සභාපති සහ ප්‍රධාන විධායක නිලධාරී (ප්‍ර.වි.නි.)	සභාපති සහ ප්‍ර.වි.නි. එකම තැනැත්තා වේනම්, සභාපති/ප්‍ර.වි.නි. ගේ නම සහ පත්කරන ලද ජ්‍යෙෂ්ඨ ස්වාධීන අධ්‍යක්ෂවරයා සහ මෙම තනතුරු දෙක ඒකාබද්ධ කිරීමේ තීරණය සාධාරණීකරණය කිරීමට හේතු.	සභාපති සහ මහා කළමනාකරු වශයෙන් හඳුන්වන ප්‍රධාන විධායක නිලධාරී තනතුරු පුද්ගලයින් දෙදෙනෙකු විසින් දරයි.
මණ්ඩලයේ තුලනතාවය	ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරු හඳුනාගත යුතුය. ආචාරධර්ම සංග්‍රහයේ අදාළ සාධක පිළිබඳව සැලකීමකින් තොරව, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු ස්වාධීන වශයෙන් හඳුනාගෙන ඇත්නම්, එවැනි හඳුනා ගැනීමක් සඳහා බලපෑ සාධක අනාවරණය කළ යුතුය.	ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා නිකුත් කරන ලද 2007 අංක 11 දරණ බැංකු පනත් විධානයෙහි ස්වාධීන අධ්‍යක්ෂවරුන් හඳුන්වා දී ඇත.
නව අධ්‍යක්ෂකවරු පත් කිරීම්	නව අධ්‍යක්ෂකවරු පත්කළ විට පහත විස්තර අනාවරණය කළ යුතුය. එම අධ්‍යක්ෂවරයා පිළිබඳව සංක්ෂිප්ත විස්තරයක් ඔහුගේ විශේෂඥතාවයේ ස්වභාවය හා අදාළවන ක්‍රියා ක්ෂේත්‍රයන් අධ්‍යක්ෂ ධූරයන් සහ මාණ්ඩලීය උපකමිටුවල සාමාජිකත්වය හොබවන සමාගම්වල නම් සහ එවැනි අධ්‍යක්ෂවරයෙකුට ස්වාධීනව කටයුතු කළ හැකිද යන බව.	අනුගමනය කරන ලදී.
නාම යෝජනා කමිටුව	නාම යෝජනා කමිටුවේ සභාපති සහ සාමාජිකයින් වෙනමම හඳුන්වාදිය යුතුය.	අනුගමනය කරන ලදී. නාම යෝජනා සහ ආයතන යහපාලන කමිටුවේ විස්තර සඳහා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 144 සහ 145 පරිශීලනය කරන්න.
අධ්‍යක්ෂ මණ්ඩලීය කාර්යසාධන ඇගයීම	කාර්යසාධන ඇගයීමේ කාර්යය සම්පූර්ණ කරන ලද්දේ කෙසේද යන්න අනාවරණය කළ යුතුය.	ඇගයීම් ආකෘති පත්‍රයක් සම්පූර්ණ කිරීමෙන් සහ එහි පිළිතුරු මත පදනම්ව වාර්තාවක් සකස් කිරීම මඟින් මෙම කාර්යය සිදු කරන ලදී.

විෂයය	හෙළිදරව් කිරීම	ප්‍රතිචාරය
අධ්‍යක්ෂ මණ්ඩලය හා සම්බන්ධ අනාවරණයන්	එක් එක් අධ්‍යක්ෂවරයා සම්බන්ධයෙන් පහත විස්තර අනාවරණය කළ යුතුය:	අනුගමනය කරන ලදී. කරුණාකර මෙම වාර්ෂික වාර්තාවේ පහත සඳහන් පිටු අංක පරිශීලනය කරන්න.
	නම, සුදුසුකම් සහ සංක්ෂිප්ත ජීවදත්ත	පිටු අංක 34 සිට 37
	අදාළ ක්‍රියාකාරී අංශයන් හි ඔහුගේ/ඇයගේ ඇති විශේෂඥතාවයේ ස්වභාවය.	පිටු අංක 34 සිට 37
	ආසන්නතම පවුලේ සහ/හෝ සමාගමේ අනෙකුත් අධ්‍යක්ෂවරු සමඟ ප්‍රමාණාත්මක ව්‍යාපාර සම්බන්ධකම්	එවැනි සම්බන්ධතා නොමැති බව අධ්‍යක්ෂවරුන් විසින් සහතික කරන ලදී.
	අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන ශ්‍රී ලංකාවේ අනෙකුත් ලැයිස්තුගත සමාගම්වල නම්	පිටු අංක 34 සිට 37
	අධ්‍යක්ෂවරයෙකු ලෙස සේවය කරන අනෙකුත් සමාගම්වල හෝ සමූහ සමාගම්වල නම්	පිටු අංක 34 සිට 37
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පැමිණි සංඛ්‍යාව/ප්‍රතිශතය	පිටු අංක 149
	අධ්‍යක්ෂවරයා සාමාජිකයෙක් හෝ සභාපති වශයෙන් සේවය කරන ලද කමිටු වල නම් සහ	පිටු අංක 149
	කමිටු රැස්වීම්වලට සහභාගී වූ සංඛ්‍යාව/ප්‍රතිශතය.	පිටු අංක 149
පාරිශ්‍රමික අනාවරණය කිරීම	අධ්‍යක්ෂ මණ්ඩලයේ සමස්ත පාරිතෝෂිකය සහ පාරිශ්‍රමික ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රකාශනයක්.	වර්ෂ 2012 සඳහා වන අධ්‍යක්ෂ මණ්ඩලයේ පාරිශ්‍රමිකය වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 259 හි ඉදිරිපත් කර ඇත. පාරිශ්‍රමික ප්‍රතිපත්තිය පිළිබඳ තොරතුරු සඳහා පිටු අංක 142 පරිශීලනය කරන්න.
ප්‍රධාන ගනුදෙනු	සමාගම විසින් එළැඹ ඇති සියලුම ප්‍රධාන ගනුදෙනු පිළිබඳව අනාවරණය කළ යුතුය.	අනුගමනය කරන ලදී.
විගණන කමිටුව	විගණන කමිටුවේ සාමාජිකයින්ගේ නම් අනාවරණය කළ යුතු වේ.	විගණන කමිටු සාමාජිකයින්ගේ නම් පිටු අංක 139 හි විගණන කමිටු වාර්තාවෙහි ඇතුළත් කර ඇත.
	විගණකවරුන්ගේ ස්වාධීනත්වය තීරණය කිරීමේ පදනම.	ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව බැංකුවේ විගණක, විගණකාධිපතිවරයායි. විගණකාධිපතිවරයාගේ ස්වාධීනත්වය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් තහවුරු කර ඇත.
ව්‍යාපාර පරිචය සහ ආචාරධර්ම සංග්‍රහය	සමාගමට ව්‍යාපාර පරිචය හා ආචාරධර්ම සංග්‍රහයක් ඇත්ද යන්න හා අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් මෙන්ම ජ්‍යෙෂ්ඨ කළමනාකරණය සඳහා ආචාරධර්ම පද්ධතියක් ඇත්ද යන්න අනාවරණය කළ යුතුය.	බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා ආචාරධර්ම සංග්‍රහයක් පවතී. බැංකුවේ සේවකයින් සඳහාද වෙනමම ආචාරධර්ම සංග්‍රහයක් සකස් කර ඇත.
	ඔවුන් විසින් එවැනි ආචාරධර්මවලට එකඟව කටයුතු කළ බව තහවුරු කෙරෙන ප්‍රකාශයක් කළ යුතුය.	වාර්ෂිකව අනුකූලතා සහතිකයක් ලබාගනී.
	සභාපතිවරයා ඔහු හෝ ඇය මෙම ඕනෑම ආචාරධර්මයකට පටහැනිව කටයුතු කළ බව නොදන්නා බව සහතික කළ යුතුය.	අනුගමනය කරන ලදී.

විෂයය	හෙළිදරව් කිරීම	ප්‍රතිචාරය
අඛණ්ඩභාවය	භාවිතාකරන ලද උපකල්පන මත සමාගමට අඛණ්ඩ පැවැත්මක් ඇත්ද යන්න හා අවශ්‍ය වේනම් ඒ සඳහා තත්වාගණනයක් කළ යුතු අතර, ඒවා වාර්තාකරණය කළ යුතු වේ.	අනුගමනය කරන ලදී.
පාරිශ්‍රමික කමිටුවේ සාමාජිකයින්	පාරිශ්‍රමික කමිටු සාමාජිකයින්ගේ නම් පාරිශ්‍රමික කමිටු වාර්තාවේ හෙළිදරව් කළ යුතුය.	අනුගමනය කරන ලදී. පාරිශ්‍රමික කමිටු සාමාජිකයින්ගේ නම් මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 142 හි මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාවේ හෙළිදරව් කර ඇත.
අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාවට පහත සඳහන් දෑ සම්බන්ධව අධ්‍යක්ෂවරුන් විසින් කරන ප්‍රකාශනයන්ද ඇතුළත් කළ යුතු වේ: • සමාගම නීති හා රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නියුක්ත නොවූ බව • සියලුම ප්‍රමාණාත්මක ගනුදෙනු හා බැඳුණු අධ්‍යක්ෂ මණ්ඩලයේ ඇල්ම අනාවරණය කර ඇති බව හා එවැනි ප්‍රමාණාත්මක ඇල්මක් සහිත ගනුදෙනු සම්බන්ධව ඡන්දය දීමේදී අදාළ අධ්‍යක්ෂවරු ඔවුන්ගේ ඡන්දය දීමෙන් වැළකී කටයුතු කළ බව • සෑම කොටස්කරුවාටම සමාන ආකාරයට සැළකීම සනාථ කෙරෙන ආකාරයට සියලුම ක්‍රියාමාර්ගයන් ගෙන ඇති බව • සහායාත්මක උපකල්පන මත ව්‍යාපාරය අඛණ්ඩව පවතින ව්‍යාපාරයක් බව හෝ අවශ්‍ය වන්නේනම් ඒ සඳහා තත්වාගණනයක් කිරීමත් සහ • ඔවුන් විසින් මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා පාලනය සහ අවදානම් කළමනාකරණය සමන්විත වන අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කළ බව හා ඒවායේ ඵලදායීතාවය හා සාර්ථක ලෙස ඒකඟතාවයක් දක්වන ආකාරයට ක්‍රියාත්මක වන බව.	අනුගමනය කරන ලදී. බැංකුවේ ඇත්තේ එක් කොටස්කරුවෙකි. එනම් ශ්‍රී ලංකා රජයයි.
මූල්‍ය ප්‍රකාශන	• අධ්‍යක්ෂ මණ්ඩලය මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳව තම වගකීම සම්බන්ධව වෙනම ප්‍රකාශයක් ඇතුළත් කළ යුතුය. • විගණකවරුන් විසින්ද ඔවුන්ගේ වාර්තාකරණ වගකීම පිළිබඳ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය.	අනුගමනය කරන ලදී. පිටු අංක 236 පරිශීලනය කරන්න.

විෂයය	හෙළිදරව් කිරීම	ප්‍රතිචාරය
කළමනාකරණ වාර්තාව	අවම වශයෙන් පහත දෑ අඩංගු කර 'කළමනාකරණ සමාලෝචනය සහ විශ්ලේෂණ වාර්තාවක්' වාර්ෂික වාර්තාවේ ඇතුළත් කළ යුතුය: • කර්මාන්ත ව්‍යුහය හා සංවර්ධනයන් • අවස්ථාවන් හා තර්ජනයන් • අවදානම් සහ අවධානයන් • අභ්‍යන්තර පාලන ක්‍රමයන් සහ ඒවායේ ප්‍රමාණාත්මකභාවය • සමාගම විසින් අනුගමනය කරන ලද සමාජ සහ පරිසරාත්මක සුරැකීමේ ක්‍රියාකාරකම් • මූල්‍ය කාර්යසාධනය • මානව සම්පත් හා කර්මාන්ත සම්බන්ධකම් හි ප්‍රමාණාත්මක සංවර්ධනයන් සහ • අනාගතය සඳහා වන අපේක්ෂාවන්.	අනුගමනය කරන ලදී. පිටු අංක 54 සිට 93 දක්වා පරිශීලනය කරන්න.
ආයතනික යහපාලන වාර්තාව	සමාගම විසින් අදාළ සංග්‍රහයේ දක්වා ඇති මූලධර්ම හා ප්‍රතිපාදන සමඟ අනුකූලවන පරිදි කටයුතු කළ ආකාරය හා එලෙස කටයුතු කරන ලද පරාසය අනාවරණය කළ යුතුය.	මෙම ක්‍රියාවලිය මඟින් මෙයට අනුකූලතාවය දක්වයි.
විගණන කමිටු වාර්තාව	කමිටුව විසින් ඉටුකරන ලද කාර්යභාරය පිළිබඳ විස්තර අනාවරණය කළ යුතුය.	අනුගමනය කරන ලදී. පිටු අංක 139 සිට 141 දක්වා පරිශීලනය කරන්න.

විගණකාධිපති විසින් පෙන්වා දෙන ලද සියලුම කරුණු ආයතනික යහපාලන වර්තාවේ අන්තර්ගත කොට ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ලබා දුන් සහතිකය.

"ශ්‍රී ලංකා සම්බන්ධිත සේවා පරිචය පිළිබඳ ප්‍රකාශය 4750" යටතේ විගණකාධිපති විසින් නිකුත් කරන ලද "අනාවරණය කරගත් කරුණු ඇතුලත් වාර්තාවේ" සඳහන් සියලුම කරුණු මෙම ආයතනික යහපාලන වර්තාවේ අන්තර්ගත කොට ඇති බව අධ්‍යක්ෂ මණ්ඩලය සහතික කරයි.

මේ පිළිබඳ තහවුරුවක් විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි

ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්

2013 අප්‍රේල් 18

කොළඹ දීය.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ
අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

අධ්‍යක්ෂ මණ්ඩලය

- **ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ***
  (සභාපති)
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **එස් ආර් ආටිගල මහතා**
  විධායක නොවන නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ
- **රාජු සිවරාමන් මහතා**
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **නලිනි අබේවර්ධන මෙනෙවිය**
  විධායක නොවන අධ්‍යක්ෂ
- **චන්ද්‍රසිරි ද සිල්වා මහතා**
  විධායක නොවන අධ්‍යක්ෂ
- **කේ එල් හේවගේ මහතා**
  ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂ
- **වී කනගසභාපති මහතා****
  එස් ආර් ආටිගල මහතා වෙනුවට විකල්ප
  විධායක නොවන නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

විගණන කමිටුව

සභාපති
වී කනගසභාපති මහතා**
(එස් ආර් ආටිගල මහතා
වෙනුවට විකල්ප අධ්‍යක්ෂක)

සාමාජිකයන්
රාජු සිවරාමන් මහතා
කේ එල් හේවගේ මහතා

මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටුව

සභාපතිනිය
නලිනි අබේවර්ධන
මෙනෙවිය

සාමාජිකයන්
රාජු සිවරාමන් මහතා
චන්ද්‍රසිරි ද සිල්වා මහතා
කේ එල් හේවගේ මහතා

නාමයෝජනා සහ ආයතනික පාලන කමිටුව

සභාපති
රාජු සිවරාමන් මහතා

සාමාජිකයන්
එස් ආර් ආටිගල මහතා (හෝ
විකල්ප අධ්‍යක්ෂක වී
කනගසභාපති මහතා**)
කේ එල් හේවගේ මහතා

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

සභාපති
වී කනගසභාපති මහතා***
(එස් ආර් ආටිගල මහතා
වෙනුවට විකල්ප අධ්‍යක්ෂක)

සාමාජිකයන්
රාජු සිවරාමන් මහතා
කේ එල් හේවගේ මහතා

* ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ මහතා 2013 ජනවාරි මස 08 වෙනි දින සිට බලපැවැත්වෙන පරිදි ඉල්ලා අස් වූ අතර 2013 ජනවාරි 09 වෙනි දින සිට රාසික් සරූක් මහතා සභාපති වශයෙන් පත් කරන ලදී.

** ආර් එම් ඒ රත්නායක මහතා (එස් ආර් ආටිගල මහතා වෙනුවට විකල්ප නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ) 2013 ජනවාරි 30 වෙනි දින සිට බල පැවැත්වෙන පරිදි වී කනගසභාපති මහතා වෙනුවට පත් කරන ලද අතර ඔහු ඉහත දිනයේ සිට විගණන කමිටුවේ සභාපති වශයෙන්ද ක්‍රියා කරයි.

*** වී කනගසභාපති මහතා විකල්ප නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ වශයෙන් කටයුතු කිරීම අවසන් වූ දිනයේ සිට එස් ආර් ආටිගල මහතා ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු රැස්වීම් වල සභාපති වශයෙන් ක්‍රියා කරයි.

විගණන කමිටු වාර්තාව

කමිටුවේ කාර්යභාරය

විගණන කමිටුව, විගණන කමිටු ප්‍රඥප්තිය අනුව ක්‍රියාත්මක වන අතර එය අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇති අතර එය නිරන්තරයෙන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කෙරේ.

අනෙකුත් කරුණු අතර, විගණන කමිටු ප්‍රඥප්තියෙන් පැහැදිලිව හඳුනාගෙන ඇති ප්‍රධාන කාර්යභාරය සහ වගකීම් වලට පහත කරුණු ඇතුළත් වේ.

- බැංකුවේ මූල්‍ය ප්‍රකාශ, එහි වාර්ෂික වාර්තාව, ගිණුම් ආදියේ විශ්වාසනීය බව අධීක්ෂණය කරනු පිණිස බැංකුවේ මූල්‍ය තොරතුරු සමාලෝචනය කිරීම.
- බැංකුවේ අභ්‍යන්තර විගණන කර්තව්‍යයේ ප්‍රමාණවත් බව හා සඵලතාව අධීක්ෂණය කිරීම, සමාලෝචනය කිරීම සහ ඇගයීම
- අභ්‍යන්තර විගණන වාර්තා, බාහිර විගණන කළමනාකරණ ලිපි හා තදනන්තර පසු විපරම් විගණන, ඒවා සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමඟින් සමාලෝචනය කිරීම.
- අභ්‍යන්තර පාලන ක්‍රම වල ප්‍රමාණවත් බව සහ සඵලතාව ඇගයීම.
- මූල්‍ය තත්ත්වය හෝ ව්‍යාපාරයට අදාළ කටයුතු සඳහා සැලකිය යුතු අන්දමින් බලපෑමට ඉඩ ඇති කරුණු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කරනු ලැබීම සහතික කිරීම.
- කමිටු ක්‍රියාකාරකම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය නිරන්තරයෙන් යාවත්කාලීන කිරීම සහ යෝග්‍ය නිර්දේශ සිදුකිරීම.

සංයුතිය හා ගණපූර්ණය

අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂකවරුන් තිදෙනෙකුගෙන් විගණන කමිටුව සමන්විත වේ.

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් අධ්‍යක්ෂකවරුන් කමිටුවේ සාමාජිකයින් ලෙස කටයුතු කරන ලදී.

*වී කනගසභාපති මහතා - සභාපති
(එස් ආර් ආටිගල මහතා වෙනුවට විකල්ප, නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂක)

රාජු සිවරාමන් මහතා - සාමාජික

කේ එල් හේවගේ මහතා - සාමාජික

*වී කනගසභාපති මහතා (විකල්ප නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ) රාජ්‍ය සේවයෙන් විශ්‍රාම යාමෙන් අනතුරුව එනම් මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයෙන් නික්ම යාමෙන් අනතුරුව ඔහු කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කිරීම අවසන් වූ අතර 2013 ජනවාරි 30 වෙනි දින සිට ආර් එම් ඒ රත්නායක මහතා (නව විකල්ප නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ), කමිටුවේ සභාපති වශයෙන් පත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා ආයතනික පාලනය පිළිබඳව නිකුත් කරනු ලැබූ 2007 අංක 11 දරණ බැංකු පනත් නියමය ප්‍රකාරව විගණන කමිටුවේ සභාපති ස්වාධීන විය යුතු අතර ගණකාධිකරණය සහ/හෝ විගණනය පිළිබඳ සුදුසුකම් හා අත්දැකීම් ඇති අයෙකු විය යුතුය. අදාළ වර්ෂය තුළදී ලංකා බැංකුව වී කනගසභාපති මහතාගේ සේවය ලබා ගත් අතර ඔහු අවශ්‍යම ක්ෂේත්‍රවල අත්දැකීම් සහිත වරලත් ගණකාධිකාරිවරයෙකු වන අතර එස් ආර් ආටිගල මහතා වෙනුවට නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂ වශයෙන් ක්‍රියා කලේය. ආර් එම් ඒ රත්නායක මහතා, ශ්‍රී ලංකා ගණකාධිකාරි සේවයේ ප්‍රමුඛ පෙලේ සාමාජිකයෙකු සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකරණ ආයතනයේ අධි සාමාජිකයෙකු වන අතර එස් ආර් ආටිගල මහතා වෙනුවට නව විකල්ප නිල බලයෙන් පත් වූ අධ්‍යක්ෂකවරයා වන අතර ඔහු 2013 ජනවාරි මස සිට විගණන කමිටුවේ සභාපති වශයෙන් ක්‍රියා කරයි. කනගසභාපති මහතා සහ රත්නායක මහතා බැංකුවේ එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජය නියෝජනය කරන බැවින් ඉහත නියමයෙහි ස්වාධීන අධ්‍යක්ෂකවරයෙකු සඳහා දී ඇති නිර්වචනය අනුව ඔවුන් ස්වාධීන යැයි සැලකිය නොහැක. 1938 අංක 53 දරණ ලංකා බැංකු පනත සහ එහි සංශෝධන වලට අනුකූලව මුදල් අමාත්‍යවරයා විසින් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත්කරනු ලබන බැවින් බැංකුව ඉහත නිර්දේශය සිය යහපතට අනුකූල වන පරිදි අදාළ කර ගෙන ඇත. මෙම සැකසුම ශ්‍රී ලංකා මහා බැංකුව වෙත දැනුම් දී එහි අනුමැතිය ලබාගෙන තිබේ. වී කනගසභාපති මහතා විකල්ප අධ්‍යක්ෂවරයෙකු වශයෙන් කටයුතු කිරීම අවසන් වූ පසුවත් බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කරන ලද ආරාධනාවකට අනුව නව ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව පිළියෙල කල මූල්‍ය වාර්තා විගණනය කිරීමේ කමිටුවට සිය සහයෝගය ලබා දුන් අතර එය ඔහු විගණන කමිටුවේ සභාපති වශයෙන් කටයුතු කළ කාලපරිච්ඡේදය තුළදීද අනුගමනය කරන ලදී.

සාමාජිකයන් විසින් දරා ඇති තනතුරු මඟින් ඔවුන් කමිටුවට ගෙන ආ පුළුල් පරාසයක අත්දැකීම් මෙම වාර්ෂික වාර්තාවේ 34 සිට 37 දක්වා පිටු වල පළකර ඇති අධ්‍යක්ෂවරුන්ගේ චරිතාපදාන විස්තර මඟින් දැකිය හැක.

කමිටුවේ ගණපුරණය සාමාජිකයින් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

මහා කළමනාකරු, විගණකාධිපතිවරයාගේ නියෝජිතයෙක් (බැංකුවේ බාහිර විගණක), ප්‍රධාන අභ්‍යන්තර විගණක සහ බැංකුවේ ප්‍රධාන මූල්‍ය නිළධාරිතුමා රැස්වීම් සඳහා සහභාගි වේ. 2012 වර්ෂය සඳහා බැංකුව සහ එහි පරිපාලිත සමාගම් වල ඒකාබද්ධ මූල්‍ය වාර්තා වාර්ෂික විගණනය කිරීම සඳහා විගණකාධිපති විසින් බාහිර විගණකවරුන් වශයෙන් වරලත් ගණකාධිකාරිවරුන් වන Ernst & Young ආයතනයේ හවුල්කරුවෙකු පත් කරන ලද අතර එම පත්වීමෙන් අනතුරුව ඔවුන්ද ඉහත රැස්වීම සඳහා සහභාගි විය.

කළමනාකාරිත්වයේ අනෙකුත් සාමාජිකයන් සහ බැංකුවේ අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගිත්වය අවශ්‍ය යැයි කමිටුවට හැඟී ගියහොත් ඔවුන්ට රැස්වීම් සඳහා පැමිණෙන ලෙස ආරාධනය කෙරේ. ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව 14 වරක් රැස්වන ලදී. රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම පිළිබඳ විස්තර 149 වැනි පිටුවේ ඇති වගුවේ දක්වා තිබේ. මෙම සියළු රැස්වීම් සඳහා අදාළ විස්තර සමඟ නිසි දැනුම්දීම්/ සාකච්ඡා සඳහා සිහිකැඳවීම් ලබා දෙන ලදී.

සමාලෝචිත වර්ෂය තුළදී කමිටුව පහත ක්‍රියාකාරකම් සිදු කරන ලදී.

අභ්‍යන්තර විගණනය

බැංකුවේ අභ්‍යන්තර විගණනය ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් මෙහෙයවනු ලබන අභ්‍යන්තර විගණක දෙපාර්තමේන්තුව මඟින් සිදු කළ අතර එය විගණන කමිටුව මඟින් විගණන ප්‍රඥප්තිය අනුව නිරන්තරයෙන් සමාලෝචනය කිරීම සහ යාවත්කාලීන කිරීම සිදු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

- නිරන්තර වාර්තා මඟින් 2012 වසර සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම ක්‍රියාත්මක කිරීමේ සඵලතාව අධීක්ෂණය කරන ලදී. අවශ්‍ය අවස්ථාවන්හිදී සුදුසු පසු විපරම් ක්‍රියාමාර්ග ගන්නා ලදී.
- අනාගතයේදී යළිත් සිදුවීම වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගැනීමේ අරමුණ ඇතිව, අභ්‍යන්තර විගණනයේදී සොයාගත් වැදගත් කරුණු හා ඒවාට කළමනාකාරිත්වය දැක්වූ ප්‍රතිචාර සමාලෝචනය කරන ලද අතර අභ්‍යන්තර පාලන ක්‍රම වල සඵලදායක බව සහතික කරන ලදී.
- අභ්‍යන්තර පාලන ක්‍රම සහතික කිරීමේ ක්‍රියාවලියට සහය දැක්වීම සඳහා 2012 වසර සඳහා පාලන ක්‍රමවේදය වැඩි දියුණු කරන ලදී.
- බැංකුවේ අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සඳහා මූලික සැකිල්ල සපයන යාවත්කාලීන කරන ලද අභ්‍යන්තර විගණන අත්පොත භාර දෙන ලදී.
- 2013 වසර සඳහා අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණන සැලැස්ම අනුමත කරන ලදී.
- විමර්ශන වාර්තා සමාලෝචනය කරන ලද අතර අත්‍යවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම වඩා ශක්තිමත් කරන ලදි/හඳුන්වාදෙන ලදී.

බාහිර විගණනය

ශ්‍රී ලංකා අණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලිය අනුව 2012 වසර සඳහා බාහිර විගණනය විගණකාධිපති විසින් සිදු කරන ලද අතර ඒ සඳහා Ernst & Young, වරලත් ගණකාධිකාරීන්ගේ සහයෝගය ලබා ගන්නා ලදී.

- 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ ගිණුම් පිළිබඳව විගණකාධිපතිවරයා ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ වාර්තාව, කළමනාකාරිත්ව ලිපිය සහ ඒවා සඳහා කළමනාකාරිත්වයේ ප්‍රතිචාර සමාලෝචනය කරන ලද අතර විශේෂ අවධානය යොමු කළ ගැටළු නැවත සිදුවීම වැලැක්වීම සඳහා බැංකුව විසින් ගන්නා ලද ප්‍රතිකාරක ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම් සිදු කරන ලදී.
- ඉහත සඳහන් කරන ලද විගණකාධිපති වාර්තාවේදී අවධානය යොමු කොට ඇති ගැටළු සම්බන්ධයෙන් රාජ්‍ය ආයතන පිළිබඳ පාර්ලිමේන්තු කමිටුව වෙත කළමනාකාරිත්වය විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිචාර සමාලෝචනය කරන ලදී.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදුකරනු ලබන ව්‍යවස්ථාපිත විමර්ශනයන් සම්බන්ධයෙන් ඔවුන් වෙත ඉදිරිපත් කරනු ලබන කාර්තුමය විශ්ලේෂණය සමාලෝචනය කරන ලද අතර නොවිසඳුනු ගැටළු නැවත සලකා බලන ලදී.
- 2012 දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා බැංකුවේ සහ එහි පරිපාලිත සමාගම් වල ඒකාබද්ධ මූල්‍ය වාර්තා විගණනය කිරීම සඳහා විගණකාධිපතිට සහය දැක්වීමට පත් කරන ලද සුදුසුකම් ලත් විගණකවරුන්ගේ සහ විගණකාධිපතිගේ සහභාගිත්වය ඇතිව රැස්වීමක් පවත්වන ලදී. එහි අරමුණ වූයේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බැංකු පනතේ 2007 අංක 11 දරණ ආයතනික යහපාලනය පිළිබඳ වූ නිර්දේශයට අනුකූලව සිදු කරන ලද විගණනයේ ස්වභාවය හා විෂය පථය පිළිබඳ සාකච්ඡා කොට එම කටයුතු අවසන් කිරීමයි.

මූල්‍ය වාර්තාකරණය

- නව ගිණුම්කරණ ප්‍රමිත එනම් ශ්‍රී ලංකා මුල්‍ය වාර්තාකරණ ප්‍රමිත සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව ඒකාබද්ධ කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිර්දේශ කර සමාලෝචනය කරන ලදී.
- වාර්ෂිකව විගණනය කරන ලද මූල්‍ය වාර්තා හා අතුරු මූල්‍ය වාර්තා අදාළ ගිණුම්කරණ ප්‍රමිතයන්ට හා පාලන අධිකාරීන්ගේ නිර්දේශයන්ට අනුව පිළියෙල කොට ප්‍රකාශයට පත් කරන බවට සහතික කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වන ලදී.

  නව ගිණුම්කරණ ප්‍රමිත (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිත) වලට අනුකූලව මූල්‍ය වාර්තා ප්‍රථම වරට පිළියෙල කරනු ලබන්නේ මෙම වසරේ බැවින් එම වාර්තා පිළියෙල කිරීමට සහ ඉදිරිපත් කිරීමට කමිටුව විසින් මූලාරම්භය ලබාදී එය පසුවිපරම් කරන ලදී. මෙම ක්‍රියාවලිය සඳහා බැංකුවට සහය දීමට උපදේශක සමාගමක සහය ලබා ගන්නා ලදී. මෙම ක්‍රියාවලිය කරගෙන යාම සඳහා ප්‍රධාන මූල්‍ය නිලධාරිතුමා යටතේ විශේෂ ඒකකයක් ස්ථාපිත කරන ලදී. මෙම ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සහ වෘත්තීය දක්ෂතා ලබා ගැනීම සඳහා නව සුදුසුකම්ලත් ගණකාධිකාරීවරුන් බඳවා ගෙන ඔවුන් මෙම ඒකකය තුළ යොදවන ලදී. කමිටුව විසින් මෙම ක්‍රියාවලියේ ප්‍රගතිය නියාමනය කර පරීක්ෂා කරන ලදී.
- නව ගිණුම්කරණ ප්‍රමිත යටතේ බැංකුව තුළ ක්‍රියාත්මක විය යුතු පසුවිපරම් ක්‍රියාවලියේ අවශ්‍යතාවය සමාලෝචනය කරන ලදී.
- කාර්තුමය වශයෙන් ප්‍රකාශයට පත් කරන මූල්‍ය ප්‍රකාශ පරීක්ෂා කරන ලදී.
- ආයතනික යහපාලනයට අනුකූලද යන්න පරීක්ෂා කරන ලදී.

දැනුවත් කිරීමේ වැඩසටහන්

- භාණ්ඩාගාර විගණන, නව ගිණුම්කරණ ප්‍රමිත ක්‍රියාත්මක කිරීම, ඉස්ලාමීය බැංකු කටයුතු පිළිබඳව අභ්‍යන්තර විගණන සේවකයින් පුහුණු කිරීමේ වැඩසටහන් සඳහා සහය දක්වන ලදී.

ලංකා බැංකුවේ පරිපාලිත සහ ආශ්‍රිත සමාගම් අධීක්ෂණය සහ විගණනය

- සමූහයේ කාර්යසාධනය ශක්තිමත් කිරීමේ අරමුණින් කළමනාකරණ ප්‍රඥප්තිය අනුව පරිපාලිත හා ආශ්‍රිත සමාගම්වල කාර්යසාධනය සාකච්ඡා කිරීම සඳහා එම සමාගම්වල අධ්‍යක්ෂකවරුන් සහ ප්‍රධාන විධායක නිළධාරීන් සමඟ දැනුවත් කිරීමේ රැස්වීමක් පවත්වන ලදී.
- පරිපාලිත සමාගම් වල අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය සඳහා සහය දැක්වීමේ අරමුණින් අභ්‍යන්තර විගණන ප්‍රතිපත්තියක් හඳුන්වා දෙන ලදී.
- සමූහයේ කාර්ය සාධනය ශක්තිමත් කිරීමේ අරමුණින් පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල කාර්යසාධනය කාර්තුමය පදනම මත තක්සේරු කරන ලදී. එහිදී අවධානය යොමු කළ යුතු කරුණු සහ ඒවා නිවැරදි කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ඉස්මතු කරන ලදී.

වෙනත් ක්‍රියාකාරකම්

- අරමුණු අතර ගැටුම් ඇතිවීම වැළැක්වීම සඳහා සහ සම්බන්ධිත පාර්ශවයන් අනාවරණය සඳහා සංශෝධනය කරන ලද ප්‍රතිපත්ති පරීක්ෂා කරන ලදී.
- වෘත්තීමය දක්ෂතා වැඩි දියුණු කිරීමේ පරමාර්ථයෙන් සුදුසුකම් ලත් වරලත් ගණකාධිකාරීවරුන් අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා සැලසුම් යන දෙපාර්තමේන්තු වලට පත් කරන ලදී.
- ඉස්ලාමීය බැංකුකරණ කටයුතු පරීක්ෂාවට ලක්කරන ලද අතර ඒ සඳහා වූ අත්පොත භාවිතා කිරීම නිර්දේශ කරන ලදී.

කාර්ය සටහන් / අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කිරීම

කමිටු රැස්වීම් වල කටයුතු පිළිබඳව ප්‍රමාණවත් කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පවත්වාගෙන යනු ලබයි. කමිටු රැස්වීම් වල සියළු කාර්ය සටහන් සභාගත කර, අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ස්ථිර කරන අතර එමඟින් කමිටු මඟින් සිදුකරනු ලබන නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලබා ගැනේ. නොවිසඳුණු කරුණු සඳහා නිරන්තරයෙන් පසුවිපරම් ක්‍රියාමාර්ග ගනු ලබයි.

පැමිණිලි සඳහා පටිපාටිය

සලකා බලන වර්ෂයේදී ගිණුම්කරණය, අභ්‍යන්තර පාලනය සහ විගණන කරුණු ආදිය පිළිබඳව බැංකුවට ලැබෙන පැමිණිලි භාරගැනීම, රඳවා ගැනීම හා ප්‍රතිකර්ම යෙදීමේ ක්‍රියා පටිපාටිය විස්ල් බ්ලෝවර් ප්‍රතිපත්තියට අනුව සිදුකෙරේ.

සාරාංශය

විගණන කමිටුවේ සාමාජිකයින් විසින් විගණන කමිටුවේ, ප්‍රධාන අභ්‍යන්තර විගණකගේ සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ කාර්යසාධනය පිළිබඳව සාමූහික ඇගයීමක් සිදු කරන ලදී. බැංකුවේ අභ්‍යන්තර විගණන කර්තව්‍යය, එය විගණනය කරන ක්‍රියාකාරකම් වලින් ස්වාධීන බවටත්, එය අපක්ෂපාතී බවටත්, ප්‍රවීණතාවය හා නිසි වෘත්තීය සැලකිල්ල දක්වමින් කටයුතු කළ බවටත් කමිටුවට නිසැකවම පැවසිය හැක. බැංකුවේ අභ්‍යන්තර පාලන කටයුතු වල ප්‍රමාණවත් බව විගණන කමිටුව නිරතුරුවම සමාලෝචනය කරන ලදී.

අධ්‍යක්ෂවරුන් විසින් අභ්‍යන්තර පාලනය පිළිබඳව කළ ප්‍රකාශය සහ ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 233 සිට 235 දක්වා පළ කර තිබේ. ඒ අනුව, බැංකුවේ වත්කම් ආරක්ෂා කරනු ලබන බවටත්, විගණනය කරන ලද ගිණුම් වලින් හෙළි වූ මූල්‍ය තත්ත්වය සහ ප්‍රතිඵල වාස්තවික අවප්‍රකාශයන්ගෙන් තොර බවටත්, සාධාරණ සහතිකයක් සැපයීමට අවශ්‍ය සංවරණ හා තුලන යොදවා ඇති බවටත් කමිටුවේ අදහස වේ.

විගණන කමිටුවේ හිටපු සභාපතිවරයා වන වී කනගසභාපති මහතා විසින් විගණන කමිටු ක්‍රියාකාරිත්වය වැඩි දියුණු කරමින් එම කර්තව්‍යයන් ඉතා උසස් තත්ත්වයක පවත්වා ගෙන යාම සඳහා ලබාදෙන ලද අතිවිශාල දායකත්වය වෙනුවෙන් එතුමා වෙත විගණන කමිටුවේ කෘතඥතාවය පළ කෙරේ.



ආර් එම් ඒ රත්නායක
සභාපති,
විගණන කමිටුව

2013 මාර්තු 21
කොළඹ දීය

අධ්‍යක්ෂ මණ්ඩලය සහ

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

මානව සම්පත් සහ පාරිශ්‍රමික කමිටු වාර්තාව

කමිටුවේ කාර්යභාරය

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා වූ ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනත් නියමය මත මූලිකව පදනම් වූ කමිටුවේ ප්‍රධාන වගකීම් පහත සඳහන් පරිදි වේ.

- බැංකුවේ මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් (ප්‍ර.ක.පි)සඳහා අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය (වැටුප්, දීමනා සහ අනෙකුත් මූල්‍ය ගෙවීම්) නිර්ණය කිරීම.
- මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් සඳහා අරමුණු සහ ඉලක්ක නියම කිරීම.
- ලබා දෙන ලද අරමුණු සහ ඉලක්ක වලට සාපේක්ෂව, කලින් කලට මහා කළමනාකරුගේ සහ ප්‍රධාන කළමනාකරණ පිරිස් වල කාර්ය සාධනය ඇගයීම සහ පාරිශ්‍රමිකය, ප්‍රතිලාභ සහ කාර්යසාධන අනෙකුත් දිරි දීමනා ගෙවීම් සංශෝධනය සඳහා පදනම නිර්ණය කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එයට යොමු කරන ලද කාර්ය මණ්ඩලයට අදාළ කරුණු සමාලෝචනය
- බැංකුවේ මානව සම්පත් ප්‍රතිපත්තිය සහ සංවිධාන ව්‍යුහය නිර්ණය කිරීම.

බැංකුවේ ප්‍රධාන කළමනාකරණ පිරිස් ලෙස සලකනුයේ අධ්‍යක්ෂවරුන්, මහා කළමනාකරු, නියෝජ්‍ය මහා කළමනාකරුවන් සහ සමාන්තර ශ්‍රේණි වල සේවක මණ්ඩලයයි.

සංයුතිය සහ ගණපූරණය

කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සතර දෙනෙකුගෙන් සමන්විතය. කමිටුවේ සභාපති/ සභාපතිනිය, විධායක නොවන අධ්‍යක්ෂවරයෙකු වේ.

සමාලෝචිත වර්ෂය තුළ පහත සඳහන් අධ්‍යක්ෂවරුන් කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී.

නලිනි අබේවර්ධන මෙනෙවිය - සභාපතිනිය
රාජු සිවරාමන් මහතා
චන්ද්‍රසිරි ද සිල්වා මහතා
කේ එල් හේවගේ මහතා

කමිටුවේ ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ.

මහා කළමනාකාරවරයාට අදාළ කරුණු සාකච්ඡා කරනු ලබන අවස්ථාවන්හි හැර, ඔහු කමිටුවේ සියලු රැස්වීම් වලට සහභාගී වේ. කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන්ගේ සහභාගීත්වය අවශ්‍ය වූ විට ඒ සඳහා ඔවුනට ආරාධනා කරනු ලැබේ. ලංකා බැංකුවේ/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්, කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව 5 වරක් රැස්වී තිබේ. රැස්වීම් සඳහා සාමාජිකයන්ගේ පැමිණීම 95 පිටුවේ දැක්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්හි දී සියළුම කමිටු රැස්වීම් වාර්තා ලේඛනගත කිරීම සහ ස්ථිර කර ඇති කමිටුවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය මණ්ඩලයෙන් ලබා ගෙන ඇත. නොවිසඳී ඇති කරුණු සම්බන්ධයෙන් එදිනෙදා පදනම මත පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ඉහතකී 2007 අංක 11 දරණ බැංකු පනත් නියමයන්ට අනුව, අධ්‍යක්ෂවරුන්ට අදාළ පාරිශ්‍රමික ප්‍රතිපත්තිය මෙම කමිටුව විසින් නිර්ණය කළ යුතුය. එතකදු වුවත්, ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත් කළ අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික නිර්ණය කරනු ලබන්නේ එහි එකම කොටස්කරු වන ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලද චක්‍රලේඛ හා උපදෙස් ප්‍රකාරවය. ලංකා බැංකුව ස්ථාපිත කරන ලද පනත වූ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතේ සහ එහි සංශෝධන වල විධිවිධාන ද, අධ්‍යක්ෂවරුන්ගේ පාරිශ්‍රමික හා ඔවුනට ලබා දෙන ප්‍රතිලාභ සම්බන්ධයෙන්ද සැලකිල්ලට ගනු ලැබේ. ඉහත නීතිරීති හා උපදෙස් වලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂවරුන් සඳහා අමාත්‍යාංශය නව රෙගුලාසි නිකුත් කරන විටදී විමර්ශනය කළ හැකි පාරිශ්‍රමික ප්‍රතිපත්තියක් සකස් කර තිබේ. සලකා බලනු ලබන වර්ෂය තුළදී මෙම ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී. අධ්‍යක්ෂකවරුන්ට ලබා දෙනු ලබන පාරිශ්‍රමික පිළිබඳ විස්තර වාර්ෂික පදනමින් වාර්ෂික වාර්තාවේ පූර්ණ ලෙස හෙළිදරව් කර ඇත.

ලංකා බැංකු ආඥා පනතේ විධිවිධාන ප්‍රකාරව මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව සේවකයන්ගේ පාරිශ්‍රමිකය වසර 3 කට වරක් සංශෝධනය කෙරේ. ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ (එනම් මහා කළමනාකරු, නියෝජ්‍ය මහා කළමනාකරුවන් සහ සහකාර මහා කළමනාකරුවන්) වැටුප් පිළිබඳව සාකච්ඡා අවසන් කිරීමට පෙර කමිටුව යෝජනා පිළිබඳව සාකච්ඡා කර සිය නිර්දේශය ලබා දෙයි. 2012 වසරේදී මෙම කරුණ පිළිබඳව සාකච්ඡා කරන ලද අතර කමිටුව විසින් නිර්දේශ කරන ලද්දේ අවසාන අනුමැතිය අධ්‍යක්ෂ මණ්ඩලයෙන් ලබාගත යුතු බවයි. මහා කළමනාකරු සහ නියෝජ්‍ය මහා කළමනාකරුවන් සඳහා අරමුණු සහ ඉලක්ක සංයුක්ත සැලැස්මේ සහ ඊට අදාළ ක්‍රියාකාරී සැලැස්මේ අන්තර්ගත කර ඇත.

නියෝජ්‍ය මහා කළමනාකරුවන් හරහා සංයුක්ත සැලැස්ම ක්‍රියාත්මක කිරීම මහ කළමනාකරුගේ වගකීම වේ. මහා කළමනාකරු විසින් නියෝජ්‍ය මහා කළමනාකරුවන් අගය කරනු ලබන්නේ ක්‍රියාකාරී සැලැස්මේ ජයග්‍රහණයන් පදනම් කර ගනිමින් වන අතර එම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ. අධ්‍යක්ෂවරුන් සඳහා ඉලක්ක ලබා දී නොමැත්තේ සියළුම අධ්‍යක්ෂවරුන් විධායක නොවන නිසාය.

මෙම වසරේදී කමිටුව විසින් පහත සඳහන් කරන ලද ප්‍රතිපත්ති අනුගමනය කරන ලෙස අධ්‍යක්ෂ මණ්ඩලයට නිර්දේශ කරන ලදී.

- පුහුණු හා සංවර්ධන ප්‍රතිපත්තිය
- අභියාචනා ප්‍රතිපත්තිය සහ ක්‍රියාපටිපාටිය
- තිළිණ ප්‍රදාන හා සම්මාන ප්‍රතිපත්තිය

- කිසියම් ශ්‍රේණියක් සඳහා අයදුම්පත් කැඳවීමට පෙර එහි තිබෙන පුරප්පාඩු ගණන පිළිබඳව තීරණය කිරීමේ ප්‍රතිපත්තිය

අවසාන වරට බාහිර කළමනාකරණ අභ්‍යාසලාභීන් බඳවා ගැනීමේදී ලැබුණු අයදුම්පත් වල දත්ත සංචිතය පිළිබඳව පුළුල් විග්‍රහයක් කිරීමට කමිටුවට අවශ්‍ය විය. එහිදී සුදුසුකම් ලැබීමේ විභාගය සහ යෝග්‍යතා නිර්ණායක බැංකුවට ඉතා සුදුසුවන පරිදි යාවත්කාලීන කිරීමට අවශ්‍ය විය.

නියෝජ්‍ය මහා කළමනාකරණ සහ සහකාර මහා කළමනාකරණ ශ්‍රේණි වලට උසස් කිරීමේදී සලකා බලනු ලබන අගය කිරීමේ නිර්ණායක පිළිබඳව කමිටුව විසින් පරීක්ෂා කරන ලද අතර අවසන් නිර්ණායක පිළිබඳව නැවත අගය කිරීමක් සිදු කරන ලදී.

නිගමනය

මානව සම්පත් සහ පාරිශ්‍රමික කරුණු වලට අදාළව කමිටුවේ අධීක්ෂණ වගකීම් තුළින් අධ්‍යක්ෂ මණ්ඩලයට සහය වීම කමිටුව අඛණ්ඩව සිදු කරනු ඇත.

නලිනි අබේවර්ධන
සභාපතිනිය
මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව

2013 මාර්තු 21
කොළඹ දීය.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

නාමයෝජනා සහ ආයතනික පාලන කමිටු වාර්තාව

කමිටුවේ කාර්ය භාරය

කමිටුව ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ පිළිබඳව වගකියනු ලැබේ.

- මහා කළමනාකරු සහ ප්‍රධාන කළමනාකරණ පිරිස (ප්‍ර. ක. පි) තෝරාගැනීම/පත් කිරීමට අදාළ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.
- මහා කළමනාකාර තනතුරට සහ ප්‍ර. ක. පි. තනතුරුවලට පත් කිරීම හෝ උසස්වීම් ලබා දීම සඳහා යෝග්‍යතාව සලකා බැලීමට සුදුසුකම්, පළපුරුද්ද සහ මුඛ්‍ය ගුණාංග බඳු නිර්ණායක නියම කිරීම.
- ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලට නිකුත් කරනු ලැබූ සහ ප්‍රඥප්තිවල දක්වා ඇති පරිදි ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනත් නියමයේ අංක 3 (3) දරණ නියමයේ සඳහන් නිර්ණායකවල නිශ්චිතව දක්වා ඇති පරිදි, අදාළ තනතුරු දැරීමට මහා කළමනාකාරවරයා සහ ප්‍ර. ක. පි. යෝග්‍ය සහ සුදුසු බව සහතික කිරීම.
- ප්‍ර. ක. පි. සඳහා අතිරේක/විශේෂඥ දැනුම පිළිබඳ අවශ්‍යතා සහ අනුප්‍රාප්තික සැකසුම් කලින් කලට සකසා බැලීම සහ නිර්දේශ කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ එක් එක් අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටුවල සඵලතාව, වාර්ෂික ඇගයීම පිළිබඳ ක්‍රමවේද නිර්ණය කිරීම, ක්‍රියාත්මක කිරීම සහ වාර්ෂික කාර්යසාධන ඇගයීම් ක්‍රියාදාමයට සහාය දැක්වීම.
- බැංකු ආචාර ධර්ම පද්ධතිය කලින් කලට සමාලෝචනය කිරීම.

කමිටුවේ සංයුතිය

කමිටුව අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් තිදෙනෙකුගෙන් සමන්විතය. කමිටුවේ සභාපතිවරයා විධායක නොවන ස්වාධීන අධ්‍යක්ෂවරයෙකි.

සමාලෝචිත වර්ෂය තුළ පහත දැක්වෙන අධ්‍යක්ෂවරුන් කමිටුවේ සාමාජිකයන් ලෙස කටයුතු කරන ලදී.

ආර් සිවරාමන් මහතා - සභාපති

එස් ආර් ආටිගල මහතා

කේ එල් හේවගේ මහතා

ආරාධනා කිරීම මඟින් මහා කළමනාකරු රැස්වීම් සඳහා සහභාගී වේ. කාර්ය මණ්ඩලයේ අනෙකුත් සාමාජිකයන්ගේ සහභාගිත්වය අවශ්‍ය වූ විට ඒ සඳහා ඔවුනට ඇරයුම් කරනු ලැබේ. ලංකා බැංකුවේ/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි.

රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව 5 වරක් රැස්වී තිබේ. රැස්වීම් සඳහා සාමාජිකයින්ගේ පැමිණීම 149 පිටුවේ දැක්වේ. අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්හි දී සියළු කමිටු රැස්වීම් වාර්තා ලේඛනගත කිරීම සහ ස්ථිර කිරීම සිදු කරන අතර කමිටුවේ නිර්දේශයන් ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය මණ්ඩලයෙන් ලබාගෙන ඇත. නොවිසඳී ඇති කරුණු සම්බන්ධයෙන් ඒදිනෙදා පදනම මත පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

ඉහත කී 2007 අංක 11 දරණ බැංකු පනත් නියමයට අනුව, නව අධ්‍යක්ෂවරුන් තෝරා ගැනීම/පත්කිරීම සඳහා වූ පටිපාටියක් නාමයෝජනා සහ ආයතනික පාලන කමිටුව ක්‍රියාත්මක කළ යුතුය. කෙසේවෙතත් මුළුමනින්ම රජයට අයත් ලංකා බැංකුව සම්බන්ධයෙන් ගත් කළ අධ්‍යක්ෂවරුන් පත් කිරීමේ කාර්යය 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනතට අනුව මුදල් අමාත්‍යවරයා විසින් සිදුකරනු ලැබේ. අධ්‍යක්ෂවරුන් පත්කිරීමට අදාළව ඉටු කිරීමට කිසිදු කාර්යභාරයක් නාම යෝජනා සහ ආයතනික පාලන කමිටුවට නොමැත.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව පහත ක්‍රියාකාරකම් සිදුකරන ලදී.

- බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කළමනාකාරිත්වය වෙත පවරා දෙන ලද බලතල හා නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලයේ ඉල්ලීම පරිදි පරීක්ෂා කරන ලදී.
- ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය සඳහා සමාජිකයින් තෝරා පත්කර ගැනීමට දැනට පවතින ක්‍රියාපටිපාටිය පරීක්ෂා කර බලා එය වැඩි දියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කරන ලදී.
- යෝජනා කරන ලද නව ආයතනික ව්‍යුහය පරීක්ෂාකර බලා එය වැඩි දියුණු කිරීමට යෝජනා ඉදිරිපත් කරන ලදී. මෙම කරුණ පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කිරීම සහ නැවත විමසා බැලීම සිදුකෙරේ.
- නව කාර්ය සාධන ඇගයීම් ක්‍රමය නිර්දේශ කරන ලදී.
- ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු වලට පත්වෙන කාර්ය මණ්ඩල සාමාජිකයින්ගේ දැනුම් පරතරය පියවීම සඳහා කමිටුව විසින් ආරම්භ කර දැනට ඉතා සාර්ථකව කොටසක් අවසන් කර ඇති නිපුණතා සංවර්ධන පුහුණු පාඨමාලාවේ ප්‍රතිඵල පරීක්ෂා කරන ලදී.
- ප්‍රධාන කළමනාකරණ පිරිස් වලට අයත්වන ආයතනික කළමනාකාරිත්වයේ පරීක්ෂා කරන ලද රැකියා පිරිවිතර නිර්දේශ කරන ලදී. තවද එම තනතුරු වලට අදාළ සුදුසුකම් සහ ප්‍රධාන ලක්ෂණ විස්තරාත්මක වශයෙන් දක්වන ලදී.

- අධ්‍යක්ෂවරුන් සිය සේවකයින් සඳහා වන බැංකු ආචාර ධර්ම පද්ධතිය සමාලෝචනය කරන ලදී. නවීන බැංකුකරණයට අදාළ නව චින්තනයක් සහිත සේවකයින් සඳහා වන බැංකු ආචාර ධර්ම පද්ධතිය සංශෝධනය කිරීම පිළිබඳව නිර්දේශ කරන ලදී.
- සිදුකළ යුතු ඇගයීම් ක්‍රියාදාමය නිර්දේශ කිරීම මඟින් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ ස්වයං - ඇගයීම පිළිබඳ වාර්තාව පිළියෙල කිරීම මඟින් අනු කමිටුවල කාර්ය සාධනයද ඇතුළුව අධ්‍යක්ෂ මණ්ඩලයට සිය ස්වයං ඇගයීම සිදු කිරීමට පහසුකම් සපයන ලදී. එසේම ස්වයං තක්සේරුව පිළිබඳ වාර්තාව පිළියෙල කරන ලදී.
- 2007 අංක 11 දරණ බැංකු පනත අනුව පවත්වාගත යුතු අනුකූලතා මට්ටම ඒවාට අනුකූල වීමේ අරමුණ ඇතිව තීරණය කරන ලදී.

නිගමනය

කමිටුව බැංකුවේ ආයතනික පාලන භාවිතයන් ඉහළ නැංවීම සඳහා ප්‍රයත්න දරනු ඇත.

රාජු සිවරාමන්
සභාපති
නාමයෝජනා සහ ආයතනික
පාලන කමිටුව

2013 මාර්තු 21
කොළඹ දීය.

අධ්‍යක්ෂ මණ්ඩලය සහ

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

කමිටුවේ කාර්යභාරය

අවදානම් කළමනාකරණයේ සියලු අංශ සඳහා සිය අධීක්ෂණ වගකීම් ඉටු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට සහාය දැක්වීම කමිටුවේ ප්‍රධාන කාර්යභාරය හා වගකීම වේ. උචිත අවදානම් දර්ශක සහ කළමනාකරණ තොරතුරු මඟින් ණය, වෙළඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ උපාය මාර්ගික අවදානම් ආදිය පිළිබඳව කමිටුව අවධානය යොමු කර සමාලෝචන සිදු කරයි.

ඉහත සඳහන් කළ කරුණට අමතරව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටු ප්‍රඥප්තිය මඟින් හඳුනාගනු ලැබූ පහත දැක්වෙන කරුණු සමාලෝචනය කිරීම සහ/ හෝ නිර්දේශ කිරීම කමිටුවේ වගකීම වේ.

- අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ කළමනාකරණ කමිටු ප්‍රඥප්ති
- ප්‍රධාන අවදානම් නිලධාරිතුමා විසින් නිර්දේශ කළ පරිදි ණය, වෙළඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් අවදානම් සඳහා රුචියක් ඇති කරන අවදානම් සීමා සහ ප්‍රතිපත්ති
- නිශ්චිත අවදානම් වලට පිළියම් යෙදීම සඳහා සහ කමිටුව විසින් නිශ්චිතව දක්වා ඇති ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සීමාවන් තුළ එකී අවදානම් කළමනාකරණය කිරීම සඳහා ණය කමිටුව සහ වත්කම් හා වගකීම් කළමනාකරණ කමිටුවල ප්‍රමාණවත් බව සහ සඵලතාව
- බැංකුවේ අවදානම් පැතිකඩ පිළිබඳව අවදානම් කළමනාකරණ වාර්තා මෙන්ම මතු වී එන වෙළඳපොළ සහ නියාමන අවදානම් සහ එබඳු අවදානම් හඳුනා ගැනීමට, මැනීමට, අධීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට සිදු කරනු ලබන ක්‍රියාමාර්ග
- නිශ්චිත අවදානම්, එබඳු අවදානම් බැංකුවේ ප්‍රතිපත්ති සහ නියාමන සහ අධීක්ෂණ අවශ්‍යතා මත පදනම්ව කමිටුව විසින් තීරණය කරනු ලබන විචක්ෂණ මට්ටම් ඉක්මවා යන අවස්ථාවන්හීදී අවම කිරීම සඳහා ප්‍රතිකාරක ක්‍රියාමාර්ග
- බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂවරයා හෝ අන්‍යාකාරයෙන් නියම කරන ලද පරිදි නිශ්චිත අවදානම් සහ කඩිනම් ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග හඳුනාගැනීමට අපොහොසත් වීම සඳහා වගකිව යුතු නිලධාරීන්ට එරෙහිව සුදුසු ක්‍රියාමාර්ග
- ණය, වෙළඳපොළ, ද්‍රවශීලතා, මෙහෙයුම් සහ අනුකූලතා අවදානම් වලට අදාළ අවදානම් හඳුනාගැනීමේ, මැනීමේ, අධීක්ෂණය කිරීමේ සහ අවම කිරීමේ ප්‍රමාණවත් බව සහ සඵලතාව

සංයුතිය සහ ගණපූරණය

2012 වසර අවසානයේදී ඒකාබද්ධ කළමනාකරණ කමිටුව, අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තුන් දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඔවුන් මෙසේය.

එස් ආර් ආටිගල මහතා
- අධ්‍යක්ෂ/කමිටු සභාපති

(ඔහු නොපැමිණි විට වී කනගසභාපති මහතා* අධ්‍යක්ෂ/කමිටු සභාපති වශයෙන් කටයුතු කළ අතර ඔහු එස් ආර් ආටිගල මහතා වෙනුවට විකල්ප අධ්‍යක්ෂ වේ)

ආර් සිවරාමන් මහතා
-අධ්‍යක්ෂ

කේ චිල් හේවගේ මහතා
-අධ්‍යක්ෂ

කේ ධර්මසිරි මහතා
-මහා කළමණාකරු

එම් චිල් ජේ ප්‍රනාන්දු මහතා
-වැඩ බලන ප්‍රධාන අවදානම් නිලධාරී

*සමාලෝචිත වර්ෂය තුළදී වී. කනගසභාපති මහතා රැස්වීම් වල සභාපති ධුරය දරන ලද අතර 2013 ජනවාරි මස සිට ඔහු විකල්ප නිල බලයෙන් පත්වූ අධ්‍යක්ෂ ලෙස කටයුතු කිරීම අවසන් කරන ලදී. කේ. ධර්මසිරි මහතා 2013 ජනවාරි මස සිට බැංකු සේවයෙන් විශ්‍රාම ගත් අතර වර්තමාන මහා කළමණාකරු වන ඩී එම් ගුණසේකර මහතා කමිටු සමාජිකයෙක් වශයෙන් ක්‍රියා කරයි.

කමිටු සමාජිකයින්ගේ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 34 සිට 37 දක්වා පළකර ඇත.

කමිටුවේ ගණපූරණය සාමාජිකයන් දෙදෙනෙකුගෙන් සමන්විතය.

ලංකා බැංකුවේ ලේකම්/ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්, කමිටුවේ ලේකම් ලෙස කටයුතු කරයි. අනෙකුත් කාර්ය මණ්ඩල සාමාජිකයන්ගේ සහභාගි වීම කමිටුවට අවශ්‍ය විටදී රැස්වීම් සඳහා පැමිණෙන ලෙස ඔවුනට ආරාධනය කරනු ලබයි.

රැස්වීම් සහ ක්‍රියාකාරකම්

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව 5 වරක් රැස්විය. රැස්වීම් සඳහා කමිටු සාමාජිකයන්ගේ පැමිණීම 149 පිටුවේ ඇති වගුවේ දැක්වේ.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව සිදු කළ ක්‍රියාකාරකම් පහත සාරාංශ කර දක්වා ඇත.

- පහත දැක්වෙන ප්‍රතිපත්ති සහ කාර්ය සංග්‍රහයන් සමාලෝචනය කරන ලද අතර බැංකුවේ අවදානම් පැතිකඩ ඒවා මත පදනම්ව තක්සේරු කරන ලදී.
  - (අ) ණය අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය
  - (ආ) වෙළඳපොළ අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ කාර්ය සංග්‍රහය
  - (ඇ) මෙහෙයුම් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තිය සහ කාර්ය සංග්‍රහය
  - (ඈ) ආතති පරීක්ෂා කිරීමේ ප්‍රතිපත්තිය
- ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ අවදානම මාසික පදනම මත අගය කරනු ලබන අතර එහි සාරාංශ ගත වාර්තා කාර්තුමය වශයෙන් කමිටුව වෙත ඉදිරිපත් කෙරේ. කමිටුව විසින් එම වාර්තා සමාලෝචනය කර රැස්වීම් වාර්තා මඟින් සිය නිර්දේශ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉතා ඉක්මනින් ඉදිරිපත් කෙරේ. ආයතනික සැලැස්ම තුළ අන්තර්ගත කර ඇති ප්‍රධාන උපාය මාර්ග වලට සම්බන්ධ අවදානම් වාර්තාකරණය වැඩිදියුණු කිරීම සඳහා උපදෙස් ලබා දෙන ලදී.
- සීමාව ඉක්මවා ගිය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් නියාමනය කර නිර්දේශ ඉදිරිපත් කරන ලදී.
- වැඩබලන ප්‍රධාන අවදානම් නිලධාරිතුමා විසින් සීමාව ඉක්මවා ගිය ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අවදානම් සඳහා ගත යුතු අත්‍යවශ්‍ය ක්‍රියාමාර්ග පිළිබඳ නිර්දේශයන් කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.
- ණය, මෙහෙයුම් සහ වෙළඳපොළ අවදානම් කළමනාකරණය සඳහා නවීන කළමනාකරණ පද්ධතියක් සහ ප්‍රතිමුදල් විශුද්ධිකරණ මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම සඳහා දැනට මූලික අවස්ථාවේ පවතින විධිවිධාන නැවත සොයා බලන ලදී.
- බැංකුවේ අනුකූලතා ප්‍රතිපත්තිය සංශෝධනය කරන ලදී.
- අනුකූලතා නිලධාරිතුමා විසින් භාරදෙන ලද පුළුල් අනුකූලතා වාර්තා කාර්තුමය වශයෙන් පරීක්ෂා කරන ලදී. බැංකුව විසින් සියළුම අනුකූලතා වලට අනුකූලව කටයුතු කරන බවට අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත් කිරීම සඳහා කමිටු වාර්තාවට වැඩි දියුණු කිරීම් යෝජනා කරන ලද අතර ඒවා ඒ තුළ අන්තර්ගත කරන ලදී.
- සිල්ලර ගණුදෙනුකරුවන් උදෙසා භාවිතා කරනු ලබන ණය අනුමත කිරීමේ සහ ලකුණු දීමේ ක්‍රමවේදයට දැඩිව අනුගත විය යුතු බවට නිර්දේශ කරන ලදී.
- ලාභාංශ ප්‍රතිපත්තිය අනුමත කරගන්නා ලදී.
- බැංකුවේ වර්තමාන අවශ්‍යතා වලට ගැළපෙන පරිදි මූලික බැංකු ක්‍රමය වැඩි දියුණු කිරීම පිළිබඳව විමර්ශනය කරන ලදී.
- එස් පහ සංකල්පය / තත්ත්වකව භාවිතා කිරීම සියළුම මෙහෙයුම් දෙපාර්තමේන්තුවල දැනට ක්‍රියාත්මක වෙමින් පවතින අතර එය පරීක්ෂා කරන ලදී.
- පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට සහය දැක්වීමක් වශයෙන් ඒ සඳහා යොදාගනු ලබන ක්‍රියා මාර්ග විමර්ශනය කරන ලදී. තවද මෙම ක්‍රියාවලියේදී අවදානම් භාර ගැනීම සහ සීමා පැනවීම සඳහා භාවිතා කරනු ලබන ක්‍රියා පිළිවෙත් පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වල සියළුම නාමික අධ්‍යක්ෂවරුන් සඳහා ලබා දෙන ලදී.
- ආයෝජනයන් සිදු කිරීමේ දී බැංකුව විසින් භාවිතා කරනු ලබන උපාය මාර්ග පිළිබඳව අදහස් දැක්වීමට ආයෝජන කමිටුවේ ප්‍රධානියාට ආරාධනා කරන ලද අතර මෙම ක්‍රියාවලිය කාර්තුමය පදනම මත කරගෙන යාමට අදහස් කෙරේ.
- බැංකුවේ අභ්‍යන්තර ප්‍රාග්ධනය ප්‍රමාණාත්මකව තක්සේරුකරන ක්‍රියාවලිය ප්‍රතිපත්තිමය වශයෙන් අනුමත කරන ලදී.

කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සිය නිර්දේශ කාර්ය සටහන් මඟින් වාර්තා කරන ලදී. කමිටු රැස්වීම්වල සියලූ කාර්ය සටහන් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී සභාගත කර අනුමත කරන අතර නොවිසඳී ඇති කරුණු සම්බන්ධයෙන් පසු විපරම් ක්‍රියාමාර්ග ගනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩල උප කමිටු

නිගමනය

ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සමාජිකයින් විසින් කමිටුවේ කාර්යඵලය සාමූහිකව අගය කරන ලදී. තවද අන්තර්ජාතික ප්‍රමිත අනුව යමින් අවදානම් කළමනාකරණ හා අනුකූලතා ක්‍රියාවලියේදී මුහුණ දීමට සිදුවන අභියෝග ජය ගැනීමේ දී බැංකුව සතුටුදායක දියුණුවක් පෙන්වා ඇති බවට කමිටුව විශ්වාස කරයි.

සමාලෝචිත වර්ෂය තුළ කමිටු සභාපතිත්වය දරණ ලද වී කනගසභාපති මහතා, බැංකුවේ අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩි දියුණු කිරීමට ලබාදෙන ලද අනර්ඝ දායකත්වය වෙනුවෙන් එය අගය කිරීමට බලාපොරොත්තු වේ.

එස් ආර් ආටිගල
සභාපති,
ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව

2013 මාර්තු 21
කොළඹ දීය.

2012 වර්ෂය සඳහා අධ්‍යක්ෂ මණ්ඩල සහ අනු කමිටු රැස්වීම් වලදී අධ්‍යක්ෂවරුන්ගේ පැමිණීම

	ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලය	විගණන කමිටුව	මානව සම්පත් හා පාරිශ්‍රමික කමිටුව	නාම යෝජනා සහ ආයතනික යහපාලන කමිටුව	ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව
පැවැත්වූ රැස්වීම් ගණන	29	14	5	5	5
අධ්‍යක්ෂවරුන්ගේ නම්	පැමිණීම් ගණන	පැමිණීම් ගණන	පැමිණීම් ගණන	පැමිණීම් ගණන	පැමිණීම් ගණන
ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ	29				
එස් ආර් ආටිගල මහතා	23			1	
රාජු සිවරාමන් මහතා	25	12	5	5	5
නලිනි අබේවර්ධන මෙනෙවිය	25		5		
චන්ද්‍රසිරි ද සිල්වා මහතා	26		5		
කේ එල් හේවගේ මහතා	26	13	5	5	5
වී කනගසභාපති මහතා (එස් ආර් ආටිගල මහතා වෙනුවට විකල්ප අධ්‍යක්ෂ)	5*	14			5

කමිටුවේ සාමාජිකයෙකු නොවේ

* වී කනගසභාපති මහතා ආරාධනය පරිදි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පහෙන් දෙකකට සහභාගි විය.



ජනතාව වෙත ගාමක ජවය සපයමින්

දේශීය බැංකු යාන්ත්‍රණයේ නියමුවා ලෙස ලංකා බැංකුව හුදෙක් තම හිමිකරු වූ රජය බලගැන්වීමෙන් නොනැවතී පොදුවේ රටවැසියන් බලාත්මක් කරයි.

තිරසර පැවැත්ම
වාර්තාව

කතා පුවත : සාමූහික වර්ධනය

පසුගිය වසරේ අප තිරසර පැවැත්ම නාභිගත වූයේ දෑත් විදහාලන්නටය. ඒ අප පාර්ශ්වකරුවන් අතර වඩාත්ම සුවිශේෂී කණ්ඩායම වන අප ගනුදෙනුකරුවන්, ප්‍රජාව, රට තුළ ප්‍රත්‍යන්ත බිම්පෙත්, අප කණ්ඩායම, ජාතික ආර්ථිකය, පරිසරය හා අනාගතය එල්ලේ අප දෑත් විදහා ලූ ආකාරය සනිටුහන් කරන්නටය.

වසරකට පසු දැන් අපගේ අවධානය යොමු කර ඇත්තේ සාමූහික වර්ධනය කෙරෙහිය. ජාතියේ බැංකුකරුවන් සේම ප්‍රමුඛතම රාජ්‍ය බැංකුව වන අපි, අප ගණුදෙනුකාර පදනම සමඟ මෙන්ම රට හාත්පස ප්‍රජාව - විශේෂයෙන් උඟන සංවර්ධිත ප්‍රත්‍යන්තය - අප ජයග්‍රාහකයන් කණ්ඩායම, ජාතික ආර්ථිකය සේම අප මෙහෙයුම් කටයුතු කරනා පරිසරය හා සමඟ එක්ව වර්ධනය වන්නෙමු. මේ වාර්තාවේ හරය වන්නේ මෙහෙයුම් වපසරියේ පවත්නා සමස්ත විවිධත්වය තුළ අප පාර්ශ්වකරුවන් හා සමඟ බැඳුනු සමීපතාවයයි.

සාමූහික වර්ධනය යන යෙදුම අපට සුවිශේෂ අරුත් දනවන්නකි. අප, අප ගනුදෙනුකරුවන් සමඟ සාමූහිකව වැඩෙන්නෙමු. මෙයින් අප අදහස් කරන්නේ ඔවුන්ගේ වත්කම් පදනම, හැකියාවන් මෙන්ම නිපුණතා, ව්‍යවසායකත්වය, ලාභදායකත්වය සේම තිරසර පැවැත්ම පිළිබඳවය. සමාජයීය හිණිමගෙහි පහළම ස්ථරයේ ඉන්නා ගනුදෙනුකාර පිරිස ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවන් බවටද උන්නතිකාමී මෙන්ම කැපවූ ක්ෂුද්‍ර මූල්‍ය ගනුදෙනුකරුවෝ සුළු හා මධ්‍ය පරිමාණ මට්ටම කරාද එළඹෙමින් සිටිති. ඒ අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් මහා - පරිමාණ ව්‍යවසායකයන් සේ වර්ධනය වන්නේ ඒ ගමන් මග ඔස්සේ වත්කම් බිහි කරමිනි; එකතු කළ අගය සහ පුළුල් සේවා අවස්ථා ජාලයක්ද නිර්මාණය කරමිනි; ඒ සියල්ල අතරතුර පාරිසරික මඟ පෙන්වීම් හා සුපිලිපන් ශ්‍රම පරිචයන් හා කදිමට අනුගත වෙමිනි.

ප්‍රජාව සම්බන්ධයෙන් වුවද මේ අපගේ භූමිකාව එලෙසින්ම ක්‍රියාත්මක වේ. අපි ප්‍රත්‍යන්ත බිම්පෙත් තුළ මූල්‍ය සේවා පුළුල් කරමින් ප්‍රජාව බල ගන්වන්නෙමු. ඒ අප ක්ෂුද්‍ර මූල්‍ය වේදිකාව ඔස්සේය; ජාතියේ අනාගතය කෙරේ අප වගකීම් සමුදාය හරහාය; අප ආයතනික සමාජ වගකීම් කාර්යභාරය තුලින්ය.

ආර්ථිකයද අප හා එක්ව වර්ධනය වේ. ජාතික ආර්ථිකය කෙරේ ශක්තිමත් දායකත්වයක් දරන අපි ගතවන වසරක් පාසා අප දායකත්වය ඉහළ නංවන්නෙමු.

අප හා සාමූහිකව වර්ධනය වන අපේ කණ්ඩායම - සේවක ප්‍රජාව අමතක නොකරන්නෙමු. ඔවුන්ගේ නිපුණතා හා ආකල්පද කැපවීම හා බැඳියාවද දැනුම හා සුවිශේෂී ප්‍රාගුණ්‍යයද නිබඳ වර්ධනය වේ.

මේ දිග හැරෙන්නේ ඒ කතා පුවතයි.....

මේ වාර්තාව පිළිබඳ වචන කිහිපයක්

මෙම වාර්තාව සකස් කරන ලද්දේ තිරසර පැවැත්ම වාර්තාකරණය පිළිබඳ වඩාත් පුළුල් ලෙස පිළිගත් ගෝලීය රාමුව වන ගෝලීය වාර්තාකරණ පුරෝගාමීත්වයේ (GRI) මඟපෙන්වීම් වලට අනුරූපවය. මේ GRI මඟපෙන්වීම් ඔස්සේ වාර්තාකරණය සඳහා අපගේ සිව්වැනි ප්‍රයත්නයය. වාර්තාව තුල G.3.1 තිරසර පැවැත්ම දර්ශක හා මූල්‍ය පහසුකම් ක්ෂේත්‍රය පිළිබඳ ව්‍යාතිරේකද අඩංගු වන අතර වාර්තාවේ අඩංගු කරුණු අන්තර්ගතයේ ගුණාත්මක බව හා වාර්තාකරණ පරිමිතීන් ඒ තුළින් උකහා ගෙන ඇත. අපේ පාර්ශ්වකරුවන්, ශ්‍රී ලාංකික ප්‍රජාව, විද්වතුන් බහු - ස්ථර ආයතන හා අපේ මෙහෙයුම් ක්‍රියාදාමයේ ආර්ථික, සමාජයීය හා පාරිසරික බලපෑම් පිළිබඳව උනන්දුවක් දක්වන සැමගේම අවධානය උදෙසා වාර්තාව පිළියෙල කර ඇත.

මෙම වාර්තාව www.boc.lk නම් වූ අප වෙබ් අඩවියෙන් ද ලබා ගත හැක.

වාර්තාකරණ කාල පරිච්ඡේදය

මෙම වාර්තාව 2012 ජනවාරි 01 දා සිට 2012 දෙසැම්බර් 31 තෙක් කාලසීමාව ආවරණය කරයි.

ඉතාමත් සමීප අතීත වාර්තාවේ වකවානු

2011-01-01 සිට 2011-12-31 දක්වා කාලසීමාව ආවරණය කල වාර්තාව 2012 මාර්තු මස නිකුත් කරන ලදී.

වාර්තාකරණ චක්‍රය

ලංකා බැංකුව තිරසර පැවැත්ම පිළිබඳ වාර්තාව සිය වාර්ෂික වාර්තාවේ කොටසක් ලෙසින් වාර්ෂිකව ඉදිරිපත් කරයි.

වාර්තාව පිළිබඳ පැහැදිලි කිරීම් ලබාගත හැකි ආකාරය

මෙම වාර්තාව පිළිබඳ කිසියම් ගැටළුවක් / පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම්, කොළඹ 10 ලංකා බැංකු මාවතේ අංක 01 දරණ තැන ලංකා බැංකු ප්‍රධාන කාර්යාලයේ දසවන මහලේ මූල්‍ය ගිණුම්කරණ ඒකකය හා සම්බන්ධ වන ලෙස පාඨකයන් වෙත ඇරයුම් කරනු ලැබේ.

සම්බන්ධ විය හැකි දුරකථන අංක : 2471615
විද්‍යුත් තැපැල් ලිපිනය : fau@boc.lk

වාර්තාකරණ සීමා හා විෂය පථය

මෙම වාර්තාව බැංකුවේ කටයුතු පමණක් ආවරණය කරන අතර, පරිපාලිතයන් හෝ ආශ්‍රිතයන් ආවරණය නොකරයි.

අන්තර්ගතය නිශ්චය කිරීම

අපේ පාර්ශවකරුවන්ගේ අපේක්ෂා හා රුචීන් මෙන්ම වසර හැත්තෑ තුනක අපේ පරිණතභාවය, ඉදිරි දැක්ම හා මෙහෙවර පදනම් කර ගනිමින් තෝරා ගත් මාතෘකා හා ගෝලීය වාර්තාකරණ දර්ශක තීරණය කොට ඒ පස් වැදෑරුම් ප්‍රවේශයක් අනුව යමින් ඉදිරිපත් කර ඇත. මෙකී තෝරා ගත් මාතෘකා තුළ ඉහළ මට්ටමක පාර්ශ්වකාර සම්බන්ධතාද ආර්ථික සමාජයීය හා පාරිසරික බලපෑමක්ද විද්‍යාමාන වේ.

- ගනුදෙනුකාර පදනම
- ප්‍රජාව
- කණ්ඩායම
- ආර්ථිකය
- පරිසරය

“සාමූහික වර්ධනය යන යෙදුම සුවිශේෂ අරුත් දනවන්නකි. අපි, අප ගණුදෙනුකරුවන් සමඟ සාමූහිකව වැඩෙන්නෙමු. මෙයින් අප අදහස් කරන්නේ ඔවුන්ගේ වත්කම් පදනම, හැකියාවන් මෙන්ම නිපුණතා, ව්‍යවසායකත්වය, ලාභදායීත්වය සේම තිරසර පැවැත්ම පිළිබඳවය.”

වාර්තාව

අදාලත්වය පිළිබඳ පැහැදිලි කිරීම

මෙම පස් වැදෑරුම් මානයන් ඔස්සේ තෝරාගත් වර්ගීකරණය කළ මාතෘකා හා දර්ශක ආර්ථික, සමාජයීය හා පාරිසරික ක්‍රියාකාරකම් තුළ කැපී පෙනෙන පිය සටහන් විදහාපාන අතර පාර්ශවකරුවන්ගේ අපේක්ෂා හා අවධානයන්ට ප්‍රතිචාර සපයයි. වාර්තාවේ අන්තර්ගතය පහත දැක්වෙන මූලික අංග ඔස්සේ ප්‍රමුඛතා පෙළගැස්වීමකට ලක් කර ඇත්තේ තිරසර සංවර්ධනය අරමුණුකර ගත් මේ ගමන් මග තුළ බෙහෙවින් තීරණාත්මක සාධක වන බැවිනි.

- භූගෝලීය අර්ථයකින් පමණක් නොව ජන විකාශ විවිධත්වය කැටි කරගත් පිවිසුම් ව්‍යාප්තිය.
- විවිධ ගණුදෙනුකාර / වෙළඳපල කාණ්ඩ වෙත යොමු කළ ගණුදෙනුකරු හිතකාමී මූල්‍ය නිමැවුම් හා සේවා (උදාහරණ: ක්ෂුද්‍ර මූල්‍යනය, ඉස්ලාමීය බැංකුකරණය, ජංගම දුරකථන මත පදනම් ගෙවීම් පද්ධති, පුද්ගලික බැංකුකරණය හා ප්‍රමුඛතා බැංකුකරණය).
- මිරිවැඩි රහිත බැංකුකරණ සංකල්පය ඔස්සේ මූල්‍ය ඇතුළත්කරණය. බැංකුකරණ ක්‍රියාවලියට අනුගත කළ නොහැකියයි සම්මත සමාජයේ පහළම ස්ථරය සෙසු ගණුදෙනුකරුවන් හා සම තත්වයක තෘප්තිමත් ගණුදෙනුකාර පදනමක් බවට පරිවර්තනය කිරීම.
- කාබනික කෘෂිකර්මය, හරිත ආයෝජනය, සම - ආකල්ප සහිත ආයතන හා කණ්ඩායම් සමඟ බද්ධ වීම, බල ශක්ති සංරක්ෂණය, සාර්ථක අපද්‍රව්‍ය කළමණාකරණය හා ප්‍රතිචක්‍රීකරණ පිළිවෙත් තුළින් මටසිලුටු පරිසරය හා පාරිසරික පද්ධති සංරක්ෂණය.
- පාරදෘශ්‍ය මානව සම්පත් පරිචයන්, ජීවනෝපාය මං පෙත් හා නිපුණතා සංවර්ධනය, සේවා ජීවන තුලිතය හා නිර්වචනය කළ ප්‍රතිලාභ සැලසුම් ඔස්සේ කණ්ඩායම ගොඩනැංවීම.
- සෞඛ්‍ය පහසුකම්, ජාතික උරුමයන්, සංස්කෘතික විවිධත්වය, ක්‍රීඩා හා විනෝද කටයුතු, අධ්‍යාපනික ආයාසයන් හා සමාජ සංකලනය අරමුණු කරගත් ප්‍රජා මූලික ක්‍රියාදාමයන්.
- දේශයේ අනාගතය වන ළමා හා යොවුන් පරපුර වේල්ලේ ආයෝජනය.

දත්ත හා තොරතුරු මිණුම්කරණය

වාර්තාවේ අඩංගු සංඛ්‍යාත්මක තොරතුරු මූලාශ්‍ර කිහිපයකින් උපුටා ගෙන ඇත.

- බැංකුවේ නිල වාර ප්‍රකාශනය
- මාර්ග ගත මූලික බැංකුකරණ මෙහෙයුම් පද්ධතිය
- බැංකුවේ විවිධ වීකක / දෙපාර්තමේන්තු විසින් රැස්කොට/ තැන්පත් කරන ලද දත්ත
- පිටස්තර ආයතන (උදා: ශ්‍රී ලංකා මහ බැංකුව) මඟින් ලබාගත් සංඛ්‍යා ලේඛණ

සංඛ්‍යාත්මක දත්තයන්හි සාවද්‍යතා ආන්තිකය සමස්තයක් ලෙස 5% නොඉක්මවන අතර, ප්‍රකාශිත ප්‍රතිඵල / කාර්යඵලය කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් නොකරයි.

දත්ත මිණුම්කරණය, සීමා හා විෂය පථය ඔස්සේ පසුගිය වාර්තාකරණයන් හා සැහෙන පමණින් වෙනස්වීම්

මෙම වසරේදී කම්කරු සබඳතා පිළිබඳ සංසන්දනාත්මක දැක්වීමේ දී අප සමස්තයක් ලෙස ස්ත්‍රී පුරුෂභාවය මත බෙදීම් දක්වා ඇති අතර, පසුගිය වසරේ, එය භාවිතා කෙරුණේ සුවිශේෂී ලෙසින් ස්ත්‍රී පුරුෂභාවය කෙරේ සංවේදීත්වයක් දක්වන කරුණු සඳහා පමණි.

කම්කරු සබඳතාවන්හි අනිවාර්යයෙන් අනාවරණය කළයුතු සියළුම අනාවරණයන් / දර්ශක සියල්ලම පාඨක - ගෝචර තනි කණ්ඩායම් හරස්කඩ වගුවක ඉදිරිපත් කර ඇත.

මේ වසරේ දී එකිනෙකට වෙනස් පාර්ශ්ව, කාණ්ඩ හා ප්‍රකාශිත මාතෘකා වාර්තාකරණයේදී පැහැදිලි සීමා / වෙන් කිරීම් යොදාගෙන ඇත. කිසියම් මාතෘකාවක් කාණ්ඩ එකකට වඩා වැඩි සංඛ්‍යාවක විහිදේ නම් (උදාහරණ : පිවිසුම් ව්‍යාප්තිය) එය වාර්තා කර ඇත්තේ වඩාත්ම දැඩි බලපෑමක් එල්ලවන කාණ්ඩය තුලය.

බාහිර පාර්ශ්ව සහතිකය

ලංකා බැංකුව, "B" මට්ටමේ වාර්තාකරණයක් ස්වයං ප්‍රකාශිත කරන අතර, බීඩීඕ පාටිනර්ස් (වරලත් ගණකාධිකාරිවරු හා සී/ස බීඩීඕ අන්තර් ජාතිකයේ සාමාජිකයෙකු) විසින් "B+" ලෙස පරීක්ෂා කොට සහතික කර ඇත.

පාර්ශ්වකරුවන් හා අන්‍යෝන්‍ය සම්බන්ධතා

අපේ පාර්ශ්වකරුවන් හා ඔවුන් හා පවත්නා සබඳතා හඳුනා ගැනීම.

කොටස් හිමිකරු - ශ්‍රී ලංකා රජය

ශ්‍රී ලංකා රජය පොදු මහජනතාව වෙනුවෙන් බැංකුවේ පූර්ණ අයිතිය දරණුයේ එකම කොටස් හිමියා වශයෙනි. රජය බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් කරන අතර, එය මුදල් අමාත්‍යංශයේ මග පෙන්වීම් මත ක්‍රියා කරයි. බැංකුව රජයේ ආයෝජනය මෙන්ම බැංකු ලාභ මට්ටම් හා සාපේක්ෂ ප්‍රමාණවත් ප්‍රතිලාභ වාරානුකූල ලාභාංශ ලෙස වෙන්කොට ප්‍රකාශ කරනු ඇතැයි රජය අපේක්ෂා කරයි. වඩාත් පුළුල් ප්‍රවේශයන් මත පදනම් වෙමින් රජය, බැංකුව ඉලක්කගත සමාජ ස්ථර හා කණ්ඩායම් උදෙසා මූල්‍ය සේවා සලසමින් සිය ජාතික ආර්ථික සංවර්ධන ආයාසයන්ට දිරිදෙනු ඇතැයිද අපේක්ෂා කරයි.

ගණුදෙනුකරුවන්

මෙම පාර්ශ්වකාර අංශයේ අපේක්ෂා මට්ටම වන්නේ සේවා පහසුකම් සැලැස්වීමෙහි ලා කඩිනම්භාවය, රහස්‍යතාවය සහ සේවා විශිෂ්ටත්වය මත පදනම් වූ ප්‍රතිලාභී සහසම්බන්ධතාවයකි. මේ අංශය ඉහළ මට්ටමේ විවිධත්වයකින් යුතු බැවින් ඒ ඒ කාණ්ඩ සඳහා වෙන් වෙන්ව සැකසූ සේවා පිරිනැමීම් පටිපාටින් ඒ වෙනුවෙන් යොදා ගත යුතුය.

සේවක පිරිස

අප කණ්ඩායම සම අවස්ථා, ජීවන මංපෙත් සංවර්ධනය, තරඟකාරී ප්‍රතිලාභ පිළිවෙත් හා අවසානයේ දී හුදු සේවා ස්ථාන පරිසරයකින් ඔබ්බට යන සේවා ජීවන තුලිත සැලසුම්ද අපේක්ෂා කරති.

සැපයුම්කරුවන්

සැපයුම් ජාලයේ අපේක්ෂා, ගුණාත්මකභාවය, පාරදෘශ්‍ය මිලදී ගැනීම් පිළිවෙත් හා ඔවුන්ගේ හැකියා සංවර්ධනය යනා දී අංග හා බැඳී පවතී.

නියාමකයන්

ශ්‍රී ලංකා මහ බැංකුව, සුරැකුම්පත් හා විනිමය කොමිසම සහ සෙසු නියාමන ආයතන, ව්‍යාපාරික අවස්ථාවන්, අවදානම් කළමණාකරණය හා අභ්‍යන්තර පාලන පිළිවෙත් පිළිබඳව සැළකිලිමත් වෙති.

අරමුදල් සපයන්නෝ

අරමුදල් සපයන්නෝ හා ණයකර හිමියෝ, විචක්ෂණශීලී භාවිතය, ප්‍රතිඥාත හා අනුකූලතාව, ප්‍රශස්ත වාණිජ පිළිවෙත් හා ආපසු ගෙවීමේ කාල රාමු අපේක්ෂා කරති.

ප්‍රජාව

බැංකු පිළිබඳව ශ්‍රී ලාංකේය ප්‍රජාවේ හැඟුම මතුපිටින් පෙනෙන මානයට වඩා සුවිසල්ය. ඊට අනුරූපව අපේක්ෂා මට්ටමද ඉහළ තලයක වන අතර සේවා සපයන්නෙකු මතු නොව ඉන් ඔබ්බට විහිදෙන්නේ සෞඛ්‍ය ආරක්ෂණය, අධ්‍යාපනය, ජාතික උරුමයන්, පාරිසරික ක්‍රියාකාරිත්වය, සංස්කෘතික හා ආගමික විවිධත්වය මෙන්ම සමාජයීය සුසංයෝගය ආවරණය කෙරෙන සමාජ ආරක්ෂණ ආයාසයන් වටා බැඳුණු සුවිශේෂී භූමිකාවක් අරමුණු කර ගනිමිනි.

පාර්ශ්වකරු සම්බන්ධතා ක්‍රියාදාමය

පාර්ශ්වකාර කණ්ඩායම හා සම්බන්ධතා එල්ලය	සම්බන්ධතා මට්ටම හා පිළිවෙත	කාල රාමුව/ වාරානුකූල කාල සීමාවන්
ගණුදෙනුකරුවන් පිළිබඳ ඉලක්කය වන්නේ පහත කියැවෙන ක්‍රියා මාර්ග තුළින් ගණුදෙනුකාර අපේක්ෂා මට්ටම් අතික්‍රමණය කිරීමය • ගනුදෙනුකාර අපේක්ෂා / සංජානනය හඳුනාගැනීම • අවදානම් සහගත ගණුදෙනුකාර කණ්ඩායම්, ඌණ වරප්‍රසාද සහිත අය, ජ්‍යෙෂ්ඨ පුරවැසියන් හා වෙනස් ආකාර හැකියා ඇත්තවුන් ආරක්ෂණය. මෙහිදී ඔවුන් වෙනුවෙන්ම සැකසුනු නිමැවුම් හා ආයාස රහිත ප්‍රවේශය භාවිතා කෙරේ • සරල ව්‍යාපාරික පිළිවෙත්, ගණුදෙනුකාර පහසුකම් ඉහළ නැංවීම ගණුදෙනුකරු කේන්ද්‍රීය සේවා ස්ථාන භෞතික සැලසුම් ප්‍රතිනිර්මාණය • හානිවිය හැකි ගණුදෙනුකාර කණ්ඩයන් අතර හැකියා මට්ටම් වර්ධනය හා බලගැන්වීම්	• ලිඛිත සන්නිවේදනය හා ප්‍රතිචාර • විද්‍යුත් තැපෑල හා කෙටි පණිවිඩ • මාසය අවසාන ගිණුම් ප්‍රකාශ සමඟ පණිවිඩ යැවීම • සේවා ස්ථානයන්හි ගණුදෙනුකාර පැමිණිලි හා යෝජනා පෙට්ටි • ගනුදෙනුකාර රැස්වීම් හා හමු • විවිධ ගණුදෙනුකාර කණ්ඩායම් හා සබඳතා උදා: කාර්මික හා වෙළඳ මණ්ඩල • දොරින් දොර පිවිස හමුවීම • පූර්ව අනතුරු හැඟවීමේ ක්‍රියාවලිය (විසිල් බ්ලොවර්) • ගණුදෙනුකාර/කාණ්ඩ සමීක්ෂණ • වෙනස් ආකාර හැකියා සහිත ගනුදෙනුකරුවන් සඳහා ආයාස රහිත ප්‍රවේශ • ගණුදෙනුකරු හැකියා සංවර්ධන වැඩ මුළු	මේ වූ කලී සුවිශේෂී සබඳතා ක්‍රියාදාමයන් හා පෙර සැලසුම් සමඟ ක්‍රියාත්මක වන නිරන්තර වැඩ පිලිවෙලකි.

පාර්ශ්වකාර කණ්ඩායම හා සම්බන්ධතා ඵල්ලය	සම්බන්ධතා මට්ටම හා පිළිවෙත	කාල රාමුව/ වාරානුකූල කාල සීමාවන්
සේවක පිරිස හා වෘත්තීය සමිති අපි සම්ප්‍රදායික සේවා ස්ථාන සංකල්පයෙන් බැහැරව සිටින්නෙමු. අප අපේක්ෂාව වන්නේ රටේ හොඳම සේවා යෝජකයා බවට පත්වීමයි. • පාරදෘශ්‍ය බඳවා ගැනීම් පිළිවෙත හා අනුයුක්ත පිළිවෙත් හා ප්‍රතිඵල මත පදනම් ජීවනෝපාය සංවර්ධන සැලසුම් • අන්‍යොන්‍යව විකඟ වූ කාර්යඵල ඉලක්ක, විකඟ වූ ඉලක්ක ඵල්ලේ නිරන්තර ඇගයුම් හා කාර්යඵල චර්යා මෙන්ම අනාගත විභවයන් උදෙසා ලකුණු පිරිනැමීම • විවිධ ජීවනෝපාය මංපෙත් ඔස්සේ සැලසුම්ගත දේශීය හා විදේශීය පුහුණු හා නිපුණතා සංවර්ධන වැඩ සටහන් • මෘදු නිපුණතා වර්ධන භාෂා හා පරිගණක සාක්ෂරතාවය • නිර්වචනය කළ ප්‍රතිලාභ සැලසුම් • සංස්කෘතික, සමාජයීය, ආගමික සංවිධාන සඳහා පහසුකම් විවේක පහසුකම් සේවා ස්ථාන සුරක්ෂිතතාව මෙන්ම සෞඛ්‍ය පහසුකම් සම්පාදනය • වෘත්තීය සමිති ප්‍රගතිය කරා යන ගමනේ පංගුකරුවන් සේ සැලකීම මේ තුළ පිළිගැනීම, නියෝජනය, සාමූහික කේවල් කිරීම හා කාර්මික සාමය අන්තර්ගතය	• ඒකක/ආංශික මට්ටමේ සේවක මණ්ඩල රැස්වීම් • අභ්‍යන්තර චක්‍ර ලේඛ • අභ්‍යන්තර පුවත් සඟරාව • පූර්ව අනතුරු හැඟවීමේ පිළිවෙත • වෘත්තීය සමිති හා මුහුණට මුහුණලා සාකච්ඡා • කාර්යඵල සමාලෝචන සැසි • ස්ථාන මාරු මණ්ඩල හා වෙනත් සේවක සහභාගීත්ව යාන්ත්‍රණ • පුහුණුවීම් පාඨමාලා • හරයාත්මක හැකියා ගොඩනැංවීම • තිරසර කාර්මික සාමය • මානව සම්පත් ප්‍රතිපත්ති කමිටුව • ශිෂ්‍යත්ව කමිටුව	• ඒකක මට්ටමේ රැස්වීම් හා සතිපතා/මාසික කාර්යඵල සමාලෝචන සැසි • පෙර සැලසුම්ගත කාලරාමු මත පුහුණු පාඨමාලා • වෘත්තීය සමිති හා නිරන්තර ගණුදෙනුව
රජය බැංකුවේ උපාය මාර්ගික ව්‍යාපාරික සැලසුම් හා ආයතනික ඉලක්ක, රජයේ ජාතික සංවර්ධන ප්‍රතිපත්ති හා අනුරූපව යොමු කිරීම • ප්‍රධාන අංශයන්හි උපාය මාර්ගික ආයෝජනද ඇතුළුව ජාතික සංවර්ධන ක්‍රියාදාමයන් තුල සක්‍රීය සහභාගීත්වය	• මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශ සමඟ නිතිපතා පැවැත්වෙන හමු • රජයේ අනෙකුත් දෙපාර්තමේන්තු සමඟ රැස්වීම් • සංවර්ධන ආයාසයන් පිළිබඳ සමාලෝචන සැසි	• ඉල්ලා සිටින පරිදි
නියාමන ආයතන • ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය, කොළඹ කොටස් හුවමාරුව, බාසල් II මගපෙන්වීම් ඇතළු නියාමන ආයතනයන්හි රෙගුලාසි, උපදෙස් හා දර්ශක අනුරූපව කටයුතු කිරීම • ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් හඳුන්වා දුන් ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති හා සමපාතීත්වය • යහ පාලන පරිවයන් හා සමඟ අනුගත වීම • කළමණාකාරිත්වය/අධ්‍යක්ෂ මණ්ඩලීය මට්ටමේ කැපවීම හා තහවුරුව	• ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කැඳවන සමාලෝචන රැස්වීම් • අනුකූලතාව තහවුරු කිරීම අරමුණු කරගත් ක්ෂේත්‍ර පරීක්ෂණ • ප්‍රධාන කාර්යාලයේ ස්ථානගත කල අනුකූලතා නිලධාරී	• මේ නිරන්තර ක්‍රියාවලියකි

පාර්ශ්වකාර කණ්ඩායම හා සම්බන්ධතා එල්ලය	සම්බන්ධතා මට්ටම හා පිළිවෙත	කාල රාමුව/ වාරානුකූල කාල සීමාවන්
අරමුදල් සපයන්නන් හා බහු - ස්ථර ණය දෙන ආයතන		
● බහු - ස්ථර ගිවිසුම් යටතේ වන කොන්දේසි, තාක්ෂණික යෙදවුම් හා ප්‍රතිඥාත සමඟ අනුගත වීම ● මූල්‍ය තත්වය හෙළිදරව්ව (අන්තර් කාලීන / වාර්ෂික වාර්තා) ● ගිවිසුම්ගත බැඳීම් හා අනුරූපව අනුකූලතා සහතික සැපයීම. ● කාර්යසාධනය / වගකීම් සහ නිවැරදි කිරීම් ක්‍රියාවලි කේන්ද්‍ර කරගත් කාලීන නිරීක්ෂණයන් සිදුකිරීම. (තනි තනි වශයෙන් හෝ කණ්ඩායම් වශයෙන්)	● වැඩ සටහන් තුළ කාර්යඵල සමාලෝචනය ● මූල්‍ය වාර්තා සම්පාදනය	● අවශ්‍යතා පදනම මත අරමුදල් සපයන්නන් හා වාරානුකූල රැස්වීම්
සැපයුම්කරුවන්		
● ශක්‍ය දේශීය සැපයුම් දාමයක් නිර්මාණය කොට ඒ හා සම්බන්ධතා පවත්වා ගැනීම	● සැපයුම්කරුවන් ලියාපදිංචිය හා සමාලෝචනය ● මුද්‍රිත මාධ්‍ය, පොදු නිවේදන ● ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවන්හි පෞද්ගලික සහභාගීත්වය තහවුරුව ● ක්ෂේත්‍ර විසිත්ත කිරීම්	● ලියාපදිංචිය දෙවසරකට වරක් ● අනෙකුත් අංග නිරන්තරව සිදුවෙමින් පවතී
ප්‍රජාව		
● යටිතල පහසුකම් උදෙසා ප්‍රජා මූලික ආයෝජන ● ප්‍රජාව දැනුවත් කිරීමේ පුරෝගාමීත්වයන් ● ආගමික / සංස්කෘතික/ක්‍රීඩා/සාමාජයීය කටයුතු තුළ සහභාගිත්වය	● පෙර සැලසුම්ගත ප්‍රජා හමුවන් ● ප්‍රජා සංවර්ධන ක්‍රියාදාම ● ස්වෙච්ඡා පදනම් මත සමාජ ක්‍රියාකාරිත්වයන් ● ප්‍රජාව තුලින් යොමු වන ප්‍රති-පෝෂණය	● නිරන්තර ව්‍යායාමයකි

පාර්ශවකරුවන් හා පැවති අන්‍යොන්‍ය සම්බන්ධතා තුළින් පැන නැගුනු මූලික මාතෘකා ඉසව්

පාර්ශවකරුවන්ගේ සැලකිල්ල යොමු වූ අයුරු	අප ප්‍රතිචාරය
ගණුදෙනුකාර සේවා විශිෂ්ටත්වය	
2011 වසර තුළ ක්‍රියාත්මක කළ ගණුදෙනුකාර සංජනන සමීක්ෂණයන්ගෙන් අනතුරුව, මේ වසර තුළ ගණුදෙනුකාර සේවා විශිෂ්ටත්වය අරමුණුකර ගත් සේවක වැඩමුළු පැවැත්විණ. ශාඛා ජාලය මුල් කර ගනිමින් පැවැති මෙම වැඩමුළු මාලාවෙහි දී අප කණ්ඩායමේ සක්‍රීය සහභාගීත්වය කැපී පෙනුනි. වැඩසටහන පිළිබඳ ප්‍රතිපෝෂණ යොමුවෙහිදී ප්‍රතිඵලදායක ගණුදෙනුකාර සත්කාරයට අකුල් හෙලීමට ඉඩ ඇති බාධක පිළිබඳව කණ්ඩායම් සාමාජිකයන් මත ඉදිරිපත් කළහ.	කණ්ඩායම් සාමාජිකයන් විසින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපෝෂණ අදහස් යෝජනා හා සංකල්ප ද ඇතුළු කර ගනිමින් මෙම වැඩ මුළුව 2013 වසර තුළද පැවැත්වෙනු ඇත.
රජය පාර්ශවකරුවකු ලෙස	
රජය බිම් මට්ටමේ ආර්ථික සංවර්ධනය ඉලක්ක කරගත් සංවර්ධන පුරෝගාමීත්ව කීපයක්ම බිහිකර ඇත. මේ අතර, උතුරු/ නැගෙනහිර සංවර්ධනය, කිරි නිෂ්පාදනය බල ගැන්වීම, ධීවර ක්ෂේත්‍රයේ ගුණාත්මක වර්ධනය හා දිළිඳු බව දුරැලීමද වෙයි. මේ වැඩසටහන් අතුරින් සමහරක් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන අංශය විසින් සම්බන්ධීකරණය කෙරෙන අතර රේඛීය අමාත්‍යංශ තමනට අදාල වැඩසටහන් ක්‍රියාත්මක කරති.	අප රජය විසින් මෙහෙය වන සංවර්ධන සමාජ පුරෝගාමීත්වයන්හි පෙරමුණු ගෙන කටයුතු කරන්නෙමු. අපේ විහිදුම් ප්‍රවේශය සමාජ සජීවීකරණයෙහි මෙන්ම ක්ෂුද්‍ර මූල්‍ය සැපයුම හා සුළු ගොවි ණය පිරිනැමීමෙහි ප්‍රතිඵල විදහා පායි.

සභාපතිතුමාගේ පණිවිඩය

අප දිවි ගෙවනුයේද, ව්‍යාපාරික කටයුතු කරනුයේ ද බෙහෙවින් කැළඹුණු ලෝකයක් තුළය. මෙහිදී අප වෙත එල්ල වන අභියෝග කිසිදා නිම නොවන චක්‍රයක රැඳී ඇත. ඒ අතර, සීඝ්‍ර ජනගහණ වර්ධනය හා මොහොතින් මොහොත පැතිරී යන නාගරීකකරණයද, ගෝලීය උණුසුම හා හිම කේතු දියවීමද කෙමෙන් සංකෝචනය වන වනගහණය හා විස්තීර්ණ ඉදිකිරීම් බිම්පෙත් ද අස්ථිර දේශගුණික විපර්යාස හා තර්ජිත පාරිසරික-පද්ධතිද වේ. වෙනත් මානයකින් සලකා බලන කල ජනවාර්ගිකත්වය, ලිංග-භේදය, මූල්‍යමය ශක්තිය හා ධූරාවලි මත පදනම් සමාජ පිළිගැනීම් තුළින් පැන නගින සමාජ අසාධාරණකම් තුලිත ආර්ථික සංවර්ධනය හා සමාජයීය සහජීවනයේ සංකල්ප නිශේධනය කරවයි.

ගෝලීයකරණයේ ප්‍රතිඵල අපේ දොර එළිපත්ත මතට පැමිණ ඇත. වත්මන් ලෝකයේ ඉන් මිදීගත හැකි අයෙක් නැත. ගෝලීයකරණයට අභියෝග කල හැකි, ඒ නොසලකා සිටිය හැකි හුදෙකලා ප්‍රජාවන්, මුළුගැන්වුණු බිම්පෙත් හෝ සමාජ සංස්ථා කිසිවක් නැත. රටවල්, සමාජ බලවේග හා පද්ධති කෙතරම් අසීමිත අයුරකින් එකිනෙකා හා බද්ධ වී ඇත් ද කිවහොත්, කිසියම් සුළු සිදුවීමක් වුවද ඒ හා බැඳි ප්‍රතික්‍රියා රළ දාමයක් ජනිත කරවයි.

මේ පසුබිම අපට ඇරයුම් කරන්නේ නවමු අයුරකින් සිතන්නටය. අප මේ අයුරින් අප දිවි පෙවතද ව්‍යාපාරික කටයුතුද එලෙසින් ඉටු කරන්නේ කෙසේ ද? තවත් කෙතරම් කාලයකටද? අප තීරණාත්මක බෙදුම් රේඛාව සටහන් කළ යුත්තේ කොතැනින්ද?

අපට ඇති එකම පිළිතුර තිරසර සංවර්ධනය වේ. එය අප අනාගතය සේම අප වර්තමානයද සේ පිළිගත යුතුව ඇත. වෙනත් කිසිදු තර්කයක් නැත. තීන්දුය.

තිරසර බව යනු ධාරිතාවකි, විභවයකි. ස්වභාවයෙන් ලද දායාදයක් නොව හැකියාවකි. කිසියම් සංවිධානයකට සිය මෙහෙවර සාක්ෂාත් කොට ඉදිරි දැක්ම කරා එළඹීමට ඇති හැකියාවය. හුදෙක් පැවැත්ම අතික්‍රමණය කොට වර්ධනය, සංවර්ධනය කරා එළඹීමය. එහිලා බලපෑමය. මෙහි මූලික පැතිකඩ දෙකකි. ඒ ආර්ථික වර්ධනය හා කැටුව එන පාරිසරික කඩා වැටීම් පිළිබඳ ගැටළුව හා මෙකී වර්ධනයට දුගී බව සමනය කිරීමට ඇති හැකියාව වශයෙනි.

තිරසර සංවර්ධනය යනු දෙපැත්තට ධාවනය කළ හැකි වීදියකි. මෙහි එකිනෙක හා බැඳුණු මානයන් යුගලයකි. ඒ තිරසර පැවැත්ම හා සංවර්ධනයයි. මෙහි සංවර්ධන මානය, අධ්‍යාපන සුදුසුකම්, සෞඛ්‍ය රැකවරණය සහ සම අවස්ථා ඔස්සේ මිනිසුන් ද ධන උත්පාදනය, නිෂ්පාදන හැකියාව හා පාරිභෝජනය ඔස්සේ ආර්ථිකය ද සමාජ ප්‍රාග්ධනය, රාජ්‍ය හා ප්‍රදේශ ඔස්සේ සමාජය ද ආවරණය කරයි. සංවර්ධනය හා සමඟ තිරසර ලෙසින් සුරැකිය යුතු මානයන් ත්‍රිත්වයකි. ඒ ස්වභාව ධර්මය (මිහිකත, ජෛව විවිධත්වය හා පාරිසරික පද්ධති) ජීවන අත්වැල (පාරිසරික පද්ධති සේවා, සම්පත් හා පරිසරය) සහ ප්‍රජාව (සංස්කෘතීන්, කණ්ඩායම් හා පෙදෙස්) වශයෙනි.

අප බැංකුවේ ආයතනික ඉලක්ක, මැදි - කාලීන උපාය මාර්ග සහ මෙහෙයුම් පිළිවෙත් සකසා ඇත්තේ තිරසර සංවර්ධන රාමුව හා අනුගත වන පරිද්දෙනි, සංක්ෂිප්තව දක්වතොත් ඒ බෘන්ට්ලෑන්ඩ් කොමිසමේ නිර්වචනය - එනම් අනාගත පරපුරට සිය මානව අවශ්‍යතා

මේ සමස්ත ක්‍රියාවලිය, නිපුණ, කැපවූ, අභිප්‍රේත කණ්ඩායමක් ඉල්ලා සිටී. පසුගිය කාලය මුළුල්ලේ අපි මේ කණ්ඩායම, ප්‍රශස්තම ජයග්‍රාහකයන් කණ්ඩායම, නිර්මාණය කොට පෝෂණය කළෙමු.

සපුරාලන්නට ඇති හැකියාව කෙරේ බල නොපාන ලෙසින් අපගේ වත්මන් අවශ්‍යතා සපුරාගැනීම - හා අනුගත වෙයි.

මේ ව්‍යායාමයෙහිදී බැංකුව සිය පාර්ශ්වකරුවනට පිළිතුරු සැපයීමට බැඳී සිටී. මේ කොටස් හිමි - හිමිකරු, ගණුදෙනුකාර පදනම, සේවක පිරිස, සැපයුම් කරුවන්, සේවා සපයන්නන් හා නියාමන ආයතන හා ශ්‍රී ලාංකීය ප්‍රජාව ලෙසින් සැදුණු විවිධාකාර කණ්ඩායමකි. අප රට තුල වඩාත් පුළුල්ව පැතිරුණු මෙන්ම විශාලතමද මූල්‍ය පහසුකම් සපයන්නා බැවින් මේ වගකීම වඩාත් බරට දැනෙයි.

අප විශ්වාස කරන්නේ තිරසර සංවර්ධනය කළ යුත්තේ එහි මූලික ත්‍රිමානය, සමාජය, පරිසරය හා ආර්ථිකය - මතම පමණක් නොවන බවය. ත්‍රිත්ව යටිතල (Tripple Bottom Line) ලෙසින්ද හඳුන්වන මේ ත්‍රිමානයට අමතරව පවත්නා, දේශජ ජනතාවන්, ජනවාර්ගික කාණ්ඩ හා සියවස් පැරණි ඥාණය හා සම්ප්‍රදායයන් විසින් ගෙනහැර පානා සංස්කෘතික මානයද අපේ අවධානයට ලක්ව ඇත.

අපේ කාර්ය භාරය ගැන ආපසු හැරී බලන අපට ඉමහත් අභිමානයක් දැනේ. අප විසින් මූල්‍ය අත හිත සැපයූ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සමහරෙක් දැන් පරිණතව සුළු හා මධ්‍ය පරිමාණ මට්ටම කරා පැමිණ සිටිති. ඒ අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෝ තවදුරටත් ඉහළ නැගෙමින් සිටිති.

තිරසර පැවැත්ම උදෙසා අප යන මේ ගමන් මග මූලික අතුරු මං පෙත් හතක් ඔස්සේ විස්තාරණය වේ.

- ප්‍රධාන බැංකු ධාරාව විසින් තවමත් සතුටුදායක ලෙසින් සේවා පහසුකම් සලසනු නොලබන බිම්පෙත් හා ජන කණ්ඩායම් කේන්ද්‍ර කර ගනිමින් පිවිසුම් ව්‍යාප්තිය හරහා අප ප්‍රවේශය සනිටුහන් කිරීම.
- මුළු මහත් සමාජ පැතිකඩ හරහා මූල්‍ය ඇතුලත්කරණය අරමුණු කර ගනිමින් එමගින් රට පුරා සමානුපාතික ධන උත්පාදනය නිර්මාණය.
- ඉදිරිපෙළ හා පසුපෙළ අලෙවි සම්බන්ධතා ඔස්සේ ක්ෂුද්‍ර ආර්ථිකය, සුළු හා මධ්‍ය පරිමාණ ඛණ්ඩය හා මහා පරිමාණ ව්‍යවසායකයන් එකිනෙකට සම්බන්ධ කරලීම.
- කාබනික කෘෂිකර්මය, පරිසර හිතකාමී කෘෂිකර්මික පිළිවෙත්, පාරිසරික පද්ධති හා වාසභූමි සංරක්ෂණය මෙන්ම හරිත ආයෝජන දිරිගැන්වීම.
- හැකියාව සහිත නිපුණතා මෙන්ම ඉහළ තලයකින් අභිප්‍රේරණය වූ ජයග්‍රාහකයන් කණ්ඩායමක් නිර්මාණය කොට පෝෂණය කිරීම තුලින් ඔවුන් බැංකුවේ අනාගත ඉදිරි පිම්මේ ගතිකය බවට පත්කරලීම.
- රජයේ ජාතික සංවර්ධන මූලෝපාය හා සංවර්ධන උපාය මාර්ග අනුව යමින් ජාතික සංවර්ධන පුරෝගාමීත්වයනට උරදීම.
- සේවා සැපයුම් තත්වයන්, වේගය හා ඒ සඳහා අවැසි උපාංග තුලින් ගණුදෙණුකාර අපේක්ෂා අතික්‍රමණය.

මේ සමස්ත ක්‍රියාවලිය, නිපුණ, කැපවූ, අභිප්‍රේරිත කණ්ඩායමක් ඉල්ලා සිටී. පසුගිය කාලය මුළුල්ලේ අපි මේ කණ්ඩායම, ප්‍රශස්තම ජයග්‍රාහකයන් කණ්ඩායම, නිර්මාණය කොට පෝෂණය කළෙමු. සිය කාර්යාලයන්හි උණුසුම හා සුවපහසුවට පමණක් සීමා නොවන ඔවුහු වත්මන් හා අනාගත ගණුදෙණුකරුවන් හමුවනු සඳහා පිටතට පිවිසෙති. පොදු ජනතාවගේ විළිපත්ත කරා පිය නගති. මේ කාර්ය තුළදී ස්වෙච්ඡා පදනමක් මත හෝරා ගණන් ගතකරති. බැංකුව ඔවුන්ගේ මේ වෑයම අගයමින් ප්‍රතිලාභ සලසයි. දේශීය බැංකු කර්මාන්තයේ ප්‍රශස්තම සේවා ජීවන තුලිත සැලසුමක් අපි ක්‍රියාත්මක කරන්නෙමු.

අපේ කාර්ය භාරය ගැන ආපසු හැරී බලන අපට ඉමහත් අභිමානයක් දැනේ. අප විසින් මූල්‍ය අත හිත සැපයූ ක්ෂුද්‍ර ව්‍යවසායකයින් සමහරෙක් දැන් පරිණතව සුළු හා මධ්‍ය පරිමාණ මට්ටම කරා පැමිණ සිටිති. ඒ අතර සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයෝ තවදුරටත් ඉහළ නැගෙමින් සිටිති. ඔවුන් අතර සමහරෙක් ගෙදරදොර එදිනෙදා වහරන වෙළඳ නාම බවට පත්ව ඇත. මේ ගමන් මග ඔස්සේ අප මඟ පෙන්වීම් මත මුළු මහත් අගය දාමයක් නිර්මාණය වී ඇත්තේ අලෙවි සම්බන්ධතා හරහාය.

රට පුරා විහිදී ඇති අප මෙහෙයුම් පරිසරයට බලපෑම් නොකරයි. එහෙත් අප ගණුදෙනුකරුවන්ගේ - විශේෂයෙන් කෘෂිකාර්මික, සත්ව පාලන හා කාර්මික ව්‍යවසායයන්හි නිරත ගනුදෙනුකරුවන්ගේ මෙහෙයුම් තුලින් මේ සංවේදී පරිසරයට බලපෑම් එල්ල වේ. මෙහිලා අපි ඔවුනට අනුගත විය හැකි පාරිසරික මඟපෙන්වීම් හා රීති රාමුවක් හඳුන්වා දී ඇත්තේ නිෂ්පාදන ක්‍රියාදාම නවීකරණය, අපද්‍රව්‍ය බැහැරකිරීම හා ඒ සඳහා සේවක පුහුණු වැනි අංග උදෙසා මූල්‍ය පහසුකම්ද විටෙක සලසමිනි.

අනාගතය

2013 වසර තුළ ක්‍රියාත්මක කරන්නට නියමිත පුරෝගාමීත්ව කීපයක්ම අප සතුව ඇත. අප අපගේ ප්‍රථම හරිත ගොඩනැගිල්ල මේ වසරේ ආරම්භ කරන්නට බලාපොරොත්තු වන්නෙමු. බැංකුවේ අනාගත ඉදිකිරීම් තුළ, ජල ප්‍රතිචක්‍රීකරණය හා මලාපවාහන පිරිපහදුවද අන්තර්ගත වනු ඇත.

අප ජාතියේ බැංකුකරුවන් යැයි හඳුන්වා ගන්නා විට ඉන් අදහස් කරන්නේ ජනතාව ගැන පමණක් නොවේ. ජාතිය යනු එහි ජනතාව, ඔවුන් අතර සංස්කෘතික විවිධත්වය, සමාජයීය පැතිකඩ සේම-ඔවි-පරිසරයද ඇතුළත් වන පුළුල් යෙදුමකි. අප අරමුණ වන්නේ තිරසර සංවර්ධනය කරා යන මේ ගමනේ දී මේ සියල්ලම රැකබලා ගනිමින් පෝෂණය කිරීමය.

ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ
සභාපති

2013 ජනවාරි 07 දා

මුඛ්‍ය බලපෑම්, අවදානම් හා අවස්ථා

අපේ මෙහෙයුම් අප පාර්ශ්වකරුවන් කෙරේ බලපාන අන්දම

බලපෑම	අවදානම	අවස්ථාවන්
විස්තීර්ණ සුළු ගොවි ණය සැපයුම් අතිරික්තයක් බිහිකරයි	ගොවිපල මිල පහත වැටීම් හා සැපයුමට මුහුණ දෙන වෙළඳ පල යාන්ත්‍රණය ප්‍රමාණවත් නොවීම	අලෙවි සම්බන්ධතා අගය දාම මූල්‍යකරණය. ගොවි නිෂ්පාදන ගබඩා කර ගැනීම සඳහා නිර්මාණශීලී මූල්‍ය උපකරණ
සාර්ථක කුඩා ව්‍යාපාර තුලින් විවිධාකාර නිෂ්පාදන පරාසයක් බිහිවීම	අලෙවි යාන්ත්‍රණයක් නොතිබීම. උපකල්පන කළ මුදල් ප්‍රවාහ යථාර්ථයක් බවට පත් නොවීම	සිල්ලර අලෙවිසැල් හා අලෙවි සබඳතා නිෂ්පාදකයින් සතු අලෙවි හල් බිහිකිරීම
විස්තීරණ හා නිතරම පාහේ සිදුවන සමාජ ක්‍රියාකාරකම් සේවා ලක්ෂ්‍ය මට්ටමෙහි මානව සම්පත් මත පීඩනයක් ඇති කරයි	කණ්ඩායම් තුළ සේවාස්ථ ආතතිය හා නොසතුට	ප්‍රජා සංවිධාන බල ගන්වා නෛතික තත්වයන් ලබා දීමේ ක්‍රියාවලිය තුලින් ක්ෂේත්‍ර සේවකයන් මත යැපීම අවම කරවීම
නව සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හා මහා පරිමාණ ව්‍යාපෘති හරහා අප ද්‍රව්‍ය බැහැර කරලීම, ජල මං දූෂණයට ලක් කිරීම හා ඩෙසිබල් මට්ටම් තුලින් සිදුවන පාරිසරික බලපෑම්	ප්‍රජාව පැමිණිලි කරයි සසම්භාවී නීතිමය කෘත්‍ය මෙහෙයුම් නතර කිරීම හා වසා දැමීම	ක්‍රියාවලි විධිමත්කරණය, අප ද්‍රව්‍ය බැහැර කරලීම සඳහා සහන පොළී ණය මෙහෙයුම් කාල සීමා යළි සකස් කිරීම
මහා පරිමාණයේ ගොවිපල ණය කෘෂි රසායන භාවිතය ඉහළ නංවයි	පරිසර දූෂණය	කාබනික පොහොර නිෂ්පාදනය සඳහා ණය පහසුකම් කාබනික කෘෂිකර්මය වාණිජ මට්ටම කරා ඉහළ නැංවීම

තිරසර පැවැත්ම උපනතීන් අපේ මෙහෙයුම් කෙරේ බලපාන අන්දම

බලපෑම	අවදානම	අවස්ථාවන්
දේශගුණික විපර්යාස සහ අස්ථාවර කාලගුණික රටාවන්	දේශගුණ සංවේදී ව්‍යාපෘතීන් හි දැඩිසේ උච්චාවචනය වන හෝ හීන වන මූල්‍ය ප්‍රවාහ	දේශගුණික ව්‍යාපාරික ණය පහසුකම් නියඟ/ජල ගැල්ම කෙරේ ප්‍රතිරෝධී භෝග උදා: කජු හා දිගුකාලීන ජලය රඳා පැවැත්මට ඔරොත්තු දෙන වී විශේෂ භෝග රක්ෂණය

තිරසර පැවැත්ම උපනතීන් අපේ මෙහෙයුම් කෙරේ බලපාන අන්දම

බලපෑම	අවදානම	අවස්ථාවන්
දැඩි පාරිසරික මඟ පෙන්වීම් හා පරිසර දූෂණ පාලනය	මඟ පෙන්වීම් අනුව කටයුතු කිරීමට හා අපේක්ෂිත මෙහෙයුම් වෙනස්කම් සඳහා ප්‍රමාණවත් අරමුදල් නොමැත	පරිසර හිතකාමී මෙහෙයුම් සඳහා සහන පොළී ණය ජල ප්‍රති චක්‍රීකරණය අපද්‍රව්‍ය බැහැර කරලීම
අසමතුලිත ධන රාශිභූතය	ආන්තික සමාජ ස්ථර හරහා නොපහන් බව හා සමාජයීය දුරස්ථකරණය	මූල්‍ය සහබද්ධය අරමුණු කර ගත් ශක්‍ය ක්ෂුද්‍ර මූල්‍ය පදනම
පාරිසරික පද්ධති, වාසභූමි හා ජෛව විවිධත්වය කෙරේ සෘණාත්මක බලපෑම් ගෙන එන සංවර්ධන ව්‍යාපෘති	පාරිසරික පද්ධති පූර්ණ හෝ අර්ධ වශයෙන් විනාශ වීම, වාසභූමි හා ජෛව විවිධත්වය අහිමිවීම	පෙරළා ස්වභාව ධර්මය කරා කැඳවාලන පුරෝගාමීත්වයන් වන වගා හරිත ආයෝජන යළි භාවිතා කල හැකි මූලාශ්‍ර හරහා විකල්ප බල ශක්ති උත්පාදනය

බැංකුවේ තිරසර පැවැත්ම ප්‍රතිපත්තිය හා මෙහෙයුම් රාමුව

හැඳින්වීම

රටේ අතිශයින්ම වැදගත් ක්ෂේත්‍රයක නිරත ලංකා බැංකුව සිය තිරසර පැවැත්ම සම්බන්ධයෙන් තමා සතු සුවිශේෂී භූමිකාව මැනවින් වටහා ගෙන ඇත. මේ නයින්, ලංකා බැංකුවේ අප තිරසර මූල්‍ය හා ආර්ථික ක්‍රියාවලීන්, දේශීය හර පද්ධති, හා සංස්කෘතිය සමඟ බද්ධ කරමින් ලාභදායීතාව තුල සමාජ වගකීම රෝපණය කරලීම ඔස්සේ ආයතනික සමාජ වගකීම සාක්ෂාත් කරගත හැකිය යන මතය විශ්වාස කරමු.

අපේ හරයාත්මක ව්‍යාපාරික උපාය මාර්ග සකසා ඇත්තේ තිරසර පැවැත්ම හා බැඳුණු අවදානම් හා අවස්ථා කෙරේ විධිමත් අවධානය යොමු කරමිනි. මේ අනුව බැංකුව සිය තිරසර පැවැත්ම උපාය මාර්ග වර්ධනය කරලීමේදී එහි ප්‍රධාන මානයන් තුන කෙරේ එනම් ආර්ථික පාරිසරික හා සමාජයීය පැවැත්ම ඉලක්ක කරයි.

ආර්ථික තිරසර පැවැත්ම

බැංකුවේ තිරසර පැවැත්ම ප්‍රතිපත්ති තුල පැහෙන ආර්ථික මානය ගොඩනංවා ඇත්තේ ව්‍යාපාරික උපාය මාර්ග මැනවින් ක්‍රියාවට නංවමින් ඒ හරහා දේශීය ආර්ථිකමය ප්‍රමුඛතාවයන් සාක්ෂාත් කරලන්නටය. මෙම දිගු කාලීන අරමුණ ඵලෙසින්ම පවත්වා ගෙන යන අතරේ තිරසර මූල්‍ය කාර්ය ඵල හා බැංකුවේ වර්ධනය ඉහළ නැංවීම මුල්කරගත් උපාය මාර්ගික ධාවන ක්‍රියාවලියක් ඔස්සේ ජාතික ධනය නිර්මාණය අපේ අරමුණය.

ආර්ථික මානය, පාර්ශ්වකරුවන් අතර මූල්‍යමය වර්ධනය පිළිබඳව ආයතනයට කල හැකි බලපෑම ගැනද අවධානය යොමු කරයි. මේ නයින් ඉහතින් පැහැදිලි කර ඇති පුළුල් ආර්ථික මානය යටතේ බැංකු කලමණාකාරිත්වය නෙත් යොමු කරනුයේ ''තිරසර ආර්ථික සංවර්ධනය කෙරේ දායකත්වය'' හා ''ප්‍රජා ආයෝජන ප්‍රවර්ධන'' වෙතය. මේ ක්‍රියාවලියෙහි දී බැංකුවේ මෙහෙයුම්, කාලසීමා මත පදනම් වූ කෙටි හා මධ්‍ය කාලීන සේම දිගුකාලීන ලෙසද විභේදනය කළ ආර්ථික ප්‍රතිලාභ විල්ල කෙරේ. මෙහි අරමුණ සමාජ ආර්ථික පරිසරයට විල්ලවිය හැකි සෘණ බලපෑම් අවම කිරීමය. සමාජයේ බිහිවෙමින් පවත්නා අවශ්‍යතා සපුරාලනු පිණිස බැංකුවේ නිමැවුම් හා සේවාවන්ද අනුගත කෙරෙනුයේ තිරසර ආර්ථික සංවර්ධනය කෙරේ දායකත්වය සපයමිනි.

පාරිසරික තිරසර පැවැත්ම

බැංකුවේ පාරිසරික මානය විහිදෙන්නේ පාරිසරික පද්ධති, ගොඩබිම, ගුවන හා ජල මං ඇතුළුව ස්වාභාවික සම්පත් මත ආයතනයේ ඇති බලපෑම මතය. අපේ විදිනෙදා බැංකු කටයුතු වලදී වගකිව යුතු ආයතනික පුරවැසියකු සේ සම්පත් පරිභෝජනය කරන්නට අපි උපරිම ආයාසයක් දරන්නෙමු. මේ නයින් අපේ ක්‍රියාවලීන් තුලින් පරිසරයට ඇති සෘණ බලපෑම් අවම හෝ නිෂේධ කරන්නට කටයුතු කරන අතරේ, සෙසු පාර්ශ්වකරුවන්ගේ පාරිසරික බලපෑම් පහත දැක්වෙන සේ සමනය කෙරේ.

- පරිසර හිතකාමී ආයතන හා ව්‍යුහයන්ට සහන පොළී හා අනෙකුත් උපකාරක සේවා ඔස්සේ ණය පහසුකම් පිරිනැමීම.
- පරිසරයට පිළිගත නොහැකි හානි සිදු කෙරෙන ව්‍යාපාරික ආයතනයනට ණය සැපයීම ප්‍රතික්ෂේප කිරීම.
- පරිසර හිතකාමී වැඩසටහන් සඳහා සමාජ සත්කාරක ව්‍යාපෘති ඔස්සේ දායකත්වය සැපයීම.

සමාජයීය තිරසර පැවැත්ම

බැංකුවේ තිරසර පැවැත්ම ප්‍රතිපත්තියේ සමාජයීය මානය, එය මෙහෙයුම් කටයුතු කරනා සමාජ වපසරිය තුල කළ හැකි බලපෑම් පිළිබඳව සැලකිලිමත් වේ. බැංකුව සමාජය අරභයා සර්වග්‍රාහී සමාජ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කරනුයේ බැංකුව මානව සම්පත්, මානව හිමිකම් හා අනෙකුත් පොදු සමාජයීය සාධක ගොනු කරමිනි.

අපේ මානව ප්‍රාග්ධනය වෙත

සිය මෙහෙවර ප්‍රකාශය අනුව යමින් ලංකා බැංකුව සැමවිටම උත්සුක වන්නේ අප කණ්ඩායමට සේවා විශිෂ්ටත්වයේ ප්‍රශස්තම ජයග්‍රාහකයින් බවට පත්වන්නට හා පූර්ණ විභවයක් අත් පත් කර ගන්නට ඇවැසි සානුබල හා පිළිගැනීම ලබා දෙන්නටය.

අපේ මානව සම්පත් පරිචයන් අනුගත කර ඇත්තේ, උචිත ශ්‍රම සබඳතා හඳුන්වා දෙන්නටය. පැහැදිලි මානව සම්පත් ප්‍රතිපත්ති විදහා පාන්නටය. ඒ සියල්ල පසු විපරමට හා සමාලෝචනයට ලක් කරන්නටය. එමඟින් අපේ මානව සම්පත් වගකීම් ඉටුකර ගන්නටය. මේ වගකීම් ඇතුළත කාර්ය මණ්ඩලය පුහුණුව හා දැනුවත් කිරීමද පාරදෘශ්‍ය ශ්‍රම පරිචයන් හා විනය පිළිවෙත් හඳුන්වාදීමද සේවකයන් වෘත්තීය සමිති කටයුතු කෙරේ සුහදශීලී පරිසරයක් තුල සාමූහික කෙවල් කිරීම් සඳහා බලගැන්වීම ද ගොනු වී ඇත.

මානව හිමිකම් සුරැකීම වෙත

සම අයිතිවාසිකම් පිළිගන්නා බැංකුව, මානව සම්පත් කළමණාකරණ ක්‍රියාවලියෙහිදී යුක්තිය හා සාධාරණත්වයේ මූල ධර්ම භාවිතා කරන අතර, බාල වයස්කාර සේවා නියුක්තිය සහමුලින්ම පිටු දකී. ළමා ශ්‍රමිකයන් සේවයේ යොදවන ව්‍යාපාරික ආයතන හා ව්‍යවසායකයන්ට අනුබල/ප්‍රවර්ධන පහසුකම් පිළිකෙව් කරන අතර, ළමා ශ්‍රමිකයන් සේවයේ යොදවන බාහිර සේවා සැපයුම් ආයතන හා ගණුදෙනු නොකරයි.

සිය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව ඉහළ මට්ටමක විශ්වාසනීයත්වයක් හා සාධාරණ ගණුදෙනු පරිචයන්ද විධිමත් නිපුනතා, සැළකිලිමත් බව හා සම්ප්‍රජන්‍යතාවද රඳවා ගනී.

තිරසර වර්තාකරණය

බැංකුව මෙහෙයුම් කටයුතු සිදුකරන ආර්ථික, පාරිසරික, සමජයීය තත්ත්වයන් කෙරෙහි බැංකුව සිය දායකත්වය සපයා ඇති ආකාරය පිළිබඳව තිරසර වාර්තාවක් වාර්ෂිකව සපයනු ලබයි.

තිරසර පැවැත්ම ක්‍රියාවලිය රේඛීය මට්ටමින් ක්‍රියාත්මක වන ආකාරය

ගෝලීය වාර්තාකරණ පුරෝගාමිත්වයෙන් (GRI) මඟපෙන්වීම් බැංකුව ඇතුළත ක්‍රියාත්මක කරනු අරමුණු කොට ගෙන ආයතනික කළමණාකාරිත්වය මට්ටමින් තිරසර පැවැත්ම කමිටුවක් ස්ථාපිත කර ඇත. මෙම කමිටුව තිරසර පැවැත්ම ක්‍රියාදාමයන් සම්බන්ධීකරණය කරනු ඇත. ඒ සඳහා යෝග්‍ය ක්‍රමවේදයන් නිර්මාණය කොට ඊට අවශ්‍ය අංගෝපාංග සම්පාදනය සැලසුම් කරනවාට අමතරව එහිලා ප්‍රගතිය නිබඳ සුපරීක්ෂණය කරන්නට ද නියමිතය.



බැංකුවේ තිරසර පැවැත්ම කමිටුව ඔස්සේ ක්‍රියාත්මක වන තිරසර පැවැත්ම ප්‍රතිපත්ති රාමුව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කාලානුරූපීව පසු විපරමට ලක් කරන්නට නියමිතය.

නියෝජ්‍ය මහා කළමණාකරු (නිමැවුම් හා සංවර්ධන බැංකුකරණය)

- ක්ෂුද්‍ර ණය වේදිකාව හා එය ශාඛා ජාලය ඔස්සේ ක්‍රියාත්මක වන ආකාරය
- ගනුදෙනුකරු අපේක්ෂා මූර්තිමත් වන පරිදි නිමැවුම් බිහි කිරීම හා සංවර්ධනය
- සංවර්ධනය කළ මුලික ධාවන රේඛා ඔස්සේ ප්‍රමුඛතා අංශයේ වර්ධනය ඉහළ නංවනු සඳහා එහි දායකත්ව මට්ටම.

නියෝජ්‍ය මහා කළමණාකරු (උපකාරක සේවා)

- ද්‍රව්‍ය, බලශක්ති හා ඉන්ධන පරිභෝජනය
- කාබන් පිය සටහන අවම කිරීමේ ක්‍රියාමාර්ග
- ප්‍රතිචක්‍රීකරණ හා බලශක්ති සංරක්ෂණ යාන්ත්‍රණ
- සේවා ස්ථාන අලංකරණය, ගණුදෙනුකාර ප්‍රවේශ ඉඩකඩ හා සේවා සැපයුම් අත්වැල් මට්ටම

ප්‍රධාන මූල්‍ය නිළධාරි

- ආර්ථිකමය චකිතූ කල අගය- උපනති විපරම
- පාර්ශවකරුවන් අතර ආදායම බෙදා හැරීම
- බැංකුවේ මෙහෙයුම් තුළින් පැනනගින වක්‍ර ආර්ථික ප්‍රතිලාභ

නියෝජ්‍ය මහා කළමණාකරු (මානව සම්පත්)

- උචිත කම්කරු පරිචයන්
- නිර්වචනය කළ ප්‍රතිලාභ හා සැලසුම් බැඳීම් හා අරමුදල් ප්‍රමාණවත් බව
- මානව හිමිකම් ප්‍රශ්න
- කණ්ඩායම් නිපුණතා සංවර්ධනය හා ජීවිතාන්ත ඉගෙනුම
- ජීවනෝපාය මං පෙත් සංවර්ධනය
- සේවා - ජීවන තුලිතය පිළිබඳ වැඩසටහන්
- වෘත්තීය සමිති හා සම්බන්ධතා

නියෝජ්‍ය මහා කළමණාකරු (විකුණුම් හා බෙදාහැරීම් කළමනාකරණය)

- සේවා ස්ථාන ව්‍යාප්ති ප්‍රතිපත්තිය හා ප්‍රගතිය
- පළාත් බද සංවර්ධනය

ප්‍රධාන අලෙවි නිලධාරි

- සමාජ සත්කාරක පුරෝගාමිත්වයන්
- පාරිසරික සංවිධාන සමඟ සහසම්බන්ධතා
- ස්වභාවික පරිසරය, ජෛව විවිධත්වය හා වාස භූමි සංරක්ෂණ ක්‍රියාදාමයන්

කළමනාකරණ ප්‍රවේශය පිළිබඳ හෙළිදරව්ව

නිමැවුම් හා සේවා මානය

- අපේ නිමැවුම් හා සේවාවන් පාර්ශ්වකරුවන්ගේ අවශ්‍යතා සංජානනය කෙරේ නිබඳවම යොමුව ඇත. විවිධාකාර ජන විකාශ මෙන්ම සමාජ ආර්ථික ස්ථර ඔස්සේ විහිදුනු අපේ ගනුදෙනුකාර පදනම හා පොදුවේ මුළු මහත් සමාජයේම විවිධත්වයන් අප විසින් හඳුනාගෙන ඇත්තේ එකි අංශ කෙරේ සුවිශේෂී අවධානයක් දැක්විය යුතු බව වටහා ගනිමිනි.

- අපේ මෙහෙයුම් ක්‍රියාවලියේ පාරිසරික හා සමාජයීය බලපෑම් (ගනුදෙනුකාර සේවා හා ණය පිරිනැමීම) කෙරෙහි ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම හා පිළිවෙත් සැකසීමෙදී ප්‍රමාණවත් අවධානයක් යොමු කෙරේ. අපේ අරමුණ වන්නේ අප ගනුදෙනු කරුවන්ගේ ව්‍යාපාරික මෙහෙයුම් වපසරිය තුල පාරිසරික සමතුලිතතාව මෙන්ම සමාජයීය සහජීවනය ද ආරක්ෂා කරමින් ගෙනයාමය.

- අප ගනුදෙනුකරුවන්ට පාරිසරික හා සමාජයීය බලපෑම්වල දී සාර්ථකව මුහුණ දිය හැකි ආකාරයට උපකාරවනු වස් මනාව සැකසූ සුපරීක්ෂණ යාන්ත්‍රණයක් ස්ථාපනය කර ඇත.

- ව්‍යාපාරික ජීවන චක්‍රය තුලදී පාරිසරික සමාජයීය ගැටලු උද්ගත වේනම් ඒ සඳහා සහයෝගය/උපදෙස් සපයන්නෙමු.

- අපගේ හැම ව්‍යාපාරික මෙහෙයුමක්ම පාරදෘශ්‍යය. සදාචාරවත් මෙන්ම ගණුදෙණුකරු හිතකාමීය.

- අපේක්ෂිත කාල පරාස ඔස්සේ බහු-ස්ථර විගණන මෙහෙයවනු සඳහා අභ්‍යන්තර විගණන කණ්ඩායම් ස්ථාපිත කර ඇත. මෙයට අමතරව, තෝරාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍ර ණය යෝජනා ක්‍රමවලදී ස්ථාපිත, බාහිර විගණකවරුන්ගේ සේවාව ලබා ගන්නට පහසුකම් සලසා ඇත.

ආර්ථික මානය

- අපේ ආර්ථික දැක්ම නාභිගතව ඇත්තේ සමාජ ව්‍යුහය ඔස්සේ සමතුලිත ධන උත්පාදනය හා පාර්ශ්වකරුවන් සියල්ලනටම බෙදී යන වර්ධනය වන එකතු කළ අගය කෙරෙහිය.

  බැංකුවේ සමස්ත ලාභ දායකත්වය මුළු රටටම බලපානුයේ එහි වත්කම් වර්ධනය, මූල්‍යමය ශක්තිය හා ලාභ මට්ටම් පොදුවේ රටවැසියනට හිමි බැවිනි. ආරථික අගය එකතු කිරීම හා ආදායම් බෙදාහැරීම දෙස නෙත් යොමු කළ යුත්තේ එවන් කෝණයක සිටය.

- මේ පසුබිම තුළ අපේ ව්‍යාපාරික උපාය මාර්ග, ඉලක්ක හා අරමුණු ජාතික ආර්ථික සංවර්ධන ප්‍රතිපත්තිය හා අනුගත වෙයි. අපි, රජය සතු ප්‍රමුඛතම රාජ්‍ය බැංකුව වශයෙන් එය අපේ ප්‍රකාශිත වගකීම ලෙස සලකන්නෙමු.

වෙළඳපල නියෝජනය

- බැංකුවේ බඳවා ගැනීම් මට්ටමේ වැටුප්, දේශීය අවම වැටුප් තල හා සමව හෝ ඉන් ඉහළ මට්ටමක පවත්වාගෙන යනු ලැබේ. සේවක බඳවාගැනීම් අභ්‍යාසලාභී පදනමක් මත වන අතර, අභ්‍යාස කාල පරිච්ඡේදයෙන් පසු වැටුප් පරිමාව දෙගුණ වේ.

- සැපයුම් හා මිළදී ගැනීම් ප්‍රතිපත්තිය නාභිගතව ඇත්තේ දේශීය සැපයුම්කරුවන් මතය. සැපයුම් ප්‍රතිපත්තිය විමධ්‍යගත කර ඇති අතර, පළාත් / ශාඛාවනට තමන්ගේම මිලදී ගැනීම් මට්ටමක විමධ්‍යගත බලතල හිමිවේ.

අපි රටපුරා සමතුලිත ධනෝපායනයේ අවශ්‍යතාව, ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතු හරයාත්මක ගැටළුව සේ දකින්නෙමු.

- ප්‍රතිපත්තියක් වශයෙන් දේශීය මෙහෙයුම් තුල, ජ්‍යේෂ්ඨ කළමණාකාරීත්වය ද ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලය දේශීයව බඳවා ගැනේ. විදේශීය මෙහෙයුම් තුළ කළමනාකරණය හා සුපරීක්ෂණ තනතුරු ශ්‍රී ලාංකීය සේවකයින් විසින් සපුරන අතර මෙහෙයුම් / උපකාරක කාර්ය මණ්ඩලය ඒ ඒ රටවලින් බඳවා ගනු ලැබේ.

වක්‍ර ආර්ථික ප්‍රතිලාභ

- අපේ ඉලක්ක, ලාභශීලීතාවය, වත්කම් වර්ධනය හා සෙසු මූල්‍ය දර්ශකයනට පමණක් සීමා නොවේ. මෙහි ගණනය කිරීමට අසීරු ප්‍රතිලාභ මට්ටම් ඇත. රැකියා අවස්ථා උත්පාදනය, වත්කම් බිහිකරලීම, අපනයන ප්‍රවර්ධනය හා සමස්ත සමාජ වපසරිය තුළ සමතුලිත ධනෝත්පාදන උදාහරණ වෙයි. මේ සංසිද්ධිය වඩාත් ඉස්මතු වන්නේ අප සේවා පහසුකම් සලකන අවාසිදායකත්වයට පත් ප්‍රජාවන් තුළය. අපේ ක්ෂුද්‍ර - මූල්‍යන වැඩ සටහනේ හරය වනුයේ ණය ප්‍රවේශය ය.

- අවධානය යොමුවූ තවත් අංශයක් වනුයේ පූර්ණ ප්‍රවේශයක් හා උපාය මාර්ග ඔස්සේ රට පුරා ඉතිරිකිරීම් රාශිකරණයය. මෙය වසර මුළුල්ලේම කෙරුණු ක්‍රියාදාමයක් වූයේ "දොරින් දොර වැඩ සටහන්", රිය පෙරහැර හා හඳුනාගත් ප්‍රවර්ධන ආයාසයන් සමගිනි.

පාරිසරික මානය

- අපි, පාරිසරික හිතකාමී ව්‍යාපාරික පරිචයන්, පරිසර සංරක්ෂණය හා සුරැකීම, හරිත ගොඩනැගිලි සංකල්පය මෙන්ම අප මෙහෙයුම් කටයුතු කරන පරිසරයේ දිගුකාලීන පරිසර පැවැත්ම කෙරේ යොමුවූ ක්‍රියාශීලී ආයාසයන් පිළිගෙන ඒ අනුව කටයුතු කරන්නෙමු.
- අපේ පාරිසරික මානය ප්‍රධාන ධාවන රේඛා හතරක් ඔස්සේ විහිදෙයි.
- ගනුදෙනුකාර පදනම තුළ දිගු කාලීන තිරසර පැවැත්ම පිළිබඳ අවධානය යොමු කිරීම.
- ණය කළඹ ඔස්සේ හරිත ආයෝජන පුළුල් කිරීම හා දිරිගැන්වීම.
- සක්‍රිය පාරිසරික සංවිධාන ජාලය සමග සබඳතා
- බලශක්ති පරිහරණය, විකල්ප බලශක්ති ප්‍රභවයන් හා ප්‍රතිචක්‍රීකරණය දෙස යොමු කළ අභ්‍යන්තර පාරිසරික අවධානය
- ණය ඇගයීම, මුද්‍රා හැරීම, කාබනික ගොවිතැන් ක්‍රම, හරිත ආයෝජන (යලි භාවිතා කලහැකි මූලාශ්‍ර බලශක්ති උත්පාදනය, වන වගාව, ප්‍රතිචක්‍රීයකරණය හා පාරිසරික සංචාරක කර්මාන්තය) හා පරිසර හිතකාමී කෘෂි - සත්ව පාලන ව්‍යාපෘති (ගාල් තුල කිරි ගව පාලනය හා වායු උත්පාදක ඒකක) ඉලක්ක කරයි.
- ලංකා බැංකු ආදර්ශ ගම්මාන වැඩ සටහන දියත් කරන ලද්දේ බහුලව කෘෂිකාර්මික ජීවන රටාවක හිඳින වියළි කලාපීය ගම්මාන කෘෂි රසායනවලින් තොර ගොවිබිම් බවට පත් කරලීම අරමුණු කොට ගෙනය.
- ණය ඇගයීම/මුද්‍රා හැරීමේ ක්‍රියාවලිය තුළ පාරිසරික අවශ්‍යතාවයනට ගැලපේ දැයි පරීක්ෂණයට අමතරව ව්‍යාපෘති ජීවන චක්‍රය තුළ පාරිසරික ගැටළු මතු වන අවස්ථාවන්හි දී බැංකුව මැදිහත් වන්නේ, ලබා ගත යුතු අනිවාර්ය පාරිසරික සහතික මට්ටම් (උදා:- ශ්‍රී ලංකා ප්‍රමිති හා ISO) ලබා ගැනීම සඳහා උපදෙස් සපයමිනි නැතහොත් පරිසර හිතකාමී මෙහෙයුම් ක්‍රියාවලියක් සඳහා පොළඹවමිනි. උතුරු මැද පළාතේ සහල් සැකසුම් ව්‍යාපෘතීන්ට ජලය පිරිසිදු කරලන පද්ධති පිහිටුවීම සඳහා සහන පොළී මත සැපයූ මූල්‍යාධාර චක් නිදසුනකි.
- බැංකුවේ තිරසර පැවැත්ම කමිටුව මේ ක්‍රියාවලියේ හිමිකරු වන අතර, ක්‍රියාත්මක කාර්ය භාරයේදී විවිධ ව්‍යාපරික ඒකක හා බෙදාහැරීම් ජාලය සමග සහයෝගයෙන් කටයුතු කරයි.

සමාජයීය මානය

- අපි රටපුරා සමතුලිත ධනෝපායනයේ අවශ්‍යතාව, ජාතික සංවර්ධන ක්‍රියාවලියේදී අවධානය යොමු කළ යුතු හරයාත්මක ගැටළුව සේ දකින්නෙමු. ගැමී ප්‍රත්‍යන්තයේ මෙන්ම නාගරික පැල්පත් හා කුලී නිවෙස් ආශ්‍රිත දුප්පතුන්ගෙන් සමන්විත වන, ජනගහණය තුළ සැලකිය යුතු ඛණ්ඩයක් ගනුදෙනුකරු හිතකාමී මූල්‍ය පහසුකම් කෙරේ ප්‍රවේශයක් රහිත ව වෙසෙන බව ද හඳුනාගෙන ඇත.

  මේ පසුබිම යටතේ, අප මූල්‍ය සහභාගීත්වය ඉලක්ක කර ගනිමින් දෙවැදෑරුම් ප්‍රවේශයක් සකසා ඇත්තෙමු.
- අවාසිදායක හා දුර බැහැර ප්‍රජාවන් ඉලක්ක කර ගනිමින් සේවා ස්ථාන ව්‍යාප්තිය.
- නිර්මාණශීලී බලගැන්වීම් ක්‍රියාදාමයක් තුළින් දුප්පතුන් අතර සමාජ සජීවීකරණය ඇති කරලීම.
- බැංකුව, මධ්‍යකාලීන ඉලක්කයක් ලෙස ස්වෝපකාර කණ්ඩායම් 25000 ක් පිහිටුවීමට අපේක්ෂා කරයි. මේ මගින් නිශ්චිත කාල පරාසයක් තුළ ගම් මට්ටමේ කුඩා පරිමාණ බැංකු සමුදායක් පිහිටවෙනු ඇත.

කම්කරු සබඳතා පරිචයන් හා උචිත සේවා තත්වයන්

- අපේ කම්කරු සබඳතා හා පරිචයන්ට මඟ පෙන්වනුයේ ශ්‍රී ලාංකික කම්කරු නීති මෙන්ම ජාත්‍යන්තර පුරෝගාමිත්වයන්ය (ජාත්‍යන්තර කම්කරු සංවිධානය). මෙහිලා අප මූලික අංග හයක් කෙරේ අවධානය යොමු කරන්නෙමු.
- සම අවස්ථා
- කාර්යඵල මත පදනම් ඇගයීම
- ජීවනෝපාය සංවර්ධනය
- නිපුණතා වර්ධනය හා පුහුණුවීම්

උතුරු නැගෙනහිර පාළාතේ මහා පරිමාණ සහල් නිෂ්පාදනාගාර වල ජල ප්‍රතිචක්‍රීයකරණ ක්‍රියාවලියට පහසුකම් සැලසීමු.

- සේවා - ජීවන තුලිතය
- නිර්වචනය කළ ප්‍රතිලාභ සැලසුම්

මානව හිමිකම්

- බැංකුවේ සමස්ත පැවැත්ම යටින් දිවෙන ප්‍රතිපත්තිය මෙන්ම ප්‍රධානතම හරයන් අතුරින් එකක් වන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජ ව්‍යවස්ථාවෙන් ප්‍රකාශිත මෙන්ම ශ්‍රී ලංකාවට වගකීමක් ඇති අන්තර්ජාතික ප්‍රඥප්ති මගින් හැඟවෙන මානව හිමිකම් පිළිබඳ සැලකිල්ලය.
- තමන්, වෙනස්ව නොසැලකීමේ පිළිවෙත පිළිපදින අතරේ, බැංකුව සෙසු පාර්ශ්වකරුවන්ට ද (ගනුදෙනුකරුවන් හා සැපයුම්කරුවන්) වෙනස්ව නොසැලකීම, රැස්වීමේ නිදහස, බලකල/අනිවාර්ය ළමා ශ්‍රමය පිටුදැකීම යනාදීය පිළිගෙන කටයුතු කරන ලෙස පොළඹවයි. බැංකුව ප්‍රතිපත්තියක් ලෙස ළමා ශ්‍රමය භාවිත නොකරන අතර ගනුදෙනුකරුවන්ගේ ණය යෝජනාවල දී ළමා ශ්‍රම භාවිතය පිළිබඳ පූර්ව පරීක්ෂාවක් කරයි.
- බැංකුවේ ප්‍රතිලාභ ව්‍යුහය හා වැටුප් - නොවන දිමනා තෙවසරකට වරක් සංශෝධනයට ලක් කෙරෙනුයේ සේවක නියෝජිතයන් හා සමග සාමූහික කේවල් කිරීමේ ක්‍රියාදාමයක් ඔස්සේය.
- පිළිගත් වෘත්තීය සමිති හයක් බැංකුව තුළ ක්‍රියාත්මක වේ. ඔවුන්ට අවශ්‍ය කාර්යාල ඉඩකඩ හා සන්නිවේදන පහසුකම් නොමිලේ සපයා ඇත.
- නියෝජ්‍ය මහා කළමණාකරු (මානව සම්පත්) ගේ අධීක්ෂණය යටතේ, පිරිස් අංශයේ කාර්මික සබඳතා ඒකකය මානව හිමිකම් ප්‍රශ්න පිළිබඳව කටයුතු කරයි.

තිරසර පැවැත්ම රාමුවක් තුළ අපේ හැඩ රුව

අප ගැන වදනක්

ලංකා බැංකුව වන අපි පූර්ණ වශයෙන් රජයට අයත් බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන්නෙමු. වත්කම් පදනම, පිවිසුම් ව්‍යාප්තිය හා ප්‍රාග්ධනීකරණය ගත් කළ අප, දිවයිනේ විශාලතම බැංකුව ද වේ. මෙයට අමතරව, නිරන්තරයෙන් ප්‍රසාරණය වන අපේ ගනුදෙනුකාර පදනම ද ශුද්ධ ආදායම ද, වසරින් වසර බෙහෙවින් ශක්තිමත් වේ.

නෛතික ස්වභාවය හා සැකැස්ම

අපේ ආයතනික තොරතුරු හා ඥාති සබඳතා (පරිපාලිත සමාගම් හා ආශ්‍රිත සමාගම්) මෙම වාර්තාවේ පසුපස ඇතුල් කවරයේ හා පිටු අංක 92 හි දැක්වේ.

අප ප්‍රධාන ව්‍යාපාරික මෙහෙයුම් පිටු අංක 244 හි සවිස්තරව දක්වා ඇත.

අපේ මහගෙදර

අප මූලස්ථානය කොළඹ 01 ලංකා බැංකු චතුරස්‍රයේ අංක 01 දරණ ස්ථානයේ ස්ථානගත ය. ශාඛා ජාලය පිළිබඳ වැඩිමනත් තොරතුරු කළමණාකරණ විවරණය හා විශ්ලේෂණයෙහි ද පිටු අංක 384 හි ද සඳහන්ය.

සේවා ස්ථාන ව්‍යාප්තිය

අපේ සේවාස්ථාන ව්‍යාප්තිය ශ්‍රී ලංකා භූමියෙන් ඔබ්බට ද විහිදි ඇත. අප සතුව එතෙර ශාඛා දෙකක් (මාලේ හා චෙන්නායි) ද ලන්ඩන් නුවර සිය ශාඛාව මෙහෙයවන පූර්ණ අයිතිය සහිත පරිපාලිත සමාගමක් ද වේ. මෙයට අමතරව, මැද පෙරදිග රටවල් 09 ක රඳවා ඇති කාර්ය මණ්ඩලය තුළින් බඳවා ගත් නියෝජිතවරුන් ද සහ ඉතාලිය, ජපානය, දකුණු කොරියාවට අනුයුක්ත කර ඇති ව්‍යාපාර ප්‍රවර්ධන නිලධාරීන් ද සමඟින්, අපි උපාය මාර්ගික වශයෙන් වැදගත් ගෝලීය සන්ධිස්ථාන සියල්ලම ආවරණය කර ඇත්තෙමු.

ගනුදෙනුකාර ආංශිකරණය

ලංකා බැංකුව කිසියම් විශේෂිත ගනුදෙනුකාර කණ්ඩායමකට පමණක් සීමා නොවේ. ජාතියේ බැංකුකරුවන් වන අපි, ආයතනික ගනුදෙනුකරුවන් හා ඉහළ මට්ටමේ වත්කම් සහිත ගනුදෙනුකරුවන්ගේ සිට ආන්තික මට්ටමේ දුප්පතුන් තෙක් විහිදෙන, ඒ අතරතුර සුමක, මධ්‍යම පරිමාණ වෙළඳපළ, සිල්ලර බැංකුකරණය හා පුද්ගලික බැංකුකරණය බඳු ස්ථර රැසකින් යුතු, මුළු මහත් සමාජයටම සේවය සපයන්නෙමු.

මෙහෙයුම් වගකීම

මූලික ව්‍යාපාරික මෙහෙයුම් ඉටු කරනු ලබන්නේ ස්ථිර හා ගිවිසුම් පදනම මත බඳවා ගත් සේවක පිරිස විසිනි. අප, සමහර උපකාරක සේවා (පවිත්‍ර කිරීම් සේවා, ආරක්ෂක සේවයෙන් කොටසක්, ගනුදෙනුකාර පණිවිඩ බෙදා හැරීම ආදිය) බාහිර සේවා සපයන්නන් වෙතින් ලබා ගන්නෙමු.

මධ්‍යම පරිමාණ වෙළඳපල බණ්ඩනය, සිල්ලර බැංකුකරණය හා ක්ෂුද්‍ර මූල්‍යන වෙළඳපල ආවරණය කරන ශාඛා බැංකුකරණ පද්ධතිය පළාත් දහයකින් සමන්විත පළාත් ජාලයක් මගින් පාලනය කෙරේ. (බස්නාහිර පළාත කොටස් දෙකකට වෙන් කොට ඇති අතර සෙසු පළාත් අට රජයේ පරිපාලන ඒකක හා සමගාමී වේ.)

ඉස්ලාමීය බැංකුකරණය මධ්‍යගත ඒකකයක් විසින් මෙහෙයවනු ලබන්නේ බෙදාහැරීම් ජාලයේ බැංකුකරණ කවුළු හරහාය.

අපි, අප ගනුදෙනුකාර පදනම ඔවුන්ගේ ආර්ථික කටයුතු අනුව වර්ග කර ඇත්තෙමු. ශ්‍රී ලංකා රජය හා රජය සතු ව්‍යවසායයන් (ව්‍යවස්ථාපිත මණ්ඩල, සංස්ථා හා පාර්ලිමේන්තු පනත් මඟින් ස්ථාපනය කල අධිකාරීන්) හැර අපේ සෙසු ගනුදෙනුකරුවෝ පුළුල් ලෙස වර්ගීකරණය කළ අංශ අටක විසිරී සිටිති.

- ආනයන / අපනයන වාණිජ කටයුතු
- තොග හා සිල්ලර වෙළඳ කටයුතු
- බැංකුකරණය, මූල්‍ය සේවා හා රක්ෂණ ආයතන
- කෘෂිකර්මය, වැවිලි කර්මාන්තය හා ධීවර කටයුතු
- නිෂ්පාදන කර්මාන්ත
- සංචාරක කර්මාන්තය
- නිවාස, ඉදිකිරීම් හා දේපළ සංවර්ධනය
- පරිභෝජනය මත පදනම් පුද්ගලික ගනුදෙනුකරුවෝ

වාර්තාකරණ කාල පරිච්ඡේදය ඇතුළත ආයතනයේ පරිමාව, ව්‍යුහය හා හිමිකම සම්බන්ධයෙන් වූ කැපී පෙනෙන වෙනස්කම්

සේවා ස්ථාන ප්‍රසාරණය හා මූල්‍ය වාර්තාවලින් පෙනී යන කොටස් හිමියන්ගේ අරමුදල් ඉහළ යාම හැරුණු විට අපේ ආයතනික සැලැස්ම තුළ කිසිදු වෙනස් වීමක් වාර්තා වී නැත.

හොඳම ශාඛා තෝරා ගැනීමේ තරඟය

සංශෝධිත තෝරා ගැනීම් ක්‍රමවේදය අනුව යමින් මෙම වසරේදී ද හොඳම ශාඛා තරඟය පවත්වනු ලැබීය. මෙම තරඟය සංඛ්‍යාත්මක (ව්‍යාපාරික පරිමාව හා ලාභ දායකත්වය) මෙන්ම ගුණාත්මක (ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය, අභ්‍යන්තර පාලන විධි හා කාර්යක්ෂමතා මට්ටම්) මානයන් මත විනිශ්චය කරනු ලැබීය.

සබරගමුව පළාතේ අයගම, ග්‍රාමීය උඹව පළාතේ පදියතලාව හා ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ ශාඛා හොඳම ශාඛා ලෙසින්

මං සලකුණු - 2012 වසරේ දිනූ සම්මාන

ආයතනය/සංවිධානය	තරඟයේ ස්වභාවය	කාණ්ඩය	සම්මානය
ශ්‍රී ලංකා ජාතික වෙළඳ මණ්ඩලය	ජාතික ව්‍යාපාරික විශිෂ්ටතා සම්මාන 2012	බැංකු හා මූල්‍ය සේවා ක්ෂේත්‍රය	රන්
		විශාල පරිමාණ කාණ්ඩය	රිදී
		සමස්ත ජයග්‍රාහක කාණ්ඩය	ලෝකඩ
සන්නිවේදන කලා හා සේවා උදෙසා අන්තර්ජාතික ඇකඩමිය, මර්කොම්	2012 අන්තර් ජාතික ARC සම්මානය	සම්ප්‍රදායික නොවන වාර්ෂික වාර්තාව - බැංකු, ජාත්‍යන්තර, බැංකු මූල්‍ය දත්ත ජාත්‍යන්තර	රන් රිදී
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය	2012 වාර්ෂික වාර්තා සම්මාන ප්‍රදානය	බැංකු ක්ෂේත්‍රය	අනුකූලතා සහතිකය
දකුණු ආසියා ගණකාධිකරණ සම්මේලනය (සාෆා) - මෙය සාර්ක් සංවිධානයේ ඉහළ තලයේ ආයතනයකි	ප්‍රශස්තම වාර්ෂික වාර්තා ඉදිරිපත් කිරීම හා 2011 ආයතනික යහපාලන හෙළිදරව් පිළිබඳ සාර්ක් සංවත්සර ප්‍රදානය	රාජ්‍ය අංශයේ බැංකු ආයතන	දෙවන ස්ථානය
ඇමරිකානු සන්නිවේදන වෘත්තිකයන්ගේ ලීගය	2011 ඉදිරි දැක්ම සම්මාන	වාර්ෂික වාර්තා තරඟය	රිදී හොඳම ශ්‍රී ලාංකීය වාර්ෂික වාර්තාව

තෝරා ගන්නා ලද අතර, ශාඛාවන්හි සම්පූර්ණ කාර්ය මණ්ඩලය, බැංකුව විසින් සම්පූර්ණයෙන් පිරිවැය දැරූ මැලේසියාවේ සංචාරයක් දිනා ගත්තෝය.

ආයතනික යහ පාලනය බැඳීම් හා අන්‍යොන්‍ය සබඳතා

ආයතනික යහ පාලනය

ඉහළම පාලන ව්‍යුහය වන අධ්‍යක්ෂ මණ්ඩලය, මුදල් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන්නේ කොටස් හිමියා වන ශ්‍රී ලංකා රජය වෙනුවෙනි. අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෝ පුළුල් පසුබිම් තලයක සනාථ කළ විශේෂඥ දැනුම සහිත වෘත්තිකයෝ වෙති. මේ විෂය පථ අතර, ව්‍යාපාරික පරිපාලනය, වාණිජ හා ජාත්‍යන්තර නීතිය, ආර්ථික පර්යේෂණ, රාජ්‍ය මූල්‍යනය, නිර්මිත පරිසරය, කෘෂි විද්‍යාව හා වැවිලි කර්මාන්ත කළමනාකරණය වේ. අධ්‍යක්ෂක මණ්ඩලීය සංයුතිය පිටු අංක 34-37 හි දැක්වේ.

බල පැවරුම

බැංකුවේ ව්‍යාපාරික කටයුතු පරිපාලනය තුලින් තිරසර අගයක් පිරිනැමීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය, පාර්ශ්වකරුවන් වගකිව යුතු වේ. ප්‍රතිපත්ති සම්පාදක ව්‍යුහය ලෙසින් එය, උපාය මාර්ග සැලසුම් කරයි; ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිණිස අභ්‍යන්තර ව්‍යුහයන් සමාලෝචනය කරයි; වග වීමේ පැහැදිලි සීමා මායිම් තහවුරු කරයි.

අධ්‍යක්ෂක මණ්ඩලීය සංයුතිය

සංයුතිය	පුරුෂ	ස්ත්‍රී
ස්වාධීන, විධායක නොවන අධ්‍යක්ෂකවරු	3	-
විධායක - නොවන අධ්‍යක්ෂකවරු	1	1
විධායක - නොවන, නිල බලයෙන් පත් වන අධ්‍යක්ෂකවරු	1	-
විධායක - නොවන විකල්ප අධ්‍යක්ෂකවරු	1	-
සම්පූර්ණ සංයුතිය	6	1
සුළු ජන කොටස් නියෝජනය	2	-

අධ්‍යක්ෂක මණ්ඩල උප කමිටු, ඔවුන්ගේ බලපැවරුම් හා වගකීම් පිටු අංක 138 හි විස්තර කර ඇත.

පාර්ශ්වකරුවන් හා සේවක පිරිසට අධ්‍යක්ෂක මණ්ඩලය වෙත කරුණු සැලකිරීමට පවතින යාන්ත්‍රණය

- එකම කොටස් හිමියා වන රජය එහි නිර්දේශ හා නියෝග, මුදල් අමාත්‍යාංශය හරහා යොමු කරයි.
- සේවක මණ්ඩලය උනන්දුවක් දක්වන යහපාලනය හා බැඳි කරුණු වෘත්තීය සමිති මාර්ගයෙන් ඉදිරිපත් කෙරේ. වෘත්තීය සමිති මේ පිළිබඳව සිය සාමාජිකයින් හා සාකච්ඡා කරති.

ශ්‍රම බලකා පරිචයන්, සම අවස්ථා, රැකියා අභිවෘද්ධිය, ඉතුරුම් ආකර්ෂණය හා සේවක පහසුකම් ආදිය පිළිබඳව මෙම කාලය තුල සේවක අවදානය/යෝජනා ඉස්මතු විය.

වාර්තාව

බැඳියා පිළිගැටුම් වළක්වනු සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය තුළ පවත්නා පිළිවෙත

බැඳියා පිළිගැටුම් ආසන්න වන අවස්ථාවන්හිදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෝ සිය බැඳියාවන් පිළිබඳව හෙළිදරව් කොට සාකච්ඡා හා තීරණ ගැනීමේ ක්‍රියාදාමයෙන් ඉවත් වෙති. මෙම අංගය පිළිබඳව ආයතනික යහපාලනය යටතේ පිටු අංක 108 හි සවිස්තරව දැක්වේ.

ඉදිරි දැක්ම, මෙහෙවර හා අභ්‍යන්තරව වර්ධනය කළ සෙසු ප්‍රකාශන

මෙම ප්‍රකාශන යුගලය පිටු අංක 10 හා 11 හි දක්වා ඇත.

පූර්ව අනතුරු හැඟවිමේ ප්‍රතිපත්තිය හා පරිචය

ප්‍රශ්නකාරී ගණකාධිකරණ පරිචය, අභ්‍යන්තර පාලන විධි ක්‍රම තුල දුර්වලතා, අල්ලස් හා දූෂණ, සාවද්‍ය වාර්තා සැකසීම, අභ්‍යන්තරික මූල්‍ය ගනුදෙනු, මුදල් විශුද්ධිකරණය, වංචා හා සොරකම්, වත්කම් අවභාවිතය, වාර්තා නොනිසි අයුරින් ඉදිරිපත් කිරීම මෙන්ම යහපාලනය, මූල්‍ය සෞඛ්‍යය, විශ්වාසනීයත්වය හා බැංකුවේ ප්‍රතිරූපයට හානිදායක විය හැකි ක්‍රියා පිළිබඳව පාර්ශවකරුවන්ගෙන් ලැබෙන පැමිණිලි භාර ගෙන සමථයකට පත් කිරීම සඳහා සංවිධිත පිළිවෙතක් බැංකුව විසින් ස්ථාපනය කර ඇත.

මෙහි දී නිර්නාමික පැමිණිලි හා යෝජනා ද භාර ගැනෙන අතර, පැමිණිලිකරුගේ අභිමතය පරිදි අනන්‍යතාවය හෙලි නොකෙරේ. පැමිණිලි, සැලකිලිමත් වීම සඳහා සෑහෙන සැකයක් මත ඉදිරිපත් කළ හැකි අතර ඒ සනාථ කෙරෙන සාක්ෂි අවශ්‍යම නැත.

මෙම ක්‍රියාදාමයේ සුපරීක්ෂණ භූමිකාව ප්‍රධාන අභ්‍යන්තර විගණක විසින් දරනු ලබන අතර, ඔහු අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කරයි. සියළුම පැමිණිලි, භාරගෙන තෙමසක් ඇතුළත නිරාකරණය කෙරේ.

වසර තුළ භාරගත් පැමිණිලි සංඛ්‍යාව	129
සමථයකට පත් කළ පැමිණිලි	118
සමථය බලාපොරොත්තු වන පැමිණිලි	11

දූෂණ - විරෝධී ප්‍රතිපත්තිය

අපි,ආයතනයේ හැම තලයකදීම දූෂණය පිටු දැකීම වෙනුවෙන් කැප වන්නෙමු. මේ අරමුණ අනුව යමින්, සේවක මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු වසර මුළුල්ලේ පවත්වන ලදී. වසර අවසානය වන විට අපේ කණ්ඩායම අතින් 77.5% කට, බැංකුවේ දූෂණ විරෝධී ප්‍රතිපත්තිය හා පිළිවෙත් පිළිබඳව පුහුණුව ලබා දෙන ලදී.

දූෂණ ක්‍රියා පිළිබඳව ප්‍රතිචාර වශයෙන් ගත් පියවර

වසර තුළ දී මේ සම්බන්ධ පරීක්ෂණ 94 ක් නිම කරනු ලැබීය.

පූර්ව - ආරක්ෂක ප්‍රවේශය

අපි 1992 රියෝ ප්‍රකාශනයේ දැක්වෙන අංක 15 දරණ පූර්ව - ආරක්ෂණ ප්‍රවේශය පිළිගන්නෙමු. ඒ, අවස්ථාවෝචිත පරිදි හා තිරසර පැවැත්ම හා සංවර්ධනය අතර තුලිතය නිශ්චය කිරීමෙහිදීය.

බැංකු ක්ෂේත්‍රය හා බැඳුණු සංවිධාන තුල සාමාජිකත්ව

- ආසියා - පැසිපික් ග්‍රාමීය හා කෘෂිකාර්මික ණය සංගමය (APRACA)
- ශ්‍රී ලංකා බැංකු ක්ෂේත්‍රයේ අවදානම් වෘත්තිකයන්ගේ සංගමය
- අන්තර්ජාතික සංවර්ධනය සඳහා වන සංගමය - ශ්‍රී ලංකා පාර්ශ්වය
- ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය
- ශ්‍රී ලංකා ජාත්‍යන්තර වෙළඳ මණ්ඩලය
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය

අපි 1992 රියෝ ප්‍රකාශනයේ දැක්වෙන අංක 15 දරණ පූර්ව – ආරක්ෂණ ප්‍රවේශය පිළිගන්නෙමු. ඒ, අවස්ථාවෝචිත පරිදි හා තිරසර පැවැත්ම හා සංවර්ධනය අතර තුලිතය නිශ්චය කිරීමෙහිදීය.

- සීමාසහිත ශ්‍රී ලංකා බැංකු සංගමය (ගරන්ටි)
- ශ්‍රී ලංකා නීති පුස්තකාලය
- ලංකා වාණිජ මණ්ඩලය
- ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් (ගරන්ටි) සමාගම

අප දායකත්වය/සාමාජිකත්ව දරන බාහිරව වර්ධනය කරන ලද පුරෝගාමිත්වයන්/ සංස්ථාපිත ආයතන

- ගෝලීය වාර්තාකරණ පුරෝගාමිත්වය (GRI) G 3.1 මඟ පෙන්වීම්
- ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති (LKAS) හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (SLFRS)
- බාසල් III මඟ පෙන්වීම්
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන පහසුකම (SMEDeF) යටතේ ඉදිරිපත් කර ඇති සමාජ කළමණාකරණ වැඩසටහන. මෙය ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ණය යෝජනා ක්‍රමයකි.

ප්‍රජාව සමඟ සාමූහික වර්ධනය

“

ප්‍රශස්තම චාරිකාව කිසි දිනක හමාර නොවේ. ඉලක්කය ඇත්තේ ගඟේ ඊළඟ වක්කලම ඉදිරිපසය. ඊළඟ කඳුගැටයේ උරහිස් තලය මතය. හැමවිටම, අනුව යායුතු තවත් එක මං පෙතක් ඇත. ගවේෂණය කොට සැක හැර ගත යුතු තවත් එක් මිරිඟුවක් වේ.

”

රොසිටා ෆෝර්බ්ස්
ඉංග්‍රීසි ජාතික චාරිකා සටහන් ලේඛිකාව හා ගවේෂිකාව.

සේවා ව්‍යාප්තිය

අපි, විධිමත් මූල්‍ය සේවාවන් විසින් තවමත් පිවිස නැති බිම්පෙත් හා නගර - බිම් සොයමින් නිරන්තර ව්‍යායාමයක නිරතව සිටින්නෙමු. සියළුම නගර, වඩා විශාල ගම්මාන හා ආර්ථික වශයෙන් ක්‍රියාකාරී ප්‍රත්‍යන්තය හාත්පස ආවරණය කරමින් පැතිරුණු අපේ විස්තීර්ණ පිවිසුම් ව්‍යාප්තිය පසුබිම් කොට බලන විට මේ කාර්ය භාරය හුදෙක් හිස්තැන් පිරවීමේ ආයාසයක් බවට පත්ව ඇත.

එසේ වුවද, සමහර විශේෂිත ප්‍රදේශයන්හි - වඩා නිවැරදිව කිවහොත් උතුරු - නැගෙනහිර ප්‍රදේශයේ-පිවිසුම් ව්‍යාප්තිය උදෙසා විභවයක් පවත්නා සේම තිරසර බව අපේ විශ්වාසය වේ. මෙහිලා උදාහරණයක් වශයෙන් ඉදිරිපත් කළ හැක්කේ උතුරු පළාතය. 2012 වසරේ එක් දිනක් තුළ - එනම් 2012 ජූනි 04 දින නව ව්‍යාප්ති කාර්යාල 11 ක් එහි විවෘත කරනු ලැබීය. පළාත තුල මේ වන විට සේවා ස්ථාන 95 ක් (පූර්ණ ශාඛා 22, ව්‍යාප්ති කාර්යාල 45 මුදල් හුවමාරු යන්ත්‍ර 28 ක් හා එක් ජංගම සේවාවක්) ක්‍රියාත්මකය. ඒ, 400,000 තරම් ජනගහනයකට සේවා සලසනු සඳහාය.

වසර තුලදී, ව්‍යාප්ති කාර්යාල හයක් පූර්ණ ශාඛා ලෙස තත්ත්වයෙන් උසස් කරන ලද අතර, රට පුරා නව ව්‍යාප්ති කාර්යාල 28 ක් ස්ථාපනය කරන ලදී. මේවා පිහිටවනු ලැබුයේ ආර්ථික කටයුතු, අවස්ථා හා අභියෝග සපිරි කුඩා නගර හා ගම්මාන තුළය. අරමුණ අභියෝග ජය ගැනීමය; ආර්ථික කටයුතු වර්ධනය කිරීමය; අවස්ථාවන්ගෙන් උපරිම ඵල නෙලා ගැනීමය. පහත දැක්වෙන වගුව තුළින් මොනවට විද්‍යාමාන වන පරිදි අපි දැන් සාමාන්‍ය පොදු ජනතාව සිය එදිනෙදා දිවි පෙවෙත පවත්වා ගෙන යන සමාජ හා ජන විකාශ ප්‍රත්‍යන්තය කරා පිවිසීමේ ගමන ආරම්භ කොට ඇත්තෙමු.

වසර තුළ අපේ පිවිසුම් පිය සටහන

ව්‍යාප්ති කාර්යාලය	සුවිශේෂී බව හා හේතු විග්‍රහය
දියබෙදුම	නමින්ම හැඟවෙන පරිදි, දියබෙදුම ජලය බෙදා හරින - ලක්ෂ්‍යයකි. ඇලහැර යෝධ ඇලේ ජලය මෙහිදී දෙපැත්තකට - අඩක් ගිරිතලේ වැවට ද අනෙක් අඩ මින්නේරිය හා ඉන්පසු කවුඩුල්ල වැවට ද බෙදී යයි. ඇලහැර-ගිරිතලේ මාර්ගයේ පිහිටි මේ කුඩා නගරයේ කෘෂි - ව්‍යාපාරික කටයුතුවල නිරත ආයතන හා පරිභෝජන වෙළඳසැල් කිහිපයකි.10,000 කට ආසන්න ජනගහනයකට සේවා සපයන මෙහි රාජ්‍ය ආයතන හා පාසල් කිහිපයක්ද වේ.
දියසෙන්පුර	මේ මැදිරිගිරිය නගරයට උතුරින් පිහිටි කුඩා නගරයකි. මූලික වශයෙන් ජනපද මණ්ඩියක් වන මෙහි ජනගහණය අතර බහුතරය නුවරඑළිය දිස්ත්‍රික්කයේ සිට කවුඩුල්ල ව්‍යාපාරය කරා යොමු කළ ජනපදිකයෝ වෙති. නගරයේ කෘෂි - ව්‍යාපාරික ස්ථාන, සේවා සැපයුම් හා පාරිභෝගික වෙළඳසැල්ය. පෝෂක ප්‍රදේශයේ ජනගහනය 20,000 ක් වේ.
පල්ලම	දැදුරුඔය උතුරු ඉවුරේ සරුසාර බිම් පටියේ පිහිටි පල්ලම, මුහුදුබඩ හලාවත නගරයට ඊසාන දෙසින් පිහිටා ඇත. එය පොළී වගාවට හා වී ගොවිතැනට ප්‍රසිද්ධය. මධ්‍යම හා මහා පරිමාණ පොළී වතු මෙන්ම අතරින් පතර කුඹුරුවලින් ද සැදුණු මෙහි අවට ගඩොල් පෝරණු ද රාශියකි. මේ, වයඹ පළාතේ පිබිදෙන ආර්ථික මධ්‍යස්ථාන අතුරින් එකකි.
දළුගම	නුවර පාරේ පිහිටි පැරණි නගරයක් වන දළුගම, පසු කලෙක කිරිබත්ගොඩ නගරය විසින් පසුපසට තල්ලු කරන ලදී. වත්මනෙහිදී, කඩවත සිට කැලණිය පාලම තෙක් මුළු මහත් පටියම එකම නාගරික කලාපයකි. දළුගම, පිත්තල වාත්තු කර්මාන්තය (සරනේරු, යතුරු තහඩු) ටයර් සංස්ථාව හා කැලණිය විශ්ව විද්‍යාලයට ප්‍රසිද්ධය. අද වන විට එය කොළඹ, උප - නගරයක් බවට පත්වී ඇත.
බටුවත්ත	ප්‍රධාන දුම්රිය මාර්ගයේ රාගම සන්ධියට උතුරින් පිහිටි බටුවත්ත විස්තීර්ණ මාර්ග පද්ධතියක් හරහා යාබද වඩා විශාල නගර වන ගනේමුල්ල, කඳාන හා කඩවත සමඟ යාවේ. 15,000 තරම වන මෙහි වැසියෝ ගොවීන් හෝ කොළඹ නගරයේ රැකියාවල නියුතු දුම්රිය මගීන් වෙති.
මරුදන්කර්නි	පටු කලපු තීරයකින් තෙන්මරච්චි ප්‍රදේශයෙන් වෙන්ව ගිය වඩමරච්චි, නැගෙනහිර කොට්ඨාසයේ ධීවර ජනාවාසයකි. මරුදන්කර්නිහි ජනගහනය සෙසු පටු යාපනය අර්ධද්වීපයට වඩා තුනීය. මෙහි, 17,000 තරම ජනගහනය ගොවීන් හෝ ධීවරයන් වෙති.
පුන්නාලෙයි කඩ්ඩුවාන්	උඩුවිල් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කුඩා නගරයක් වන මෙය වසර විස්සකට පසු යළි පදිංචි වන්නට අවසර දෙන ලද බිම් පියසකි. පෝෂක ප්‍රදේශය ග්‍රාම නිලධාරී වසම් හතරකින් සමන්විතය. ප්‍රධාන පෙලේ ගොවිබිමක් වන පුන්නාලෙයි කඩ්ඩුවාන්, තක්කාලි හා මිදි වගාවට ප්‍රසිද්ධය.
කල්වියන්කාඩු	පේදුරුතුඩුව පාරේ නල්ලූර් කොට්ඨාශයේ සංගත ජනගහනයකින් යුතු කල්වියන්කාඩු ප්‍රසිද්ධව ඇත්තේ යාබද ගොවි ගම්මානවලින් රැගෙන එන ගොවි නිෂ්පාදන අලෙවි වන තොග වෙළඳපල නිසාය. මෙහි පෝෂක ප්‍රදේශයේ ජනගහනය 25,000 ඉක්මවයි.
මාන්තිකායි	වඩමරච්චි කොට්ඨාශයේ ප්‍රධාන පෙලේ ආර්ථික මධ්‍යස්ථානයක් වන මෙහි ද, යාබද ගොවිබිම් පටියේ නිෂ්පාදන බෙදා හරින වෙළඳපලක් වේ.
ඕමන්තේ	කලකට පෙර චල්ට්ටිපුරම් අණසක යටතේ පැවති වන්නියට පිවිසුම් කඩොල්ල වූ ඕමන්තේ අවට යළි පදිංචි කිරීම් දැඩි සේ සිදුවෙයි. වන්නි ප්‍රදේශයේ භෝග සඳහා යෝජිත ආර්ථික හුවමාරු මධ්‍යස්ථානය ඕමන්තේ හි ඉදි කිරීමට සැලසුම්ගතය.

ව්‍යාප්ති කාර්යාලය	සුවිශේෂී බව හා හේතු විග්‍රහය
සිරුපිඩ්ඩි	කුඩා නගරයක් බවට පරිවර්තනය වන්නට යත්න දරන සිරුපිඩ්ඩි පිහිටියේ යාපනය අර්ධද්වීපයේ සුප්‍රකට සාරවත් රතු පස් කලාපයේ මැදහරියේය. ඒ අච්චුවේලි හා උරුම්පිරායි නගර දෙක අතර මැදය. යාබද ප්‍රදේශය උසස් මට්ටමේ රතු ළෑණු, වැලවළු හා මිදිවලට ප්‍රසිද්ධය.
සාවල්කාඩු	යාපනය නගරයට වයඹ දෙසින් සන්දිලිප්පිඩි කොට්ඨාසයේ පිහිටි සාවල්කාඩු යාබද ධීවර ගම්මාන පොකුරේ මධ්‍ය ලක්ෂ්‍යය ය. පෙදෙස් වැසියෝ සියල්ලන්ම පාහේ ධීවර කටයුතු හෝ ගොඩබිම - ආශ්‍රිත අගය චකතු කිරීම් දාමයේ නිරත වෙති.
කරනවායි	මේ, නෙල්ලියඩි නගරයට හා ඉන් ඔබ්බේ පිහිටි පේදුරු තුඩුවට පිවිසෙන කඩොල්ලය. එය ළඟදීම කුඩා නගරයක් බවට පත්වන්නට නියමිත විශාල ගම්මානයකි. පෙදෙස් වැසියන් අතරින් බහුතරය මිදි/වැලවළු වගාවේ නිරත ගොවීන් වන අතර ගැමි කාර්මිකයන් පිරිසක් ද මෙහි වෙති.
පුතුකුඩියිරිප්පු	නමේ අරුත නව ජනාවාසය ය. මේ මුලතිව් නගරයෙන් සැතපුම් 20 ක් වයඹ දිගට වන්නට පරන්තන් පාරේ කුඩා නගරයකි. බහුල කොට ගොවීන්ගෙන් යුත් මෙපියස සීඝ්‍රයෙන් සංවර්ධනය වන්නේ කඩිනම් යළි පදිංචි කිරීම් පසුබිමේය.
යාපනය විශ්ව විද්‍යාලය - තිරුනෙල්වේලි	5,800 ක ශිෂ්‍ය ප්‍රජාවක් හා 393 ක ආචාර්ය මණ්ඩලයකින් සමන්විත යාපනය විශ්ව විද්‍යාලය ජාතික විශ්ව විද්‍යාල පද්ධතියේ හත්වැනි විශාලතම සරසවිය වේ. මණ්ඩපය පිහිටා ඇත්තේ යාපනයේ උප නගරයක් වන තිරුනෙල්වේලි හිය.
පැලවත්ත - පසුව වලල්ලාවිට යනුවෙන් යළි නම් කරන ලදී	අගලවත්ත නගරයේ සිට සැතපුම් 12 ක් ඔබ්බෙන් පිටිගල පාරේ පිහිටි පැලවත්ත, සංවර්ධනය හා ගනුදෙනු කරන්නට යත්න දරන ගම්මානයකි. පෝෂක ප්‍රදේශය අතින් පතර කුරුඳු හා වී වගා බිමින් යුතු බහුල වශයෙන් කුඩා හා මහා පරිමාණ තේ-රබර් වතුවලින් සමන්විතය. යාබදව සැලසුම් ගත මධ්‍යම පංතික හා අඩු - ආදායම් ජනාවාස රැසකි.
පස්ගොඩ	මාතර දිස්ත්‍රික්කයේ උතුරු පාවුල් කඳු අතර, මාවරල හා ඌරුබොක්ක නගර අතර මැද පිහිටි පස්ගොඩ ග්‍රාමීය දකුණු පළාතේ තවත් පිබිදෙන ආර්ථික බිම් පියසකි. මෙහි වැසියන් අතර බොහොමයක් කුඩා තේවතු හිමියන්ය. ඒ අතර, තැන තැන කුඩා බිම් කට්ටිවල කුරුඳු වගාව ද දක්නට ලැබේ.
මහනුවර උසාවි සංකීර්ණය	උසාවි සංකීර්ණය පළාත්බද මහාධිකරණය, දිස්ත්‍රික් උසාවිය හා මහේස්ත්‍රාත් උසාවිවලින් සමන්විත වන අතර, මේ කුඩා ශාඛාව නීති වෘත්තිකයන් හා දෛනිකව එහි පැමිණෙන 1,000 තරම සේවාදායකයන්ට සේවා සපයනු ඇත.
තිහගොඩ	තිහගොඩ, මාතර - හක්මන පාරේ පිහිටි කුඩා නගරයකි. කඹුරුපිටිය පාර විහිදෙන්නේ තිහගොඩ සිටය. නිල්වලා මිටියාවතේ පහත් කෙත්බිම් අතර පිහිටි මේ නගරය අවට වැසියෝ බහුල වශයෙන් වී ගොවීන් වන අතර ගෙවතු ද දක්නට ලැබේ.
උකුවෙල	මාතලේ - වත්තේගම පාරේ පිහිටි තවත් කුඩා නගරයකි. එය වතු ජනාවාසයනට පහසුකම් හා සේවා සපයන මධ්‍යස්ථානයක් වන අතර පෝෂක ප්‍රදේශයේ ජනතාව අතර වතු කම්කරුවන් හා තේ වතු අතර මැදි වූ ගම්මානයන්හි ගැමි ප්‍රජාව ද වේ.
අලන්කර්නි	අලන්කර්නි පිහිටා ඇත්තේ ත්‍රිකුණාමල දිස්ත්‍රික්කයේ කින්නියා නගරයට බටහිර දෙසින් පිහිටි ගම්මණ්ඩි රැසක් මධ්‍යයේ ය. මෙහි බහු - වාර්ගික ජනගහනය, ධීවරයන්, වී ගොවීන් හා සත්ව පාලනයේ නිරත වන්නන් ය.
මුල්ලේරියාව නව නගරය	කොලොන්නාව නගරය හා බද්ධ, සීඝ්‍රයෙන් දියුණු වන උප නගරයක් වන මෙහි සැලසුම්ගත නිවාස යෝජනා ක්‍රම කිහිපයක්ම ද කාර්මික හා වාණිජ ව්‍යාපාර ද දැකිය හැකිය.
නල්ලූර්	යාපනයේ පාරම්පරික-උප නගරයක් වන නල්ලූර් ප්‍රසිද්ධව ඇත්තේ සුප්‍රකට කන්දසාමි කෝවිල හේතුවෙනි. එය වරෙක අධ්‍යාපන විශිෂ්ටත්වයේ තෝතැන්න විය. මෙහි ඉපැරණි විභූතිය තවමත් ශේෂභූතව පවතී.
මල්වත්ත	අම්පාර - සමන්තුරේ මාර්ගයේ සාපේක්ෂව කුඩා නගරයක් වන මල්වත්ත, 10,000 ක තරම් ජනගහනයකින් යුතු සම්ප්‍රදායික ගොවි බිමකි.

තිරසර පැවැත්ම

වාර්තාව

ව්‍යාප්ති කාර්යාලය	සුවිශේෂී බව හා හේතු විග්‍රහය
නවිතන්වේලි	දිගාමඩුල්ලේ තවත් පුළුල් කෘෂිකාර්මික බිම්පෙතක් වන නවිතන්වේලි ක්ෂිතිජය තෙක් විහිදෙන සරුසාර, හරිත පලසක් බඳු කෙත් යායෙන් වැසී ගත්තකි. කල්මුණේ නගරයට වයඹ දෙසින් පිහිටි මේ කුඩා නගරය ක්‍රියාශීලී ගොවි ජනතාවකගේ වාසභූමියයි.
ඉරක්කමම්	ඉරක්කමම් වැව විසින් පෝෂණය කෙරෙන සාරවත් තැන්න මැද පිහිටි ඉරක්කමම් 13,000 ක පමණ කෘෂිකාර්මික ජනගහනයක් දරා සිටී.
පලූගාමම්	මඩකලපුව දිස්ත්‍රික්කයේ දකුණු මායිමේ, පොරතීවු පත්තුවේ ගොවි ගම්මානයක් වන පලූගාමම් ගැටුම් අතර සිට සහජීවනය කරා සෙමෙන් එහෙත් තිරසරව පිය නගන්නේ විවිධාකාර කෘෂිකාර්මික ව්‍යවසායයන් මැදය.

දැන් දැන් අප අවධානය යොමු කරන්නේ පවත්නා ව්‍යාප්ති කාර්යාල පූර්ණ ශාඛා බවට ඉහළ නංවමින් ඒ අතරතුර අපේ ගනුදෙනුකාර ප්‍රජාවට මනාව සකසන ලද සේවා බෙදා හැරීමක් පිරිනමන්නටය. ගනුදෙනුකාර පදනම මෙන්ම අපේ ව්‍යාපාරික පරිමාවන්, ගනුදෙනු හා වත්කම් නිරන්තරව වර්ධනය වන බැවින් ඉදිරි වසර කිහිපය තුළ මේ කාර්යය ඉසිඹුවක් රහිත වේදිනෙදා ආයාසයක් බවට පත්වනු ඇත.

කැපී පෙනෙන මතක සටහන්

අපගේ මුල්ම ධාවන ප්‍රවේශයක් සහිත ස්වයංක්‍රීය මුදල් හුවමාරු යන්ත්‍රය, කොළඹ 07 තුන්මුල්ල මංසන්ධියේ සම්බුද්ධත්ව ජයන්ති ගොඩනැගිල්ලේ පිහිටි තිඹිරිගස්යාය ශාඛා පරිශ්‍රයේ ස්ථාපිත කර ඇත.



දෑස් මානයේ උරුම්පිරායි ශාඛාවේ වර්ධනය

යාපනය නගරයේ සිට උතුරින් පලාලි දක්වා දිවෙන මාර්ගයේ පිහිටි කුඩා නගරයක් වන උරුම්පිරායි, කෝපායි (කි.මී. 2) චුන්නාකම් (කි.මී. 2) තිරුනෙල්වේලි (කි.මී. 3) හා අච්චුවේලි (කි.මී. 7) අතර කැටිවී ඇත්තේ යාපනයේ කෘෂිකාර්මික ත්‍රිකෝණය තුළය. ඒ කෝපායි, චුන්නාකම්, හා අච්චුවේලි නගර යා කරමින් ඇඳෙන ත්‍රිකෝණයයි. මේ කුඩා නගරය ප්‍රසිද්ධියට පත්ව ඇත්තේ යාපනය අර්ධද්වීපයේ ප්‍රධානතම මුදල් බෝගයක් වන මිදි වගාව නිසාය. එහෙත්, මේ අවට මනා අධ්‍යාපනයක් ලද ප්‍රභූ පිරිසක් ද වූහ. ඔවුන් අතර බොහොමයක් දෙනා මේ වන විට කැනඩාව හා මැලේසියාවට සංක්‍රමණය වී ඇත.

උරුම්පිරායි ශාඛාවේ පෝෂක ප්‍රදේශය සමන්විත වන්නේ 15,000 තරම ජනගහනයක් සහිත උරුම්පිරායි (කොට්ඨාශ 4 ක්) උරෙලූ, පොන්නාලෙයි කඩ්ඩුවාන්, අච්චේලූ හා නීර්වැලි ග්‍රාම නිලධාරී වසම්වලිනි. බොහෝ කොට ගොවි ජනතාවගෙන් සැදුම් ලත් ගනුදෙනුකාර පදනම කුඩා වෙතත් ශාඛාව බෙහෙවින් සාර්ථක ලෙසින් ඒ තුළට කිඳා බැස ඇත.

2011 අගෝස්තු 01 දා පිහිටුවන ලද උරුම්පිරායි ව්‍යාප්ති කාර්යාලය 2011 නොවැම්බර් 01 දින පූර්ණ ශාඛාවක් ලෙස උසස් කරනු ලැබීය. මේ කාලය ඇතුළත ශාඛාව නොසැලෙන ප්‍රගතියක් වාර්තා කර ඇත්තේ ඉතිරි කිරීමේ ගිණුම් 2,944 ක් හා ස්ථාවර තැන්පත් ගිණුම් 1,551 ක් සංඛ්‍යා ලේඛන අතරට එක් කරමිනි.

මෙම ශාඛාව 2012 වසර තුළ බැංකුව විසින් මෙහෙය වූ ප්‍රධානතම තැන්පතු රාශිකරණ ක්‍රියාදාමය වූ ස්මාට් සේවර් වැඩ සටහන තුල මුළු දිවයිනේම දෙවන ස්ථානය දිනා ගන්නට සමත් විය.

බිම් මට්ටමේ වර්ධනය මිරිවැඩි රහිත බැංකුකරණය

“දුප්පත් මිනිස්සු ජවය හා දැනුමේ කැපී පෙනෙන උල්පත් බව ක්ෂුද්‍ර මූල්‍යනය හඳුනා ගනී. මූල්‍ය සේවා පහසුකම් නොමැති සංසිද්ධිය දුගී බවේ ලක්ෂණයක් වන අතරතුරේ, එයම වෙළඳපල බිහි කිරීමට මෙන්ම මිනිසුන් සමාජ ඉමේ සිට කැඳවා ස්ව උත්සාහයෙන් නැගී සිටින්නට මෙවලම් සපයන්නට යොදා ගත හැකි මෙතුවක් ප්‍රයෝජනයට නොගත් අවස්ථාවක් ලෙස ද වත්මනෙහි අරුත් ගැන්වේ”

කොෆි අන්නන්
වරෙක එක්සත් ජාතීන්ගේ මහලේකම්

දුප්පතුන් අන්තරාය මුව විටේ ඉන්නා සමාජ ස්ථරයක් වෙති. ඔවුන් නාගරික පැල්පත් හා කුලී නිවෙස් සිට ග්‍රාමීය ප්‍රත්‍යන්තය තෙක් රට පුරා පුළුල් පරාසයක පැතිර සිටිති. ඔවුන් කුලී කම්කරුවන් හා අඳ ගොවීන්, රැකියා විරහිත අයවලුන් හා ඌණ - රැකියා නියුක්තිකයන් මෙන්ම කාන්තාවන් විසින් බර උසුලන පවුල් හා දේශීය සංක්‍රමණිකයන් ලෙසින් වර්ගීකරණය කළ හැකිය.

ලොව පුරා විශාල පිරිසක් - සංවිධාන මෙන්ම සාමාජයීය ක්‍රියාකාරිත්වයන් - දුප්පතුන් බලගන්වා ඔවුන්ගේ සමාජ තත්ත්වය ඉහළ නැංවිය හැක්කේ කෙසේද යන ගැටළුවට පිළිතුරු සෙවීම කෙරේ අවධානය යොමු කර ඇත්තෝය. බොහොමයක් රටවල මේ පිළිබඳ සමාජ, ආර්ථික අත්හදා බැලීම් කෙරී ඇත. බංගලාදේශයේ ග්‍රාමීන් බැංකුව, ASA ආදර්ශය හා වඩා කුඩා මට්ටමේ සේෆ් සේව් බදු ආයාස, ඉන්දුනීසියාවේ ග්‍රාමීය දේසා ඒකක, අප්‍රිකාව පුරා පැතිර ඇති ඉතිරි කිරීමේ සමාජ මෙන්ම ලතින් ඇමරිකාවේ සංවර්ධිත, ඒ සමඟ ප්‍රශ්නකාරී ක්ෂුද්‍ර මූල්‍ය බැංකු උදාහරණ කිහිපයකි.

දුප්පතුන්ගේ මුදල් ප්‍රවාහ අවිධිමත්ය; පෙර - සැලසුමකට අනුව සිදු නොවේ. මෙම ගැටළුවේ හරය වන්නේ ඔවුන් සතු ආදායම් ස්වල්පය තිබිය දී වුව ඔවුනට මුදල් ප්‍රවාහයට ඔරොත්තු දී ගත නොහැකි අවශ්‍යතාවයන් අබිමුව තිබීමය. ආහාර බඳු දෛනික අවශ්‍යතා හැර ඔවුන්ට ජීවන චක්‍ර අවශ්‍යතා, හදිසි අවශ්‍යතා සඳහා ද මුදල් අවශ්‍යය.

අප සැලකිලිමත් වන්නේ මේ කියන ‘අවස්ථා’ පිළිබඳවය. දුප්පතුන්ට ඇති අවස්ථාවන් වන්නේ ව්‍යාපාර ආරම්භ කොට පවත්වාගෙන යෑම, ඵලදායී වත්කම් අත්පත් කර ගැනීම හා ජීවන තත්ත්වය ඉහළ නංවන කල් පවත්නා පාරිභෝගික භාණ්ඩ හිමි කර ගැනීම ආදියය. මේ අවස්ථා නිසිසේ ග්‍රහණය කර ගත හැකි වේ නම් ජීවන චක්‍ර අවශ්‍යතා හා හදිසි සිදුවීම් ගැන වග බලා ගත හැකි ය.

අපේ ස්වෝපකාර කණ්ඩායම් සංකල්පය ක්‍රියාත්මක වන්නේ මෙන්න මේ උපකල්පනය මතය. දුප්පතුන් සජීවීකරණය කළ හැකිය. ඔවුන් මූල්‍ය විනය, මූලික සාධකයක් වන සමාජ ජාලයක් වටා සංවිධානය කළ හැකිය. හුදෙක් තනි තනි පුද්ගලයන් නොව සංවිධිත කණ්ඩායමක් ලෙස ඔවුන් ශක්තිමත් කළ හැකිය. අපට අවශ්‍ය වන්නේ ඔවුන් මේ තමන් හාත්පස ඇති අවස්ථාවන්ගෙන් ප්‍රයෝජන ගනු දැකීමටය.

මේ ක්‍රියාදාමය ඉදිරියට ගෙන යනු සඳහා කැප වූ කණ්ඩායමක් අවශ්‍යය. මිනිසුන් සමඟ - ඔවුන්ගේ දොර එළිපත්තේ, කුඹුරේ, වැඩපොලේ එකට ගැටෙමින් කටයුතු කල හැකි ප්‍රජා සංවර්ධන සහායකයින් කණ්ඩායමක් අප තෝරා ගෙන ඇත්තේ එබැවිනි. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සපයන ලද මේ විපර්යයකාරකයෝ ඇත්තෙන්ම පොදු ජනතාව අතර ගැවසෙමින් ඔවුන් ස්වෝපකාර කණ්ඩායම් වශයෙන් ගොනු කිරීමෙහි නිරත මිරිවැඩි රහිත බැංකුකරුවෝ වෙති.

ප්‍රථම ආයාසය වූයේ ඔවුන් අතර ඉතිරි කිරීමේ හුරුව බිහිකරලිමය. ක්ෂුද්‍ර මූල්‍යනය තුළ තුන් ආකාරයක ඉතිරි කිරීම් විද්‍යාමාන වේ. ඒ පෙර-ඉතුරුම් (නිශ්චිත කාල රාමුවක් තුළ නිතිපතා ඉතිරි කිරීම්) පසු-ඉතුරුම් (මුලින් ණය මුදලක් ලබා අනාගත ඉතිරි කිරීම් ඔස්සේ පියවීම) හා

මුසු ඉතුරුම් (ඉහත කී අංශ දෙකේම හමුවක්) වශයෙනි. අපේ ස්වෝපකාර කණ්ඩායම්, මේ ක්‍රමවේද තුනම භාවිත කරති. මුලදී ඔවුන් පෙර-ඉතිරි කිරීම් භාවිතා කරන්නේ කාලානුරූප පදනමකින් තනි/කණ්ඩායම් ඉතිරි කිරීම් රැස් කරනු සඳහා ය. කණ්ඩායම් සාමාජිකයන් සමාජ සජීවීකරණය හා කැපවීම විදහා පෙන්වන අවස්ථාවේ දී පසු-ඉතුරුම් (ණය) ඉනික්බිතිව ඇරඹේ.

තමන් අතර ණය ලබා දිය යුත්තේ කාහටද, ඒ කුමක් සඳහා ද යන්න තීරණය කරනුයේ කණ්ඩායමය. මේ හැම පියවරකදීම සහෝදර සාමාජිකයන්ගේ ක්‍රියාකාරී බැඳීයාව හා බලපෑම විද්‍යාමාන වේ. මෙහි අරුත වන්නේ ණය ආපසු අය කර ගැනීම සඳහා පිටස්තර බලපෑමක් අවශ්‍ය නොවීමය. දැන් අප පිවිස සිටින්නේ මේ ව්‍යායාමය ශක්තිමත් කිරීමේ අදියරටය. අප ප්‍රජාව කණ්ඩායම් ගත කිරීම එලෙසින්ම කරගෙන යතත් දැන් දැන් වැඩි බරක් තබනුයේ හැකියා වර්ධනය හා ආයතනික ශක්තිමත් කිරීම වෙතය. මෙහිදී ගම්මානයක කණ්ඩායම් 5-10 අතර සංඛ්‍යාවක් ගම් මට්ටමේ මධ්‍යස්ථාන හා ඉනික්බිතිව සමිති බවට පරිවර්තනය කෙරෙන්නේ අවසන් ප්‍රතිඵලය ලෙස සමිති කෙරේ පූර්ණ නෛතික පිළිගැනීමක් ලබා දෙමිනි. තනි තනි කණ්ඩායම් සාමාජිකයන් මෙන්ම කණ්ඩායම් හා සමිතිවල තෝරා පත් කර ගත් නිලධාරීන්ගේ හැකියා වර්ධනය යොමු වූයේ පුහුණුව කරාය. අප වසර මුළුල්ලේම ඔවුන් වෙනුවෙන් පුහුණු වැඩමුළු පැවැත්වූයෙමු. මෙහිදී ආවරණීත අංශ වූයේ, මූල්‍ය සාක්ෂරතාවය, නායකත්වය හා අභිප්‍රේරණය, මූලික පොත් තැබීම හා විවිධ තාක්ෂණික දැනුමය. මෙහි තවත් මානයක් ලෙස, කණ්ඩායම් සාමාජිකයන්, තවත් එබඳු කණ්ඩායම් ක්‍රියාත්මක වන දිවයිනේ සෙසු පෙදෙස් කරා රැගෙන ගියේ අත්දැකීම් හුවමාරුව හා අන්තර්-සම්බන්ධතා බිහිකරනු සඳහාය.



ලංකා බැංකුවේ ස්වෝපකාර කණ්ඩායම් අතර කාර්ය ඵලය

	2012 වසර අග	2011 වසර අග
නිර්මාණය කළ කණ්ඩායම් සංඛ්‍යාව	17,010	16,396
සමස්ත සාමාජික එකතුව	90,993	87,824
ස්ථාපිත ග්‍රාමීය මධ්‍යස්ථාන සංඛ්‍යාව	576	410
ස්ථාපිත ග්‍රාමීය සමිති සංඛ්‍යාව	134	30
කණ්ඩායම් ඉතිරි කිරීම් (රු මිලියන)	375	200
පසු-ඉතුරුම් (ණය) රු මිලියන	1,408	1,297
බිහි කළ ආර්ථික කටයුතු සංඛ්‍යාව	28,876	26,358

ස්වෝපකාර කණ්ඩායම් අතර ධාරිතා සංවර්ධනය

පාඨමාලා වපසරිය	ඉලක්ක ගත ප්‍රතිලාභී කණ්ඩායම	පාඨමාලා සංඛ්‍යාව	සමස්ත සහභාගිත්වය
මූල්‍ය සාක්ෂරතාවය	කණ්ඩායම් ගත වීමට අපේක්ෂිත අඩු-ආදායම් ප්‍රජාව	26	1,768
ව්‍යවසාය සංවර්ධන වැඩසටහන	තවමත් සිය ව්‍යාපාරයන්හි මුල් අදියරේ ඉන්නා කැපවූ ව්‍යවසායකයින්	7	315
නායකත්ව සංවර්ධන වැඩසටහන	ස්වෝපකාර කණ්ඩායම් සාමාජිකයින්	614	3,169
නිපුණතා වර්ධන වැඩමුළුව	වෘත්තීය පාඨමාලා හදාරන ශිෂ්‍යයන්	3	262
ස්වෝපකාර කණ්ඩායම් ක්ෂේත්‍ර චාරිකා	ස්වෝපකාර කණ්ඩායම් සාමාජිකයින්	2	96
බැංකුකරණ සාක්ෂරතාවය	පුනරුත්ථාපනය කොට සමාජගත කරන ලද හිටපු එල්ටීටීඊ සාමාජිකයන්	3	97

වාර්තාව

සමාජ සත්කාරයක් හිටපු එල්ටීටීඊ සාමාජිකයන් සමාජ ගත කිරීම

හිටපු එල්ටීටීඊ සාමාජිකයන් පෙරලා පොදු සමාජ ප්‍රවාහයට එක් කරලීමේ ක්‍රියාදාමයේ පුරෝගාමී භූමිකාවක් අප විසින් ඉටු කරන ලදී. මෙය රජයේ ප්‍රකාශිත ප්‍රතිපත්තියක් වූයෙන් ඔවුන්ගේ ජීවනෝපාය සංවර්ධනය අරමුණු කොට ණය පිරි නැමීම උතුරු - නැගෙනහිර ශාඛා ජාලය ඔස්සේ ක්‍රියාත්මක කරන ලදී. ඔවුන් කඳවුරුගතව සිටියදී වෘත්තීය පුහුණුව ලබා දී තිබිණ. මේ සමාජ කණ්ඩායම මේ වන විට යාපනය, වන්නිය හා නැගෙනහිර පළාතේ පැරණි සටන්බිම් තුළ ස්වයං රැකියා ව්‍යවසායයන් මාලාවක් ආරම්භ කර ඇත. ඔවුන් අතර එක් අයෙක් - මුලතිව් දිස්ත්‍රික්කයේ නිරාවිපිඩිඩි නැගෙනහිර පදිංචිකරුවෙකු වන වී. උදයසූදන්, මුල්ලියාවෙලිහි කොණ්ඩා සැකසුම් හලක් ආරම්භ කර ඇත්තේ එහි හමුදා කඳවුර ඉදිරිපිටමය. ඔහුගේ සේවා දායකයන් අතර සෑහෙන ප්‍රමාණයක් හමුදා සෙබළු වෙති.

විගමනික ශ්‍රමිකයන්ට අත්වැලක්

වසර තුළ අපි උපාය මාර්ගික වශයෙන් වැදගත් එතෙර සන්ධිස්ථාන තුළ අප කණ්ඩායමේ නියෝජනය 26 දක්වා වර්ධනය කළෙමු. අප නියෝජිතයෝ විගමනික ප්‍රජාව ඔවුන්ගේ සේවා ස්ථානවලදී හමුවී වේගවත් මෙන්ම ආරක්ෂිත මුදල් ප්‍රේෂණ විධි හා ආයෝජන සැලසුම් පිරිනමති. අවධානය යොමු වූ රටවල් වූයේ මැද පෙරදිග, කොරියාව හා ඉතාලිය ය. එතෙර ශ්‍රී ලාංකීය තානාපති කාර්යාල හා ස්වේච්ඡා සංවිධාන මෙන්ම සංස්කෘතික සංසද විසින් මුල පුරන ලද උත්සව හා වැඩ සටහන් රාශියක දී අපේ ක්‍රියාකාරී සහභාගීත්වය පිරිනමන ලද අතර ඒ ඔස්සේ සබඳතා වර්ධනයට පියවර ගනු ලැබීය.

ප්‍රජාව අරමුණු කර ගත් ප්‍රවේශයක්

සෞඛ්‍ය රැකවරණය

රනෝරාව ග්‍රාමීය රෝහල සංවර්ධන ව්‍යාපෘතිය

අනුරාධපුරයට වයඹ දෙසින් පිහිටි කුඩා ගම්මානයක් වන රනෝරාව, මේ කටුක බිම්පෙතේ සුවිශේෂී ස්ථානයක් වී ඇත්තේ මූලික වශයෙන්, 5,000 තරම හාත්පස විසිරී ග්‍රාමීය ජන ගහනයට සෙත සලසන ග්‍රාමීය රෝහල නිසාය. අපි මෙම වසරේ ප්‍රධාන පෙලේ සමාජ සත්කාරයක් දියත් කළේ වෛද්‍ය නිලධාරී හමුවීම් කාමර, සායනය, ඖෂධාගාරය, ඖෂධ ගබඩාව, වැසිකිලි පහසුකම් හා ඉඩකඩ සහිත රෝගී නැවතුම් ශාලාවක් ද සහිත අංග සම්පූර්ණ බාහිර ප්‍රතිකාර අංශයක් ගොඩ නංවනු සඳහාය. රුපියල් මිලියන හයකට වැඩි පිරිවැයකින් ඉදි කළ මේ ගොඩනැගිල්ල 2012 පෙබරවාරි මස ජනතාවට පිරිනමනු ලැබීය.

මහරගම පිළිකා රෝහලේ ළමා චිකිත්සක ඒකකය

1989 දී ලංකා බැංකුවේ පනස් වන සංවත්සරයට සමගාමීව මහරගම පිළිකා රෝහලේ අංග සම්පූර්ණ ළමා වාට්ටුවක් ඉදි කරනු ලැබීය. අපි එහි නඩත්තු කටයුතු පවත්වා ගෙන යන්නෙමු. එක් මට්ටමේ කණ්ඩායම් සාමාජිකයන් ද ඇතුළත් භාරකාර මණ්ඩලයක් විසින් මෙම කටයුතු අධීක්ෂණය කරන අතර ඒ සඳහා පිරිවැය සපයා ගන්නේ මූලස්ථාන ගොඩනැගිල්ලේ හා ශාඛා ජාලයේ එකතු වන පැරණි පුවත්පත් විකුණා ලැබෙන මුදල් යොදවමිනි.

ග්‍රාමීය තලයේ සෞඛ්‍ය රැකවරණයට දිරි දුන් අයුරු

අපේ ගල්නෑව ශාඛාව සිය බල ප්‍රදේශයේ සෞඛ්‍ය රැකවරණය බල ගැන්වීම උදෙසා නිර්මාණශීලී පියවරක් තබා ඇත.

ගල්නෑව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, මහවැලි 'එච්' කලාපයේ බහුතරය ගොවීන් වන 15,000 ක තරම ගැමි ජනගහනයකට සේවා සපයයි. හඳුන්ගම, බුල්නෑව, තලන්කුට්ටිය, නාමල්ගමුව, හල්මිල්ලවැව, මුස්නව, කන්දෙගම, කල්ලන්චිය, සියඹලෑව, අවුකන, නෑගම්පහ හා යාබද ගම්මානවල ගැමියන් මෙන්ම මහවැලි ජනාවාසයන්හි ජනපදිකයන් අතර ගැබිණි මවුවරුන් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ හා සෙසු නම් කරන ලද ස්ථානවල පවත්වන සායන සඳහා සහභාගී වෙති. බැංකුව, ප්‍රාදේශීය සෞඛ්‍ය බලධාරීන්ගේ ද සහයෝගය මත තරුණ ගැබිණි මව්වරුන් අතර බෙදා හැරීම සඳහා පිටු හතරක පත්‍රිකාවක් සකස් කළේය. මෙම කුඩා අත්පොත දරු ප්‍රසූතියට සූදානම් වීම, උපතට පසු බිලිඳු රැකවරණය, එන්නත් කිරීම් කාල සටහන්, මවු කිරි දීමේ නිවැරදි උපදෙස් හා අදාල සෙසු කරුණුවලින් සමන්විත වූ අතර මේ නොදියුණු, අවම අධ්‍යාපනික මට්ටම් සහිත ග්‍රාමීය බිම් පෙදෙස පසුබිම් කර ගන්නා විට බෙහෙවින් කාලෝචිත ප්‍රයත්නයක් විය.

සෞඛ්‍ය සේවා පහසුකම් සඳහා මූල්‍යාධාර

ගාස්තු අය කරන පුද්ගලික අංශයේ සෞඛ්‍ය සේවාවන්හි සීඝ්‍ර වර්ධනය, සාමාන්‍ය ජනතාවට සෙත සලසන රාජ්‍ය අංශයේ නිදහස් සෞඛ්‍ය සේවයට දරන්නට සිදුව ඇති බර සමහන් කරන බව අපගේ විශ්වාසය වේ. මේ අරමුණ මත අපි වසර ඇතුලත සෞඛ්‍ය සේවා ව්‍යාපෘති කිහිපයකටම ණය පහසුකම් සැලසුවෙමු.

නයින්වෙල්ස් කෙයා මව් හා ළදරු රෝහල	**රු. මිලියන** 500
සිංහ රෝහල - රත්නපුර මෙය සබරගමුව පළාතේ නව රෝහලකි.	**රු. මිලියන** 140
සෙන්ට්‍රල් රෝහල - කොළඹ 07	**රු. මිලියන** 960

සෞඛ්‍ය රැකවරණය හා අධ්‍යාපනය එක් තැන් කළ බහු විධ ප්‍රවේශයක්

බැංකුව සෞඛ්‍ය සේවා සැපයීමේ බහු විධ ප්‍රවේශයක් සනිටුහන් කරමින් මාලබේ පිහිටි දකුණු ආසියා තාක්ෂණික හා වෛද්‍ය ආයතනයේ (SAITM) නවීන පහසුකම් හා තාක්ෂණය කැටි කළ ශික්ෂණ රෝහල සඳහා ආයෝජනයට දායක විය. මේ ලංකාවේ ප්‍රථම පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයයි. මේ නවීන රෝහල SAITM හි වෛද්‍ය ශිෂ්‍යයන්ගේ සායනික පුහුණුවීම් සඳහා යොදා ගැනෙනවා හැර, මේ කලාපයේ කලක සිට විද්‍යාමානව තිබී හිඩැසක් සපුරාලමින් වෛද්‍ය පර්යේෂණ කටයුතුවල ද නිරත වනු ඇත. අපි, මේ ඓතිහාසික පුරෝගාමිත්වය උදෙසා රුපියල් බිලියනයක මූල්‍ය ආධාර සැපයුවෙමු.

ජාතික උරුමය

උත්කෘෂ්ඨ සංස්කෘතික සංදර්ශනය මහනුවර දළදා පෙරහැර

සුපුරුදු පරිදි මෙවර ද, අපි ශ්‍රී ලංකා සංස්කෘතික ප්‍රභාව විදහාපාන සෙංකඩගල පුර දළදා පෙරහැරට සම දායකත්වය සැපයුවෙමු. මෙම උළෙල සියවස් පැරණි යාතුකර්ම හා සම්ප්‍රදායයන් මෙන්ම පූජනීය දන්ත ධාතුව හා සබැඳි පිළිවෙත් කදිමට හසු කරගන්නේ, පරම්පරාවෙන් පරම්පරාවට දායාද කළ ඉපැරණි නර්තන රිද්මයන්, ජන සංගීතය හා වර්ණවත් සළුපිලියෙන් අලංකාරව සැරසූ අලි ඇතුන් විශාල සංඛ්‍යාවකගේ සහභාගීත්වයෙන්, බැතිමතුන් හා ප්‍රේක්ෂකයන් මුසපත් කරමිනි. මේ තනිව ගත් කළ ද සංචාරකයන් ඇඳ බැඳ ගන්නා සංදර්ශනයකි.

පෙරහැර සඳහා අනුග්‍රහය දැක්වීමට අමතරව, අපි දළදා මාළිගාවේ පුවත්පත හා පරිගණක සාක්ෂරතා වැඩමුළු ද ඇතුලත් වන්නා වූ සමාජ සත්කාරක පුරෝගාමිත්වයනට ද මූල්‍ය අනුග්‍රහය ලබා දුන්නෙමු.

කතරගම ඇසළ උළෙල

ගිණිකොණ දිග දිවයිනේ පූජනීය ස්ථානයක් වන කතරගම, වසර මුළුල්ලේම බැතිමතුන් දහස් ගණනකගේ ආගමනය සනිටුහන් කරයි. එය වඩාත් තීව්‍ර වන්නේ වාර්ෂික ඇසළ උළෙල පැවැත්වෙන අගෝස්තු මාසයේය. 'සුරිඳුනි කතරගම' යනුවෙන් කදිමට නම් ගොත් තැබූ මේ උළෙල බෞද්ධ හා හින්දු ආගමික වත් පිළිවෙත් අතර කදිම සුසංයෝගයකි.

දීඝවාපී සංරක්ෂණ ව්‍යාපෘතිය

ක්‍රිස්තු පූර්ව 110 වසර තෙක් ආපස්සට යන ඓතිහාසික පුදබිමක් වන අම්පාර දිස්ත්‍රික්කයේ දීඝවාපිය, ජාතික උරුමයන් අමාත්‍යාංශය විසින් සිහිවටනාත්මක පුරා විද්‍යා සංරක්ෂණ ව්‍යාපෘතියක් ලෙසට ප්‍රකාශයට පත් කොට ඇත. සංරක්ෂණ කටයුතු පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව විසින් කරනුයේ සිවිල් ආරක්ෂක බලකායේ ශ්‍රම දායකත්වය සමගිනි. සංරක්ෂණ කටයුතු අතර හඳුනාගත් භූමි භාගය තුළ කැනීම් කටයුතු, වත්මන් කෞතුකාගාරය ප්‍රතිසංස්කරණය, වන්දනාකරුවන් සඳහා පහසුකම් ස්ථාපනය කිරීම හා භූමි අලංකරණය ද වේ. බැංකුව මේ දක්වා සිවිල් ආරක්ෂක බලකායේ වැටුප් හා දීමනා ද, කැනීම් උපකරණ හා හඳුනා ගත් යටිතල පහසුකම් සඳහා පිරිවැය ද දරා ඇත.

සමාජයීය ආයෝජන

උනිච්චායි ගම්මානය සංරක්ෂණ වැඩසටහන

උනිච්චායි, වසර තිහක යුද සමය තුල දැඩි සේ බැට කෑ මඩකලපුව දිස්ත්‍රික්කයේ ඈත එපිට ගම්මානයකි. වියවුල් සහගත අතීතයේ දී ගම හැරදා ගිය ගම්මු දැන් දැන් පෙරලා පැමිණෙමින් සිටිති. මේ ප්‍රජාවට තමන්ගේ එදිනෙදා දිවි පෙවෙතට බලපාන දහසකුත් එකක් ප්‍රශ්න සමුදායකට මුහුණ පාන්නට සිදුව ඇත. ඒ සුන්බුන්ව ගිය යටිතල පහසුකම්, අබලන් ගේ දොර, ප්‍රමාණවත් නොවන සෞඛ්‍ය පහසුකම් හා සනීපාරක්ෂාව, හා දූ දරුවන්ගේ අධ්‍යාපනික අවශ්‍යතා ද වශයෙනි.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මඟ පෙන්වන ලදුව, මහජන බැංකුව හා අත්වැල් බැඳ ගත් අපි ගැමියන්ගේ අවශ්‍යතා හඳුනාගනු උදෙසා පදනම් රේඛා සමීක්ෂණයක් නිම කළෙමු. ඔවුන්ගේ

ආසන්නතම අවශ්‍යතා වූයේ නිවාස ගොඩනැගීම, සනීපාරක්ෂක පහසුකම්, ජීවනෝපාය සංවර්ධනය හා අධ්‍යාපනික උපකාරක පහසුකම්ය.

බැංකු දෙක එක්ව හඳුනාගත් කඩිනම් අවශ්‍යතා සඳහා මුදල් සැපයූහ.

ගම්මුන් ස්වෝපකාර කණ්ඩායම් තුළට ගොනු කිරීමේ ඊළඟ පියවර දැන් කෙරීගෙන යයි. ඒ වෙනුවෙන් විශේෂයෙන් බඳවාගත් ක්ෂේත්‍ර සේවකයෝ මේ ප්‍රජාව ණය පිරිනැමීමේ එළිපත්ත කරා කැඳවාගෙන ඒමේ ව්‍යායාමයේ නිරත වෙමින් සිටිති.

දොරමඩලාව ආදර්ශ ගම්මානය

අනුරාධපුර නගරයට ඊසාන දෙසින් පිහිටි කටුක වියළි කලාපයට අයත් වන මේ ගම්මානයේ සර්වග්‍රාහී සංවර්ධනය අරමුණු කරගත් දිවිමංසල ප්‍රජා මධ්‍යස්ථානය මේ වසර තුළ පිහිටුවනු ලැබිණි. දොරමඩලාව රජමහා විහාර භූමියේ ස්ථාපිත මෙම මධ්‍යස්ථානයෙහි බැංකු ශාඛාවට අමතරව කෘෂි - තොරතුරු හා උපදේශ කේන්ද්‍රයක්ද වෘත්තීය පුහුණු පහසුකම් ද වේ. සියයට සියයක්ම පාහේ ගොවීන් වන දොරමඩලාවේ ගම් වැසියෝ මේ වන විට විධිමත් කාල රාමු මත ගොවි ණය ලබා ගනිති.

ක්‍රීඩා හා විනෝද කටයුතු උදෙසා අත හිත

අපි 2012 ජුනි 09 - 12 කාලය තුල කොළඹ සුගතදාස ක්‍රීඩාංගනයේ පැවති 15 වැනි ආසියාතික කනිෂ්ඨ මලල ක්‍රීඩා තරඟාවලිය සඳහා අනුග්‍රහය සැපයූ ප්‍රධානම අනුග්‍රාහකයෙක් වීමු. ආසියානු මලල ක්‍රීඩා සංගමය විසින් සංවිධානය කරන ලද මෙම උළෙලට ආසියානු රටවල් 34 ක තරුණ මලල ක්‍රීඩක ක්‍රීඩිකාවෝ 5,000 කටත් වඩා සහභාගී වූහ.

> **“ගම්මුන් ස්වෝපකාර කණ්ඩායම් තුළට ගොනු කිරීමේ ඊළඟ පියවර දැන් කෙරීගෙන යයි. ඒ වෙනුවෙන් විශේෂයෙන් බඳවාගත් ක්ෂේත්‍ර සේවකයෝ මේ ප්‍රජාව ණය පිරිනැමීමේ එළිපත්ත කරා කැඳවාගෙන ඒමේ ව්‍යායාමයේ නිරත වෙමින් සිටිති.”**

වසර තුළ සෙසු සමාජ සත්කාරක ක්‍රියාදාමයන්

පහත දැක්වෙන සමාජ සත්කාරක ක්‍රියාදාමයන් බොහොමයක් සංවිධානය කොට සහභාගිත්වය ද සැපයුවේ අප පලාත් මට්ටමේ කණ්ඩායම් සාමාජිකයන්ය.

සෞඛ්‍ය රැකවරණය

- මානිපායි නගර සිංහ සමාජයේ ද සහයෝග යෙන් අත්මදතෝඩයි / පුලසිඩ්ඩි හි පැවති වෛද්‍ය සායනය. මෙහිදී 300 කට වැඩි රෝගීන් පිරිසකට ප්‍රතිකාර කරනු ලැබීය
- 01.02.2012 දින ත්‍රිකුණාමලයේ පැවැත්වූ ඩෙංගු නිවාරණ වැඩ සටහන
- ආයුර්වේද / කටු චිකිත්සා සායනය. කල්මුණේ
- කරාපිටිය ශික්ෂණ රෝහලේ පිළිකා වාට්ටුවේ රෝගීන්ට ඖෂධ මිලදී ගැනීම සඳහා මුදල් පරිත්‍යාගය හා ආහාර පාන සැපයීම
- මහනුවර පිළිකා සංගමය විසින් පිළිකා ඒකකයක් ස්ථාපිත කිරීම වෙනුවෙන් කණ්ඩායම් සාමාජිකයන්ගේ පරිත්‍යාගය
- කුරුණෑගල මහ රෝහලේ තැලසීමියා ඒකකය සඳහා මුදල් පරිත්‍යාගය
- කණ්ඩායම් සහභාගිත්වය සහිතව අනුරාධපුර මහ රෝහලේ වාට්ටු පිළිසකර කිරීම
- කණ්ඩායම් සහභාගිත්වය සහිතව පදියතලාව රෝහලේ ළමා වාට්ටුව ප්‍රතිසංස්කරණය
- ප්‍රාදේශීය සෞඛ්‍ය බලධාරීන්ගේ සහයෝග යෙන් මොණරාගල පැවැත් වූ ඩෙංගු නිවාරණ වැඩසටහන
- මොණරාගල ජාතික රෝහලෙහි ළමා වාට්ටුව සඳහා මදුරු දැල් 50ක් ප්‍රදානය කිරීම
- සෞඛ්‍ය සේවා සම්බන්ධීකරණයෙන් බිබිලේ පැවති ඩෙංගු නිවාරණ වැඩසටහන
- බණ්ඩාරගම ශාඛා කණ්ඩායම විසින් ප්‍රදේශයේ ගැබිණි මව්වරුන් 35 දෙනෙකුට බිළිදු ඇඳුම් පරිත්‍යාගය
- හක්මන ශාඛා කණ්ඩායම විසින් ගංගොඩගම රෝහලට වර්ණ රූපවාහිනී යන්ත්‍රයක් පරිත්‍යාගය
- සියළුම උපාංග සහිත ඇඳන් පහක් අවිස්සාවේල්ල රෝහලට පරිත්‍යාග කිරීම

ප්‍රජා සත්කාර

- චුන්නාකම් හි රාමනාදන් විද්‍යාලයේ විශේෂ අධ්‍යාපන ඒකකයට ඇතුළත් වෙනස් ආකාර හැකියා ඇති සිසුන්ගේ පරිහරණය සඳහා පරිගණකයක් ලබා දෙන ලදී
- ත්‍රිකුණාමලයේ පැවති ජාත්‍යන්තර කාන්තා දින උත්සවය සඳහා අනුග්‍රහය
- සේරුවිල විහාරස්ථානයේ වාර්ෂික උත්සවය සංවිධානය
- කින්නියා නගර සභා රැස්වීම් ශාලාව ප්‍රතිසංස්කරණය
- ගාලු කොටුව හා මිහිඳු ගුහාව ප්‍රතිසංස්කරණය
- බෙලිඅත්තේ පැවති දක්ෂිණ ලංකා පාසැල් ක්‍රීඩා උළෙල සඳහා ප්‍රධාන දායකත්වය
- මහනුවර ගේට්වේ පාසැලේ වෙසක් බැති ගී සරණිය සඳහා අනුග්‍රහය
- නුවරඑළිය දිස්ත්‍රික්කයේ අන්තර් පාසැල් චිත්‍ර තරඟය සඳහා අනුග්‍රහය දැක්වීම
- කතෝලික කන්‍යා සොයුරියන් විසින් පවත්වා ගෙන යන අත්හැර දමන ලද හා වෙනස් ආකාර හැකියා සහිත පුද්ගලයන් සඳහා වෙන්වූ මහනුවර, දයා නිවස සඳහා ස්වේච්ඡා පරිත්‍යාග
- සුනෙර පදනම හා එක්ව කායික අඩුලූහුඬුකම් සහිත දරුවන් 100 කට ඉතිරි කිරීම් පොත් පිරිනැමීම
- අනුරාධපුර අභිමන්සලෙහි පැවති ආගමික උත්සවය
- අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධියට මහජන ඇමතුම් කට්ටලයක් පරිත්‍යාගය
- පසුගිය වසරේ 5 වසර ශිෂ්‍යත්ව පරීක්ෂණයෙන් දක්ෂතා පෙන්වූ වෙනස් ආකාර හැකියා සහිත දැරියකට රු.100,000 ක පරිත්‍යාගය
- අනුරාධපුර දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ බුදුමැදුර ගොඩනැංවීම
- ඌව පළාත් සභාව විසින් මෙහෙය වූ, පහ වසර ශිෂ්‍යත්ව පරීක්ෂණයට පෙනී සිටි සිසුන් ඉලක්ක කොට පැවති සිප්සර උදාන වැඩ සටහන සඳහා දායකත්වය. ඌව පළාතේ සියලුම සිසුන් පාහේ ආවරණය කරමින් සම්මන්ත්‍රණ 20 ක් පවත්වනු ලැබීය
- ඇඹිලිපිටිය ජාතික පාසල හා දෙහිවින්න මිහිඳු විද්‍යාලයට ජල ටැංකි පරිත්‍යාගය
- මිල්ලේවත්ත මහා විද්‍යාලය - ගිරාඳුරුකෝට්ටේ හි පැවති චිත්‍ර හා රචනා තරඟය සඳහා අනුග්‍රහය
- ඌව පළාත් කාර්යාලයේ ජාත්‍යන්තර කාන්තා දින වැඩ සටහන

වාණිජ හා කර්මාන්ත මණ්ඩල සමග පැවති සබඳතා - අනුග්‍රහයන්

- ශ්‍රී ලංකා ජාතික අපනයනකරුවන්ගේ මණ්ඩලය - 20 වන වාර්ෂික අපනයන සම්මාන උළෙල
- ශ්‍රී ලංකා ජාතික වාණිජ මණ්ඩලය - 2012 ජාතික ව්‍යාපාරික විශිෂ්ටත්ව සම්මාන
- ලංකා වාණිජ මණ්ඩලය - 2012 ප්‍රශස්තතම ආයතනික පුරවැසියා සම්මාන උළෙල
- ශ්‍රී ලංකා ඖෂධ කර්මාන්තකරුවන්ගේ මණ්ඩලය - වාර්ෂික සම්මේලනය
- ශ්‍රී ලංකා වාණිජ හා කර්මාන්ත මණ්ඩල සම්මේලනය - SAARC
- කාන්තා කර්මාන්ත හා වාණිජ මණ්ඩලය - වසරේ ව්‍යාපාරික කාන්තාව තරඟය
- ලංකා කාර්මික හා වාණිජ මණ්ඩලය - 2012 ජයග්‍රාහකයා සම්මාන
- ශ්‍රී ලංකා යුරෝපීය වාණිජ මණ්ඩලය - යුරෝලින්ක්
- ජාත්‍යන්තර වාණිජ මණ්ඩලය - 46 වන වාර්ෂික සම්මේලනය

අනාගතය හා සමඟ වර්ධනය වෙමින්

හපනා අධ්‍යාපනික වැඩසටහන

හපනා වැඩසටහන ඵල්ල වන්නේ පහ වසර ශිෂ්‍යත්වය සඳහා සූදානම් වන දරුවන් කෙරේය. මෙහිදී අප හපනා අධ්‍යාපනික පුවත්පත හා සහයෝගයෙන් කටයුතු කරන්නෙමු. සම්පත් දායකයන් ලෙස සුප්‍රකට අධ්‍යාපනඥයන් ලබා දෙන්නේ ඔවුන් විසිනි. මෙම අධ්‍යාපනික සම්මන්ත්‍රණ මාලාව දිවයින පුරා පැවැත්වෙන්නේ ඌණ සංවර්ධිත ග්‍රාමීය හා නාගරික පාසල් කෙරේ වැඩි බරක් තබමිනි. දරුවන් වෙනුවෙන් පැවැත්වෙන වැඩමුළුවට සමාන්තරව ඔවුන් කැටුව එන දෙමාපියන් වෙනුවෙන් වැඩසටහනක් පැවැත්වෙන්නේ දෙමාපිය මඟ පෙන්වීම තේමා කරගෙනය.

මෙම වසර පුරා අපි 37,000 ක සිසු දරුවන් හා 32,000 ක දෙමාපියන් වෙනුවෙන් වැඩසටහන් 75 ක් පැවැත්වීමු.

වෙනත් අධ්‍යාපනික ක්‍රියාදාමයන්

ක්‍රියාදාමය	ප්‍රතිඵල
අනාගත නායකයන්ට අත හිත දෙමින් සෑම වසරකදීම අප, සරසවි පිවිසුම් පෙළ ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටිනා පාසල් හැර යන දරුවන් 1,000 කට වඩා පුහුණු කරන්නෙමු. ඒ අපේ ශාඛා පද්ධතිය ඔස්සේය. බහුතරය ඒ හැටි වත්පොහොසත්කම් නැති පවුල් පසුබිමකින් එන ශිෂ්‍යයන් වෙති. ඔවුන් වෙත ගණුදෙනුකාර සේවය, ණය ගනුදෙනුකරු පසු විපරම, දත්ත කැවීම, බිම් මට්ටමේ ගනුදෙනුකරුවන් සමඟ අන්‍යෝන්‍ය සබඳතා හා උපකාරක සේවා යනාදි අංශ ඔස්සේ හය මසක පුහුණුවක් ලබා දෙන අතර, එය ඔවුන් අනාගත අභියෝග සඳහා හුරු කරන කදිම අධ්‍යාපනික වැඩසටහනකි.	මෙම වසර තුළ අපි රු. මිලියන 147 ක් ආයෝජනය කරමින් සිසුන් 1,500 ක් පුහුණු කළෙමු.
උපාධිධාරී පුහුණු වැඩ සටහන ජාතික සරසවි පද්ධතිය විසින් යොමු කරන උපාධි අපේක්ෂකයන්ට සේවාස්ථ පුහුණුවක් ලබා දීමේ වැඩ පිළිවෙළක් කාලයක් තිස්සේ ක්‍රියාවට නැංවේ. මෙවර අප මේ වැඩසටහන පුළුල් කළේ ජාතික ව්‍යාපාර කළමණාකාරිත්ව ආයතනය (NIBM), ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT) හා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය ද මීට ඇතුළත් කරමිනි. මේ හැර අපි, පිළිගත් විගණන ආයතන විසින් යොමු කළ විගණන පුහුණුවන්නන්ට ද පුහුණුව ලබා දුන්නෙමු.	මෙම වසර තුළද අපි උපාධි අපේක්ෂකයන් 434 දෙනෙකුට පුහුණුව ලබා දුන්නෙමු. හයමසක් දිවෙන වැඩසටහනින් 80% ක් සේවාස්ථ පුහුණුව මඟින් ආවරණය කරන ලද අතර සෙස්ස ජ්‍යෙෂ්ඨ බැංකුකරුවන් හා පැවති අන්තර්-ක්‍රියාකාරී සැසි හා සාකච්ඡා ඔස්සේ නිම කරන ලදී.
රන් කැකුළු ශිෂ්‍යත්ව වැඩසටහන මෙම වසරෙදී, පහ වසර ශිෂ්‍යත්ව විභාගයෙන් ඉහළ ලකුණු ලැබූ 2,000 වන රන් කැකුළු ගිණුම් හිමි සිසුන් වෙත, රුපියල් මිලියන 20 ක මූල්‍ය ත්‍යාග පිරිනමනු ලැබීය. ඔවුන්ගේ ගිණුම්වලට බැර කරන ලද මේ ත්‍යාග, ඔවුන් සමඟම වැඩී, සරසවි පිවිසුම් එළිපත්ත මතදී මාහැඟි සම්පතක් වනු ඇත.	මුළු දිවයිනේම කුසලතාවය මත රු. 10,000 බැගින් ශිෂ්‍යත්ව 1,750 ක් ප්‍රදානය දිස්ත්‍රික්ක 25 ඉහළ ලකුණු ලැබූ දරුවන් 10 දෙනා බැගින් ශිෂ්‍යත්ව 250 ක් ප්‍රදානය
රන් කැකුළු සංසද - පාසල් ඉතිරි කිරීමේ ඒකක අපි පාසල් දරුවන් අතර ඉතිරි කිරීමේ පුරුද්ද බිහි කිරීමෙහි ලා පුරෝගාමීන් වන්නෙමු. මේ කාර්යය කෙරෙනුයේ තෝරා ගත් පාසල්වල පාසැල් ඉතිරි කිරීමේ ඒකක පිහිටුවමිනි. මින් ඔබ්බටද පිවිසෙමින්, ඇතැම් පාසල්වල රන් කැකුළු සංසද නමින් හැඳින්වෙන ඉතිරි කිරීමේ සමාජ ද ස්ථාපනය කර ඇත. මේ තුළින් මූල්‍ය සාක්ෂරතාවය ප්‍රචලිත කෙරේ. මේ කුඩා පාසල් බැංකු ඒකක මෙහෙය වන්නේ ශිෂ්‍ය ශිෂ්‍යාවන් විසින්මය.	වසර අවසානය වන විට පාසැල් ඉතිරි කිරීමේ ඒකක 2,498 ක් හා රන් කැකුළු සංසද 954 ක් පිහිටුවා තිබිණ.

වෙනත් අධ්‍යාපනික ක්‍රියාදාමයන්

ක්‍රියාදාමය	ප්‍රතිඵල
18+ ශිෂ්‍යත්ව වැඩසටහන බහුතරය සරසවි පිවිසුම සඳහා උගන්නා ශිෂ්‍යයන් වන 18+ ගිණුම් හිමියෝ, තල දෙකකින් වාර්ෂිකව තෝරා ගනු ලබන 100 කට ආසන්න සරසවි ශිෂ්‍යත්ව සඳහා හිමිකම් ලබති. දිනුම් ඇදීමකින් තෝරා ගනු ලබන රු. 30,000 බැගින් වන ශිෂ්‍යත්ව 72 කි. ප්‍රධාන විෂය ධාරා හතර තුළ ඉහළම ලකුණු ලැබූ අපේක්ෂක/අපේක්ෂිකාවන් සඳහා ශිෂ්‍යත්ව 20 කි. (විද්‍යාව, ගණිතය, කලා හා වාණිජ)	මෙම වසර තුළදී අපි රු. මිලියන 2.8 ක ශිෂ්‍යත්ව 92 ක් පිරිනැමුවෙමු. ඒ ජාතික සරසවි පද්ධතියට ඇතුළු වන්නට වරම් ලැබූ 18+ ගිණුම් හිමියන් වෙතය.
විශිෂ්ටත්වය කරා යෞවනයන් කැටුව යමින් 2012 අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය සඳහා පෙනී සිටි උතුරු පළාතේ සිසුන් උදෙසා සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී.	කාල සීමාව - දිනකි සහභාගිත්වය - 819 කි.
අධ්‍යාපනික ණය පහසුකම් ජාතික සරසවි පද්ධතියට ඇතුළු වීමේ දැඩි තරඟකාරිත්වය, එතෙර හා මෙතෙර පෞද්ගලික අංශයේ තෘතීයික අධ්‍යාපන පහසුකම් සඳහා වැඩි ඉල්ලුමක් නිර්මාණය කර ඇත. මේ බොහොමයක් සිසුන්ට පාඨමාලා ගාස්තු මෙන්ම ජීවන චක්‍ර අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මූල්‍ය ප්‍රභවයන් නැති බැවින්, එම අඩුව පිරවීමේ මූල්‍ය පහසුකම් අවශ්‍ය වේ. ලංකා බැංකුවේ අධ්‍යාපන ණය පහසුකම් ඒ සඳහා කදිම අත්වැලක් වන්නේ එය අනවශ්‍ය හිරිහැරවලින් තොර ක්‍රියාදාමයක් නිසාය.	වසර අවසානය වන විට අප මේ අංශය වෙනුවෙන් රු. මිලියන 536 ක් ආයෝජනය කොට ඇත. ඒ ශිෂ්‍යයන් 90 දෙනෙකු වෙනුවෙනි.

පාසල් ඉතිරි කිරීමේ ඒකක - උත්කර්ෂවත් කාර්යඵලයක්

	2012 වසර අග	2011 වසර අග	ප්‍රගතිය %
පාසල් ඉතිරි කිරීමේ ඒකක ගිණුම් සංඛ්‍යාව	514,368	423,252	21.5
මුළු ඉතිරි කිරීම් පරිමාව - රු මිලියන	614	492	24.7
එක් ගිණුමක සාමාන්‍ය ශේෂය	1,450	1,100	31.8

අපේ ගනුදෙනුකරුවන් හා සාමූහිකව වර්ධනය වෙමින්

ගනුදෙනුකාර සේවය කෙරේ යොමු වීම

ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්ව වැඩ සටහන

තාක්ෂණික ප්‍රගමනය, නිතිපතා වෙනස් වන ගනුදෙනුකරු අවශ්‍යතා, අපේක්ෂා මට්ටම් හා සංජානනය සමඟ කැටි වූ මූල්‍ය සේවා ක්ෂේත්‍රයේ ඇති දැඩි තරඟකාරිත්වය, බැංකු සේවා සැපයුම අභියෝගකාරී ව්‍යාපාරික කටයුත්තක් බවට පත් කර ඇත්තේ එහි තිරසර පැවැත්මට ද බලපෑම් කරමිනි.

තරඟකාරිත්වය-ඔව්- සදාචාරවත් තරඟ කාරිත්වය - සේවා විශිෂ්ටත්වය ඉදිරියට තල්ලු කරන/කැඳවා ගන්නා ගාමක බල වේගයකි. මේ වත්මන් පසුබිමෙහි ක්ෂේත්‍රයේ රඳා ඉන්නට උත්සාහක ජයග්‍රාහකයකු බවට පත් විය යුතුය.

මේ වසරේදී අප ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්ව වැඩ සටහනක් ආරම්භ කළේ අපේ කණ්ඩායම අතර සුපිරි ජයග්‍රාහක මානසිකත්වයක් බිහිකරනු සඳහාය. ඔවුන් අනාගතයේ ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය සාක්ෂාත් කරගත් ජයග්‍රාහකයන් කණ්ඩායම වනු ඇත.

මෙම වැඩසටහනේ සංකල්පය, නිර්මාණය හා මෙහෙය වීම, මානව සම්පත් විශේෂඥවරයා හා ඔහුගේ කණ්ඩායම විසින් විය. අන්තර්-ක්‍රියාකාරී වැඩ සටහනක් වූ මෙහි සැසි, මෙහෙයුම් මට්ටමෙන්, - ශාඛා, ව්‍යාප්ති කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ උප කාරක ඒකක තුල පවත්වනු ලැබීය. වැඩමුළුවෙහි දී ආවරණීත මාතෘකා අතර, ගනුදෙනුකාර සේවා ඉඟි, දුරකථන සංවාදකරණය, ගනුදෙනුකාර පැමිණිලි පිළිබඳ කටයුතු කරනා ආකාරය මෙන්ම අසීරු ගනුදෙනුකරුවන් හා සබඳතා පැවැත්වීම ද අන්තර්ගත විය.

පැය තුනක වැඩමුළුවක් වූ මෙය, පවර් පොයින්ට් ඉදිරිපත් කිරීම්, දේශන, සහභාගිවන්නන්ගේ භූමිකා රංගනවලින් සමන්විත වූ අතර, උගත් පාඩම් හා තීරණාත්මක කරුණු කැටි කළ ප්‍රතිපෝෂණ සැසියකින් හමාර විය.

වැඩසටහන වසර මුළුල්ලේම පැතිරුණු අතර, 110 ක් ශාඛා, ව්‍යාප්ති කාර්යාල හා උපකාරක සේවා ඒකක ආවරණය කරනු ලැබීය. සමස්ත සහභාගීත්වය කණ්ඩායම් සාමාජිකයන් 1,876 ක් වූ අතර එය බැංකුවේ මුළු කණ්ඩායම් ශක්තියෙන් 24% විය.

සහභාගි වූ කණ්ඩායම් සාමාජිකයන්ගේ ඇගයීම් ප්‍රමාණාන මෙන්ම ඔවුන් විදහා පෑ උද්යෝගය ද ඉහළ තලයක විය. ඔවුනතර 68% සමස්ත වැඩසටහන විශිෂ්ඨ බව නිගමනය කළ අතර 22% ක් එය ප්‍රශස්ත බව තක්සේරු කළහ. හැම වැඩමුළුවක්ම අවසානයේ පැවති ජීවයෙන් පිරි ප්‍රතිපෝෂණ සැසිවලදී, ඔවුහු අවධානය යොමු කළ යුතු තීරණාත්මක කරුණු රැසක්ම ගෙන හැර පෑහ.

මෙම වැඩසටහන 2013 වසර තුළද ක්‍රියාත්මක වීමට නියමිත අතර, ඉතිරි ශාඛා/ඒකකවලදී ප්‍රතිපෝෂණ සැසි තුළින් ලත් අදහස් ද එකතු කර ගනු ඇත.

සමාජ කළමනාකරණ රාමුව

ලෝක බැංකුව විසින් අරමුදල් සපයන ණය යෝජනා ක්‍රමයක් වන සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ණය ලබා ගන්නා ගනුදෙනුකරුවන් සමාජ කළමනාකරණ රාමුවක් තුළට අනුගත කෙරේ.

මෙම වැඩසටහන තුළ, මානව හිමිකම්, උපරිම වැඩ කරන පැය, වෘත්තීය සමිතිවලට ගොනු වීමේ නිදහස, නිර්වචනය කළ ප්‍රතිලාභ සැලසුම්, අවම වේතන, වැටුප් සහිත ප්‍රසූත නිවාඩු හා වැඩපල අනතුරු ආරක්ෂණය යනාදි කරුණු අඩංගු සමාජ කළමනාකරණ රාමුවක් හා අනුගත වන ලෙස ණයලාභී ව්‍යවසායකයන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

වඩා පුළුල් අර්ථයකින් ගතහොත්, සමාජ කළමනාකරණ ප්‍රවේශය තුළින් කාර්මික සාමය හා ගනුදෙනුකාර ව්‍යවසායයන්හි ප්‍රශස්තම සේවා ජීවන තුලිතයක් රඳවා ගන්නවාට අමතරව යුරෝපීය සංගමය බඳු සුපිලිපන් කම්කරු පරිචයත් කෙරේ දැඩි අවධානය යොමු කරන සුවිශේෂ වෙළඳපල කරා පිවිසීම බෙහෙවින් පහසු කරයි. මෙහි සමස්ත ප්‍රතිඵලය වනුයේ ගනුදෙනුකාර ව්‍යවසායයන් මූලික තිරසර පැවැත්ම අංගයක් වන බහුවිධ පාර්ශ්වකාර ආයතන බවට පත් වීමය.

5S සංකල්පය

එස් 5 සංකල්පය පිළිගෙන ඇති බැංකුව ශාඛා ජාලය හරහා එය ක්‍රියාත්මක කරන්නට පියවර ගෙන ඇත.

වසර අවසානය වන විට ශාඛා 18 ක් එස් 5 සංකල්පය ක්‍රියාත්මක කොට අවසන් කර තිබි අතර තවත් ශාඛා 71 ක් ක්‍රියාත්මක කිරීමේ විවිධ අදියර පසු කරමින් හුන්නෝය.

මෙම වැඩසටහන ක්‍රියාත්මක වනුයේ ශාඛා මට්ටමේ පැවැත්වෙන දැනුවත් කිරීමේ වැඩමුළු/සම්මන්ත්‍රණ හරහාය. මේ පුහුණු වැඩමුළු සාර්ථක ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිසරය හා චිත්ත ඒකාග්‍රතාව බිහි කරයි. වසර තුළ මෙබඳු වැඩමුළු 34 ක් පවත්වන ලද්දේ ක්‍රියාත්මක කිරීමේ කාලරාමු ඉලක්ක හා අනුගත වන පරිද්දෙනි.

බටහිර පළාත - දකුණ	ශාඛා 12
උතුරු මැද පළාත	පළාත් කාර්යාලය හා ශාඛා 22

මෙම වැඩ පිළිවෙල සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කළ පසු බැංකුවේ ව්‍යාපාරික ඒකක තුළ ගනුදෙනුකරු-හිතකාමී පරිසරයක් ගොඩ නැංවෙනු ඇත.

ආදර්ශ ශාඛා සංකල්පය

ආදර්ශ ශාඛා සංකල්පය තුලින්, ඉදිරිපෙළ ව්‍යාපාරික ඒකක තුළ සර්වග්‍රාහී අභ්‍යන්තර සැලසුමක් හඳුන්වා දෙනු ලැබේ. මෙහිදී, මෙතෙක් ගනුදෙනුකරුවන්ට ප්‍රවේශය සීමා කොට හෝ තහංචි පනවා තිබී ශාඛාවේ පසු පෙළ කාර්යාල සංකල්පය ඉවත් කෙරිණ. දැන් ශාඛාවල ඉදිරි පෙළ - පසු පෙළ භේදයක් නැත.

ආදර්ශ ශාඛා සංකල්පය යටතේ මුළු මහත් ශාඛා පරිශ්‍රයම ගනුදෙනුකරුවන්ට විවෘතය. ඔවුන්ට දැන් ශාඛාව තුළ ඕනෑම සේවා ලක්ෂ්‍යකට පිවිසිය හැකිය. ශාඛාවල හඳුන්වා

දී ඇති ඉඩපාඩු සහිත ගනුදෙනුකරු ලොබිය, නිරන්තරයෙන් ප්‍රසාරණය වන ගණුදෙනුකාර ප්‍රවාහයට පහසුකම් සලසයි.

ශාඛාවල බොහොමයක් පසුපෙළ කටයුතු ප්‍රධාන කාර්යාලයේ ස්ථාපනය කර ඇති මධ්‍යම පසු පෙළ කාර්යාලය මඟින් ඉටු කරන බැවින්, ශාඛා කාර්ය මණ්ඩලයේ බොහොමයක්, ගනුදෙනුකාර සේවා හා ක්ෂේත්‍ර මට්ටමේ ගනුදෙනුකාර සේවා පසු විපරම් සඳහා මුදා හැරීමට හැකි විය.

මෙම ක්‍රියාමාර්ගය තුළින් අභ්‍යන්තර භෞතික සැලැස්ම පිළිබඳ වෙනස්කම්වලට අමතරව, එක් එක් කණ්ඩායම් සාමාජිකයන්ගේ සේවා විස්තරය ද, බල පැවරුම් මට්ටම්, පෝරම හා ගිණුම් විවෘත කිරීමේ ලියවිලි යනාදිය ද නැවත සකස් කරන ලදී.

2012 වසර තුළදී ශාඛා 14 ක් ආදර්ශ ශාඛා මට්ටමට ගෙන එනු ලැබුවේ දිවයින පුරා ව්‍යාප්ත සමස්ත ආදර්ශ ශාඛා සංඛ්‍යාව 266 ක් දක්වා ඉහළ නංවමිනි.

කඩදාසි රහිත බැංකුකරණය කරා

අපේ ජංගම බැංකුකරණ විසඳුම

අප ජංගම බැංකුකරණ විසඳුම වන බීඕසී පේමේට් මඟින් උපයෝගිතා බිල්පත් ගෙවීම්, මුදල් මාරු කිරීම් හා රක්ෂණ වාරික ගෙවීම් සඳහා පහසුකම් සැලසේ. එය විසිහතර පැය පුරාම ක්‍රියාත්මක සේවාවක් වන අතර, මෙය තුළින් කඩදාසි භාවිතය අවම කරන බැවින් හරිත සංකල්පයට ද පිටුවහලක් වේ. මේ, දැනට ඇති හොඳම පෝලිම් කළමණාකරණ පද්ධතියයි.

වෘත්තිකයන් සුවිශේෂ ගනුදෙනුකාර අංශයක් ලෙස

දිවයිනේ වෘත්තිකයන් - වෛද්‍යවරුන්, ඉංජිනේරුවන්, පරිගණක වෘත්තිකයන්, මානව සම්පත් විශේෂඥයන්, මූල්‍ය කළමණාකරුවන්, ගණකාධිකාරීන් හා තාක්ෂණවේදීන් වෙනුවෙන් සැකසුණ සුවිශේෂ ණය පැකේජ මාලාවක්ම අප විසින් හඳුන්වා දී ඇත. මේවායේ සුවිශේෂත්වය වන්නේ ලිහිල් මෙන්ම සරල සුරැකුම් ආවරණය, සහනදායක පොළී අනුපාත, දිගු කල ආපසු ගෙවීම් කාල සීමා සහ මැනවින් සංවිධිත ණය අනුමත කිරීමේ ක්‍රියාදාමයයි.

කාන්තා බලගැන්වීම

අපි කාන්තාවන්ගේ - විශේෂයෙන් ආසියානු කලාපයේ කාන්තාවන් තුළ ඇති ආවේණික ශක්‍යතා, හැකියාවන් හා දිරිය පිළිබඳව විශ්වාස කරන්නෙමු. පවුල තුල ආදායම් උත්පාදනය කරන්නේ කවරෙක් වුවද, භාණ්ඩාගාරය මෙහෙය වන්නේ ඇයය.

මේ නිසාම ඇය ප්‍රතිචාරාත්මක අත්වැලකට හිමිකම් පාන්නියක වන්නීය. කාන්තාවන් වෙනුවෙන් අප සැකසූ 'කාන්තා රන් ගිණුම්' තැන්පතු යෝජනා ක්‍රමයේ සුවිශේෂ අංගයක් වනුයේ ඒතුළ ආයෝජනය කළ මුදලට සාපේක්ෂ නොමිලේ ජීවිත රක්ෂණාවරණයයි.

රටපුරා කාන්තාවන් ගෙහිමියාගේ භූමිකාව හොබවන පවුල් රාශියකි. කදිම උදාහරණයක් වන්නේ මඩකලපුව අසළ වෙරළබඩ ගම්මානයක් වන තිරායිමඩුය. මෙහි හැම පවුල් ඒකකයම ප්‍රධානියා කාන්තාවකි. අප තිරායිමඩුහි කාන්තාවන් ස්වෝපකාර කණ්ඩායම් ලෙස ගොනු කොට, ජීවනෝපාය සංවර්ධනය උදෙසා ක්ෂුද්‍ර-ණය පිරිනමා ඇත්තෙමු.

මේ පිළිබඳ නවතම ව්‍යායාමය සිරිලිය ණය වැඩසටහනය. මෙහි අරමුණ ස්වයං රැකියාවන්හි නිරත කාන්තාවන් ව්‍යවසායිකාවන් බවට පරිවර්තනය කිරීමය. අප විසින් මූල්‍ය පහසුකම් සලසනු ලැබ අප හා එක්ව වර්ධනය වන කාන්තා ව්‍යවසායිකාවන් දහස් ගණනකි.

ජාතියට සෙවණ සලසමින්

මේ වන විට අපි රට පුරා නිවෙස් හිමියන් 7,559 දෙනෙකුට නිවාස ණය වශයෙන් රුපියල් බිලියන 9.1 ක් පිරිනමා ඇත්තෙමු. මෙයට අමතරව අපේ පුද්ගලික ණය යෝජනා ක්‍රමය යටතේ මෙතෙක් පිරිනමා ඇති රුපියල් බිලියන 27 න් ද බහුතරය යෙදවී ඇත්තේ නිවාස තනන්නට හෝ පිළිසකර කරන්නටය. මෙයින් ගම්‍යමාන වන්නේ ජාතියට සෙවණ සැපයීම උදෙසා අපේ ආයෝජනය රුපියල් බිලියන 20 ඉක්මවා ඇති බවය.

තෝරා ගත් රාජ්‍ය අංශයේ ආයතන මෙන්ම අර්ධ රාජ්‍ය ආයතන සඳහා ද විශේෂයෙන් සැකසූ ණය වැඩසටහන් මේ වසර තුළ ඉදිරිපත් කරන ලදී. ඒ අතර, ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය, මාර්ග සංවර්ධන අධිකාරිය, භූ විද්‍යා හා පතල් කාර්යාංශය, ජාතික රක්ෂණ භාර අරමුදල හා ජාතික විශ්ව විද්‍යාල පද්ධතිය ද විය.

උතුරු නැගෙනහිරට දෑත් දිගු කරමින්

ජීවනෝපාය සංවර්ධනය

පශ්චාත් ගැටුම් උතුරු නැගෙනහිර අභියෝග කිහිපයකටම මුහුණපායි. ඒ විනාශ වූ යටිතල පහසුකම්, සිඳී බිඳී ගිය ජීවන මංපෙත් හා මහා පරිමාණ විතැන් වීම් ආදී පරාසයක පැතිරී ඇත. රාජ්‍ය හා මූල්‍යාධාර සපයන්නන් එක්ව යටිතල පහසුකම් බොහෝ දුරකට යළි ගොඩ නංවා ඇත.

අවතැන් වූ ජනතාව ඔවුන්ගේ ගම්බිම් නිවෙස්වල යළි පදිංචි කරවා ඇත. එහෙත් නැවත ගොඩ නැංවිය යුතු, පිළිසකර කළ යුතු කාලයත් සමඟ තිරසරව වර්ධනය කළ යුතු ජීවන මංපෙත් ඉතිරිව ඇත.

අපි උතුරු නැගෙනහිර ජීවනෝපාය සංවර්ධනයේ හා නැවත ගොඩ නැංවීමේ පුරෝගාමී කාර්යභාරයක් ඉටු කළෙමු. යාපනය අර්ධද්වීපයේ සිට වන්නිය දක්වාත් මඩකලපුව සිට ත්‍රිකුණාමලය දක්වාත් ගොවිබිම් පටියේ සිට ධීවර ගම්මාන තෙක්ද නගරයේ සිට ගැමි ප්‍රත්‍යන්තය දක්වාත් මේ එකම කතාව, එකම සංසිද්ධිය විය. අපි අවතැන්වූවන් විශාල පිරිසකට මූල්‍ය පහසුකම් සැලසුවෙමු. අප සිය මුදල් මල්ලේ විශාලතම මූල්‍යාධාර සහිත බැංකුව බවට පත්වුණේ මේ අන්දමටය.

සඳ තරු කරා එලඹෙමින්

එස්.ඒ.ටී. නයනාංජලී මහත්මිය මාදම්පේ පාර, උඩුබද්දාව පදිංචි 51 වියැති ගුරු උපදේශිකාවකි. ඒ බිංගිරිය අධ්‍යාපන කලාපයේය.

දෙවසරකට පෙර ඇය, මල් වගාවට පිවිසුනේ හුදෙක් විනෝදයටය. එහෙත් මේ විනෝදාංශය කෙටි කලකින්ම පැතිරුණු ව්‍යාපෘතියක්, චක්‍ර අපනයන ව්‍යවසායයක් බවට පත් විය.

ඇය අක්කර දෙකක් පමණ වන සිය ගෙවත්තේ ඇන්තූරියම් හා සැන්ඩ්‍රියානා වගා කරන්නේ දැල් මඩු තුළය. ඇන්තූරියම් හා සැන්ඩ්‍රියානා ඉති, බිංගිරිය කෘෂි අපනයන කලාපයේ මිලදී ගන්නෝ තරඟයට මිලදී ගනිති. වසර 22 හා 18 වයස්වල ඉන්නා ඇගේ දරු දෙදෙනා ද කලකට පෙර තමා ද ව්‍යාපාරිකයෙකුව හුන් සැමියා ද මේ කටයුත්තේදී ඇයට උදව් පදව් කරති.

ඇය පවසන අන්දමට මේ ව්‍යාපෘතියෙන් මසකට ලැබෙන ආදායම රුපියල් 30,000 ඉක්මවයි.

මේ සියල්ලටම මුල් වන්නේ ලංකා බැංකුව 'සිරිලිය' ණය යෝජනා ක්‍රමය යටතේ පිරිනැමූ රු 500,000 ක ණය මුදලකි.

දැස් මානයේ ජීවන මංපෙත් ප්‍රතිනිර්මාණය කරමින්

කනකපුරම්හි එස්. කලයරානි, ජයන්දිනගර්හි පදිංචි චිත්‍රා සිවකුමාර් හා එස්. මංගලේශ්වර් සහ තිරුවෙයිනාරු හි වී. වදනකාන්දන් අපේ කිලිනොච්චි ශාඛාවේ ගනුදෙනුකරුවන්ය. මේ සිව්දෙනා අතර එක් කැපී පෙනෙන සමානකමක් තිබේ. ඔවුන් හැමදෙනාම යුද්ධයේ අවසන් අදියරේ අනාථව සරණාගත කඳවුරු තුළ වසරක් තරම් ගත කොට ලංකා බැංකුවේ මූල්‍ය පහසුකම් තුළින් සිය දිවි පෙවෙත යළි ගොඩ නගා ගත්තෝ වෙති.

කලයරානි හා ඇගේ සැමියා එක්ව කනකපුරම්හි ඇඹරුම්හලක් ආරම්භ කර ඇත. දැනට එහි අඹරන යන්ත්‍ර යුගලයක් ඇති අතර ඉන් එකක් මේ නොබෝදා මිලදී ගත්තකි. ඔව්හු මිරිස් තුනපහ කුළුබඩු තොග වශයෙන් මිලදී ගෙන අඹරා පැකට් කර වෙළඳපලට ඉදිරිපත් කරති. විටෙක ගම්වැසියෙකු ගෙන එන මිරිස් තුනපහ කුලියට කෙරීම ද ඔවුන් අත් හරින්නේ නැත. දැනට මාසික ලාභය රු. 30,000 ඉක්මවයි. මේ යුවළ තමන්ගේ ව්‍යාපෘතියෙන් ලැබෙන ආදායම යළිත් ඒ තුළටම ආයෝජනය කරති.

චිත්‍රා සිවකුමාර් සිය නිවෙස ඉදිරිපස මෝටර් බයිසිකල් හා ත්‍රීරෝද රථ අළුත්වැඩියා හා සේවා මධ්‍යස්ථානයක් ආරම්භ කර ඇත. මෙම සේවාස්ථානය ඇගේ සැමියා විසින් පාලනය කරනු ලබන අතර එය ඩේවිඩ් පීරිස් මෝටර් සමාගමේ බලයලත් සේවා නියෝජිත ස්ථානයක් වන අතර නොමිලේ සේවා සඳහා ඩේවිඩ් පීරිස් සමාගමෙන් ලැබෙන දීමනාවට අමතරව වැඩපලේ මාසික ලාභ මට්ටම රු 25,000 ඉක්මවයි. දියුණුවන ව්‍යාපාරය නිසා චිත්‍රා සිය අබලන් නිවස පිළිසකර කර ඇතුවා පමණක් නොව ත්‍රීරෝද රථ සේවා කිරිම සඳහා ඔසවනයක් ද තනා සිය ඉතිරි කිරීමේ ගිණුමෙහි රු.70,000 ක් ද තැන්පත් කර ඇත.

කුඩා දරුවෙකුගේ මවක වන එස්. මංගලේශ්වර් සිමෙන්ති හා කොන්ක්‍රීට් නිෂ්පාදන වැඩපලක් අරඹා ඇත. මෙහි කම්බි කණු, විසිතුරු කොන්ක්‍රීට් කණු හා ග්‍රිල් වර්ග නිෂ්පාදනය කෙරේ. වන්නියේ පැතිරුණු ගොඩනැගිලි ඉදිකිරීම් මේ සඳහා හොඳ ඉල්ලුමක් සපයයි. නිෂ්පාදන කටයුතු ඇගේ පියා විසින් සිදු කරන අතර ඇණවුම් සරු සමයේදී පිටස්තර සේවකයන්ගේ සේවය ලබා ගනී.

වී. වදනකාන්දන් සිල්ලර වෙළඳාම හා කෘෂිකර්මයට අත ගසා ඇත. ඉරණමඩු කරා දිවෙන පාර ඉදිරිපිට සිය නිවෙසට යාව සිල්ලර වෙළඳ සැලක් පවත්වාගෙන යාමට අමතරව ඔහු අක්කර 1 1/2 දක්වා විහිදුනු බිම් කොටස් තුනක කෙසෙල් (ඇඹුල්, අළුකෙසෙල් හා කෝලිකුට්ටු) වී‍ළවලු හා තරුණ පොල් වගාවක් ද නඩත්තු කරයි. දරු දෙදෙනෙකුගේ පියකු වන ඔහු සිය දිවි පෙවෙත ඉක්මනින් ඉහළ නංවාගෙන ඇත්තේ මුදල් ප්‍රවාහ යොදවා ත්‍රී රෝද රියක් මිල දී ගෙන නිවෙස ද ප්‍රතිසංස්කරණය කරමිනි.

මේ සිව්දෙනාම රුපියල් 90,000 ක ප්‍රථම ණය මුදල දුගී බව දුරුලීමේ ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමය යටතේ ද රු 200,000 ක දෙවැන්න උතුරු වසන්තය ණය වැඩසටහන යටතේ ද ලබා ගත්හ.

ජාතියේ බැංකුකරුවාගේ කුඩා තල්ලුවක් ද සමඟින් පෙරමග බලා සිටින සතුට පිරි මුහුණු හතරක්.

කෙටිකාලීන බෝග නිෂ්පාදනය

> **“අනාගත ආහාර සුරක්ෂිතතාවය තහවුරු කරන්නට නම් සුළු ගොවීන් විසින් මෙහෙයවනු ලබන පෙදෙස්බද පරිසරයට ගැලපෙන සේ සැකසූ පරිසර පද්ධතියට හා ආර්ථිකයට තිරසර පැවැත්ම සලසන නව විධි ක්‍රම අත්‍යවශ්‍ය වෙයි.”**
>
> **බිල් ගේට්ස්**
> මයික්‍රොසොෆ්ට් ආයතනයේ සම ආදී කර්තෘ හා සභාපති

කෙටි කාලීන බෝග, ආහාර බෝග මෙන්ම වෙළඳ බෝග ද දිවයිනේ කෘෂිකාර්මික වපසරියේ ප්‍රධානතම අංගයකි. රටට විදේශ විනිමය උපයන්නේ වැවිලි කර්මාන්තය වුව ද ජාතියේ කුසගිනි නිවන්නේ වී හා සෙසු ධාන්‍ය, මාංෂ බෝග හා අල වර්ග වලවළු හා පලතුරු වගාවේ නිරත සුළු ඉඩම් හිමි ගොවීන්ය.

මේ පසුබිම මත අප අනාදිමත් කාලයක සිට සුළු ගොවින්ගේ වගා පිරිවැය පියවීමෙහිලා ණය සැපයීමේ නිරතව සිටින්නෙමු. වත්මන අප දිවයිනේ බැංකු අතර වඩාත්ම විශාලතම සුළු ගොවි ණය පරිමාවට හිමිකම් කියන්නේ 38% වෙළඳපල කොටසක් ද සමඟිනි. මේ ණය මුදල්වලින් බහුතරය නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හරිනු ලැබ ඇත.

යුද්ධයෙන් පසු උතුරු නැගෙනහිර පළාත්වල, කෙටිකාලීන වගා ණය සඳහා දැඩි අභිරුචියක් දක්වයි. වසර පහකට පෙර වගා ණය කළඹේ වැඩිබර දැරුවේ මහවැලි ප්‍රදේශවල පිහිටි ශාඛාවන්ය.
(අරලගංවිල, දෙහිඅත්තකණ්ඩිය හා ගිරාඳුරුකෝට්ටේ) දැන් මේ වාරය උදා වී ඇත්තේ සරුසාර වන්නියේ කිලිනොච්චි හා යාපනය අර්ධද්වීපයේ අච්චුවේලි වැනි ශාඛාවන්ටය.

සුළු ගොවි ණය ප්‍රදානයේ වෙනස්වන මුහුණුවර

	ණය මුදල් සංඛ්‍යාව	%	මුදල රු මිලියන	%
උතුරු පළාත	19,775	54%	2,628	73 %
දිවයිනේ සෙසු පළාත්	16,742	46%	958	27 %

බඩ ඉරිඟු වගාවේ අපූරු කතා පුවත

ශ්‍රී ලංකාව දැන් බඩ ඉරිඟුවලින් ස්වයංපෝෂිතය. තුති පුද හිමි විය යුත්තේ ශ්‍රී ලංකා මහ බැංකුව හා වාණිජ බැංකුවල ඉදිරි දැක්ම හා කැපවීමටය. අද වන විට බඩ ඉරිඟු වර්ෂාපෝෂිත වියළි කලාපයේ, වඩාත් නිවැරදිව සටහන් කරනවා නම් අනුරාධපුර හා මොණරාගල දිස්ත්‍රික්කවල - ලාභදායී බෝගයක් බවට පරිවර්තනය වී ඇත. ගලෙන්බිඳුණුවැව, කහටගස්දිගිලිය හා හොරොව්පතාන අවට සරුසාර බිම්පෙත් ද සියඹලාණ්ඩුව හා බුත්තල ද ශ්‍රී ලංකාවේ ඉරිඟු කලාපය බවට පත්ව ඇත.

අපි මේ ව්‍යායාමය තුළ ක්‍රියාකාරී පංගුකරුවකු-වඩාත් නිවැරදිව කියන්නේ නම් ප්‍රධානතම පංගුකරුවා වූයෙමු. අප ගනුදෙනුකරුවන් හඳුනාගෙන, ක්ෂේත්‍ර සේවක පිරිස අනුයුක්ත කොට වගා කාල සීමා අනුරූපව ණය මුදා හැරීම පමණක් නොව පසු අස්වනු අලෙවිය පිළිබඳව ද සිත් යොමු කොට ඉදිරි වෙළඳ ගිවිසුම් හරහා බෙහෙවින් ප්‍රතිඵලදායක අලෙවි සබඳතා වැඩ පිළිවෙලක් නිර්මාණය කළෙමු. 2011 අප තිරසර පැවැත්ම වාර්තාවෙහි, කෙහෙල්දල්ල මිතුරු සංවර්ධන සමිතියට අනුගත බඩ ඉරිඟු ගොවීන්ට අප සැපයූ අත හිත ගැන සඳහන් වෙයි. අප විසින් අඩක් මූල්‍යනය කරන ලද නවීනතම සුවිසල් බඩ ඉරිඟු සයිලෝ (ගබඩා) සංකීර්ණයක් මිහින්තලේ (A9 මාවතට යාව) දැන් ක්‍රියාත්මකය. තවත් එවැන්නක් මොණරාගල ඉදිවෙමින් පවතී. අප ඉදිරි වෙළඳ ගිවිසුම් හරහා ගොවින් දහස් ගණනක් බඩ ඉරිඟු සකසන්නන් හා සම්බන්ධ කොට ඇත.

ප්‍රමුඛතා ක්ෂේත්‍රය බල ගන්වමින්

ධීවර ක්ෂේත්‍රය

දිවයිනේ ධීවර ක්ෂේත්‍රය දළ ජාතික නිෂ්පාදනයෙන් 1.2% ක් සපයන අතර රටේ ප්‍රෝටීන භාවිතයෙන් 70% කටම වඟ කියයි. මේ හැර 650,000 ක පමණ පිරිසකට සෘජු මෙන්ම වක්‍ර රැකියා අවස්ථා සලසා දී ඇති අතර අපනයන ආදායමෙන් 2.5% ක අගයක් වාර්තා කරයි.

සමස්ත මත්ස්‍ය අස්වැන්නෙන් 53% ක් වන වෙරළාසන්න ධීවර කර්මාන්තය හා අක්වෙරළ/ ගැඹුරු මුහුදේ ධීවර කටයුතුවලට අමතරව දිවයිනේ අභ්‍යන්තර ජලාශ, අභ්‍යන්තර වැව්, කඩොලාන, මඩ තැනිබිම් හා ලවණ තැනි හරහා අති විශාල විභවයක් පවතී.

අපි ධීවර ක්ෂේත්‍රයේ විවිධත්වයට සරිලන සේ ණය පහසුකම් සලසා ඇත්තෙමු. ඒ ගැඹුරු මුහුදේ ධීවර කර්මාන්තය (බහුදින යාත්‍රා හා ධීවර උපකරණ) වෙරළාසන්න ධීවර කර්මාන්තය (සාම්ප්‍රදායික යාත්‍රා හා මාදැල්) මිරිදිය ධීවර කටයුතු, ජල ජීවී වගාව ආදී වශයෙනි. මේ විවිධත්වයට සරිලන සේ ණය වැඩසටහන් සම්පාදනය කරන ලද්දේ ගොඩබිම් ආශ්‍රිත ධීවර කටයුතු (කරවල, උම්බලකඩ හා ජාඩි නිෂ්පාදන) සඳහා ද අවධානය යොමු කරමිනි.

එහෙත් මත්ස්‍ය අස්වැන්න නෙලීමෙහි සීමාවක් ඇති බව අපි දනිමු. ලොව පුරා අතිධාවනකාරී මසුන් මැරීම මුහුදු ජීවීන්ගේ තිරසර පැවැත්මට තර්ජනයක්ව පවතී. මේ පසුබිම මත අප සිත් යොමු විය යුත්තේ මත්ස්‍ය වගාවටය. අනාගතය හිමිවන්නේ මත්ස්‍ය වගාවට බව සැකයක් නැත.

අපි මේ මංපෙත කරා යොමුවී සිටින්නෙමු.

නිෂ්පාදනය නැංවීම සඳහා සැපයූ මූල්‍ය පහසුකම්

වගා කන්නය	ණය ලබාගත් ගොවීන් සංඛ්‍යාව	මුදල රු.මිලියන
2011/12 මහ	4,149	192
2012 යල	590	22
එකතුව	4,739	214



දැස් මානයේ කින්නියා හි උප්පාර් කලපුවේ

මත්ස්‍ය කොටු වගාව

ත්‍රිකුණාමලයට යාබද කින්නියාවේ ධීවරයන් පිරිසක් නිර්මාණශීලී ධීවර පරිචයකට අතගසා ඇත. ඔවුන් කණ්ඩායමක් සේ ගොනුවී මත්ස්‍ය අපනයනය සඳහා යොමුවූ පුද්ගලික සමාගමක් වන 'ඇක්වා එන් ග්‍රීන් සමාගම' හා ගිවිසුමකට එළඹ සිටිති. ඒ මාළු කොටු ක්‍රමය ඔස්සේ මත්ස්‍ය නිෂ්පාදනයටය.
මෙහිදී ප්ලාස්ටික් බැරල් මත ලෑලි සවි කොට සම චතුරස්‍රයක ආකාරයට සකසා යටින් ප්ලාස්ටික් දැලක් සවි කොට කලපුව තුළ සුරක්ෂිතව තැන්පත් කෙරේ. මෙබඳු කොටු කිහිපයක්ම එකට ඈඳා තිබීම වඩා සුරක්ෂිතය.

මාළු පැටවුන් එක් කොටුවකට 650 ක් වන ආකාරයට තැන්පත් කොට හය මසක කාලයක් ආහාර සපයා එක් මත්ස්‍යයෙකුගේ බර කිලෝග්‍රෑමයක් වන තුරු දැඩි කෙරේ. අපනයන සමාගම මාළු කිලෝග්‍රෑමයක් රු. 250 ක් වන සේ මිලදී ගන්නට ගිවිස ගෙන ඇත. දැනට වර්ධනය කරන්නේ "මොදා" නම් මත්ස්‍යය විශේෂයය. සම්පූර්ණ අස්වැන්න අපනයනය කෙරේ.

අප මේ ධීවරයන් සඳහා රු. මිලියන 3.0 ක් මුදා හැරියේ නියමු ව්‍යාපෘතියක් වශයෙනි. අපේ හැඟීම වන්නේ මෙය සාර්ථක වීමේ ඉඩකඩ ප්‍රශස්ත බවය.

තිරසර සත්ව පාලනය - කදිම උදාහරණයක්

වැලිමඩට ආසන්න පහල ගල් කුඹුර, මිරහවත්තේ මැදිවියේ ගොවි මහතෙකු වන සුමිත් ජයශාන්ත විවිධ කෘෂිකාර්මික අත්හදා බැලීම් වල නිරත වේ. සිය ගෙවත්තේ ඉදිරිපස කොටසේ උඩරට වලවළු වගා කරන ඔහු පසුපස අර්ධයේ කිරිගව පාලනයේ නිරත වෙයි. ඔහු කලක් තිස්සේ ගව පාලනය කළේ සම්ප්‍රදායික ආකාරයට ගවයින් නිදැල්ලේ යවමිනි. ඒ 2010 ට පෙරය. පසුව ඔහු ගව නිවෙස් මත පදනම් තිරසර සත්ව පාලනයට එලඹුණේ බැංකුවේ පෙළඹවීම මතය.



ලංකා බැංකුවෙන් පිරිනැමුණු රු 210,000 ණය මුදල ඔහු යෙදවූයේ සතුන් 10 දෙනෙකුට සෑහෙන විද්‍යාත්මක ගව නිවසක් තනන්නට හා අක්කර 1/2 ප්‍රමාණයේ අධි පෝෂ්‍යදායී තෘණ විශේෂයක් වගා කරන්නටය. මේ තෘණ වගාව සතුන් සඳහා අවශ්‍ය ඝන ආහාර සම්පූර්ණයෙන් ලබා දෙයි. ගොවිපල සතුව දැන් වැඩුණු දෙනුන් (කිරිදෙනුන් හා නෑම්බියන්) හතක්ද පැටව් දෙදෙනකු ද වේ. දැනට දෛනික කිරි නිෂ්පාදනය ලීටර 20 ක් තරම වන අතර පෙදෙස්බද කිරි නිෂ්පාදකයෙකු වන රුවන්සිරි කිරි කම්හල ඒ මිලදී ගන්නේ ලීටරයක් රු. 50 බැගිනි. මේ අනුව කිරිගව පාලනයෙන් දෙසතියකට වතාවක් ලැබෙන මුදල් ප්‍රවාහය රු 15,000 ඉක්මවයි. මේ මුදල් වලවළු අස්වැන්නෙන් පසු එළඹෙන මිල උච්චාවචනයන් යම්තාක් දුරකට සමනය කරයි.

ජාතික ප්‍රමුඛතාවයක් කිරිගව ක්ෂේත්‍රය

තවමත් එහි පූර්ණ විභවය සාක්ෂාත් කර නොමැති කිරි නිෂ්පාදනය රජය විසින් හඳුනාගෙන ඇත්තේ කඩිනම් සංවර්ධනයට යොමු කළ යුතු ක්ෂේත්‍රයක් හැටියටය. මෙම අංශය ගෙදරදොර කිරිගව පාලනයේ සිට මහා පරිමාණ අර්ධ - ස්වයංක්‍රිය කිරි ගොවිපළ දක්වා ද අභිජනන ගොවිපළ හා අතරමැදි ගොවිපළ ද ආහාර සැපයුම්කරුවන්, පශු වෛද්‍ය සේවා, කිරි එකතු කරන්නන්, කිරි සහ අගය එකතු කළ කිරි නිෂ්පාදකයින් හා සිල්ලර අලෙවිකරුවන් ආදී පුළුල් පරාසයක අගය දාමයක් රාශිභූත වූ ක්ෂේත්‍රයකි. අපි මේ ක්ෂේත්‍රයේ හැම ආකාරයකම උප ක්ෂේත්‍ර වලට ණය පහසුකම් සපයා ඇත්තෙමු. අපේ ණය පහසුකම් හේතු කොටගෙන සම්ප්‍රදායික නිදැල්ලේ උලාකන ගවයින්ගෙන් යුතුව පැවති කිරිගව පාලනය තිරසර ගවමඩු ආශ්‍රිත විද්‍යාත්මක ගව පාලනයක් කරා පරිවර්තනය කරන්නට හැකි විය. මෙයට සමගාමීව කෘතිම සිංචනය හරහා ගව පට්ටි තත්ත්වය ඉහළ නංවන්නට හැකිවූ අතර අධි පෝෂක තෘණ වර්ග වගා කිරීමට දිරිදීම තුළින් මනා ගව ආහාර කළමනාකරණ ප්‍රතිපත්තියක් හඳුන්වා දිය හැකි විය. ක්ෂේත්‍ර පශු වෛද්‍ය සේවා, සෞඛ්‍ය ගැටළු නිරාකරණය කළ අතර කිරි නිෂ්පාදන සකසන්නන් හා ගිවිසුම්ගත අලෙවි සබඳතා ඔස්සේ සැපයුම් ගැටළු මග හරවන ලදී.

අපේ ණය පහසුකම් තුළින් 1,500 තරම ගෘහාශ්‍රිත සත්ව පාලන ඒකක උසස් තත්ත්වයේ නැවුම් කිරි සපයන තිරසර ව්‍යවසායයන් බවට පත්ව ඇත. ණය ප්‍රදානය කරන ලද්දේ බහුවිධ ණය යෝජනා ක්‍රම යටතේ සහන පොළී අනුපාත මතය.

තිරසර පැවැත්ම

වාර්තාව

කිරිගොවීන් හා නිෂ්පාදකයින් අතර අලෙවි සබඳතා බිහි කරලීමට වසර තුළ අපේ අවධානය යොමු විය. මෙම වසරේදී ද දිවයින පුරා කිරි සැකසුම් මධ්‍යස්ථාන පිහිටුවීමේ අපේ ක්‍රියාදාමය වලෙසින්ම සිදු විය. බැංකුවේ කිරි නිෂ්පාදන ව්‍යාපෘතිය අප පරිපාලිත සමාගමක් හා අත්දැකීම් සහිත කිරි නිෂ්පාදකයකු ද හා එක්ව වන්නියේ පිහිටුවීමට නියමිත අතර එය තවමත් පෙර-සැලසුම් අදියරේ පවතී.

ප්‍රගති වාර්තාව

ණය සපයන ලද කිරිගව ඒකක සංඛ්‍යාව	2,449
සමස්ත ණය පරිමාව රු මිලියන	698
ජනිත සෘජු හා වක්‍ර රැකියා අවස්ථා	5,240

සැබෑවූ සිහිනය

රුවන්සිරි කිරි නිෂ්පාදනාගාරය - වැලිමඩ

එකල රුවන්සිරි ගොවිපල ලෙස හැඳින්වුණු මේ ව්‍යාපාරය 1970 පටන් ග්‍රාමීය මට්ටමේ කිරි එකතු කරන්නෙකු වශයෙන් කටයුතු කළේ ජාතික කිරි මණ්ඩලයේ නියෝජිතවරයෙකු වශයෙනි. පසුව එය පුද්ගලික අංශයේ කිරි ආශ්‍රිත නිෂ්පාදකයින්ට කිරි එකතු කොට සැපයීය.

සංවිධිත කිරි ගොවි සැපයුම්කරු ජාලයක් හිමිව තිබි මේ ව්‍යාපාරය 2011 වසරෙදී කිරි නිෂ්පාදනයට අත තැබුවේ ලංකා බැංකුවෙන් රු. මිලියන 90 සුළු හා මධ්‍ය පරිමාණ ණය මුදලක් ලබා ගනිමිනි. මේ වන විට ව්‍යාපාරය සීමිත සමාගමක් බවට පරිවර්තනය කර ඇත.

නවීනතම කිරි සැකසුම් යන්ත්‍රෝපකරණ සහිත මෙම නිෂ්පාදනාගාරය පිහිටා ඇත්තේ වැලිමඩ යාල්පත්වෙලය. එහි දියර කිරි නිෂ්පාදනයට අමතරව බටර්, කේජු, යෝගට් හා අයිස්ක්‍රීම් වැනි අගය එකතු කළ කිරි නිෂ්පාදන සඳහා ද පහසුකම් ඇත. 'මිල්රේන්' යන වෙළඳ නාමය යටතේ බෙදා හැරෙන මෙම නිෂ්පාදන සඳහා උෂ්ව හා මධ්‍යම පළාත්වල සැලකිය යුතු වෙළඳපළක් නිර්මාණය වී ඇත.

කිරි නිෂ්පාදනාගාරය සතුව නුවරඑළිය හා බදුල්ල දිස්ත්‍රික්කයන් තුළ විසිරී සිටින 2,000 තරම් බෙහෙවින් සමීප කිරි සැපයුම්කරුවන් ජාලයක් වෙයි. ඔවුන් අතර ගැමියන් මෙන්ම වතු කම්කරුවන් ද වෙති. මෙම කිරි ගොවීන් සියලූ දෙනාම ගම් මට්ටමේ කිරි ගොවි සමිති වශයෙන් සංවිධානය කොට ඇත්තේ 8-10 දක්වා වන සැපයුම් මාර්ග ඔස්සේ ස්ථාපිත කර ඇති කිරි එකතු කිරීමේ මධ්‍යස්ථාන හා සම්බන්ධ කරමිනි. එක් මධ්‍යස්ථානයක් ගම් 45 කට තරම සේවය ලබා දෙයි. මධ්‍යස්ථාන සඳහා කුඩා ශීතාගාර ද ලබා දී ඇත.

කිරි ගොවීන් සමඟ බෙහෙවින් ශක්තිමත් අන්තර් ක්‍රියාකාරී පරිසරයක් නිර්මාණය කොට ඇත. පෙර සැලසුම් කළ විධිමත් පශු සෞඛ්‍ය හා සඵලතා කඳවුරු ද ප්‍රශස්ත පශු විධික්‍රම පිළිබඳ තාක්ෂණික වැඩමුළු ද පවත්වන්නේ පශු වෛද්‍යවරුන් හා සත්ව පාලන සංවර්ධන සහායකයින්ගේ සම්පත් දායකත්වය සමඟිනි.

තමන්ට ලැබෙන කිරි එකතුවේ ගුණාත්මක භාවය ගැන ව්‍යාපෘතිය සැලකිලිමත් වේ. ලබා ගන්නා කිරිවල බැක්ටීරියා ගණනය මත ගුණාත්මක කිරි වෙනුවෙන් ඉහල මිලක් පිරි නැමේ.

ව්‍යාපෘතිය 30 ක් තරම් සේවක පිරිසකට අර්ථවත් රැකියා අවස්ථා ලබා දී ඇත්තේ කිරි ගොවි ප්‍රජාව අතර ප්‍රශස්ත ආදායම් උත්පාදන ජාලයක් ද නිර්මාණය කරමිනි.

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් (සුමව)

අපි දිවයිනේ සුමව ප්‍රවර්ධනයේ බෙහෙවින් ආශක්ත පංගුකරුවෙකු වූයෙමු. ඒ 1970 දශකයේ සුමව ව්‍යාපෘති ණය කලල අවස්ථාවේ තිබී අවධියේ පටන්ය. ආසියානු සංවර්ධන බැංකුව විසින් අරමුදල් සැපයූ ණය යෝජනා තුළ පුරෝගාමී මෙහෙවරක් ඉටු කළ අප පසුව ණය වැඩසටහන් හතරක් ඔස්සේ මෙහෙයවුණු සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්ත ණය වැඩසටහන තුළ ද ලෝක බැංකුව මුදල් සැපයූ SMAP හා SMILE ණය යෝජනා ක්‍රම තුළ ද ක්‍රියාකාරීව දායකත්වයක් දැරුවෙමු. සුළු හා මධ්‍ය පරිමාණ ක්ෂේත්‍රයේ බෙහෙවින් ක්‍රියාකාරීව සහභාගි වන ණය දෙන ආයතනයක් වූ අපි දිවයින හාත්පස දහස් ගණනක් ව්‍යාපෘති සඳහා මූල්‍ය පහසුකම් සලසා ඇත. මේ සමහරක් ව්‍යවසායයන් ප්‍රචලිත වෙළඳ සන්නාම බවට පත්ව ඇත.

මෙම ක්ෂේත්‍රය රටේ ආර්ථික සංවර්ධනයෙහිලා කේන්ද්‍රගත භූමිකාවක් ඉටු කරයි. ඒ එකතු කල අගය හා අපනයන ආදායම මතම නොවේ. සෘජු හා වක්‍ර රැකියා උත්පාදනය හා නිර්මාණය කළ ඉදිරි හා පසුපෙල වෙළඳපල සම්බන්ධතා ද නිසාය.

අපි වසර තුළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් 635 කට ණය පහසුකම් පිරිනැමුවේ මේ ක්ෂේත්‍රයට මෙතෙක් පිරිනමා ඇති ණය පරිමාව සුවිසල් රු බිලියන 6.1 ක් බවට පත් කරමිනි. මේ ණය පිරිනැමීම අතර බහුතරය යොමුවූයේ ආහාර සැකසුම් (24%) හෝටල් හා ආපනශාලා (16%) සේවා සැපයීම් (15%) සෞඛ්‍ය සේවා (6%) හා ගොඩනැගිලි ද්‍රව්‍ය නිෂ්පාදනය (5%) වෙනුවෙනි.

සුමව අංශය සඳහා අත හිත, ණය පිරිනැමීමෙන් නතර නොවේ. අපි ඉන් ඔබ්බට යමින් ණය - සංකල්පය මත මේ ගනුදෙනුකාර කණ්ඩායමේ හැකියා හා ධාරිතා වර්ධනය වෙනුවෙන් කැපවූයෙමු. මෙයට සමගාමීව සුමව අංශයේ ණය සබඳතා නිලධාරීන්ගේ නිපුණතා වර්ධනය කෙරෙහි ද අවධානය යොමු කළෙමු.

ව්‍යවසායක හැකියා සංවර්ධනය

වැඩසටහනේ අන්තර්ගතය	වැඩ සටහන් සංඛ්‍යාව	සහභාගිත්වය
එක්දින ව්‍යවසාය සංවර්ධන වැඩසටහන	8	959

ණය සබඳතා නිලධාරී නිපුණතා සංවර්ධනය

වැඩසටහනේ අන්තර්ගතය	වැඩසටහන් සංඛ්‍යාව	සහභාගිත්වය
පාරිසරික හා සමාජ රැකවරණය පිළිබඳ එක් දින වැඩමුළුව	6	497
විශේෂිත තාක්ෂණික ආධාර පිළිබඳ දෙදින වැඩමුළුව	6	618
සුමව ණය දීමේ ක්‍රියාවලිය පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුව	1	40

අප හා එක්ව සිටින සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන්ගේ දරා ගැනීමේ ශක්තිය කැපී පෙනෙන සුළුය. අප, අභියෝග සමග මුහුණ ලා අවසන ජයගත් අපේ ව්‍යවසායක ණයලාභීන් සිවි දෙනෙකුගේ ව්‍යාපාරික ජීවන වෘත්තාන්ත මේ සමඟ සටහන් කරන්නේ එය ඉස්මතු කරන්නටය. ඔවුහු මුළු මහත් සුමව අංශයම නියෝජනය කරති. තමන් අන් ගණුදෙනුකාර බණ්ඩවලින් වෙනස් පිරිසක් බව පෙන්වන මේ ක්ෂේත්‍රයේ දක්නට ඇති ප්‍රධානතම ගාමක බලවේගය සැබෑ අධිෂ්ඨානය විදහා පාති.

මනික් සහල් මෝල - උප්පුවේලි - ත්‍රිකුණාමලය

ත්‍රිකුණාමලයේ සහල් මෝලක් ස්ථාපිත කිරීමේ අදහසින් එම්. කෝනේශ්වරන් මහතා 2010 දී අප කරා පැමිණි විට අප මේ අදහස දෙස බැලුවේ සැකමුසු සිතිනි. ත්‍රිකුණාමලයේ සහල් මෝලක්? ඔහු අමුද්‍රව්‍ය ලබා ගන්නට අදහස් කරන්නේ කොයිබින්ද? නාගරික පරිසරයක බෙහෙවින් දැඩි පාරිසරික මඟ පෙන්වීම්වලට අනුගත වන්නේ කොහොමද? අනෙක් අතට මේ වන විට යුද්ධය හමාර වූවා පමණකි. නැගෙනහිර පළාතට ආයෝජන අත්‍යවශ්‍යම සමය එය විය.

එහෙත් ඔහු අපට සියල්ල ඒත්තු ගන්වන්නට සමත් විය. ඔහුට අළුත් හාල් මෝල් ගොඩනැගිල්ලකට මුදල් අවශ්‍ය නොවීය. ඔහු කලක් තමා ඇඟලුම් කම්හලක් පවත්වා ගෙන ගිය ගොඩනැගිල්ලක් සහල් මෝලකට සුදුසු ආකාරයට පිළිසකර කළේ වී පොඟ වන ටැංකි ද ඒ තුළ ගොඩනගමිනි. වාෂ්ප බොයිලේරු, ගල් වැලි ඉවත් කරන යන්ත්‍ර, සහල් ශුද්ධ කොට ඔප දමන යන්ත්‍ර හා එලිවේටර්වලින් සමන්විත ස්වයංක්‍රීය සහල් මෝල 2010 අවසාන භාගයේදී වාණිජ නිෂ්පාදන කටයුතු ඇරඹීය. ඇත්ත. මුලදී යම් යම් තිගැස්මක් විය. මුල් වසර තුල පාඩුවක් ලැබුවේ මූලික වශයෙන් වී මිල ගණන්වල තිබී උච්චාවචනයන් නිසාය. එහෙත් ඔහු ඉන් පසු නොබා, හිඟ මුදල් පියවන්නට තමන් සතු වෙනත් දේපලක් විකුණා දැමීය. ව්‍යාපාරය සිතූ පරිදෙන්ම අළු ගසා දමා නැගිට ගත්තේය.

නගර සීමාවෙන් මදක් ඔබ්බෙන් පුල්මුඩේ පාරේ අක්කර 5 ක තරම ඉඩමක ස්ථාන ගත කර ඇති ව්‍යාපෘතියේ දෛනික වැටුප් ලබන හා කොන්ත්‍රාත් පදනම මත සේවය කරන සේවකයෝ 40 කි.

මේ සඳහා වී මිලදී ගන්නේ පදවිය, මොරවැව, මුත්තූර්, කින්නියා, කන්තලේ ආදී පෙදෙස්වලිනි. දැනට දිනකට කිලෝග්‍රෑම් 15,000 ක් වන සහල් නිෂ්පාදනය ත්‍රිකුණාමලය නගරය තුළ හා අවිස්සාවේල්ල, නිට්ටඹුව, යාපනය, වවුනියා හා කිලිනොච්චි විවිධ සේවා සමූපකාර සමිතීන් වෙත අලෙවි කෙරේ.

ව්‍යාපෘතිය රුපියල් මිලියන දහයක ව්‍යාපෘති ණය මුදලකින් හා හැම කන්නයකදීම පිරිනැමෙන රු. මිලියන 32 ක් දක්වා වන කාලීන කාරක ප්‍රාග්ධන පහසුකමින් ද මූල්‍යකරණය විය.





'ඔඒසීස්' මත්ස්‍ය ගොවිපළ - බදනාගල, දෙහිඅත්තකණ්ඩිය

කලාතුරකින් හමුවන අන්දමේ දුලබ ඉදිරි දැක්මකින් යුතු ව්‍යවසායයෙකු වන ඩී.එම්. විමලසිරි මහතා අනෙක් අය අත නොගසන ව්‍යවසායකට අත ගසා ඇත. මිරිදිය මත්ස්‍ය කර්මාන්තයේ අත්දැකීම් සපුරා තිබී ඔහු තමන් මහවැලි අධිකාරියෙන් බද්දට ලබා ගත් උස්බිමක විසිතුරු මත්ස්‍ය වගාවක් ඇරඹීය. පටන්ගත් ව්‍යාපෘතියේ සාර්ථකත්වය මත ඒ ආසන්නයෙන් තවත් ඉඩමක් බද්දට ගෙන දෙවන මත්ස්‍ය ගොවිපල ද පටන් ගත්තේය.

මේ ගමනේ අතරමග දී විමලසිරිට තමන් අපේක්ෂා නොකළ ගැටළුවකට මුහුණපාන්නට සිදු විය. ඒ ගොවිපළට ජලය සැපයූ ඇල මාර්ගය බලධාරීන් විසින් වසා දැමූ බැවිනි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ගොවිපල තුළ සිටි සමස්ත මත්ස්‍ය ගහනය මියැදී ගියේය. එහෙත් වෙනත් යමෙකු කරන්නාක් සේ ඔහු මේ ව්‍යාපෘතිය අත්හැර දැමුවේ නැත. බැංකුවේ ද උදව් පදව් මත ව්‍යාපෘතිය දිගටම කරගෙන ගියේය.

අද වන විට ඔඒසීස් මත්ස්‍ය ගොවිපලෙහි මඩ හා සිමෙන්ති පොකුණු විශාල සංඛ්‍යාවකි. මේ පොකුණු මසුන් බෝ කිරීමට මෙන්ම දැඩි කිරීමට ද භාවිත කෙරේ. ගොවිපලේ සමස්ත මත්ස්‍ය ගහනය එක් වයස් මට්ටම්වල සිටින ඇඟිල්ලන් හා මසුන් මිලියන 29 ක් තරමය.

ගොවිපල තමන් හා සම්බන්ධ කුඩා මත්ස්‍ය වගාකරුවන් 400 ක් තරම පිරිසකට ද සෙවණ සලසයි. රට පුරා විසිරී ස්ථිර ගණුදෙනුකරුවෝ 160 කි. ඒ අතර මහා පරිමාණ විසිතුරු මත්ස්‍ය අපනයනකරුවන් 10 ක් ද වේ. ව්‍යාපෘතිය මත්ස්‍ය ගොවිපලට අමතරව පරිශ්‍රයේම පිහිටි අලෙවිහලක්, මත්ස්‍ය ආහාර නිෂ්පාදනාගාරයක්, විසිතුරු මත්ස්‍ය ව්‍යාපාරයට අවශ්‍ය උපාංග ගබඩාවක් හා කිරිබත්ගොඩ නගරයේ පිහිටි නාගරික අලෙවි සැලකින් ද සමන්විතය.

36 දෙනෙකුට සෘජු රැකියා අවස්ථා සපයන මෙම ව්‍යාපෘතිය රටපුරා මත්ස්‍යාගාර හා අලෙවිහල්වල දහස් සංඛ්‍යාත පිරිසකට වක්‍ර ආදායම් මාර්ග ද නිර්මාණය කර ඇත.

මෙහිදී මුලින් මිරිදිය සම්පත් ණය යෝජනා ක්‍රමය ඔස්සේ ද පසුව සුමව ණය වැඩසටහන යටතේ ද ලබාදුන් රු මිලියන 16 ක ණය පහසුකම් සැපයුනු අතර ව්‍යාපෘතිය මේ සාර්ථක මට්ටම කරා ගෙන ඒමට ඒ කදිම පිටුවහලක් විය.

කිවයුතු කරුණක් ඇත. විමලසිරි මහතා මේ වසරේ උතුරු මැද පළාතේ මධ්‍යම පරිමාණයේ හොඳම ව්‍යවසායකයා ලෙස පිදුම් ලැබීය.

නල්ලූර්හි ජීනික්ස් කුරුල්ලා

මද කලකට පෙර පී. කුමනදීපන් යාපනයේ සිටි දක්ෂ ජායාරූප ශිල්පියෙකු විය. මේ ඔහු සිය පියා වෙතින් ලත් ආභාෂයකි. පසු කලෙක ඔහු වන්නිය බලා ගිය අතර එහිදී මේ ව්‍යවසාය දියුණුවෙන් දියුණුවට පත්වූයේ ශබ්ද වාහිනී යන්ත්‍ර හා සංගීත උපකරණ කරා ද ව්‍යාප්ත වෙමිනි.

ඉන්පසු ලෝකය සුනු විසුණු විය. රුපියල් මිලියන 7 කට වඩා වටිනා උපකරණ හා වත්කම් සහිත ඔහුගේ සමස්ත ව්‍යාපාරයම යුද්ධය අතරතුරේ සම්පූර්ණයෙන් විනාශ විය. කුමනදීපන් සරණාගතයෙකු බවට පත්ව චෙඩ්ඩිකුලමේ ආනන්ද කුමාරස්වාමි කඳවුරේ හයමසක් පමණ ගත කළේය. කඳවුරෙන් නිදහස් කරනු ලැබ එහි එළිපත්ත මත හුන් ඔහුගේ දෑතේ මලු දෙකක් හැර අන් කිසි වස්තුවක් නොවීය. එක් මල්ලක සිය කිලිටි ඇඳුම් කැඩුම් ද අනෙකෙහි මානවවාදී ඒජන්සියක් පිරිනැමූ වියළි සලාකය ද වශයෙනි. මේ වත්කම් ද රැගෙන පෙරළා යාපනයට ආ ඔහු සිය ජීවිතය යළි පටන් ගන්නට වෑයම් කළේ, තමන් පෙරදා ලක්ෂ ගණනින් ගනුදෙනු කළ බැංකුව කරා පිය නැගුවේය. කුකුළන් ඇති කරන්නට කුඩා ණය මුදලක් ලබා දිය හැකි යැයි ඔහුට පවසන ලදී.

එහෙත් කුමනදීපන් සිය වෑයම අත්හළේ නැත. ලංකා බැංකුව අවතැන්වූවන්ට සහනාධාර සපයන බව කණින් කොනින් අසා ගත් ඔහුට දෛවය කීයේ අච්චුවේලිහි ලංකා බැංකුවට පිය නගන සේය. බැංකුව ඔහුගේ හදිසි අවශ්‍යතාවය මත රු. 200,000 ක් ද පසුව තවත් රු. 700,000ක් ද ණය පහසුකම් සැපයීය. ඔහු මේ මුදල් යොදවා අධි තාක්ෂණික කැමරාවක් හා වෙනත් උපාංග මිල දී ගත්තේය. නල්ලූර්හි සිය ජායාරූප ශාලාව යළි ඇරඹීය. බැංකුව හදිසි මුදල් අවශ්‍යතා පිරිමසිනු පිණිස ජංගම ගිණුම වල්ලේ අයිරා පහසුකම් ද සැලසීය.

අද වන විට කුමනදීපන්ගේ පියා සමරනු වස් 'සේගාර් සවුන්ඩ්ස්' යැයි නම් කළ ශබ්දවාහිනී ව්‍යාපාරය ද මියගිය සොහොයුරා සිහිපත් කරවන 'පාර්තිපන් ස්ටුඩියෝ' වද යාපනයේ ප්‍රකට ව්‍යාපාරික ස්ථාන වේ. තනි තනි පුද්ගලයන් මෙන්ම විවිධ සංවිධාන හා ආයතන ද ඔහුගේ ගනුදෙනුකරුවන් අතර සිටිති. ඒ අතර ඉන්දියාවේ කොන්සල් කාර්යාලය ද වේ.

මේ අළු මතින් යළි පිබිදීමේ කතාව නොවේද ?

බුද්ධි ට්‍රැඩිෂනල් කී - සම්ප්‍රදායික මුත් නිර්මාණශීලී ව්‍යවසායයක්

'බුද්ධි ට්‍රැඩිෂනල් කී' යන යෙදුම ව්‍යාපාරයක නමක් වශයෙන් අමුත්තක් ඇතැයි කෙනෙකුට හිතෙන්නට පුළුවන. එහෙත් ව්‍යාපාරයේ ද අමුත්තක් ඇත. අපගේ අම්බලංගොඩ ශාඛාව හා ගනුදෙනු කරන මේ ව්‍යවසාය පැරණි විහාර බිතු සිතුවම්, පෞරණික ගෘහ භාණ්ඩ ඇසුරෙන් චිත්‍ර හා වෙනත් කලා නිර්මාණ බිහි කරයි. මේ විදේශ විනිමය උපයන්නෙකුට අමතරව ඉපැරණි කලා සම්ප්‍රදායන් ආරක්ෂා කරන්නෙකි. මේ පවුල් ව්‍යාපාරය මේ වන විට මෙහෙය වන්නේ තරුණයෙක්. ඔහු නමින් අරුණ නිශාන්ත මලලගමය. ව්‍යාපාරික ස්ථානය පිහිටා ඇත්තේ දකුණු වෙරළබඩ තෙල්වත්තේය.

මේ සුවිශේෂ ව්‍යවසායයකි. ඔවිහු පැරණි විහාරස්ථාන, වලව් හා සිත්තම් හා මූර්ති ඇති වෙනත් තැන්වලට ගොස් ඒ පිටපත් කරති. ඉන්පසු මේ පිටපත් කළ කලා නිර්මාණ පැරණි ගෘහභාණ්ඩ, බිත්ති සැරසිලි හෝ ඉපැරණි දැව කොට මත ප්‍රති නිර්මාණය කරති. මේ කාර්ය කෙරෙන්නේ මේ සඳහා කැපවූ පලපුරුදු සිත්තරුන් පිරිසක් විසිනි.

මේ කතා පුවතේ ඇති සංවේදීම කරුණ නම් මේ ව්‍යාපාරය, වත්කම් සියල්ල, මිල කළ නොහැකි කලා නිර්මාණ, එකී දෛවෝපගත දිනයේ එනම් 2004 දෙසැම්බර් 26 දා, සුනාමිය ලංකාව ආක්‍රමණය කළ දා, සම්පූර්ණයෙන් විනාශ වූ බවය.

එහෙත්, ව්‍යාපාරය කල් නොයවාම පෙර තිබූ තත්වයටම ගෙන එන්නට ව්‍යවසායකයනට හැකි විය. ඒ සඳහා අප සහනදායක කොන්දේසි මත සැපයූ ණය මුදල ද බෙහෙවින් ඉවහල් විය. කලාවට ලැදි විදේශීය සංචාරකයන්ගේ සුපුරුදු තිප්පොළීක් වන මෙය සිය සම්ප්‍රදායික ව්‍යවසාය දිගටම පවත්වා ගෙන යන්නේ රටට අවශ්‍ය යුරෝ හා ඩොලර් උපයමිනි.



ආහාර සුරක්ෂිතතාවය සුරැකිමින් අලෙවි සබඳතා බිහි කළ බවයි.

ව්‍යාප්ත වන බෝග අස්වැන්න (වී, ඉරිඟු, ළුණු හා චිලවළු) අස්වනු නෙලන සමයේ අතිරික්තයක් විඳහා පාමින් අලෙවි ගැටළු මතු කරයි. අනෙක් අතට අවාරයේදී දැඩි මිල උච්චාවචනයක් දැක ගත හැකිය.

අස්වැන්නේ ඇති ඉහළ පරිමාව නිසාම වී හා වෙනත් බෝග මිලදී ගන්නන්ට ණය පහසුකම් සැලසීම අත්‍යවශ්‍ය කටයුත්තක් බවට පත්ව ඇත. නො එසේ නම් නිෂ්පාදක ගොවීන්ට මෙන්ම සැකසුම්කරු මිලදී ගන්නන්ට ද ගැටළු රැසකට මුහුණ පාන්නට සිදු වන්නේ ශක්‍ය අලෙවි ක්‍රියා දාමයක් නොමැති වීම නිසාය.

ලංකා බැංකුව මූලික වශයෙන් වී හා බඩ ඉරිඟු උදෙසා අලෙවි සබඳතා ණය පහසුකම් සැලසීමේ පුරෝගාමිකයෙකු විය. මේ වසරෙදී මේ අන්දමින් සහල් මෝල් හිමියන් හා බඩ ඉරිඟු සැකසුම්කරුවන්ට සැපයූ ණය රු. බිලියන හයකට ආසන්න විය.

කන්නය	පහසුකම් සංඛ්‍යාව	සමස්ත ණය මුදා හැරීම (රු. මිලියන)
2012 **යල**	34	2,291
2012 **මහ**	44	3,046

මේ පරිමාවෙන් කොටසක් නිෂ්පාදකයන් හා මිලදී ගන්නන් අතර ඉදිරි වෙළඳ ගිවිසුම් මත සපයනු ලැබීය. මේ ක්‍රියාදාමය නිෂ්පාදකයන්ට ප්‍රශස්ත මිලක් හා මිලදී ගන්නන්ට බාධා රහිත සැපයුම් මාර්ගයක් ද උදා කර දේ.

2012 වසර තුළ ආරම්භ කරන ලද සංවර්ධන ණය වැඩසටහන්

වැඩසටහනේ වපසරිය, අරමුණු හා ඉලක්ක ණයකරු කණ්ඩායම	ඉලක්කගත මුදාහැරීම් රු මිලියන	2012 මුදාහැරීම රු මිලියන
පිබිදෙන උතුර ණය වැඩසටහන - වඩකින් වසන්තම් උතුරු පළාතේ ස්ථිර පදිංචිකරුවන්ට විවෘත මෙම වැඩසටහන යටතේ ප්‍රජාව තුළ පශ්චාත් - යුද්ධ ජීවනෝපාය සංවර්ධනය අරමුණු කර ගත්තකි. මෙහිදී හයමසක සහන කාලයක් හා පස් අවුරුදු ආපසු ගෙවීමේ කාල සීමාවක් හා සහනදායී පොළී අනුපාත මත උපරිම රු. 200,000 දකවා ණය පිරිනැමේ. මෙහිදී ශ්‍රී ලංකා මහ බැංකුව 90% දක්වා ප්‍රතිමූල්‍ය සපයයි.	120	160
නැගෙනහිර නවෝදය - දෙවන අදියර - කලකින් උදයම් බොහෝ අංශවලින් පිබිදෙන උතුර හා සමාන නැගෙනහිර නවෝදය නැගෙනහිර පළාත අරමුණු කරයි. මෙහිදී නැගෙනහිර පළාතේ පදිංචිකරුවන්ගේ ආර්ථික කටයුතු සඳහා රු. 250,000 උපරිමයකට යටත්ව ණය ලබා ගැනීමට සුදුසුකම් ලබති. පොළී අනුපාත, ආපසු ගෙවීමේ කාලය පිබිදෙන උතුර හා සමගාමීය.	1,000	942
දිවිනැගුම යටතේ විශේෂිත ධීවර ණය යෝජනා ක්‍රමය මෙම වැඩසටහන අරමුණු කරන්නේ ආර්ථික වශයෙන් පසුබා සිටින ධීවර ජනතාවය. මෙහිදී ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය විසින් හඳුනා නිර්දේශ කරන අයදුම්කරුවන්ට රු. 10,000 උපරිමයක් දක්වා ණය පිරිනැමෙනුයේ ගොඩබිම ආශ්‍රිත ධීවර කටයුතු (කරවල, උම්බලකඩ හා ජාඩි බඳු) සඳහාය. පොළී රහිත ණය මුදලක් වන මෙහි එක්වරක් පමණක් අය කරන 4% සේවා ගාස්තුවක් අය කෙරේ.	100	ආරම්භක අවස්ථාවේ පවතී
මිරිදිය සම්පත් ණය වැඩසටහන ජාතික සංවර්ධන බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන ප්‍රතිමූල්‍ය ණය වැඩ සටහනක් වන මෙහිදී මිරිදිය ධීවර කටයුතු, ජලජීවී වගාව, ඉස්සන් වගාව, විසිතුරු මත්ස්‍ය වගාව, පටක රෝපණය ද ඇතුළුව ජලජ ශාඛ වගාව කෙරේ අවධානය යොමු කෙරේ. රු. මිලියන 10 ක උපරිම ණය මුදලක් ලබා දෙනුයේ ව්‍යාපෘති පිරිවැයෙන් 25% ක දායකත්වයක් මතය. තේරීමක් සහිත මාස 12 ක සහන කාලයක් ඇතුළුව ආපසු ගෙවීමේ කාල සීමාව වසර පහකි.	25	ආරම්භක අවස්ථාවේ පවතී

2012 වසර තුළ ආරම්භ කරන ලද සංවර්ධන ණය වැඩසටහන්

වැඩසටහනේ වපසරිය, අරමුණු හා ඉලක්ක ණයකරු කණ්ඩායම	ඉලක්කගත මුදාහැරීම් රු මිලියන	2012 මුදාහැරීම රු මිලියන
සුළු රබර් වගාකරුවන් සඳහා තුරුසවිය වැඩසටහන තුරුසවිය බලාපොරොත්තු වන්නේ සුළු රබර් වගාකරුවන්ට අතහිතදීමය. ණය පහසුකම්, නව වගාවන්ට, නැවත වගාවන්ට, අන්තර් බෝග වගාවට හා දුම් ගෙවල් සඳහා පිරිනැමේ. ණය අයදුම්කරුවන් සුළු රබර් වගාකරුවන්ගේ සංවිධානයක් වන තුරුසවිය අරමුදලට සම්බන්ධ විය යුතු අතර අවම වශයෙන් අක්කර 1/4 ක රබර් වගාවක හිමිකරු විය යුතුය. කොළඹ ද ඇතුළුව රබර් වගා කරන දිස්ත්‍රික්ක දහයක ක්‍රියාත්මක වන මෙහි උපරිම ණය මුදල රු. 300,000 වන අතර ආපසු ගෙවීමේ කාල සීමාව වසර තුනකි. මෙහිදී හයමසක සහන කාලයක් ද පිරිනැමේ.	100	ආරම්භක අවස්ථාවේ පවතී
රන්මසු ණය වැඩසටහන මෙම වැඩසටහන ඔස්සේ සුළු අපනයන බෝග ක්ෂේත්‍රය වර්ධනය කරන්නට අපේක්ෂා කෙරේ. (කුළුබඩු, කෝපි, කොකෝවා, බුලත්, පුවක්, පැඟිරිමානා, සේර, කජු, උක්) අරමුදල් සැපයෙන්නේ නව වගාවන්, සැකසුම් සංවර්ධනය ව්‍යවසාය හැකියා වර්ධනය හා තවාන් සංවර්ධනයටය. මෙහිදී කාන්තා ව්‍යවසායිකාවන් කෙරේ වැඩි අවධානයක් යොමු කෙරේ. මේ හරහා අගය එකතු කිරීම් ඔස්සේ මේ ක්ෂේත්‍රයේ තත්ත්ව වර්ධනයක් ද එතුළින් ගෝලීය අපනයන අවස්ථා පුළුල් කිරීමට ද අපේක්ෂිතය.	500	4
රෙපියා වැඩ සටහන මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබන්නේ පුද්ගලයන් දේපළ හා කර්මාන්ත පුනරුත්ථාපනය කිරීමේ අධිකාරිය හා සම්බන්ධවය. ඉලක්ක ගත කණ්ඩායම වනුයේ සමාජ ගත කරන ලද හිටපු චිල්ට්ටිරි සාමාජිකයන්ය. මෙහිදී අරමුණ වන්නේ ඔවුන් සඳහා ජීවනෝපාය සංවර්ධනය බිහිකරලීමය.	125	83

ආර්ථික මාවත් සොයා යාම

සමාජ/ආර්ථික කණ්ඩායම	අරමුණු කළ පැතිකඩ/පිරිමැසූ අවශ්‍යතා
සුළු ගොවීන්	වගා පිරිවැය සැකසුම්කරුවන් හා සබඳතා පසු අස්වනු මිල ස්ථායීකරණය
ධීවර ප්‍රජාව	නව මංපෙත් කරා විහිදීම ගොඩබිම් පදනම් ධීවර කටයුතු යාත්‍රා සංවර්ධනය උපකරණ හා නාවික අංගෝපාංග
සුළු රබර් හිමියන්	නැවත වගා කිරීම/ නව වගා සඳහා සහන ණය දුම්ගෙවල් සඳහා ආධාර අන්තර් බෝග වගාව
අඩු ආදායම් සහිත ප්‍රජාව - දුගීන්	ස්වෝපකාර කණ්ඩායම් ලෙස සංවිධානය හැකියා සංවර්ධනය ඉතිරි කිරීමේ හැකියාව ආර්ථික කටයුතු ආරම්භ කිරීම ඊළඟ සමාජ ආර්ථික තලය කරා නික්මීම
සුළු අපනයන බෝග නිපදවන්නන්	අගය වැකතු කිරීමේ මංපෙත් සැකසුම් සංවර්ධනය ව්‍යවසායක සංවර්ධනය පැල තවාන් සංවර්ධනය
සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්	ලිහිල් කාල සීමා පොළී අනුපාත මත ණය පහසුකම් ව්‍යවසායක සංවර්ධනය තිරසාර කම්කරු පිළිවෙත් හරිත සංකල්පය
කාන්තා ව්‍යවසායකයින්	ස්වයං රැකියා අවස්ථා අඩු පොළී ණය අලෙවි සබඳතා
ගෘහාශ්‍රිත කිරි ගොවීන්	පරිසර මිතුරු ගව පාලන පිළිවෙත් විද්‍යාත්මක ගව පාලනය පට්ටි සංවර්ධනය තෘණභූමි සංවර්ධනය හා සැකසුම් වර්ධනය සඳහා ණය පහසුකම් සත්ව පාලන හැකියා වර්ධනය අලෙවි සබඳතා
වෘත්තිකයන්	ජීවන චක්‍ර අවශ්‍යතා
නිවෙස් තනන්නන්	අපහසුවක් නැතිව ආපසු ගෙවිය හැකි ණය
විගමනික ශ්‍රමිකයන්	ආයෝජන උපදෙස් කඩිනම් මුදල් හුවමාරුව සංක්‍රමණ වීමට පෙර ලිහිල් කොන්දේසි මත ණය ජීවන චක්‍ර අවශ්‍යතා සඳහා ණය
අභ්‍යන්තර අවතැන්වූවන්	ජීවනෝපාය සංවර්ධනය නිවෙස් ප්‍රතිසංස්කරණය

සංවර්ධන ණය විෂයෙහි ලා අපේ සම්මාදම

ශ්‍රී ලංකා මහ බැංකුව සංවර්ධන ණය ක්ෂේත්‍රයේ අපේ පිය සටහන් හඳුනාගෙන ඇත. අප පහත දැක්වෙන ණය වැඩසටහන් තුළ ප්‍රබලතම ණය සපයන්නා වන්නෙමු.

- නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (කෙටි කාලීන වගා ණය) මුළු ණය පරිමාවෙන් 38%
- පිබිදෙන උතුර ණය වැඩසටහන - 33%
- දිලිඳු බව දුරුලීමේ ක්ෂුද්‍ර ණය යෝජනා ක්‍රමය - 41.3%

අපේ කණ්ඩායම සමඟ සාමූහිකව වර්ධනය වෙමින්

අප සතු වටිනාම වත්කම අපේ කණ්ඩායම යැයි පවසන විට අප ඉන් අදහස් කරන්නේ හුදෙක් මූල්‍ය ශක්තිය ගැනම නොවේ. එහි ඊට වඩා යටි අරුතක් ඇත. අපේ තිරසර පැවැත්ම සැලසුමේ ගාමක බලවේගය ඔවුන්ය. ඔවුන් කැපවීම හා ඉලක්කය අතින් උත්කර්ෂවත්ය. ඔවුන් හැම මොහොතකදීම සිය සාඵල්‍යතා මට්ටම ඉක්මවනු ඇතැයි අපේ පැතුමයි. මේ සියල්ල ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය පිළිබඳ පමණක් නොවේ. ඉන් ඔබ්බට විහිදෙයි. ඒ, කාරුණික බව, අවංකත්වය, උදව් අවැසි අයට උදව් වීමේ නියෝග, කරුණා ගුණය මෙන්ම සමාජය, ප්‍රජාව, ගනුදෙනුකරුවන් හා පරිසරය සමඟ ආත්මීය සබඳතාවයක් පවත්වා ගැනීම වටා විහිදෙයි.

මේ වන විට 7,790 ක් වන ලංකා බැංකු කණ්ඩායම, ස්ත්‍රී පුරුෂ භාවය අතින් බොහෝ සේ සමව මුත් කාන්තාවන් කෙරේ මඳක් නැඹුරුව ඇත. මේ කණ්ඩායමේ අඩකටත් වඩා වයස අවුරුදු 35 ට අඩුය. මේ හඟවන්නේ ගත වන හැම වසරක් පාසා අපේ කණ්ඩායම කෙමෙන් තරුණ වන බවකි. ඒ සුබ පෙර නිමිත්තකි.

සම අවස්ථා

ලංකා බැංකුව සම අවස්ථා සලසන සේවා යෝජකයෙකි. අපි ස්ත්‍රී-පුරුෂ භේදය මත පදනම් වැටුප් හා වේතන පිළිවෙතින් බැහැරව ඉන්නෙමු.

නව සේවය බඳවා ගැනීම්

නව සේවය බඳවා ගැනීම් තල හතරක දී සිදු කෙරේ.

- උපකාරක සේවකයින් - බහු කාර්ය සහායක
- මාණ්ඩලික සහකාර හා ලේකම් සහකාර - මේ ඉදිරිපෙල කණ්ඩායමේ ප්‍රවේශ කඩුල්ලය
- කළමනාකරණ අභ්‍යාසලාභී - අනාගත නායකත්වය සඳහා ප්‍රවේශය
- විශේෂිත තනතුරු (වෘත්තීය) - මේ තනතුරු බිහි කෙරෙන්නේ බැංකුවේ ආයතනික අරමුණු හා ව්‍යාපාරික සැලැස්මට අනුරූපවය.

මාණ්ඩලික සහකාර හා කළමනාකරණ අභ්‍යාසලාභී තනතුරු සඳහා නව බඳවා ගැනීම් විස්තීර්ණ, පාරදෘශ්‍ය තේරීම් පටිපාටියකට අනුව සිදු කෙරේ. මෙහිදී ජාතික විභාග දෙපාර්තමේන්තුව විසින් ස්වාධීනව පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයක් හා සම්මුඛ පරීක්ෂණයක් අදාල වේ.

වාර්තාව

2012 නව බඳවා ගැනීම් හා සේවය හැර යාම්

සේවක වර්ගීකරණය	නව බඳවා ගැනීම් පුරුෂ	නව බඳවා ගැනීම් ස්ත්‍රී	වසර තුල ඉවත් වීම් පුරුෂ	වසර තුල ඉවත් වීම් ස්ත්‍රී
තාක්ෂණික සේවක පිරිස	11	-	-	-
කළමනාකරණ අභ්‍යාසලාභී	12	18	-	-
යතුරු ලේඛක	-	2	-	-
ලේකම් සහායිකා	-	1	-	-
උපකාරක සේවා	252	-	2	-
එකතුව	275	21	2	-

මුළු සේවකයන් ස්ත්‍රී පුරුෂභාවය මත



ස්ත්‍රී/පුරුෂ අනුපාතය - 93:07
නව බඳවා ගැනීම්/ඉවත්වීම් ප්‍රතිශතය - 0.67%

නව බඳවා ගැනීම් අතර බහුතරය, පිරිමි අයදුම්කරුවන් පමණක් ඉදිරිපත් වූ රියැදුරු/පණිවිඩකරු ශ්‍රේණින්ගෙන් සමන්විත විය.

අපගේ ප්‍රසාරණය වන පිවිසුම් ව්‍යාප්තිය හා තරඟකාරී ව්‍යාපාරික සැලැස්ම, ශක්තිමත් ඉදිරිපෙළ කණ්ඩායමක් අපේක්ෂා කරයි. මේ පසුබිම මත 1,400 තරම් මාණ්ඩලික සහකාර පුහුණුවන්නන් බඳවා ගැනීම සඳහා මේ වසර තුළ මූලික පියවර ගන්නා ලදී. දිවයින පුරා අයදුම්පත් යොමු කළ විශාල පිරිසක් අතින් 53,949 ක් තරඟකාරී ලිඛිත විභාගය සඳහා පෙනී සිටි අතර ඒ තුළින් සාර්ථක වූ අයදුම්කරුවන් වසරේ අවසාන කාලය තුල සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන ලදී.

කණ්ඩායම් හරස්කඩ

	2012		2011	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
රැකියා ස්වභාවය හා ස්ත්‍රී පුරුෂ භාවය අනුව				
ස්ථිර	3,866	3,924	3,963	4,152
කොන්ත්‍රාත් පදනම මත	68	3	70	2
බාහිරව ලබාගත්	1083	24	1,076	22
එකතුව	5,017	3,951	5,109	4,176
සේවක වර්ගීකරණය මත				
ආයතනික කළමණාකාරීත්වය	8	3	14	4
විධායක කළමණාකාරීත්වය	42	7	34	11
ප්‍රධාන කළමණාකරු	71	26	73	26
ජ්‍යෙෂ්ඨ කළමණාකරු	118	49	118	50
මැදිපෙළ කළමණාකරණය	1572	1557	1,521	1,369
ඉදිරිපෙළ කණ්ඩායම්	1415	2367	1,791	2,676
උපකාරක සේවා	640	15	418	16
එකතුව	3,866	3,924	3,963	4,152
භූගෝලීය ව්‍යාප්තිය මත				
ප්‍රධාන කාර්යාලය	871	573	919	817
බස්නාහිර පළාත	897	1,349	855	1,236
මධ්‍යම පළාත	347	317	386	341
නැගෙනහිර පළාත	242	145	247	150
උතුරු පළාත	245	215	217	222
උතුරු මැද පළාත	261	234	269	239
වයඹ පළාත	314	297	338	320
සබරගමුව	196	250	205	255
දකුණු පළාත	317	344	347	364
ඌව පළාත	176	200	186	208
එකතුව	3,866	3,924	3,963	4,152
නව බඳවා ගැනීම් වයස් කාණ්ඩ මත				
අවුරුදු 18-24	102	1	4	53
අවුරුදු 25-34	136	20	160	316
අවුරුදු 35-44	32	-	4	10
අවුරුදු 45-54	5	-	-	-
අවුරුදු 55 ට වැඩි	-	-	-	-
එකතුව	275	21	168	379

භූගෝලීය ව්‍යාප්තිය මත සේවක වර්ගීකරණය



වාර්තාව

කණ්ඩායම් හරස්කඩ

	2012		2011	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
භූගෝලීය ව්‍යාප්තිය අනුව				
ප්‍රධාන කාර්යාලය	92	2	26	90
බස්නාහිර පළාත	44	2	13	79
මධ්‍යම පළාත	16	2	10	27
නැගෙනහිර පළාත	22	3	20	13
උතුරු පළාත	38	5	15	26
උතුරු මැද පළාත	12	2	35	32
වයඹ පළාත	14	1	12	28
සබරගමු පළාත	13	-	8	23
දකුණු පළාත	13	3	11	28
ඌව පළාත	4	1	18	33
එකතුව	275	21	168	379
වයස් කාණ්ඩ මත සේවක පිරිවැටුම				
අවුරුදු 18-24	2	1	-	2
අවුරුදු 25-34	4	14	7	21
අවුරුදු 35-44	1	3	3	1
අවුරුදු 45-54	-	-	1	1
අවුරුදු 55 හා වැඩි	-	-	-	-
එකතුව	7	18	11	25
ප්‍රදේශය/ස්ත්‍රී පුරුෂ භාවය මත සේවක පිරිවැටුම				
ප්‍රධාන කාර්යාලය	3	4	5	3
බස්නාහිර පළාත	3	5	-	6
මධ්‍යම පළාත	1	2	1	1
නැගෙනහිර පළාත	-	-	1	1
උතුරු පළාත	-	1	-	2
උතුරු මැද පළාත	-	-	2	2
වයඹ පළාත	-	4	-	5
සබරගමුව පළාත	-	-	1	-
දකුණු පළාත	-	-	-	3
ඌව පළාත	-	2	1	2
එකතුව	7	18	11	25

සේවක වර්ගීකරණය මත



සාමාන්‍ය පුහුණු පැය සේවක වර්ගීකරණය මත



සේවක වැටුප් තල

ප්‍රවේශ මට්ටමේ වැටුප් තල, සෙසු බැංකුකරණ ක්ෂේත්‍රය සමග සන්සන්දනය කරන කල තරඟකාරී මට්ටමක පවතී.

- මාණ්ඩලික සහකාර පුහුණුවන්නන් - මුල් වසර - රු.12,500 මසකට
  - දෙවන වසර - රු.14,000 මසකට
- කළමනාකරණ අභ්‍යාසලාභීන් - මුල් හය මස - රු.25,000 මාසික
  - ඊළඟ වසර 1 1/2 - රු.28,000 මාසික

වෘත්තීය මංපෙත් සංවර්ධනය

නව බඳවා ගැනීම් උදෙසා හැකියාව හා නිපුණතා වර්ධනය කෙරේ නැඹුරු වූ සංවිධිත වෘත්තීය මංපෙත් සංවර්ධන සැලසුමක් සහතික කෙරේ. මුලින් ගනුදෙනුකාර සේවා හා උපකාරක කටයුතු සඳහා යොමු කෙරෙන ඔවුන් පසු කලක සාමාන්‍ය බැංකුකරණය හෝ බැංකුකරණයේ විවිධ විශේෂඥ ඉසව් කරා යොමු කරවන්නට පොළඹවනු ලැබේ. ජ්‍යෙෂ්ඨ කළමණාකාර ශ්‍රේණිය තෙක් සේවාස්ථ ඇගයීම් විධි ක්‍රමයක් ස්ථාපිත කර ඇත.

අපි අප කණ්ඩායම් සාමාජිකයන් වෘත්තියමය වශයෙන් පුහුණු බැංකුකරුවන් වනු දැක්ම අපේක්ෂා කරන්නෙමු. ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය සහ එක්සත් රාජධානියේ වරලත් බැංකුකරුවන්ගේ ආයතනයේ වෘත්තීය පාඨමාලා සාර්ථක ලෙස නිම කරන බැංකු කණ්ඩායම් සාමාජිකයන්ට ප්‍රසාද පාරිතෝෂිකයක් ගෙවනු ලැබේ. 2012 වසර තුල රු. මිලියන 14 ක ප්‍රසාද පාරිතෝෂික පිරිනමනු ලැබීය.

ලකුණු පිරිනැමීමේ විධිමත් පිලිවෙතක් සහිත, නිර්වචනය කළ උසස්වීම් ක්‍රියාදාමයක්, අභ්‍යන්තර උසස්වීම් විධිමත්ව පාලනය කරයි. උසස්වීම් කාලානුරූපව කරනුයේ බැංකුවේ ව්‍යාපාරික සැලසුම් අවශ්‍යතා හා සේවක සංඛ්‍යා ප්‍රතිපත්ති මත පදනම් වෙමිනි.

කාර්යඵල සමාලෝචනය

කණ්ඩායම් සාමාජිකයන්ගේ කාර්යඵල විභවය මනින ක්‍රම වේදය වන කාර්ය ඵල ඇගයීම් ක්‍රියාදාමය වසර තුළ දී සංශෝධනයට ලක් කරන ලද්දේ ආයතනික ඉලක්ක/අරමුණු හා නිපුණතා අතර 70:30 අනුපාතයකින් කාර්යඵලය මැනීමේ පිටු හතරකින් සමන්විත සංක්ෂිප්ත සැලසුමකින් ඉටු කර ගත හැකි වන පරිද්දෙනි.

වසර තුල දී හඳුන්වා දුන් තවත් ලේඛනයක් වූයේ සේවක වාර්තා සටහන් පොතය. මෙහි තුල එකඟ වූ ඉලක්ක, නිවාඩු සැලසුම, සේවා ස්ථාන මාරු කිරීම්, සාමාන්‍ය රාජකාරී රටාවෙන් ඔබ්බට විහිදුන සුවිශේෂී දායකත්වය හා නිපුණතා සංවර්ධන කඩඉම් යනාදිය සටහන් කරනු ඇත. මෙය වසර අවසන කාර්යඵල සමාලෝචනයට ඉවහල් වනු ඇත.

විශ්‍රාම නඩත්තු ප්‍රතිලාභ

නිර්වචනය කළ ප්‍රතිලාභ සැලසුම්

ලංකා බැංකු කණ්ඩායමට දායකත්ව අර්ථසාධක අරමුදලක් හා වැන්දඹු අනත්දරු විශ්‍රාම අරමුදලක් ඔස්සේ ප්‍රතිලාභ සමුදායක් පිරිනැමේ. දායකත්ව නොවන අරමුදලක් වන ලංකා බැංකු විශ්‍රාම අරමුදල පශ්චාත් - විශ්‍රාමික මූල්‍ය රැකවරණයක් සලසයි. මේ අරමුදල් සියල්ලම කණ්ඩායම් සාමාජික/විශ්‍රාමික නියෝජනය සහිත භාරකාර මණ්ඩල විසින් කළමණාකරණය කෙරේ. අරමුදල් දිගුකාලීන අගයක් ලබා දෙන අන්දමින් විචක්ෂණශීලි ලෙස ආයෝජනය කරන බවට භාරකරුවෝ වග බලා ගනිති. මෙම අරමුදල් විසින් කැඳවන වාර්ෂික සභා රැස්වීම්වල දී සාමාජිකයන්ට අරමුදල් ශක්‍යතාවය හා ආයෝජන පරිචයන් පිළිබඳව ප්‍රශ්න කළ හැකි අතර, ප්‍රතිපත්ති තීරණ සඳහා සිය ඡන්දය ද පාවිච්චි කළ හැකිය. අරමුදල් හිඟයන් හා ඒ සඳහා පිළියම් නිශ්චය කරනු සඳහා වාර්ෂික ජීවගණක විද්‍යාඥ තක්සේරු වලෙසින්ම ඉටු කෙරේ.

2012 වසර අවසානය වන විට 5,016 ක් විශ්‍රාමිකයෝ ද 1,281 වන වැන්දඹු අනත්දරු අරමුදල් ප්‍රතිලාභියෝ ද ලංකා බැංකුවේ විශ්‍රාම නඩත්තු යෝජනා ක්‍රම තුලින් ප්‍රතිලාභ ලබා ගත්හ. ඔවුන් අතර, ගණනින් 600 ක් වන අළුත විශ්‍රාම ලැබූ සාමාජික සාමාජිකාවෝ ද වූහ. ලංකා බැංකු විශ්‍රාම අරමුදලේ සමස්ත එකතුව රු.බිලියන 49 ක් විය.

කණ්ඩායමේ සාමාජිකයින් වෘත්තීය බැංකුකරුවන් කිරීමට අප ඔවුන්ව උනන්දු කරන්නෙමු.

සේවාවසාන ප්‍රතිලාභ

මේ ප්‍රතිලාභය දෙවැදෑරුම්ය.

- විශ්‍රාම යායුතු වයසට ප්‍රථම, බැංකු සේවය අත්හැර යන සාමාජිකයන් විසින් සම්පූර්ණ කර ඇති සේවා වසර සංඛ්‍යාව අනුව පාරිතෝෂික දීමනාවක් හිමිවේ.
- විශ්‍රාම යන සාමාජිකයන්ට 24 මසක විශ්‍රාම වැටුප ගණනය කොට එක්වර ගෙවන දීමනාවක් ලෙස හිමිවේ.

වෛද්‍ය සහනාධාර යෝජනා ක්‍රමය

අපේ කණ්ඩායමේ සෞඛ්‍ය හා චිරජීවනය අපගේ ප්‍රධානතම වගකීමක් වේ. නාමික වශයෙන් දායකත්වය සහිත වෛද්‍ය සහනාධාර යෝජනා ක්‍රමයක් කණ්ඩායම් සාමාජිකයන්, කලත්‍රයන්, අවිවාහක සාමාජිකයන්ගේ දෙමාපියන් හා වයස අවුරුදු 18 ට අඩු දරුවන්ගේ සෞඛ්‍ය සම්බන්ධ පිරිවැය ආවරණය කරයි. මෙහිදී වෛද්‍ය වියදම්, විශේෂඥ වෛද්‍ය ප්‍රතිකාර, රෝහල් ගත වීම්, ශල්‍ය කර්ම, නිවැරදි කිරීමේ ප්‍රතිකාර, දරු ප්‍රසූතිය හා ශල්‍ය කර්ම අත්‍යාවශ්‍ය වන හඳුන්වා දී ඇති බරපතල රෝගාබාධ වශයෙන් විවිධ කාණ්ඩ යටතේ දරන්නට සිදුවන පිරිවැය ප්‍රතිපූරණය කෙරේ.

2012 වේතන නොවන ප්‍රතිලාභ

විස්තරය	රු. මිලියන
විශ්‍රාම අරමුදල සඳහා දායකත්වය	1,690
අර්ථසාධක අරමුදල් දායකත්වය	636
වැන්දඹු/අනත්දරු විශ්‍රාම අරමුදලට දායකත්වය	456
ප්‍රතිපූරණය කළ වෛද්‍ය වියදම්	431
විශ්‍රාමික වෛද්‍ය වියදම්	281

සහනදායී ණය පහසුකම්

අපි කණ්ඩායමේ සාමාජිකයන් උදෙසා විවිධ හැඩතල ඔස්සේ සැකසුණු - සහන පොළී ණය මාලාවක් පිරිනමන්නෙමු.

- නිවාස මිලදී ගැනීම හා ඉදි කිරීම
- පුළුල් පරාසයක උපයෝගිතා පිරිවැය ණය
- නිර්වචනය කළ ශ්‍රේණි සඳහා පරිගණක/මෝටර් රථ මිළදී ගැනීමේ ණය
- හදිසි අවශ්‍යතා
- අධ්‍යාපනික අවශ්‍යතා

මෙයට අමතරව, ඔවුනට භයමසකට වරක් අළුත් කරමින් ඉහළ දැමිය හැකි, සිය අර්ථසාධක අරමුදල් ශේෂය එල්ලේ ද ණය ලබා ගත හැකිය.

පුහුණු කිරීම් හා නිපුණතා සංවර්ධනය

බැංකු කර්මාන්තය තුල වෙනස් වන පැතිකඩ, සීඝ්‍ර තාක්ෂණික වර්ධනය හා මූල්‍ය පහසුකම් ක්ෂේත්‍රයේ දැකිය හැකි සංකීර්ණ තරඟකාරිත්වය නව මංපෙත් විවෘත කළා පමණක් නොව, සේවා විශිෂ්ටත්වය, වඩා කඩිනම් බෙදා හැරීමේ විධි ක්‍රම, ශිල්පීය දැනුම හා නිපුණතා සංවර්ධනය සඳහා පුළුල් ඉල්ලුම කරා අප තල්ලු කර ඇත. ඒ නයින් බලන කල දිගු කාලීන කණ්ඩායම් ඵලදායීතාව තුල පුහුණු කිරීම් හා සංවර්ධනය ප්‍රධාන පෙලේ භූමිකාවක් අත්‍යාවශ්‍යයෙන්ම නිරූපණය කළ යුතුය.



අපි මේ මානය කෙරේ යොමු වී සිටින්නෙමු. නියෝජ්‍ය මහා කළමණාකරු (මානව සම්පත්) වෙත සෘජුව වාර්තා කරන සහකාර මහා කළමනාකරුවෙකු විසින් මෙහෙය වන අපේ පුහුණු කිරීම් අංශය මේ ක්‍රියාදාමයේ කැපවූ පංගුකරුවෙකි.

අංග සම්පූර්ණ නේවාසික පුහුණු ආයතනයක් වන මහරගම පිහිටි, ඉඩකඩ සහිත අපගේ මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයට පරිබාහිරව අප ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල තුල ද පුහුණු කිරීමේ පහසුකම් ස්ථාපිත කළේ සහභාගිවන්නන් මෙන්ම සම්පත් දායකයන්ගේ ද ගමන් පහසුව සැලකිල්ලට ගනිමිනි.

සම්ප්‍රදායික පන්ති කාමර මත පදනම් උගැන්වීමෙන් ඔබ්බට

අප පුහුණු කිරීමේ හස්තය - මධ්‍යම පුහුණු කිරීමේ ආයතනය - මේ වසර තුල තවත් පිය සටහනක් තැබුවේ, පන්ති කාමර මත පදනම් පුහුණුවට විකල්පයක් වන ඊ-ඉගෙනුම කරා පිවිසෙමිනි.

මුල් පියවර වූයේ පුහුණු කිරීමේ අවියක් වශයෙන් වීඩියෝ සම්මන්ත්‍රණ තාක්ෂණය පෙරට ගෙන ඒමය. 'ලංකා බැංකු නිමැවුම් හා සේවා පිළිබඳ නව මං පෙතක්' යන හිසින් වූ මුල්ම වීඩියෝ සම්මන්ත්‍රණ වැඩමුළුව 2012 අගෝස්තු 26 දින මහරගම, මධ්‍යම පුහුණු කිරීමේ ආයතනයේ දී ඇරඹිණ. මෙහිදී පුහුණු කිරීමේ ආයතනය ස්ථාන පහක් (අනුරාධපුරය,මහනුවර, රත්නපුර, බදුල්ල හා ගාල්ල) සමඟ එකවර සම්බන්ධ කරන ලද්දේ ඒ ඒ ස්ථානයන්හි සම්පත් දායකයන්ගේ සජීවී යෙදවුම් උකහා ගනු සඳහාය. මෙම වැඩසටහන සඳහා තාක්ෂණික දායකත්වය NODES ආයතනය (ජාතික මාර්ගස්ථ දුරස්ථ අධ්‍යාපන සේවය) හා ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම විසින් දරනු ලැබීය.

මෙම නිර්මාණශීලී ක්‍රමවේදය - කණ්ඩායම් සාමාජිකයන් උදෙසා පුහුණු පාඨමාලා පැවැත්වීමෙහි දී පුහුණු ආයතනය මුහුණ පාන එක් බරපතල ගැටළුවක් වන ශාඛාවන්හි අධික වැඩ ධාරිතාව හා කාලය පිළිබඳ ගැටළු හේතුවෙන් කාර්ය මණ්ඩලය නිදහස් කිරීමේ ප්‍රශ්නය - යම් තාක් දුරකට සමහන් කරන්නට සමත් විය.

2012 වසර තුල පවත්වන ලද පුහුණු පාඨමාලාවන්හි වපසරිය, එල්ලය හා සහභාගිත්වය

පාඨමාලා වර්ගීකරණය	පාඨමාලා සංඛ්‍යාව	පුහුණු කිරීම් පැය	සහභාගිත්වය
සන්නිවේදන නිපුණතා හා ඉදිරිපත් කිරීමේ විධි ක්‍රම - මුදු ඇමතුම් මධ්‍යස්ථානය, ඊමේල් හා අන්තර්ජාලය, මයික්‍රොසොෆ්ට් එක්සෙල්, වර්ඩ් සහ පවර් පොයින්ට් සාර්ථක සන්නිවේදනය සඳහා ව්‍යාපාරික ඉංග්‍රීසි, ලේඛණ නිපුණතා	46	518	932
අනුකූලතා හා විශේෂිත අංශ - ණය අය කර ගැනීම්, අවදානම් ණය කළමනාකරණය හා සුරැකුම් ලේඛනගත කිරීම, උතුරු මැද පළාත් ශාඛා සඳහා එස් 5 සංකල්පය, බාසල් 111 හා අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණතා තක්සේරු පිළිවෙත, ණය තොරතුරු කාර්යාංශය - පියවර 111, කාර්යඵල ඇගයීම් ක්‍රමවේදය ස්ථාපනය කිරීම, ඔබට අවැසි පුද්ගලයන් වෙත වගකීම් භාර දී සාර්ථකත්වය උදෙසා බලපෑම් කරන්නට උගන්වන වැඩමුළුව	50	382	3,725
ගනුදෙනුකාර සේවා - මූලික ණය මෙහෙයුම්, නව සපිරි ණය යේජනා ක්‍රමය පිළිබඳ ශාඛා කාර්ය මණ්ඩලය දැනුවත් කිරීම, ශාඛා කාර්ය මණ්ඩල සඳහා ආනයන අපනයන කටයුතු පිළිබඳ අභ්‍යන්තර වැඩසටහන, දිළිඳු බව දුරැලීම සඳහා ක්ෂුද්‍ර ණය වැඩසටහන II, ගනුදෙනුකාර සේවා විශිෂ්ටත්වය, ICBS මෙහෙයුම්, ප්‍රසන්න ඉදිරි පෙළ අත්දැකීමක් ඉදිරිපත් කිරීම, ජාත්‍යන්තර වෙළඳ කටයුතු	34	581	1,461
දෛනික විගණනය, ස්කයි ලීස් පිළිවෙත තුල පසු විපරම් හා සුපරීක්ෂණය: ස්කයිලීස් මෘදුකාංගයේ 1 වන මොඩියුලය පිලිබඳ නිමැවුම් දැනුවත්කරණය හා විගණන පැතිකඩ, එහිම මොඩියුල III හා IV, ස්කයිලීස් පශ්චාත් ක්‍රියාත්මක කිරීමේ සමාලෝචනය	16	176	326
වංචා විමර්ශනය හා වැලැක්වීමේ විධි ක්‍රම - ශාඛා සඳහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මෙහෙයුම් විධිමත් කිරීම, විදේශ සේවා නියුක්ති කාර්යාංශය තුළ ලංකා බැංකුව නියෝජනය කරන කාර්ය මණ්ඩලය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මෙහෙයුම් සුමට කිරීම.	4	34	256
අනෙකුත් පුහුණු කිරීම් - ලංකා බැංකු රක්ෂණ මෙහෙයුම් පිළිබඳ දැනුවත්කරණ වැඩසටහන, ශ්‍රී ලංකා ගුවන් හමුදා ඇකඩමියේ නිල නොලත් නිලධාරීන්හට ලංකා බැංකු මූලස්ථානය විසිත්ත කිරීම, විශ්‍රාම දිවියට නවමු පියවරක්.	4	32	245
ඵලදායිතා විධි ක්‍රම - උසස් ණය කළමනාකරණය, සංවර්ධන ණය යෝජනා ක්‍රම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩ සටහන, සුමක අංශය සඳහා පාරිසරික කළමණාකරණ පද්ධතිය, ණය සඳහා මූල්‍ය වාර්තා විශ්ලේෂණය, සුමක ණය දීම, සුමක ව්‍යවසායක නිපුණතා සංවර්ධන වැඩසටහන, සුමක ණය ඇගයීම උදෙසා වැඩමුළුව	45	948	2,590

2012 වසර තුල පවත්වන ලද පුහුණු පාඨමාලාවන්හි වපසරිය, එල්ලය හා සහභාගිත්වය

පාඨමාලා වර්ගීකරණය	පාඨමාලා සංඛ්‍යාව	පුහුණු කිරීම් පැය	සහභාගීත්වය
විකුණුම් මූලධර්ම, බැංකු නිලධාරීන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන - ධීවර කර්මාන්තය, රියැදුරන් සඳහා මූලික වැඩසටහන, කල්බදු මූල්‍යකරණය, රන් සුරැකුම් ණය සේවා, ලේකම් නිපුණතා සංවර්ධනය, කල්බදු ව්‍යාපාර කටයුතු ස්වයං යාන්ත්‍රිකකරණය, ඊ-ඉගෙනුම හරහා ලංකා බැංකු නිමැවුම හා සේවාවන්ට නව ප්‍රවේශයක්, ස්ලිප්ස් මෙහෙයුම්, බහු කාර්ය සහායකයින් සඳහා මූලික වැඩසටහන, ලේකම් සහායකයින් සඳහා මෙහෙයුම් හා අලෙවි හැඩරුව, ශාඛා මට්ටමේ හර/ණය කාඩ්පත් ප්‍රචාරණය, විදේශ මුදල් ගිණුම් නිමැවුම් හි සුවිශේෂ ලක්ෂණ, සුවිශේෂී විදේශීය මෙහෙයුම්	69	1,027	2,742
සුපරීක්ෂණ නිපුණතා සංවර්ධනය - ණය මෙහෙයුම්, කළමනාකරණ අභ්‍යාසලාභී නව බඳවා ගැනීම් උදෙසා මූලික වැඩසටහන, කළමනාකරුවන් සඳහා හුරු කිරීමේ වැඩසටහන, ඇළුත උසස්වීම් ලැබූ සහකාර කළමනාකරුවන් සඳහා හුරු කිරීමේ වැඩසටහන, පරිශ්‍ර අංශයේ කාර්ය මණ්ඩලය සඳහා හුරු කිරීමේ වැඩසටහන, ලංකා බැංකු මධ්‍යගත චෙක්පත් නිෂ්කාශන පද්ධතිය, සාර්ථක බැංකු කළමනාකරණය උදෙසා ICBS පහසුකම්, අලුත් උසස් වීම් ලද කණිෂ්ඨ විධායක නිලධාරීන් සඳහා හුරු කිරීමේ වැඩසටහන, කළමණාකරණ අභ්‍යාසලාභීන් උදෙසා ICBS ප්‍රවේශය, ණය උදෙසා ලකුණු පිරි නැමීමේ ආදර්ශය හා ගනුදෙනුකාර වර්ගීකරණය, ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම හා පිරිසිදු නෝට්ටු පිළිවෙත	37	784	1,949
කණ්ඩායම් ගොඩ නැංවීමේ පුහුණුව - ඉහළ තලයේ නායකත්වය	1	11	60
ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන් හා කළමනාකරුවන් උදෙසා කළමනාකරණ සංවර්ධන වැඩසටහන, ලංකාවේ බැංකු කර්මාන්තය හා එහි අනාගතය, පුද්ගලික නිපුණතා, තාක්ෂණික නිපුණතා, පුද්ගල කළමනාකරණ ශිල්පීය ක්‍රම හා කණ්ඩායම් ගත වීම, සන්නිවේදන කුසලතා, නිර්මාණශීලීත්වය, ගනුදෙනුකාර ප්‍රගතිය, කාර්යඵල මට්ටම්,	12	189	90
හැකියා සංවර්ධන පුහුණු වැඩසටහන. උපාය මාර්ගික සැලසුම්කරණය හා ප්‍රශස්ත ව්‍යාපාරික තීරණ ගැනීම, ගනුදෙනුකාර චිල්ලය, ගනුදෙනුකාර සබඳතා කළමනාකරණය, ඉහළ කාර්යඵල සහිත කණ්ඩායම් ගොඩ නැංවීම හා තීරණ ගැනීම, පක්ෂග්‍රාහී ක්‍රියා පිළිවෙත්, ආයාස හා පසු චිල්ලය (නොහැක්කක් නොමැත) තීරණ ගැනීම හා ගැටළු නිරාකරණය, සංවේදිත සන්නිවේදනය, කේවල් කිරීම, දෙපාර්ශවයටම වාසිදායක උපාය මාර්ග, පිරිවැයකරණය, පෞද්ගලික විශිෂ්ටත්වය කරා එළඹීම, චිත්තාවේග බුද්ධිය, නායකත්වය, ඵලදායීතාවය හා ඵලදායීතා ඉහළ නැංවීමේ පරිචයන්, ප්‍රශස්ත කළමනාකරණ පිළිවෙත්	32	224	60
දේශීය පුහුණු කිරීම් (පළාත් බද)	192	1,547	21,003
භාෂා (දෙමල හා ඉංග්‍රීසි - ප්‍රධාන කාර්යාලය ශාඛා හා දුරස්ථ අධ්‍යාපන පංති)	20	2,380	1,875
විභව සංවර්ධන වැඩසටහන (අනාගත මානව සම්පත් නායකයන් සඳහා විශේෂයෙන් සකසන ලදී)	1	210	12
වෙනත් දේශීය ආයතන හරහා ලද පුහුණුව	182	14,000	958
විදේශීය ආයතන තුල පුහුණුව	97	19,551	293
සමස්ත එකතුව	842	42,594	38,577

සේවක පුහුණු කිරීම් විශ්ලේෂණය

සේවය වර්ගීකරණය	පුහුණු කිරීමේ පැය				සේවක සංඛ්‍යාව				වසර තුල ස්ත්‍රී පුරුෂ බව අනුව සාමාන්‍ය පුහුණු පැය			
	2012		2011		2012		2011		2012		2011	
	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී	පුරුෂ	ස්ත්‍රී
ආයතනික කළමනාකාරීත්වය	1,177	656	606	1,941	42	16	35	28	41	34	20	14
ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය	13,512	8,547	1,864	1,454	1,472	944	65	53	28	26	13	12
විධායක නිළධාරීන්	63,853	67,996	68,681	27,780	3,180	3,416	1,511	29,301	40	38	17	12
විධායක සහයකයින්	174,382	329,062	29,854	65,338	1,373	2,612	22,300	1,262	63	58	10	7
පුහුණුවන්නන්	140,619	210,736	14,123	32,191	1,001	1,495	2,730	2,380	102	12	19	76

අන්තර් බැංකු ක්ෂේත්‍රය තුල කණ්ඩායම් කාර්යඵලය

පිට පිට දෙවන වරට ද, අප විසින් ඉදිරිපත් කළ කණ්ඩායම් තුන අතරින් එකක්, ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය විසින් මෙහෙයවන ලද අන්තර් බැංකු ප්‍රශ්න විචාරාත්මක තරඟයේ දී ප්‍රථම ස්ථානය දිනා බෙහෙවින් අඟය කරනා සම්මාන ඵලකය දිනා ගත්හ.

සේවා ජීවන තුලිතය

විවේකී පහසුකම්

බැංකු කණ්ඩායම උදෙසා සාපේක්ෂව සහනදායක ගෙවීම් පදනමක් මත බහුවිධ විවේකී පහසුකම් සපයනු ලැබේ. ඒ කතරගම, නුවරඑළිය හා අනුරාධපුරයේ ස්ථාපනය කර ඇති හෝටල මාදිලියේ ගිමන්හල් සහ මධ්‍ය කඳුකරය, උඟව සහ යාපනය අර්ධද්වීපයේ නිවාඩු නිකේතන හා බංගලා හරහාය. ගිමන්හල් තුල ආපන ශාලා පහසුකම් ඇති අතර නිවාඩු නිවෙස් සියල්ලෙහිම භාරකරු - අරක්කැමියෙකු අනුයුක්ත කර ඇත. මේ පහසුකම්, කාර්ය මණ්ඩලය අතර බෙහෙවින් ජනප්‍රියව ඇත.

කතරගම, අනුරාධපුර හා නුවරඑළියේ පිහිටි අප නිවාඩු නිකේතන උදෙසා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ පිළිගැනීම හා නිර්දේශය හිමි වී තිබේ. වසර තුළදී 4,033 ක් කාර්ය මණ්ඩල සාමාජිකයෝ හා ඔවුන්ගේ පවුල් අපේ නිවාඩු නිකේතන/නිවාඩු බංගලා හා නිවෙස් තුල ආගන්තුක සත්කාර භුක්ති වින්දෝය.

ගතවූ වසර තුළ දී 'රන්කොත් දසුන' සේ හැඳින්වෙන කාමර විස්සකින් යුතු නව ගොඩනැගිල්ලක්, අනුරාධපුර සී බෑන්ක් නිවාඩු නිකේතනයට එක් කරන ලද්දේ එහි පූර්ණ අමුත්තන් ධාරිතාවය 92 දක්වා ඉහළ නංවමිනි.

නුවරඑළියේ දැනට කරමින් පවතින ඉදි කිරීම් කටයුතු මඟින් එයට තවත් කාමර 26 ක් එකතු කරනු ඇත. දික්ඔය නිවාඩු බංගලාව තවත් කාමර හයකින් හා ශ්‍රවණාගාරයකින් යුතුව පුළුල් කරනු සඳහා සැලසුම් කරනු ඇත.

යාපනයේ නිවාඩු නිකේතනයක් ඉදි කිරීම සඳහා බිම් කැබැල්ලක් වසර තුළදී මිලයට ගන්නා ලදී. මෙහි නිකේතනයන් සම්මන්ත්‍රණ ශාලාවක් හා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයකින් සමන්විත බහුවිධ පැතිකඩ සහිත ඉදි කිරීම් සංකීර්ණයක් සඳහා සැලසුම් කරමින් පවතී.

ප්‍රත්‍යන්තයෙහි කාර්ය මණ්ඩල නිල නිවස්න

දැනට කරගෙන යනු ලබන පිවිසුම් ව්‍යාප්තිය හා සමඟ සලකන කල, දුර බැහැර පෙදෙස්වල කාර්ය මණ්ඩල සඳහා නවාතැන් පහසුකම් සැපයීම අත්‍යවශ්‍ය කරුණක් බවට පත්ව ඇත. තෝරාගත් ප්‍රත්‍යන්ත ලක්ෂ්‍යයන්හි සහනදායී මිලකට නවාතැන් සැපයීමෙහිලා බැංකුවේ කල්පවත්නා පරිචයක් ඇත. මේ වන විට, අපි ප්‍රත්‍යන්තයේ ස්ථාන 26 ක සේවක නිල නිවස්න පවත්වා ගෙන යන්නෙමු. ඒ, අනුරාධපුර, කැබිතිගොල්ලෑව, නුවරඑළිය, හැටන්, අරලගංවිල, වවුනියාව හා දෙහිඅත්තකණ්ඩිය බඳු පෙදෙස්වලය. අපේ, පූර්ණ පරිපාලිත සමාගමක් වන සීබෑන්ක් හොලිඩේ හෝම්ස්, මේ සඳහා භාරකාර - අරක්කැමියන්ගේ සේවය සලසයි. කණ්ඩායම් සාමාජිකයන් 300ක් පමණ, වසර තුල මේ පහසුකම් භුක්ති වින්දාහ.

සෞඛ්‍ය රැකවරණය, සේවාස්ථ සුරක්ෂිතතාවය හා ක්‍රීඩා පහසුකම්

- වසර තුලදී සීමාසහිත ලංකා හොස්පිටල්ස් පීඑල්සී විසින් කළමනාකරණය කරනු ලබන වෛද්‍ය මධ්‍යස්ථානයක් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලෙහි ස්ථාපිත කරන ලදී. වෛද්‍ය නිළධාරියෙකු හා හෙදියක අනුයුක්ත කර ඇති මෙය දෛනිකව පෙරවරු 8.30 - පස්වරු 10.20 දක්වා විවෘතව තබා ඇත. මෙම මධ්‍යස්ථානය තුළ

නොමිලේ වෛද්‍ය යොමුව සඳහා උපදෙස්, ප්‍රථමාධාර, සහන මිලකට රසායනාගාර සේවා හා ඖෂධ නිකුත් කිරීම් මෙන්ම බැංකුව හා ලංකා හොස්පිටල්ස් ආයතනය අතර නොමිලේ ගිලන් රථ සේවයක් ද සැපයේ.

- සියළුම ශාඛා, ව්‍යාපාරික ඒකක හා අංශයන්හි ප්‍රථමාධාර පෙට්ටි මෙන්ම ගිනි නිවීමේ උපකරණ ද ස්ථානගත කර ඇත.
- සියළුම පහසුකම් සහිත ශාරීරිකාභ්‍යාස ශාලා දෙකක් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ සහ තැප්‍රොබේන් ගොඩනැගිල්ලේ පිහිටුවා ඇත. මෙහි 3,000 ක කාර්ය මණ්ඩලයකට සේවා සැපයේ.
- සුභසාධක දෙපාර්තමේන්තුව විසින් ප්‍රවීණ වෛද්‍ය වෘත්තිකයන්ගේ සහභාගිත්වය සහිත සෞඛ්‍ය හා සේවස්ථාන සුරක්ෂිතභාවය පිළිබඳ වැඩසටහන් කිහිපයක්ම මෙහෙයවන ලදී.
- ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ සෑම මහලක් පාසා නිතිපතා පුහුණු කරනු ලබන මහල් පාලකවරුන් අනුයුක්ත කර ඇත.
- ප්‍රතිඵලදායක ගොඩනැගිලි හිස් කිරීමේ සැලසුමක් උදෙසා හදිසි ඉවත් කිරීමේ අභ්‍යාස ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ල තුල සිදු කරන ලදී.
- බැංකුවේ ක්‍රීඩා සංගමය, කණ්ඩායම්, ක්‍රීඩා කටයුතුවලදී (ක්‍රිකට්, පාපන්දු, පිහිනුම් ක්‍රීඩා, දැල් පන්දු හා ගෘහස්ත ක්‍රීඩා ආදිය) සජීවීකරණය කරමින් ඒවා සංවිධානය කරයි.
- හැම පළාතක්ම මෙන්ම ප්‍රධාන කාර්යාලයේ ව්‍යාපාරික හා උපකාරක ඒකක ද පෙර - සැලසුම් කළ වාර්ෂික ක්‍රීඩා තරඟ පැවැත්වීය.
- කණ්ඩායම් සාමාජිකයන්ගේ ක්‍රීඩා පුහුණු කටයුතු හා තරඟ සහභාගීත්වය උදෙසා අපි වැටුප් සහිත නිවාඩු ලබා දෙන්නෙමු.
- ශාඛා මට්ටමේ ක්‍රීඩා හා විනෝද සමාජ පිහිටුවා ඇත. මේවායේ මෙහෙයුම් කටයුතු උදෙසා වාර්ෂික මූල්‍ය ප්‍රදාන පිරිනැමේ.

සංස්කෘතික හා ආගමික විවිධත්වය

අප කණ්ඩායම තුල ජනවාර්ගිකත්වය හා ආගම පිළිබඳ ඉහළ තලයේ විවිධත්වයක් ඇත. ප්‍රධාන ආගමික ප්‍රවාහ හතරේ ආගමික කටයුතු මෙහෙය වන සංගම්, බැංකුව තුල සංවිධානය වී ඇති අතර විවිධ ආගමික වත් පිළිවෙත් මෙහෙයවති. මේවායේ කටයුතු සඳහා මූල්‍යාධාර බැංකුව විසින් පිරිනැමේ.

කණ්ඩායම, ඉතිරි කිරීමේ සමාජ, සුභසාධක සංගම් ආදී වශයෙන් ද ඒකරාශී වී ඇත. සාමාජික මුදල් හා බැංකුවේ ප්‍රදාන තුලින් අරමුදල් සැපයෙන මෙබඳු සංවිධාන, ජීවන චක්‍ර අවශ්‍යතා හදිසි ඕනෑ එපාකම් හා සේවයෙන් ඉවත් වන අවස්ථාව බඳු ලක්ෂ්‍යයන්හි දී මූල්‍යාධාර සපයයි. බැංකුව, මෙම සංගම් සඳහා කාර්යාල ඉඩ කඩ මෙන්ම සන්නිවේදන පහසුකම් ද සම්පාදනය කරයි.

සිංහල සහ ඉංග්‍රීසි සාහිත්‍ය සංගම් කණ්ඩායම අතර සංස්කෘතික සාක්ෂරතාවය පිළිබඳව මුල් ව කටයුතු කරයි. ඔවුහු කියවීම් ශාලා පහසුකම් සපයනවාට අමතරව සිය සාමාජිකයන් හා ඔවුන්ගේ දරුවන් උදෙසා විවිධාකාර වාර්ෂික සාහිත්‍ය තරඟ සංවිධානය කරයි.

මානව හිමිකම්

අප, මානව හිමිකම් සඳහා කැපවනවා හා ඒ සුරකින්නට කැපවන අතරම, තමනට අගතියක් සිදු වී ඇතැයි කණ්ඩායම් සාමාජිකයන් දුක් ගැනවිලි ඉදිරිපත් කළ අවස්ථා ද තිබුණි. ඔවුනට සිය දුක් ගැනවිලි ඉදිරිපත් කොට සහන ලබා ගත හැකි විධිමත් යාන්ත්‍රණයක් ස්ථාපිත කර ඇත. මානව හිමිකම් උල්ලංඝණය කිරීම් පිළිබඳ පැමිණිලි භාර ගැනීම හා ඒ පිළිබඳ පිළියම් යෙදීම මානව සම්පත් අංශයේ කාර්ය භාරයකි.

වාර්තා ගත මානව හිමිකම් දුක් ගැනවිලි සාරාංශය

දුක්ගැනවිලි මට්ටම	පුරුෂ	ස්ත්‍රී	එකතුව
2011 වසරින් පෙරට ගෙන ආ මානව හිමිකම් දුක් ගැනවිලි සංඛ්‍යාව	18	4	22
2011 වසර තුල වාර්තා ගත මානව හිමිකම් දුක් ගැනවිලි සංඛ්‍යාව	1	1	2
2012 වසර තුල සමථයකට පත් කළ දුක් ගැනවිලි ගණන	-	-	-
වසර අවසානයේ දී ඉතිරිව තිබී දුක් ගැනවිලි සංඛ්‍යාව	19	5	24

ආර්ථිකය සමඟ සාමූහිකව වර්ධනය වෙමින්

> **“ලංකා බැංකුව ගනුදෙනුකරු – කේන්ද්‍රගත පොළී අනුපාත ව්‍යුහයක් පවත්වා ගෙන යයි. එය, තැන්පතු හිමි පාර්ශ්වකරුවනට අඛණ්ඩ ආදායමක් සහතික කළා පමණක් නොව, ආර්ථිකයේ හැම පැතිකඩක් ඔස්සේම වර්ධනයට රුකුලක් විය.”**

ආර්ථික කාර්යඵලය

අපි ගතවන වසරක් පාසා අපේ ආර්ථික කාර්යඵලය ඉහළ නංවමින් සිටින්නෙමු. මෙය දැන් දැන් ස්වභාවික සංසිද්ධියක් බවට පත් වී ඇත්තේ, රට අපේ මේ ගමන් මගේ කැපී පෙනෙන පිය සටහන් නිබඳව අපේක්ෂා කරන මට්ටමකට ගෙන එමිනි. වසර තුළ අප විදහා පෑ එක් කැපී පෙනෙන පිය සටහනක් වූයේ රුපියල් ට්‍රිලියනයක් ඉක්ම වූ වත්කම් පදනමක් සතු කර ගැනීමය.

අප ආර්ථික කාර්යඵලයේ නිබඳවම දිස්වන වර්ධනය, අප පාර්ශ්වකරුවන් හැමටම ඔවුනට හිමි ප්‍රතිලාභ පංගුව එලෙසින්ම ලැබෙන බව තහවුරු කරයි. කොටස් හිමි ප්‍රාග්ධන වර්ධනය, අරමුදල් ප්‍රමාණාත්මතාව ඉහළ නංවයි. තැන්පතු පදනමේ වර්ධනය අපේ ණය ප්‍රදානය කිරීමේ ඉඩ කඩ පුළුල් කරයි. කණ්ඩායමට සිය පංගුව ලැබෙන්නේ වර්ධනය වූ වේතන වශයෙනි. අරමුදල් සපයන්නන්ට, ආයෝජිත මුදල් සඳහා සරිලන ප්‍රතිලාභ සැපයේ. කොටස් හිමි - හිමිකරුට ද හිමි විධිමත් පංගුව, භාණ්ඩාගාරය තුළට යැවෙනා ලාභාංශ හා බදු වශයෙන් ලැබෙයි.

ආර්ථිකමය අගය එකතුව

ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභය පෙර වසරට සාපේක්ෂව 35% කින් වර්ධනය විය. ශුද්ධ ආර්ථිකමය එකතු කළ අගය වන රු. බිලියන 10.1, 25% ක ප්‍රතිලාභ මට්ටමක් විදහා පායි.

වක්‍ර ආර්ථික ප්‍රතිලාභ

ලංකා බැංකුව ගනුදෙනුකරු - කේන්ද්‍රගත පොළී අනුපාත ව්‍යුහයක් පවත්වා ගෙන යයි. එය, තැන්පතු හිමි පාර්ශ්වකරුවනට අඛණ්ඩ ආදායමක් සහතික කළා පමණක් නොව, ආර්ථිකයේ හැම පැතිකඩක් ඔස්සේම - සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය, ක්ෂුද්‍ර අංශය හා වඩා විසල් ව්‍යාපාරික ආයතන - වර්ධනයට රුකුලක් විය.

කිවයුතු වඩා රසවත් පැතිකඩ ඇත. අප, අපේ පිවිසුම හා දායකත්වය සනිටුහන් කළ එක් ප්‍රධානතම ක්ෂේත්‍රයක් වූයේ වී වෙළඳපල ස්ථායීකරණය යි. අප නිර්මාණය කරන්නට දායක වූ වෙළඳපල සබඳතා මෙන්ම කොතෙකුත් අය කුඩා මෙන්ම සුවිසල් පුළුල් පරාසයක ව්‍යවසායයන් ඇරඹුම තුලින් රට හාත්පස බිහි කල රැකියා අවස්ථා ද මෙම ප්‍රමාණ කිරීමේ ක්‍රියාවලියේ දී මග හැරී යන කරුණුය.



ආර්ථිකමය එකතු කළ අගය

	2012 රු. මිලියන	2011 රු. මිලියන
ආයෝජිත ප්‍රාග්ධනය		
සාමාන්‍ය කොටස් හිමි ප්‍රාග්ධනය	46,153	35,630
ප්‍රතිප්‍රමාණිත සංචිත	(5,222)	(4,613)
2006 දී නිකුත් කළ ප්‍රසාද කොටස්	(1,400)	(1,400)
	39,531	29,617
ආයෝජිත ප්‍රාග්ධනය මත ප්‍රතිලාභ		
වාර්තා කළ බදු පසු ලාභය	14,417	11,918
ප්‍රතිප්‍රමාණිත අතිරික්තය මත ක්ෂය කිරීම්	(522)	(461)
ආයෝජිත ප්‍රාග්ධනය මත සමස්ත ප්‍රතිලාභය	13,895	11,457
ආයෝජිත ප්‍රාග්ධනයේ ආවස්ථික පිරිවැය	(3,763)	(2,103)
එකතු කළ ආර්ථික අගය	10,132	9,354
මාස 12 භාණ්ඩාගාර බිල්පත් බර තැබූ සාමාන්‍ය ප්‍රතිලාභ අනුපාතය	9.52%	7.10%

ආදායම් ප්‍රභවයන් හා බෙදා හැරීම

31 දෙසැම්බර් දිනෙන් අවසන් වූ	2012 රු.මිලියන	2011 රු.මිලියන
ආදායම් ප්‍රභවයන්		
පොළී හා සමාන ආදායම්	95,022	61,222
විදේශ විනිමය ලාභය	1,823	154
ගාස්තු හා කොමිස් ආදායම	7,320	6,676
ආයෝජන ආදායම	4,140	667
අනෙකුත් ආදායම්	1,833	1,738
	110,138	70,457
ආදායම බෙදා හැරීම්		
තැන්පතුකරුවන් හා සෙසු ආයෝජකයන්ට	59,701	36,215
සැපයුම්/සේවා සපයන්නන්ට	7,637	6,125
සේවකයන්ට	12,927	10,460
රජයට		
- ලාභාංශ ලෙසින්	5,346	3,846
- බදු (ආදායම් බදු/එකතු කළ අගය බදු)	8,722	6,115
බැංකුව විසින් රඳවාගත්		
- සංචිත	9,071	8,072
- ක්ෂය කිරීම්/ක්‍රමක්ෂය	960	913
- බොල් ණය ප්‍රතිපාදන හා අගය අඩු වීම් මත කපාහැරීම්	5,904	(2,257)
- විලම්බිත බදු	(130)	968
	110,138	70,457

අගය එකතු කිරීම

අවධානයට ලක්වූ කාලය තුල ජනිත අගය, බෙදා හැරී ආකාරය පහත වගුවෙන් නිරූපණය කෙරේ.

	2012 රු. මිලියන	2011 රු. මිලියන
එකතු කළ අගය		
බැංකු සේවා සැපයුම මත ලද ආදායම	105,674	69,512
සේවා සැපයුම් පිරිවැය	(46,385)	(30,986)
බැංකු සේවා තුළින් එකතු කල අගය	59,289	38,526
බැංකු සේවා නොවන ආදායම	4,464	945
අගය පහත වැටීම් වල්ලේ ප්‍රතිපාදන	(5,904)	2,258
	57,849	**41,729**
අගය විභජනය		
සේවකයන්ට - වැටුප්/වේතන හා වෙනත් ප්‍රතිලාභ	12,927	10,460
රජයට		
රජයට ගෙවූ ලාභාංශ	5,346	3,846
ආදායම් බදු	5,508	3,599
එකතු කළ අගය මත බදු	3,214	2,516
	14,068	9,961
බාහිර අරමුදල් සපයන්නන්ට		
නිකුත් කළ ණයකර මත පොළී	4,619	3,770
වෙනත් ණය ගැනීම් මත පොළී	16,334	7,585
	20,953	11,355
පුළුල් කිරීම්/වර්ධනය උදෙසා		
රඳවාගත් ලාභය	9,071	8,072
ක්ෂය කිරීම් හා ක්‍රමක්ෂය	960	913
විලම්බිත බදු	(130)	968
	9,901	9,953
	57,849	**41,729**

අගය එකතු කිරීම 2012



අගය එකතු කිරීම 2011



සේවකයන්
රජයට
බාහිර අරමුදල් සපයන්නන්ට
ව්‍යාප්තිය සහ වර්ධනයට

පරිසරය හා සමඟ සාමූහික වර්ධනය

“මේ මිහිකත අපට අපේ මුතුන් මිත්තන්ගෙන් ලැබුණු දායාදයක් නොවේ. ඒ, අප අපේ දරුවන්ගෙන් ණයට ගත්තකි.”

රතු ඉන්දිය නායක සියැවිල්

අප ගැන වචනයක්

සේවා සපයන්නෙකු වශයෙන් අපේ මෙහෙයුම්, අප පරිසරයට හානිකර බලපෑමක් නොකරයි. අප, ඉහළ තලයේ පෙව විවිධත්වයක් ඇති පෙදෙස්, ස්වභාවික වාසභූමි හා තර්පිත පාරිසරික පද්ධති බිම්පෙත් තුළ ව්‍යාපාරික/මෙහෙයුම් ඒකක ස්ථාපනය කර නැත. එහෙත් අප මෙහෙයුම් නඩත්තු කිරීමෙහිලා සෑහෙන පරිමාවක ජලය, කඩදාසි, ඉන්ධන හා විදුලි බලය පරිභෝජනය කරන්නෙමු. මේ හීන වන සම්පත් සුරැකීම් හා ප්‍රතිචක්‍රීකරණය කෙරේ අපි නිබඳවම සිත් යොමන්නෙමු. ප්‍රතිචක්‍රීකරණ ක්‍රියාදාම මෙන්ම බලශක්ති සංරක්ෂණ ආයාසයන් අපට පෙන්වා දෙන්නේ ඉතා සුළු මට්ටමේ නිර්මාණශීලීත්වයක් වුව, මේ මිහිකත වඩා සුපිලිපන් බිම්පෙතක් බවට පත් කරන්නට දිගුදුර අත්වැලක් වන බවය. මෙහිලා මුල් පියවරක් ලෙස, අනුරාධපුර සී බෑන්ක් නිකේතනයේ අළුතින් ගොඩ නැගූ ‘රන්කොත් දසුනේ’ ජල පිරිපහදු හා ප්‍රතිචක්‍රීකරණ පහසුකමක් ස්ථාපනය කර ඇත.

වෙනත් මානයකින් සලකා බලන කල, අපගේ ඉක්ෂි ප්‍රාග්ධන ආයෝජන සැලසුම තුල හරිත ගොඩනැගිලි සංකල්පය පිලිගෙන ඇත්තෙමු. ලංකා බැංකුවේ ප්‍රථම හරිත ගොඩනැගිල්ල මේ වසර තුල සැබෑවක් වනු ඇත.

අපගේ පරිභෝජන මට්ටම්

සම්පත් හා පරිභෝජන අනුපාතය	2012	2011
විදුලි බල පරිභෝජනය - මෙගාවොට් පැය	22,155	16,645
සාමාන්‍ය වත්කම් මත පරිභෝජන අනුපාතය	2.35	2.15%
ඒක පුද්ගල(සේවක) පරිභෝජනය මෙගා වොට් පැය	2.84	1.79
ජල පරිභෝජනය - ලීටර්	324,653	261,403
සාමාන්‍ය වත්කම් මත පරිභෝජනය	34.46	33.72%
ඒක පුද්ගල(සේවක) පරිභෝජනය ලීටර්	41.68	28.53
ව්‍යාපාරික ගමන් මත ඉන්ධන පරිභෝජනය - ලීටර්	1,164,634	932,242
සාමාන්‍ය වත්කම් මත පරිභෝජන අනුපාතය	123.62	120.25%
ඒක පුද්ගල (සේවක) පරිභෝජනය ලීටර්	149.50	114.87

අපේ බලශක්ති පිය සටහන

- ඉන්ධන - ගිගා ජූල් 42,458
- විදුලි බලය - ගිගා ජූල් 79,758

අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණ පුරෝගාමිත්වයන්

ඉවතලන කඩදාසි

ප්‍රධාන කාර්යාලයේ සහ ශාඛා පද්ධතියේ ඉවතලන කඩදාසි සියල්ල ප්‍රතිචක්‍රීකාරකයකු වෙත මුදා හරින්නට අප කටයුතු කළෙමු. ඒ කාබන් සහතිකය ලත් සමාගමකි. වසර තුල දී ඉවතලන කඩදාසි කිලෝග්‍රෑම් 167,239 ක් මෙපරිද්දෙන් ඉවත් කරන ලදී. මෙය නිතිපතා එකතු කරන ලද්දේ ප්‍රධාන කාර්යාලයේ මහල් 30 හි සහ ශාඛා පද්ධතිය හරහා ස්ථාන ගත කළ රැළි කඩදාසි බහලූ උපයෝගී කර ගනිමිනි. මේ ව්‍යායාමය තුලින්,

- මනාව වැඩුණු ගස් 2,843 ක්
- කිලෝවොට් පැය 668,956 ක විදුලි බලය
- තෙල් ලීටර් 293,504 ක්
- මීටර 502 ක බිම් පිරවීම්
- ජලය ලීටර් 5,314,855 ක් ඉතිරි කර ගත හැකි විය.

මෙයට අමතරව කිලෝග්‍රෑම් 167,239 ක කාබන් දහනයකට සමාන හරිතාගාර වායු විමෝචනයක් අඩු කර ගැනීමට ද හැකි විය.

කඩදාසි රහිත තීරණ ගැනීම කරා

මෙම වසර තුල අපි ඉතිහාසය නිර්මාණය කළේ අභ්‍යන්තරික ඉලෙක්ට්‍රොනික සන්නිවේදනය කරා පියවර තබමිනි. මේ සැලසුම අනුව ණය හා මෙහෙයුම් දෙඅංශයේම සංදේශ පත්‍ර අධ්‍යක්ෂ මණ්ඩලය/ආයතනික කළමනාකාරිත්වය වෙත යොමු කරනු ලබනුයේ අයිපෑඩ් හරහාය.

මෙනයින්, සංදේශ යොමු කිරීමේ කඩදාසි භාවිතය සෑහෙන ප්‍රමාණයකින් අඩු කර ගැනීමට හැකිවීමට අමතරව, ගබඩා කිරීමේ ඉඩකඩ ද නිදහස් කර ගැනීමට හැකිවිය.

ඉලෙක්ට්‍රොනික (තොරතුරු තාක්ෂණ) අපද්‍රව්‍ය

පරිගණක මොනිටර, මධ්‍යම සැකසුම් ඒකක හා මුද්‍රණ යන්ත්‍ර 100 තරම, ඉවතලූ ඉලෙක්ට්‍රොනික අපද්‍රව්‍ය, මධ්‍යම පරිසර අධිකාරිය විසින් බලපත් ලද ප්‍රතිචක්‍රීකාරකයෙකු වෙත මුදා හරිනු ලැබීය.

බලශක්ති/ඉන්ධන පිරිමැසුම් ආයාසයන්

- වැසිකිලි/නාන කාමර තුල 2*18 ප්‍රතිදීප්ත විදුලි පහන් සීවිෆ්වල් භාවිතයට මාරු කිරීම
- කාර්යාල අංශ තුල 2*36 චුම්බක සමතුලිත බර ඉලෙක්ට්‍රොනික ක්‍රමයට මාරු කිරීම තුලින් ප්‍රශස්ත ආලෝකකරණය. (අඩක් සම්පූර්ණ කර ඇත)
- උමං මහලේ දුමාර විමෝචන පංකා පාලනය සඳහා (02 සෙන්සර හා VCD ක්‍රමවේදය භාවිතය)
- නව පරිගණක මිලදී ගැනීමේ LCD නිරූපණයට අනුගත කිරීම
- ශීතක මෙහෙයුම් කාලය, සතියේ දිනයන්හි පැය 1.30 කින් කපා හැරීම
- වායු සමනය මසකට වරක් සති අන්තයකට සීමා කිරීම

- ලොබි පෙදෙස, ගබඩා, වැසිකිලි ආදියේ විදුලි බුබුළු නිවා දැමීම හෝ අවම ආලෝකකරණයක් පවත්වා ගැනීම
- රාජකාරී කටයුතුවලදී සාමූහික ප්‍රවාහනය හඳුන්වා දී ඇත. මේ අනුව වාහන පරිහරණය අවම කෙරේ. ප්‍රවාහන අවශ්‍යතා අවම කරනු වස් පුහුණු කිරීම් සැසි පළාත් බදව පවත්වන ලදී
- විදුලි බල/බලශක්ති පරිහරණය 5-10% අතර ප්‍රතිශතයකින් අඩු කරන ලෙස ශාඛාවන්ට ඉලක්ක ලබා දී ඇත

පාරිසරික පුරෝගාමිත්වයන් සමඟ අපේ සබඳතා

රට තුල සජීවී පාරිසරික සංවිධාන චකතුවක් මෙන්ම පරිසර හිතකාමී මාධ්‍යයක් ද ඇත. අප මේ අංශ දෙක හා සමාන අන්‍යෝන්‍ය ඵලදායී සබඳතාවයක් නිර්මාණය කර ඇත්තෙමු. හරිත සංකල්පය හා පාරිසරික සංරක්ෂණය පිළිබඳ මේ ගමන තුල අපේ ගමන් සගයන් දෙදෙනෙකි. ඒ, ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව හා හරිත වන සංසදය වේ.

රිවිදින අරුණැල්ල

ඉරිදා උදෑසන විකාශනය වන බෙහෙවින් ජනප්‍රිය රූපවාහිනී වැඩ සටහනක් වන රිවිදින අරුණැල්ල සඳහා දායකත්වය සපයන්නේ අප විසිනි.

සම්මාන රැසකින් පිදුම් ලබා ඇති මේ වැඩ සටහන, තිරසර කෘෂිකර්මය, කාබනික වගා ක්‍රම, වැසි ජල සංරක්ෂණය හා පරිසර පද්ධති සංරක්ෂණය කෙරෙහි ජනතා අවධානය බිහි කරලීමෙහි නිරත වේ. මෙමගින් නිරතුරුවම සිතට කාවද්දන සංකල්පය වන්නේ වගාව ගැමි ගොවියන්ට පමණක් සීමා වන රස්සාවක්ම නොව නාගරික කොන්ක්‍රීට් වනාන්තරයේ වුව අත්හදා බැලිය හැකි ජීවන - විලාසිතාවක් බවය. පරිසර හිතකාමී, වස විසෙන් තොර කෘෂිකාර්මික පරිචයෙන් ඔබ්බට ද යන මේ වැඩ සටහන් සෞඛ්‍ය හා පෝෂණය ද ප්‍රශස්ත ආහාර හා ආහාර සුරක්ෂිතතාවය ද කාන්තා බල ගැන්වීම හා දිළිදු බව දුරුලීම කරා ද යොමුවෙයි. වැඩසටහන මඟින් ඉස්මතු කරන නිර්මාණශීලී කෘෂිකාර්මික අත්හදා බැලීම් අතර, පෝච්චි තුළ වගාව, චිල්ලෙන උයන් වතු, පලා සිලින්ඩර හා ඉවතලන ටයර් උපයෝගී කරගත් චිලවළු පාත්ති ද වේ.

හරිත වන සංසදය

පරිසර සංරක්ෂණය හා පරිසර දැනුවත් බව අරමුණු කරගත් සමාජ සජීවීකරණයෙහි නියුතු දේශීය ස්වේච්ඡා සංවිධානයක් වන හරිත වන සංසදය මේ වන විට බිම් මට්ටමට ගොස් ඇත්තේ පාසැල් ප්‍රජාව තුල පාරිසරික ක්‍රියාකාරිත්වයන් ප්‍රවර්ධනය කරමිනි. මෙහි යටි අරුත වන්නේ තුලිත මෙන්ම ප්‍රශස්ත අධ්‍යාපනික වටපිටාවක් බිහි කිරීමය. සම්මාන දිනා ඇති මේ සංවිධානය පාසල් අතර වාර්ෂික තරඟාවලියක් මෙහෙයවයි. මෙහිදී, හොඳම සංරක්ෂණ ක්‍රියාදාම හා පාරිසරික නිර්මාණශීලීත්වය සහිත පාසල් තෝරා සම්මාන ප්‍රදානය කෙරේ. වැඩසටහනේ හරය, යොමුවන්නේ කසල කළමණාකරණ ආයාසයන්, ගෙවතු වගාව, කෘෂිකාර්මික බෝග, වන වගාව, පරිසරය හා අනුගත වන නිර්මාණශීලී ඉදි කිරීම් (පොකුණු, කුඩා ජලාශ හා කටු මැටි නිවෙස්) පන්ති කාමර සංරක්ෂණය, මල් සහ විසිතුරු පැලෑටි යනාදිය කෙරේය.

බැංකුව, පිට පිට තෙවන වතාවටත් මේ සඳහා අනුග්‍රහය සැපයුවේ දිස්ත්‍රික්, පළාත් හා ජාතික මට්ටමේ සම්මාන සඳහා මුල්‍ය දායකත්වය සළසමිනි.

අපේ ගනුදෙනුකරුවන් හා අන්තර් - සබඳතා

මුල්පෙලේ පාර්ශවකාර කණ්ඩායමක් වන අප ගනුදෙනුකරුවෝ, සිය ව්‍යාපාරික කටයුතු අතරතුර පාරිසරික සමතුලනයට යම් බලපෑමක් එල්ල කරති. මෙය වඩාත් විද්‍යාමාන වන්නේ කෘෂිකර්මය, කෘෂි-ව්‍යාපාර හා කර්මාන්ත කටයුතුවල නිරත ගනුදෙනුකරුවන් අතරය. මෙය බෙහෙවින් සංවේදී විෂයයක් වන්නේ මෙහිලා පාරිසරික අවධානය, සංවර්ධනය හා ස්වාභාවික සම්පත් පරිභෝජනය අතර ගැටුමක් නිර්මාණය වීමේ ඉඩකඩ නිසාය. ගනුදෙනුකරුවන්ගේ ව්‍යාපාරික කටයුතු සංවර්ධනයට උරදෙන අතරතුරේ අපි තිරසර පැවැත්ම පිළිබඳ බෘන්ට්ලෑන්ඩ් කොමිසමේ නිර්වචනය, රියෝ මූලධර්මයන්හි ගැනෙන පෙර - ආරක්ෂණ ප්‍රවේශය හා අනෙකුත් තිරසර පැවැත්ම සාධක පිළිබඳව ද සැලකිලිමත් වන්නෙමු. එය ඇත්තෙන්ම, අතුරේ යාමකි.

එහෙත්, මුල්පෙලේ ජාතික බැංකුව වන අපි, අතුරේ යාමට හුරුව සිටින්නෙමු.

අපි, ණය පිරිනැමීමේ මෙහෙයුම් ක්‍රියාවලිය තුල, පාරිසරික මඟ පෙන්වීම් පෙදින් පෙද ඇතුලත් කරන්නෙමු.

පාරිසරික බලපෑම් කළමනාකරණ රාමුව

සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපෘති හා ව්‍යවසායකයන් සර්වග්‍රාහී පාරිසරික බලපෑම් කළමනාකරණ රාමුවක් තුලට ගෙනැවිත් ඇත. මෙහිදී පූර්ව - අනුමත කිරීම් අදියර (ඉවත් කිරීමේ ලයිස්තුව, මූලික පෙරීම, බලපෑම් මට්ටම් අනුව වර්ගීකරණය) මෙන්ම පශ්චාත් - මුදා හැරීම් (අධීක්ෂණය හා පසු විපරම්) අදියර ද ආවරණය කෙරේ.

ව්‍යාපෘති ඇගයීමේ දී සාධක හා ප්‍රමාණන මිම් පරාසයක් උපයෝගී කරගනු ලැබේ. මේ අතර පහත දැක්වෙන දෑ මුල් තැනක් ගනී.

- අවදානම් සහගත පාංශු බාදනය ද ඇතුළුව පසේ තත්ත්වය
- භූගත ජලයේ ස්වභාවය, ගැඹුර හා ප්‍රමාණවත් බව
- වැසි ජලය රොක් වීම හා මුදා හැරීම.
- පොළව හෑරීම නිසා සිදුවන ජලය රඳා පැවතීම්
- පවත්නා ඉඩම් පරිහරණ පිළිවෙත් හා දෘශ්‍යමාන ගැටළු
- ස්වභාවික සම්පත් කළමනාකරණය පිළිබඳ මතු විය හැකි ගැටළු
- පාරිසරික පද්ධති වාස භූමි අවදානම් කලාප හා තර්ජිත සත්ව හා ජීවී විශේෂ අභිමි වීමේ අවදානම
- ස්වභාවික සම්පත් කළමණාකරණය පිළිබඳ මතු විය හැකි ගැටළු
- මෙහෙයුම් හා ප්‍රවාහන අතරතුර අන්තරායකාරී අපද්‍රව්‍ය, විෂ සහිත දෑ හා රසායනික මුදාහැරීම්
- ශබ්ද මට්ටම් හා මෙහෙයුම් ආශ්‍රිත භූගත කම්පන
- පවත්නා පරිසරය වෙනස් කරලීමට හේතුකාරකයන්

හරිත ආයෝජන

අනාගතය භාර වී ඇත්තේ හරිත ආයෝජනයන්ට බව අපේ හැඟීමයි. මේ ක්ෂේත්‍රයේ පුරෝගාමී මෙහෙවරක් ඉටු කරනු ඇත්තේ දේශගුණික ව්‍යාපාර මූල්‍යකරණය, ජල/සුලං/සූර්ය බල ප්‍රභවයන් තුලින් විකල්ප බලශක්ති ජනනය, කාබනික කෘෂිකර්මය හා ස්වාභාවික බීජ ප්‍රරෝහණය, වන වගාව හා පුනර්ජනනය කළ හැකි දැව, කසල ප්‍රතිචක්‍රීකරණය හා පාරිසරික පද්ධති මෙන්ම වාස භූමි උදෙසා බලපෑමක් ගෙන නොවන සංචාරක ව්‍යාපාරය ය. අපි, හරිත ආයෝජන කෙරේ අපේ මූල්‍ය දායකත්වය ඉහල නැංවීම සඳහා අරුත් බර ක්‍රියාමාර්ග ගෙන ඇත්තෙමු. මෙහිලා අපේ ණය කළඹ රු. බිලියන 2.5 ඉක්මවා ඇත.

පුරෝගාමිත්වය	අරමුදල් සැපයුම රු.මිලියන
රොස් හයිඩ්‍රෝපවර් (පුද්ගලික) සමාගම මාතලේ, මැටිහක්ක ප්‍රදේශයේ මෙගාවොට් 4.6 ක ධාරිතාවක් සහිත ජල විදුලි බලාගාරයක් පිහිටුවීමට බලාපොරොත්තු වේ. සුදු ගඟ ආශ්‍රිත මේ භූමියේ 1928 සිට පැවත එන කුඩා විදුලි බලාගාරයකි. යෝජිත බලාගාරය සඳහා මේ පැරණි බලාගාරයට නුදුරින් ගඟ හරහා වේල්ලක් තැනීමට අපේක්ෂා කරයි. මේ සඳහා පරිසර අනුමැතිය ලැබී ඇත.	320
ඉකෝ ෆ්‍රෙන්ඩ්ලි පවර් ඩිවලපර්ස් (පුද්ගලික) සමාගම රත්නපුර දිස්ත්‍රික්කයේ වේවැල්වත්තේ දෙනවක ගඟ හරහා වේල්ලක් ඉදි කොට මෙගා වොට් 1.2 ක ධාරිතාවයකින් යුතු ජල විදුලි බලාගාරයක් සැලසුම් කර ඇත. මෙහි පාරිසරික බලපෑම් වාර්තාව නිම කර ඇති අතර වේල්ල, වාන්දොර, ජල මාර්ගය හා බලාගාරය සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය හිමි වී ඇත.	150
සෙනොක් වින්ඩ් එනර්ජි (පුද්ගලික) සමාගම හා සෙනොක් වින්ඩ් රිසෝසස් (පුද්ගලික) සමාගම එක්ව, කල්පිටිය, මාම්පුරි හි සුලං බලාගාර යුගලයක් ස්ථාපිත කිරීමට කටයුතු සලසා ඇත. එක් බලාගාරයක ධාරිතාව මෙගාවොට් දහයකි. මෙම ව්‍යාපෘතිය පුනර්ජනන බලශක්ති ප්‍රභවයක් වන සුළං බලය උපයෝගී කර ගනු ඇති අතර, පොසිල ඉන්ධන හා තාප බලය මත යැපීම අවම කරනු ඇත.	670
රොසෙන් ලංකා (පුද්ගලික) සමාගම උඩවලව තණමල්විල පාරේ පරිසර - හිතකාමී නිකේතනයක් ආරම්භ කර ඇත. මේ, උඩවලව වනෝද්‍යානය ආශ්‍රිතව බිහිව ඇති නිකේතන දාමයට අළුත්ම එක්වීමය. ප්‍රදේශයේ එකම තරු තුනේ පහසුකම වන මෙය අවට පරිසරය හා කදිමට අනුගත වී ඇත. ඉදිකිරීම්වල දී බිම හෙලන ලද්දේ අවම හා අවශ්‍යම ගස් පමණකි. නිකේතනයේ කැපී පෙනෙන අංගයක් වනුයේ යාබද මාබොටු ඔයේ ජලයෙන් පෝෂිත වන, මනාව වැඩුණු කුඹුක් තුරු සෙවණක් මැද පිහිටි පිහිනුම් තටාකය ය. මෙම ව්‍යාපෘතිය තුල මලාපවාහන පිරිසිදු කිරීමේ ඒකකයක් හා අපජලය පවිත්‍රතා අංශයක් ද එකතු කර ඇත්තේ එහි ප්‍රකාශිත පරිසර - හිතකාමී බව තවත් උද්දීපනය කරමිනි.	410
ජංගල් බීච් රිසෝට්ස් (පුද්ගලික) සමාගම ත්‍රිකුණාමලයේ කුච්චාවේලි හි පැතිරුණු වෙරළ තීරයේ ස්ථාපිත තවත් පරිසර හිතකාමී නිකේතන ව්‍යාපෘතියකි. මෙහි වෙරළබඩ මැදුරු පණහක් ඉදි කොට ඇත්තේ හාත්පස පරිසරයට අවම බලපෑමක් වන පරිද්දෙනි.	295
ඇසෝසියේටඩ් රිසෝට් ඩිවලපර්ස් (පුද්ගලික) සමාගම මඩකලපුව පාසිකුඩා හි පරිසර හිතකාමී වෙරල කුටි 48 කින් සමන්විත උගාබේරිසෝට් හි හිමිකරුවාය.	270
අලියා රිසෝට්ස් හා ස්පා (පුද්ගලික) සමාගම තවමත් කලල අවස්ථාවේ පවතී. මෙහි ව්‍යාපෘති ප්‍රවර්ධකයෝ වියළි කලාපීය ස්වභාව සෞන්දර්යය හා කදිමට මුසු වන ගෙපැල මාදිලියේ නිකේතනයක් සීගිරිය ආසන්නයේ ස්ථාපිත කරන්නට සැලසුම් කරති.	**ඇ.ඩො මිලියන** 3.7

සිද්ධි අධ්‍යයනයක්

අප හෝමාගම ශාඛාව විසින් මූල්‍යකරණය කරන ලද පරිසර හිතකාමී ව්‍යාපෘතියක් දිදුලන උදාහරණයක් සේ ඉස්මතු වෙයි. ඒ හැටි බරසාර නොවූ රු.මිලියන දහයක ආයෝජනයක් වන මේ ව්‍යාපෘතිය ජනාකීර්ණ උප-නාගරික පරිසරයක වුව කල හැකි දෑ මොනවට විදහා පායි. අවශ්‍ය වන්නේ කුඩා සිතුවිල්ලක්, නිර්මාණශීලීත්වයක් හා කැටුව එන කැපවුණු මූල්‍ය සපයන්නෙකුගේ අත්වැලය.

පරිසරය ගැන සැලකිලිමත් වෙමින් - ඒපී ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම

අජිත් රෝහණ මහතා සිය දිවිය ඇරඹුවේ උප - නාගරික පොළිතින් කම්හලක සේවකයෙකු හැටියට ය. කම්හලේ වෙහෙසකර රාජකාරී අතරතුර ඔහු සිත යොමු කළේ තමන්ගේම ව්‍යාපාරයක් ඇරඹුම කරාය. රැකියාවෙන් ඉවත් වූ ඔහු නිවෙස්, කාර්යාල හා කම්හල් තුල එකතු වන පොළිතින් අපද්‍රව්‍ය එකතු කරන්නට පටන් ගත්තේය. වසර 1 1/2 තරම මේ කාර්යේ නිරතව උන් ඔහුට තමන්ගේම ව්‍යාපාරයක් පටන් ගන්නට මුදලක් එකතු කර ගත හැකි විය. ඔහු කළේ කොට්ටාව මාලපල්ලේ පිහිටි සිය උරුම නිවසෙහි කුඩා පරිමාණයේ පොළිතින් ප්‍රතිචක්‍රීකරණ ඒකකයක් පටන් ගැනීමය. ඔහු සහ එක් මිතුරෙක් මෙහි විසිහතර පැය පුරා වෙහෙස විය. දෛනික නිෂ්පාදනය කිලෝග්‍රෑම් 600-700 අතර විය.

ඒ,1998 ගණාන්වල ය. අද වන විට ඔහුගේ මෙහෙයුම් මාලපල්ල හා මීගොඩ පිහිටි කම්හල් තුනකට ව්‍යාප්තව ඇත. අක්කර පහක සුවිසල් භූමියක පිහිටි මීගොඩ කම්හල ආරම්භ කරන ලද්දේ 2004 වසරේදීය. පාවිච්චි කොට ඉවත දමන පොළිතින් කම්හල් භූමිය තුලදීම මිලයට ගනු ලැබේ. කර්මාන්තය හා නිතිපතා සම්බන්ධ මහා-පරිමාණ සැපයුම්කරුවෝ 15 දෙනෙක් පමණ වෙති.

ව්‍යාපෘතිය ටියුලිප් මළු, කිලිටි රෙදි බහාලූ හා පොළිතින් මෙන්ම පොළිප්‍රොපලින් පටල ද නිෂ්පාදනය කරන්නේ ඉවත දමන පොළිතින් භාවිතා කරමිනි. දැනට දෛනික නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 50-60 අතර වේ. මාසික පිරිවැටුම රු.මිලියන 5 ක් තරම වේ.

මේ සියල්ල, ලංකා බැංකුවෙන් පිරිනැමුණු රුපියල් මිලියන 10 ක සුමක ණය මුදලක් හා පසුව වරින් වර සැපයූ කෙටි කාලීන මූල්‍ය පහසුකම් තුලිනි.



Tel : +94-11-2421878-79-70
+94-11-2387002-03
Fax : +94-11-2336064
E-mail : bdopartners@bdo.lk
Website : www.bdo.lk

Chartered Accountants
"Charter House"
65/2, Sir Chittampalam A Gardiner Mawatha
Colombo 02
Sri Lanka

තිරසර පැවැත්ම පිළිබඳ වාර්තාව 2012 සම්බන්ධයෙන් ලංකා බැංකුවේ පාර්ශ්වකරුවන් වෙත යොමු කෙරෙන ස්වාධීන සහතික වාර්තාව

හැඳින්වීම හා ප්‍රතිඥාත වපසරිය

ලංකා බැංකුවේ (බැංකුව) කළමනාකාරිත්වය, තිරසර පැවැත්ම 2012 පිළිබඳව (වාර්තාව) පහත දැක්වෙන අංගයන් පිළිබඳ ස්වාධීන සහතිකයක් සැපයීම සඳහා අපට භාර කර ඇත.

- වාර්තාවේ පිටු අංක 209 සහ 210 හි සඳහන් කර ඇති මූල්‍ය කාර්ය සාධන තොරතුරු පිළිබඳ සාධාරණ සහතිකයක්
- වාර්තාවේ අඩංගු ප්‍රධාන කාර්යඵල දර්ශක හා අනෙකුත් තොරතුරු පිළිබඳ සීමිත සහතිකයක්

වාර්තාව පිළිබඳ කළමනාකාරිත්වයේ වගකීම

තිරසර පැවැත්ම පිළිබඳ බැංකුවේ පරිචයන් හා ගෝලීය වාර්තාකරණ මුල් පිරීම (GRI-G3) තිරසර බව වාර්තාකරණ මඟ පෙන්වීම් අනුරූපීව වාර්තාව සකස් කිරීම හා ඉදිරිපත් කිරීම බැංකුවේ කළමණාකාරිත්වයට පැවරෙන වගකීමකි. මේ වගකීම් තුළ, සෙසු දෑ අතර, පාර්ශ්වකරුවන් හා වැදගත් විෂයයන් හඳුනා ගැනීම, වාර්තාකරණය උදෙසා තිරසර පැවැත්ම කාර්යඵල නිර්ණායක තීරණය කිරීම, යෝග්‍ය කාර්යාවලී හා කාර්යඵල නිර්ණායක මිනුම් කොට වාර්තාකරණය සඳහා අභ්‍යන්තර පාලන පද්ධති ස්ථාපිත කිරීම ද ඇතුළත් වේ.

අපේ වගකීම

අපේ වගකීම වන්නේ සහතික කිරීමේ ප්‍රතිඥාත උදෙසා ශ්‍රී ලංකා ප්‍රමිතිය (SLSAE-3000), ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති විගණනය හා වෛතිහාසික මූල්‍ය තොරතුරු පුනරීක්ෂණය හැර සහතික කිරීම් ප්‍රතිඥාත මත පදනම්ව, සාධාරණ හා සීමිත සහතික කිරීම් ප්‍රතිඥාතයක් ඉටු කිරීම හා ඒ ගැන නිගමන ප්‍රකාශ කිරීමය.

සාධාරණ සහතිකය යනු ඉහළ මට්ටමේ තහවුරුවකි. එසේ වුවත්, එය නියත සහතිකයක් නොවන්නේ සාධාරණ ප්‍රතිඥාතය තුළ දක්නට ඇති ඊටම ආවේණික සීමාවන් නිසාය.

සීමිත සහතික ප්‍රතිඥාතයක් ,සාධාරණ සහතික ප්‍රතිඥාතයකට වඩා සැලකිය යුතු තරම් අඩු වපසරියකින් යුක්ත වන අතර, ඒ හේතුව නිසාම, සාධාරණ සහතික ප්‍රතිඥාතයක හඳුනාගත හැකි සියළුම වැදගත් අංග පිළිබඳව දැනුවත් වේ යැයි තහවුරු කරලන්නට හැකියාවක් ලබා නොදේ.

මෙම වාර්තාව ඉදිරිපත් කරනුයේ හුදෙක් බැංකුවට පමණක් වන අතර, ඒ 2013 පෙබරවාරි 10 දිනැති අපගේ ප්‍රතිඥාත ලිපිය හා අනුරූපවය. බැංකුව හැර වෙනත් පුද්ගලයෙකු හෝ මෙය සකස් කළ හේතුව හැර අන් හේතුවක් සඳහා හෝ මෙම වාර්තාව මත විශ්වාසය රැඳවීමේ වගකීම පිළිබඳව කවර හෝ ආරෝපණයක් අපි, ප්‍රතික්ෂේප කරන්නෙමු. අපගේ ප්‍රතිඥාත හැසිරවීමේ දී, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කළ වෘත්තීය ගණකාධිකාරීන් සඳහා ආචාර ධර්ම සංග්‍රහයේ ස්වාධීන අවශ්‍යතාවනට අනුකූලව කටයුතු කළෙමු.

ඉටු කළ ප්‍රතිඥාත පිළිවෙත

මූල්‍ය තොරතුරු

අපි වාර්තාවේ පිටු අංක 209 සහ 210 හි සඳහන් මූල්‍ය කාර්යඵල තොරතුරු 2011 හා 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා විගණනය කළ මූල්‍ය ප්‍රකාශ හා සැසඳුවෙමු.

ප්‍රධාන කාර්යඵල දර්ශකය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ප්‍රධාන කාර්යඵල දර්ශක දත්ත/තොරතුරු පිළිබඳ විශ්වාසනීයත්වය පහත දැක්වෙන සමාලෝචන මත පුනරීක්ෂණය කළෙමු.

- මේ තොරතුරු ජනිත, සංයුක්ත හා වාර්තා කරන්නට උපයෝගී කර ගත් පිළිවෙත්
- අදාළ ව්‍යාපාරික අංශ විසින් ආයතනික මට්ටමට වාර්තා කළ තොරතුරු
- ව්‍යාපාරික මෙහෙයුම් හා ආයතනික මට්ටමේදී මේ තොරතුරු වලංගු කිරීම සඳහා භාවිත කළ කාර්යාවලීන්
- කළමනාකාරිත්වය හා සාකච්ඡා කළ තොරතුරු උපනතීන්

BDO Partners, a Sri Lankan Partnership, is a member of BDO International Limited, a UK company limited by guarantee, and forms part of the international BDO network of independent member firms.

Partners : S. Rajapakse FCA, MBA. Ms. M.S.E.Raymond FCA. S. G. Ranjith ACA. Tishan H. Subasinghe FCA, CISA
H.S.Rathnaweera ACA. Ashane J.W. Jayasekara ACA. MBA. H.M. Saman Siri Lal ACA
Consultant : V. Sinnadorai FCA

වාර්තාව

- බැංකු විසින් ඉටු කළ ගණනය, නියැදි පදනමක් මත යළි ගණනය කිරීම

අනෙකුත් තොරතුරු

අපි වාර්තාවේ ඉදිරිපත් කර ඇති සෙසු තොරතුරු උදෙසා පහත දැක්වෙන සහතික පිළිවෙත සැලසුම් කොට ක්‍රියාත්මක කළෙමු.

- වාර්තාව සඳහා තොරතුරු රැස් කිරීමේ, සංයුක්ත කිරීමේ හා වාර්තාකරණයේ කාර්යාවලීන් අවබෝධ කර ගැනීම සඳහා බැංකුවේ අදාළ පාර්ශ්වයන් වෙතින් විමසුම් කිරීම.

- වාර්තාවේ සඳහන් තොරතුරු ජනිත, සංයුක්ත හා ඉදිරිපත් කිරීම සඳහා භාවිතා කළ පිළිවෙත් විමර්ශනය.

- ඉහළ කළමනාකාරිත්වය, ආයතනික මට්ටමේ කාර්ය මණ්ඩලය හමු වී සාකච්ඡා කොට, තිරසර පැවැත්ම උපාය මාර්ග හා ප්‍රතිපත්ති හා බැඳුණු සාධක ද, ඒවා බැංකුවේ මෙහෙයුම් ක්‍රියාවලිය ඔස්සේ ක්‍රියාත්මක කරන අන්දම ද උකහා ගන්නා ලදී.

- වාර්තාවේ අඩංගු තොරතුරු විමර්ශනය කොට සත්‍යාපණය කිරීම.

- වාර්තාවෙන් ඉදිරිපත් කර ඇති තොරතුරු, බැංකුවේ තිරසර පැවැත්ම කාර්යාවලය පිළිබඳ අපේ සමස්ත දැනීම මත හා අවබෝධය සමඟ අනුගත වන්නේ ද යන්න තීරණය කර ගැනීම උදෙසා එකී වාර්තාව කියැවීම.

නිගමනය

ඉහතින් සඳහන් කර ඇති ආකාරයට, ඉටු කළ පිළිවෙත් මත පදනම් ව, අපි මෙසේ නිගමනය කරමු.

- වාර්තාවේ පිටු අංක 209 සහ 210 හි දක්වා ඇති මූල්‍ය කාර්යාවල තොරතුරු 2012 හා 2011 දෙසැම්බර් 31 වන දිනට බැංකුවේ විගණනය කළ මූල්‍ය ප්‍රකාශවලින් නිසි සේ උකහා ගෙන ඇත.

- මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති කාර්යාවල දර්ශක සහ අනෙකුත් තොරතුරු, GRI (G3.1) තිරසර පැවැත්ම මඟ පෙන්වීම් තුළින් ජනිත වන බැංකුවේ තිරසර පැවැත්ම පරිචයන් හා ප්‍රතිපත්තිවලට අනුකූලව ඉදිරිපත් කර නැතැයි විශ්වාස කරන්නට හේතු කාරක වන කිසිවක් අපේ අවධානයට ලක් වී නැත.

BDO Partners

වරලත් ගණකාධිකාරිවරු

2013 අප්‍රේල් 8 වන දින
කොළඹ දීය.

G3.1 සම්මත හෙළිදරව් කිරීමේ දර්ශකය

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
1	**උපාය මාර්ග හා විශ්ලේෂණය**		
1.1	ආයතනයේ වඩාත්ම ජ්‍යෙෂ්ඨ තීරණ ගන්නාගේ වාර්තාව (උදා :- ප්‍රධාන විධායක, සභාපති හෝ ඒ හා සමාන ඉහළ තනතුරු), ආයතනයට තිරසර පැවැත්ම හා ඇති සම්බන්ධය හා එහි උපාය මාර්ග පිළිබඳව කරනු ලබන ප්‍රකාශ	තිරසර පැවැත්ම	158
1.2	ප්‍රධාන පෙළේ බලපෑම්, අවදානම් හා අවස්ථාවන්	තිරසර පැවැත්ම	160
2	සංවිධාන ආකෘතිය		
2.1	ආයතනයේ නම	ලංකා බැංකුව	
2.2	මූලික සන්නාම, නිෂ්පාදන/සේවා	නිෂ්පාදන/සේවා	358-365
2.3	ආයතනයේ මෙහෙයුම් ව්‍යුහය ප්‍රධාන අංශ මෙහෙයුම් සමාගම්, පරිපාලිතයන් හා හවුල් ව්‍යවසායයන්	කළමණාකරණ විවරණය	54-93
2.4	ආයතනයේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම	01, "ලංකා බැංකු චතුරස්‍රය" ලංකා බැංකු මාවත කොළඹ 01	
2.5	ආයතනය මෙහෙයුම් කටයුතු කරන රටවල් සංඛ්‍යාව, ඒවායේ නම්, ප්‍රධාන ක්‍රියාකාරකම් හෝ තිරසර පැවැත්මට විශේෂයෙන් අදාළ වන ක්‍රියාකාරකම්	තිරසර පැවැත්ම	166, 176
2.6	හිමිකම් ස්වභාවය හා නෛතික තත්වය	පසුපස ඇතුල් කවරය	
2.7	සේවා වෙළඳපල (භූගෝලීය ව්‍යාප්තිය සේවා සපයන ක්ෂේත්‍ර, ගනුදෙනුකාර කාණ්ඩ හා අර්ථලාභීන්)	කළමණාකරණ විවරණය හා විශ්ලේෂණය	54-93
2.8	වාර්තාකරණ ආයතනයේ පරිමාව	ව්‍යාපාරික කඩඉම්	4-5
2.9	වාර්තාගත කාලසීමාව තුළ ප්‍රමාණය, ව්‍යුහය හා හිමිකමේ සිදුවූ සැලකිය යුතු වෙනස්වීම්	තිරසර පැවැත්ම	154-157
2.10	වාර්තාගත කාල සීමාව තුළ ලද සම්මාන	තිරසර පැවැත්ම	167
3	වාර්තාකරණ පරාමිතීන්		
3.1	වාර්තාකරණ කාල පරිච්ඡේදය (උදා:- මූල්‍ය වර්ෂය/ලිත් වර්ෂය)	2012 ජනවාරි 01 දා සිට 2012 දෙසැම්බර් 31 තෙක්	
3.2	වඩාත් ආසන්නතම වාර්තාවේ දිනය	දෙසැම්බර් 2011	
3.3	වාර්තාකරණ චක්‍රය (වාර්ෂික/ද්විවි වාර්ෂික ආදී වශයෙන්)	වාර්ෂික	
3.4	වාර්තාව හෝ එහි අඩංගු දෑ පිළිබඳව විමසුම් ලබා ගත හැකි ස්ථානය	තිරසර පැවැත්ම	153
3.5	වාර්තා අන්තර්ගත නිර්වචනය	තිරසර පැවැත්ම	153
3.6	වාර්තාවේ ආවරණීත සීමාව	තිරසර පැවැත්ම	153
3.7	වාර්තාවේ විෂය පථය හෝ ආවරණීත සීමාව හා බැඳි විශේෂිත සීමා	තිරසර පැවැත්ම	153
3.8	හවුල් ව්‍යවසායන්, පරිපාලිත සමාගම්, කල්බදු පහසුකම්, බාහිරව සේවා සපයා ගැනීම හා කාලසීමාවෙන් කාලසීමාවට මෙන්ම ආයතන අතර සංසන්දනය කෙරේ. සැලකිය යුතු මට්ටමකින් බලපෑ හැකි අනෙකුත් අස්තිත්ව පිළිබඳව වාර්තා කිරීමේ පදනම	තිරසර පැවැත්ම	154
3.9	වාර්තාවේ දර්ශකයන් හා අනෙකුත් තොරතුරු සම්පාදනය කිරීම පදනම් වූ නිමානයන් හා උපකල්පන ද ඇතුළුව දත්ත මාපන විධික්‍රම හා ගණනය කළ පදනම	තිරසර පැවැත්ම	154
3.10	පෙර වාර්තාවේ තොරතුරු පිළිබඳ පුන ප්‍රකාශයක් වේ නම් ඉන් මතුවන ප්‍රතිඵලය ගැන විස්තරයක් හා එබඳු පුන ප්‍රකාශයකට හේතු	තිරසර පැවැත්ම	154
3.11	පෙර වාර්තාකරණ කාලච්ඡේද හා අනුරූප තිරසර පැවැත්ම විෂය පථය, ආවරණය හා මිනුම්කරණ ක්‍රමවේද යනාදියේ සැලකිය යුතු වෙනසක් වූයේ නම් ඒ පිළිබඳ විස්තර	තිරසර පැවැත්ම	154
3.12	වාර්තාවේ සම්මත හෙලි කිරීම් පිහිටීම හඳුනා ගන්නා වගුව	තිරසර පැවැත්ම	217-223

G3.1 සම්මත හෙළිදරව් කිරීමේ දර්ශකය

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
3.13	වාර්තාව සඳහා බාහිර සහතිකයක් ලබා ගැනීමේ ප්‍රතිපත්තිය හා වත්මන් පරිචය	තිරසර පැවැත්ම	154
4	යහපාලනය බැඳුම් හා ප්‍රතිඥාත		
4.1	උපාය මාර්ග සැකසීම හා සම්මත සංවිධාන පාලනය බදු විශේෂිත කාර්යයන් සඳහා වගකීම දරන උසස්ම පාලන සමූහනය බදු විශේෂිත කාර්යයන් සඳහා වගකීම දරන උසස්ම පාලන සමූහනය යටතේ වන කමිටුව ඇතුළුව ආයතනයේ ව්‍යුහය	අධ්‍යක්ෂක මණ්ඩල හා උපකමිටු	138
4.2	ඉහළම යහ පාලන සමූහයේ ප්‍රධානියා, ඒ සමගම විධායක නිලධාරියෙක් වන්නේද යන වග	නැත	
4.3	ඒකීය මණ්ඩල ව්‍යුහයක් සහිත ආයතනවල උසස්ම පාලන සමූහනයේ ස්වාධීන/සහ/හෝ විධායක නොවන සාමාජිකයන් සංඛ්‍යාව	ආයතනික යහපාලනය	167
4.4	කොටස් හිමියන් හා සේවකයන්ට ඉහළම යහපාලන සමූහනයට නිර්දේශ හා විධාන සැපයීමේ යාන්ත්‍රණය	ආයතනික යහපාලනය	108-137
4.5	ආයතනයේ කාර්යඵලය සහ මණ්ඩලයේ සාමාජිකයන් ජ්‍යෙෂ්ඨ කළමණාකාරිත්වය හා විධායකයන්ගේ ප්‍රතිලාභ අතර ඇති සම්බන්ධතාවය	එවැන්නක් නැත	
4.6	බැඳියා පිළිගැටුම් වළක්වන බවට තහවුරු කරලනු සඳහා උසස්ම යහ පාලන සමූහනයේ ස්ථාපිත කර ඇති පිළිවෙත්	ආයතනික යහපාලනය	108-137
4.7	ආර්ථික, පාරිසරික හා සමාජයීය විෂයයන් ඔස්සේ ආයතනයේ උපාය මාර්ග මෙහෙයවීම සඳහා උසස්ම යහපාලන සමූහනයේ සාමාජිකයන්ගේ සුදුසුකම් හා විශේෂ දැනුම තීරණය කිරීමේ ක්‍රියාවලිය	ආයතනික යහපාලනය අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු	108-137 138-148
4.8	අභ්‍යන්තරිකව සංවර්ධනය කළ මෙහෙවර හෝ වටිනාකම පිළිබඳ ප්‍රකාශ, ආචාර ධර්ම පද්ධතිය හා ආර්ථික, පාරිසරික හා සමාජයීය ක්‍රියාවලීන් හා ඒවා ක්‍රියාත්මක කිරීමේ ප්‍රකාශන	අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු	138
4.9	ආයතනයේ උසස්ම යහ පාලන සමූහනයට අදාළ අවදානම් හා අවස්ථාවන් ද, ජාත්‍යන්තර සම්මත ප්‍රමිතීන්, ආචාර ධර්ම හා ප්‍රතිපත්තිවලට අනුගතවීම/ අනුකූලත්වය ඇතුළුව එහි ආර්ථික,පාරිසරික හා සමාජයීය කාර්ය සාධනය හඳුනා ගැනීම, කළමණාකරණය හා අධීක්ෂණය පිළිබඳව ඇති පිළිවෙත්	තිරසර පැවැත්ම හා ආයතනික යහ පාලනය	161 138
4.10	ආර්ථික, පාරිසරික හා සමාජයීය කාර්ය සාධනයට සැලකිල්ල දක්වමින් ආයතනයේ උසස්ම යහ පාලන සමූහනයට, සිය කාර්යවල ඇගයීම සඳහා වන කාර්යාවලී	තිරසර පැවැත්ම අධ්‍යක්ෂ මණ්ඩල හා අධ්‍යක්ෂ මණ්ඩල උපකමිටු	163 138
4.11	ආයතනය විසින් ආරක්ෂණවාදී ප්‍රවේශය හා ප්‍රතිපත්ති පිළිබඳ සලකා බලා තිබේ ද , එසේ නම් ඒ කෙසේද යන්න	තිරසර පැවැත්ම	168
4.12	බාහිරව සංවර්ධනය කරන ලද ආයතනය පිළිගන්නා හා සහභාගිත්වය සැපයූ ආර්ථික, පාරිසරික හා සමාජයීය ප්‍රඥප්ති, ප්‍රතිපත්ති හා අනෙකුත් පුරෝගාමී කාර්යයන්	තිරසර පැවැත්ම	168
4.13	කාර්මික සම්මේලන බදු සංගමයන්හි හෝ ජාතික සහ/ජාත්‍යන්තර පාර්ශ්වික සංවිධානයන්හි සාමාජිකත්වය	තිරසර පැවැත්ම	168

G3.1 සම්මත හෙළිදරව් කිරීමේ දර්ශකය

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
4.14	ආයතනය හා සම්බන්ධ පාර්ශවකරුවන්ගේ කණ්ඩායම් ලැයිස්තුව	තිරසර පැවැත්ම	154
4.15	සම්බන්ධකම් ගොඩ නැගිය යුතු පාර්ශ්වකරුවන් හඳුනා ගැනීම හා තෝරා ගැනීමේ පදනම	තිරසර පැවැත්ම	154
4.16	පාර්ශවකරුවන් හා ප්‍රතිඥාත ප්‍රවේශය, ප්‍රතිඥාත ස්වභාවය හා කණ්ඩායම් අනුව සංඛ්‍යාතය	තිරසර පැවැත්ම	154
4.17	පාර්ශ්වකරුවන් හා ප්‍රතිඥාත තුළින් මතු ප්‍රධාන විෂය හා සැලකිලිමත්වීම් සහ ආයතනය වාර්තා කිරීම ද ඇතුළුව මෙම විෂය හා සැලකිලිමත්වීම් පිළිබඳ ප්‍රතිචාර දැක්වූයේ කෙසේද යන්න	තිරසර පැවැත්ම	157
5	කළමණාකරණ ප්‍රවේශය හා ආර්ථික කාර්යඵල දර්ශක		
	ආර්ථික		
5.1	ආර්ථික අංග කෙරේ කළමණාකරණ ප්‍රවේශය	තිරසර පැවැත්ම	164
EC1	අයභාර, මෙහෙයුම් පිරිවැය, සේවක ප්‍රතිලාභ, පුණ්‍යාධාර,අනෙකුත් ප්‍රජා ආයෝජන, රඳවා ගත් ඉපැයීම් හා රජය හා ප්‍රාග්ධන සැපයුම්කරුවන්ට ගෙවීම ඇතුළුව උත්පාදනය කළ හා විසර්ජනය කළ සෘජු ආර්ථික අගය	තිරසර පැවැත්ම	209
EC2	දේශගුණික විපර්යාසය හේතුවෙන් ආයතනයේ කටයුතුවලට වූ මූල්‍යමය බලපෑම්, අනෙකුත් අවදානම් හා අවස්ථාවන්	සැලකිය යුතු බලපෑමක් නැත	
EC3	ආයතනයේ නිර්වචනය කළ ප්‍රතිලාභ සැලසුම් ආවරණය	තිරසර පැවැත්ම	202
EC4	රජයෙන් ලැබූ සැලකිය යුතු මූල්‍යාධාර	බැංකුව රජයෙන් සැලකිය යුතු මූල්‍ය ආධාර නොලබයි	
EC5	සැලකිය යුතු මෙහෙයුම් පිහිටීම් හි දේශීය අවම වැටුපට සාපේක්ෂව, පිවිසුම් තලයේ සම්මත වැටුප් අනුපාත පරාසය	තිරසර පැවැත්ම	201
EC6	සැලකිය යුතු මෙහෙයුම් පිහිටීම් හි දේශීය පදනම් සැපයුම්කරුවන් වෙනුවෙන් වියදම් දැරීමේ ප්‍රතිපත්තිය, පරිචය හා ප්‍රචාරණය	සැපයුම් ප්‍රතිපත්තිය මිලදී ගැනීමේ අත්පොත මගින් පාලනය වේ.	
EC7	සැලකිය යුතු මෙහෙයුම් පිහිටීම් හි දේශීය ප්‍රජාව තුළින් බඳවා ගන්නා ලද ජ්‍යෙෂ්ඨ කළමණාකාරීත්ව අනුපාතය සහ බඳවා ගැනීමේ පිළිවෙත	දේශීය බඳවා ගැනීම්	
EC8	මූලික වශයෙන් පොදු යහපත තකා වාණිජ, භාණ්ඩ හෝ පුණ්‍යාධාර ප්‍රතිඥාත මත සැපයූ යටිතල පහසුකම් ආයෝජන හා සේවාවන් සංවර්ධනය හා ඉන් ලද ප්‍රතිඵල	තිරසර පැවැත්ම	169-179
EC9	බලපෑමේ ප්‍රමාණය ද දක්වමින්, සැලකිය යුතු ආර්ථික බලපෑම් අවබෝධය හා පැහැදිලි කිරීම	තිරසර පැවැත්ම	211-214
	පාරිසරික		
5.2	පාරිසරික අංග පිළිබඳ කළමණාකරණ ප්‍රවේශය පිළිබඳ හෙලිදරව්ව	තිරසර පැවැත්ම	165
	ද්‍රව්‍ය		
EN1	බර හා පරිමාව අනුව භාවිත කළ ද්‍රව්‍ය	තිරසර පැවැත්ම	211
EN2	ප්‍රතිචක්‍රීකරණය කළ යෙදවුම් ද්‍රව්‍ය අනුපාතය	කිසිවක් නැත	
	බලශක්ති		
EN3	ප්‍රාථමික බලශක්ති ප්‍රභවය අනුව සෘජු බලශක්ති පරිභෝජනය	තිරසර පැවැත්ම	වාර්තා කොට නැත
EN4	ප්‍රාථමික බලශක්ති ප්‍රභවය අනුව වක්‍ර බලශක්ති පරිභෝජනය	වාර්තා කොට නැත	
EN5	සංරක්ෂණය හා කාර්යක්ෂමතාවය මත ඉතිරි කළ බලය	තිරසර පැවැත්ම	211
EN6	බල කාර්යක්ෂමතාවය හෝ යළි භාවිත කළ හැකි බලය මත පදනම් වූ නිමැවුම් හා සේවා වෙනුවෙන් දරන ප්‍රයත්න හා එබදු ප්‍රයත්නයන්හි ප්‍රතිඵලයක් සේ බල අවශ්‍යතා අඩු කරලීම	තිරසර පැවැත්ම	211
EN7	වක්‍ර බල පරිභෝජනය අවම කරන්නට දැරූ ප්‍රයත්න හා ලද අඩු කිරීම්	වාර්තා කොට නැත	
	ජලය		
EN8	ප්‍රභවය අනුව ලබා ගත් ජලය	සැලකිය යුතු මට්ටමක නැත	

G3.1 සම්මත හෙළිදරව් කිරීමේ දර්ශකය

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
EN9	ජලය ලබා ගැනීම හේතුවෙන් සැලකිය යුතු මට්ටමකට බලපෑමට ලක් වූ ජල මූලාශ්‍ර	සැලකිය යුතු මට්ටමක නැත	
EN10	ප්‍රතිචක්‍රීකරණය කොට යළි භාවිත කළ ජලයේ පරිමාව හා ප්‍රතිශතය	කිසිවක් නැත ජලය ප්‍රතිචක්‍රීකරනය කර නැත.	
EN11	සංරක්ෂිත ප්‍රදේශ තුළ හා සංරක්ෂිත ප්‍රදේශවලින් පිටත ඉහළ ජෛව විවිධත්ව අගයක් සහිත ප්‍රදේශ තුළ හෝ ඊට යාබදව, අයිති, බදුගත් හෝ කළමනාකරණය කළ භූමි ප්‍රමාණය හා පිහිටීම	බැංකුවේ මෙහෙයුම් ඒකක සංරක්ෂිත ප්‍රදේශ තුල හෝ ඉහළ ජෛව විවිධත්ව අගයන් සහිත ප්‍රදේශ තුල පිහිටා නැත.	
EN12	සංරක්ෂිත ප්‍රදේශ තුළ හා සංරක්ෂිත ප්‍රදේශවලින් පිටත ඉහළ ජෛව විවිධත්ව අගයක් සහිත ප්‍රදේශ තුළ ක්‍රියාකාරකම්, නිමැවුම් හා සේවා මගින් ජෛව විවිධත්වයට ඇති සැලකිය යුතු බලපෑම පිළිබඳ විස්තරය	බැංකුවේ නිමැවුම් හෝ මෙහෙයුම් ජෛව විවිධත්වය කෙරෙහි බලපෑමක් නොකරයි	
EN13	සංරක්ෂිත හෝ පිළිසකර කළ ජීවී බිම්	කිසිවක් නැත	
EN14	ජෛව විවිධත්වය කෙරෙහි බලපෑම් කළමනාකරණය උදෙසා උපාය මාර්ග, වත්මන් ක්‍රියාකාරකම් හා අනාගත සැලසුම්	තිරසර පැවැත්ම	211-214
EN15	ජීවී බිම්වල මෙහෙයුම් නිත්‍ය බලපෑමට ලක් වූ, IUCN රතු ලයිස්තුවේ අඩංගු ජීව විශේෂ සංඛ්‍යාව, විනාශයට ලක් කිරීමේ මට්ටම මත	බැංකුවේ මෙහෙයුම් රතු ලැයිස්තුවේ අඩංගු ජීව විශේෂ කෙරෙහි බලපෑමක් නොකරයි	
	විමෝචන, අපවාන හා අපද්‍රව්‍ය		
EN16	බර අනුව සමස්ත සෘජු හා වක්‍ර හරිතාගාර විමෝචනය	අදාල නැත	
EN17	බර අනුව අනෙකුත් අදාළ හරිතාගාර වායු විමෝචනය	අදාල නැත	
EN18	හරිතාගාර වායු විමෝචනය අවම කිරීමට දැරූ ප්‍රයත්න හා එහි ප්‍රතිඵල	අදාල නැත	
EN19	බර අනුව ඕසෝන් ක්ෂය කරවන ධාතු විමෝචනය	අදාල නැත	
EN20	බර අනුව සල්පර් මොනොක්සයිඩ් හා වෙනත් වායු විමෝචන	අදාල නැත	
EN21	ගුණාත්මක බව හා ගමනාන්තය අනුව පිට කළ සමස්ත ජල ප්‍රමාණය	වාර්තා කොට නැත	
EN22	වර්ගීකරණය හා භාවිත කළ ක්‍රමය අනුව පිට කළ සමස්ත අපද්‍රව්‍ය ප්‍රමාණය	වාර්තා කොට නැත	
EN23	සැලකිය යුතු පිටාර පරිමාව හා සංඛ්‍යාව	අදාල නැත	
EN24	බාසල් සම්මුතිය - අතිරේක I,II,III, හා VIII අනුව අහිතකර අපද්‍රව්‍ය සේ සැලකෙන අපද්‍රව්‍ය ආනයනය, අපනයනය, ප්‍රවාහනය හෝ අපනයන ප්‍රමාණය හෝ පිළියම් කළ බර ප්‍රමාණය හා ජාත්‍යන්තරව ප්‍රවාහනය කළ ප්‍රතිශතය	කිසිවක් නැත	
EN25	වාර්තාකරණ ආයතනයේ ජලය මුදා හැරීම් හා පිටාර හේතුවෙන් සැලකිය යුතු මට්ටමක බලපෑමට ලක්වූ ජලාශ්‍රිත ප්‍රදේශ හා ඒ හා බැඳුණු ජීව බිම්වල ජෛව විවිධත්ව අගය, සංරක්ෂිත තත්වයන් හා ප්‍රමාණය	අපේ මෙහෙයුම්වලට අදාල නැත	
	නිමවුම් හා සේවා		

G3.1 සම්මත හෙළිදරව් කිරීමේ දර්ශකය

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
EN26	නිමැවුම් හා සේවාවන්හි පාරිසරික බලපෑම් වැලැක්වීමට ගත් පියවර හා වැළැක්වීමේ වපසරිය	කිසිවක් නැත	
EN27	යළි මුදා ගත හැකි නිමවුම් හා ඊට අදාළ ඇසුරුම් ද්‍රව්‍ය ප්‍රතිශතය, කාණ්ඩ අනුව	කිසිවක් නැත	
	අනුකූලතාව		
EN28	පාරිසරික නීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම මත පැනවුණු සැලකිය යුතු දඩයන් හි මූල්‍ය අගය හා මූල්‍ය නොවන සම්බාධක සංඛ්‍යාව	කිසිවක් නැත	
	ප්‍රවාහන කටයුතු		
EN29	ආයතනයේ මෙහෙයුම් සඳහා භාවිත කරන නිමැවුම්, අනෙකුත් භාණ්ඩ හා ද්‍රව්‍ය සහ සේවකයන් ප්‍රවාහනය කිරීමේ දී මතුවූ සැලකිය යුතු පාරිසරික බලපෑම	වාර්තා කොට නැත	
	සමස්ත කරුණු		
EN30	වර්ගීකරණය කරන ලද, සමස්ත පාරිසරික ආරක්ෂණ වියදම් හා ආයෝජන	තිරසර පැවැත්ම	211
	සමාජයීය		
5.3	සමාජ අංශ සඳහා කළමනාකරණ ප්‍රවේශය පිළිබඳ හෙලිදරව්ව	තිරසර පැවැත්ම	165
	ශ්‍රම පරිචයන් හා යහපත් වැඩ පරසරය		
LA1	වර්ගය, රැකියා හා ගිවිසුම හා ප්‍රදේශ අනුව සමස්ත සේවක මණ්ඩලය	තිරසර පැවැත්ම	199
LA2	වයස් කාණ්ඩය, හා ලිංග භේදය අනුව සේවක පිරිවැටුම් අනුපාතය හා සංඛ්‍යාව	තිරසර පැවැත්ම	198
LA3	ප්‍රධාන මෙහෙයුම් අනුව පූර්ණකාලීන කාර්ය මණ්ඩලයට සලසන, එහෙත් තාවකාලික හා අර්ධකාලීන සේවකයන්ට නොසලසන ප්‍රතිලාභ	තිරසර පැවැත්ම	201-207
LA4	සාමූහික කේවල් කිරීමේ ගිවිසුම් මඟින් ආවරණය වන කාර්ය මණ්ඩල ප්‍රතිශතය	තිරසර පැවැත්ම	165
LA5	මෙහෙයුම් වෙනස්කම් පිළිබඳව අවම දැනුම්දීමේ කාල සීමාව හා ඒ ගැන සාමූහික ගිවිසුමේ සඳහන් වේද යන්න	වාර්තා කොට නැත	
LA6	රැකියා ආශ්‍රිත සෞඛ්‍ය හා ආරක්ෂණ වැඩ සටහන් පසු විපරම්/උපදේශනය සඳහා සහාය වන, කළමනාකාරිත්වය හා සේවකයන් අතර ඒකාබද්ධ සෞඛ්‍ය හා ආරක්ෂණ කමිටුවල සේවක සහභාගීත්වයේ සමස්ත ප්‍රතිඵලය	තිරසර පැවැත්ම	206-207
LA7	ප්‍රදේශ අනුව, රැකියා ආශ්‍රිත ජීවිත හානි, තුවාල, රැකියා ආශ්‍රිත රෝගාබාධ, අහිමි වූ දින හා රැකියාවට නොපැමිණීමේ අනුපාතය	වාර්තා කොට නැත	
LA8	බරපතල රෝගාබාධ පිළිබඳව, කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පවුල් හෝ ප්‍රජාවට උපකාර කිරීම සඳහා ස්ථාපිත කර ඇති අධ්‍යාපනික, පුහුණුවීම්, උපදේශන නිවාරන හා අවදානම් - පාලන වැඩ සටහන්	තිරසර පැවැත්ම	206-207
LA9	වෘත්තීය සමිති හා විධිමත් ගිවිසුම්වලින් ආවරණය කළ සෞඛ්‍ය හා ආරක්ෂණ විෂයයන්	කිසිවක් නැත	
LA10	සේවක වර්ගීකරණය අනුව සැකසූ, වසරකට එක් සේවකයෙකු සඳහා පුහුණු පැය සාමාන්‍යය	තිරසර පැවැත්ම	205
LA11	සේවකයන්ගේ අඛණ්ඩ සේවය ලබා ගැනීමට හා වෘත්තීය සමාප්තිය කළමනාකරණයට සහාය සලසන කුසලතා පුහුණු හා ජීවිතාන්ත දැනුම සඳහා වැඩසටහන්	තිරසර පැවැත්ම	203-204
LA12	කාර්ය සාධන හා වෘත්තීය සංවර්ධනය සමාලෝචන නිතිපතා ලබන සේවක ප්‍රතිශතය	තිරසර පැවැත්ම	201
LA13	ස්ත්‍රී පුරුෂ භාවය, කාණ්ඩය සුළු ජන කණ්ඩායම් සාමාජිකත්වය හා අනෙකුත් විවිධත්ව දර්ශක අනුව යහපාලන සමූහන සංයුතිය හා කාණ්ඩ තිරසර පැවැත්ම මත සේවක මණ්ඩල වර්ගීකරණය	තිරසර පැවැත්ම	167, 200

G3.1 සම්මත හෙළිදරව් කිරීමේ දර්ශකය

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
LA14	සේවක කාණ්ඩය අනුව ස්ත්‍රී/පුරුෂ මූලික වැටුප් අනුපාතය	සම අනුපාතයක් පවත්වා ගෙන යයි	
LA15	දෙමාපිය නිවාඩුවලට අනතුරුව ආපසු පැමිණීමේ අනුපාතිකය	100%	
	මානව හිමිකම්		
HR1	මානව හිමිකම් වගන්ති ඇතුළත් හෝ මානව හිමිකම් පිරික්සුමට ලක්වූ සැලකිය යුතු ආයෝජන ගිවිසුම් සමස්ත ප්‍රමාණය	වාර්තා කොට නැත	
HR2	මානව හිමිකම් පිරික්සුමට ලක්වූ සැලකිය යුතු සැපයුම්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් හා කොන්ත්‍රාත්කරුවන් හා පිළිබඳව ගන්නා ලද පියවර	කිසිවක් නැත	
HR3	පුහුණු කළ සේවක ප්‍රතිශත ද ඇතුළුව, මෙහෙයුම් කටයුතුවලට අදාල මානව හිමිකම් පැතිකඩ ප්‍රතිපත්ති හා පිළිවෙත් පිළිබඳ ව ගන්නා ලද ක්‍රියාමාර්ග	වාර්තා කොට නැත	
HR4	වෙනස්ව සැලකීමේ සිද්ධීන් ගණන හා ගන්නා ලද ක්‍රියාමාර්ග	තිරසර පැවැත්ම	165, 197
HR5	සංවිධානය වීමේ නිදහස හුක්ති විඳීමේ හා සාමූහික කේවල් කිරීම සැලකිය යුතු පරිදි අවදානමට ලක් කරනු විය හැකි යැයි හඳුනාගත් මෙහෙයුම් හා එම අයිතීන් සුරකින්නට ගත් පියවර	තිරසර පැවැත්ම	165
HR6	ළමා ශ්‍රමය හා සම්බන්ධ සිදුවීම් හා ළමා ශ්‍රමය කෙරෙහි සැලකිය යුතු සේ අවදානම් සහගත යැයි හඳුනාගත් මෙහෙයුම් හා ළමා ශ්‍රමය තුරන් කිරීම සඳහා දායකත්වය සපයන පියවර	තිරසර පැවැත්ම	165
HR7	බලතල හෝ අනිවාර්ය ශ්‍රමය ලබා ගත හැකි සිදුවීම් හෝ සැලකිය යුතු මට්ටමේ අවදානමක් ඇතැයි හඳුනාගත් මෙහෙයුම් හා එය තුරන් කිරීමට දැරූ දායකත්වය	තිරසර පැවැත්ම	165
HR8	මෙහෙයුම් කටයුතුවලට අදාල මානව හිමිකම් පැතිකඩ පිළිබඳ ආයතනයේ ප්‍රතිපත්ති හා පිළිවෙත් සම්බන්ධයෙන් පුහුණු කරන ලද ආරක්ෂක සේවක ප්‍රතිශතය	වාර්තා කොට නැත	
HR9	ආදිවාසීන්ගේ හිමිකම් උල්ලංඝනය කළ සිදුවීම් සංඛ්‍යාව හා ඒ වෙනුවෙන් ගත් පියවර	උල්ලංඝනය කර නැත	
HR 10	මානව හිමිකම් සමාලෝචන/බලපෑම් තක්සේරුවට ලක් කළ මෙහෙයුම් සංඛ්‍යාව හා ප්‍රතිශතය	කිසිවක් නැත	
HR 11	විධිමත් දුක් ගැනවිලි නිවාරණ ක්‍රමවේදයක් මඟින් සමථයට පත් කළ, මානව හිමිකම් දුක් ගැනවිලි සංඛ්‍යාව	තිරසර පැවැත්ම	207
	සමාජය		
SO1	ප්‍රවේශය, ක්‍රියාකාරකම් හා නික්ම යෑම ඇතුළුව ප්‍රජාවන්හි මෙහෙයුම් කෙරේ බලපෑම ඇගයුම හා කළමනාකරණය කිරීමේ කිසියම් වැඩසටහන් හා පරිචයන්හි ස්වභාවය, වපසරිය හා ඵලදායීතාව	තිරසර පැවැත්ම	169-179
SO2	දූෂණ හා බැඳුණු අවදානම සඳහා විශ්ලේෂණය කෙරුණු ව්‍යාපාරික ඒකක සංඛ්‍යාව හා ප්‍රතිශතය	වාර්තා කොට නැත	
SO3	ආයතනයේ දූෂණ මර්ධන ප්‍රතිපත්ති හා පිළිවෙත පිළිබඳව පුහුණු කළ සේවක ප්‍රතිශතය	තිරසර පැවැත්ම	168
SO4	දූෂණ ක්‍රියා සම්බන්ධයෙන් ගත් ප්‍රතිචාර පියවර	වාර්තා කොට නැත	
SO5	පොදු ප්‍රතිපත්ති අස්ථාන හා පොදු ප්‍රතිපත්ති සංවර්ධනය හා උද්යෝගී සහභාගීත්වය	වාර්තා කොට නැත	
SO6	දේශපාලන පක්ෂ, දේශපාලකයින් හා ඒ හා බැඳුණු ආයතනයන්ට දුන් මූල්‍යමය හා ද්‍රව්‍යමය ආධාර රටවල් වශයෙන් වෙන්ව	කිසිවක් නැත	

G3.1 සම්මත හෙළිදරව් කිරීමේ දර්ශකය

අංකය	විස්තරය	සම්බන්ධය/ස්ථානය	පිටු අංකය
SO7	තරඟකාරීත්වය විරෝධී, සංගත විරෝධී හා ඒකාධිකාරී චර්යාවන්ට එරෙහිව ගනු ලැබූ නීතිමය කටයුතු හා ඒවායේ ප්‍රතිවිපාක	කිසිවක් නැත	
SO8	නීති හා රෙගුලාසි පිළිබඳ අනුකූල නොවීමේ හේතුව මත පැනවූ සැලකිය යුතු දඩයන්හි අගය හා මූල්‍යමය නොවන සම්බාධකයන්හි සංඛ්‍යාව	කිසිවක් නැත	
SO9	පළාත්බද ප්‍රජාව අතර සැලකිය යුතු මට්ටමේ සත්‍ය හෝ විභව ඍණ බලපෑමක් සහිත මෙහෙයුම්	කිසිවක් නැත	
SO10	පලාත්බද ප්‍රජාව අතර සැලකිය යුතු මට්ටමේ සත්‍ය හෝ ඍණ බලපෑමක් සහිත මෙහෙයුම් සම්බන්ධයෙන් ගන්නා ලද වැලැක්වීමේ පියවර හා පිළියම්	කිසිවක් නැත	
	නිමැවුම් පිළිබඳ වගකීම්		
PR1	නිමැවුම් හා සේවාවන්හි සෞඛ්‍ය හා ආරක්ෂණ බලපෑම් වඩා ප්‍රශස්ත කිරීම උදෙසා ඇගයුම් කෙරෙන ජීවන චක්‍ර පියවර හා මෙබදු පිළිවෙත් වලට නතුවන සැලකිය යුතු මට්ටමේ නිමැවුම් හා සේවා කාණ්ඩ ප්‍රතිශතය	වාර්තා කොට නැත	
PR2	නිමැවුම් හා සේවාවන්හි ජීවන චක්‍රය තුළ සෞඛ්‍ය හා ආරක්ෂණ බලපෑම් හා සම්බන්ධ රෙගුලාසි හා ස්වේච්ඡා ආචාර ධර්ම සමඟ අනුකූල නොවූ අවස්ථා සංඛ්‍යාව, ප්‍රතිවිපාක ස්වභාවය අනුව වර්ගීකරණය	වාර්තා කොට නැත	
PR3	පිළිවෙත් විසින් අවශ්‍ය කෙරෙන නිමැවුම් හා සේවා තොරතුරු කාණ්ඩ සහ එබඳු පිළිවෙත්වලට යටත් සැලකිය යුතු නිමැවුම් හා සේවා ප්‍රතිශතය	වාර්තා කොට නැත	
PR4	අඩයාලම් ද ඇතුළුව නිමැවුම් හා සේවා තොරතුරු පිළිබඳ රෙගුලාසි හා ස්වේච්ඡා ආචාර ධර්ම හා අනුකූල නොවූ අවස්ථා ගණන එහි ප්‍රතිඵලයේ ස්වභාවය මත	කිසිවක් නැත	
PR5	ගනුදෙනුකාර තෘප්තිය පිළිබඳ සමීක්ෂණ ප්‍රතිඵල ද ඇතුළුව ගනුදෙනුකාර තෘප්තිය හා බැඳි පරිචයන්	තිරසර පැවැත්ම	155
PR6	දැන්වීම් පළකිරීම්, ප්‍රචාරණය හා අනුග්‍රාහකත්ව ඇතුළුව අලෙවි සන්නිවේදනය හා බැඳුණු නීති, රෙගුලාසි හා ස්වේච්ඡා ආචාර ධර්ම පිළිපැදීම පිළිබඳ වැඩ සටහන්	වාර්තා කොට නැත	
PR7	දැන්වීම් පළකිරීම්, ප්‍රචාරණය හා අනුග්‍රාහකත්ව ඇතුළුව අලෙවි සන්නිවේදනය හා බැඳුණු නීති, රෙගුලාසි හා ස්වේච්ඡා ආචාර ධර්ම සමග අනුකූල නොවූ අවස්ථා ගණන, එහි ප්‍රතිවිපාක මත වෙන්ව	කිසිවක් නැත	
PR8	ගනුදෙනුකාර රහස්‍ය භාවය උල්ලංඝනය කිරීම හා ගනුදෙනුකාර දත්ත අස්ථානගත වීම් පිළිබඳ සනාත කළ පැමිණිලි මුළු ගණන	තිරසර පැවැත්ම	168
PR9	නිමැවුම් හා සේවා සම්පාදනය හා පරිහරණය හා බැඳුණු නීති, රෙගුලාසි හා අනුකූල නොවීම හේතුවෙන් පනවනු ලැබූ සැලකිය යුතු දණ්ඩනයන් හි මූල්‍යමය වටිනාකම	ප්‍රමාණාත්මක නැත	





ප්‍රගති චාර්තා

වාර්ෂික මූල්‍ය ප්‍රකාශන
අපගේ ගමන්මගේ සාර්ථකත්වය
පිළිබඳ ප්‍රතිමූර්තියකි.

මූල්‍ය වාර්තා

බැංකුවේ කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්ෂික වාර්තාව 226

ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම 230

මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව 233

ස්වාධීන සහතිකවීමේ වාර්තාව 235

මූල්‍ය වර්තා හා සම්බන්ධව අධ්‍යක්ෂවරුන්ගේ වගකීම 236

විගණකාධිපති වාර්තාව 237

ආදායම් ප්‍රකාශය 238

වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශය 239

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 240

හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශය 241

මුදල් ප්‍රවාහ ප්‍රකාශය 243

මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් 244

ලංකා බැංකුවේ කටයුතු පිළිබඳව
බැංකු අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන වාර්ෂික වාර්තාව

1. හැඳින්වීම

ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, බැංකුවේ කටයුතු පිළිබඳ සිය වාර්තාව සහ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත සහ 1988 අංක 30 දරණ බැංකු පනත සහ එහි සංශෝධනයන්හි අවශ්‍යතාවයන්ට අනුකූලව පිළියෙල කරන ලද, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වන බැංකුවේ සහ සමූහයේ විගණනය කරන ලද ඒකාබද්ධිත මූල්‍ය ප්‍රකාශ සහ මූල්‍ය ප්‍රකාශ මත ඉදිරිපත් කරන විගණන වාර්තාව ඉදිරිපත් කරන්නේ ඉතාමත් සතුටිනි. තවද මෙම වාර්තාව තුල, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ වන 2007 අංක 11 දරණ බැංකු පනත් විධානය සහ එහි පසුකාලීන සංශෝධනයන් මඟින් හා කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීති මඟින් දක්වන අවශ්‍යතාවයන්ට අනුව ඉදිරිපත් කරන හෙළිදරව් කිරීම්ද ඇතුළත් වේ. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ 2013 මාර්තු 21 දින අනුමත කරන ලදී.

1988 අංක 30 දරණ බැංකු පනත යටතේ ස්ථාපනය කරන ලද ලංකා බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වන අතර 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥාපනත යටතේ 1939 අගෝස්තු 1 දින සංස්ථාපනය කරන ලදී. බැංකුවේ පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුවේ. බැංකුව විසින් සුරැකුම් රහිත, යටත්, නිදහස් කළ හැකි ණයකර නිකුත් කර ඇති අතර කොළඹ කොටස් හුවමාරුවෙහි ලැයිස්තුගත කර ඇත.

2. ව්‍යාපාර කටයුතු පිළිබඳ සමාලෝචනය

2.1 ප්‍රධාන ක්‍රියාකාරකම් බැංකුව

සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්වලට වාණිජ බැංකු කටයුතු, පුද්ගල බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, උකස් මූල්‍යකරණය, කල්බදු මූල්‍යකරණය, ආයෝජන බැංකු කටයුතු, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, ආයතනික මූල්‍යකරණය, රාජ්‍ය සුරුකුම්පත් ගනුදෙනු, රන් උකස් මූල්‍යකරණය, ණය කාඩ්පත් පහසුකම්, අක්වෙරළ බැංකු කටයුතු හා විදේශීය මුදල් මෙහෙයුම් සහ අනෙකුත් මූල්‍ය සේවා පහසුකම් සැපයීම ඇතුළත් විය.

2.2 පරිපාලිතයන් හා ආශ්‍රිත සමාගම්

පරිපාලිත සහ ආශ්‍රිත සමාගම්වල ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව විස්තරාත්මක කරුණු වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ පිටු අංක 244 හි ඇතුළත් වේ.

සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම් පිළිබඳව වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි දක්වා ඇති වෙනස් වීම් හැරෙන්නට බැංකුවේ සහ සමූහයේ ප්‍රධාන ක්‍රියාකාරකම්වල ස්වභාවය සැලකිය යුතු තරමේ වෙනසකට භාජනය වී නැත.

2.3 සමූහයේ ආකෘතියේ වෙනස්වීම්

සමාලෝචිත වර්ෂය තුළදී සමූහයේ ආකෘතියේ සිදු වූ වෙනස්කම් වාර්ෂික වාර්තාවේ මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් අංක 29 සහ 30, පිටු අංක 280 සහ 282 යටතේ ඉදිරිපත් කර ඇත.

2.4 දැක්ම, මෙහෙවර, සංස්ථාපිත පරිවය

බැංකුවේ දැක්ම හා මෙහෙවර මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 10 සහ 11 හි ඉදිරිපත් කර ඇත. බැංකුව උසස්ම ආචාරධර්ම පද්ධතියකට අනුරූපව තම කටයුතු ඉටු කරන අතර, එමඟින් දැක්ම හා මෙහෙවර යටතේ ළඟා කරගැනීමට අපේක්ෂිත අරමුණු කරා බැංකුව මෙහෙයවනු ලැබේ.

2.5 වර්ෂයේ කාර්යසාධන සමාලෝචනය

සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ/සමූහයේ කාර්යසාධනය සහ ශ්‍රී ලංකා ආර්ථිකය පිළිබඳව විවරණයක් අංක 26 සිට 27 දක්වා වූ පිටුවල අන්තර්ගත සභාපතිගේ පණිවිඩයෙහි ඇතුළත්කර ඇත. සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ මෙහෙයුම් කටයුතු පිළිබඳව විස්තරාත්මක විග්‍රහයක් අංක 18 සිට 19 දක්වා වූ පිටුවල මහා කළමනාකාරතුමාගේ පණිවිඩයෙහි ඇතුළත්කර ඇත. පිටු අංක 34 සිට 93 දක්වා වන කළමනාකරණ විවරණය හා විශ්ලේෂණයෙහි බැංකුවේ මෙහෙයුම් පිළිබඳ සවිස්තර විශ්ලේෂණයක් අන්තර්ගතය. මෙම වාර්තාවලින් සාධාරණ සමාලෝචනයක් ඉදිරිපත් කර ඇති අතර ඒවා මෙම වාර්ෂික වාර්තාවෙහි සංකලිත කොටසකි.

2.6 වර්ෂය තුළ ශාඛා ව්‍යාප්තිය

සමාලෝචිත වර්ෂය තුළදී බැංකුව ව්‍යාප්ති කාර්යාල 28 ක් ආරම්භ කරමින් තම සේවා තවදුරටත් ව්‍යාප්ත කර ඇත. ශාඛා සංඛ්‍යාව 06 කින් ඉහළ නංවමින් පාරිභෝගිකයින්ට වඩාත් පහසු සේවාවක් ලබාදීම පුළුල් කිරීමේ අදහසින් ශාඛාජාලය තවදුරටත් ව්‍යාප්ත කරන ලදී. වර්ෂය තුළදී බැංකුව විසින් නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර 47 ක් ස්ථාපිත කළ අතර, එමඟින් ටෙලර් යන්ත්‍ර සංඛ්‍යාව 451 දක්වා වැඩි කිරීමට හැකිවූ අතර, මෙම සංඛ්‍යාව අනෙකුත් බැංකු ආයතන සතු, ලංකා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ප්‍රවේශ විය හැකි ස්වයංක්‍රීය ටෙලර් පහසුකම්වලට අතිරේක වශයෙනි.

2.7 ආයතනික පරිත්‍යාග

මේ යටතේ බැංකුව 2013 වර්ෂය තුල ප්‍රදානයක් සිදුකර නොමැත. නමුත් ආයතනික යහපාලනය සහ වගකීම් කටයුතු සඳහා රු. මිලියන 46.8 ක් බැංකුව විසින් දරා ඇත.

2.8 මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම්

සත්‍ය හා සාධාරණ තත්ත්වය නිරූපණය කරන ආකාරයට මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට, 1988 අංක 30 දරන බැංකු පනතේ සහ එහි සංශෝධනවලට, 1938 අංක 53 දරන ලංකා බැංකු ආඥාපනතේ සහ එහි සංශෝධනයන්ට සහ කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත නීතිවලට අනුකූලවන ආකාරයට වන මූල්‍ය ප්‍රකාශ සකස්කර ඇති බවයි. පරිපාලිතයන්හි මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී 2007 අංක 07 දරණ සමාගම් පනතේ ප්‍රතිපාදනද භාවිතා කර ඇත.

මූල්‍ය ප්‍රකාශ මත අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම පිළිබඳ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 236 හි ඇති අතර එය අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවේ සංකලිත කොටසකි.

2.9 විගණක වාර්තාව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවලියේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා, ලංකා බැංකුවේ විගණක වශයෙන් පත්කර ඇත. 2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ මූල්‍ය ප්‍රකාශ සහ බැංකුවේ හා පරිපාලිතයන්හි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 237 හි දක්වා ඇත.

2.10 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී අනුගමනයකර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මෙම වාර්තාවෙහි අංක 244 සිට 256 දක්වා වූ පිටුවල විස්තරාත්මකව සඳහන්කර ඇත.

සමූහයේ සහ බැංකුවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය ඇතුළත්ව ඒ දක්වා මූල්‍ය ප්‍රකාශන එදින දක්වා බලපවත්වන ලද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව පිළියෙල කරන ලදී.

අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සමග ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සමපාත කිරීම සඳහා පවතින ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත (ශ්‍රී.ල.මු.වා.ප්‍ර) සහ ලංකා ගිණුම්කරණ ප්‍රමිත (ල.ගි.ප්‍ර) වශයෙන් අන්තර්ජාතික මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට සහ අන්තර්ජාතික ගිනුම්කරණ ප්‍රමිතීන්ට අනුගත කරන ලදී. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී 2012 ජනවාරි 01 දින සිට යොදාගත යුතු නව ශ්‍රී ලංකා ගිනුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සමූහයේ සහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇත.

3. අනාගත සංවර්ධනය

අනාගත සංවර්ධනය පිළිබඳව බැංකුවේ දර්ශනය හා සැලසුම් පිටු අංක 22 සභාපතිතුමාගේ පණිවිඩයෙහි සහ පිටු අංක 86 කළමනාකරණ විවරණය හා විශ්ලේෂණයෙහි ඇතුළත්කර ඇත.

4 දළ ආදායම

සමූහයේ ප්‍රධාන ආදායම පොළී ආදායමෙන් සමන්විත වූ අතර, පොළී ආදායම මුළු ආදායමෙන් 85% ක නියෝජනයක් කර ඇත. පෙර වර්ෂයේ සමූහයේ ආදායම වූ රු. මිලියන 74,857 හා සංසන්දනාත්මකව බැලීමේ දී 2012 වර්ෂය සඳහා සමූහයේ ආදායම රු. මිලියන 115,527 ක් වශයෙන් වාර්තා විය. බැංකුවේ මුළු ආදායම වර්ෂය සඳහා සමූහයේ මුළු ආදායමෙන් 95% ක් (2011 - 94%) වශයෙන් වාර්තා විය.

5 ලාභාංශ සහ සංචිත

5.1 ලාභය

සමාලෝචිත 2012 වර්ෂය තුළදී බැංකුව රු. මිලියන 19,794 ක බදු පෙර ලාභයක් වාර්තා කිරීමට සමත් වී ඇති අතර, එය සංසන්දනාත්මකව පෙර වර්ෂයේ රු. මිලියන 16,485 ට වඩා 20% ක වැඩිවීමක් නිරූපණය කරයි. රු. මිලියන 5,378 ක් ආදායම් බදු වෙනුවෙන් අඩු කළ පසු (2011 දී රු. මිලියන 4,567) 2012 වර්ෂය සඳහා බදු පසු ලාභය රු. මිලියන 14,417 ක් ලෙස වාර්තා වී ඇති අතර, එය සාපේක්ෂව 2011 වර්ෂයේදී වාර්තා වූ බදු පසු ලාභය වන රු. මිලියන 11,918 ට වඩා 21% ක වැඩිවීමක් වේ.

බැංකුවේ සහ සමූහයේ ලාභය හා සම්බන්ධව දත්තයන් වගු අංක 1 හි දක්වා ඇත.

සමූහයේද බදු පෙර ලාභය සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 16,491 සිට රු. මිලියන 20,246 දක්වා පත්වෙමින් පෙර වර්ෂයට සාපේක්ෂව 23% ක වැඩිවීමක් නිරූපණය කරන ලදී. රු. මිලියන 5,638 ක් ආදායම් බදු වෙනුවෙන් අඩු කළ පසු (2011 දී රු. මිලියන 4,824) 2011 වර්ෂය සඳහා සමූහයේ බදු පසු ලාභය වූ රු. මිලියන 11,667 සිට 2012 වර්ෂය සඳහා රු. මිලියන 14,608 ක් දක්වා වැඩි විය.

වගු අංක 1

	බැංකුව		සමූහය	
	2012 රු. '000	**2011 රු. '000**	**2012 රු. '000**	**2011 රු. '000**
සියලුම වියදම් දැරීමෙන් සහ ක්ෂය සඳහා අවශ්‍ය ප්‍රතිපාදනයන් මෙන්ම විය හැකි අත්තිකාරම් අලාභ සහ අසම්භව්‍යන් සඳහා වෙන්කිරීමෙන් පසු, එහෙත් එකතු කළ අගය මත බදු සහ ආදායම් බද්දට පෙර වර්ෂයේ ලාභය	23,008,589	19,000,470	23,482,400	18,879,587
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු	(3,214,291)	(2,515,755)	(3,274,717)	(2,596,957)
ආශ්‍රිත සමාගම්හි බදු පෙර ලාභයේ කොටස	-	-	38,585	208,716
ආදායම් බද්දට පෙර ලාභය	19,794,298	16,484,715	20,246,268	16,491,346
ආදායම් බදු වියදම	(5,377,677)	(4,567,110)	(5,638,274)	(4,824,536)
වසරේ ලාභය	14,416,621	11,917,605	14,607,994	11,666,810
විසර්ජනයන්				
ස්ථාවර සංචිත අරමුදලට මාරු කිරීම	277,955	230,500	277,955	230,500
ප්‍රාථමික වෙළඳ විශේෂ අවදානම් සංචිතයට මාරු කිරීම	85,147	38,557	85,147	38,557
ආයෝජන අරමුදලට මාරු කිරීම	3,232,612	1,484,073	3,279,672	1,570,276
ලාභාංශ	5,346,410	3,846,410	5,346,410	3,846,410

5.2 ලාභාංශ

සියලුම බදු, ණය අලාභයන් සඳහා වෙන්කිරීම් සහ සංචිත සඳහා අවශ්‍ය වන්නාවූ මාරු කිරීම් යනාදිය අඩුකළ පසු ලාභය මත පදනම්ව බැංකුව විසින්, ශ්‍රී ලංකා රජයේ වනම්, බැංකුවේ කොටස්කරුවන්ගේ උපදෙස් මත ලාභාංශ තීරණය කරනු ලැබේ. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා බැංකුව විසින් රු. මිලියන 5,346ක මුදලක් ලාභාංශ වශයෙන් ගෙවා ඇත. (2011 - රු. මිලියන 3,846)

5.3 සංචිත

2012 දෙසැම්බර් 31 දිනට සමූහය සතු මුළු සංචිත වටිනාකම රු. මිලියන 52,225 (2011 - රු. මිලියන 42,391) වශයෙන් වාර්තා විය.

සමූහයේ සංචිතයන්හි සංයුතිය පහත වේ.

	2012 රු. '000	**2011 රු. '000**
ස්ථාවර සංචිත අරමුදල	3,285,955	3,008,000
ප්‍රත්‍යාගණන සංචිතය	8,367,737	7,716,172
ප්‍රාථමික වෙළඳ විශේෂ අවදානම් සංචිතය	822,676	737,529
විනිමය පරිවර්තන සංචිත	998,291	430,347
ආයෝජන අරමුදල් ගිණුම	4,849,948	1,570,276
විකිණීම සඳහා රඳවාගත් සංචිතය	3,970,915	4,987,494
වෙනත් සංචිත	611,559	586,199
රඳවා ගත් ලාභ	29,318,089	23,355,259
එකතුව	52,225,170	42,391,276

6 දේපළ, පිරියත හා උපකරණ

වර්ෂය තුළදී දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම වෙනුවෙන් දරන ලද ප්‍රාග්ධන වියදම රු. මිලියන 1,483 ක් (2011 දී රු. මිලියන 1,905) වූ අතර, ඒවා පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 286 ඇති සටහන් අංක 32 න් නිරූපණය කරයි.

7. නිදහස් දේපළවල අගය

2012 දෙසැම්බර් 31 දිනට සමූහය සතු නිදහස් දේපළවල අගය රු. මිලියන 9,626 ක් වශයෙන් (2011 දී රු. මිලියන 9,009) මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 32 හි දක්වා ඇත.

8 ප්‍රකාශිත ප්‍රාග්ධනය හා කොටස් හිමිකම

8.1 ප්‍රකාශිත ප්‍රාග්ධනය

නිකුත් කරන ලද හා මුළුමනින්ම ගෙවා නිම කරන ලද බැංකුවේ ප්‍රාග්ධනය 2012 දෙසැම්බර් 31 දිනට සාමාන්‍ය කොටස් 5,000,000 කින් සමන්විත වූ රු. මිලියන 5,000 ක් විය.

8.2 කොටස් අයිතීන්

ලංකා බැංකුවේ එකම කොටස්හිමියා ශ්‍රී ලංකා රජයයි.

9 යටත් කාලීන ණයකර නිකුතුව

2012 දෙසැම්බර් 31 දිනට සමූහය විසින් නිකුත්කර තිබූ යටත් කාලීන ණයකරවල (ලැයිස්තුගත කරන ලද හා ලැයිස්තුගත නොකරන ලද දෙවර්ගයේම) අගය රු. මිලියන 6,000 ක් (2011 දී රු. මිලියන 5,000) විය. වත්කම් සහ වගකීම් වලින් ඇතිවන පරතරය පියවීම සහ බැංකුවේ අතිරේක ප්‍රාග්ධන පදනම ශක්තිමත් කිරීම සඳහා මෙම ණයකර නිකුතුව මගින් ජනනය වූ අරමුදල් යොදාගන්නා ලදී. ශේෂ පත්‍ර දිනට පැවති ණයකර පිළිබඳව තොරතුරු පිටු අංක 297,301 සහ 302 හි මූල්‍ය ප්‍රකාශවල සටහන් අංක 41 සහ 45 හි ඇතුළත්කර ඇත.

10 කොටස් පිළිබඳ තොරතුරු

සමාලෝචිත වර්ෂය තුළදී සමූහයේ කොටසක ඉපැයුම හා කොටසක් සඳහා වූ ශුද්ධ වත්කම් ප්‍රමාණය පිළිවෙලින් රු. 2,916/- ක් සහ රු. 11,445/- ක් විය.

11 ආයතනික තිරසාරභාවය සහ වගකීම

ආයතනික තිරසාරභාවය සහ සමාජීය වගකීම් යටතේ ක්‍රියාත්මක කරන ලද විවිධ වැඩසටහන් පිළිබඳව විස්තරාත්මක සමාලෝචනයක් මෙම වාර්තාවෙහි අංක 152 සිට 223 දක්වා වූ පිටුවල තිරසාර පැවැත්ම පිළිබඳ වාර්තාවෙහි ඇතුළත් කර ඇත.

12 අධ්‍යක්ෂ මණ්ඩලය

2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිතුමා ද ඇතුළුව සාමාජිකයින් 6 දෙනෙකුගෙන් සමන්විත වූ අතර, ඔවුන් කිසිවෙක් බැංකුවේ විධායක තනතුරු දරනු නොලැබේ. ඔවුන්ගේ විශාල පරාසයක කුසලතාවයන් සහ පළපුරුද්ද සමස්ත අධ්‍යක්ෂ මණ්ඩල කටයුතු සඳහා දායක කරනු ලැබේ. වර්තමාන අධ්‍යක්ෂකවරුන්ගේ සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 34 සිට 36 දක්වා විස්තරාත්මකව සඳහන්කර ඇත.

12.1 අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ විස්තර

සමාලෝචිත වර්ෂය තුළදී බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ විස්තර

අධ්‍යක්ෂකගේ නම	විධායක/විධායක නොවන තත්වය	ස්වාධීනත්වය
ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ (සභාපති)	විධායක නොවන	ස්වාධීන
එස් ආර් ආටිගල මහතා	විධායක නොවන නිල බලයෙන් පත් වූ	ස්වාධීන නොවන
රාජු සිවරාමන් මහතා	විධායක නොවන	ස්වාධීන
නලිනි අබේවර්ධන මෙනවිය	විධායක නොවන	ස්වාධීන නොවන
චන්ද්‍රසිරි ද සිල්වා මහතා	විධායක නොවන	ස්වාධීන නොවන
කේ එල් හේවගේ මහතා	විධායක නොවන	ස්වාධීන
වී කනගසබාපති මහතා (එස් ආර් ආටිගල මහතා වෙනුවට විකල්ප අධ්‍යක්ෂක)	විධායක නොවන	ස්වාධීන නොවන

බලපත්‍රලාභී වාණිජ බැංකු වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කර ඇති ආයතනික යහපාලනය පිළිබඳ 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධානයන්ට අනුව අධ්‍යක්ෂකවරු ස්වාධීන/ ස්වාධීන නොවන අධ්‍යක්ෂකවරු ලෙස වර්ග කර ඇත.

12.2 අධ්‍යක්ෂ මණ්ඩලීය උප කමිටු

ඉහත දැක්වූ 2007 අංක 11 දරණ බැංකු පනතේ විධිවිධානයන්ට අනුකූල වීම සඳහා සහ බැංකුවේ කටයුතු මනාව පාලනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය උප කමිටු 4ක් පිහිටුවා ඇත. උප කමිටු සංයුතීන් මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 138 සිට 148 දක්වා සඳහන් කර ඇත.

12.3 අධ්‍යක්ෂවරුන්ගේ රැස්වීම්

අධ්‍යක්ෂ මණ්ඩල හා උප කමිටු රැස්වීම් වලට අධ්‍යක්ෂවරුන්ගේ සහභාගීත්වය පිළිබඳ තොරතුරු මෙම වාර්ෂික වාර්තාවේ 149 වන පිටුවේ දක්වා ඇත.

12.4 ගිවිසුම් පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ ඇල්ම

බැංකුව සමඟ ඇති ගිවිසුම් හා සම්බන්ධව අධ්‍යක්ෂකවරුන්ට ඇති සෘජු හා වක්‍ර ඇල්ම පිළිබඳව දත්තයන් අංක 230 සිට 232 දක්වා වූ පිටුවල විස්තර කර ඇත. මෙම ඇල්ම පිළිබඳව තොරතුරු අධ්‍යක්ෂකවරු විසින් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී අනාවරණය කර ඇත. දී ඇති ගිවිසුම් වලට අමතරව කිසිදු අධ්‍යක්ෂකවරයෙකුට වෙනත් සෘජු හෝ වක්‍ර ඇල්මක් බැංකුව සමඟ ඇතිකරගෙන ඇති හෝ අනාගතයේදී යෝජිත ගිවිසුමකට සම්බන්ධයක් හෝ නොමැති බව ප්‍රකාශ කෙරේ.

12.5 බැංකුව/සමූහය මගින් නිකුත් කර ඇති ණයකර පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ ඇල්ම

ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ, (සමාලෝචිත වර්ෂය තුළ සභාපති) විසින් 2008 වර්ෂය තුළදී බැංකුව නිකුත් කළ ඩොලර් ණයකරවල ඇ.ඩො. 349,000 ක් ආයෝජනය කර ඇති අතර, එය 2012 දෙසැම්බර් 31 දිනට ණයකර ලේඛනයේ නිරූපණය වේ. වර්ෂය ආරම්භයේදී හෝ වර්ෂය අවසාන දිනට වෙනත් කිසිදු අධ්‍යක්ෂකවරයෙකුගේ නමින් ණයකර ලේඛනගතකර නොතිබිණි.

12.6 අධ්‍යක්ෂ මණ්ඩලයේ දීමනා/ගාස්තු

අධ්‍යක්ෂ මණ්ඩලයට ගෙවනු ලබන දීමනා/ගාස්තු සියල්ලම, 2011 අප්‍රේල් 29 දිනැති අංක PED 58, 2002 ජූලි 19 දිනැති අංක PF/PE/23 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අනුව සහ 2008 මාර්තු 24 දාතම දරන ලිපිය ඇතුළු මුදල් සහ ක්‍රමසම්පාදන අමාත්‍යංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝග අනුව සහ ලංකා බැංකු ආඥා පනත සහ එහි සංශෝධනයන්ට අනුව සිදු කර ඇත.

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ අධ්‍යක්ෂකවරුන්ගේ පාරිශ්‍රමික පිළිබඳ තොරතුරු පිටු අංක 259 හි දක්වා ඇත.

13 අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර පාලන පද්ධතිය

13.1 අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණය සඳහා සමස්ත වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි. අවදානම් අවම කිරීම සඳහා බැංකුව විසින් අනුගමනය කරන ලද විශේෂ ක්‍රියාමාර්ග මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 96 සිට 105 දක්වා ඇතුළත් කර ඇත.

13.2 අභ්‍යන්තර පාලනය

බැංකුව තුළ විගණන කමිටුව හරහා වඩාත් ඵලදායී සහ විස්තීර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ක්‍රියාත්මක වන බව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සහතික කරනු ලැබේ.

විගණන කමිටුව විසින් භාරකාර වගකීම් නිදහස් කිරීම උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලයට සහයෝගය දෙනු ලබයි. විගණන කමිටුවේ සභාපතිතුමාගේ වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 139 සිට 141 දක්වා ඇතුළත් කර ඇත. සමාලෝචනයට පාත්‍ර වූ වර්ෂය තුළ සහ මූල්‍ය වාර්තා සහ වාර්ෂික වාර්තාව නිකුත් කළ දිනය දක්වා වූ අභ්‍යන්තර විගණන පාලන පද්ධතියෙහි ඵලදායීතාව පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය සෑහීමකට පත්වේ. බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳව වූ 2007 අංක 11 දරණ බැංකු පනත් විධිවිධානයේ විධිවිධාන අංක 3(8)(ii)(ආ) අනුව අභ්‍යන්තර විගණන යාන්ත්‍රණය පිළිබඳ වාර්තාවක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කර ඇත. ඉහත සඳහන් වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 233 සිට 234 දක්වා ඇතුළත් කර ඇත.

මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සාධාරණ තහවුරුවක් ලැබෙන පරිදි නිර්මාණය කර ඇති බවටත්, බාහිර පාර්ශවයන්ට ඉදිරිපත් කිරීම සඳහා පිළියෙල කරනු ලබන මූල්‍ය ප්‍රකාශ, අදාළ ගිණුම්කරණ මූලධර්ම හා නියාමන අවශ්‍යතාවයන්ට අනුකූල වන ආකාරයෙන් සකස් වී තිබෙන බවටත්, අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය මත සහතික වීමේ වාර්තාවක් විගණකාධිපතිතුමාගෙන් ලබාගෙන ඇති අතර එය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 235 හි දක්වා ඇත.

14 ආයතනික යහපාලනය

වඩාත් ඵලදායී ආයතනික යහපාලන රාමුවක් සහ ක්‍රියාවලියන් පවත්වාගෙන යෑමට අධ්‍යක්ෂ මණ්ඩලය බැඳී සිටියි. බැංකුවේ මූල්‍ය, මෙහෙයුම් සහ අනුකූලතා ක්‍රියාකාරකම් ආයතනික යහපාලන පරිචයට අනුකූලවන පරිදි මෙහෙයවීම සහ කාර්යක්ෂමව පාලනය කිරීම සිදු වේ. වාණිජ බැංකුවල නියාමක වශයෙන් කටයුතු කරන ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, 2007 අංක 11 දරණ බැංකු පනත් විධිවිධානය යටතේ නිකුත් කරන ලද ආයතන යහපාලන විධිවිධානයන්ට සහ ශ්‍රී ලංකා සුරුකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය බද්ධව නිකුත් කරන ලද ආයතනික යහපාලනය පිළිබඳ මනා පරිචය සඳහා වූ ආචාරධර්ම සංග්‍රහයට මෙම පද්ධතීන් සහ පරිචයන් අනුකූල වන අතර, මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 108 සිට 137 දක්වා ඇති ආයතනික යහපාලනය පිළිබඳ වාර්තාවේ සවිස්තරාත්මකව සඳහන් වේ.
අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඉහත දැක්වූ 2007 අංක 11 විධිවිධානයන්ට අනුකූල වීම මත විගණකාධිපතිතුමාගෙන් වාර්තාවක් ලබා ගෙන ඇත.

15 මානව සම්පත්

බැංකුව සතු ඉහළ වටිනාකමක් සහිත සම්පතක් ලෙස එහි සේවකයින් සලකන අතර, ඔවුන්ගේ සංවර්ධනය බැංකුවට ඉතාමත් වැදගත්වනු ඇත. සංස්ථාපිත අරමුණු ඉටුකරගැනීමේදී ඔවුන්ගෙන් ලැබෙන දායකත්වය උපරිම තත්ත්වයෙන් පවත්වාගෙන යෑම සඳහා ඉතා වටිනා මෙම මානව ප්‍රග්ධනය තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය පියවර රාශියක් ගෙන ඇත. බැංකුවේ මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ පරිචයන්, තිරසාර පැවැත්ම පිළිබඳ වාර්තාවේ පිටු අංක 197 සිට 207 දක්වා ඇතුළත්කර ඇත.

16 නීති හා රෙගුලාසි පිළිබඳ අනුකූලතාවය

බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි බැංකුව නීති හෝ රෙගුලාසිවලට පටහැනි කිසිදු ක්‍රියාකාරකමක නියුක්ත වී නොමැති බව ප්‍රකාශ කරයි.

මෙම වාර්තාවේ සංකලිත කොටසක් වන අවදානම් හා අනුකූලතාවය පිළිබඳ වාර්තාව යටතේ පිටු අංක 105 හි නීති හා රෙගුලාසි සමග බැංකුවේ අනුකූලතාවය පිළිබඳ විස්තර ඇතුළත්වේ.

17 සමථයට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්

අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය පරිදි දැනට බැංකුව විසින් මෙහෙයවනු ලබන තවමත් සමථයකට පත් නොවූ නෛතික ක්‍රියාකාරකම්වලින් බැංකුවේ මූල්‍ය තත්ත්වයට හෝ අනාගත මෙහෙයුම් සඳහා ප්‍රමාණාවත් අහිතකර බලපෑමක් සිදු වෙතැයි අපේක්ෂා නොකෙරේ.

18 ව්‍යවස්ථාපිත ගෙවීම්

රජයට සහ සියලුම සේවකයින්ට ගෙවිය යුතු සියලුම ව්‍යවස්ථාපිත ගෙවීම් නියමිත දිනයන්හිදී කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාසයෙන් තහවුරු කරයි.

19 පාරිසරික ආරක්ෂාව

පරිසරයට අයහපත් ප්‍රතිඵල ළඟාකර දෙන කිසිදු ක්‍රියාකාරකමක බැංකුව නියුක්ත වී නැත. තවද, පරිසරය රැකගැනීමේ අරමුණින් ගත් පියවර පිටු අංක 161,162 හා 165 හි තිරසාර පැවැත්ම පිළිබඳ වාර්තාවේ ඇත.

20 ශේෂ පත්‍රයෙන් පසු සිදු වූ සිද්ධීන්

අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ප්‍රමාණාත්මක ගැලපීමක් හෝ හෙලිදරව්වක් සිදුකල යුතු කිසිදු ප්‍රමාණාත්මක සිද්ධියක් ශේෂ පත්‍ර දින හා මෙම වාර්තාව නිකුත් කළ දින අතර කාල පරාසය තුළදී සිදුවී නැති බවයි.

21 අබණ්ඩභාවය

තම මෙහෙයුම් කටයුතු අබණ්ඩව පවත්වාගෙන යාමට අවශ්‍ය ප්‍රමාණයේ සම්පත් බැංකුව සතු බව අධ්‍යක්ෂ මණ්ඩලයේ විශ්වාසයයි. එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අබණ්ඩව පවැත්ම යන සංකල්පය භාවිතාකර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2013 මාර්තු 21
කොළඹ දීය.

ගිවිසුම් හා සම්බන්ධව
අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 24 හි අවශ්‍යතාවන්ට අනුව, සම්බන්ධිත පාර්ශවයන්ගේ අනාවරණයන් විස්තරාත්මක වශයෙන් මූල්‍ය ප්‍රකාශ වල සටහන් අංක 55 (පිටු අංක 310 සිට 315 දක්වා) හි දක්වා ඇත. අතිරේක වශයෙන්, ව්‍යාපාරයීය සාමාන්‍ය ක්‍රියාකාරකම් තුළ බැංකුවේ සභාපති සහ අධ්‍යක්ෂමණ්ඩලය සභාපති හෝ අධ්‍යක්ෂධූර දරන අනෙකුත් ආයතනයන් සමඟ අතේදුරින් සිදුකරන ලද ගනුදෙනු සම්බන්ධව විස්තරයක් දැක්වේ.

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000*	2012/12/31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	2011/12/31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	සුරැකුම
ආචාර්ය ගාමිණී වික්‍රමසිංහ						
ලංකා බැංකුව (යූ කේ) සමාගම	සභාපති	ජංගම ගිණුම		ඇ.ඩො. 678	ඇ.ඩො. 471	
		(නොස්ට්‍රෝ ගිණුම)		**86,253	**53,674	
				යුරෝ 1,679	යුරෝ 445	
				**282,738	**65,593	
				ඒ.රා.ප. 356	ඒ.රා.ප. 467	
				**73,195	**81,979	
		රඳවා තැබීම්		ඇ.ඩො. 8,000	ඇ.ඩො. 8,000	
				**1,018,040	**911,240	
				-	EURO 7,500	
					**1,105,875	
				ඒ.රා.ප. 37,500	ඒ.රා.ප. 28,300	
				**7,714,039	**4,965,821	
		වෙනත් ගෙවීම්		474,192	247,429	
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	සභාපති	ජංගම ගිණුම		3,023	2,498	
		කාලීන තැන්පතු		9,735	82	
		වෙනත් ගෙවීම්		681	1,496	
		වෙනත් ලැබීම්		1,170	795	
කොළඳෙනිය හයිඩ්‍රොපවර් (පුද්ගලික) සමාගම	සභාපති	ජංගම ගිණුම		1,237	13,496	
		ණයවර ලිපි		-	5,822	
ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී.එල්.සී	සභාපති	ජංගම ගිණුම		8,084	16,614	
		කාලීන තැන්පතු		1,216,734	936,058	
		REPO ශේෂය		99,888	180,732	
		කුලී අත්තිකාරම් ගෙවීම		235,179	235,179	
		ඉන්ධන සඳහා තැන්පතු		907	907	
		ණයවර ලිපි	5,000	-	2,103	
		ඇපකාර ලිපි		3,630	3,300	
සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පුද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම		31,090	2,562	
		ජංගම ගිණුම		ඇ.ඩො. 44	ඇ.ඩො. 2	
				**5,601	**229	
		කාලීන තැන්පතු		51,639	-	
		කාලීන ණය		-	ඇ.ඩො. 22,809	
					**2,598,104	
		ණයවර ලිපි		ඇ.ඩො. 356	-	කාලීන තැන්පතු
				**45,290		
		ඇපකාර ලිපි		-	1,256	
සී/ස බී ඕ සී මැනේජ්මන්ට් ඇන්ඩ් සපොර්ට් සර්විසස් පුද්ගලික සමාගම	සභාපති	ජංගම ගිණුම		2,736	-	
		කාලීන තැන්පතු		1,307	-	
		වෙනත් ගෙවීම්		323	-	
ද ලංකා හොස්පිටල් කෝපරේෂන් පී එල් සී	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		ඇ.ඩො. 82	ඇ.ඩො. 65	
				**10,438	**7,376	
		ජංගම ගිණුම		57,693	43,927	
		කාලීන තැන්පතු		451,878	60,350	
		කාලීන තැන්පතු		ඇ.ඩො. 1,355	ඇ.ඩො. 305	
				**172,477	**34,768	
		REPO ශේෂය		75,017	100,019	

* මුදල් ඒකකය විශේෂයෙන් සඳහන් කොට නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.
** සමාන අගය රුපියල් වලින්

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000*	2012/12/31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	2011/12/31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	සුරැකුම
ඉන්ෆොමැටික්ස් සමාගම් සමූහය***	සභාපති	ඉතිරිකිරීමේ ගිණුම		9	9	
		ඉතිරිකිරීමේ ගිණුම		ඇ.ඩො. 88	ඇ.ඩො. 11	
				**11,223	**1,290	
				එ.රා.ප. 1	එ.රා.ප. 1	
				**219	**184	
		ජංගම ගිණුම		14,790	2,619	
		කාලීන තැන්පතු		ඇ.ඩො. 742	ඇ.ඩො. 545	
				**94,423	**62,130	
				එ.රා.ප. 103	එ.රා.ප. 98	
				**21,170	**17,279	
		අයිරාව	98,140	98,677	54,938	අනේවාසික විදේශ මුදල්
		ඇපකාර ලිපි	15,085	8,870	7,883	තැන්පතු, නේවාසික දේපළ
එස් ආර් ආටිගල මහතා						
ශ්‍රී ලංකා වරාය අධිකාරිය	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		ඇ.ඩො. 45	ඇ.ඩො. 1,823	
				**5,682	**207,700	
		ජංගම ගිණුම		579,576	897,985	
		කාලීන තැන්පතු		718,122	230,462	
		කාලීන තැන්පතු		ඇ.ඩො. 39,273	ඇ.ඩො. 46,346	
				** 4,997,665	** 5,279,004	ආනයනය කළ වත්කම් මත
		කාලීන ණය	ඇ.ඩො. 62,512	ඇ.ඩො. 42,209	ඇ.ඩො. 54,721	සෘණාත්මක ඔඩපණය
			**7,954,998	**5,371,311	**6,232,974	
		REPO ශේෂය		450,630	24,500	
		ණයවර ලිපි	756,251	786,602	818,847	විනිමය බිල්පත්, නැව්ගත කිරීමේ ලියවිලි සහ බැංකුවේ පාලනය යටතේ පවතින භාණ්ඩ
ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	අධ්‍යක්ෂ	ජංගම ගිණුම		2,269	-	
		කාලීන තැන්පතු		534,699	-	
රාජු සිවරාමන් මහතා						
සී/ ස සීලීස් සමාගම	සභාපති	ඉතිරිකිරීමේ ගිණුම		ඇ.ඩො. 3	-	
				**336	-	
				යුරෝ 3	-	
				**583		
				ඕස්.ඩො. 0.4		
				**54		
		ජංගම ගිණුම		3,188	11,487	
		අයිරාව	50,000	45,455	-	නිරවුල්
		ණය මාලාව	550,000	394,350	-	ඇටර්නි බලපත්‍රයක් මඟින් ආවරණය කරන ලද ලැබියයුතු කල්බදු/ කුළී පිට ගැනුම්
		මුදල් වෙළඳපළ ණය	350,000	351,850	340,881	නිරවුල්
		ඇපකාර ලිපි	2,500	2,500	2,500	නිරවුල්
		REPO ශේෂය		42,009	10,002	
		වෙනත් ගෙවීම්		6,331	6,029	
සී/ ස එම් සී එස් එල් ෆයිනෑන්ෂල් සර්විසස් සමාගම	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		16,968	-	
		ජංගම ගිණුම්		30,891	37,519	
		කාලීන තැන්පතු		16	16	
		ණය මාලාව	250,000	65,290	-	ඇටර්නි බලපත්‍රයක් මඟින් ආවරණය කරන ලද ලැබියයුතු කල්බදු
		අයිරාව	50,000	494	8	
		මුදල් වෙළඳපළ ණය	50,000	50,522	50,136	
		අත්වැල් මූල්‍යනය	100,000	-	-	
		ණයවර ලිපි	10,000	-	-	
		ඇපකාර ලිපි	4,000	-	-	
නලිනි අබේවර්ධන මෙනවිය						
සී/ස හොටෙල්ස් කලම්බු (1963) (පුද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම		35,303	16,880	
		කාලීන තැන්පතු		102,075	93,254	
		වෙනත් ලැබීම්		31,548	23,601	

* මුදල් ඒකකය විශේෂයෙන් සඳහන් කොට නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.

** සමාන අගය රුපියල් වලින්

*** 1) සී/ස විෂුවල් කම්පියුටින් සිස්ටම්ස් (පෞද්ගලික) සමාගම (ඉන්ෆොමැටික්ස් සමාගම් සමූහයට අයත්) ටැන්ඩම් සර්වරයෙහි නඩත්තු සේවා සැපයීම සඳහා පත්කර ඇති අතර එම සමාගම සිය අයිතිවාසිකම් තම මව් සමාගම වන ඉන්ෆොමැටික්ෂ් (පෞද්ගලික) සමාගමට පවරා ඇත.

2) තනි ආකෘති පදනමට විසඳුමක් ලෙස ප්‍රතිමුදල් විශ්වාදීකරණ මෘදුකාංගය ලබාගැනීම සඳහා ඉන්ෆ්‍රාසොෆ්ට් ටෙක්නොලොජීස් සමාගම, ඉන්ෆොටෙක් සමාගම සහ ඩී එම් එස් සොෆ්ට්වෙයාර් ඉන්ජිනියරින් (පෞද්ගලික) සමාගම සමඟ ඉන්ෆෝමැටික්ස් (පෞද්ගලික) සමාගම මඟින් බැංකුව මිල ඇණවුම් කැඳවා ඇත.

3) ඩීර්සිවිෂ්රෑව් ATM යන්ත්‍ර දෙකක් ඉන්ෆෝමැටික්ස් (පෞද්ගලික) සමාගමෙන් මිලදීගෙන ඇත.

අධ්‍යක්ෂවරුන්ගේ ඇල්ම

සමාගම	සම්බන්ධය	ගනුදෙනුවේ ස්වභාවය	සීමාව '000*	2012/12/31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	2011/12/31 දිනට ශේෂය/ පිටහිටි වටිනාකම '000*	සුරැකුම
සී/ස බී.ඕ.සී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		5,000	-	
		ජංගම ගිණුම		36,760	35,410	
		කාලීන තැන්පතු		83,131	50,207	
		ණයකර		15,436	10,374	
		අයිරාව	7,600	-	-	පොත් ණය
		ඇපකාර ලිපි	56,000	56,050	50,000	කාලීන තැන්පතු සහ ණයකර
		වෙනත් ලැබීම්		12	1,240	
		වෙනත් ගෙවීම්		428	619	
චන්ද්‍රසිරි ද සිල්වා මහතා						
සී/ස හොටෙල්ස් කලම්බු (1963) (පුද්ගලික) සමාගම	අධ්‍යක්ෂ	ජංගම ගිණුම		35,303	16,880	
		කාලීන තැන්පතු		102,075	93,254	
		වෙනත් ලැබීම්		31,548	23,601	
සී/ස බී.ඕ.සී ට්‍රැවල්ස් (පුද්ගලික) සමාගම	සභාපති	ඉතිරිකිරීමේ ගිණුම		5,000	-	
		ජංගම ගිණුම		36,760	35,410	
		කාලීන තැන්පතු		83,131	50,207	
		ණයකර		15,436	10,374	
		අයිරාව	7,600	-	-	පොත් ණය
		ඇපකාර ලිපි	56,000	56,050	50,000	කාලීන තැන්පතු සහ ණයකර
		වෙනත් ලැබීම්		12	1,240	
		වෙනත් ගෙවීම්		428	619	
කේ එල් හේවගේ මහතා						
සී/ස සීබෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	සභාපති	ජංගම ගිණුම		961	1,799	
		කාලීන තැන්පතු		38,841	-	
		REPO ශේෂය		10,502	17,400	
		ඒකකයන්හි ආයෝජන ***				
				1,726,479	1,513,004	
වී කනගසබාපති මහතා						
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී.එල්.සී	අධ්‍යක්ෂ	ජංගම ගිණුම		50,804	58,765	
		ණයකර		1,102	1,102	
		අයිරාව	110,000	71,557	46,384	ඇටර්නි බලපත්‍රයක් මඟින් ආවරණය කරන ලද ලැබියයුතු කල්බදු
		අයිරාව		92,224	-	
		ණය මාලාව	900,000	679,050	597,473	
		මුදල් වෙළඳපළ ණය	100,000	-	40,024	
		චෙක්පත් සීමා මත ක්ෂණික ණය				
		ප්‍රදාන	1,000	-	-	
		අභ්‍යන්තර දීන අයිරා	5,000	-	-	
		ණයකරයන්හි ආයෝජන		140,437	140,437	
		වෙනත් ගෙවීම්		5,742	10,625	
හොටෙල් ඩිවලොපර්ස් ලංකා පී එල් සී	අධ්‍යක්ෂ	ඉතිරිකිරීමේ ගිණුම		ඇ.ඩො. 3 **403	ඇ.ඩො. 3 **359	
		ඉතිරිකිරීමේ ගිණුම		ජ.යෙන් 4 ** 6	ජ.යෙන 5 ** 7	
		ජංගම ගිණුම		104,070	11,250	
		කාලීන ණය	350,000	8,761	43,806	ණය ගිවිසුම
		(SRCC & T අරමුදල මත ප්‍රදානය කරන ණය)		982,260	150,264	
		REPO ශේෂය				
සී/ස දුරස්ථ අධ්‍යාපන මධ්‍යස්ථානය	සභාපති	ජංගම ගිණුම		10,797	8,876	
		අයිරාව	2,000	17	385	කාලීන තැන්පතු
සී/ස ලංකා හයිඩ්‍රොලික් ඉන්ස්ටිට්‍යුට්	අධ්‍යක්ෂ	ජංගම ගිණුම		18	18	

* මුදල් ඒකකය විශේෂයෙන් සඳහන් කොට නොමැති සංඛ්‍යා රුපියල් වලින් දක්වා ඇත.
** සමාන අඟය රුපියල් වලින්.
*** ඉහත ඒකකයන් හි කළමනාකරණ කටයුතු සිදු කරනු ලබන්නේ සී/ස සී බෑන්ක් ඇසේට් මැනේජ්මන්ට් සමාගම මඟිනි.

මූල්‍ය වාර්තාකරණයේ
අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

වගකීම
2007 අංක 11 දරණ බැංකු පනත් විධානයෙහි 3(8)(ii) වගන්තිය ප්‍රකාරව මූල්‍ය වාර්තාකරණයේ අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ මෙම වාර්තාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබේ.

ලංකා බැංකුවෙහි අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ ප්‍රමාණාත්මතාවය සහ සඵලදායීත්වය අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි. මෙහිදී බැංකු කටයුතු වලට අදාළ අවදානම් හා ප්‍රතිඵල සමබර ලෙස කළමනාකරණය කළ යුතු අතර, බැංකුවේ අවදානම් අභිරුචිය පිළිබඳ සීමා හා දර්ශක වල විචල්‍යතා ඉස්මතු වන සේ අභ්‍යන්තර පාලන පද්ධති මූලික වශයෙන් නිර්මාණය කරයි. මේ අනුව මූල්‍ය තොරතුරු හා වාර්තාවල මූලික අවප්‍රකාශයන් හෝ මූල්‍ය අලාභයන් හෝ වංචා වලට එරෙහිව අභ්‍යන්තර පාලන පද්ධතීන්ට ලබාදිය හැක්කේ පූර්ණ සහතිකයක් නොව සාධාරණ සහතිකයක් පමණි.

බැංකුව විසින් මුහුණ පෑ හැකි සැලකිය යුතු අවදානම් කාරකයන් හඳුනාගැනීම ප්‍රමාණ නිර්ණය නිරීක්ෂණය සහ කළමනාකරණය සඳහා වූ අඛණ්ඩව බලපැවැත්වෙන ක්‍රමවේදයක් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ස්ථාපනය කර ඇත. ව්‍යාපාර පරිසරයේ සහ ව්‍යවස්ථාපිත මාර්ග සූචකයන්හි සිදුවන වෙනස් වීම් වලට අනුරූපීව මූල්‍ය වාර්තාකරණයට අදාල අභ්‍යන්තර පාලන පද්ධති වර්ධනය කිරීම හා ශක්තිමත් කිරීමද මෙයට ඇතුලත් වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී වරුන්ගේ ආයතන විසින් බැංකු අධ්‍යක්ෂවරුන් හට මඟ පෙන්වීම සඳහා නිකුත්කර ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව උපයෝගී කරගනිමින් සහ ඒ අනුව යමින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිරතුරුවම ඉහත සඳහන් ක්‍රමවේදය නිරීක්ෂණය කරනු ලබයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන කටයුතු නිරීක්ෂණයේදී ඉහත මඟපෙන්වීම්හි සඳහන් පරිදි අභ්‍යන්තර පාලන පද්ධති තක්සේරු කිරීමේ මූලධර්ම යොදාගෙන ඇත.

දැනට ක්‍රියාත්මක වන මූල්‍ය වාර්තාකරණය පිළිබඳ අභ්‍යන්තර පාලන පද්ධති සාධාරණ සහතික ප්‍රතිඥාවක් ලබා දීමට ප්‍රමාණවත් බව අධ්‍යක්ෂ මණ්ඩලයේ මතයයි. තවද බාහිර උපයෝගීතාවය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශයන් අදාල ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට සහ ව්‍යවස්ථාපිත අවශ්‍යතා වලට අනුකූල බවද අධ්‍යක්ෂ මණ්ඩලය විශ්වාස කරයි.

මතුවූ අවදානම් හඳුනා ගැනීමට හා තක්සේරු කිරීමට මෙන්ම එම අවදානම් අවම කිරීමට හා පාලනය කිරීමට සුදුසු අභ්‍යන්තර පාලන විධි නිර්මාණය, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම මඟින් අවදානම් සහ පාලනයන් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලීය ප්‍රතිපත්ති සහ ක්‍රියා මාර්ග භාවිතයට කළමණාකාරිත්වය සහාය දක්වනු ලැබේ.

අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි සැලැස්ම සහ සඵලදායීත්වය නිරීක්ෂණය කිරීමේදී යොදා ගන්නා ලද ක්‍රමවේදය සහ එහි මූලික ලක්ෂණ.
අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන්හි ප්‍රමාණාත්මකතාවය සහ සම්පූර්ණත්වය නිරීක්ෂණය කිරීමට ස්ථාපිත කර ඇති ප්‍රධාන ක්‍රමවේදයන්හි පහත දෑ ඇතුලත් වේ.

- බැංකුවෙහි දෛනික කටයුතු වල සඵලතාවය සහ බැංකුවේ සමස්ථ මෙහෙයුම් අනුමත කළ ආයතනික සැලැස්ම මඟින් උකහා පිළියෙල කල ආයතනික අරමුණු, උපක්‍රම සහ වාර්ෂික අයවැය අනුව පවතීද යන්න සහතික කර ගැනීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සහය පිණිස විවිධ කමිටු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පිහිටුවා ඇත.

- නියැදි හා චක්‍රීය ක්‍රම භාවියෙන්, ප්‍රතිපත්තීන්ට හා ක්‍රියාදාමයන්ට අනුගත වීම සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි කාර්යසාධනය පිළිබඳව අඛණ්ඩව පරීක්ෂා කිරීම බැංකුවේ අභ්‍යන්තර විගණන අංශය මඟින් සිදු කරනු ලබන අතර එමඟින් සොයාගනු ලබන සැලකිය යුතු අනුගත නොවීම් අවධානයට ලක් කරනු ලබයි. සියලු අංශ වල සහ ශාඛාවල විගණනයන් පවත්වනු ලබන අතර, ස්වාධීන සහ විෂයමූලික වාර්තාවක් නිකුත් කිරීම උදෙසා විගණනයෙහි වාර ගණන ඇගයීමට ලක්වූ අවදානම මත තීරණය වේ. වාර්ෂික විගණන සැලසුම අධ්‍යක්ෂ මණ්ඩල විගණන නිරීක්ෂණ කමිටුව නිරීක්ෂණය කොට අනුමත කරනු ලබයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ සොයාගැනීම් අධ්‍යක්ෂ මණ්ඩල විගණන නිරීක්ෂණ කමිටුවේ නිරන්තර රැස්වීම්හි නිරීක්ෂණය සඳහා යොමු කරයි.

අභ්‍යන්තර පාලනය පිළිබඳ වූ අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව

- නියාමන අධිකාරීන්, කළමනාකාරිත්වය, අභ්‍යන්තර හා බාහිර විගණකයින් විසින් හඳුනාගත් පාලනය පිළිබඳ ගැටළු පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩල විගණන කමිටුව විසින් අවධානය යොමුකර අවදානම් කළමනාකරණයෙහි සහ අභ්‍යන්තර පාලන පද්ධතියෙහි ප්‍රමාණාත්මකභාවය සහ කාර්යසාධනය පිළිබඳ ඇගයීම් සිදුකරයි.

- අභ්‍යන්තර විගණන ක්‍රියාවලියෙහි ගුණාත්මකභාවය සහ විෂයපථය පිරික්සීමද විගණන කමිටුව මඟින් සිදු කරයි.

- විගණන කමිටුවේ රැස්වීම් වාර්තා ඉදිරිපත් කරනු ලැබේ. පිටු අංක 139 සිට 141 දක්වා ඇති විගණන කමිටු වාර්තාවෙහි විගණන කමිටුව විසින් අදාළ වර්ෂය තුළ ක්‍රියාත්මක වීම සවිස්තරව දක්වා ඇත

- අභ්‍යන්තර පාලන පද්ධති ඇගයීමේදී, හඳුනාගත් බැංකු නිලධාරීන් විසින් මූල්‍ය ප්‍රකාශයන්හි වැදගත් ගිණුම් සහ හෙලිදරව් කිරීම් වලට සම්බන්ධ සියළු ක්‍රියා පිළිවෙත් සහ පාලනයන් පරතුලනය කරන ලදී. එහි සැලැස්මේ උචිතභාවය හා සඵලතාවය පිළිබඳ අභ්‍යන්තර විගණන අංශය විසින් නැවත නිරීක්ෂණය කරන ලදී. 2012 වර්ෂය නව ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරන ප්‍රමිත යොදා ගන්නා පළමු වසර හෙයින් ඊට අදාළ නව හඳුනාගැනීමේ, මිණුම් කිරීමේ හා වර්ගීකරණය කිරීමේ අවශ්‍යතාවන්ට යෝග්‍ය ක්‍රියා පටිපාටි සකස් කරන ලදී. මෙහිදී බැංකුවේ පරිපාලිත සමාගම් විසින් සිදු කරන ලද ක්‍රියාපටිපාටීන් විශ්ලේෂණය කර නැත.

තහවුරු කිරීම

ඉහත සඳහන් ක්‍රියාවලීන් හා ක්‍රියා දාමයන් පදනම්ව බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණ පද්ධතිය නිර්මාණය කර ඇත්තේ බැංකුවෙහි මූල්‍ය වාර්තාකරණය ශ්‍රී ලංකා මහ බැංකුවේ නියාමන අවශ්‍යතාවයන් සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව, බාහිර අරමුණු උදෙසා මූල්‍ය ප්‍රකාශන සැකසීමේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතික වීමක් සැපයෙන අයුරින් බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරනු ලැබේ.

විගණකාධිපති වාර්තාව පිළිබඳ සමාලෝචනය

බැංකුවේ බාහිර විගණක වන විගණකාධිපති විසින් 2012 වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසරට අදාල වාර්ෂික වාර්තාවේ දක්වා ඇති අභ්‍යන්තර පාලනය පිළිබඳව අධ්‍යක්ෂකවරුන්ගේ වාර්තාව සමාලෝචනය කරන ලදී. බැංකුවේ මූල්‍ය වාර්තාකරණය උදෙසා වූ අභ්‍යන්තර පාලන පද්ධතියේ නිර්මාණය හා සඵලදායීතාවය සමාලෝචනය උදෙසා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ක්‍රියාවලිය මත ලද අවබෝධය සමග මෙම වාර්තාව සංගත නොවන බවට පැවසීමට තරම් කරුණක් විගණකාධිපතිගේ අවධානයට යොමු නොවූ බවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇත. අභ්‍යන්තර පාලනය පිළිබඳ වාර්තාවේ විගණකාධිපතිගේ ස්වාධීන විගණන වාර්තාව මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 235 හි දක්වා ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්

රාසික් සරූක්
සභාපති

රාජු සිවරාමන්
අධ්‍යක්ෂ

ආර් එම් ඒ රත්නායක
සභාපති විගණන කමිටුව

2013 මාර්තු 21
කොළඹ දීය

ස්වාධීන
සහතිකවීමේ වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය
எனது இல.
My No FB/F/BOC/IC/2012

ඔබේ අංකය
உமது இல
Your No.

දිනය
திகதி
Date 01 April 2013

ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයන්ට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ විගණකාධිපති විසින් ඉදිරිපත් කරනු ලබන සහතිකවීමේ වාර්තාව

හැඳින්වීම

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ වාර්ෂික වාර්තාවේ ඇතුළත් ලංකා බැංකුවේ අභ්‍යන්තර පාලනයට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ සහතිකවීමක් මෙම වාර්තාවෙන් සපයනු ලැබේ. මෙම සහතිකවීමේ කාර්යයේදී මා විසින් වෘත්තීය වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනයක සහාය ලබාගන්නා ලදී.

කළමනාකරණයේ වගකීම

2007 අංක 11 දරන බැංකු පනතේ 3 (8)(ii)(බී) වගන්තියට අනුකූලව ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති "අභ්‍යන්තර පාලනයට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු අධ්‍යක්ෂවරුන් සඳහා වූ මාර්ගෝපදේශයට" අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම, කළමනාකරණය සතු වගකීම වේ.

මාගේ වගකීම හා ශ්‍රී ලංකා සහතිකවීමේ කාර්යභාර ප්‍රමිත (ශ්‍රී ලං.ස.කා.ප්‍ර.) 3050ට අනුකූලවීම

මාගේ පරීක්ෂණ මත පදනම්ව මෙම අභ්‍යන්තර පාලනයන්ට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ වාර්තාවක් නිකුත්කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරුන්ගේ ආයතනය විසින් ප්‍රකාශයට පත්කර ඇති අභ්‍යන්තර පාලනයට අදාලව අධ්‍යක්ෂවරුන්ගේ ප්‍රකාශය පිළිබඳ බැංකු ආයතන සඳහා සහතිකවීමේ වාර්තාව ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050ට අනුකූලව මාගේ සහතිකවීමේ කාර්යභාරය මා විසින් මෙහෙයවා ඇත.

ඉටුකළ කාර්යයේ සාරාංශය

අදාල ප්‍රකාශය, අධ්‍යක්ෂවරුන් විසින් හෝ අධ්‍යක්ෂවරු සඳහා හෝ පිළියෙල කළ ලිපි ලේඛන යන දෙඅංශය මඟින් තහවුරු වන්නේද, සහ බැංකුව සඳහා වූ අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනයේදී අධ්‍යක්ෂවරුන් විසින් යොදාගෙන තිබෙන ක්‍රියාවලිය මඟින් මැනවින් පිළිබිඹු වන්නේද යන්න අගයකර බැලීම සඳහා මෙම කාර්යභාරය මෙහෙයවා තිබේ.

ඉටුකරන ලද ක්‍රියාපටිපාටීන්, නියැදි පදනම මත ලබාගත් බැංකු කාර්ය මණ්ඩල විමසීම් හා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදාගනු ලැබූ ක්‍රියාවලීන් සඳහා උපකාරී වන ලිපිලේඛන වල පැවැත්ම මත මූලික වශයෙන් සීමා වේ.

මෙම ප්‍රකාශය තුළින් සියලූ අවදානම් හා පාලනයන් ආවරණය වන්නේ දැයි සලකා බැලීම හෝ බැංකුවේ අවදානම් හා පාලන ක්‍රියාපටිපාටි වල සඵලදායීතාවය පිලිබඳ මතයක් ගොඩනැගීම හෝ ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050ට අනුව අවශ්‍ය නොවේ. එසේම ශ්‍රී ලං.ස.කා.ප්‍ර. 3050ට අනුව වාර්ෂික වාර්තාවේ හෙළිදරව් කර ඇති ප්‍රමාණාත්මක අභ්‍යන්තර පාලන අංශයන් පිළිබඳව පවතින සැලකිය යුතු ගැටළු සඳහා ක්‍රියාකිරීමට විස්තර කර ඇති ක්‍රියාවලීන් මඟින් එම ගැටළු සඳහා නියත පිළියම් ලැබේ දැයි යන්න මා විසින් සලකා බැලීම අවශ්‍ය නොවේ.

නිගමනය

ඉටුකරන ලද ක්‍රියාපටිපාටීන් මත පදනම්ව වාර්ෂික වාර්තාවේ ඇතුළත් ප්‍රකාශය, බැංකුවේ අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම හා සඵලදායකත්වය පිළිබඳ සමාලෝචනයේදී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් යොදවා ඇති ක්‍රියාවලිය පිළිබඳ මාගේ අවබෝධය හා සංගත නොවන බවට විශ්වාස කිරීමට හේතුවන කරුණු කිසිවක් මාගේ අවධානයට ලක්වී නොමැත.

එච් ඒ එස් සමරවීර
විගණකාධිපති

අංක 306/72 පොල්දූව පාර,
බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி,
பத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road,
Battaramulla , Sri Lanka

දූරකථනය
தொலைபேசி
Telephone 2887028 -34

ෆැක්ස් අංකය
பக்ஸ் இல
Fax No. 2887223

ඉලෙක්ට්‍රොනික් තැපෑල්
ஈ- மெயில்
E-mail. oaggov@sltnet.lk

අධ්‍යක්ෂ මණ්ඩලයේ
වගකීම පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය ප්‍රකාශ වාර්තාකරණයට අදාල අධ්‍යක්ෂවරුන්ගේ හා විගණකවරුන්ගේ වගකීම් පැහැදිලිව දැක්වීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම් පිළිබඳ ප්‍රකාශය සකසනු ලබයි. ලංකා බැංකුවේ හා සමූහයේ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම මෙම ප්‍රකාශය මගින් දැක්වේ.

මූල්‍ය ප්‍රකාශ
1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් සමඟ 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන් සහ විධිවිධානයන්ට අනුව, සෑම අවස්ථාවකදීම ප්‍රමාණවත් නිරවද්‍යතාවක් සමඟ බැංකුවේ මූල්‍ය තත්වය පිළිබිඹු කෙරෙන ගිණුම් පොත් බැංකුව විසින් පවත්වා ගෙන යාම තහවුරු කිරීමත් සහ බැංකුවේ කටයුතු පිළිබඳ තත්වය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය වන ආකාරයට සෑම මූල්‍ය වර්ෂයක් සඳහාම මූල්‍ය ප්‍රකාශන සකස්කර ඉදිරිපත් කිරීමත් බැංකුවේ අධ්‍යක්ෂවරුන්ගේ වගකීම වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය අදහස් කරන පරිදි මෙම වාර්ෂික වාර්තාවේ නිරූපනය කර ඇති, 2012 වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශය පිළියෙල කිරීමේදී වඩාත් යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්තීන් තෝරාගෙන ඇති අතර, ඒවා ඒකාකාරව භාවිතා කර, කළමනාකරණය විසින් වඩාත් සාධාරණ හා විවේකෂණ ලෙස තම විනිශ්චයන් සහ ඇස්තමේන්තු කිරීම් පාදක කරගෙන ඇත. භාවිතා කරන ලද ගිණුම් ප්‍රතිපත්තීන් පිළිබඳව ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් එවැනි දෑ පිළිබඳව අනාවරණය හා පැහැදිලි කිරීම්කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඇතුළත්කර ඇති 2012 වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධනයන් හා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන් හා අනෙකුත් නියාමන අවශ්‍යතාවයන් හා අනුකූලවන පරිදි සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශවලින් 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා බැංකුවේ හා සමූහයේ සත්‍ය හා සාධාරණ තත්වය නිරූපණය කෙරේ.

අඛණ්ඩ පැවැත්ම
අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය වන්නේ, බැංකුවට හා සමූහයට අනාගතය දැකිය හැකි නිශ්චිත කාලයක් සඳහා තම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට ප්‍රමාණවත් සම්පත් ඇති බවයි. ඒ අනුව මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී සහ ඉදිරිපත් කිරීමේදී තවදුරටත් අඛණ්ඩ පැවැත්ම පිළිබඳ සංකල්පය භාවිතාකර ඇත.

අභ්‍යන්තර පාලන, අවදානම් කළමනාකරණය හා අනුකූලතාවය
බැංකුවේ වත්කම්වල සුරක්ෂිතභාවය ආරක්ෂා කිරීමට මෙන්ම වංචාවන් සහ අවකළමනාකරණය වැළැක්වීමට, වඩාත් ශක්තිමත් අභ්‍යන්තර පාලන පරිසරයක් පවත්වාගෙන යාම සඳහා සැලකිය යුතු වැදගත්කමක් ලබා දීම, අභ්‍යන්තර මූල්‍ය පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම සහ අවදානම් කළමනාකරණය ද අධ්‍යක්ෂවරුන් සතු වගකීමකි.

ආවේණික හා අවශේෂ අවදානම් මුළුමනින්ම තුරන්කරලීම කළ නොහැකි නමුත් කලින් තීරණය කරන ලද පද්ධති හා සීමා පැනවීම් තුළ උචිත යටිතල පහසුකම්, පාලනයන්, පද්ධති හා ආචාරධර්ම පදනම් වූ චර්යාවන් භාවිතය හා ක්‍රියාවට නැංවීම තුළින් එවැනි දෑ අවම කරගැනීම තහවුරු කිරීම අපේක්ෂා කෙරේ.

මූල්‍ය වාර්තාකරණයේ යථානුරූපී බව පිළිබඳව සාධාරණ සහතිකවීමක් ලබාදෙන ආකාරයට මූල්‍ය වාර්තාකරණ පද්ධතිය සකසා ඇති බව පිටු අංක 233 හි අභ්‍යන්තර පාලනය පිළිබඳ අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව මඟින් තහවුරු කෙරේ.

අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණය විසින් අවදානම් කළමනාකරණ ප්‍රතිපත්තීන් සහ ඒ සඳහා වන මඟපෙන්වීම් මනා ලෙස සංවිධානය කර ඇත. ප්‍රමාණාත්මක අවදානම් පාලනය කිරීමටත්, ඒවා කළමනාකරණය කිරීමටත්, කළමනාකරණ කමිටු ස්ථාපිත කර ඇත. ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවට සාකච්ඡා කිරීම සඳහා කාර්තුමය පදනමක් මත අවදානම් වාර්තාවන් සැපයීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත. අදාල නීති, රෙගුලාසි, රීති, විධානයන් සහ මඟපෙන්වීම් සමඟ අනුකූලවන ආකාරය ස්වාධීන ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව විසින් අධීක්ෂණය කරන අතර, මේ පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලයට වාර්තා කෙරේ.

අභ්‍යන්තර පාලනයන් සහ අවදානම් කළමණාකරණ ක්‍රියාමාර්ගයන්ගේ කාර්යක්ෂමතාව ශක්තිමත් කිරීම සඳහා විගණන කමිටුව හා ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුව අඛණ්ඩව ක්‍රියා කරයි. විගණන කමිටුවේ හා ඒකාබද්ධ අවදානම් කළමණාකරණ කමිටුවේ වාර්තා මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 139 සහ 146 හි අන්තර්ගත වේ.

විගණන වාර්තාව
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අංක 154 වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා බැංකුවේ විගණකවරයා වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත විගණන වාර්තාව සහ අවසාන විගණන මතය ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ පිළිබඳව විගණකාධිපතිගේ වගකීම මෙම වාර්ෂික වාර්තාවෙහි පිටු අංක 237 හි ඇතුළත් කර ඇත. බැංකුවේ අභ්‍යන්තර පාලන යාන්ත්‍රණයේ කාර්යක්ෂමතාව පිළිබඳ විගණකාධිපතිවරයා විසින් ලබා දුන් සහතිකය මෙම වාර්ෂික වාර්තාවේ පිටු අංක 235 හි දක්වා ඇත.

අනුකූලතාව
මූල්‍ය තත්ව ප්‍රකාශ දිනට නියාමන හා ව්‍යවස්ථාපිත අධිකාරීන්ට ගෙවීමට ඇති සියලු ව්‍යවස්ථාපිත ගෙවීම් බැංකුව සහ පරිපාලිතයන් විසින් නියමිත පරිදි ගෙවා අවසන් කර හෝ ප්‍රතිපාදන සලසා ඇති බවට අධ්‍යක්ෂවරුන් ඔවුන්ගේ දැනුම හා විශ්වාසය පරිදි සෑහීමට පත් වේ.

මෙම වාර්තාවේ දක්වා ඇති පරිදි අධ්‍යක්ෂවරුන්ගේ මතය වන්නේ ඔවුන්ගේ වගකීම් යථා පරිදි ඉටුකර ඇති බවයි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,



ජානකී සේනානායක සිරිවර්ධන
ලේකම්, ලංකා බැංකුව/අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

2013 මාර්තු 21
කොළඹ දීය.

විගණකාධිපති වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT



මගේ අංකය
எனது இல.
My No: FB/F/BOC/FA/2012

ඔබේ අංකය
உமது இல
Your No.

දිනය
திகதி
Date: 28 March 2013

සභාපති
ලංකා බැංකුව

ලංකා බැංකුව හා එහි පරිපාලිතයන්හි 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකාධිපති වාර්තාව

ලංකා බැංකුවේ (බැංකුව) හා එහි පරිපාලිතයන්හි (සමූහය) 2012 දෙසැම්බර් 31 දිනට ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශය, විස්තීර්ණ ආදායම් ප්‍රකාශය, ස්කන්ධය වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ එහි වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අනෙකුත් පැහැදිලි කිරීම් වල සාරාංශයකින් සමන්විත බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සහ එහි පරිපාලිතයන්ගේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (I) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශන එම පරිපාලිතයන්ගේ සාමාජිකයන් විසින් පත්කරන ලද ප්‍රසිද්ධ වෘත්තියෙහි නියැලි වරලත් ගණකාධිකාරි ආයතන විසින් විගණනය කරන ලදී.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සේම, සැලසුම් නිර්මාණය, ක්‍රියාත්මක කිරීම සහ අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වාගෙන යාමට සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය යැයි කළමනාකරණය විසින් තීරණය කරනු ලබන අභ්‍යන්තර පාලනය කළමනාකරණයේ වගකීම වේ.

විගණකගේ පරාසය සහ නිගමනයෙහි පදනම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකල අතර මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවන් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිතීන් අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණය වන අගයන්ට අදාළව නියැදි පරීක්ෂණයන් සිදු කිරීම ඇතුළුව ගිණුම්කරණ ප්‍රතිපත්ති තක්සේරු කිරීම, කළමනාකරණය විසින් සිදුකරන ලද සුවිශේෂ ඇස්තමේන්තූන් සහ සියලුම මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම යන සියලු දෑ ද විගණනයට අයත් වේ. මාගේ විගණනයට අදාල සියලුම තොරතුරු හා පැහැදිලි කිරීම් මාගේ අනුදැනුම පරිදි උපරිම ලෙස ලබාගෙන ඇත. මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

මතය

2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ එහි පරිපාලිතයන්හි මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් බැංකුව විසින් සුදුසු ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යන බවත් මා දරන්නා වූ මතය වේ.

2012 දෙසැම්බර් 31 දිනට බැංකුවේ සහ එහි පරිපාලිතයන්ගේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව කොටස්කරුවන්ගේ අවශ්‍යතාවය පරිදි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

නිදහස් කිරීම්

1971 අංක 38 දරන මුදල් පනතේ 5 (ii) වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාර මුදල් අමාත්‍යවරයා විසින් 1992 මැයි 14 දිනැති අංක 715 දරන රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද නියෝගයක් මඟින් බැංකුව එකී මුදල් පනතේ II කොටසේ විධිවිධාන වලින් නිදහස් කර ඇත.

පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීම

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු මාගේ වාර්තාව යථා කාලයේදී සභාගත කෙරෙනු ඇත.

එච් ඒ එස් සමරවීර
විගණකාධිපති

අංක 306/72 පොල්දූව පාර,
බත්තරමුල්ල , ශ්‍රී ලංකාව

இல. 306/72, பொல்துவ வீதி,
பத்தரமுல்லை இலங்கை

No.306/72, Polduwa Road,
Battaramulla , Sri Lanka

දුරකථනය
தொலைபேசி
Telephone: 2887028 -34

ෆැක්ස් අංකය
பக்ஸ் இல
Fax No.: 2887223

ඉලෙක්ට්‍රොනික් තැපැල්
ஈ- மெயில்
E-mail.: oaggov@sltnet.lk

ආදායම්
ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන් අංකය	බැංකුව 2012 රු.'000	බැංකුව 2011 රු.'000	බැංකුව වෙනස %	සමූහය 2012 රු.'000	සමූහය 2011 රු.'000	සමූහය වෙනස %
මුළු ආදායම	7	110,137,919	70,456,979	56.3	115,527,161	74,856,653	54.3
පොළී ආදායම	8.1	95,021,794	61,222,410	55.2	98,751,348	64,208,696	53.8
පොළී වියදම	8.2	(59,700,875)	(36,215,901)	64.8	(61,489,053)	(37,384,647)	64.5
ශුද්ධ පොළී ආදායම	8	35,320,919	25,006,509	41.2	37,262,295	26,824,049	38.9
ගාස්තු සහ කොමිස් ආදායම	9	7,320,001	6,676,092	9.6	7,531,297	6,939,856	8.5
ගාස්තු සහ කොමිස් වියදම	9	(654,195)	(542,911)	20.5	(761,209)	(609,243)	24.9
ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම	9	6,665,806	6,133,181	8.7	6,770,088	6,330,613	6.9
වෙළඳ කටයුතු වලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	10	3,773,334	319,477	1,081.1	3,753,375	269,010	1,295.3
මූල්‍ය ආයෝජනවලින් ලද ශුද්ධ ලාභය/(අලාභය)	11	366,407	347,748	5.4	368,206	353,480	4.2
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණයන් ගෙන් ලත් ශුද්ධ ලාභය/(අලාභය)		-	-	-	-	-	
වෙනත් මෙහෙයුම් ආදායම්	12	3,656,383	1,891,252	93.3	5,122,935	3,085,611	66.0
මුළු මෙහෙයුම් ආදායම		49,782,849	33,698,167	47.7	53,276,899	36,862,763	44.5
ණය හානිය සහ වෙනත් අලාභයන් සඳහා (ප්‍රතිපාදන)/ප්‍රතිවර්ත්‍ය කිරීම	13	(5,904,282)	2,257,722	(361.5)	(6,005,882)	1,309,744	(558.6)
ශුද්ධ මෙහෙයුම් ආදායම		43,878,567	35,955,889	22.0	47,271,017	38,172,507	23.8
සේවක මණ්ඩල වියදම්	14	(12,926,831)	(10,460,089)	23.6	(14,061,777)	(11,462,039)	22.7
වෙනත් වියදම්	15	(7,943,147)	(6,495,330)	22.3	(9,726,840)	(7,830,881)	24.2
මුළු මෙහෙයුම් වියදම්		(20,869,978)	(16,955,419)	23.1	(23,788,617)	(19,292,920)	23.3
එකතු කළ අගය මත බද්දට පෙර මෙහෙයුම් ලාභය		23,008,589	19,000,470	21.1	23,482,400	18,879,587	24.4
මූල්‍ය සේවා සඳහා එකතු කළ අගය මත බදු		(3,214,291)	(2,515,755)	27.8	(3,274,717)	(2,596,957)	26.1
එකතු කළ අගය මත බද්දට පසු මෙහෙයුම් ලාභය		19,794,298	16,484,715	20.1	20,207,683	16,282,630	24.1
බදු අයකිරීමට පෙර ආශ්‍රිත සමාගම් වල ලාභයේ/(අලාභයේ) කොටස	16	-	-	-	38,585	208,716	(81.5)
ආදායම් බද්දට පෙර ලාභය		19,794,298	16,484,715	20.1	20,246,268	16,491,346	22.8
ආදායම් බදු වියදම	17	(5,377,677)	(4,567,110)	17.7	(5,638,274)	(4,824,536)	16.9
වර්ෂය සඳහා ලාභය		14,416,621	11,917,605	21.0	14,607,994	11,666,810	25.2
වර්ෂයේ ලාභයෙන් :							
මව් සමාගමේ ස්කන්ධ හිමියන්ට අදාල කොටස		14,416,621	11,917,605	21.0	14,580,264	11,592,078	25.8
පාලනයට යටත් නොවන හිමිකම්		-	-	-	27,730	74,732	(62.9)
වර්ෂය සඳහා ලාභය		14,416,621	11,917,605	21.0	14,607,994	11,666,810	25.2
කොටසක ඉපැයුම							
කොටසක මූලික ඉපැයුම (රු.)	18.1	2,883.32	2,383.52	21.0	2,916.05	2,318.42	25.8
කොටසක තනුක ඉපැයුම (රු.)	18.2	2,883.32	2,383.52	21.0	2,916.05	2,318.42	25.8
කොටසක ලාභාංශය (රු.)	18.3	1,069.28	769.28	39.0	1,069.28	769.28	39.0

පිටු අංක 244 සිට 338 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

විස්තීරණ
ආදායම් ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන් අංකය	බැංකුව 2012 රු.'000	බැංකුව 2011 රු.'000	බැංකුව වෙනස %	සමූහය 2012 රු.'000	සමූහය 2011 රු.'000	සමූහය වෙනස %
වර්ෂය සඳහා ලාභය		14,416,621	11,917,605	21.0	14,607,994	11,666,810	25.2
විදේශීය මෙහෙයුම් පරිවර්තනයේදී ඇතිවන විනිමය අසමානතා	48.7	253,847	(130,541)	294.5	567,944	(135,398)	519.5
විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් මත ජීවගණක ලාභ/(අලාභ)		431,641	851,384	(49.3)	421,634	820,521	(48.6)
දේපළ, පිරියත හා උපකරණ වල ප්‍රත්‍යාගණන ලාභ/(අලාභ)		696,307	4,710,770	(85.2)	738,219	5,658,237	(87.0)
ප්‍රත්‍යාගණන ලාභය මත විලම්බිත බදු බලපෑම	48.4	(86,654)	(223,408)	(61.2)	(86,654)	(488,699)	(82.3)
		1,295,141	5,208,205	(75.1)	1,641,143	5,854,661	(72.0)
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් නැවත අගය කිරීමෙන් ලැබූ ලාභ/(අලාභ)		(766,275)	(1,832,161)	(58.2)	(1,038,486)	(1,424,698)	(27.1)
මුළු වෙනත් විස්තීරණ ආදායම		528,866	3,376,044	(84.3)	602,657	4,429,963	(86.4)
වෙනත් විස්තීරණ ආදායම්වලට අදාළ ආදායම් බදු වියදම්		-	-	-	-	-	-
වර්ෂය සඳහා අදාළ මුළු වෙනත් විස්තීරණ ආදායම, බදු ගෙවූ පසු		528,866	3,376,044	(84.3)	602,657	4,429,963	(86.4)
වර්ෂය සඳහා අදාළ සමස්ත විස්තීරණ ආදායම, බදු ගෙවූ පසු		14,945,487	15,293,649	(2.3)	15,210,651	16,096,773	(5.5)
මුළු විස්තීරණ ආදායමෙන්:							
මව් සමාගමේ ස්කන්ධ හිමියන්ට අදාල කොටස		14,945,487	15,293,649	(2.3)	15,204,828	15,957,656	(4.7)
පාලනයට යටත් නොවන හිමිකම්		-	-	-	5,823	139,117	(95.8)
		14,945,487	15,293,649	(2.3)	15,210,651	16,096,773	(5.5)

පිටු අංක 244 සිට 338 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

මූල්‍ය
තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන් අංකය	බැංකුව 31.12.2012 රු. '000	31.12.2011 රු. '000	වෙනස %	01.01.2011 රු. '000	සමූහය 31.12.2012 රු. '000	31.12.2011 රු. '000	වෙනස %	01.01.2011 රු. '000
වත්කම්									
මුදල් හා කෙටි කාලීන අරමුදල්	20	31,544,558	18,670,911	69.0	14,103,803	31,955,777	18,780,907	70.2	13,786,344
මහ බැංකු සමඟ ඇති ශේෂ	21	29,963,240	30,222,650	(0.9)	25,641,964	29,963,240	30,222,650	(0.9)	25,641,964
බැංකු වල ඇති තැන්පතු	22	19,394,466	14,580,998	33.0	42,708,657	25,577,197	18,885,470	35.4	47,810,453
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	23	507,451	63,211	702.8	239,780	507,451	63,211	702.8	239,780
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගනු ලැබූ සුරැකුම්පත්		797,425	1,094,934	(27.2)	40,853,170	1,423,796	1,630,165	(12.7)	40,863,129
මූල්‍ය වත්කම් - වෙළඳාම සඳහා දරා සිටින	24	15,541,185	40,296,813	(61.4)	47,192,646	16,028,758	40,752,353	(60.7)	47,852,471
මූල්‍ය ආයෝජන - ණය හා ලැබිය යුතු දෑ	25	99,206,859	89,739,284	10.6	88,448,678	99,182,351	89,636,684	10.6	88,448,678
ගනුදෙනුකරුවන්ට ලබා දුන් ණය හා අත්තිකාරම්	26	691,899,207	543,148,965	27.4	368,301,921	709,933,498	558,254,483	27.2	379,477,713
මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින	27	12,080,988	12,864,301	(6.1)	12,828,058	14,361,925	15,903,141	(9.7)	14,786,474
මූල්‍ය ආයෝජන - කල් පිරෙන තෙක් දරා සිටින	28	110,956,202	51,386,437	115.9	51,641,782	111,706,459	51,842,461	115.5	52,603,444
පරිපාලිත සමාගම්වල ආයෝජන	29	6,792,848	6,240,686	8.8	5,279,094	-	-	-	-
ආශ්‍රිත සමාගම්වල ආයෝජන	30	842,988	842,988	-	844,658	1,268,995	1,282,678	(1.1)	1,172,760
ආයෝජන දේපළ	31	-	-	-	-	147,047	165,875	(11.4)	386,867
දේපළ, පිරියත සහ උපකරණ	32	11,430,827	10,518,926	8.7	5,544,589	18,437,863	17,480,943	5.5	11,369,145
කල්බදු දේපළ	33	84,976	76,270	11.4	77,515	124,724	117,376	6.3	119,978
අස්පෘශ්‍ය වත්කම්	34	376,002	342,839	9.7	163,826	461,955	413,229	11.8	170,037
විලම්බිත බදු වත්කම්	35	-	-	-	842,543	73,042	76,300	(4.3)	842,543
වෙනත් වත්කම්	36	16,801,769	18,182,827	(7.6)	15,535,062	18,199,140	19,125,554	(4.8)	16,497,285
මුළු වත්කම්		1,048,220,991	838,273,040	25.0	720,247,746	1,079,353,218	864,633,480	24.8	742,069,065
වගකීම්									
බැංකුවලට ගෙවිය යුතු	37	10,127,983	6,507,833	55.6	2,214,596	10,329,510	8,357,333	23.6	2,458,511
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	38	74,314	987,775	(92.5)	157,854	74,314	987,775	(92.5)	157,854
ගනුදෙනුකරුවන්ට ගෙවිය යුතු	39	693,440,642	595,773,738	16.4	530,091,812	700,168,802	603,406,426	16.0	537,153,200
වෙනත් ණය ගැනීම්	40	233,795,515	138,388,932	68.9	105,169,017	245,140,679	143,359,562	71.0	109,693,669
නිකුත් කළ ණය සුරැකුම්පත්	41	23,296,349	25,236,518	(7.7)	26,623,371	24,481,798	26,429,041	(7.4)	27,369,072
ප්‍රවර්තන බදු වගකීම්		2,208,461	1,139,464	93.8	2,199,758	2,418,079	1,289,186	87.6	2,422,527
විලම්බිත බදු වගකීම්	35	351,279	395,268	(11.1)	46,185	1,699,612	1,759,690	(3.4)	1,125,893
රක්ෂණ ප්‍රතිපාදන (ජීවිත රක්ෂණ)	42.1	-	-	-	-	166,087	115,210	44.2	78,681
රක්ෂණ ප්‍රතිපාදන (ජීවිත නොවන රක්ෂණ)	42.2	-	-	-	-	571,068	342,848	66.6	264,490
වෙනත් වගකීම්	43	10,155,542	11,134,423	(8.8)	10,346,562	11,859,101	12,402,274	(4.4)	11,399,724
යටත් කාලීන ණය	45	23,818,024	17,355,284	37.2	13,492,025	23,801,505	17,343,828	37.2	13,492,025
මුළු වගකීම්		997,268,109	796,919,235	25.1	690,341,180	1,020,710,555	815,793,173	25.1	705,615,646
ස්කන්ධය									
කොටස් ප්‍රාග්ධනය	46	5,000,000	5,000,000	-	5,000,000	5,000,000	5,000,000	-	5,000,000
ස්ථාවර සංචිත අරමුදල	47	3,285,955	3,008,000	9.2	2,777,500	3,285,955	3,008,000	9.2	2,777,500
රඳවාගත් ඉපැයුම්		27,639,146	21,733,008	27.2	14,563,559	29,318,089	23,355,259	25.5	16,616,493
වෙනත් සංචිත	48	15,027,781	11,612,797	29.4	7,565,507	19,621,126	16,028,017	22.4	10,794,955
මව් සමාගමට අයත් මුළු ස්කන්ධය		50,952,882	41,353,805	23.2	29,906,566	57,225,170	47,391,276	20.8	35,188,948
පාලනයට යටත් නොවන හිමිකම්		-	-	-	-	1,417,493	1,449,031	(2.2)	1,264,471
මුළු ස්කන්ධය		50,952,882	41,353,805	23.2	29,906,566	58,642,663	48,840,307	20.1	36,453,419
මුළු වගකීම් සහ ස්කන්ධය		1,048,220,991	838,273,040	25.0	720,247,746	1,079,353,218	864,633,480	24.8	742,069,065
අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්	50	455,180,815	409,747,168	11.1	313,039,513	455,863,271	410,879,389	10.9	314,956,820
කොටසක ශුද්ධ වත්කම් (රු.)		10,190.58	8,270.76	23.2	5,981.31	11,445.03	9,478.26	20.8	7,037.79

පිටු අංක 244 සිට 338 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

මෙම මූල්‍ය ප්‍රකාශන 2012 දෙසැම්බර් 31 දිනට ලංකා බැංකුවේ සහ සමූහයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වූ වර්ෂයේ ලාභය සත්‍ය හා සාධාරණ ලෙස නිරූපණය කරන බවට සහතික කරමි.

ඩබ්ලිව් ඒ අසෝක රූපසිංහ
ප්‍රධාන මූල්‍ය නිළධාරී

මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුය.
අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් අනුමත කොට අත්සන් කරන ලදී.

රාසීක් සරූක්
සභාපති

ආර් සිවරාමන්
අධ්‍යක්ෂ

ඩී එම් ගුණසේකර
මහා කළමනාකරු

2013 මාර්තු 21 දින
කොළඹ දීය

ස්කන්ධය
වෙනස්වීමේ ප්‍රකාශය

බැංකුව			අනෙකුත් සංචිත					
	සටහන් අංකය	කොටස් ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	විකිණීම සඳහා තබා ඇති මූල්‍ය උපකරණ සඳහා සංචිත [සටහන 48.8]	ආයෝජන අරමුදල් ගිණුම	අනෙකුත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ලාභ	මුළු ස්කන්ධය
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	2,777,500	-	-	1,516,295	125,299	18,712,777	28,131,871
2011 ජනවාරි 01 දිනට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත භාවිතයේ බලපෑම		-	-	6,001,624	-	(77,711)	-	(4,149,218)	1,774,695
2011 ජනවාරි 01 දිනට ගළපන ලද ශේෂය		5,000,000	2,777,500	6,001,624	-	1,438,584	125,299	14,563,559	29,906,566
2011 ජනවාරි 01 දිනට ශේෂය		5,000,000	2,777,500	6,001,624	-	1,438,584	125,299	14,563,559	29,906,566
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම									
වර්ෂය සඳහා ලාභය		-	-	-	-	-	-	11,917,605	11,917,605
වෙනත් විස්තීරණ ආදායම් (බදු පසු)		-	-	(1,832,161)	-	(130,541)	4,487,362	851,384	3,376,044
		-	-	(1,832,161)	-	(130,541)	4,487,362	12,768,989	15,293,649
2011 වර්ෂය සඳහා ලාභාංශ	18.3	-	-	-	-	-	-	(3,846,410)	(3,846,410)
ආයෝජන අරමුදල් ගිණුමට පැවරුම්	48.2	-	-	-	1,484,073	-	-	(1,484,073)	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	47	-	230,500	-	-	-	-	(230,500)	-
ප්‍රාථමික වෙළඳ විශේෂ අවධානම් සංචිතයට පැවරුම්	48.5	-	-	-	-	38,557	-	(38,557)	-
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	3,008,000	4,169,463	1,484,073	1,346,600	4,612,661	21,733,008	41,353,805
2012 ජනවාරි 01 දිනට ශේෂය		5,000,000	3,008,000	4,169,463	1,484,073	1,346,600	4,612,661	21,733,008	41,353,805
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම									
වර්ෂය සඳහා ලාභය		-	-	-	-	-	-	14,416,621	14,416,621
වෙනත් විස්තීරණ ආදායම්, බදු පසු		-	-	(766,275)	-	253,847	609,653	431,641	528,866
		-	-	(766,275)	-	253,847	609,653	14,848,262	14,945,487
2012 වර්ෂය සඳහා ලාභාංශය	18.3	-	-	-	-	-	-	(5,346,410)	(5,346,410)
ආයෝජන අරමුදල් ගිණුමට පැවරුම්	48.2	-	-	-	3,232,612	-	-	(3,232,612)	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	47	-	277,955	-	-	-	-	(277,955)	-
ප්‍රාථමික වෙළඳ විශේෂ අවධානම් සංචිතයට පැවරුම්	48.5	-	-	-	-	85,147	-	(85,147)	-
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	3,285,955	3,403,188	4,716,685	1,685,594	5,222,314	27,639,146	50,952,882

පිටු අංක 244 සිට 338 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

ස්කන්ධය
වෙනස්වීමේ ප්‍රකාශය

සමූහය			අනෙකුත් සංචිත							
	සටහන් අංකය	කොටස් ප්‍රාග්ධනය	ස්ථාවර සංචිත අරමුදල	විකිණීම් සඳහා තබා ඇති මූල්‍ය උපකරණ සඳහා සංචිත [සටහන 48.8]	ආයෝජන අරමුදල් ගිණුම	අනෙකුත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිතය	රඳවාගත් ලාභ	පාලනයට යටත් නොවන හිමිකම	මුළු ස්කන්ධය
		රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000	රු. '000
2010 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	2,777,500	-	-	1,846,865	178,692	20,393,029	1,065,411	31,261,497
2011 ජනවාරි 01 දිනට ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත භාවිතයේ බලපෑම		-	-	6,429,916	-	(75,121)	2,414,603	(3,776,536)	199,060	5,191,922
2011 ජනවාරි 01 දිනට ගළපන ලද ශේෂය		5,000,000	2,777,500	6,429,916	-	1,771,744	2,593,295	16,616,493	1,264,471	36,453,419
2011 ජනවාරි 01 දිනට ශේෂය		5,000,000	2,777,500	6,429,916	-	1,771,744	2,593,295	16,616,493	1,264,471	36,453,419
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම										
වර්ෂය සඳහා ලාභය		-	-	-	-	-	-	11,592,078	74,732	11,666,810
වෙනත් විස්තීරණ ආදායම් (බදු පසු)		-	-	(1,442,422)	-	(135,398)	5,122,877	820,521	64,385	4,429,963
		-	-	(1,442,422)	-	(135,398)	5,122,877	12,412,599	139,117	16,096,773
2011 වර්ෂය සඳහා ලාභාංශ	18.3	-	-	-	-	-	-	(3,846,410)	(63,834)	(3,910,244)
ආයෝජන අරමුදල් ගිණුමට පැවරුම්	48.2	-	-	-	1,570,276	-	-	(1,570,276)	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	47	-	230,500	-	-	-	-	(230,500)	-	-
වෙනත් සංචිත වලට පැවරුම්		-	-	-	-	79,172	-	(79,172)	-	-
අත්පත් කර ගැනීම්, බැහැර කිරීම් සහ පාලනයට යටත් නොවන හිමිකම්හි වෙනස්වීම්		-	-	-	-	-	-	91,082	109,277	200,359
ප්‍රාථමික වෙළඳ විශේෂ අවධානම් සංචිතයට පැවරුම්	48.5	-	-	-	-	38,557	-	(38,557)	-	-
2011 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	3,008,000	4,987,494	1,570,276	1,754,075	7,716,172	23,355,259	1,449,031	48,840,307
2012 ජනවාරි 01 දිනට ශේෂය		5,000,000	3,008,000	4,987,494	1,570,276	1,754,075	7,716,172	23,355,259	1,449,031	48,840,307
වර්ෂය සඳහා මුළු විස්තීරණ ආදායම										
වර්ෂය සඳහා ලාභය		-	-	-	-	-	-	14,580,264	27,730	14,607,994
වෙනත් විස්තීරණ ආදායම්, බදු පසු		-	-	(1,016,579)	-	567,944	651,565	421,634	(21,907)	602,657
		-	-	(1,016,579)	-	567,944	651,565	15,001,898	5,823	15,210,651
2012 වසර සඳහා ලාභාංශ	18.3	-	-	-	-	-	-	(5,346,410)	-	(5,346,410)
පාලනයට යටත් නොවන හිමිකම් සඳහා ගෙවූ පරිපාලිත ලාභාංශ		-	-	-	-	-	-	-	(60,302)	(60,302)
ආයෝජන අරමුදල් ගිණුමට පැවරුම්	48.2	-	-	-	3,279,672	-	-	(3,279,672)	-	-
ස්ථාවර සංචිත අරමුදලට පැවරුම්	47	-	277,955	-	-	-	-	(277,955)	-	-
වෙනත් සංචිත වලට පැවරුම්		-	-	-	-	25,360	-	(25,360)	-	-
අත්පත් කර ගැනීම්, බැහැර කිරීම් සහ පාලනයට යටත් නොවන හිමිකම්හි වෙනස්වීම්		-	-	-	-	-	-	(24,524)	22,941	(1,583)
ප්‍රාථමික වෙළඳ විශේෂ අවධානම් සංචිතයට පැවරුම්	48.5	-	-	-	-	85,147	-	(85,147)	-	-
2012 දෙසැම්බර් 31 දිනට ශේෂය		5,000,000	3,285,955	3,970,915	4,849,948	2,432,526	8,367,737	29,318,089	1,417,493	58,642,663

පිටු අංක 244 සිට 338 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

මුදල් ප්‍රවාහ
ප්‍රකාශය

දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා	සටහන් අංකය	බැංකුව 2012 රු. '000	බැංකුව 2011 රු. '000	සමූහය 2012 රු. '000	සමූහය 2011 රු. '000
මෙහෙයුම් කටයුතුවලින් ලත් මුදල් ප්‍රවාහ					
ආදායම් බදුවලට පෙර ලාභය		19,794,298	16,484,715	20,246,268	16,491,346
ගැලපීම් :					
ශුද්ධ පොළී ආදායම	8	(35,320,919)	(25,006,509)	(37,262,295)	(26,824,049)
වෙළඳ සුරැකුම්පත් වෙනුවෙන් ලැබූ ලාභාංශ ආදායම	10	(94,153)	(86,786)	(94,377)	(91,845)
පරිපාලිත හා ආශ්‍රිත සමාගම් වලින් ලැබූ ලාභාංශ		(324,798)	(278,091)	-	-
ආශ්‍රිත සමාගම් වලින් ලද (ලාභයේ)/අලාභයේ කොටස (බදුපෙර)	16	-	-	(38,585)	(208,716)
මෙහෙයුම් වත්කම්වල වෙනස්වීම්	49.1	(116,036,895)	(132,698,370)	(115,905,927)	(139,145,819)
මෙහෙයුම් වගකීම්වල වෙනස්වීම්	49.2	82,392,310	82,140,834	83,188,312	84,258,673
බදු පෙර ලාභයේ ඇතුලත් මුදල් නොවන වෙනත් අයිතම	49.3	7,732,156	2,353,683	8,104,859	3,015,001
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද වෙනත් ශුද්ධ (ලාභ)/අලාභ		(465,822)	(368,200)	(464,247)	(378,671)
		(42,323,823)	(57,458,724)	(42,225,992)	(62,884,080)
නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් සඳහා දායකත්වය		(4,156,871)	(3,257,607)	(4,169,844)	(3,268,782)
පොළී ලැබීම්		66,059,418	46,899,319	69,705,947	49,923,644
පොළී ගෙවීම්		(34,795,501)	(25,179,000)	(37,108,275)	(26,157,931)
ලාභාංශ ලැබීම්		94,153	86,786	94,377	91,845
ආදායම් බදු වලට පෙර මෙහෙයුම් කටයුතු වලට යෙදූ ශුද්ධ මුදල්		(15,122,624)	(38,909,226)	(13,703,787)	(42,295,304)
ආදායම් බදු ගෙවීම්		(4,148,349)	(3,439,227)	(4,382,700)	(3,576,228)
මෙහෙයුම් කටයුතු වලට යෙදූ ශුද්ධ මුදල්		(19,270,973)	(42,348,453)	(18,086,487)	(45,871,532)
ආයෝජන කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහ					
කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන වල ශුද්ධ වැඩිවීම		(56,731,405)	(1,576,946)	(57,025,638)	(1,071,309)
විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන වල ශුද්ධ වැඩිවීම		(1,727,908)	(1,868,404)	(1,281,698)	(2,549,911)
ණය සහ ලැබීම් යුතු දෑ හි මූල්‍ය ආයෝජන වල ශුද්ධ වැඩිවීම		(9,480,520)	(1,290,607)	(9,558,613)	(1,188,006)
පරිපාලිතයන්හි ඇල්මේ වැඩිවීම		(596,624)	-	(1,350)	-
ආයෝජන දේපළ අත්පත් කර ගැනීම		-	-	-	(15,000)
දේපළ, පිරියත, උපකරණ සහ කල්බදු දේපළ අත්පත් කර ගැනීම		(1,066,781)	(1,085,125)	(1,316,646)	(1,562,216)
අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම		(153,783)	(275,283)	(166,401)	(342,517)
ආයෝජන දේපළ වලින් ලද මුදල්		-	-	1,140	232,707
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද මුදල්		105,603	13,759	106,413	33,735
ලාභාංශ ලැබීම්		646,036	625,838	367,080	401,018
පොළී ලැබීම්		16,040,375	12,380,625	17,996,652	12,713,071
ආයෝජන කටයුතු වලින් ලැබූ /(වලට යෙදූ) ශුද්ධ මුදල්		(52,965,007)	6,923,857	(50,879,061)	6,651,572
මූල්‍යනය කිරීමේ කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහයන්					
වෙනත් ණයට ගැනීම් වල ශුද්ධ වැඩිවීම		105,650,070	23,003,094	110,535,429	23,047,911
පරිපාලිත සමාගම්වල හිමිකම් නිකුතුවෙන් පාලනයට යටත් නොවන හිමිකම් මඟින් ලද මුදල්		-	-	18,335	201,000
ණයකර නිකුතුවෙන් ලද මූදල්		9,400,000	5,000,000	9,400,000	6,000,000
ණයකර නිදහස් කිරීම් සඳහා ගෙවූ මුදල්		(5,500,000)	(2,450,000)	(5,550,000)	(2,877,500)
ශ්‍රී ලංකා රජයට ගෙවූ ලාභාංශ		(5,346,410)	(4,019,615)	(5,346,410)	(4,019,615)
පාලනයට යටත් නොවූ හිමිකම් සඳහා ගෙවූ ලාභාංශ		-	-	(60,302)	(63,834)
ණය හා ණය සුරැකුම්පත් සඳහා පොළී ගෙවීම්		(14,563,581)	(9,057,244)	(15,874,370)	(9,037,882)
මූල්‍යනය කටයුතු වලින් ලද ශුද්ධ මුදල්		89,640,079	12,476,235	93,122,682	13,250,080
වර්ෂය තුළදී මුදල් සහ මුදල් හා සමාන දෑ වල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)		17,404,099	(22,948,361)	24,157,134	(25,969,880)
වර්ෂය ආරම්භයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		29,376,816	52,325,177	31,139,634	57,109,514
වර්ෂය අවසානයේදී මුදල් සහ මුදල් හා සමාන දෑ		46,780,915	29,376,816	55,296,768	31,139,634
සටහන I					
මුදල් සහ මුදල් හා සමාන දෑ විශ්ලේෂණය					
මුදල් සහ කෙටි කාලීන අරමුදල්	20	31,544,558	18,670,911	31,955,777	18,780,907
පරිණත කාලය තෙමසකට වඩා අඩු බැංකුවලින් ලැබිය යුතු දෑ		15,381,086	10,840,927	23,572,247	13,783,380
බැංකු අයිරා	37	(144,729)	(135,022)	(231,256)	(1,424,653)
		46,780,915	29,376,816	55,296,768	31,139,634

පිටු අංක 244 සිට 338 දක්වා ඇති මූල්‍ය ප්‍රකාශ පිළිබඳ සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල සංකලිත කොටසකි.

මූල්‍ය
ප්‍රකාශ පිළිබඳ සටහන්

1. ආයතනික තොරතුරු

ලංකා බැංකුව, 1938 අංක 53 දරණ ලංකා බැංකු ආඥා පනත යටතේ 1939 අගෝස්තු 01 දින ශ්‍රී ලංකාව තුළ ප්‍රතිෂ්ඨාපිත රාජ්‍ය සංස්ථාවකි. එය 1988 අංක 30 දරණ බැංකු පනත හා ඒ හා ආනුෂාංගික සංශෝධනවලට යටත්වන ලෙස ස්ථාපිතකර ඇති බලපත්‍රලාභී වාණිජ බැංකුවකි. ලංකා බැංකුවේ ලියාපදිංචි කාර්යාලය ශ්‍රී ලංකාවේ, කොළඹ 01, ලංකා බැංකු මාවතෙහි අංක 01 දරණ ස්ථානයේ ලංකා බැංකු චතුරස්‍රයෙහි පිහිටා ඇත. ලංකා බැංකුව නිකුත් කර ඇති ණයකර කොළඹ කොටස් වෙළඳපළෙහි ලැයිස්තුගත කර ඇති අතර ඇමරිකානු ඩොලර් මිලියන.500 ක් වටිනා ජාත්‍යන්තර බැඳුම්කර සිංගප්පූරුවෙහි කොටස් වෙළඳපළෙහි ලැයිස්තුගත කර ඇත.

2012 දෙසැම්බර් 31 දිනට සේවකයින් 7790 ක් ලංකා බැංකුවෙහි සේවයේ නියුක්තව සිටියහ. (2011 දෙසැම්බර් 31 දිනට එම ප්‍රමාණය 8115 කි.)

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ

2012 දෙසැම්බර් 31 දිනට හා ඒදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ බැංකුවේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ බැංකුව, ඊට අයත්වන පරිපාලිතයන් (බැංකුව සහ එහි පරිපාලිතයන්ගේ එකතුව සමූහය ලෙස හැඳින්වේ) සහ ආශ්‍රිත සමාගම්වල සමූහයට ඇති අයිතිවාසිකම් අයත්වන ආකාරයට සකසකර ඉදිරිපත්කර ඇත.

ලංකා බැංකුව අයත් සේ හඳුනාගත හැකි පරිපාලක සමාගමක් නොමැත.

මූල්‍ය ප්‍රකාශ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය

2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ, 2013 මාර්තු මස 21 වන දින බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිකුත් කිරීම සඳහා අධිකාරිය ලබාදෙන ලදී.

1.1 ප්‍රධාන ක්‍රියාකාරකම්

බැංකුව

ගෙවුණු වර්ෂය තුළ බැංකුව නිරත වූ ප්‍රධාන ක්‍රියාකාරකම් ලෙස වාණිජ බැංකුකරණය, පුද්ගල බැංකුකරණය, සංවර්ධන මූල්‍යකරණය, උකස් මූල්‍යකරණය, කල්බදුකරණය, ආයෝජන බැංකුකරණය, ඉස්ලාමීය බැංකුකරණය, බැංකු රක්ෂණය, ආයතනික බැංකුකරණය, ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සම්බන්ධව වෙළඳ කටයුතු, උකස් සේවා, ණයපත් පහසුකම්, අක්වෙරළ බැංකු කටයුතු, විදේශ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතු, ටෙලි බැංකුකරණය, අන්තර්ජාල බැංකුකරණය සහ වෙනත් මූල්‍ය සේවාවන් හඳුනාගත හැකිය.

පරිපාලිතයන්

ලංකා බැංකුවේ පරිපාලිතයන්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
ප්‍රොපර්ටි ඩිවලප්මන්ට් පී එල් සී	ලංකා බැංකු ප්‍රධාන කාර්යාලීය ගොඩනැගිල්ලේ පාලනය හා නඩත්තු කිරීම වැඩි දියුණු කිරීම හා උපයෝගීතාවය රඳවා ගැනීම
මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී	කල්බදුකරණය සහ කුලී පිට ගනුදෙනු, වෙළඳ මූල්‍යනය, ක්ෂුද්‍ර ණය, සංස්ථාපිත වෙළඳ මූල්‍ය උපදේශක සේවා, ප්‍රාග්ධන වෙළඳපල ක්‍රියාකාරකම් සහ සංස්ථාපිත ලේකම් කටයුතු සේවාවන්
සී/ස බීඕසි මැනෙජ්මන්ට් ඇන්ඩ් සපෝර්ට් සර්විසර්ස් (පෞද්ගලික) සමාගම	බැංකුවට සහ එහි පරිපාලිතයන් සඳහා කළමනාකරණ සේවා සැපයීම
සී/ස බීඕසි ප්‍රෝපර්ටි ඩිවලප්මන්ට් ඇන්ඩ් මැනේජ්මන්ට් (පෞද්ගලික) සමාගම	කොළඹ 03 බීඕසි මර්චන්ට් ටවර් හි සහ මහනුවර සීබෑන්ක් හවුස් හි කාර්යාල ඉඩ පහසුකම් කුලියට දීම
සී/ස බීඕසි ට්‍රැවල්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සේවා සම්බන්ධ කටයුතු
සී/ස හොටෙල්ස් කලම්බු (1963) සමාගම	හෝටල් සේවා සැපයීම
සී/ස එම් සී එස් එල් ෆයිනෑෂල් සර්විසස්	තැන්පතු භාරගැනීම, කල්බදු පහසුකම් සැපයීම, කුලී පිට ගනුදෙනු, අත්තිකාරම් සහ අනෙකුත් ණය පහසුකම්, දේපළ සංවර්ධනය සහ ඒ ආශ්‍රිත සේවා
සී/ස සීලීස් සමාගම	කල්බදු පහසුකම් සැපයීම, කුලීපිට ගනුදෙනු අත්තිකාරම් සහ අනෙකුත් ණය පහසුකම් සැපයීම, දේපළ සංවර්ධනය සහ උකස් කටයුතු
සී/ස සීබෑන්ක් හොලිඩේ හෝම්ස් (පෞද්ගලික) සමාගම	සංචාරක සහ ආගන්තුක නිවහන් පහසුකම් පවත්වාගෙන යාම
සී/ස එම් බී එස් එල් ඉන්ෂුවරන්ස් සමාගම	පීවිත සහ පොදු රක්ෂණ සේවා සැපයීම
සී/ස කොළදෙණිය හයිඩ්‍රොපවර් (පෞද්ගලික) සමාගම	ජල විදුලි උත්පාදනය
සී/ස ලංකා බැංකුව (එක්සත් රාජධානිය) සමාගම	එක්සත් රාජධානියේ මූල්‍ය සේවා අධිකාරිය යටතේ ලියාපදිංචි කර ඇති අතර තැන්පතු භාරගැනීම සහ ආයෝජන කටයුතු ඇතුළු මූල්‍ය සේවා සැපයීම
සී/ස එම් බී එස් එල් සේවින්ස් බෑන්ක් සමාගම	විශේෂිත වාණිජ බැංකුවක් වන අතර තැන්පතු භාර ගැනීම, කාලීන ණය පහසුකම්, කල්බදු පහසුකම්, කුලීපිට ගනුදෙනු සහ උකස් සේවා ඇතුළු මූල්‍ය සේවා සැපයීම කරනු ලබයි

ආශ්‍රිතයන්

ලංකා බැංකුවේ ආශ්‍රිත සමාගම්හි මූලික ක්‍රියාකාරකම් පහත දක්වා ඇත.

සමාගමේ නම	ප්‍රධාන ක්‍රියාකාරකම්
සී/ස සී බෑන්ක් ඇසෙට් මැනේජ්මන්ට් සමාගම	ඒකක භාර අරමුදල් සහ පෞද්ගලික කළඹයන් කළමනාකරණය
සී/ස සඳර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම	ණය පහසුකම් සැපයීම
සී/ස ලංකා සික්‍යුරිටීස් (පෞද්ගලික) සමාගම	ලියාපදිංචි කොටස් තැරව්කරුවෙකු වන අතර ස්කන්ධ ගනුදෙනු, ණය ගනුදෙනු සහ ආන්තික ගනුදෙනු
සී/ස මිරේකා කැපිටල් ලෑන්ඩ් (පෞද්ගලික) සමාගම	දේපළ මිලදී ගැනීම, අත්පත් කරගැනීම, කුලියට දීම, දේපළ සංවර්ධනය සහ දේපළ සංවර්ධන ව්‍යාපෘති සඳහා යටිතල පහසුකම් සැපයීම
සී/ස ට්‍රාන්ස්නැෂනල් ලංකා රෙකෝඩ්ස් සොලූයුෂන්ස් (පෞද්ගලික) සමාගම	දේපළ කුලියට දීම

අදාළ වර්ෂය තුළදී බැංකුවේ, පරිපාලිතයන් හි සහ ආශ්‍රිතයන්හි මූලික ක්‍රියාකාරකම් වල ස්වභාවයන්හි සැලකිය යුතු වෙනසක් සිදු වී නැත.

2012 වසරෙන් පසුව පරිපාලිත සමාගම් දෙකක් වන සී/ස සීලීස් සමාගම සහ සී/ස එම් සී එස් එල් ෆයිනෑෂල් සර්විසස් සමාගම් අතර ඒකාබද්ධ වීමේ ගිවිසුමකට එකඟව ඇති අතර එය යථාකාළයේදී සිදුවීමට නියමිතය. ඒකාබද්ධ වීමේ ක්‍රියාවලියෙන් පසුව සී/ස එම් සී එස් එල් සමාගම අඛණ්ඩව පවතිනවා ඇත.

තවත් පරිපාලිත සමාගම් දෙකක් වන මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී සහ සී/ස එම් බී එස් එල් සේවින්ස් බෑන්ක් අතර ඒකාබද්ධ වීමේ ගිවිසුමකට එකඟ වී ඇති අතර ඒකාබද්ධ වීමේ ක්‍රියාවලියෙන් පසුව මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී සමාගම අඛණ්ඩව පවත්වාගෙන යනු ඇත. ඒකාබද්ධ වීමේ ක්‍රියාවලියක් සමග මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් බවට පත් කිරීමට බලාපොරොත්තු වේ. මේ සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් අනුමැතිය ලැබුණු විගස මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා පී එල් සී බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් ලෙස කටයුතු අරඹනු ඇත.

2013 වසර තුලදී සී/ස සදර්න් ඩිවලප්මන්ට් ෆයිනෑන්ෂල් සමාගම ඈවර කිරීම සඳහා කටයුතු යොදා ඇත.

2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

ලංකා බැංකු ආඥා පනත හා එහි සංශෝධනයන්හි ප්‍රතිපාදන, 1988 අංක 30 දරණ බැංකු පනත හා එහි සංශෝධන සහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අනුව, බැංකුවේ සහ එහි පරිපාලනයන්හි හා ආශ්‍රිතයන්හි මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම හා ඉදිරිපත් කිරීම පිළිබඳ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.

3. ගිණුම් පිළියෙල කිරීමේ පදනම

3.1 අනුකූලතා ප්‍රකාශය

සමූහයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනය විසින් නිකුත්කර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් සමන්විත වන ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතවලට හා ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර ඇත. (මින් පසුව ශ්‍රී ලං මූ වා ප්‍ර යනුවෙන් සඳහන් කරනු ඇත). ලංකා බැංකු අඥා පනතට සහ 2007 අංක 07 දරණ සමාගම් පනතට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර හා වාර්තා කර ඇත. තවද මෙම මූල්‍ය ප්‍රකාශ 1988 අංක 30 දරණ බැංකු පනතට අනුව සකස් කර ඇත.

පළමු වරට සමූහය විසින් ශ්‍රී ලං මූ වා ප්‍ර වලට අනුකූලව 2012 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇත. 2011 දෙසැම්බර් 31 දක්වා කාළපරිච්ඡේදය සඳහා සමූහයේ මූල්‍ය ප්‍රකාශ එම දිනට වලංගුව පැවති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සකස් කර ඇත.

ඒ අනුව 2012 දෙසැම්බර් 31 දිනට සහ දිනෙන් අවසන් වර්ෂය සමඟ සංසන්දනාත්මක වර්ෂය වන 2011 දෙසැම්බර් 31 දිනට සහ දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ මූල්‍ය ප්‍රකාශ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වල විස්තර කර ඇති ආකාරයට පිළියෙල කොට ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලං මූ වා ප්‍ර වලට අනුගතවන දිනවන 2011 ජනවාරි පළමුවන දිනට ආරම්භක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කොට ඇත.2011 ජනවාරි පළමුවන දිනට සහ ඊට පෙර ප්‍රකාශිත 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නැවත ප්‍රකාශ කිරීමේදී බැංකුවේ සහ සමූහයේ මූලික ගැලපුම් සටහන් අංක 57න් විස්තර කර ඇත.

3.2 මිනුම්කරණයේ පදනම

පහත සඳහන් ඒවා හැරුණු විට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය පදනම මත පිළියෙල කර ඇත.

- වෙළඳාම සඳහා දරා සිටින වෙනත් මූල්‍ය වත්කම් සාධාරණ අගය මත මැනීම.
- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සාධාරණ අගය මත මැනීම.
- මූල්‍ය ආයෝජන - විකිණීම සඳහා පවතින සාධාරණ අගය මත මැනීම.
- අයිතිකරු විසින් පදිංචි සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන අගයේ එනම් ප්‍රත්‍යාගණනය කළ දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන්කිරීම අඩු කළ අගයට වාර්තා කෙරේ.
- නිශ්චිත ප්‍රතිලාභ සැළසුම් පීව ගණකාඥයකු විසින් තක්සේරු කර වර්තමාන අගය මත හඳුනාගත් නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් වලින් සැළසුම්ගත වත්කම්වල සාධාරණ අගය අඩු කරනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශවලට බලපාන්නා වූ උද්ධමනකාරී සාධක වෙනුවෙන් කිසිදු ගැලපීමක් කර නැත.

3.3 ව්‍යවහාර හා වාර්තාකරණ මුදල් ඒකක

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුලත් අයිතමයන් මිනුම්කරණය කරනු ලබන්නේ බැංකුව ක්‍රියාත්මක වන මූලික ආර්ථික පරිසරයක් තුළ පවතින මුදල් ඒකකය වන ශ්‍රී ලංකා රුපියල් වලිනි. සමූහයේ ව්‍යවහාර මෙන්ම වාර්තාකරණ මුදල් ඒකකය ශ්‍රී ලංකා රුපියල් වන අතර ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇත. මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීමේදී වෙනත් අයුරකින් සඳහන් නොකර ඇති විටෙක සියලූම අගයන් ආසන්නම රුපියල් දහස දක්වා වන පරිදි වැටයීම කර ඇත.

3.4 මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කිරීම

බැංකුව සහ සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් ද්‍රවශීලතාවය අනුව පෙළ ගස්වා ඇත.

ඒකාබද්ධ මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ මූල්‍ය වත්කම් සහ වගකීම් හිලව් කිරීම මගින් ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදුවන්නේ නීතිමය වශයෙන් බලය ලබා දී ඇති විට සහ ශුද්ධ වටිනාකම මත හෝ එකවිටම වත්කම් සහ වගකීම් පියවා ගැනීමේ අදහසක් ඇති විටම පමණක් වේ. ගිණුම්කරණ ප්‍රමිතයක් මගින් ඉඩ සලසා ඇති විටක හෝ අර්ථ නිරූපණය කර ඇති විටක සහ විශේෂයෙන් බැංකු ගිණුම්කරණ ප්‍රතිපත්තියකින් සඳහන් කර ඇතිවිටක පමණක් ඒකාබද්ධ ආදායම් ප්‍රකාශයේ සඳහන් ආදායම් සහ වියදම් හිලව් කරනු ලැබේ.

3.5 වැදගත් ගිණුම්කරණ විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන්ගේ භාවිතය

මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ඒ සඳහා භාවිතා කළ යුතු සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති, තීරණය කිරීම හා වාර්තා වන වත්කම් සහ වගකීම් අගයන් මෙන්ම ආදායම් සහ වියදම් සංඛ්‍යාවන් නිශ්චය කිරීමේදී ඒ සඳහා බලපාන ඇස්තමේන්තු සහ උපකල්පනයන් නිශ්චය කිරීමට කළමනාකාරිත්වයට සිදුවේ. සැබෑ ප්‍රතිඵලය ඇස්තමේන්තු සමග වෙනස් විය හැක.

විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් ඉතිහාසය පිළිබඳ වූ අත්දැකීම් සහ විවිධ සාධක නිසා වෙනස් විය හැකියයි සිතිය හැකි අවස්ථාවන් මත පදනම් වන අතර මේවා කාලීන පදනමක් මත සමාලෝචනයට භාජනය කෙරේ. ගිණුම්කරණ ඇස්තමේන්තු සමාලෝචනයේදී ඒවා පිළිබදව සංශෝධනයක් අවශ්‍ය වන්නේ නම් සමාලෝචනයට භාජනය කෙරෙන වර්ෂය තුළදී සහ අනාගත කාලපරිච්ඡේදයන් සඳහා එම සංශෝධනයන් අදාළ වන පරිදි ගිණුම්ගත කෙරේ.

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් යෙදීමේ ක්‍රියාවලියේදී ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල වඩා වැදගත් බලපෑමක් ඇති කරන්නා වූ අගයන් මත කළමනාකරණය විසින් පහත සඳහන් ඇස්තමේන්තු, උපකල්පනයන් සහ විනිශ්චයන් යොදනු ලැබේ.

අඛණ්ඩ පැවැත්ම

තම මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකි සහ සෑහීමකට පත්විය හැකි සම්පත්, බැංකුව සතු බව කළමනාකරණය උපකල්පනය කරයි. තවදුරටත් බැංකුවෙහි අඛණ්ඩ පැවැත්ම පිළිබඳව සැළකිය යුතු අවිශ්වාසයක් සහ අවිනිශ්චිතතාවයක් කළමනාකරණය නොදකී.

එම නිසා මූල්‍ය ප්‍රකාශ සකස් කිරීමේදී අඛණ්ඩව පවතීය යන සංකල්පය භාවිතා කර ඇත.

සාධාරණ අගය මත මූල්‍ය උපකරණ

මූල්‍ය තත්ත්වය පිළිබඳව ප්‍රකාශයේ වාර්තාවන මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල සාධාරණ අගය ක්‍රියාකාරී වෙළඳපලෙන් ලබා ගත නොහැකි අවස්ථාවල ඒවා ගණිතමය ආකෘතියක් පදනම් කරගත් තක්සේරු ශිල්ප ක්‍රමයක් භාවිතා කර ලබා ගනු ලැබේ. මෙම ආකෘතීන් සඳහා අවශ්‍ය යෙදවුම් සොයාගනු ලබන්නේ හැකි අයුරින් වෙළඳපල නිරීක්ෂණය කිරීමෙනි. කෙසේ වෙතත් මේ සඳහා දත්ත නොමැති විට විනිශ්චයන් මත සාධාරණ අගය ගණනය කරනු ලැබේ.

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන හානිකරණය

සමූහය විසින් විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන ලෙස වර්ග කර ඇති ණය සුරුකුම්පත් ඒවා හානිකරණයට ලක්වීදැයි නිරීක්ෂණයකර අගය කරනු ලැබේ. මේ සඳහාද ණය සහ අත්තිකාරම්වල කේවල තක්සේරුකරණයේදී යොදාගත් විනිශ්චයන්ට සමාන විනිශ්චයන් යොදාගනු ලැබේ. සමූහය විසින් විකිණීම සඳහා පවතින ස්කන්ධ ආයෝජනවල පිරිවැයට වඩා සාධාරණ අගය සැළකිය යුතු හෝ දිගුකාලීනව ඇතිවන අඩුවීමක් ඇතිවිට ඒ සඳහා හානිකරණ වියදම් වාර්තා කරනු ලැබේ. සැළකිය යුතු හෝ දිගුකාලීන යන්න සඳහා නිර්ණය කිරීමට විනිශ්චයක් අවශ්‍ය වේ. මෙම විනිශ්චයන් ගැනීමේදී අනෙකුත් සාධක අතර ඓතිහාසික කොටස් මිලෙහි චලනයන්, පැවතුම් කාලය සහ විස්තාරය යන සාධක ආයෝජනවල සාධාරණ අගයට වඩා ධාරණ අගය අඩු වූ විට සමූහය විසින් අගයනු ලැබේ.

ණය සහ අත්තිකාරම් සඳහා අලාභ හානිකරණය

සමූහය විසින් නිරීක්ෂණය කරනු ලබන කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් වාර්තාකරණ දිනයට අගයකර ඒ සඳහා හානිකරණ අලාභයක් ඇත්නම් ඒවා ආදායම් ප්‍රකාශයේ වාර්තා කරනු ලබයි. අලාභ හානිකරණය තීරණය කිරීමේදී උපකල්පන අගයන් සහ අනාගත මුදල් ප්‍රවාහයන් වල කාලය නිශ්චය කරන විට නිශ්චිත කළමනාකරණ විනිශ්චයන් අවශ්‍ය වේ. මෙම විනිශ්චයන් සාධක කීපයක් පදනම් කරගත් උපකල්පනයන්ගෙන් යුක්ත වන නිසා එය සැබෑ තත්ත්වය සමග වෙනස් වන බැවින් අනාගත ප්‍රතිපාදනද එහි ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් විය හැක.

ණය සහ අත්තිකාරම් කේවල වශයෙන් තක්සේරුකර හානිකරණයක් නොමැති විට සහ කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ අත්තිකාරම් සාමූහිකව තක්සේරුකර දරන ලද අලාභ සිදුවීම් සඳහා විෂයබද්ධ සාධක ඇතිවිට ඒ මත

ප්‍රකාශ පිළිබඳ සටහන්

පදනම්ව ඒ හා සමාන අවදානම් ලක්ෂණ ඇති සාමූහික වත්කම් සඳහා ප්‍රතිපාදන නිර්ණය කල යුතුය. සාමූහික තක්සේරුව සඳහා අවශ්‍ය දත්ත ගනු ලබන්නේ ණය කළඹ මගින් (ඒවා නම් ණය වර්ගය, හිඟවාරික මට්ටම යනාදිය) සහ අවදානම් ඒකරාශීවීමේ බලපෑම සඳහා උපකල්පනයන් සමග ආර්ථික දත්ත (විරැකියා මට්ටම, දේපළ වෙළඳුම් මිල දත්තයන්, රටේ අවදානම සහ එක් එක් සමූහයන්ගේ ක්‍රියාකාරිත්වයේ වෙනස්වීම්) උපයෝගී කරගනිමින්ය.

නිශ්චිත ප්‍රතිලාභ සැලැස්ම

ආයුගණක තක්සේරු යොදා ගනිමින් නිශ්චිත ප්‍රතිලාභ සැලැසුම් සහ අනෙකුත් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් නිර්ණය කරනු ලබයි. ආයුගණක තක්සේරුව සඳහා වට්ටම් අනුපාත, සැළසුම් වත්කම් මත අපේක්ෂිත අනුපාතය, අනාගත වැටුප් වැඩි වීම්, මරණ අනුපාතය සහ අනාගත විශ්‍රාම වැඩිවීම යන උපකල්පන මත නිර්ණය කරනු ලැබේ. මෙම සැලසුම් දිගු කාලීන ස්වභාවයක් ගන්නා බැවින් මෙම ඇස්තමේන්තු අවිනිශ්චිත ස්භාවයක් ගනු ඇත. සියලුම උපකල්පන සෑම වාර්තාකරණ දිනයකදීම සමාලෝචනය කරයි.

දේපළ, පිරියත සහ උපකරණවල සාධාරණ අගය

සමූහයේ සින්නක්කර ඉඩම් සහ ගොඩනැගිලි සහ කල්බදු ඉඩම් මත ඇති ගොඩනැගිලි සාධාරණ අගය මත සටහන් කරනු ලැබේ. ඒ හා සමාන වත්කම් පවතින වෙළඳපල මිල යටතේ ලබාගත හැකිවිට ඒවා සාක්ෂි වශයෙන් ගෙන සාධාරණ අගය ඇස්තමේන්තු කරනු ලැබේ.

බදුකරණය

සමූහය විසින් ආදායම් බදු සහ මූල්‍ය සේවා මත එකතුකළ අගය මත බද්ද අතුළුව අනෙකුත් බදු ගෙවිය යුතුවේ. ප්‍රවර්තන බදු, විලම්භිත බදු සහ අනෙකුත් බදු වර්ග ශ්‍රී ලං මූ වා ප්‍ර අනුව මූල්‍ය ප්‍රකාශනවල සහ බදු අය කල හැකි ලාභය ගණනයේදී යොදා ගන්නා නමදු මෙතෙක්, බදු මාර්ගෝපදේශයන් මගින් ස්ථිර ක්‍රමවේදයක් ඉදිරිපත් නොවුනු හෙයින් බදු ප්‍රතිපාදන තැබීමේදී සැලකිය යුතු විනිශ්චයන් සහ ප්‍රමාණාත්මක සාධකයන් සැලකිල්ලට ගනු ලැබීමට සිදුවී ඇත. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පවතින බදු නීතිය පිළිබඳව ඇති අර්ථ නිරූපණයන් සඳහා අවිනිශ්චිතතා පවතී.

සමූහය හඳුනාගත් ප්‍රවර්ථන, විලම්බිත සහ අනෙකුත් වත්කම් සහ වගකීම් සඳහා අනාගතයේදී තවදුරටත් බදුගෙවිය යුතු වේ දැයි තක්සේරු කර ඇත. අවසාන බදු අගය මුලින් වාර්තා කළ අගයන් සමඟ වෙනස් වන විට එහි බලපෑම නිර්ණය කරන කාලපරිච්ඡේදයේදී ආදායම සහ විලම්බිත බදු සකස්කරනු ලැබේ.

දේපළ, පිරියත සහ උපකරණවල ඵලදායී ජීවිත කාලය

වත්කම්වල සුන්බුන් අගය, ඵලදායී පිවිත කාලය සහ ක්ෂය කිරීමේ ක්‍රමවේදයන් සෑම වාර්තා කරන දිනයකදීම සමූහය විසින් සමාලෝචනය කරනු ලැබේ. මෙම වාර්තා තක්සේරු කිරීම සඳහා කළමනාකරණය විසින් යොදනු ලබන විනිශ්චයන් පිළිබඳව අවිනිශ්චිතතාවයක් පවතී.

4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන්

බැංකුව සහ සමූහය විසින් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදා ගන්නා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් පහත දැක්වේ. විශේෂයෙන් සඳහන් කර නොමැති විට පහත සඳහන් සියලුම ගිණුම්කරණ ප්‍රතිපත්තීන් මූල්‍ය ප්‍රකාශන වාර්තා කිරීමේදී සෑම කාලපරිච්ඡේදයක් සඳහා සහ 2011 ජනවාරි 01 වන දින ශ්‍රී ලං මූ වා ප්‍රමිතීන්ට අනුව ආරම්භක මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය පිළියෙල කිරීමේදී සිටම අඛණ්ඩව යොදා ගත යුතුය.

4.1 ඒකාබද්ධ කිරීමේ පදනම

4.1.1 පරිපාලිත සමාගම්

බැංකුව විසින් පාලනය කරනු ලබන ආයතන පරිපාලිතයන් වේ. පරිපාලිතයන්ගේ පාලනය පටන්ගත් දින සිට පාලනය අහිමිවන දින තෙක් එම පරිපාලිතයන්ගේ මූල්‍ය ප්‍රකාශ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල අඩංගු වේ. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී ගනුදෙනු සඳහා සහ ඒ හා සමාන අනෙකුත් අවස්ථා සඳහා යොදා ගනු ලබනුයේ ඒකාකාරී ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ය.

ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරනු ලබන්නේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් පොදු මූල්‍ය වර්ෂය සඳහාය. පරිපාලිතයන්ට ණය හා අත්තිකාරම් නැවත ගෙවීම හෝ මුදල් ලාභාංශ ආකාරයෙන් මවු සමාගමට කිසිදු සැළකිය යුතු බාධාවකින් තොරව පැවරීම් සිදු කල හැක. එක්සත් රාජධානියේ පිහිටුවා ඇති සී/ස ලංකා බැංකුව (එක්සත් රාජධානිය) සමාගම හැර බැංකුවේ අනෙකුත් සියලුම පරිපාලිතයන් ශ්‍රී ලංකාව තුල සංස්ථාපනය කර ඇත.

බැංකුවේ ප්‍රධාන පරිපාලිත සමාගම්වල නාම ලේඛනයක් මෙම මූල්‍ය ප්‍රකාශවල 1.1 වන සටහන යටතේ ප්‍රකාශ කොට ඇත.

4.1.2 ආශ්‍රිත සමාගම්

ආශ්‍රිත සමාගම් යනු සමූහය තුල සැලකිය යුතු බලපෑමක් කළ හැකි එහෙත් මූල්‍ය සහ මෙහෙයුම් පාලනයකින් තොර සමාගම් වේ. සැලකිය යුතු බලපෑමක් යනුවෙන් අදහස් වන්නේ 20% ක් සහ 50% ක් අතර ඡන්ද බලයක් හිමි කොටස් වලින් සමන්විත වූ සමාගම් වේ. ආශ්‍රිත සමාගම් වල සමූහයේ ආයෝජන පිරිවැයට මූලිකව හඳුනාගන්නා අතර පසුව ස්කන්ධ ක්‍රමය (ආයෝජිතයාගේ ගිණුම් මත ස්කන්ධය) භාවිතා කර ගිණුම් තබයි. ආයෝජන පිරිවැයට ගනුදෙනු පිරිවැයද ඇතුලත්ය. බැංකුව විසින් 20% ක් සහ 50% ක් අතර ස්කන්ධ ප්‍රමාණයක් දරා සිටියත් ඒ සඳහා සැලකිය යුතු බලපෑමක් කල නොහැකි නම් ඒවා ආශ්‍රිත සමාගම් ලෙස හැඳින් නොවේ.

සැලකිය යුතු පාලනය පටන්ගත් දින සිටම අවසාන වන දින තෙක් සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්වලට ගලපන ලද බැංකුවේ ලාභයේ හෝ අලාභයේ කොටස සහ විස්තීරණ ආදායමේ කොටස ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අඩංගු වේ.

බැංකුවේ අලාභයේ කොටස ආයෝජිතයාගේ ස්කන්ධයේ වඩා වැඩි වන විට දිගු කාලීන ආයෝජනද ඇතුළුව ධාරණ අගය වාර්තා කරනු ලබන්නේ ශුන්‍ය අගයට වන අතර සමූහය ආයෝජිතයා වෙත බැඳීමක් නොමැති විට තව දුරටත් අලාභ හඳුනා නොගනී. ආශ්‍රිතයන් විසින් ඉන්පසුව ලාභ වාර්තා කරන විට බැංකුවේ ලාභයේ කොටස හඳුනා ගැනීම ආරම්භ වන්නේ හඳුනා නොගත් අලාභයේ කොටස ලාභයේ කොටසින් සම්මත වූ පසුවය.

බැංකුවේ ආශ්‍රිත සමාගම්වල නාම ලේඛනයක් මෙම මූල්‍ය ප්‍රකාශවල 1.1 වන සටහන යටතේ ප්‍රකාශ කොට ඇත.

4.1.3 ව්‍යාපාර සංයෝජනය

ව්‍යාපාර සංයෝජනයකදී එහි පාලනයට යටත් නොවන හිමිකමද සැලකිල්ලට ගෙන හුවමාරු ප්‍රතිශ්ධාවේ සාධාරණ අගය සහ සංයෝජනයට ලක්වන ව්‍යාපාරයේ වත්කම් වලින් එහි වගකීම් සහ එදිනට තක්සේරු ගත හානිකරණ අලාභයන් වෙතොත් එයද ඉවත් කර ඉතිරිවන අගය යන දෙකෙහි අන්තරය කීර්තිනාමය ලෙස සලකනු ලැබේ. කලින් කල කීර්තිනාමය සමාලෝචනය කරනු ලැබේ. 1988 අංක 30 දරණ බැංකු පණතේ 22 වන ඡේදයට අනුව කීර්තිනාමය සම්පූර්ණයෙන්ම අත්පත් කර ගන්නා වර්ෂයේදී ලියා හල යුතුය.

අතිරික්ත අගය සෘණ අගයක් නම් එය අත්පත් කර ගැනීමේ දී ජනනය වූ ලාභයක් සේ සලකා අත්පත් කරගත් වර්ෂය සඳහා ආදායම් ප්‍රකාශයට සෘජුවම ඇතුළත් කෙරේ. අත්පත් කර ගැනීමේ දිනයේදී පාලනයට යටත් නොවන හිමිකම් ගණනය කිරීම සඳහා පදනම වශයෙන් සාධාරණ අගයට ගනුදෙනුවෙන් ගනුදෙනුවට හෝ ශුද්ධ වත්කම්වලින් සමානුපාතික කොටස සමූහය විසින් තෝරා ගනු ලැබේ.

සමූහය විසින් ව්‍යාපාර සංයෝජනයේදී දරණ ලද වියදම් ලෙස ණය නිකුත් කිරීමේදී හා ස්කන්ධ සුරුකුම්පත් සඳහා ගැනුනු වියදම් හැරුණු විට අනෙකුත් වියදම් ගනුදෙනු පිරිවැය ලෙස හැඳින්වේ.

4.1.4 පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීම

පාලනයට යටත් නොවන හිමිකම් අත්පත් කර ගැනීමේදී ස්කන්ධ හිමියන්ගේ ගනුදෙනු සටහන් වන්නේ ඔවුන්ගේ ධාරිතාවය අනුවය. එබැවින් එම ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස කීර්තිනාමය හඳුනාගනු නොලැබේ.

4.1.5 පාලනය අහිමි වීම

පාලනය අහිමි වීමේ දී සමූහය විසින් පරිපාලිතයන්ගේ හඳුනාගත් වත්කම් සහ වගකීම් ඉවත් කරගන්නා අතර ඒ අනුව පාලනයට යටත් නොවන හිමිකම් සඳහා පරිපාලිතයන්ගේ ස්කන්ධ සංරචක ගලපනු ලැබේ. පාලනය අහිමි වීමෙදී ඇතිවන ඌනතාවය හෝ අතිරික්තය ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ. එවැනි හිමිකමක් පාලනය අහිමි වන දිනට සාධාරණ අගයට මිනිනු ලැබේ. ඉන්පසුව මූල්‍ය ප්‍රකාශනවල සමූහයේ ගිණුම්කරණ ප්‍රතිපත්තීන්ට අනුකූලව ආයෝජිතයන්ගේ ස්කන්ධය ගණනය කරනු ලැබේ.

4.1.6 ඒකාබද්ධකරණයේදී ඉවත් කරන ලද ගනුදෙනු

සියලුම අන්තර් - සමූහ ගනුදෙනු සහ ශේෂයන්, ආදායම් හා වියදම් (විදේශ විනිමය ගනුදෙනුවල ලාභ සහ අලාභ හැර) ඒකාබද්ධකරණයේ දී ඉවත් කෙරේ. සමූහය සහ එහි ආශ්‍රිත සමාගම් අතර කරනු ලබන ගනුදෙනු වලදී ඇතිවිය හැකි ලාභ හෝ අලාභද ආශ්‍රිත සමාගම්වල සමූහයේ අයිතිය ප්‍රමාණයට ඒකාබද්ධකරණයේදී ඉවත් කෙරේ.

හානිකරණය පිළිබඳව සාක්ෂි නොමැති විට පමණක් උපලබ්ධි නොවූ ලාභ මෙන් අලාභද ඉවත් කරනු ලැබේ.

4.2 විදේශ ව්‍යවහාර මුදල

4.2.1 විදේශ විනිමය ගනුදෙනු

විදේශ විනිමය ගනුදෙනු ව්‍යවහාර මුදල් ඒකකය බවට පත්වන්නේ ගනුදෙනුව සිදුවන දිනට පවතින විනිමය අනුපාත මඟින් පරිවර්තනය කිරීමෙනි. විදේශ වලංගු මුදල් වලින් නිරූපණය කෙරෙන මූල්‍ය වත්කම් හා වගකීම් වාර්තා කරන දිනට බලපැවැත්වෙන විනිමය අනුපාතිකයන්ට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට නැවත පරිවර්තනය කරනු ලබන අතර වෙළඳ කටයුතු තුළින් ඇතිවන්නාවූ අසමානතා ආදායම් ප්‍රකාශයේ අනෙකුත් මෙහෙයුම් ආදායම් ලෙස සටහන් කරනු ලැබේ.

විදේශ මුදල්වලින් වෙළඳපල වටිනාකමට නිරූපණය කරනු ලබන මුදල් නොවන වත්කම් සහ වගකීම් ව්‍යවහාර මුදල් ඒකකය බවට පරිවර්තනය කරනු ලබන්නේ මුලින්ම ගනුදෙනුව සිදුවන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින්ය.

නැවත පරිවර්තනයේදී ඇතිවන විදේශ විනිමය අසමානතා ආදායම් ප්‍රකාශයේ සටහන් කරයි.

විදේශ මුදල් වලින් ඓතිහාසික පිරිවැයට නිරූපණය කරනු ලබන මුදල් නොවන වත්කම් සහ වගකීම් එම ගනුදෙනුව සිදුවන දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් පරිවර්තනය කරනු ලැබේ.

ඉදිරි විනිමය ගිවිසුම් තක්සේරු කරනු ලබන්නේ වාර්තා කරන දිනට බලපැවැත්වෙන ඉදිරි වෙළඳපල අනුපාතිකයන්ට අනුව වන අතර ඉන් ඇතිවන උපලබ්ධි නොවූ ශුද්ධ ලාභ සහ අලාභ ආදායම් ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

4.2.2 විදේශීය මෙහෙයුම්

ශ්‍රී ලංකා රුපියල් නොවන ව්‍යවහාර මුදල් භාවිතා කරන්නාවූ විදේශීය මෙහෙයුම්වල මෙහෙයුම් ප්‍රතිඵල හා මූල්‍ය තත්ත්වයන් පහත දැක්වෙන පරිදි ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කරනු ලැබේ.

විදේශීය මෙහෙයුම්වල පවතින වත්කම් සහ වගකීම් වාර්තාකරණ දිනට පවතින විදේශ විනිමය අනුපාතිකය මඟින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරනු ලැබේ. ආදායම් ප්‍රකාශයේ ආදායම් සහ වියදම් ගනුදෙනු සිදුවන දිනයන්හිදී පවතින විනිමය අනුපාතිකයන්හි සාමාන්‍ය අගය අනුව පරිවර්තනය කෙරේ.

විදේශ මෙහෙයුම් පරිවර්තනයේදී ඇතිවන විදේශ විනිමය අසමානතා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ සටහන් කරයි.

විදේශ මෙහෙයුම් ඉවත්කර ගැනීමකදී අදාල වටිනාකම ආදායම් ප්‍රකාශය තුළ ඉවත්කර ගැනීමේ ලාභ හෝ අලාභ වල කොටසක් ලෙස හඳුනාගෙන පරිවර්තනයේදී සටහන් කරනු ලැබේ.

4.3 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් හා මුදල් සමාන දෑ ලෙස ඇතුලත්වන්නේ අතැති දේශීය හා විදේශ විනිමය නෝට්ටු සහ කාසි, මහ බැංකු සමග ඇති සීමා නොකල ශේෂයන්, අනෙකුත් බැංකු සමග ඇති ශේෂයන් සහ කල්පිරීම් මාස තුනකට වඩා අඩු ද්‍රවශීලතාවයෙන් ඉහළ මූල්‍ය වත්කම්වල සාධාරණ අගය වෙනස්වීමේ අවදානම සැලකිය යුතු මට්ටමකින් නොපවතින සමූහය විසින් කෙටි කාලීන බැඳීම් කළමනාකරණය සඳහා භාවිතා කරන දෑය.

4.3.1 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත භාවිත කරමින් පිළියෙල කරනු ලබන අතර එය ශ්‍රී ලං ගි ප්‍ර 07 ට අනුව වක්‍ර ක්‍රමයට අනුව පිළියෙල කරනු ලැබේ. මෙහෙයුම් ක්‍රියාකාරකම් තුළින් ලැබූ මුදල් ප්‍රවාහයන් ලබා ගනු ලබන්නේ ලාභයට ගැලපුම් කිරීමෙනි. මුදල් සහ මුදල් සමාන දෑ ලෙස ඇතුලත් වන්නේ මුදල්, අනෙකුත් බැංකු වෙත ගෙවිය යුතු සහ ලැබිය යුතු මුදල් ද අත්පත් කර ගන්නා දිනයේ දී මාස 3 කට වඩා කල්පිරෙන කාලය අඩු වැඩි ද්‍රවශීලතාවයකින් යුතු කෙටි කාලීන ආයෝජනයි.

4.4 මූල්‍ය වත්කම් සහ වගකීම්

4.4.1 හඳුනා ගැනීමේ දිනය

සියලුම මූල්‍ය වත්කම් සහ වගකීම් ආරම්භයේදී හඳුනා ගනු ලබන්නේ පියවුම් දිනයේදීය. එනම් උපකරණවල ගිවිසගත් නියෝග සඳහා සමූහය පාර්ශවයක් ලෙස පත්වන දිනයයි. මෙයට ඇතුලත් වන්නේ අබන්ධ වෙළඳුම් කටයුතු, වෙළඳපල නීති සහ සම්මුතීන්මත නියමිත කාල පරාසයක් තුලදී වත්කමක් හුවමාරු කිරීම අවශ්‍ය වන මූල්‍ය වත්කමක් මිලදී ගැනීම හෝ විකිණීම්.

4.4.2 මූල්‍ය උපකරණ මුල් වරට මිණුම්කරණය

මූල්‍ය උපකරණ වර්ගීකරණය ප්‍රථමයෙන් හඳුනාගැනීම සිදුවන්නේ එහි අරමුණු, ලක්ෂණ සහ ඒවා අත්පත් කර ගැනීමේ කළමනාකරණ අරමුණු අනුවය.

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කළ මූල්‍ය වත්කම් හා වගකීම් හැරුණු විට මූල්‍ය වත්කම් සහ වගකීම් මුල් වරට මිණුම්කරණය කිරීමේදී ඒවායේ සාධාරණ අගයට ගනුදෙනු පිරිවැයද ඇතුලත් කෙරේ.

මූල්‍ය වත්කම් සහ වගකීම් මිණුම්කරණයේදී පහත සඳහන් අරමුණු අනුව වර්ගීකරණය කරනු ලැබේ.
ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට
කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන
ණය සහ ලැබිය යුතු දෑ
විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම්

4.4.3 ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම් හා වගකීම්

ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය කරනු ලබන්නේ ඒවා වෙළඳාම් සඳහා දරා සිටින විට හෝ ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට නම් කරන විටය. මුල් වරට හඳුනා ගැනීමේදී, අත්පත් කර ගන්නා විට ඇතිවන ගනුදෙනු පිරිවැය, ඍජුවම දැරූ ලාභයක් හෝ අලාභයක් ලෙස හඳුනා ගනී.

• ලාභ හෝ අලාභ මඟින් සාධාරණ අගයට වාර්තාකරණ ව්‍යුත්පන්න උපකරණ

සමූහය විසින් ව්‍යුත්පන්න උපකරණ ලෙස හරස් විනිමය අනුපාත, විදේශ විනිමය ඉදිරි කොන්ත්‍රාත්තු භාවිත කරයි. ව්‍යුත්පන්න උපකරණ සාධාරණ අගයට වාර්තා කරනු ලබන අතර ඒවායේ සාධාරණ අගය ධන අගයක් ගන්නා විට එය වත්කම් ලෙසද සාධාරණ අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙස වාර්තා කරනු ලබයි. ව්‍යුත්පන්න උපකරණ වල සාධාරණ අගයේ වෙනස් වීම ශුද්ධ වෙළඳ ආදායම්වල ඇතුලත් වේ.

• වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් සහ වගකීම්

වෙළඳාම සඳහා දරා සිටින මූල්‍ය වත්කම් සහ වගකීම් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ වාර්තා කරනුයේ සාධාරණ අගයටය. ඒවායේ, සාධාරණ අගයේ වෙනස් වීම ශුද්ධ වෙළඳ ආදායම්වල ඇතුළත් කරනු ලැබේ. අත්පත් කර ගැනීමේදී ආසන්න කාලයකදී විකිණීම හෝ නැවත මිලදී ගැනීම ප්‍රධාන අරමුණු කරගත් ණය සුරැකුම්පත් මෙම වර්ගීකරණයේ ඇතුලත් වේ.

4.4.4 කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම්

ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් සහිත සහ ස්ථිර කල්පිරීමක් සහිත සමූහයේ ධනාත්මක අදහසක් සහ කල් පිරෙන තෙක් දරා සිටිය හැකි ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය ආයෝජන ලෙස හැඳින්වේ.

මූලික මිනුම්කරණයෙන් පසුව කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම් මනිනුයේ සඵල පොළී ක්‍රමය මත ක්‍රමක්ෂය කළ පිරිවැය මත අගයෙන් හාණිකරණය අඩු කිරීමෙනි. ක්‍රමක්ෂය කළ පිරිවැය ගණනයේදී අත්පත් කර ගැනීමේදී ඇතිවන වට්ටම් සහ අධිමිල සළකා බලන අතර සඵල පොළී අනුපාතයේ අවශ්‍ය කොටසක් වන ගාස්තුද සළකා බැලේ. ක්‍රමක්ෂය ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම තුළ ඇතුලත් වේ. කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන විකිණීම හෝ නැවත වර්ගීකරණය කිරීමේදී විකිණීම සඳහා පවතින ආයෝජන ලෙස වර්ගීකරණය කිරීම සැළකිය යුතු වන විට එසේ කරනු ලැබේ.එසේ කිරීමෙන් ප්‍රවර්තන වර්ෂයේ දී සහ ඉදිරි මූල්‍ය වර්ෂ 2 ක් තුළ කල් පිරෙන තෙක් දරා සිටින ආයෝජන සුරැකුම්පත් වර්ගීකරණය කිරීම සමූහය විසින් වළකනු ලැබේ. විකිණීම හෝ නැවත වර්ගීකරණය කිරීම සඳහා පහලින් සඳහන් වන අවස්ථා ක්‍රියාරම්භකය නොවනු ඇත.

- විකිණීම හෝ නැවත වර්ගීකරණය තෙක් ඇති කල් පිරීමට ආසන්න, වෙළඳපල පොළී අනුපාතිකයන්ගේ වෙනස් වීම මූල්‍ය වත්කම්වල සාධාරණ අගය කෙරෙහි සැළකිය යුතු බලපෑමක් නොකරන
- සමූහය විසින් ප්‍රමාණාත්මක ලෙස වත්කමෙහි මුල් මුදල අයකර ගැනීමෙන් පසුව සිදුවන විකිණීම සහ වර්ගීකරණය

- විකිණීම හෝ නැවත වර්ගීකරණයෙන් ආරෝපණීය වන සමූහයේ පාලනයෙන් තොර කලින් බලාපොරොත්තු විය නොහැකි නැවත සිදු නොවන හුදෙකලා අවස්ථා

4.4.5 බැංකු වල ඇති තැන්පතු, සහ අනෙකුත් ගනුදෙනුකරුවන් වෙතැති ණය සහ අත්තිකාරම්

බැංකු වල ඇති තැන්පතු සහ අනෙකුත් ගනුදෙනුකරුවන් වෙතැති ණය සහ අත්තිකාරම් යනුවෙන් ගම්‍ය වනුයේ ක්‍රියාකාරී වෙළඳපලක ලැයිස්තු ගතව නොමැති ස්ථිර හෝ නිශ්චිත ගෙවීමක් සම්බන්ධවන ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. කෙසේ නමුදු පහත සඳහන් දෑ මීට ඇතුලත් නොවේ.

- මූලික හඳුනාගැනීමේ දී, ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල සහ ඉතා මෑත කාලයේදී අලෙවි කිරීමට බැංකුව අදහස් කර ඇති ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම්.
- මූලික හඳුනාගැනීමේ දී, විකිණීම සඳහා වන මූල්‍ය වත්කම් ලෙස වර්ග කර ඇති දෑ.
- ණය හානිකරණය සඳහා වන යම් අගයක් හැර ප්‍රධාන වශයෙන් ම මූලික ආයෝජනය යලිත් අයකර ගැනීමට නොහැකි මූල්‍ය වත්කම්.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව බැංකු වල ඇති තැන්පතු, සහ අනෙකුත් ගනුදෙනුකරුවන් වෙතැති ණය සහ අත්තිකාරම් සඵල පොළී අනුපාතිකය මත ගණනය කරනු ලබන ක්‍රමක්ෂය කල පිරිවැයට, ණය හානිකරණය සඳහා වන වෙන්කිරීම් ගලපා මූල්‍ය ප්‍රකාශවල හඳුනා ගැනේ. ක්‍රමක්ෂය කල පිරිවැය ගණනය කිරීමේදී අත්පත් කර ගැනීමේදී පැන නගින අවම්ල හෝ අධිමිලත් සඵල පොළී අනුපාතිකයේ සැලකිය යුතු කොටසක් බවට පත්වන ගාස්තු සහ පිරිවැයත් සැලකිල්ලට ගනු ලැබේ. ක්‍රමක්ෂය, ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම යටතේ ඇතුලත් වන අතර ණය හානිකරණය මගින් පැන නගින අලාභ ආදායම් ප්‍රකාශයේ "ණය හානි සහ වෙනත් අලාභයන්" යටතේ දක්වා ඇත.

ණය සහ අත්තිකාරම්, ආයෝජන සුරුකුම් යලි අයකර ගත නොහැකි බවට තහවුරු වූ පසු එම අයකර ගත නොහැකි අගයන් කපා හැරීම සමූහයේ ප්‍රතිපත්තියයි.

4.4.6 විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන

විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන යටතට ගනු ලබන්නේ ණය සුරුකුම් සහ වෙළඳාම සඳහා දරා සිටින හෝ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කරන ලද ස්කන්ධ ආයෝජනයන් හැර අනෙකුත් ස්කන්ධ අයෝජනයන් වේ.

මෙම වර්ගීකරණය යටතේ දරා සිටින ණය සුරුකුම් වල විශේෂත්වය වනුයේ, නිශ්චිත නොවන කාලසීමාවක් තුල රඳවා ගනිමින්, ද්‍රවශීලතා අවශ්‍යතාවයන් මත හෝ වෙළඳපල තත්ත්වයන්ට ප්‍රතිචාර දැක්වීමක් ලෙස හෝ විකිණීම සිදු කිරීමයි. කිසිදු ණය සහ ලැබිය යුතු දෑ විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන යටතේ සමූහය විසින් වර්ගීකරණය කර නොමැත.

මූලික හඳුනාගැනීමෙන් පසුව විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන සාධාරණ අගය මත පසු කාලීනව ගිණුම්ගත කරණු ලැබේ.

උපලබ්දි නොවූ ලාභ හෝ අලාභ, "විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන සංචිත" නමින් වෙනත් විස්තීරණ ආදායම් යටතේ හඳුනා ගැනෙන අතර, ආයෝජන විකිණීමක් වේ නම් සංචිත යටතේ ඊට අදාලව පෙර හඳුනාගත් ලාභ හෝ අලාභ ආදායම් ප්‍රකාශයේ "වෙනත් මෙහෙයුම් ආදායම්" යටතේ හඳුනා ගනී. සමූහය විසින් සමාන සුරුකුම් වලින් එක් ආයෝජනයකට වඩා දරණ අවස්ථාවන් හිදී, "ප්‍රථමයෙන් ලැබ ප්‍රථමයෙන් නිකුත් කරන" පදනම යටතේ විකිණීමට නියමිතය. විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන මගින් උපයනු ලබන පොළී ආදායම, සඵල පොළී අනුපාතය මත ගණනය කර පොළී ආදායම යටතේ ප්‍රකාශ කරන අතර ලාභාංශ ලැබීමේ අයිතිය තහවුරු වූ පසු ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනා ගනී. ආයෝජන හානිකරණය මත වන අලාභ "විකිණීම සඳහා පවතින මූල්‍ය ආයෝජන සංචිත" මගින් ඉවත්කරනු ලැබේ.

4.4.7 "එක් දින" ලාභ හෝ අලාභ

යම් මූල්‍ය උපකරණයක ගනුදෙනුවන මිල, එම මූල්‍ය උපකරණයම ගනුදෙනු වන වෙනත් නිරීක්ෂිත වර්තමාන වෙළඳපලක සාධාරණ අගයට හෝ නිරීක්ෂිත වර්තමාන වෙළඳපලක දත්ත මත ගණනය කරන ලද සාධාරණ අගයට හෝ වෙනස් වන්නෙහි නම් එම සාධාරණ අගයෙහි හා ගනුදෙනු මිලෙහි වෙනස සමූහය විසින් වහාම ආදායම් ප්‍රකාශය යටතේ ඇති . වෙළඳ කටයුතු වලින් ශුද්ධ ලාභ/අලාභ යටතේ හඳුනා ගනේ. නිරීක්ෂිත නොවන දත්ත මත සාධාරණ අගය ගණනය කරනු ලබන අවස්ථාවන් හී දී ගනුදෙනු මිල සහ ආදර්ශ මිල අතර වෙනස එම මූල්‍ය උපකරණයේ ආයු කාලය තුල ආදායම් ප්‍රකාශයේ හඳුනා ගනී.

4.4.8 නිකුත් කර ඇති ණය සුරුකුම් සහ අනෙකුත් ණය

නිකුත් කර ඇති ණය සුරුකුම් සහ අනෙකුත් ණය ලෙස වර්ගීකරණය කරනු ලබන්නේ, ගිවිසුම් ගත එකඟතාවයේ ස්වභාවය මත මුදල්, වෙනත් මූල්‍ය වත්කමක් හෝ ස්ථාවර ප්‍රමාණයක තම හිමිකම් කොටස් අදාල පාර්ශවය වෙත ගෙවීමට වගකීමකින් සමූහය බැඳී ඇති මූල්‍ය උපකරණයි. තවද, ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වගකීම් ද මෙම ගණනයට අයත් නොවේ.

මූලික හඳුනාගැනීමෙන් අනතුරුව, නිකුත් කර ඇති ණය සුරුකුම් සහ අනෙකුත් ණය සඵල පොළී අනුපාතය මත ගණනය කරන ක්‍රමක්ෂය පිරිවැය මත ගිණුම් ගත කරනු ඇත. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කිරීම සඳහා සඵල පොළී අනුපාතය තීරණය කිරීමේදී නිකුත් කිරීමට අදාල වට්ටම් හෝ අධි මිලත්, පිරිවැයත් සැලකිල්ලට ගනු ලැබේ.

4.4.9 බැහැර කිරීම

මූල්‍ය වත්කම් මගින් ජනනය වන මුදල් ප්‍රවාහයන් සඳහා ඇති ගිවිසුම් ගත අයිතිවාසිකම කල්පිරෙන විට දී හෝ ගනුදෙනුවක් මගින් මූල්‍ය වත්කමේ අයිතිය හා බැඳුනු සැලකිය යුතු ප්‍රමාණයක අවදානම් හා ප්‍රතිලාභ අනෙකුත් පාර්ශවය වෙත මාරු කිරීමේ දී හෝ සමූහය විසින් එම මූල්‍ය වත්කම බැහැර කරනු ඇත.

බැහැර කිරීමට යටත්ව මාරු කරන ලද මූල්‍ය වත්කම් වලට අදාලව සමූහය රඳවා ගනු ලබන පොළීය මූල්‍ය තත්ත්ව වාර්තාවේ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා ගනී. මූල්‍ය වත්කමක් බැහැර කිරීමේ දී ධාරණ අගය සහ පහත අගයන් හි අතර වෙනස ආදායම් ප්‍රකාශය යටතට ගැනේ.

i. ප්‍රතිෂ්ඨාව මත ලද අගයන් (අත්කර ගත් නව වත්කම් වලින් කල්පිත වගකීම් අඩු කල පසු අගයන් ද ඇතුළුව)

ii. විස්තීරණ ආදායම් ප්‍රකාශය යටතේ හඳුනාගෙන තිබූ ලාභ හෝ අලාභ වල අගයන් වත්කම් වලට අදාලව සියලු හා යම් ප්‍රමාණාත්මක අවදානම් සහ ප්‍රතිලාභ සමූහය වෙත රඳවා ගනිමින් අදාල වත්කම් වෙනත් පාර්ශවයකට පැවරීමේ හැකියාව සමූහය වෙත පවතී. එවන් අවස්ථාවක දී වත්කම් බැහැර කිරීමක් ලෙස නොසැලකේ.
උදා : ප්‍රති මිල දී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණනු ලබන සුරුකුම්.

වත්කම් තෙවන පාර්ශවයක් වෙත, එහි සමකාලීන මුළු ඉපයුම් අනුපාතිකය සමඟ විකුණූ විට එම ගනුදෙනුවක් හා සමානව ගිණුම් ගත කරනු ඇත. සමූහය වෙත ප්‍රමාණාත්මක අවදානම් හා ප්‍රතිලාභ රඳවා ගනිමින් සිදු කරනු ලබන ප්‍රති මිලදී ගැනීමේ ගනුදෙනු මේ හා සැසඳේ.

සමූහය විසින් සිදු කරනු ගනුදෙනු මූල්‍ය වත්කමේ හිමිකම හා බැදුණු ප්‍රමාණාත්මක අවදානම් හා ප්‍රතිලාභ සමූහය වෙත රඳවා නොගන්නා නමුත් එම වත්කමෙහි පාලන අයිතිය රඳවා ගන්නා විට එම වත්කමෙහි පාලනය දරා සිටින තාක් දුරට සමූහයෙහි ගිණුම් තුල එම වත්කම හඳුනා ගැනේ.

යම් ගනුදෙනු වලදී මූල්‍ය වත්කමක් වෙනත් පාර්ශවයක් වෙත පැවරීම සිදු කල ද එම වත්කම හා බැදුණු සේවාවන් යම් ගාස්තුවක් අය කිරීම මත සැපයීමේ වගකීම සමූහය රඳවා ගනී. එවන් ආවස්ථා වලදී එම වත්කම බැහැර කිරීමේ උපමානයන් සපුරා ඇත්නම් එය බැහැර කෙරනු ඇත. තවද එම සේවා සැපයුමට අදාල ගිවිසුමක් වේ නම් ඒහා බැඳී සේවා ගාස්තුව හා සපයනු ලබන සේවාව අතර වන වෙනස මත වත්කමක් හෝ වගකීමක් හඳුනා ගනී.

මූල්‍ය වගකීමක් සහ බැඳුණු වගකීම නිසියාකාරව නිම කිරීම නිසා හෝ එය අහෝසි වී යාම නිසා හෝ කාලසීමාව ඉකුත්වීම නිසා හෝ යන කාරණා මත නිමා වී ඇති නම් එම මූල්‍ය වගකීම ගිණුම් තුලින් බැහැර කිරීම් සිදු කරයි. පවත්නා මූල්‍ය වගකීමක් එම ණයහිමියා විසින්ම වෙනත් වගකීමක් මගින් ප්‍රමාණාත්මක කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවත්නා කොන්දේසි ප්‍රමාණාත්මක හා සැලකිය යුතු ලෙස වෙනසකට භාජනය කරන විට එය මුල් වගකීමෙහි බැහැර කිරීමක් ලෙසත් නව වගකීමෙහි හඳුනා ගැනීමක් ලෙසත් ගිණුම් ගත කරනු ඇත. මුල් මූල්‍ය වගකීමෙහි ධාරණ අගයෙහි සහ ගෙවූ ප්‍රතිෂ්ඨාවෙහි අතර වෙනස ආදායම් ප්‍රකාශයෙහි සටහන් කෙරේ.

4.4.10 ප්‍රති මිලදී ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම යටතේ මිලට ගනු ලබන සුරුකුම්

සමූහය වෙත ප්‍රමාණාත්මක සහ සැලකිය යුතු සියළු අවදානම් සහ ප්‍රතිලාභයන් රදවා ගනිමින්, නිශ්චිත අනාගත දිනය කදී ප්‍රති මිලදී ගැනීමේ ගිවිසුමක් මත විකුණනු ලබන සුරුකුම් මූල්‍ය තත්ත්ව වාර්තාවෙන් බැහැර කරනු නොලැබේ. මෙම ගනුදෙනු මත ලද මුදල් ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව වාර්තාවේ වත්කමක් ලෙස හඳුනා ගනු ලබන අතර එයට අදාල වන ගිවිසුම් ගත බැදීම අදාල උපචිත පොළිය ද සමග වෙනත් ණය යටතේ වගකීමක් ලෙස ගිණුම් ගත කෙරේ. එමගින් ගනුදෙනුවේ ආර්ථිකමය යථා ස්භාවය මත වගකීම සමූහයේ ණය වගකීමක් ලෙස විදහා දැක්වේ. විකුණුම් සහ ප්‍රති මිලදී ගැණුම් මිල අතර අන්තරය පොළී වියදම ලෙස සලකන අතර, ප්‍රති විකුණුම් ගිවිසුමේ ආයු කාලය තුල එය උපචිත වන පරිදි සඵල පොළී අනුපාතිකය යටතේ ගිණුම් ගත කෙරේ.

විලෝම වශයෙන්, ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මිලයට ගත් සුරුකුම් නිශ්චිත අනාගත දිනක දී යළි විකිණිය යුතු අතර එය මූල්‍ය තත්ත්ව වාර්තාව තුලට අන්තර්ගත කරනු නොලැබේ. ගනුදෙනුවේ ආර්ථික යථා ස්වභාවය මත මෙය සමූහය විසින් දෙනු ලැබූ ණයක් ලෙස සලකා ගෙවන ලද ප්‍රතිෂ්ඨාව සහ උපචිත පොළිය ප්‍රති විකුණුම් ගිවිසුම් යටතේ මූල්‍ය තත්ත්ව වාර්තාවේ සටහන් කෙරේ. මිලට ගැනුම් සහ "ප්‍රති විකුණුම්" යන අගයන් අතර අන්තරය "ශුද්ධ පොළී ආදායම" ලෙස ගැනෙන අතර එය සඵල පොළී අනුපාතිකය මත ගිවිසුමේ ආයු කාලය මත ගිණුම් ගත කෙරේ.

4.4.11 "සාධාරණ අගය" නිර්ණය කිරීම

වාර්තාගත දිනට ක්‍රියාකාරී වෙළඳපලක ගනුදෙනු වන මූල්‍ය උපකරණයන් හී සාධාරණ අගය රදා පවතින්නේ ඒවායේ සාමාන්‍ය ප්‍රකාශිත වෙළඳපල මිල හෝ සාමාන්‍ය ඇස්තමේන්තු ගත වෙළඳ මිල මත වේ. (ගනුදෙනු ගාස්තු ඉවත් නොකර)

ක්‍රියාකාරී වෙළඳපලක ගනුදෙනු නොවන මූල්‍ය උපකරණයන් හී සාධාරණ අගය තීරණය කිරීමේදී එයට යෝග්‍යවන තක්සේරු ක්‍රමයන් අනුගමනය කරනු ඇත. තක්සේරු ක්‍රමයන් ලෙස යොදා ගැනෙන්නේ වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය, නිර්ණිත වෙළඳපලක සමාන මූල්‍ය උපකරණයන් හි අගයන්, සහ අනෙකුත් යෝග්‍ය තක්සේරු ආකෘතීන්ය.

4.4.12 හිලව් කිරීම්

මූල්‍ය තත්ත්ව වාර්තාව තුල වත්කම් සහ වගකීම් හිලව් කිරීම මගින් ශුද්ධ වටිනාකමට වාර්තා කිරීම සිදු කරනු ලබන්නේ ඒ සඳහා නීතිමය වශයෙන් බලය ලබා දී ඇති විට ශුද්ධ වටිනාකම මත හෝ එකවිට වත්කම සහ වගකීම පියවා ගැනීමේ අදහසක් ඇති විටම පමණක් වේ.

4.4.13 මූල්‍ය වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම මූල්‍ය වත්කම් හි අගය තනිව හෝ සාමූහිකව සලකන විට හානිකරණයකට ලක්ව තිබේද යන්න පිළිබඳව සපයනු ලබන විෂය බද්ධ සාක්ෂි මගින් තක්සේරු කරනු ලැබේ. එලෙස විෂය බද්ධ සාක්ෂි මගින් හානිකරණයක් සිදුව ඇති බවට විද්‍යාමාන වනුයේ වත්කමෙහි මූලික හඳුනා ගැනීමට පසු අලාභයක් ජනනය වන සිද්ධියක් සිදුව ඇති විට සහ එම අලාභ ගත සිද්ධිය එම වත්කමෙහි අනාගත මුදල් ප්‍රවාහ මත විශ්වාස ගත ලෙස නිමානය කල හැකි විටදීය.

• ක්‍රමක්ෂය පිරිවැය මත වන මූල්‍ය වත්කම් හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදී ම මූල්‍ය වත්කම් හි අගය තනිව හෝ සාමූහිකව සලකන විට හානිකරණයට ලක්ව තිබේද යන්න පිළිබඳව සපයනු ලබන විෂය බද්ධ සාක්ෂි මගින් තක්සේරු කරනු ඇත.

මෙලෙස මූල්‍ය වත්කම් (ස්කන්ධ සුරුකුම් ද ඇතුළුව) හානිකරණයට ලක් ව ඇති බවට තහවුරු කෙරෙන විෂය බද්ධ සාක්ෂි පහත පරිදි වේ.

- ණයගැණුම්කරු හෝ නිකුත්කරන්නාගේ සැලකිය යුතු මූල්‍ය දුෂ්කරතාවයන් පෙන්නුම් කරයි නම්.
- ණයගැණුම්කරු විසින් ගෙවීම් පැහැර හැරීම.
- ණය හෝ අත්තිකාරම් ප්‍රතිව්‍යුහගත කිරීමක් හෝ ඒ උදෙසා සමූහය විසින් කෙරෙන සලකා බැලීමක්.
- ණයගැණුම්කරු හෝ නිකුත්කරන්නාගේ බුන්වත්භාවය පිළිබඳ සංඥාවක්
- සුරුකුම් සඳහා ක්‍රියාකාරී වෙළඳපලක් නොමැතිවීම.
- වත්කම් සමූහයකට අදාල වන ගෙවීම් තත්ත්වයන් හී හානිකර වෙනස්කම්, සමූහය සමග අනෙන්‍යන්‍ය සම්බන්ධතාවක් පෙන්නුම් කරන, සමූහයේ පසුබැස්මකට හේතු වන ආර්ථික තත්ත්වයන් වැනි නිරීක්ෂිත දත්ත.

හානිකරණයක් සිදුව ඇති බවට විෂය බද්ධ ගත සාක්ෂි පවතින විට, වත්කමේ හි ධාරණ අගය සහ ඇස්තමේන්තු ගත අනාගත මුදල් ප්‍රවාහයන් හි වර්තමාන අගය (මෙතෙක් ජනිත වී නොමැති අනාගත අලාභයන් අත්හැර) යන දෙකෙහි අන්තරය හානිකරණ අලාභය ලෙස සැලකේ. ධාරණ අගය හානිකරණ අලාභය මත වන ප්‍රතිපාදන ගිණුමක් මගින් ගැලපීමකට ලක් කෙරෙන අතර හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශයෙහි හදුනා ගැනේ. හානිකරණ අලාභය ගණනය කිරීමේදී අනාගත මුදල් ප්‍රවාහයන් වට්ටම් කිරීමට භාවිතා කරන ලද පොළී ප්‍රතිශතය යොදා ගනිමින්, හානිකරණ අලාභ මත වන ප්‍රතිපාදන ගලපන ලද ධාරණ අගය මත පොළී ආදායම ගණනය කෙරේ. එම පොළී ආදායම ආදායම් ප්‍රකාශයේ පොළී ආදායම යටතේ ගිණුම් ගත කරනු ඇත.

හානිකරණ අලාභ ඇස්තමේන්තු කරණයේ දී හානිකරණයට යටත් නොවූ සියලුම කේවල වශයෙන් ප්‍රමාණාත්මක ණය සහ අත්තිකාරම් සාමූහික වශයෙන් යලි හානිකරණය උදෙසා සලකා බලනු ඇත. එසේම කේවල වශයෙන් ප්‍රමාණාත්මක නොවන ණය සහ අත්තිකාරම් ද එහි සමාන අවදානම් ස්වරූපය පාදක කොට සමූහ ගත කර හානිකරණය උදෙසා තක්සේරු කරනු ලැබේ.

සාමූහික හානිකරණය තීරණය කිරීමේ දී සමූහය උපයෝගී කර ගනුයේ අතීතය තුල ගෙවීම් පැහැර හැරීමේ ප්‍රවනතාවය, යලි අයකර ගැනීමේ කාලය, සහ අලාභයන් වූ ප්‍රමාණය සලකා බලා සකසනු ලැබූ සංඛ්‍යානමය ආකෘතියකි. වර්තමාන ආර්ථික සහ ණය තත්ත්වයන් මත වන අලාභයන් ආකෘතිය මගින් ලබාදෙන අගය ඉක්මවන බවට කලමනාකරණය තීරණය කරන විට ඒ සඳහා වන ගැලපුම් සාධකයක් සංඛ්‍යානමය ආකෘතියට යොදා ඇත.

ණය සහ අත්තිකාරම් කළඹ සඳහා වන ණය හානිකරණය ගණනය කරනුයේ අතීතයේ එම ණය සහ අත්තිකාරම් කළඹයන්හි හැසිරීම් රටාව මතවේ. කෙසේ නමුත් මෙම කළඹයන් ඒවායේ සම්පූර්ණ ආර්ථික ආයු කාලය සපුරා නොමැති හෙයින් අනාගතයේ දී පැනනැගිය හැකි අස්ථාවර තත්ත්වයන් සමාලෝචනයට භාජනය නොවේ. එබැවින් මෙම සීමාවීම් නිවැරදි ලෙස සැලකිල්ලට ගනිමින් "ආර්ථික සාධක ගැලපුම්" අගයන් ණය හානිකරණය ගණනය කිරීමේදී යොදා ගනේ.

ණය සහ අත්තිකාරම් හි අනාගත අයකර ගැනීම පිළිබඳව යතාර්ථ අපේක්ෂාවක් නොමැති විට සහ සුරුකුම් දේපල උපලබ්ධි වී සමූහය වෙත යලි පවරා ඇති විට ණය සහ ඒ මත කල ප්‍රතිපාදන කපා හැරීම සිදු කරනු ලැබේ. පසු වසරකදී ඇස්තමේන්තු ගත ණය හානිකරණය යම් කිසි සිද්ධියක් හඳුනා ගැනීම මත වැඩි වීමකට හෝ අඩු වීමකට ලක්වේ නම් ප්‍රථමයෙන් ගිණුම් ගත කල ප්‍රතිපාදන එම වැඩි වීම හෝ අඩු වීමට අනුරූපීව සටහන් කරනු ඇත. කපා හරින ලද යම් ණය හෝ අත්තිකාරමක් පසුව යලි අයකර ගැනීමට හැකිවේ නම් එම යලි අයකර ගත් ප්‍රමාණය වෙනත් මෙහෙයුම් ආදායම් යටතේ හඳුනා ගනු ලැබේ.

• කල් පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම් මත වන හානිකරණ තක්සේරුකරණය

ක්‍රමක්ෂය පිරිවැය මත ගිණුම් ගත කර කල්පිරෙන තෙක් දරා සිටින මූල්‍ය වත්කම් වල ධාරණ අගය සහ වත්කමේ මූලික සඵල පොළී අනුපාතිකය මගින් වට්ටම් කරන ලද තක්සේරු ගත අනාගත මුදල් ප්‍රවාහයන් හී වර්තමාන අගය අතර අන්තරය, මෙම මූල්‍ය වත්කම් මත වන ණය හානිකරණය වන අතර ආදායම් ප්‍රකාශයේ ණය හා අත්තිකාරම් හානිකරණය යටතේ මෙය සටහන් කරයි. හානිකරණය වූ වත්කම් මත ලැබෙන පොළී ආදායම හඳුනා ගැනීම එලෙසම සිදු කරන අතර පසුව ඇතිවන සිදුවීමක් මත ප්‍රතිපාදනය කල ප්‍රමාණයට වඩා නව හානිකරණ අගයෙහි අඩු වැඩි වීමක් වෙයි නම් ඊට අනුකූලව ප්‍රතිපාදන වෙන් කෙරේ.

• විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කම් මත වන හානිකරණ තක්සේරුකරණය
විකිණීම සඳහා පවතින ආයෝජන සුරැකුම් මත වන හානිකරණය හඳුනා ගැනෙන්නේ විස්තීරණ ආදායම් ප්‍රකාශයේ සටහන් කලා වූ මුළු හානිකරණ අලාභය ආදායම් ප්‍රකාශයට ප්‍රතිවර්ගීකරණ ගැලපුමක් ලෙස මාරුකිරීමෙනි. එසේ ප්‍රතිවර්ගීකරණය කරනු ලබන අගය වනුයේ අත්පත් කර ගත් අගයන් මුල් මුදල පියවීම් සහ ක්‍රමක්ෂය ඉවත් කල පසු අගය සහ වර්තමාන සාධාරණ වටිනාකම්වන් පෙර කාලපරිච්ඡේද වලදී ආදායම් ප්‍රකාශයේ හඳුනාගත් හානිකරණ අලාභ ඉවත් කල පසු අගය යන දෙකෙහි අන්තරයයි. හානිකරණ අලාභය සඳහා වන ප්‍රතිපාදනයන් හි කාල අගයට අදාලව සිදුවන වෙනස්කම් පොළී ආදායමෙ හි අන්තර්ගත කෙරේ.

හානිකරණ අලාභ සඳහා ප්‍රතිපාදනය කල, විකිණීම සඳහා පවතින මූල්‍ය වත්කමක සාධාරණ වටිනාකම එම ප්‍රතිපාදනය සිදු කල පසුව ඇති වන යම් විෂය බද්ධ සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස වැඩිවී ඇත්නම් ආදායම් ප්‍රකාශයට සටහන් කල හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කරනු ඇත. කෙසේ නමුත් හානිකරණ අලාභයන් හඳුනාගත් විකිණීම සඳහා පවතින ස්කන්ධ සුරැකුම් හි යලි අයකර ගැනීමක් වේ නම් එය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ දී හඳුනා ගැනේ.

• ප්‍රතිකතිකා ගත ණය
සමූහය හැකි සෑම විටකදීම අවදානම් සහිත ණය, ඇප සුරැකුම් යොදා ගනිමින් අයකර ගැනීමට වඩා ගෙවීම් ගිවිසුම් දීර්ඝ කිරීම හෝ නව ණය කොන්දේසි යෙදීමෙන් හෝ ණය ප්‍රතිව්‍යුහගත කිරීමට පෙළඹේ. නව ණය කොන්දේසි පිළිබඳ කතිකා කොට එකඟතාවයකට එළඹී පසු යම් හානිකරණයක් වේ නම් එය නව කොන්දේසි වලට පෙර පැවති සවල පොළී අනුපාතිකය මත ගණනය කරන අතර එම ණය තවදුරටත් කල්පිත ණය ලෙස නොසැලකේ. මෙම ප්‍රතිව්‍යුහගත ණය වල අනාගත ගෙවීම් ක්‍රියාවලිය පිලිබඳව කලමනාකරණය අඛණ්ඩව අවධානය යොමු කරන අතර එය මුල් සවල පොළී අනුපාතිකය මත කේවල හෝ සාමුහික වශයෙන් හානිකරණ තක්සේරු කිරීමට යටත් වේ.

• ඇප සුරැකුම් ගණනය
සමූහය හැකි සෑම විටකදීම තම මූල්‍ය වත්කම් හි අවදානම අවම කර ගැනීම සඳහා ඇප සුරැකුම් භාවිතයට පෙළඹේ. මුදල්, සුරැකුම්, ණයවර ලිපි හෝ ඇප සහතික, නිශ්චල දේපළ, ණය ගැතියෝ, භාණ්ඩ තොග, අනෙකුත් මූල්‍ය නොවන වත්කම් සහ ණය පුළුල් කිරීම් ආදී සියලු දේ ඇප සුරැකුම් ගණයට ගැනේ.

ඇප සුරැකුම් වල සාධාරණ අගය ආරම්භයේ සිටම එහි අවම අගයට ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගෝපදේශයන්ට අනුකූලව තක්සේරු කෙරේ.

නිශ්චල දේපළ වැනි මූල්‍ය නොවන ඇප සුරැකුම් වල සාධාරණ අගය ගණනයේ දී ස්වාධීන තක්සේරුවක් හෝ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශ වැනි තෙවන පාර්ශවීය දත්තයන් සැලකිල්ලට ගනී.

• නැවත භුක්තිය ලබා ගන්නා ඇප සුරැකුම්
සමූහයේ ප්‍රතිපත්තිය වනුයේ නැවත භුක්තිය ලබාගත් ඇප සුරැකුම් එය තම අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීම සහ විකිණීම යන අවස්ථා දෙකෙන් සුදුසුම අවස්ථාව තීරණය කර ඒ මත කටයුතු කිරීමයි. තම අභ්‍යන්තර මෙහෙයුම් කටයුතු සඳහා යොදා ගැනීමට උචිත බවට තහවුරු වන වත්කම් එහි අත්පත් කරගත් අගය සහ මූලික සුරැකුමට තැබූ වත්කමේ ධාරණ අගය යන දෙකෙහි අඩු අගය මත නියමිත වත්කම් වර්ගයට මාරු කරමින් ගිණුම් ගත කෙරේ.

4.5 මූල්‍ය නොවන වත්කම්
4.5.1 දේපළ, පිරියත හා උපකරණ
4.5.1.1 හඳුනාගැනීම හා මිණුම්කරණ පදනම
සමූහය තුළට අනාගත ආර්ථික ප්‍රතිලාභයන් වත්කම් තුළින් ගලා ඒම පිළිබඳව භව්‍යතාවයක් ඇත්නම් සහ වත්කමේ පිරිවැය විශ්වාසනීය ලෙස මැනිය හැකි විටක දේපළ, පිරියත හා උපකරණ වත්කම් සේ හඳුනා ගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීමේ නිර්නායකයන් සම්පූර්ණ කළ පසු ඒවා මුල් වරට අත්පත් කර ගැනීමට හෝ ඉදිකිරීමට දරන ලද සෘජුවම හඳුනාගත හැකි පිරිවැය සහ ඒ හා ආනුෂාංගික පිරිවැය සහිතව මුළු පිරිවැයට අගය කරනු ලැබේ. ඉදිකරන ලද වත්කම් සම්බන්ධයෙන් අමුද්‍රව්‍ය පිරිවැය, සෘජු ශ්‍රම පිරිවැය සහිත අදාල වත්කම අපේක්ෂිත පරිහරණ තත්ත්වයට පත් කිරීම සඳහා දරන ලද අනෙකුත් පිරිවැය සහ එම ඉදිකිරීමට කරන ලද වැඩ බිමෙහි යම් ඉවත් කිරීම් සහ අපහරණයන් සඳහා දරන ලද පිරිවැය සහිතව මුළු පිරිවැයට හඳුනා ගැනීම කෙරේ. මිලදී ගත් පරිගණක මෘදුකාංගද උපකරණයේ ක්‍රියාවට අත්‍යාවශ්‍ය නම් පරිගණක උපකරණ වශයෙන් ප්‍රාග්ධනගත කෙරේ.

සමූහය විසින් දේපළ පිරියත හා උපකරණ වාර්තා කරන්නේ පිරිවැය ආකෘතියට වන අතර මෙහිදී මිලදී ගැනීම හා ඉදිකිරීම සඳහා දරන ලද පිරිවැය මෙන්ම ඒ හා අනුෂාංගික අනෙකුත් පිරිවැය එකතුවෙන් සමුච්චිත ක්ෂය සහ හානිකරණ අලාභයක් වේනම් සමුච්චිත හානිකරණ අලාභ සඳහා වෙන් කිරීමද අඩුකල පසු අගයට දේපළ, පිරියත හා උපකරණ වාර්තා කෙරේ. සමූහය විසින් සිදුකරන ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු ගිවිසුම් යටතේ වන ඉඩම් වල පිහිටි ගොඩනැගිලි යන වත්කම් පන්තියම ප්‍රත්‍යාගණන ආකෘතිය මත වාර්තා කරනු ලැබේ.

එවැනි දේපළ ප්‍රත්‍යාගණන අගයෙන් එනම් ප්‍රත්‍යාගණනය කල දිනට පැවති සාධාරණ අගයෙන් පසු කාලීන සමුච්චිත ක්ෂය හා පසු කාලීන සමුච්චිත හානිකරණ අලාභ වේ නම් ඒ සඳහා වෙන් කිරීම් අඩු කල අගයට වාර්තා කෙරේ. සිදුකරන ඉඩම් හා ගොඩනැගිලි සහ කල්බදු ගිවිසුම් යටතේ වන ඉඩම් වල පිහිටි ගොඩනැගිලි සමූහය විසින් වර්ෂ හතක් තුලදී චක්‍රීය පදනම මත ප්‍රත්‍යාගණනය කරන අතර, එමගින් ශේෂ පත්‍ර දිනට ධාරණ වටිනාකම් ඒවායේ සාධාරණ අගයෙන් ප්‍රමාණාත්මකව වෙන් නොවන බවට සාක්ෂාත් කෙරේ. යම් ප්‍රත්‍යාගණන අතිරික්තයක් වේ නම් එය වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ එම වත්කම් වර්ගයටම අදාලව වෙනත් විස්තීරණ ආදායමට පෙර ගලපන ලද ප්‍රත්‍යාගණන අලාභයේ ප්‍රමාණය දක්වා හඳුනාගන්නා අතර, යම් ප්‍රත්‍යාගණන අලාභයක් වේ නම් එම වත්කමට ම අදාලව වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශයට කලින් ගලපන ලද ප්‍රත්‍යාගණන අතිරික්තය දක්වා හඳුනා ගැනේ.

ප්‍රත්‍යාගණනය කරන දිනට පවතින සමුච්චිත ක්ෂය ප්‍රමාණය වත්කමේ ධාරණ අගයෙන් ඉවත් කර ලැබෙන ශුද්ධ අගය, ප්‍රත්‍යාගණන අගය තෙක් ගලපා ගිණුම් ගත කෙරේ. යම් සිද්ධියක් හෝ අවස්ථානුගත වෙනස්වීමක ප්‍රතිඵලයක් ලෙස වත්කමෙහි ධාරණ අගය උපලබ්ධි කරගත නොහැකි බව හැඟීයයි නම් එය හානිකරණ තක්සේරුවකට ලක් කෙරේ. යම් වත්කමක ප්‍රධාන ප්‍රභේදයක් ලෙස සැලකිය හැකි කොටසක් වෙනත් ආයුකාලයක් දරයි නම් එම කොටස වෙනම වූ අයිතමයක් ලෙස දේපළ, පිරියත හා උපකරණ යටතේ විදහා දැක්වේ.

4.5.1.2 පසුකාලීන පිරිවැය
දේපළ, පිරියත හා උපකරණයක කොටස් ප්‍රතිස්ථාපනය සඳහා දරන ලද පිරිවැය වත්කමේ ධාරණ අගයට හඳුනාගනු ලබන්නේ එම කොටස හා බැඳුණු අනාගත ආර්ථික ප්‍රතිලාභයන් සමූහය තුළට ලැබීමේ භව්‍යතාවයක් ඇත්නම් සහ එහි පිරිවැය විශ්වසනීය ලෙස මැනිය හැකිනම් පමණි. එදිනෙදා කටයුතු සඳහා දේපළ පිරියත හා උපකරණ මත වන පිරිවැය ආදායම් ප්‍රකාශයේ හඳුනා ගැනේ.

4.5.1.3 ක්ෂය වීම්
සෑම දේපළ, පිරියත හා උපකරණ ප්‍රභේදයක් සඳහාම ඒවායේ ඇස්තමේන්තු කරනු ලබන ඵලදායී ජීව කාලය තුල සරල මාර්ග පදනම මත ක්ෂයවීම් සඳහා ප්‍රතිපාදන සලස්වනු ලැබේ. මෙම ක්‍රමය එම වත්කමේ අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ පරිභෝජනය හා බොහෝ දුරට ගැලපේ. කල්බදු ක්‍රමය යටතේ පවතින දේපළ , පිරියත හා උපකරණ ඒවායේ ආයුකාලය හෝ කල්බදු ගිවිසුමේ කාලය යන දෙකෙන් අඩු කාලසීමාව මත ක්ෂය කරණු ලැබේ. ඉඩම් ක්ෂය වෙන්කිරීමකට භාජනය නොවේ.

තවදුරටත් ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් හා ප්‍රමාණාත්මක ඇළුත්වැඩියා මත වන පිරිවැය ඒවායේ මූලික ගොඩනැගිල්ලේ ඉදිරියට ශේෂව පවතින ආයුකාලය මත ක්ෂය කෙරේ.

දේපළ, පිරියත හා උපකරණ වෙනුවෙන් ඒවා පාවිච්චි කල කාලයට සමානුපාතිකව ක්ෂය සඳහා වෙන් කිරීම් කෙරේ.

වර්තමාන හා සමානරූපී කාලපරිච්ඡේදයන් උදෙසා සමූහයේ දේපළ පිරියත හා උපකරණ මත ඇස්තමේන්තු ගත ඵලදායී ආයු කාලය පහත පරිදි වේ.

නිදහස් අයිතිය ඇති ගොඩනැගිලි	වසර 40 - 60
කාර්යාලීය උපකරණ	වසර 08
ගෘහභාණ්ඩ හා සවිකිරීම්	වසර 08
පරිගණක උපකරණ	වසර 05
මෝටර් වාහන	වසර 04

ක්ෂය වෙන් කිරීමේ ක්‍රමවේදය, ඵලදායී ආයුකාලය සහ වත්කමේ සුන්බුන් අගය සෑම මූල්‍ය වර්ෂයක් අවසනදීම ප්‍රතිතක්සේරු ගත කර අවශ්‍ය නම් ගැලපීම් කරනු ලැබේ.

4.5.1.4 බැහැර කිරීම්

දේපළ, පිරියත හා උපකරණයක් භාවිතා කිරීමෙන් හෝ අපහරණය තුළින් අනාගත ආර්ථික ප්‍රතිලාභයන් ජනනය නොකරන බව පැහැදිලි වූ විට වත්කමක ධාරණ අගය පොත් වලින් ඉවත් කරනු ලැබේ. වත්කම් බැහැර කිරීමෙන් ලැබෙන ලාභය හෝ අලාභය අදාළ අපහරණය සිදුවූ වර්ෂයේ ආදායම් ප්‍රකාශනයේ ඇතුලත් කෙරේ.

4.5.1.5 ඵලදායී ආයුකාලය සහ සුන්බුන් අගය

සුන්බුන් අගය යනුවෙන් හඳුන්වනු ලබන්නේ වාර්තා කරන දිනට එම වත්කම එහි අපේක්ෂිත ආයුකාලය සපුරා විකිණීම සඳහා පවතින තත්ත්වයෙන්ම පවතින බව සැලකූවිට එම වත්කම් සඳහා ආයතනය වෙත ලැබෙන අගයයි.

සුන්බුන් අගය සහ ඵලදායී ආයුකාලය අඩුම වශයෙන් සෑම වාර්තාකරණ දිනකම යලි සලකා බැලෙන අතර, එහි ප්‍රමානාත්මක වෙනසක් වේ නම් එය ගිණුම්කරණ ඇස්තමේන්තු වල සිදුවන වෙනසක් ලෙස සලකා ගිණුම්ගත කෙරේ.

4.5.1.6 නොනිමි ප්‍රාග්ධන වැඩ

නොනිමි ප්‍රාග්ධන වැඩ ඒවායේ පිරිවැයට නිරූපණය කර ඇත. මෙම පිරිවැය ප්‍රාග්ධන ස්වාභාවයක් ගන්නා අතර, ගොඩනැගිලි, විශාල යන්ත්‍ර හා පිරියත ඉදිකිරීමේ සහ ක්‍රම හා පද්ධති සංවර්ධනයේදී දැනටමත් දරා ඇති අනාගතයේදී ප්‍රාග්ධනීකරණය කිරීමට අපේක්ෂිත පිරිවැයන් සේ සැලකේ.

4.5.2 බදු දේපළ - බදු කරු

ප්‍රමාණාත්මක ලෙස අයිතිය සහ බැඳුණු සියලුම අවදානම් සහ ප්‍රතිලාභ සමූහය වෙතැති බදු ගිවිසුම්, මූල්‍ය බදු ලෙස සැලකේ. මූලික හඳුනාගැනීමේදී බදු දේපළ එහි සාධාරණ අගය සහ අවම බදු ගෙවීම් වල වර්තමාන අගය යන දෙකෙහි අවම අගයට ගිණුම්ගත කරන අතර, ඉන් අනතුරුව ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 17 ට (ලං ගි ප්‍ර 17 කල්බදු) අනුකූලව ගිණුම්ගත කෙරේ.

මූල්‍ය කල්බදු හැර අනෙකුත් කල්බදු මෙහෙයුම් කල්බදු ලෙස හැඳින්වේ. සමූහයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ මේවා හඳුනා නොගනී.

4.5.3 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක උපකරණයන්හි මෙහෙයුම් මෘදුකාංග හැර අනෙකුත් පරිගණක යෙදවුම් මෘදුකාංග සහ බලපත්‍ර වල වටිනාකම අස්පෘශ්‍ය වත්කම් ගණයෙහි ලා සැලකේ.

සමූහය විසින් අත්පත් කරගනු ලැබූ අස්පෘශ්‍ය වත්කම් හි අගය එහි පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් සහ හානිකරණයන් අඩුකර දක්වා ඇත.

මූලික හඳුනා ගැනීමෙන් පසුව අස්පෘශ්‍ය වත්කම් උදෙසා දරණු ලබන පිරිවැය මගින් ඒ හා බැඳි අනාගත ආර්ථික ලාභයන්හි වැඩිවීමක් වේ නම් පමණක් එම පිරිවැය ප්‍රාග්ධනීකරණය කරන අතර නොඑසේ නම් එය වියදමක් ලෙස ගිණුම්ගත කරනු ඇත.

ක්‍රමක්ෂය කිරීමේ සරල මාර්ග ක්‍රමය යටතේ එහි අපේක්ෂිත ඵලදායී ආයුකාලය තුල විහිදී යන ආකාරයට හඳුනා ගැනේ. අස්පෘශ්‍ය වත්කම් වල අපේක්ෂිත ඵලදායී ආයුකාලය වනුයේ වසර පහක් හෝ එහි යෝග්‍යතම අපේක්ෂිත ආයුකාලය යන දෙකින් අඩු කාලයයි.

හානිකරණය පිළිබඳව සංඥාවක් ඇති සෑම විටකදීම ක්‍රමක්ෂය නොකල නිශ්චිත ආයු කාලයක් ඇති අස්පෘශ්‍ය වත්කම් හි අගයන් හානිකරණය සඳහා සලකා බලන අතර එය අනාගත ප්‍රතිලාභයන් මගින් පියවාගත නොහැකි බව තහවුරු වන ප්‍රමාණයට ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස හඳුනාගනී.

අස්පෘශ්‍ය වත්කම් මගින් අනාගත ප්‍රතිලාභයන් ජනනය නොවන බව පැහැදිලි වන විට සහ ධාරණ අගය හානිකරණයට ලක්ව ඇති බව තහවුරු වන විට එම වත්කම් පොත් වලින් බැහැර කෙරේ.

බැහැර කිරීම් මගින් වන ලාභ හෝ අලාභ වනුයේ අස්පෘශ්‍ය වත්කම්හි ධාරණ අගය සහ ශුද්ධ විකුණුම් අගය යන දෙකෙහි අන්තරයයි. එය ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් කෙරේ.

4.5.4 මූල්‍ය නොවන වත්කම්හි හානිකරණය

සෑම වාර්තාකරණ දිනකටම අදාලව මූල්‍ය නොවන වත්කම් හි හානිකරණය හා සම්බන්ධ වන සංඥාවන් පිළිබඳව බැංකුව තක්සේරු කරනු ලැබේ. එවන් සංඥාවක් පවතින විටදී හෝ හානිකරණය පිළිබඳව පරීක්ෂාවක් අවශ්‍ය විටකදී එම මූල්‍ය නොවන වත්කම් යලි අයකර ගැනීමේ සක්‍යතාවය පිළිබඳව සලකා බලේ. වත්කම් නැවත අයකර ගත හැකි අගය වනුයේ වත්කමේ සාධාරණ අගය සහ එහි මුදල් ජනනය කරන ඒකකයන්ගේ සාධාරණ අගයෙන් විකුණුම් වියදම් ඉවත් කල පසු අගය යන දෙකෙහි උපරිම අගයයි. වත්කමේ ධාරණ අගය හෝ මුදල් ජනනය කරණ ඒකක වල අගය එහි නැවත අයකර ගැනීමේ අගය ඉවත්වන විට එය හානිකරණයට ලක්වූ ලෙස සලකා වත්කම නැවත අයකර ගත හැකි අගයට ගිණුම් වල ගලපනු ලැබේ.

භාවිතයේ පවතින වටිනාකම ගණනයේදී, වත්කමට බද්ධ වන අවදානම සහ වෙළඳපල තක්සේරුව මත මුදලේ කාලානුරූපී වටිනාකම අර්ථ නිරූපනය කෙරෙන බදු පෙර වට්ටම් අනුපාතය භාවිතයෙන් තක්සේරුගත අනාගත මුදල් ප්‍රවාහ ඒවායේ වර්තමාන අගයට වට්ටම් කරනු ඇත. විකුණුම් පිරිවැය සාධාරණ අගයෙන් අඩුකර තීරණය කිරීමේදී ඒ සඳහා සුදුසු තක්සේරු ආකෘතීන් භාවිතා කෙරේ. මෙම තක්සේරු කරණයන් බහුවිධ තක්සේරු ක්‍රම, පොදු වශයෙන් විකිණෙන පරිපාලිතයන්ගේ ලැයිස්තු ගත කොටස් මිල හෝ අනෙකුත් වටිනාකම් ඇති සාධාරණ මිලක් පෙන්වන සංඥාවක් මගින් තවදුරටත් තහවුරු කෙරේ.

4.6 සේවක ප්‍රතිලාභ

4.6.1 නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුමක් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් යටතේ ආයතනය විසින් වෙනත් වූ පාර්ශවීය ආයතනයකට දක්වන ස්ථාවර දායකත්වයය. මෙම ස්ථිර දායකත්ව අගය හැරුනු විට වැඩිමනත් ගෙවීමක් සඳහා වෙනත් නීතිමය හෝ අනුමිත වගකීමක් නොමැත. වාර්තාකරණ දින අවසනට පෙර කරන ලද සේවය උදෙසා වන විශ්‍රාම වැටුප් අයිතිය වෙනුවෙන් ආයතනය තම වගකීම මත දක්වනු ලබන නිශ්චිත ප්‍රතිලාභ දායකත්වය ආදායම් ප්‍රකාශයේ වාර්තාකරන දිනට අදාලව වියදමක් වශයෙන් හඳුනා ගැනේ. නියමිත දිනට පෙර ගෙවන ලද දායකත්වය එහි මුදල් ප්‍රතිගෙවීමක් හෝ ඉදිරිගෙවීම් වල අඩුවීමක් ලෙස සලකයිනම් එය වත්කමක් ලෙස හඳුනාගැනේ. නිශ්චිත දායකත්ව සැලසුම් සඳහා වන දායකත්වය සේවකයන් වෙත ගෙවීම සිදුවන්නේ වාර්තාකරන දින සිට මාස 12 කට පසු කාල පරාසයකින් නම් එය වාර්තාකරන දිනට වන වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ.

• ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදල

බැංකුවේ සියලුම සේවකයින් ලංකා බැංකුවේ අර්ථසාධක අරමුදලේ සාමාජිකයෝ වෙති. මෙම අරමුදලට, සේවකයාගේ අතිකාල දීමනා එකතු නොකල දළ වැටුපෙන් 12% ක මුදලක් බැංකු විසින් දායක මුදල් වශයෙන් ගෙවනු ලබන අතර, සේවකයින්ගේ දායක මුදල 8% කි. බැංකුවේ අර්ථසාධක අරමුදල අනුමත අරමුදලක් වන අතර, එය ස්වාධීනව පරිපාලනය කෙරේ.

• සේවක අර්ථසාධක අරමුදල

ලංකා බැංකු සේවකයින් හැර සියලුම පරිපාලිතයින් ඔවුන්ගේ සේවකයින් වෙනුවෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා එහි සංශෝධනවලට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල සඳහා 12% (ප්‍රොපර්ටි ඩිවලොප්මන්ට් පී එල් සී-15%) ප්‍රමාණයක් දායක මුදල් ගෙවන අතර සෑම සේවකයකුගෙන්ම සේවක අර්ථසාධක අරමුදල් සඳහා 8% සිට 10% දක්වා මුදලක් අඩු කරගනී.

• සේවක භාරකාර අරමුදල

1980 අංක 46 දරණ සේවක භාරකාර අරමුදල් පනත අනුව, බැංකුව සහ සියලුම පරිපාලිතයින් සේවකයින් සඳහා මෙම අරමුදලට දායක විය යුතු අතර, මාසිකව බැංකුව/සමූහය අතිකාල හැර, දළ වැටුපෙන් 3% ක මුදලක් මේ සඳහා ගෙවනු ලැබේ.

4.6.2 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු නිශ්චිත දායකත්ව සැලසුම් නොවන පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් වේ. නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වෙත සමූහයේ ශුද්ධ වගකීම හෝ බැදීම එක් එක් සැලසුම වෙන් වශයෙන් සලකා එම සේවකයන් විසින් ඔවුන්ගේ වර්තමාන සහ පෙර සේවාවන් උදෙසා උපයාගත් අනාගත ප්‍රතිලාභයන් වර්තමාන අගයට වට්ටම් කර, ඉන් සැලසුම්ගත වත්කම් වල සාධාරණ අගය ඉවත් කල පසු අගයට ගණනය කෙරේ. වට්ටම් අනුපාතය ලෙස සලකනු ලබන්නේ වාර්තාකරණ දිනට දිගුකාලීන භාණ්ඩාගර බැඳුම්කර වල ඉපැයුම් අනුපාතයයි. මෙම ගණනය කිරීම් සුදුසුකම් ලත් ජීවගණකඥයන් විසින් "පුරෝකථනය කළ ඒකක බැර ක්‍රමය" භාවිතයෙන් ගණනය කෙරේ.

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්හි ගණනය කරන ලද, ලාභ හෝ අලාභ සමූහය විසින් විස්තීරණ ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගන්නා අතර, ඊට අදාළ වියදම්, ආදායම් ප්‍රකාශයේ සේවක මණ්ඩල වියදම් යටතේ හඳුනාගනී.

• ලංකා බැංකු විශ්‍රාම වැටුප් භාර අරමුදල

ලංකා බැංකුවේ විශ්‍රාම වැටුප් භාර අරමුදල, අරමුදල් සපයනු ලබන, දායක මුදල් අය නොකරන නිශ්චිත විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි. බැංකුවෙහි අවම වශයෙන් වසර දහයක අඛණ්ඩ සේවා කාලයක් ඇති විශ්‍රාම ගැනීමේ වයස් සීමාව වන වයස අවුරුදු 55 ට ළඟාවීමේදීත් ඉන්පසු විශ්‍රාම ගැනීමේදී හෝ ඊට පෙරාතුව සෞඛ්‍ය හේතු මත විශ්‍රාම ගන්නා වූ බැංකුවේ සේවකයින් සඳහා යාවජීව විශ්‍රාම වැටුපක් ගෙවීම සඳහා මෙම විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලැබේ. විශ්‍රාම වැටුප, සමහර දීමනා අත්හැර සේවකයා විසින් අවසානවරට ලැබූ වැටුපෙහි ප්‍රතිශතයක් මත පදනම් වේ.

විශ්‍රාම වැටුප් භාර අරමුදලට දායක මුදල් යෝග්‍ය ජීවගණකඥයකුගේ උපදෙස් වලට අනුව බැංකුව විසින් මාසිකව ගෙවනු ලබේ. වර්තමානයේ එය දළ වැටුපෙන් 56.76% කි.

මෙම අරමුදල වසරකට වරක් සුදුසුකම් ලත් ජීවගණකඥයන් විසින් අගය කර ඇත.

පරිපාලිතයන් විශ්‍රාම අරමුදල් ක්‍රියාත්මක කරනු නොලැබේ.

• ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදල

ලංකා බැංකුවේ වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි අර්ථලාභීන්ට ගෙවීම් කිරීමට බැංකුව බැඳී සිටින අතර, එම ගෙවීම සහතික කෙරේ. එම අරමුදලට සේවකයින්ගේ දායකත්වය ඔවුන්ගේ දළ වැටුපෙන් 8% ක් වේ. මෙම අරමුදලට අඛණ්ඩව අවුරුදු පහක් තුළ දායක මුදල් ගෙවනු ලැබූ සේවකයෙකු සේවයේ යෙදී සිටියදී මියගියහොත් එම සේවකයාගේ අර්ථලාභීන් වෙනුවෙන් බැංකුවට වගකීමක් ඇති වේ. තවද විශ්‍රාමිකයෙකු මියගිය විටදී ඔහුගේ/ඇයගේ අර්ථලාභීන්ට මාසික වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුපක් ගෙවීමට බැංකුව බැඳී සිටී. සේවයේ යෙදී සිටියදී මියයන සේවකයෙකු වෙනුවෙන් ඔහුගේ /ඇයගේ අර්ථලාභීන්ට හිමිවන විශ්‍රාම වැටුප, සමහර දීමනා අත්හැර ඔහු/ඇය විසින් අවසාන වරට ලැබූ වැටුප මත පදනම් වේ.

වාර්ෂිකව, අරමුදල සුදුසුකම්ලත් ජීව ගණකඥයකු විසින් ජීවගණක තක්සේරුකරණයකට යටත් කෙරෙන අතර ඌණතාවයක් වේ නම් ජීවගණක, භාරකරුවන් සහ ප්‍රතිලාභීන්ගේ උපදේශණයන් මත සම්පූර්ණ කෙරෙනු ඇත.

විශ්‍රාම වැටුප් භාර අරමුදලත්, වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලත් යන අරමුදල් දෙකම රජය විසින් අනුමත කොට ඇති අතර, ඒවා ස්වාධීනව පරිපාලනය කෙරේ.

• පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

දායක මුදල් අය නොකරන බැංකුවට අයත් විශ්‍රාම ප්‍රතිලාභ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වන හෙයින් 1996 ජනවාරි මස 01 දිනට පෙරාතුව බැංකුවේ සේවය සඳහා බැඳුණු සේවකයින් සඳහා 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ ගෙවිය යුතු විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සඳහා මූල්‍ය ප්‍රකාශවල ප්‍රතිපාදන සලස්වා නොමැත. කෙසේවුවද සේවකයින් විශ්‍රාම නොගොස් වෙනත් අයුරකින් ඔවුන්ගේ සේවය නතර කරනු ලැබුව හොත්, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ ඔවුන්ට ආන්තික පාරිතෝෂිකයක් ලැබීමට හිමිකම් ඇත. මෙම පාරිතෝෂිකය ගෙවනු ලබන්නේ අදාළ මුදල් වර්ෂයේ අවසාන මාසයට අදාළවන ජීවන වියදම් දීමනා සහ අනෙකුත් දීමනාද ඇතුළුව සේවකයාගේ මූලික මාසික හෝ ඒකාබද්ධ වැටුපෙන් අඩක් ඒ සේවකයා අඛණ්ඩ සේවය කළ එක් එක් වර්ෂය සඳහා ගණන් බැලීමෙනි. 1996 ජනවාරි 01 දින හෝ ඉන් පසුව බැංකුවේ සේවයට බැඳුණු සියලුම සේවකයින් සඳහා බැංකුවේ විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයෙන් ආවරණය නොවන නිසා, විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය පිළිබඳව සේවකයින්ගේ සේවයෙහි පළමුවන වර්ෂයේ සිටම විශ්‍රාම පාරිතෝෂික ගෙවීම් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ප්‍රතිපාදන සලස්වා තිබේ.

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 19 හි නිර්දේශයන් ප්‍රකාරව ජීවගණක තක්සේරු ක්‍රමය අනුව ගණනය කොට හඳුනාගෙන ඇති අතර ආදායම් ප්‍රකාශයෙහි ඒ සඳහා ප්‍රතිපාදනයන් කර ඇත.

පාරිතෝෂික වගකීම බාහිර අරමුදලකින් ආවරණය නොවේ.

4.7 ප්‍රතිපාදනයන්

අතීත සිද්ධියක ප්‍රතිඵලයක් ලෙස සමූහයට වර්තමානයේ දී නෛතික හෝ සම්මුතික වගකීමක් ඇති වූ විට දී එම වගකීම නිවැරදිව තක්සේරුගත කල හැකිනම් සහ අදාල වගකීම පියවීම සඳහා ආර්ථික ප්‍රතිලාභයන්හි පිටතට ගලා යාමක් සිදුවන බවට අපේක්ෂාවක් වේ නම් ඒ සඳහා ප්‍රතිපාදනයන් වෙන් කෙරේ. මුදලේ කාල අගයෙහි ප්‍රමානාත්මක බලපෑමක් තිබේනම් අනාගතයේදී සමූහයෙන් පිටතට ගලායාමට නියමිත මුදල් ප්‍රවාහයන් වර්තමාන පෙර බදු අනුපාතිකය යොදා ගනිමින් වර්තමාන අගයට වට්ටම් කරනු ලැබේ. මෙම අනුපාතිකය යොදා ගැනීම තුළින් කාල අගයෙහි වෙනස්වීම පිළිබඳව වර්තමාන වෙළඳපල තත්ත්වයන් හි බලපෑම සහ වගකීම හා බැඳි අවදානම් සැලකිල්ලට ගනු ලැබේ.

4. 8 මූල්‍ය ඇපකර

සාමාන්‍යයෙන් එදිනෙදා සිදුවන ගණුදෙනු වලදී සමූහය විසින් ණයවර ලිපි, ඇපකර සහ ප්‍රතිග්‍රහණ වැනි මූල්‍ය ඇපකරයන් එහි ධාරණ අගය මත මූල්‍ය වාර්තාවල හඳුනාගැනෙන අතර, ඉන් අනතුරුව සමූහය විසින් සෑම ඇපකරණයක්ම එහි මූලික හඳුනාගත් අගයෙන් ආදායම් ප්‍රකාශය තුළට ගැලපූ සමුච්චිත ක්‍රමක්ෂය අඩුකල පසු අගය සහ මූල්‍ය වගකීම පියවීම සඳහා වන ඇස්තමේන්තු ගත වියදම් යන අගයන් දෙකෙන් වැඩි අගයට හඳුනාගනී.

මූල්‍ය ඇපකරණ මත වන වගකීමෙහි යම් වැඩිවීමක් වේනම් එය ආදායම් ප්‍රකාශයෙහි "හානිකරණ අලාභයක්" ලෙස වාර්තා කෙරේ. වාර්ෂික ලැබීම් ආදායම් ප්‍රකාශයෙහි "ගාස්තු හා කොමිස් ආදායම" යටතේ සරල මාර්ග ක්‍රමයට අනුව ඇපකරයේ ආයුකාලය මත හඳුනාගැනේ.

4.9 ආදායම් සහ වියදම් හඳුනා ගැනීම

4.9.1 පොළිය

සුළු පොළී අනුපාතය උපයෝගී කර ගනිමින් පොළී ආදායම් සහ පොළී වියදම් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනී. සුළු පොළී අනුපාතිකය යනු වත්කමෙහි හෝ වගකීමෙහි ඇස්තමේන්තු ගත අනාගත ගෙවීම් සහ ලැබීම්, එහි අපේක්ෂිත ආයු කාලය තුළ වට්ටම් කල විට එම වත්කමෙහි හෝ වගකීමෙහි ධාරණ අගයට සමාන අගය ලබාදෙන අනුපාතිකයයි. සමූහය විසින් සුළු පොළී අනුපාතිකය ගණනය කිරීමේදී මූලය උපකරණයන්හි ගිවිසුම් ගත සියලු කොන්දේසි සැලකිල්ලට ගනිමින් අනාගත ණය අලාභයන් හැර සියලු අනාගත මුදල් ප්‍රවාහයන් තක්සේරු කෙරේ.

සුළු පොළී අනුපාතිකයෙහි අවශ්‍යම කොටසක් වන, ලද සහ ගෙවනු ලැබූ ගාස්තු එම අනුපාතිකය ගණනය කිරීමේදී සැලකිල්ලට ගනු ලබන අතර, ගනුදෙනු පිරිවැය ලෙස සැලකෙන්නේ මූලිකවම වත්කමක් හෝ වගකීමක් අත්පත්කර ගැනීමේදී හෝ නිකුත් කිරීමේදී දරණ වර්ධනය වන පිරිවැයයි.

ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් පොළී ආදායම සහ පොළී වියදම වනුයේ:

- සඵල පොළී අනුපාතිකය මත වන ක්‍රමක්ෂය යටතේ ගිණුම්ගත කෙරෙන මූලය වත්කම් සහ වගකීම්හි පොළිය

- සඵල පොළී අනුපාතිකය මත ගණනය කෙරෙන විකිණීම සඳහා වන ආයෝජන සුරැකුම් මත වන පොළිය

වෙළඳ වත්කම් සහ වගකීම් මත වන පොළී ආදායම සහ වියදම සමුහයේ වෙළඳ කටයුතු වලින් ආගන්තුකව හඳුනා ගැනෙන අතර එය වෙළඳ ආදායම යටතේ වෙළඳ වත්කම් හා වගකීම් වල සාධාරණ අගයෙහි වන වෙනස්කම් ලෙස ගිණුම් තැබේ.

අවදානම් කළමණාකරණ උපායමාර්ගයක් ලෙස රඳවා තබා ගන්නා ව්‍යුත්පන්න උපකරණයන්හි සාධාරණ අගයන්හි සිදුවන වෙනස්කම් සහ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල මූල්‍ය වත්කම් හි සාධාරණ අගයෙහි සිදුවන වෙනස්කම් විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල මූල්‍ය උපකරණ මත ශුද්ධ ආදායම යටතේ සටහන් කෙරේ.

4.9.2 ගාස්තු සහ කොමිස්

සමූහය විසින් තම සේවා දායකයන් වෙත සපයනු ලබන විවිධාකාර වූ සේවාවන් මත ගාස්තු සහ කොමිස් ආදායම උපයා ගනී.

ගාස්තු ආදායම පහත සඳහන් පරිදි වර්ග දෙකකි.

• නිශ්චිත කාල පරාසයක් තුලදී සපයනු ලබන සේවාවන් මත උපයන ගාස්තු ආදායම

කොමිස් ආදායම, වත්කම් කළමනාකරණ ගාස්තු, ආරක්ෂණ සහ වෙනත් කළමනාකරණ ගාස්තු සහ උපදේශන ගාස්තු ආදී යම් කාල පරාසයක් තුල සේවා සැපයීම මත උපයන ගාස්තු ආදායම එම කාල පරාසය තුළ උපචිත කරනු ලැබේ.

ණය සහ සම්බන්ධ ගාස්තු විලම්බනය කෙරෙන අතර එය සඵල පොළී අනුපාතිකයට වන ගැලපුමක් ලෙස හඳුනා ගනී.

• ගනුදෙනු සේවාවන් සැපයීම මත වන ගාස්තු ආදායම

කොටස් හෝ සුරැකුම් අත්පත් කර ගැනීම, ව්‍යාපාර මිලට ගැනීම සහ විකිණීම වැනි ක්‍රියාවලීන් සඳහා තෙවන පාර්ශවයක් වෙනුවෙන් සිදු කෙරෙන කතිකාවන් හෝ ගනුදෙනු මත වන ගාස්තු ආදායම එම අදාල කාර්යය අවසානයට පැමිණීමත් සමඟම හඳුනා ගැනේ. තවද, යම් කොටසක් සඳහාම වෙන්වූ ගාස්තු ආදායමක් වේ නම් එම අදාල කාර්යය හෝ කොන්දේසි සියල්ල සම්පූර්ණ වීමත් සමඟම එම කොටසට පමණක් අදාල වන ගාස්තු ආදායම හඳුනාගනේ.

4.9.3 ශුද්ධ වෙළඳ ආදායම

වෙළඳ වත්කම් හා වගකීම් වලට අදාල වන ලාභ හෝ අලාභ එහි සාධාරණ අගයෙහි වන වෙනස්කම්, පොළිය, ලාභාංශ සහ විදේශීය විනිමය වෙනස්කම් ශුද්ධ වෙළඳ ආදායම් යටතට ගැනේ.

4.9.4 ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල වෙනත් මූල්‍ය උපකරණ මත වන ශුද්ධ ආදායම්

ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගයට නම් කල වෙනත් මූල්‍ය උපකරණ මත වන ශුද්ධ ආදායම් යටතට ගැනෙන්නේ හෙජින් ගිවිසුම් වල කොටස් නොවන අවදානම් කලමනාකරණය උදෙසා දරා සිටින, වෙළඳ නොවන ව්‍යුත්පන්න උපකරන මගින් වන සියළු උපලබ්ධිත සහ උපලබ්ධිත නොවන සාධාරණ අගයෙහි වෙනස්කම්, පොළිය, ලාභාංශ සහ විදේශ විනිමය වෙනස්කම්ය.

4.9.5 ලාභාංශ

ලාභාංශ ආදායම හඳුනාගනු ලබන්නේ එම ගෙවීම ලැබීමේ අයිතිය තහවුරු කිරීමෙන් අනතුරුවයි.

4.9.6 කුලී ආදායම

කුලී ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

4.9.7 වෙනත් ආදායම්

වෙනත් ආදායම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ.

4.9.8 කල්බදු ගෙවීම්

මෙහෙයුම් කල්බදු යටතේ කරන ගෙවීම් කල්බදු ගිවිසුම් කාලසීමාව තුල සරල මාර්ග ක්‍රමය යටතේ හඳුනා ගැනේ. යම් දිරිගැන්වීමක් හෝ වරප්‍රසාදයක් සඳහා වන ලැබීමක් වෙතොත් එය කල්බදු ගිවිසුම් වියදමට ගලපා හඳුනාගනේ.

මූල්‍ය කල්බදු යටතේ වන අවම කල්බදු ගෙවීමක් වේනම් එය මූල්‍ය වියදම් සහ ගෙවිය යුතු වගකීම අතර විභජනය කෙරේ. ශේෂවන වගකීම මත ස්ථාවර පොළී අනුපාතයක් අයවන සේ මූල්‍ය වියදම් කල්බදු ගිවිසුමේ සෑම කාලපරිච්ඡේදයක් සඳහාම සටහන් කරනු ඇත.

කල්බදු ගිවිසුමේ යම් ගැලපීමක් තහවුරු වූ පසු එය අවම කල්බදු ගෙවීම ප්‍රතිශෝධනය කරමින් අසම්භාව්‍ය කල්බදු ගෙවීම ගිණුම් ගත කෙරේ.

4.9.9 අනෙකුත් වියදම්

අනෙකුත් සියලුම වියදම් ඒවා අදාල කාලය මත දැරූ විට ගිණුම් ගත කර ඇත. සියලුම ව්‍යාපාරික මෙහෙයුම් වලට අදාල වියදම් සහ ප්‍රාග්ධන වත්කම් ඒවායේ නියමිත කාර්යක්ෂමතාවයෙන් පවත්වාගෙනයාම සඳහා දරණ ලද නඩත්තු වියදම් සමුහයේ ලාභය ගණනයේදී ආදායමට එරෙහිව සටහන් කර ඇත.

4.10 ආදායම් බදු වියදම

4.10.1 ප්‍රවර්තන බදු සහ විලම්බිත බදු

ආදායම් බදු ප්‍රවර්තන සහ විලම්බිත බදු යන කොටස් දෙකකින් සමන්විත වේ. සෘජුවම ස්කන්ධ ප්‍රකාශය තුල හෝ විස්තීරණ ආදායම් ප්‍රකාශය තුල හඳුනාගැනෙන අයිතම හැර අනෙකුත් අයිතමයන්ට අදාල, වන ප්‍රවර්තන සහ විලම්බිත බදු, ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනේ.

ප්‍රවර්තන බදු ලෙස හඳුන්වනුයේ වාර්තාකරණ දිනට පවතින බදු අනුපාතය යොදා ගනිමින් වර්ෂය සඳහා බදු අයකල හැකි ආදායම හෝ පාඩුව මත ගණනය කරන ලද බදු ගෙවීම හෝ ලැබීමයි. තවද පෙර වර්ෂයන් හි බදු ගෙවීම් සඳහා යම් ගැලපීමක් වේ නම් එයද සැලකිල්ලට භාජනය කෙරේ.

වත්කම් සහ වගකීම් වල මූල්‍ය ප්‍රකාශනයන්හි දක්වනු ලබන ධාරණ අගය සහ ඒවා බදු පදනම උදෙසා දක්වනු ලබන අගය අතර තාවකාලික වෙනස්කම් පවතිනවිට, එම වෙනසට අදාලව විලම්බිත බදු ගණනය කරනු ලැබේ.

පහත සඳහන් වන තාවකාලික වෙනස්කම් මත විලම්බිත බදු හඳුනා නොගනී.

- මුල් හඳුනාගැනීමේ දී ඇතිවන කීර්තිනාමය

- ගිණුම්කරණ හා බදු ලාභ කෙරෙහි බලපෑමක් නොමැති ව්‍යාපාර ඒකාබද්දකරණයේ දී හැර හඳුනා ගැනෙන වත්කම් හෝ වගකීම්

- නුදුරු අනාගතයේදී ප්‍රතිවර්තනය නොවන බවට තහවුරු වන, පරිපාලිත සමාගම් හි සිදුකර ඇති ආයෝජනයන්හි සිදුවන වෙනස්කම්

විලම්බිත බදු ගණනයේදී වර්තාකරණ දිනට බලපැවැත්වෙන බදු නීතිය අනුව ප්‍රකාශිත අනුපාතය භාවිතා කෙරෙන අතර තාවකාලික වෙනස්කම ප්‍රතිවර්තනය කිරීම සඳහා ද එම අනුපාතය ම භාවිතා කෙරේ. ප්‍රවර්තන බදු වගකීම් ප්‍රවර්ත බදු වත්කමකට එරෙහිව කාපහැරීමට නෛතිකමය අවසරය සහ අයිතිය පවතින විටක දී පමණක් ඊට අනුරූපි වන විලම්බිත බදු වගකීම් සහ වත්කම් එකිනෙක හිලව් කරනු ඇත. තවදුරටත් එම ප්‍රවර්ත බදු වගකීම සහ වත්කම එකම ආයතනයකට අදාලව හෝ බදු වගකීම සහ වත්කම හිලව් කර පියවීමට අදහස් කරන වෙන් වශයෙන් වූ ආයතනයන්ට අදාලව හෝ එකම බදු අධිකාරියක් විසින් ආදායම් මත පනවනු ලැබුවක් විය යුතුය.

ආනාගතයේ දී බදු ලාභයක් මගින් පියවා ගත හැකි බවට විශ්වාසනීයත්වයක් ඇති විට පමණක් එම අපේක්ෂිත බදු ලාභයේ ප්‍රමාණය තෙක් භාවිතා නොකල බදු අලාභයක්, බදු බැර අගයන් සහ අඩුකල නොහැකි තාවකාලික වෙනස්කම් මත ප්‍රවර්තන බදු වත්කම හඳුනාගනී. සෑම වාර්තාකරණ දිනයකදීම විලම්බිත බදු වත්කම විශ්ලේෂණයකට ලක්කර එය අනාගතයේදී බදු ප්‍රතිලාභයක් ලෙස නිශ්කාශණය නොවන බව හැගීයන ප්‍රමාණය මත වගකීම ගලපනු ලැබේ.

4.10.2 මූල්‍ය සේවා මත එකතු කළ අගය මත බද්ද

එකතු කල අගය මත බද්ද සඳහා පදනම වන්නේ සේවකයින්ගේ පාරිශ්‍රමික ගෙවීම්, ගිණුම්කරණ බදු පෙර ලාභය සමූහනය කිරීම මගින් ලබාගත් අගය ක්ෂය ගණනය සඳහා නියමකල අනුපාතිකයන් ප්‍රකාරව ගැලපීමයි.

2002 අංක 14 දරණ එකතු කළ අගය මත බදු පනතෙහි අංක 25(අ) වගන්තිය හා ආනුෂාංගික සංශෝධන අනුව වර්ෂය සඳහා බැංකුවේ මුළු එකතු කළ අගය 12% (2011 දී 12%) ක එකතු කළ අගය මත බද්දකට යටත් විය. පනත මගින් හඳුන්වා දී ඇති ගණනය කිරීමේ ක්‍රම දෙකින් එකක් වන ''වටිනාකම ආරෝපිත ක්‍රමය''යටතේ මූල්‍ය සේවා මත එකතු කල අගය මත බදු ගණනය කෙරේ.

4.10.3 ලාභාංශ මත රඳවා ගත් බදු

බැංකුව එහි එකම කොටස් කරුවා වන ශ්‍රී ලංකා රජයට ලාභාංශ බෙදා හැර ඇති බැවින් බැංකුව විසින් කිසිදු ලාභාංශයක් මත බද්දක් ගෙවා නොමැත.

• පරිපාලිතයන් හා ආශිතයන්ට බෙදාහල ලාභාංශ මත රඳවාගත් බදු

පරිපාලිතයන් සහ ආශිතයන්හි බදු වන ලාභයෙන් බෙදා හරින ලද ලාභාංශ සඳහා ප්‍රභවයේදී, 10% ක ලාභාංශ බද්දක් අඩු කරගන්නා අතර මෙය බැංකුවේ බදු බැරකම් ගණනය කිරීමේදී එයට එරෙහිව අඩු කරගත නොහැකිය. එම නිසා ප්‍රභවයේදී අඩුකරගන්නාලද රඳවාගත් බද්ද, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී ඒකාබද්ධකරණය ගැලපුමක් සේ බදු වියදමට එකතු කරගනු ලැබේ.

4.11 ප්‍රකාශිත ප්‍රාග්ධනය සහ සංචිත

සමූහය විසින් ප්‍රාග්ධන උපකරණයන් ඒවායේ ගිවිසුම් ගත කොන්දේසි වල භාවාර්ථය මත මූල්‍ය වගකීම් හෝ ස්කන්ධ උපකරණයන් ලෙස වර්ගීකරණය කෙරේ. ඒ අනුව ඒවා ස්කන්ධයෙහි කොටසක් ලෙස නිරූපණය කරනු ඇත.

4.12 කොටසක ඉපැයුම

සමූහය විසින්, එහි කොටසක මූලික ඉපැයුම් සහ ගලපන ලද ඉපැයුම් ගණනයේදී සාමාන්‍ය කොටස් ප්‍රමාණය සැලකිල්ලට ගනු ලැබේ. කොටසක මූලික ඉපැයුම් ගණනය කරනු ලබන්නේ බැංකුවේ සාමාන්‍ය කොටස් හිමියන්ට අයත් ශුද්ධ ලාභය හෝ අලාභය වර්ෂය සඳහා නිකුත් කර ඇති බර තැබූ සාමාන්‍ය කොටස් ගණනින් බෙදීමෙනි. ගලපන ලද කොටසක ඉපැයුම් ගණනයේදී සාමාන්‍ය කොටස් හිමියන්ට අදාල ශුද්ධ ලාභය හෝ අලාභය සහ නිකුත් කර ඇති බර තැබූ සාමාන්‍ය කොටස් යන අගයන් දෙකම සේවකයන් සඳහා පිරිනමා ඇති කොටස් විකල්පයන් ද ඇතුළුව සියලුම තත්විකරණයන් උදෙසා ගැලපීමට ලක්කරනු ලැබේ.

4.13 බණ්ඩ පදනම මත මූල්‍ය තොරතුරු වාර්තාකරණය

මෙහෙයුම් බණ්ඩයක් ලෙස සලකනු ලබන්නේ සමූහයේ වෙනත් කොටස් සමඟ සිදුකෙරෙන ගනුදෙනු ද ඇතුලුව ආදායම් ඉපයීම් සහ වියදම් දැරීම් සිදුකරමින් ව්‍යාපාර වල නියැලෙන සමූහයේම කොටසක් ලෙස සැලකෙන ආයතනීය බණ්ඩයකි.

සමූහයේ ප්‍රධාන ව්‍යාපාර බණ්ඩයන් වනුයේ සිල්ලර බැංකු කටයුතු, ආයතනික බැංකු කටයුතු, ජ්‍යාන්තර, භාණ්ඩාර සහ ආයෝජන, ශ්‍රී ලංකා රජය, අනෙකුත් බැංකු නොවන සහ සමූහයේ කටයුතු. ශ්‍රී ලංකා රජය සමූහයේ ප්‍රධාන ගනුදෙනුකරුවෙකු ලෙස සැලකෙන අතර එය වෙනත් බණ්ඩයක් ලෙස වාර්තා කෙරේ.

4.14 වාර්තාකරණ දිනට පසු සිදු වූ සිද්ධීන්

ලං ගි ප්‍ර අංක 10 - වාර්තාකරණ දිනට පසු සිදු වන සිද්ධීන්ට අනුකූලව, වාර්තාකරණ දිනයෙන් පසු සිදු වූ සියලුම ප්‍රමාණවත් සිද්ධීන් සැලකීමට භාජනය කර, ඒවායේ අදාළභාවය අනුව මූල්‍ය ප්‍රකාශවල ගැලපීම් හෝ අනාවරණය කිරීම් සිදුකර ඇත.

5.1 රක්ෂණ ව්‍යාපාරය

5.1.1 ප්‍රතිරක්ෂණය

මෙමගින් සමූහය සිය සියලු සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සහ බැදී රක්ෂණ අවදානම පැවරීමකට ලක්කරන අතර ප්‍රතිරක්ෂණ වත්කම මගින් ප්‍රතිරක්ෂණ සමාගම් වෙතින් ලැබිය යුතු ශේෂයන් නිරූපණය වේ. ප්‍රතිරක්ෂණය මගින් ලැබිය යුතු ප්‍රමාණ්‍ය තීරණයේ දී ප්‍රතිරක්ෂණ ගිවිසුම් සහ බැදී හිමිකම් පැමි සඳහා වන ප්‍රතිපාදන සහ ගෙවා නිමකල හිමිකම් සැලකිල්ලට භාජනය කරනු ඇත.

වාර්තාකරණ වර්ෂය තුල සංඥාවක් ලද විට හෝ වාර්තාකරණ දිනයේදී හෝ ප්‍රතිරක්ෂණ වත්කම් වල හානිකරණය පිළිබඳව සමාලෝචනය කට ලක්කරනු ලැබේ. ප්‍රතිරක්ෂණ වත්කමෙහි මූලික හදුනාගැනිමෙන් අනතුරුව සිදුවන ලද යම් සිද්ධියක ප්‍රතිඵලයක් වශයෙන් ප්‍රතිරක්ෂණය මගින් ලැබිය යතු මුදල් නොලැබී යාමේ විෂය බද්ධ ගත සාක්ෂියක් සපයනු ලබන විට හානිකරණයක් සිදුව ඇති බවට නිගමනය කෙරේ. එය ආදායම් ප්‍රකාශයෙහි සටහන් තැබේ.

යෝග්‍යවන අවස්ථාවන්හිදී සමූහය විසින් ජීවිත සහ ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් සඳහාද සාමාන්‍ය ව්‍යාපාරික අවස්ථා යටතේ ප්‍රතිරක්ෂණ අවදානම සලකනු ලැබේ. ප්‍රතිරක්ෂණ ව්‍යාපාරයේ නිෂ්පාදන වර්ගිකරණය සැලකිල්ලට ගෙන එය සෘජු ව්‍යාපාරයක් ලෙස සලකා කටයුතු කල හැකි ආකාරයට ප්‍රතිරක්ෂණ වාරික ලැබීම් සහ හිමිකම් පැමි මත ගෙවීම් ආදායම් සහ වියදම් ලෙස හදුනාගනී.

පවරා දෙන සහ භාරගන්නා යන දෙයාකාර වූ ප්‍රතිරක්ෂණයන් හිදී, වාරික සහ හිමිකම්පෑම් දළ පදනම මත නිරූපණය වේ.

ගිවිසුම් ගත අයිතිය නිමවූ පසු හෝ වෙනත් පාර්ශවයකට පැවරූ පසු ප්‍රතිරක්ෂණ වත්කම හෝ වගකීම බැහැර කිරීම සිදුවේ.

5.1.2 ලැබිය යුතු රක්ෂණයන්

ලැබිය යුතු රක්ෂණයන් ඒවා උපචිත වූ විට හඳුනාගැනෙන අතර මූලික හදුනා ගැනිමේදී ලැබුණු හෝ ලැබිය යුතු ප්‍රතිඳ්ධාවේ සාධාරණ අගය මත ගිණුම් ගත කෙරේ. ධාරණ අගය ගත නොහැකි බවට යම් සිද්ධියක් හෝ අවස්ථාවක් සංඥාවන් සපයන විටදී ලැබිය යුතු රක්ෂණයන් හි ධාරණ අගයෙහි හානිකරණය පිළිබඳව සලකා බැලේ. එසේ හානිකරණ අලාභයක් වේනම් එය ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගනී.

5.2 විලම්බිත වියදම්

5.2.1 විලම්බනය කල අත්පත් කර ගැනිමේ පිරිවැය

නව රක්ෂණ ඔප්පුවක් හා සම්බන්ධවන හෝ අභිමතානුසාර් සහභාගීත්ව ලක්ෂණ ඇති ආයෝජන ගිවිසුමක් හෝ සම්බන්ධ වන කොමිස්, ප්‍රතිරක්ෂණ ගාස්තු, අලෙවිකරන වියදම්, ගිවිසුම් නිකුත් කිරීමේ වියදම් ආදී පිරිවැය අනාගත වාරික මගින් පියවා ගත හැකි ප්‍රමාණයට විලම්බනය කරනු ලැබේ. අනෙකුත් සියලු ආරම්භක අත්පත් කර ගැනිමේ පිරිවැය ඒවා දැරූ විට වියදමක් ලෙස හදුනාගනී. මූලික හඳුනාගැනිමෙන් පසුව, උපයානොගත් වාරිකයන් ක්‍රමක්ෂය කිරීමේ පදනමෙහි කාලපරිච්ඡේදය හා සමගාමීව විලම්බනය කල අත්පත් කර ගැනිමේ පිරිවැය ද ක්‍රමක්ෂය කරනු ලැබේ.

අපේක්ෂිත ඵලදායි ආයුකාලයේ හෝ වත්කම සහ බැදුනු අනාගත ප්‍රතිලාභයන් පරිභෝජන රටාවේ අපේක්ෂිත වෙනස්කම් එම වත්කමේ ක්‍රමක්ෂය කාලපරිච්ඡේදයෙහි සිදුකරනු ලබන වෙනස් කිරීම මගින් ගිණුම් ගත කරනු ඇත. එය ගිණුම්කරණ ඇස්තමේන්තු වල සිදුවන වෙනසක් ලෙස සැලකේ.

අදාල ගිවිසුම් අවසන් වූ පසු හෝ අවලංගු වූ පසු විලම්බනය කල අත්පත් කර ගැනිමේ පිරිවැය බැහැර කිරීම සිදුවේ.

5.3 ප්‍රතිරක්ෂණ කොමිස

පිටස්තර ප්‍රතිරක්ෂණ ගිවිසුම මත ලැබිය යුතු කොමිස් විලම්බනය කර ක්‍රමක්ෂය කරනු ලැබේ.

5.4 රක්ෂණ ගිවිසුම් මත වන වගකීම්

5.4.1 ජීවිත රක්ෂණ ගිවිසුම් මත වන වගකීම්

ගිවිසුම් වෙත චලඹ වාරික ලැබීමත් සමඟම ජීවිත රක්ෂණ ගිවිසුම් ශුද්ධ වාරික ක්‍රමය යටතේ වගකීමක් ලෙස හදුනා ගැනේ. අනාගත අපේක්ෂිත ප්‍රතිලාභයන්, හිමිකම් පෑමේ හා ඔප්පු කළමණාකරණයන්හි වියදම් , ඔප්පු හිමියන්ගේ විකල්ප අවස්ථා සහ ඇපවීම් යන වටිනාකම්හි වට්ටම් කල අගයෙන් ආනගත මුදල් ප්‍රවාහයන් ගේ පිටතට ගලායාම් පියවීම සඳහා අවශ්‍යවන අපේක්ෂිත සෙද්ධාන්තික වාරිකයන් හි වට්ටම් කල අගය අඩුකල පසු ලැබෙන ශේෂය වගකීම ලෙස සැලකේ.

වගකීම් වර්තාකිරිමේදී වර්තමානයේ වන උපකල්පනයන් හෝ ගිවිසුම ආරම්භයේදී වූ උපකල්පනයන් යොදා ගැනෙන අතර අවදානම හෝ හානිකර අපගමනයන් උදෙසා යම් ගැලපීමක් කෙරේ.

ජීවිත රක්ෂණයේදී දීර්ඝායුෂ සාධකය සඳහා වෙනම වූ සංචිතයක් පිහිටුවනු ලබන අතර එය වගකීමක් ලෙස විදහා දැක්වේ. තවදුරටත් ජීවිත රක්ෂණය සම්බන්ධයෙන් වන වගකීම් සඳහා දැනට උපයානොගත් වාරික සහ බලාපොරොත්තු නොවූ අවදානම්, ගෙවීමට ඇති ඉදිරිපත් කල සහ ඇස්තමේන්තු ගත හිමිකම් පෑම් වෙනුවෙන් වූ ප්‍රතිපාදනයන්ද ඇතුලත් වේ. සෑම වාර්තාකරණ දිනකදීම වගකීම සඳහා වන ගැලපිම් ආදායම් ප්‍රකාශයෙහි ඇතුලත් කෙරේ. අතිරික්ත ගිවිසුම්

හානිකර වෙනස්කම් මත අයවන අතර ප්‍රමාණයන් මගින් ජනනය වන ලාභයන් එම ගිවිසුමේ ආයු කාලය පුරා ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගැනේ. මෙම ගිවිසුම මත යම් අලාභයක් වේ නම්, එය සම්පූර්ණයෙන්ම අතිරික්ත ගිවිසුමෙහි පළමු වර්ෂය තුලදී ආදායම් ප්‍රකාශයට ගැනෙන අතර ගිවිසුම කල්පිරි පසු හෝ අවලංගු වූ පසු ගිණුම් වලින් බැහැර කෙරේ.

පවත්නා වගකීම් ප්‍රමාණාත්මතාවය මැනිමේ පරීක්ෂණය මගින් සැම වාර්තකරණ දිනකටම හඳුනාගත් ජීවිත රක්ෂණ වගකීමෙහි ප්‍රමාණාත්මතාවය පිලිබඳව තක්සේරුවක් කරනු ඇත. ඒ මත තවදුරටත් ප්‍රතිලාභයන් සහ වියදම් දැරීමට පවතින නොහැකියාව මත වගකීමෙහි වටිනාකම සඳහා ගැලපීමක් සිදුකෙරේ. ප්‍රමාණාත්මතා පරීක්ෂණයේදී අනාගත මුදල් ප්‍රවාහ පිළිබඳව වර්තමාන සුදුසුකම තක්සේරුව, සිදුකෙරේ. මෙහිදී වට්ටම් කල මුදල් ප්‍රවාහ ආකෘතිය විකල්ප මිල ආකෘතිය සහ අනුමානික ආකෘතිය වැනි ආකෘතින් අනුගමනය කරනු ලැබේ. වට්ටම් වල මුදල් ප්‍රවාහනයන් භාවිතයේ දී ඒ සඳහා භාවිතා කරන පොළී අනුපාතය කලමනාකරණයේ වර්තමාන වෙළඳපල පොළී අනුපාතය කෙරෙහි පවතින විවක්ෂණ අපේක්ෂාවන් මත තීරණය වේ. යම් අවප්‍රමාණයක් වේ නම්, එය වර්තමාන අගයෙහි පොළී සාධකය සහ විලම්බනය කල අත්පත් කර ගැනිමේ පිරිවැය හානිකරණයට ලක්කර ආදායම් ප්‍රකාශයේ සටහන් කරන අතර ශේෂවන අලාභයන් ශිල්පිය සංචිතයක් ස්ථාපනය කිරීමෙන් පසු කාලීනව ආදායම් ප්‍රකාශයෙහි හඳුනා ගැනේ.

5.4.2 ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් මත වන වගකීම්

ජීවිත නොවන රක්ෂණ ගිවිසුම් වල වගකීම් හඳුනාගනු ලබන්නේ අදාල ගිවිසුමට ඇතුලත් ව වාරික අයකරගැනීම සිදුකල විටදීය. වාර්තාකරණ දිනට ගෙවිය යුතු හිමිකම් පෑම් හි ඇස්තමේන්තු ගත අවසාන පිරිවැය සටහන් කල හෝ නොකල හිමිකම් පෑම් වෙනුවෙන් වන කලමනාකරණ ගාස්තු හා වියදම් වලින් යම් ප්‍රතිගෙවීමක් හෝ ශේෂවූ ද්‍රව්‍ය මගින් පියවා ගැනීමක් වේ නම් එය අඩුකර ලැබෙන අගයට සිදුකරන ප්‍රතිපාදන මේ යටතේ වන වගකීම් ලෙස සටහන් කරනු ඇත. යම් හිමිකම් පෑම් සම්බන්දයෙන් දැනුම් දීම් සහ තක්සේරුකිරීම් වල සිදුවන ප්‍රායෝගික ප්‍රමාදවීම් මත වාර්තාකරණ දිනවන විට එම හිමිකම් පෑමෙහි වටිනාකම නිශ්චිතවම තහවුරු වී නොතිබීමට පුළුවන. එබැවින් වාර්තාකරණ දිනට වන වගකීම ප්‍රත්‍යක්ෂ මූලික දත්ත සහ අවදානම් වෙනසට ගැලපුම් ද සැලකිල්ලට ගෙන සකස් කරන ලද ආයුගණක හිමිකම්පෑමේ ප්‍රක්ෂේපන ක්‍රමය මගින් තීරණය කෙරේ. වගකීම් මුදලේ කාල අගයට ගැලපීමක් නොකරන අතර සමතකරණයෙන් සහ විපත්තීන් සඳහා ද ප්‍රතිපාදන වෙන් නොකෙරේ. ගිවිසුම අවසන්වීම මත හෝ කල්පිරීම මත හෝ අවලංගු වීම මත ඒ හා බැදි වගකීම ගිණුම් වලින් බැහැර කෙරේ.

තවදුරටත් මෙම ගණනය කිරීම් සඳහා අනාගත මුදල් ප්‍රවාහයන් ජීවිත රක්ෂණ නොවන ගිවිසුම් වලට අදාලව ඇති වත්කම් මත උපයා ගිවිසුම් ගත අනාගත මුදල් ප්‍රවාහයන් හි ඇස්තමේන්තු ගත අගය ද සැලකිල්ලට ගැනේ.

උපයා නොගත් වාරික සඳහා වන ප්‍රතිපාදනයන් මගින් මෙතෙක් අවදානම උදෙසා වන බැදීමෙහි කාලය ඉක්මනොවු ගිවිසුම් මත ලද වාරික නිරූපණය සාමාන්‍යයෙන් සංචිතය ගිවිසුමේ කොන්දේසි මත නිදහස් කෙරෙන අතර එය වාරික ආදායම ලෙස හඳුනාගනී. සෑම වාර්තාකරණ දිනයකටම සමූහය එහි කල්ඉකුත් නොවූ ගිවිසුම් වල අවදානම් මත වන වගකීම පිළිබඳ පරීක්ෂාවට ලක්කරයි. මෙහිදී උපයානොගත් වාරිකවල ධාරන අගයෙහි ඇස්තමේනතු ගත අගය ප්‍රමාණාත්මක නොවන බව පෙනීයයි නම් වගකීම් වල ප්‍රමාණාත්මකතාවය සඳහා වන ප්‍රතිපාදනයන් වැඩි කරමින් එම වෙනස ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ.

5.5 ආයෝජන ගිවිසුම් වගකීම්

ආයෝජන ගිවිසුම් ලෙස අභිමතානුසාරී සහභාගීත්ව ලක්ෂණ (අ ස ල) සහිත හා රහිත ගිවිසුම් අතර වර්ගීකරණය කරයි. අ ස ල සහිත ආයෝජන ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිත්තීන් ජීවිත රක්ෂණ ගිවිසුම් වගකීම් සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා සමාන වේ.

අ ස ල රහිත ආයෝජන ගිවිසුම් වගකීම් හඳුනා ගනු ලබන්නේ ගිවිසුමට ඇතුලත් වූ පසු සහ වාරිකය අය කිරීමෙන් පසුවය. මෙම වගකීම් මූලිකවම සාධාරණ අගයට හඳුනා ගන්නා අතර මෙම සාධාරණ අගය වන්නේ ගිවිසුම නිකුත් කෙරෙන ගනුදෙනු මිලයි. එම ගනුදෙනු මිල සඳහා සෘජුවම ආරෝපිත කල හැකි ගනුදෙනු පිරිවැය ඇතුලත් නොවේ. ආයෝජන ගිවිසුම් වගකීම මූලිකව හඳුනා ගැනීමෙන් අනතුරුව එය ලාභ හෝ අලාභ මගින් සාධාරණ අගය මනිනු ලැබේ.

